මිහිතලයේ පහළවූ ශ්‍රේෂ්ඨතම පුරුෂයා

බුදුහාමුදුරුවෝ



පණ්ඩිත ගණේගම සරණංකර නායක හිමිපාණෝ



普觉禅寺

මිහිතලයේ පහළවූ
ශ්‍රේෂ්ඨතම පුරුෂයා
බුදුහාමුදුරුවෝ

කර්තෘ
පණ්ඩිත ගණේගම සරණංකර නායක හිමි

නව සංස්කරණයේ කර්තෘ
වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ

ප්‍රකාශනය
සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය
අංක. 1, ජලන් මස් පුටේ,
සිංගප්පූරුව 128607
දුරකතන: 65 - 7783330,
පැක්ස්: 65 - 7730150

කර්තෘ

පණ්ඩිත ගණේගම සරණංකර නායක හිමි

නව සංස්කරණයේ කර්තෘ

වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ

(සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානාධිපති)

සහාය සංස්කාරක

එඩ්වින් ආරියදස

චිත්‍ර ශිල්පී

පී. වික්‍රමනායක

මාධ්‍යරූප සංකල්පක

පියරත්න හේවාබටගේ

සහාය

සමන් සිරිවර්ධන

ලලිත් රෝහණ ලියනගේ

අසෝක කමල්සිරි

පරිගණක තාක්ෂණය සහ විද්‍යුත් මුද්‍රණ කටයුතු

පූජ්‍ය වේරගොඩ සුනන්ද මෙහෙනිය

අජිත් සූරවංශ

මහින්ද කුමාර තිලකරත්න

කේ. එම්. මෛත්‍රී

මේ ග්‍රන්ථයේ ආගත කරුණු පිළිබඳ
පූර්ණ හා සදාකාලික අයිතිය හිමි වන්නේ බුදු රජාණනන් වහන්සේටයි.
බුදු රජාණනන් වහන්සේ ගේ ශ්‍රී මුඛයෙන් පහල වූ සනාතනික සත්‍යයෝ
පුහුදුන් මිනිසුන් විසින් පනවන ලද තාවකාලිකවූත්.
අසත්‍යවූත් අයිතිවාසිකම් පිළිබඳ නීති රීති පිළිගනු නොලබති

ප්‍රථම මුද්‍රණය

1998 ජුනි 26 ද

සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය

අංක. 1, ජලන් මස් පුතේ,

සිංගප්පූරුව 128607

දුරකතන: 65- 7783330, ෆැක්ස්: 65-7730150

මිහිතලයේ පහළවූ ශ්‍රේෂ්ඨතම පුරුෂයා

බුදුහාමුදුරුවෝ

කතෘ

පණ්ඩිත ගණේගම සරණංකර නායක හිමි

නව සංස්කරණයේ කතෘ

වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ

සහාය සංස්කාරක

එඩ්වින් ආරියදස

චිත්‍ර ශිල්පී

පී. වික්‍රමනායක

මාධ්‍යරූප සංකල්පක

පියරත්න හේවාබටගේ

සංස්කරණ උපදේශක මණ්ඩලය

පණ්ඩිත කිරින්දේ ශ්‍රී ධම්මානන්ද නායක හිමි
පණ්ඩිත පාතේගම ඤාණාරාම හිමි
පූජ්‍ය හැව්ඕවිට දීපානන්ද හිමි
පූජ්‍ය බුප්පම්පොල ධම්විසුද්ධි හිමි
පූජ්‍ය විතාරන්දෙනියේ නන්ද හිමි
පූජ්‍ය වේරගොඩ සුනන්ද මෙහෙනිය
මහාචාර්ය විනී විතාරන මයා
මහාචාර්ය සෙනරත් විජයසුන්දර මයා

උපදේශක මණ්ඩලය

සිතෝ චුන් චි මහතා
අන්ග් ලි සුච් මිය
වැන්ග් කී පොං මහතා
ඈන් ලි කිම් මොයි මිය
දයා සතරසිංහ මහතා
වජිරා සිරිවර්ධන මිය
ඩී. එස්. වීරනාරායන මහතා
උපුල් රුද්‍රිගු මහතා
මානෙල් ද සිල්වා මිය
රෝසි වීරකෝන් මිය
පී. වීරකෝන් මෙනවිය

කාලාම සූත්‍රය

ඇසූ පමණින් යම් කිසිවක් විශ්වාස නො කරන්න. පරපුරෙන් පරපුරට පැවතෙන හෙයින් සම්ප්‍රදයය මෙය යැයි සිතා යම් කිසිවක් විශ්වාස නො කරන්න. බොහෝ දෙනා විසින් පවසන නිසා හෝ ආරංචියෙන් දත් නිසා හෝ යම් කිසිවක් විශ්වාස නො කරන්න. ඔබ අදහන ආගමට අයත් ග්‍රන්ථයන්හි ලියා තිබෙන නිසාම පමණක් හෝ යමක් විශ්වාස නො කරන්න. ඔබගේ ආචාර්යවරුන්ගේ හෝ වැඩිහිටියන්ගේ හෝ වචනය නිසා පමණක් විශ්වාස නො කරන්න. එහෙත් නිරීක්ෂණයෙන් හා විශ්ලේෂණයෙන් පසුව යම් කිසිවක් තර්කයට, න්‍යායට ගැළපෙන්නේ යැයි අවබෝධ වූ විට, එමෙන්ම එය, සැම දෙනාගේම යහපතට සහ සුවසෙතට තුඩු දෙන්නේ යැයි ඔබට අවබෝධ වූ විට පමණක් යම් කිසිවක් පිළිගෙන එයට අනුව හැසිරෙන්න."

- බුදුරජාණන් වහන්සේ -

අඞ්ගුත්තර නිකාය

කෘතඥතාව



පූජ්‍ය වේරගොඩ සාරද ස්ථවිර

සදකාලයටත් සියලු ස්ථානයටත් අදාල බවින් යුත් ඉතා මාහැඟි සම්පත් රාශියක් මනුෂ්‍යත්වය පිළිබඳ සාරවත් ඉතිහාසයෙන් හෙළිදරවු වී පවතී. සමස්ත ලෝකවාසීන් කෙරෙහි දක්වන ලද කරුණා - මෛත්‍රිය ද, දේශනා කරන ලද සාම පණිවිඩය ද, හේතු කොට ගෙන විශ්ව සම්මානයට පත් ඇතැම් මහා පුද්ගලයන් විසින් අත්පත් කර ගන්නා ලද විජයග්‍රහණය නිසා මනුෂ්‍ය ස්මරණ තලයෙහි ඔවුන් ගේ චරිත නොනැසෙන සේ සටහන් ව පවතී. අසාර ඉතිහාසයෙහි වේගයෙන් ගිලිහී යන මොහොතක් තුළ ලෙයින් තෙත් සිංහාසනයක් මත යන්තම් පෙනී සිටීම සඳහා කඳුළු සාගර තරණය කරන ඊනියා ජයග්‍රාහිකයනට වඩා යොදුන් ගණන් ඉහළින් ඔවුහු පැහැදිලි ව නැගී සිටිති.

සාධනීය වුත්, වැඩදායී වුත් ජීවන බලවේග සංකේතවත් කරන්නා වූ ද මනුෂ්‍ය ප්‍රවර්ධන මාවත අවිද්‍යා ගොහොරුවෙන් බැහැරට ගෙන, එය විවිධ ක්ෂේත්‍ර හා ආශ්‍රිත ප්‍රඥාන්විත චින්තනය කරා ආලෝකවත් කළා වූ ද මේ මනුෂ්‍යෝත්තමයෝ ආගමික චක්‍රවර්තීන් වශයෙන් ද ශාන්තුවරයන්, මුනිවරයන්, ඍෂිවරයන්, දාර්ශනිකයන්, විද්වතුන්, කලාකරුවන් හා විද්‍යාඥයන් වශයෙන් ද අභිවන්දනයට පාත්‍ර වෙති. විකාර වුත්, විරූප වුත් දෑ පහ කොට මෙසේ ආධ්‍යාත්මික අත්දැකීමේ උසස් තල ක්ෂාත්-ක්ෂාත් කර ගැනීම සඳහා පෘථග්ජනයනට පිහිටාධාර වූ පුද්ගලයන් අතරින්, සවකීය මානුෂික සේවාවෙහි ගුණාත්මක භාවය අනු ව, මහ ඉහළින් විද්‍යමාන වන්නේ ඉතා ස්වල්ප දෙනෙකි. එසේ සාමාන්‍ය වශයෙන් සීමා වුණු, එහෙත් මනුෂ්‍ය ඉතිහාසය මෙතෙක් අලංකාර කළ ගණයට අයත් වුණු උසස් පුද්ගලයන් අතරින් උසස්තම පුද්ගලයා කවරෙක් ද?, පූර්ව-විනිශ්චයෙකින් ස්වකීය දෘෂ්ටි අඳුරු වුණා වූ ද, සාධාරණ තුලනාත්මක දෘෂ්ටිය පිළිබඳ ශක්තියක් ස්වල්ප වශයෙන් වුව දුබල නොවුණා වූද යම් තැනැත්තකුට නම්, මේ ප්‍රශ්නයට මුහුණ දීමේ ලා කිසිදු විකල්ප ඇති නොවිය හැකි යි. අප ගේ ලොවෙහි පහළ වුණු ශ්‍රේෂ්ඨතමයා වනාහි සීමා නොලත් කරුණා - මෛත්‍රියෙහි මහිමයෙන් ලෝ - අග පත් බුදුරජාණන් වහන්සේ ය. ශ්‍රේෂ්ඨතම පුද්ගලයා අන් උතුමෙක් නො වේ ම ය.

තමා ගේත් අන් සියලු ලෝ වැසියන් ගේත් විමුක්තිය සඳහා ඒ සා ප්‍රමාණයෙන් ආත්ම පරිත්‍යාගයෙහි යෙදුණු තැනැත්තෙක් මනුෂ්‍ය ඉතිහාසයෙහි නැත. සත්‍යය සොයා ගෙන ලොවේ දුක කෙළවර කරනු සඳහා මග සොයා යෑමේ දී තමාට අයිති ව පැවති දෑ එතරම් සමූහයක් අත් හළ තැනැත්තෙක් ද නැත. තමන් වෙත අයත් ඉතා කුඩා දැයක් වුවත් පරිත්‍යාග කිරීම පෘථග්ජනයනට ඉතා අසීරු කරුණක් වනු නොඅනුමාන ය. එහෙත් සිද්ධාර්ථ කුමාරයාණන් අත් හළේ අසදෘශ වරප්‍රසාද සමූහයක් මධ්‍යයෙහි විසූ ඔවුන් ගේ නොකැළැල් සිත ජීවිතයෙහි රළු, අම්හිරි යථාතත්වාවබෝධයෙන් වෙනස් වීම වළක්වනු සඳහා සිය පිය රජ තුමාණන් විසින් මහත් උනන්දුවෙන් යුක්ත ව සම්පාදනයකරන ලද අනේක ස්වර්ණමය සැප සම්පත් සම්භාරයකි. ඒ සියල්ල අත් හළ සිද්ධාර්ථ කුමාරයාණන් හිතා මතා තෝරා ගත්තේ උග්‍ර තපස් ජීවිතයකි. සය අවුරුදු කාලයක් තුල එතුමාණෝ සිය ශරීරයට අතිශය දුක් වේදනා දුන්නාහ. පන්සාළිස් වසර කලක් තුළ එතුමන් යෙදුණු ලෝකෝත්තර ආධ්‍යාත්මික සේවාව මනුෂ්‍යය ඉතිහාසයෙහි අපූර්ව තත්ත්වයක් දරයි. මේ සම්මා සම්බුදු රජුන් ගේ ජීවිත විස්තර ඇතුළත් සාහිත්‍ය කෘති සහ අන් නිර්මාණ කෘති ලක්ෂ සංඛ්‍යාත ය. එහෙත්, ඒ උදාර ජීවිතය හා සම්බන්ධ ප්‍රධාන - අප්‍රධාන සිද්ධිවලට ම විශේෂ අවධානය යොමු වී පවතින්නේ එයින් ඉතා ස්වල්පයක පමණි. ත්‍රිපිටක සාහිත්‍යයෙහි පවතින එවන් ප්‍රවෘත්ති සවිස්තර ව ඉදිරිපත් කිරීමේ ලා මේ ග්‍රන්ථය සමත් වී ඇත. මේ

කරුණු ගොනු කොට ගෙන බුදුන් වහන්සේ පිළිබඳ ව දත මනා සියලු කරුණු තමන් දනිතැයි සැනසීමට පත් ව සිටින්නන් වුව මවිතයට පත් කිරීමට මේ ග්‍රන්ථය පොහොසත් වනු නිසැක ය. මේ ග්‍රන්ථය සම්පාදනය කළ ගරු පණ්ඩිත ගණේගම සරණංකර මාහිමියන් වහන්සේ (1973) බුදු රජුන් ගේ ජීවිතය දෙස තිරසර සැදැහැවෙන් යුක්ත ව අමුතු නැවුම් බැල්මක් හෙළීමට පොහොසත් වී ඇත. එයින් බොහෝ අප්‍රකට කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා පාඨකයන්, ඒ කරණ කොට ගෙන ඉමහත් ආධ්‍යාත්මික සුවයක් ලබනු නොඅනුමාන ය. මෙහි ඒක - රාශි ව ඇති කරුණු සම්භාරය අධ්‍යයනය කරන නූතනයන් ලෝක ඉතිහාසයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා බුදු රජාණන් වහන්සේ බව නිගමනය කරනු නොඅනුමාන ය.

සම්මා සම්බුදු රජුන් විසින් ලොවට හෙළිදරවු කරන ලද අදහස් හා සංකල්ප කාලයට ඔරොත්තු දීමේ බලවත් හැකියාවක් දරයි. හැම ඉතිහාස කාල පරිච්ඡේදය ම තුළ පැන නගින අභියෝගවලට සුදුසු ප්‍රතිචාර දැක්වීමේ බලයක් ඒ සතු ය. අප ගේ අන් ප්‍රකාශනවල ද සිරිතක් වශයෙන් පෙනෙන සේ, මෙහි ද විශේෂයෙන් නිර්මාණ කරන ලද චිත්‍ර වෙයි. මෙය කියවන සැදැහැවතුන් ගේ සිත්හි බුදු රජාණන් වහන්සේ ගේ ජීවිතය හා සම්බන්ධ ඇතැම් සිද්ධි ඉතා පැහැදිලි ව එයින් මැවී පෙනෙන්නට වෙයි. ගරු පණ්ඩිත සරණංකර හිමියන් විසින් සම්පාදනය කරන ලද '**බුදු හාමුදුරුවෝ**' නම් කෘතියේ නොඑන කොටස් ස්වල්පයක ද මේ ග්‍රන්ථයට ඇතුළත් ව පවතී. එයින් පළමු වැන්න නම් 'වසල සූත්‍රය' යි. බුදුන් වහන්සේ ගේ දේශනා අතුරින් සමාජ සදාචාරය හා ඍජු සම්බන්ධතාවයක් දරන සූත්‍රය වන එය අකාලික වටිනාකමින් යුක්ත ය. දෙ වැන්නෙහි, බුදු සමයේ දැක්වෙන පරිදි ධාතු පිළිබඳ විස්තරයක් ද, විශේෂයෙන් සර්වඥ ධාතු පිළිබඳ ඉතා සංක්ෂිප්ත ඓතිහාසික කරුණු ද එයි. තෙ වැන්න, මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි එන පරිදි සර්වඥයන් වහන්සේ ගේ ශාරීරික ධාතු විවිධ දඹදිව් රාජ්‍යවලට බෙදා දෙනු ලැබ, ඒ නිධාන කොට ස්තූප ගොඩනගන ලද ආකාරය සඳහන් කරයි.

මේ ග්‍රන්ථය නිෂ්පාදනය කිරීමේ පරමාධ්‍යාශය වූයේ බුදුරජාණන් වහන්සේ ලොවෙහි ජීවත් වුණු ශ්‍රේෂ්ඨතම උතුමාණන් බව පැහැදිලි වන පරිදි උන් වහන්සේ ගේ ජීවිත පුවත් සමහරක් ඉදිරිපත් කොට, උන් වහන්සේ දෙවියකු නො ව, සැබෑ මනුෂ්‍යයකු සේ ඉපිද, මනුෂ්‍යයකු සේ ජීවත් ව, මනුෂ්‍යයකු සේ ජීවිතාවසානයට පත් වූවකු බව-පොදු මනුෂ්‍යත්වය අබිබවන කොතරම් ශ්‍රේෂ්ඨ දෑ කළත්, උන් වහන්සේ මනුෂ්‍යයකු ම බව, දැක්වීමට යි. ඒ අනු ව බලත් ම, උන් වහන්සේ සැබවින් ම මනුෂ්‍යයන් අතරේ අසදෘශ ය, උත්තරීතර ය. මේ ප්‍රකාශනය අප ගේ ළමා පරපුරෙහි සිත් ගැනීමේ අරමුණින් ද සකස් වී ඇති බව පෙනී යනු නොඅනුමාන ය. මෙහි එන බොහෝ චිත්‍ර ඔවුන් ගේ සිත් ගනී ම ය. බුදුන් වහන්සේ ඉගැන්වූ යහපත් ('සම්‍යක්') මාර්ගය අනු ව සිය ජීවිතය ගොඩනගා ගැනීමට ඒවා ද ඔවුනට උපකාර වනු ඇතැයි සිතමු. මෙ වැනි ග්‍රන්ථයක් එළි දැක්වීමේ ලා බොහෝ ප්‍රවීණයන් ගේ අඛණ්ඩ සහයෝගය අවශ්‍ය බව නොකිවමනා ය. ඒ අතරින් අප ගේ ප්‍රකාශනවල සංස්කාරක වශයෙන් කටයුතු කරන සුප්‍රකට මාධ්‍යවේදී එඩ්වින් ආරියදාස මහතා විශේෂයෙන් සඳහන් කරමු.

එසේ ම, බෞද්ධ චිත්‍ර නිර්මාණයෙහි උසස් කීර්තියක් ලබා සිටින පී. වික්‍රමනායක මහතා, අප ගේ අන් ප්‍රකාශනවලට සේ, මේ සඳහා ද චිත්‍ර සියයකට අධික සංඛ්‍යාවක් සපයා, එහි අගය අතිශයින් වර්ධනයට පත් කෙළේ ය. පියරත්න හේවාබටගේ මහතා ද, සිරිත් පරිදි, සිය 'ග්‍රැෆික්' කලා කටයුතුවලින් මෙහි පිටුවෙන් පිටුව සේ අලංකාර කරයි. තම දැනුම සහ තම කාලය යොදවා, සෑම අතින් ම මේ පොත මුද්‍රණයේ දී මට උදව් වුනු, මාගේ ආචාර්යවරයෙකු වන මහාචාර්ය විනී විතාරණ මහතා ද විශේෂයෙන් ස්තුති පූර්වකව සඳහන් කරමි. පණ්ඩිත ගණේගම සරණංකර නායක මාහිමියන් පිළිබඳ මා හැඟි කරුණු රාශියක් සම්පාදනය කිරීමෙන් ද උන් වහන්සේගේ "**බුදුහාමුදුරුවෝ**" නම් ග්‍රන්ථය නැවත මුද්‍රණය කිරීමට අවසරය සපයා දීමෙනුත්, කරන ලද මහා ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය ගැන ගණේගම රතනසාර පිරිවෙනේ වර්තමාන අධිපති පණ්ඩිත දමල සීලවිමල ස්වාමීන්ද්‍රයන් වහන්සේට සහ අපේ හිතවත් හොරන්ගල්ලේ හේමසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේටත් මගේ අවංක ස්තූතිය මින් පිරිනමමි. මෙවැනි සංකීර්ණ ග්‍රන්ථයක් සකස් කිරීමේදී, සහාය සපයන සැදැහැවතුන්ගේ සංඛ්‍යාව අපමණ ය. ඒ සියලු දෙනාම, නම් වශයෙන් සඳහන් කිරීම අසීරු කරුණකි. ඒ සියලු දෙනාගේ ම භක්ත්‍යාදර පූර්වක සහාය සඳ අගයමු.

මෙත් සිතිනි

වේරගොඩ සාරද මහා ස්ථවිර
සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානාධිපති,
Singapore Buddhist Meditation Centre
No. 1, Jalan Mas Puteh
Singapore 128607
1998 ජුනි 26

ප්‍රස්තාවනාව

මුල් පිටපතින් උපුටා ගන්නා ලදී

සම්බුදු චරිතය පිළිබඳ පෙර අපර දෙදිග පඬුවන් විසින් මෙතෙක් ලියා ඇති ග්‍රන්ථවල අනුගත මාර්ගයට වෙනස්ව යමින් ජීවමාන බුදුහාමුදුරුවන්ගේ පා සෙවන යටතේ ජීවත් වන ශ්‍රද්ධා බුද්ධි සම්පන්න බුද්ධ පුත්‍රයකු බුදුන් දකින හැටි මේ පොත කියවන ඕනෑම කෙනෙනුට මැවී පෙනේතැයි සිතමි. බුදුහාමුදුරුවන් ගේ රූපකාය හා ධර්මකාය පිළිබඳව අංග සම්පූර්ණ විස්තරයක් පෘථග්ජන මනසකින් තබා මාර්ගඵලාවබෝධය කළ ආර්‍ය්‍ය ශ්‍රාවකයෙකුට ද කළ නොහැකිය. බුදුවරයෙකු ගේ ගුණ පැවසිය හැක්කේ තවත් බුදුවරයෙකුට පමණය. එබඳු අසීමිත අපරිමිත අවාච්‍ය අනුපම, ගුණ සමුදයක් ඇති බුද්ධ චරිතයකින් බිංදු මාත්‍රයක් දෙස සූවිසි අංශයකින් බලා එය තම නැණ පමණින් පැවසීම මෙම ග්‍රන්ථයෙහි අරමුණ වී තිබේ.

මෙහි දැක්වෙන සූවිසි මාතෘකාවන් අතර මුල්ම තැන හිමිවී තිබෙන්නේ "බුදුහාමුදුරුවෝ දෙවියෙක් නොව ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකි." යන්නටය. මනුෂ්‍යයෙකු වශයෙන් ඉපිද, මනුෂ්‍යයෙකු වශයෙන් හැදී වැඩී, මනුෂ්‍යයෙකු තුළ උපදවා ගත හැකි බලසම්පන්න ධෛර්‍ය්‍ය වූ චතුරංග සමන්නාගත අධිෂ්ඨානයෙන් යුක්තව ක්‍රියා කිරීම නිසා කාම, රූප, අරූප, යන ත්‍රිවිධ ලෝකයෙන් එතර වී ලෝකෝත්තර තත්ත්වයට පත් වීමට පවා අවශ්‍ය මූලික ශක්තිය මිනිසා තුළ පවත්නා බව පෙන්නුම් කර දීමෙන් මනුෂ්‍යත්වයෙහි ඇති වටිනාකම උන් වහන්සේ අපට පෙන්වා වදාළහ. වර්තමාන සමාජ පැවැත්මෙහිදී ධනය, කුලය, නිලය, බලය වැනි මාධ්‍යයක් ඇසුරු කරමින් මිනිසා වර්ග වීම නිසා ඔවුන් අතර සාමකාමී සහජීවනයක් ඇති කිරීම බලවත් ප්‍රශ්නයක් බවට පත්ව තිබෙනා මෙබඳු අවධියක මිනිසා යනු වටිනා පුද්ගලයෙකු බව බුද්ධ චරිතයෙන් පැහැදිලි කර දීම ඉතා අවශ්‍ය වී තිබේ. එම අවශ්‍යතාවය මෙම ග්‍රන්ථයෙහි මුල් මාතෘකාවෙන්ම සම්පූර්ණ වී තිබීම සතුටට කරුණකි.

"බුදුහාමුදුරුවෝ මානසික වෛද්‍යවරයකි, ශ්‍රේෂ්ඨතම මනෝවිද්‍යාඥයෙකි" යන මාතෘකා යටතේ ලියා ඇති ලිපි දෙක ද ඉතා කාලෝචිතය. මනෝ වෛද්‍යවරයෙකු වශයෙන් බුදුරජාණන් වහන්සේ දක්වා තිබෙන ප්‍රතිකාර ක්‍රමය වර්තමාන මනෝවෛද්‍ය විද්‍යාඥයින්ට පවා ප්‍රයෝජනවත් මග පෙන්වීමකි.

පණ්ඩිතාචාර්‍ය්‍ය ගණේගම සරණංකර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පෙර අපර දෙදිග භාෂා පිළිබඳ මනා පටුත්වයක් ඇති, එසේම පෙර අපර දෙදිග සංචාරය කිරීමෙන් ලබාගත් පුලුල් අත්දැකීි ඇති උසස්ම ගණයේ පැවිදි පඬිවරයෙකි.

එබඳු විද්වතෙකුගේ ශ්‍රද්ධා බුද්ධි සම්පන්න පෑන් තුඩින් ලියැවුනු පොතක් අගය කිරීම හෝ හැඳින්වීම එතරම් අවශ්‍ය කරුණකැයි මම නොසිතමි.

බුදුන් වහන්සේ පිළිබඳව මෙබඳු ග්‍රන්ථයක් ලිවීමෙන් උන් වහන්සේ අදහස් කළේ බුදුහාමුදුරුවන් කවුද? උන් වහන්සේගේ බලාපොරොත්තුව කුමක්ද? උන් වහන්සේගේ අනුගාමිකයන් ස්වකීය ජීවිත සකස්කර ගැනීම සඳහා ඒ උදාර චරිතයෙන් ගතයුතු ආදර්ශ මොනවාද? ආර්ථික, සාමාජික, දේශපාලනමය, ගැටලුවලදී බුද්ධ චරිතයෙන් ලබාගත හැකි පිළිතුරු මොනවාද? ආර්ථික, සාමාජික, දේශපාලනමය, ගැටලුවලදී බුද්ධ චරිතයෙන් ගත යුතු උපදෙස් මොනවාද? යන කරුණු පැහැදිලි කර දීමයි.

කාටත් පහසුවෙන් තේරුම් ගත හැකි සරළ බසින් ජනප්‍රිය ලේඛකයකු අතින් ලියැවුනු මෙම ග්‍රන්ථය මුල පටන් අග දක්වා එක්වරටම කියවා අවසන් කළහැකි ඉතා උතුම් චරිත කථාවක් බව සතුටින් පවසමි.

මේ ග්‍රන්ථයට ප්‍රස්තාවනාවක් සපයන ලෙස කළ ආරාධනය පැය කීපයක් ඇතුළත ඉටු කළ යුතුව තිබුනු හෙයින් මගේ අදහස් ද දක්වමින් අගය කළ යුතු වැදගත් මාතෘකා රාශියක් මා අතින් ගිලිහී ගිය බව අවසාන වශයෙන් සඳහන් කරමි.

මිට

පිඹුරේ සෝරත ස්ථවිර
පරිවේණාචාර්‍ය්‍ය
අභ්‍යාස විද්‍යාලය
රත්මලාන

හැඳින්වීම



ගරු ආචාර්ය කේ ශ්‍රී ධම්මානන්ද මහානායක ස්ථවිරයන් වහන්සේ

දවසින් දවස ඉතා සීඝ්‍රයෙන් දියුණුව කරා ගමන් කරන වේරගොඩ සාරද ස්ථවිරයන්ගේ බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන වැඩසටහන ධර්ම ප්‍රචාරක වැඩ කටයුතු කරණ භික්ෂූන් වහන්සේලාට ආදර්ශයකි. බුදුරජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳ ලියා ඇති ඉතා වැදගත් පොත් රාශියක් උන් වහන්සේගේ ග්‍රන්ථ ප්‍රකාශන වැඩසටහන තුලින් නව මුහුණුවරකින් යුතුව එසේම වර්ණ චිත්‍ර සහිතව මුද්‍රණය කරවා ලෝකය පුරා නොමිළයේ බෙදහැරීම අතිප්‍රශංසණීය උදාර කාර්‍යයකි. මේ උදාර කටයුත්ත විශේෂයෙන් ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ නමක් අතින් සිදුවීම ශ්‍රී ලාංකික අප කාගේත් පැසසීමට ලක්විය යුතුය යනු මගේ විශ්වාසයයි.

අපවත්වී වදාළ පණ්ඩිත ගණේගම සරණංකර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ලියා ඇති "බුදුහාමුදුරුවෝ" නම් වූ, ඉතා විශිෂ්ට ග්‍රන්ථය "The Greatest Man Who Ever Lived - The Supreme Buddha" නමින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුළුලෝකයටම නොමිලයේ බෙද හැරීමට මේ නොබෝද කටයුතු කළ වේරගොඩ සාරද ස්ථවිරයන්, සිංහල භාෂාවෙන් ද එම වටිනා ග්‍රන්ථය ඉතා අලංකාර අයුරින් මුද්‍රණය කරවා බෙද හැරීම, **අපවත් වී වදාළ ගරු පණ්ඩිත ගණේගම සරණංකර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී නාමයට කරණ ලද ප්‍රණාමයක් වූවාසේම** සකල සිංහල බෞද්ධ ජනතාවට ද, කරණ ලද විශිෂ්ට සේවාවක් වශයෙන් සැළකිය හැක.

"මිහිතලයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම පුරුෂයා - බුදුහාමුදුරුවෝ" නම් වූ මේ ග්‍රන්ථය, බුදුරජාණන් වහන්සේගේ චරිතාපදානය ඉතා හොඳින් දන්නා අය තුළ වුවද, බුදුහාමුදුරුවන් පිළිබඳව නව හැඟීමක් දනවන සුළුය. මේ ග්‍රන්ථය සතු විශේෂ ලක්ෂණය නම් බුදුහිමියන්, අප වෙසෙන මේ යුගයට අයත් අභියෝගයනට මුහුණපාන සමකාලීනයෙකු සේ දකින්නට පාඨකයාට පිහිට වීමයි.

"ත්‍රිපිටකය තුලින් පෙනෙන බුදුහාමුදුරුවෝ, අපේ විහාරය තුළ වැඩසිටින බුදුහාමුදුරුවන්ට වඩා වෙනස්ය. අපේ විහාරතුළ වැඩසිටින්නේ අචේතනික බුදුකෙනෙකි. බුදුරුවකි. සචේතනික බුදුන් වහන්සේ දැක ගත හැක්කේ ත්‍රිපිටකය තුළිනි. උන් වහන්සේ කථාකරණ හැටි, බණ කියන හැටි, ප්‍රශ්න විසඳන හැටි, පිළිපදින හැටි, පිඬුසිගා වඩින හැටි, සැතපෙන හැටි, එක මොහොතක් අපතේ නොයවා ස්වයෙහි යෙදෙන හැටි, මහන්සියක් නො තකා පා ගමනින් සැතපුම් සිය ගණන් ගම් නියම්ගම් වල චාරිකාවේ හැසිරෙණ හැටි, ගස් යට, ගල් උඩ, සුනඃගාරවල තනිව ම වැඩ වී සිටින හැටි හා උන් වහන්සේගේ සිතුම් පැතුම් ජීවමාන ස්වරූපයෙන් දැක ගැනීමට හා දැන ගැනීමට නම් අපි ත්‍රිපිටකය කියවිය යුතුයි." මේ අපවත්වී වදාළ ගරු පණ්ඩිත ගණේගම සරණංකර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පොත හැඳින්වීමෙන් උපුටාගත් ඉතා වටිනා කොටසකි.

ඉතා ලිහිල් කාටත් කියවා තේරුම් ගතහැකි මටසිළුටු භාෂාවෙන් ලියා ඇති මෙම පොත කියවීමේ රුචිය අඩු මුළු මහත් සිංහල බෞද්ධ ජනතාව විසින්ම පුනපුනා කියවිය යුතු පොතක් වශයෙන් නම් කළ හැක.



කේ ශ්‍රී ධම්මානන්ද මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
සිංගප්පූරුවේ සහ මැලේසියාවේ ප්‍රධාන සංඝ නායක

පෙරවදන



අති පූජ්‍ය අග්ග මහා පණ්ඩිත
බලංගොඩ ආනන්ද මෛත්‍රීය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

ගාලු කෝරලයේ ප්‍රධාන සංඝනායක තනතුර හෙබැවූ ගරු ගණේගම සරණංකර මාහිමියන් වහන්සේ විසින් මෙයට පස්විසි වසරකට පෙර රචිත 'බුදු හාමුදුරුවෝ' යන වටිනා ග්‍රන්ථය ගරු වේරගොඩ සාරද මාහිමියන් වහන්සේ ගේ ආධිපත්‍යයෙන් යුත් සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය මඟින් යළිත් ප්‍රකාශයට පත් වන බව අසා ඉමහත් සොම්නසට පත් වීමු.

අපි බුදුරජානන් වහන්සේ හඳුනා ගනිමු: පණ්ඩිත සරණංකර හිමියන් ඇසුරු කෙළෙමු: සාරද ස්ථවිරයෝ දැනු දු ඇසුරු කරමු: ග්‍රන්ථය ද කියවීමු. ස්වකීය ශාස්තෘන් වහන්සේ කෙරෙහි අපරිමිත සැදැහැයෙන් යුත් බුද්ධ පුත්‍රයන් වහන්සේ දෙ නමක් විසින් ස්වකීය සුවිශේෂ ශ්‍රමය ඇසුරින් පළ කරනු ලබා නව පාඨක පරම්පරාව අතට මේ සාහිත්‍ය කෘතිය යළි පැමිණීම ඒ තරුණ - තරුණියන් ගේ වාසනා මහිමයේ ප්‍රතිඵලයක් බව අප ගේ අදහස යි.

අද ලොව පුරා පිරිසිදු බුදු දහම පිළිබඳ ව ඉමහත් උනන්දුවක් රෝපණය වෙමින්, පැතිරෙමින් පවතී. එය නූතන "ධර්ම කෝලාහලයක්' බව සිතමු. එය පෝෂණය කිරීමේ ශක්තිය ඓතිහාසික වශයෙන් පවතින්නේත් පැවතිය යුත්තේත් ශ්‍රී ලංකාවේ ය - එහි මනුෂ්‍යය සම්පත්තිය කෙරෙහි ය. ඒ සඳහා සිංහල - බෞද්ධ අප, අප ගේ දහම පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයෙන් ද, ඒ අවබෝධය අනුනට බෙදා දීමේ ශක්තියෙන් ද සපිරී සිටිය යුතු ය.

නූතන චින්තනය දේවත්වය පිළිබඳ ව දැඩි සැක පහළ කරයි. බෞද්ධ අපට එය අරුමයක් නො වේ. අප ගේ තථාගතයන් වහන්සේ ඒ සැක පහළ කෙළේ අදින් දෙදහස් පන්සිය වසර කලක් පෙර ය. උන් වහන්සේ දෙවියකු නො ව මනුෂ්‍යයකු බව පැහැදිලිව ද තහවුරුව ද දක්වන ගරු සරණංකර හිමියන් ගේ මේ කෘතිය අතිශය කාලෝචිත අවශ්‍යතාවක් පිරිමසයි. එයින් ද පෝෂණය වී නව ලොවෙහි නව අවශ්‍යතාවලට මුහුණ දීමට සැරසීම ඔබ ගේ යුතු කමක් ව පවතී.

සාරද ස්ථවිරයන්ගේ ග්‍රන්ථ ප්‍රකාශන කටයුතු, බෞද්ධ ලෝකයට පමණක් නොව මුලු මහත් ජගත් ජන කණ්ඩායමට ම මාහැඟි සේවයකි. පෙළෙහි ආගත කරුණු ඉතාම පැහැදිලි ලෙස ප්‍රකාශවන වර්ණ චිත්‍ර යෙදීමේ සම්ප්‍රදාය සාරද ස්ථවිරයන් ගේ කෘති වල විශේෂ ලක්ෂණයකි. සාරද ස්ථවිරයන් ගේ මේ මහාර්ඝ ශාසන සේවය හැමතින්ම සාර්ථක වේවා යි මගේ ආශිර්වාද යයි.

B. Anandamaitreya

බලංගොඩ ආනන්ද මෛත්‍රීය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

සංදේශය

සීතෝ චුන් චී

ලෝකය, ශීඝ්‍රවේගයෙන්, දෙදහස්වන වසර දෙසට ගමන් ගනිමින් සිටී. එවැනි සමයයෙකදී සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ ග්‍රන්ථ ප්‍රකාශක ව්‍යාපෘතිය දෙසියවන ප්‍රකාශනය දෙසට ශීඝ්‍ර ලෙස ගමන් ගන්නේ ය. ඒ නිසා, මේ මොහොත, සිංගප්පූරු බෞදධ භාවනා මධ්‍යස්ථානයට සාධාරණ ප්‍රෞඪත්වයක් පිළිබඳ හැගීමක් ලද හැකි අවස්ථාවකි. අපගේ අලුත්ම ප්‍රකාශනයත්, අප අද යොමුවී සිටින සිද්ධි දමයත් හේතුකොට ගෙන, සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයට නව ගැඹුරක් එක් වේ. **"මිහිතලයේ පහළවූ ශ්‍රේෂ්ඨතම පුරුෂයා - බුදුහාමුදුරුවෝ"** නම් මේ ග්‍රන්ථය, හුදෙක් අපගේ අලුත්ම ප්‍රකාශනය පමණක් නොවේ. එහි ඊටත් වැඩි වටනාකමක් ඇත්තේය. ඒ ග්‍රන්ථය, සිංගප්පූරු - බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ සහායයෙන් පැවත්වෙන අත්‍යශ වැදගත් හා ගාම්භීර සිද්ධයක් පිළිබඳ ග්‍රන්ථමය සමරුවක් වෙයි.

මේ පූජනීය සාමහික අවස්ථාව නම්, සිංගප්පූරුවේ බ්‍රයිටන් හිල් පාරේ පිහිටි ෆෝර් කාක් සී පන්සලෙහි සර්වඥධාතූන් වහන්සේ ප්‍රදර්ශනය කිරීමයි. ඒ මහෝත්සවය පැවැත්වෙන්නේ සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ සහායත් සහභාගීත්වයත් සහිතවයි. මෙම සහයෝගිතාවය පිළිබිඹු කිරීමක් වශයෙන්, මේ අලුත්ම ප්‍රකාශනයෙහි, සර්වඥධාතූන් වහන්සේ පිළිබඳ ඉතිහාසය ගැන තරමක් දීර්ඝ විස්තරයක් පළවන්නේ ය.

එක් අතකින්. මේ ග්‍රන්ථය, ඒ අසහාය සාමධික පූජෝත්සවය පිළිබඳ සමරු ග්‍රන්ථයකි. මේ අපූර්ව පූජෝත්සවය පිළිබඳ සමරු සයහන්, මේ ග්‍රන්ථය විසින් අනාගත පරම්පරා උදෙසා ආරක්ෂා කොට තබන්නේ ය. අන් හැම අවස්ථාවක දී මෙන්ම, මෙහි දී ත්, මේ අසහාය සාමයික ජයග්‍රහණය වූ කලී, අපගේ මාර්ගෝපදේශකයන් වහන්සේ සහ අපගේ ආචාර්යවරයාණන් වන ගරු වේරගොඩ සාරද මහාස්ථවිර යන් වහන්සේ ගේ විචිත්‍ර චින්තනයෙහි මා ඇගි ප්‍රතිඵලයකි.

සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ, අප සැමදෙනා විසින්ම පැහැදිළිව අවබෝධකොට ගෙන සිටින කරුණක් නම්, අපට ඕනෑම ව්‍යාපෘතියක් උච්ච සාර්ථකත්වය කරා ගෙන යා හැකි වන්නේ අපට, සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ අධිපති තැන්පත් ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ ගේ ප්‍රායෝගික චින්තනයෙහි ආශිර්වාදය අපට සැමවිටම ලැබෙන හෙයිනි.

ගරු වේරගොඩ සාරද මහ ස්ථවිරයන් වහන්සේ විසින සිංගපූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයට ඉටුකෙරෙන මාහැගි, අසහාය සේවය ගැනත් ඒ මගින් මුලු ලොවට ඉටු වන සේවය ගැනත් අප හැම දෙනාගේම භක්ති පූර්වක කෘතඥතාව මෙහිදී සැළකොට සිටීම, මගේ පරම යුතුකම කැයි මම විශ්වාස කරමි. සභාපතිවරයා වශයෙන්, මම, සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ සියුලුම සාමාජිකයන්ටත්, සියලුම ආධාරෝපකාරී හිතවතුන්ටත් මගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමන්නෙමි. ශ්‍රී බද්ධ වචනය, ලොව පුරා පතුරුවාලීමෙහි ලා අප විසින් කරනු ලබන ප්‍රයත්න යෙහි ලා අප හා එක්ව සිටින ඒ සියලු දෙනාටම අපගේ ස්තුතිය පිරිනැමීමට ලැබීම මහා භාග්‍යයකි.

මෙත් සිතින්

සීතෝ චුන් චී

සභාපති, සිංගප්පූරු බෞද්ධ භාවනා මධ්‍යස්ථානය.

පිළිගැන්වීම



අපවත් වී වදාළ ගෞරවාර්හ පණ්ඩිත යටලමත්තේ සිරි වාචිස්සර ජිනරතන වජිරඤාණාභිධාන
ගාලු කෝරළේ ප්‍රධාන අධිකරණ සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

අති පූජ්‍ය පණ්ඩිත ගණේගම සරණංකර නා හිමියන්ගේ
"මිහිතලයේ පහළවූ ශ්‍රේෂ්ඨතම පුරුෂයා - බුදුහාමුදුරුවෝ" නැමැති මේ මහා ග්‍රන්ථය
අපවත් වී වදාළ මගේ ගුරුදේවයන් වහන්සේ වූ
පණ්ඩිත යටලමත්තේ සිරි වාචිස්සර වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ
දෙලොස් වැනි ගුණානුස්මරණය සඳහා මුද්‍රණය කර,
ගෞරව භක්ත්‍යාදර පූර්වකව උන්වහන්සේ ගේ නමට පිළිගැන්වෙයි.

යො මාං ප්‍රවාජයිත්වාජනක ඉවමුද මේ'භිවෑද්ධිං ව්‍යධත්ත
ශ්‍රී වජ්‍රඥානනාමා යටලමතුර්ති ග්‍රාමජාතො යතීන්ද්‍රඃ
ග්‍රන්ථං තස්මා ඉදං මෙ භවතු ච ගුරුවෙ දක්ෂිණාවත් ප්‍රශස්තං
පුණ්‍යෙනෛතෙන භූයාත් පරම මමෘතදං ශ්‍රෙයසඤ්චාපිතසෙම

රචනය පණ්ඩිත දවුල්දෙන ඤාණිස්සර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

"මා පැවිදි කරවා පියකු මෙන් සතුටින් මගේ දියුණුව සිදු කළ
යටලමත්තේ ශ්‍රී වජිරඤාණ ගුරුදේව ස්වාමීන්ද්‍රයන් වහන්සේට
මේ මහගු ග්‍රන්ථය පූජාවක් වේවා. මේ පිනෙන් උන්වහන්සේට
අමාමහ නිවන් සැප ලැබේවා"

පූජ්‍ය වේරගොඩ සාරද ස්ථවිරයන් වහන්සේ

අති පූජ්‍ය පණ්ඩිත ගණේගම ශ්‍රී සරණංකර මා හිමිපාණන් වහන්සේ

ගණේගම ශ්‍රී සරණංකර මා හිමියන් වහන්සේ යනුවෙන් පසු කල්හි කීර්තියට පත් වූ උළුවිටිය ගමගේ සැමි කාරියවසම් ළදරුවා මෙ ලෝ එළිය දුටුවේ 1908 ඔක්තෝබර් මස 12 වැනි දා ය. ඔහු ගේ පියා අන්ද්‍රියස් සහ මව කරලයින් විජේතිලක යන දම්පතීහු දකුණු ලක බද්දේගම, ගණේගම වාසීහු වූ හ. ගණේගම රජයේ පාසල්හි තෙ වැනි පෙළ තෙක් ද, බද්දේගම සාන්ත අන්තෝනි විදුහලේ සත් වැනි පෙළ තෙක් ද උගත් ඒ දරුවා, 1924 ජූනි මාසයේ ආචාර්ය වශයෙන් ගරු පණ්ඩිත කහවේ ශ්‍රී රතනපාල මා හිමියන් වහන්සේ ද, උපාධ්‍යාය හිමිවරුන් වශයෙන් ගරු වැලිවිටියේ සුගතපාල මා හිමියන් වහන්සේ සහ ගරු බද්දේගම ගුණානන්ද මා හිමියන් වහන්සේ ද ඇති ව ගණේගම සරණංකර නමින් පැවිදි බිමට පත් වූයේ ය.

1925 ජනවාරි 2 වැනි ද ගාල්ලේ කිතුලම්පිටියේ ආනන්ද පිරුවනට ද තවත් සිව් වසරකින් (1929) කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරුවනට ද ප්‍රවිෂ්ට ව, භික්ෂුවරයකු ලද මනා ධර්ම ශාස්ත්‍ර උද්ග්‍රහණයෙහි යෙදී 1932 ජූනි 11 වැනි ද මල්වතු මහා විහාරස්ථානයේ දී උපසම්පදව ද, 1943 දෙසැම්බර් ප්‍රාචීන භාෂෝපකාර සංගමය මගින් පැවැත්වුණු පරීක්ෂණයෙන් ප්‍රාචීන පණ්ඩිත උපාධිය ද, මේ හිමියන් වහන්සේ හිමි කර ගත් හ.

විද්‍යෝදය පිරුවන් ශිෂ්‍යවරයකු වශයෙන් බද්දේගම පියරතන, වැලිවිටියේ සෝරත, කුකුල්නාපේ දේවරක්ඛිත, පරවාහැර වජිරඤාණ, කළුකොඳයාවේ ප්‍රඥාසේකර, පලන්නොරුවේ විමලධම්ම ආදී ගරු පණ්ඩිත යතිවරයන් වහන්සේලා ගේ ගුරු ආශ්‍රය ලැබීම උන් වහන්සේ ගේ අනාගත ජීවිත ගමන කෙරෙහි බල පෑ බව නොඅනුමාන ය.

1943 දී කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට පිවිසුණු සරණංකර ස්වාමීන් වහන්සේ 1951 දී ඉන්දියාවේ ශාන්තිනිකේතනයට ඇතුළු ව, ශාසෙත්‍රාද්ග්‍රහණය කරන අතර ම 'ලංකාදීප' පුවත්පතට 'ප්‍රියරංජන්' යන නමින් 'දඹදිව විත්ති' යන ලිපි පෙළක් සපයන්නට වූ හ. ඒ ඇසුරින් එරටෙහි පරිසරය පමණක් නො ව, මේ රටෙහි විවිධ ප්‍රශ්න ද අළලා ඉතා සරල රීතියක් අනුගමනය කරමින් කාලෝචිත අදහස් සමූහයක් ඉදිරිපත් කළ සේක.

පෙරළා පැමිණි උන් වහන්සේ 1956 දී බද්දේගම රතනසාර පිරුවන්හි ගුරු තනතුරක් ලබා, පසු ව 1960 සැප්තැම්බර් 01 වැනි ද එහි අධිපති බවට පත් වූ හ. 1977 දී මල්වතු විහාර සංඝ සභාව මගින් ගාලු කෝරලයේ සංඝනායක තනතුරින් පුදනු ලැබූ සේක.

ගරු සරණංකර මා හිමියන් වහන්සේ ස්වකීය විශිෂ්ට ග්‍රන්ථ සම්පාදන කාර්ය්‍ය ආරම්භ කෙළේ 1963 දී B.C. Law යන වංග ජාතික පඬිවරයා ගේ "Buddhaghosa" ග්‍රන්ථයෙ පරිවර්තනය කිරීමෙනි. ඒ වර්ෂයේ දී ම 'මහාධිරාජ අශෝක හා සෙල්ලිපි' යන ග්‍රන්ථය පළ විණි.

සෙසු සාහිත්‍ය කෘති මෙසේ ය - ප්‍රියරංජන් ගේ ජනප්‍රිය රචනා' (1966), 'බුදු හාමුදුරුවෝ' (1973: මෙය 1974 රාජ්‍ය සාහිත්‍ය සම්මානය ලැබී ය), 'ආනන්ද හාමුදුරුවෝ' (1977), 'සිංහල ජාතියේ ශ්‍රේෂ්ඨ වීර පුරුෂයා' (1983), 'යසෝධරාව' (1984), 'බුද්ධ මාර්ගය' 1986 මෙය ගරු හම්මලව සද්ධාතිස්ස මා හිමියන්ගේ "Buddha's Way' කෘතියේ පරිවර්තනයකි) සහ 'රාජා භවතු ධම්මිකෝ' (1987), පුවත් පත්- සඟරාවලට ලියූ ලිපි ද, විශේෂයෙන් අපවත් වුණු ස්වාමීන් වහන්සේලා ගේ චරිත ඇතුළත් කුඩා පොත් ද රැසකි. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ බද්දේගම පළාතේ සරණංකර හිමියන් විසින් ඇති කරන ලද සමාජ සේවා අතුරින් නිදහස් ජංගම පුස්තකාල සේවය යි.

1989 දෙසැම්බර් 29 වැනි ද උන් වහන්සේ අපවත් වී වදාළ සේක. මේ ධර්ම දානමය පුණ්‍යකර්මයේ බල මහිමයෙන් උන් වහන්සේට අමා මහ නිවන් සුව අත්වේවා!

වේරගොඩ සාරද මහා ස්ථවිර

ප්‍රණාමය

අපවත් වී වදාළ

අති පූජ්‍ය පණ්ඩිත ගණේගම ශ්‍රී සරණංකර මා හිමිපාණන් වහන්සේ

බුද්ධ වචන කීපයක්

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද
ධර්ම විනය විවෘතව තිබෙන තරමට, ප්‍රචාරය වූ තරමට බැබලෙයි.
වැසී තිබෙන තරමට නොබැබලෙයි."

(අංගුත්තර නිකාය - තික නිපාත)

"මහණෙනි, මම ධර්මය ඔරුවකට උපමා කොට
දේශනා කරන්නෙමි. ධර්මය එතෙරවීම පිණිස මිස කරගහගෙන
යෑම පිණිස නොවේ."

(මජ්ඣිම නිකාය - අලගද්දූපම සූත්‍රය)

"මේ ලෝකයෙහි සැපසේ සයනය කරන්නන් අතර මමත් එක්කෙනෙක්මි."

(අංගුත්තර නිකාය)

"ආනන්දය, මා විසින් තොපට යම් ධර්මයක් හා විනයක්
දේශනා කරන ලද ද එය
මගේ ඇවෑමෙන් ඔබේ ශාස්තෘවරයායි."

(පටිසම්භිධා මග්ග අට්ඨ කථා)

" මල් සුවඳ ආදියෙන් මට පුද පූජා පවත්වන්නෝ (නියම ලෙසින්)
මා පුදන්නෝ නොවෙත්. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි
යෙදෙන්නෝ ම (නියම ලෙසින්) මා පුදන්නෝ වෙත්.

(ධම්ම පදට්ඨ කථා ධම්මාරාම වත්ථු)

පටුන

පරිච්ඡේදය	පිටුව
1. බුදුහාමුදුරුවෝ දෙවියෙක් නොව උත්තරීතර මනුෂ්‍යයෙකි	1
2. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම ආචාර්යවරයාණෝයි	13
3. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම අවිහිංසාවාදියාණෝයි	28
4. බුදුහාමුදුරුවෝ මේ මිහිපිට උපන් මිනිසුන් අතර ඉතාම වැඩියෙන් දුක්වින්ද මිනිසායි	31
5. බුදුහාමුදුරුවෝ ලෝකයා වෙනුවෙන් ඉතාම වැඩි පරිත්‍යාග කළ උතුමාණෝයි	35
6. බුදුහාමුදුරුවෝ මිනිසුන් අතර උපන් ඉතාම නිර්භීත පුරුෂයාණෝයි	40
7. බුදුහාමුදුරුවො සැබෑ ඉතිහාසයක් ඇති ශාස්තෘවරයාණෝයි	44
8. බුදුහාමුදුරුවෝ ඉතාම වැඩියෙන් බැනුම් ඇසූ සමාජ සේවකයාණෝයි	49
9. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම ප්‍රතිපත්තිය පෙන්වූ නායකයාණෝයි	52
10. බුදුහාමුදුරුවෝ සංඝශාසනය නැමැති තරුණ සංවිධානයක් ඇති කළ තරුණ ශාස්තෘවරයාණෝයි	55
11. බුද්ධාගම පොත පතට හා වැඳුම් පිදුම්වලට පමණක් සීමා කළයුතු ආගමක් ද?	59
12. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මාර්ග දේශකයාණෝයි	62
13. බුදුහාමුදුරුවෝ චින්තන විප්ලවයක් හා සමාජ විප්ලවයක් කළ පළමුවන ශාස්තෘවරයාණෝයි	70
14. බුදුහාමුදුරුවෝ සත්‍ය සොයාගත් මහා වීරවරයාණෝයි	79
15. බුදුහාමුදුරුවෝ විචිත්‍ර ධර්මකථිකයාණෝයි	85
16. බුදුහාමුදුරුවෝ ශාස්තෘවරුන් අතර ප්‍රගතිශීලී ශාස්තෘවරයාණෝයි	89
17. බුදුහාමුදුරුවෝ උපමා හා කතාන්දර කීමෙහි අති දක්ෂයෙකි	94
18. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මානසික වෛද්‍ය වරයාණෝයි	106
19. බුදුහාමුදුරුවෝ අනුපම රූපසම්පත්තියෙන් යුත් උතුමාණෝයි	113
20. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මනෝවිද්‍යාඥයාණෝයි	122
21. බුදුහාමුදුරුවෝ ධර්මරාජ්‍යයක් ගොඩනංවා පාලනයකළ ධර්මරාජයෙකි	130
22. බුදුහාමුදුරුවෝ පරලොව පෙන්වා මෙලොව දියුණුව සැලැස් වූ ශාස්තෘවරයාණෝයි	139
23. බුදුහාමුදුරුවෝ මිහි පිට උපන් මහා කාරුණිකයාණෝයි	145
24. බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම සමාජ ශෝධකයාණෝයි	158
25. බුදුහාමුදුරුවෝ සමාජවාදයේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ ආදිකර්තෘවරයාණෝයි	166
වසල සූත්‍රය	175
සර්වඥ ධාතූන් වහන්සේලා	209
මහා පරිනිබ්බාණ සූත්‍රය	219

බුදුහාමුදුරුවෝ දෙවියෙකු නොව උත්තරීතර මනුෂ්‍යයෙකි

බුදුන්වහන්සේ ගැන හරිහැටියට නො දත් අය උන්වහන්සේ දේවත්ව යෙහිලා සළකති. එබඳු අනවශ්‍ය කීර්ති, ප්‍රශංසා ගෞරවාචාර උන්වහන්සේ කිසි විටකත් අගය නො කළහ. බලාපොරොත්තු නුවූහ.

"මහණෙනි ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා, දරුණුය. තියුණුය. අනුත්තර වූ රහත් බව ලබාගැනීම පිණිස අන්තරායකය."

"දරුණෝ භික්ඛවෙ ලාභ සක්කාර සිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යෝගක්ඛෙමස්ස අධිගමාය"

(සංයුක්ත නිකාය - ලාභ සක්කාර සංයුත්ත)

උන්වහන්සේ ලෝකයා තුළ පවත්නා අවිද්‍යාව, නොදැනීම, නූගත් කම, වැරදි දෘෂ්ටි, වැරදි මත, වැරදි ක්‍රියා, පෙන්වාදීම සඳහා ම පහළ වූ උතුමෙකි. එබඳු උතුමෙක් ලෝකයාගෙන් සීමාව ඉක්ම වූ ගෞරවාචාර කිසිසේත් බලාපොරොත්තු නොවෙයි.

දිනක් බුදුන් වහන්සේ **උක්කට්ඨා** හා **සේතව්‍යා** යන නගර දෙක අතර පා ගමනින් වඩිද්දී ඒ මගෙහි ම ගමන් ගත් ද්‍රෝණ නම් බමුණෙක් බුදුරදුන්ගේ පා සටහන් දැක, "ඒකාන්තයෙන් මේ පා සටහන් මනුෂ්‍යයෙකුගේ නම් නොවේ" යයි සිතා ඉතා ඕනෑකමින් බලා සිටියේ ය.

බුදුන්වහන්සේ මාර්ගයෙන් පැත්තකට ගොස් ගසක් මුල වැඩ හුන් හ. බමුණා අතිශය සාන්ත දන්ත ඉරියවුවෙන් හෙබි බුදුරදුන් ලගට ගොස් පහත සඳහන් ප්‍රශ්න ඇසිය:

බමුණා:- ඔබ දෙවියෙක් ද?

බුදුහු :- බමුණ, මම දෙවියෙක් නො වෙමි.

බමුණා :- ඔබ ගාන්ධර්වයෙක් ද?

බුදුහු :- බමුණ, මම ගාන්ධර්වයෙක් නො වෙමි.

බමුණා :- ඔබ යක්ෂයෙක් ද?

බුදුහු :- බමුණ, මම යක්ෂයෙක් නො වෙමි.

බමුණා :- ඔබ මනුෂ්‍යයෙක් ද?

බුදුහු :- බමුණ, මම මනුෂ්‍යයෙක් ද නො වෙමි.

බමුණා:- මම ඔබෙන් දෙවියෙක් දැයි ඇසූ විට "මම දෙවියෙක් නො වෙමි" යි ඔබ කියයි. ඔබ ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද මනුෂ්‍යයෙක්දැ? යි ඇසූවිට "මම ගාන්ධර්වයෙක් හෝ යක්ෂයෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ නොවෙමි" යි කියයි. එසේ නම් ඔබ කවරෙක් ද?

බ්‍රාහ්මණය, මා දෙවියෙක් නම් දෙවියෙකු තුළ පවත්නා කාමාදි ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම කාමාදි ආශ්‍රවයන් සියල්ල සහමුලින් ම ප්‍රහීණ කෙළෙමි, මුලිනුපුටා දැම්මි. ඒ නිසා මම දෙවියෙක් නොවෙමි.

බ්‍රාහ්මණය, මා ගාන්ධර්වයෙකු නම් ගාන්ධ -ර්වයෙකු තුළ පවත්නා කාමාදි ආශ්‍රවයන්

මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කෙළෙමි. ඒ නිසා මම ගාන්ධර්ව-යෙක් ද නොවෙමි. බ්‍රාහ්මණය, මා යක්ෂයෙකු නම්, යක්ෂයෙකු තුළ පවත්නා කාමාදි ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතු ය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කෙළෙමි ඒ නිසා මම යක්ෂයෙක් ද නොවමි.

බ්‍රාහ්මණය මා "සාමාන්‍ය මනුෂ්‍යයෙක්" නම් සියලු මිනිසුන් තුළ පවත්නා කාමාදි ආශ්‍රවයන් මා තුළත් තිබිය යුතුය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කෙළෙමි. ඒ නිසා මම අනික් මිනිසුන් වැනි මිනිසෙක් ද නොවෙමි.

බ්‍රාහ්මණය, උපුලක් හෝ පියුමක් හෝ හෙළපියුමක් හෝ දියෙහි ඉපිද, දියෙහි වැඩී, දියෙන් ඉස්මතු වී, දියෙහි නොගැවී තිබෙනවා වගේ මමත් ලෝකයෙහි මිනිසුන් අතර ඉපිද, ලෝකයෙහි මිනිසුන් අතර වැඩී, ලෝකයාගෙන් - මිනිසුන්ගෙන් ඉස්මතුවී, ලෝකයා සමග නොගැටී, නොගැවී, නොබැඳී සිටිමි.

ඒ නිසා බමුණ මම මිනිස් දුර්වලකම් සියල්ල ම නැති කළ උත්තර මනුෂ්‍යයෙක්මි-**"උත්තර මනුස්සෝ"** කොටින් ම "මම බුදුවරයෙක්මි" මා හැඳින්විය යුතු හොඳම නම "බුද්ධ" යනුයි. **"බුද්ධොති මං බ්‍රාහ්මණ ධාරෙහි"**

(අංගුත්තර නිකාය - චතුත්ථ නිපාත - ද්‍රෝණලෝක සූත්‍රය)

බුදුන්වහන්සේ හා බමුණකු අතර සිදුවී ඇති මේ සාකච්ඡාවෙන් පෙනී යන්නේ කෙලෙසුන්ගෙන් පිරුණු සාමාන්‍ය මිනිසුන් සඳහා පොදුවේ යෙදෙන "මනුෂ්‍ය" යන මේ වචනය බුදුහාමුදුරුවන් ගැන යෙදිය යුත්තේ සුර, අසුර, නර, නාග ආදි සත්ව ජාතින් හැඳින්වීමේදී පමණක් බවයි.

බුදුන්වහන්සේගේ ජීවිතය පරිච්ඡේද දෙකකින් යුක්තය. සිද්ධාර්ථ කුමාර කාලයේ සිට බුද්ධත්වය ලබන තුරු උන්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයෙකි. බෝධිසත්ව වරයෙකි. බුදු බව ලැබූ කෙණෙහි සිට සියලු මිනිසුන් තුළ පවත්නා රාගාදි ක්ලේශ ධර්මයන් සම්පූර්ණයෙන්ම නැතිකළ බැවින් "උත්තරීතර" මනුෂ්‍යයෙකි. මනුෂ්‍යයන් අතර මෙතෙක් උපන් ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයාය. උන්වහන්සේ සමකළ හැක්කේ තවත් මිනිසෙකුට නොව බුදුවරයකුට පමණකි. උන්වහන්සේට සමකළ හැකි තවත් මිනිසෙකු නැති නිසා **"අසම"** යනුවෙන් හැඳින්වෙති. සමකළ හැක්කේ බුදුවරයකුටම නිසා **"අසමසම"** යනුවෙන් හැඳින්වෙති.

බුදුහාමුදුරුවෝ පුද්ගලයන් අතර ආශ්චර්යවත් පුද්ගලයෙකි- **"අච්ඡරියොපුග්ගලො"**. මනුෂ්‍යයන් අතර ආශ්චර්යවත් මනුෂ්‍යයෙකි. **"අච්ඡරිය මනුස්සෝ"** එබඳු දෙදෙනකු එකවර දක්නට නැති නිසා එකම පුද්ගලයෙකි-**"ඒකපුග්ගලො"**

සිදුහත් කුමරා මිනිස් මවුපියන්ට දාව මිනිස් සිරුරක් ඇතිව ඉපිද, බුදුවරයෙකු මෙන් ජීවත්ව සිට, මිනිස් ආයුෂ වලද උත්තරීතර මනුෂ්‍යයෙකු වශයෙන් පිරිනිවන් පෑවේය. සියලු මිනිසුන් තුළ දක්නට ඇති රාග, ද්වේෂ, මෝහ, මද, මාන, ඊර්ෂ්‍යා ක්‍රෝධ ආදි ක්ලේශ ධර්මයෝ උන්වහන්සේ තුළ අවිද්‍යමාන වූහ. මිනිසුන්ට අයත්, මිනිසුන් තුළ ම දක්නට ලැබෙන මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා, සීල, සමාධි, ප්‍රඥා ආදි ශ්‍රේෂ්ඨ මිනිස් ගති උන්වහන්සේ තුළ විද්‍යමාන විය.

බුදුන්වහන්සේ කථාකළේ එකල ව්‍යවහාරයෙහි ඇති, කාටත් තේරෙන මිනිසුන් කථා කරන භාෂාවෙනි. උන් වහන්සේ වැළඳුවේ මිනිසුන් කනබොන ආහාරපාන වර්ගයි. උන්වහන්සේගේ කථාවෙහි මිනිස් ලක්ෂණ හොඳින් දිස්වෙන තැන් බොහෝය.

පරිපක්කො වයො මය්හං
පරිත්තං මම ජීවිතං
පහාය වො ගමිස්සාමි
කතං මෙ සරණ මත්තනො

"මම දැන් මහල්ලෙක්මි. මට ජීවත් වීමට ඇත්තෙ තව ස්වල්ප වේලාවකි, මම නුඹලා අත්හැර දමා යන්නෙමි. මා විසින් නුඹලාට කළයුතු උපකාරය-පිහිට කරණ ලද්දේය."

දිනක් බුදුන් වහන්සේ උක්කට්ඨා හා සේතව්‍යා යන නගර දෙක අතර පා ගමනින් වඩිද්දී ඒ මගෙහි ම ගමන් ගත් දෝණ නම් බමුණෙක් බුදුරදුන්ගේ පා සටහන් දැක, "ඒකාන්තයෙන් මේ පා සටහන් මනුෂ්‍යයෙකුගේ නම් නොවේ" යයි සිතා ඉතා ඕනෑකමින් බලා සිටියේ ය.

1 පිටුව බලන්න

මහලු පියෙකු තම මරණ මඤ්චකය වටා රැස්ව සිටින දූ දරුවන් අමතා කියන අන්තිම වචනයේ විලාසය මෙහි දක්නට ඇත. බුදුන්වහන්සේ මිනිසෙකු වශයෙන් මිනිසුන් සමග කථාකරනු මෙහි ඉතා හොඳින් දිස්වේ.

"ආනන්දය, මම දැන් ජරාවට, වැඩි වයසට, මහලු බවට, වයස්ගත බවට, පත්වීමි. මගේ වයස අසූවකි. දිරූ රියක් රෝද බැඳීම් ආදී ප්‍රතිසංස්කරණයෙන් අල්ලා සිටිනවා වගේ මගේ කයද අර්හත් බලවේගයෙන් බඳනා ලදුව අල්ලා සිටී."

("අහංඛො පනානන්ද එතරහිජිණ්ණො, වුද්ධො, මහල්ලකො, අද්ධගතො වයො අනුප්පතො, ආසීතිකො මෙ වයො වත්තති සෙය්‍යථාපි ආනන්ද ජජ්ජර සකටං වෙඨ මිස්සකෙන යාපෙති, එවමෙව කො ආනන්ද වෙඨමිස්සකෙන මඤ්ඤෙ තථාගතස්ස කායො යාපෙති.")

(මහා පරිනිබ්බාන සූත්‍රය)

(මේ වචන තුළින් අසූහැවිරිදි වැඩිහිටියෙක් දිස් වෙයි.)

චුන්ද කර්මාරපුත්‍රයාගේ ආහාර වැළඳීමෙන් පසු බුදු රදුන්ට දරුණු රෝගයක් වැළඳුණේය. එවිට බුදුහු

"ආනන්දය, හොඳටම වතුර පිපාසයි. ඉක්මනට පැන් ටිකක් ගෙනත් දෙන්න."
("ඉංඝ මෙ ත්වං ආනන්ද පානියං ආහර, පිපාසිතොම්හි ආනන්ද පිබිස්සාමි.")

ය යි තෙවරක් ම අනඳ තෙරුන්ගෙන් ඉල්ලා සිටියහ. මෙහිදී උන්වහන්සේ භාවිත කළ වචන තුළින් වතුර පිපාසයෙන් පෙළෙන රෝගියෙක් දිස් වෙයි.

බුදුරදුන්ගේ අනුපම රූසපුවෙන් වශී වී ඒ දෙස ම බලා සිටීම සඳහා මහණවී සිටි වක්කලී තෙරුන් අමතා

"වක්කලිය මේ කුණු සිරුරෙන් ඔබට ඇති ඵලය කුමක්දැයි"? **("කිං තෙ වක්කලි ඉමිනා පූතිකායෙන")**

ඇසූහ. මෙයින් උන්වහන්සේගේ සිරුර දෙතිස් කුණුපයෙන් යුත් මිනිස් සිරුරක් බව පැහැදිලි වෙයි.

"මහණෙනි, මගේ කීමට එක දෙයක් අත්හරින්න. එය අත් හැරියොත් නුඹලා අනාගාමී වන බවට මම පොරොන්දු වෙමි. මම ඇප වෙමි. ඒ එකම දෙය නම් ලෝබකමයි."

(එකධම්මං භික්ඛවෙ පජහථ අහං වො පාටිභොගො අනාගාමිතාය. කතමං එකධම්මං" ලෝභං භික්ඛවෙ එක ධම්මං ලෝභංභික්ඛවෙ එක ධම්මං).

(ඉතිවුත්තක - එකක නිපාතය)

"මම පොරොන්දු වෙමි. මම ඇප වෙමි" යි යන මේ බුදුවදනෙහි ඇත්තේ සාමාන්‍ය මිනිස් ස්වරූපයයි. මම පොරොන්දු වෙනවාය, මම ඇප වෙනවාය කියා හැමෝම හැම විටම නොකියති.

දැකීමෙන්, කළ පුරුද්දෙන්, අත්හද බැලීමෙන් ලැබූ විශ්වාසය ඇති කෙනෙකු ම කියන කතාවකි මේ.

බුදුහු පිරිනිවන් මඤ්චකයෙහි වැඩ හිඳ භික්ෂූන් අමතා,

"මහණෙනි මේ සිටින එක භික්ෂුවකට හරි මා ගැන, ධර්මය ගැන, සංඝයා ගැන, මාර්ග ගැන, ප්‍රතිපද ගැන මොන විධියේ හෝ සැකයක් තිබේ නම් දැන් මගෙන් අහන්න. අපේ ශාස්තෘවරයා ජීවත්ව සිටියදී මේ ප්‍රශ්න අසන්නට බැරිවුනාය. මේ සැකය අත්හැර ගන්නට බැරි වුනාය කියා පසුව කනගාටු වෙන්ට එපා. ඒ නිසාම ඇසිය යුතු යමක් ඇත්නම් දැන්ම මගෙන් අසා දැනගන්න. මට ඇති ගෞරවය නිසා යමෙක් මගෙන් ප්‍රශ්න අසන්නට අකමැති නම් යහළුවකු ලවා හරි අස්වාගන්න"

යයි තුන්වරක්ම භික්ෂූන්ට කියා සිටියහ. එහෙත් භික්ෂූහු තුෂ්ණීම්භූතව හුන්හ.

"සියා ඛො පන භික්ඛවෙ එක භික්ඛුස්සපි

කංඛා එක භික්ඛුස්ස වා කංඛා වා විමති වා බුද්ධෙ වා ධම්මෙ වා සංඝෙ වා මග්ගෙ වා පටිපදය වා පුච්ඡථ භික්ඛවෙ. මාපච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ. සම්මුඛීභූතො නො සත්ථා. එවංවුත්තෙ තෙ භික්ඛු තුණ්හී අහෙසුං දුතියම්පි - තතියම්පි - සියා ඛො ජන භික්ඛවෙ සත්ථුගාරවෙනාපි න පුච්ඡෙය්‍යාථ සහායකොපි භික්ඛවෙ සහායකස්ස ආරොචෙතු ති එවං වුත්තෙ තෙ භික්ඛු තුණ්හී අහෙසුං"

(මහා පරිණිබ්බානසුත්ත - අංගුත්තර නිකාය - චතුක්ක නිපාත)

බලන්න මේ ප්‍රධානියාගේ හැටි, මේ නායකයාගේ හැටි මේ ගුරුවරයාගේ හැටි, අන්තිම හුස්ම හෙළන්නට පෙර තමන්ගේ චරිතය ගැන පැවැත්ම ගැන තමන්ගේ අදහස් ගැන, තමන්ගෙ පිරිස ගැන මොන විධියේ හරි සැකයක් තියෙනවා නම්, එසේම නොදන්නා දෙයක් අසා දැනගන්නට ඕනෑකම තිබෙනවා නම්, ඒ ඕනෑම දෙයක් අසා දැනගන්නට යයි මරණ මඤ්චකයේ සිටගෙන එක් වරක් නොව තුන්වරක් ම දන්වා සිටියහ. තම චරිතයෙහි ඇති පිරිසිදු බව, අනුන් නොදන්නා දෙයක් අන්තිම අවස්ථාවේ හරි කියාදීමෙහි ඇති ඕනෑකම මෙයින් පෙනේ.

අන්තිම හුස්ම හෙළන මොහොතෙහි පවා අනුන්ට සේවය කිරීමේ බලාපොරොත්තුව මෙයින් පෙනේ. සෝචනීය අවස්ථාවක මෙබඳු ඉල්ලීමක් කළ ගුරුවරයෙක්, නායකයෙක්, ශාස්තෘවරයෙක්, මවෙක්, පියෙක්, වැඩිහිටියෙක් මේ මානව ඉතිහාසයෙහි වෙන සිටියේද? සේවය කරන අයට, සේවය කිරීමට බැඳී සිටින අයට මෙය හොඳ ආදර්ශයක් නොවේද?

"මහණෙනි, අකුසල් අත්හරින්න. අකුසල් අත්හරින්න පුලුවනි. අකුසල් අත්හරින්න බැරිනම් අකුසල් අත්හරින්නය කියල මම කියන්නේ නැහැ. අකුසල් අත්හරින්න පිළිවන් නිසාමයි මම එසේ කියන්නේ. අකුසල් අත්හැරීමෙන් අහිතක්, දුකක්, අවැඩක් වෙනව නම් මම කිසි කලෙක එසේ කියන්නෙ නැහැ. අකුසල් අත්හැරීම හිත පිණිසම, සැප පිණිසම හේතුවන නිසාමයි මම එසේ කියන්නෙ."

"අකුසලං භික්ඛවෙ පජහථ සක්කා භික්ඛවෙ අකුසලං පජහිතුං නොචෙතං භික්ඛවෙ සක්කා අභවිස්ස අකුසලං පජහිතුං නාහං එවං වදෙය්‍යං අකුසලං භික්ඛවෙ පජහථාති. යස්මා ච ඛො භික්ඛවෙ සක්කා අකුසලං පජහිතුං තස්මාහි එවං වදාමි අකුසලං භික්ඛවෙ පජහථාති, අකුසලං ච හිදං භික්ඛවෙ පහීනං අහිතාය දුක්ඛාය සංවත්තෙය්‍ය නාහං එවං වදෙය්‍යං, අකුසලං භික්ඛවෙ පජහථාති. යස්මා ච ඛො භික්ඛවෙ අකුසලං පහීනා හිතාය සුඛාය සංවත්තති තස්මාහං එවං වදාමි අකුසලං භික්ඛවෙ පජහථා ති" *(අංගුත්තර නිකාය - දුක නිපාත)*

බලන්න මිනිස් මවක හෝ පියෙකු "පුතේ දුවේ, නරකවැඩ කරන්න එපා. නුඹලාට වැරදි වැඩ නොකර ඉන්න පුළුවන්. ඒ නිසයි මම කියන්නෙ. නොකොට හිටියොත් එයින් වෙන්නෙ හොඳක් ම" යයි දූ දරුවන්ට බලකර සිටීමක, ඇවිටිල්ලක ස්වරූපය මෙහි නැද්ද කියා. මෙබඳු කීම් දෙවිවරුන් කියා තිබේද? ඇත්තෙන් ම නැහැ.

"මහණෙනි, දීමෙහි හා බෙදීමෙහි අනුසස් මම දන්න තරම් අනික් අයත් දන්නව නම් ඒ කිසිවෙක් ටිකක් හරි අනුන්ට නොදීනම් අනුභව කරන්නෙ නැහැ. මසුරු කමට ඉන්නෙ නැහැ. තමන් කකා සිටින අන්තිම බත් පිඩෙන් කොටසක් හරි එය පිළිගන්ට කෙනෙකු සිටිනවා නම් ඉන් කොටසක් හරි නොදී අනුභව කරන්නෙ නැහැ."

("එවං චෙ භික්ඛවෙ සත්තා ජානෙය්‍යුං. දානං සංවිභාගස්ස විපාකා යථා අහං ජානාමි න අදත්වා භුඤ්ජෙය්‍යං න ච තෙසං මච්ඡෙරමලං චිත්තං පරියාදය තිට්ඨෙය්‍ය. යොපි තෙසං අස්ස චරිමො ආලොපො චරිමං කබලං තතොපි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං")

බ්‍රාහ්මණය, උපුලක් හෝ පියුමක් හෝ හෙළපියුමක් හෝ දියෙහි ඉපිද, දියෙහි වැඩී, දියෙන් ඉස්මතු වී, දියෙහි නොගෑවී තිබෙනවා වගේ මමත් ලෝකයෙහි මිනිසුන් අතර ඉපිද, ලෝකයෙහි මිනිසුන් අතර වැඩී, ලෝකයාගෙන් - මිනිසුන්ගෙන් ඉස්මතුවී, ලෝකයා සමග නොගැටී, නොගෑවී, නොබැඳී සිටිමි. ඒ නිසා බමුණ මම මිනිස් දුර්වලකම් සියල්ල ම නැති කළ උත්තර මනුෂ්‍යයෙක්මි-"උත්තර මනුස්සො" කොටින් ම "මම බුදුවරයෙක්මි.

2 පිටුව බලන්න

(ඉතිවුත්තක පාලි - එකක නිපාත)

මෙය ද හොඳට දන් දී පුරුදු ඇති දන පතියෙකුගේ කථාවකි.

එකල බුදුරදුන්ට වාතරෝගයක් හැදුණේය. උපවාන හාමුදුරුවෝ බුදුරදුන්ට උපස්ථාන කරති. බුදුහු ඒ තෙරුන් අමතා

> "උපවානය මට උණුවතුර ටිකක් ගෙනැත් දෙන්න ය" යි කීහ. (**"තෙන ඛො පන සමයෙන භගවා වාතෙහි ආබාධිතො හොති ආයස්මා ච උපවානො භගවතො උපට්ඨාකො හොති අථඛො භගවා ආයස්මන්තං උපවානං ආමන්තෙසි. ඉඞඝ මෙසිත්වං උපවාන උණ්හොදකං ජානාහීති."**)

(සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්ත)

මේ කියමනෙහි දක්නට ඇත්තේ ද මිනිස් ස්වභාවයකි.

දිනක් බුදුහු මහාකාශ්‍යප මහතෙරුන් සමග ගසක් යටට වැඩ එහි වාඩි වී සිටින්නට කැමති බවක් ඇගවූහ. මහා කාශ්‍යප තෙරනුවෝ පට පිළියෙන් කළ තමාගේ සගළ සිවුර හතරට නමා බිම එලා බුදුරදුන්ට අසුනක් පැනවූහ. එහි වැඩසිටි බුදුහු

> "මහා කාශ්‍යපය ඔබේ මේ සිවුර සිනිඳුය" යි කීහ. "ස්වාමීනි මට අනුකම්පාකොට මේ සිවුර ඔබ වහන්සේ පිළිගනු මැනවි" "කාශ්‍යපය, පෙරවීමෙන් පරණ වී හණ වැහැරියෙන් කළ මගේ පාංශුකූල සිවුර පොරවා ගන්නට ඔබ කැමැත්තෙහිද?" "එසේය මම කැමැත්තෙමි."

> "ඇවැත්නි මෙසේ මා පෙරවූ සිවුර බුදුරදුන්ට දී බුදුරදුන් පෙරවූ හණ රෙද්දෙන් මැසූ පාංශුකූල සිවුර මම පොරවා ගතිමි." (**"මුදුකා ඛොත්‍යායං කස්සප පට පිලොතිනං සංඝාටී"ති පතිගණ්හාතු මෙ භන්තෙ භගවාපට පිලොතිනං සංඝාටි අනුකම්පං උපාදයාති" ධාරෙස්සසි පන මෙ ත්වං කස්සප සාණානි පාංසුකූලානි නිබ්බසනානීති ධරෙස්සාමහං භන්තෙ භගවතො සාණානි පාංසු කූලානි නිබ්බසනානී ති සො ඛො අහං ආවුසො පටපිලෝතිනං සංඝාටි භගවතො පදසිං අහං පන භගවතො සාණානි පංසුකූලානි නිබ්බසනානී'ති පට්පජ්ජිං"**)

(සංයුත්ත නිකාය - කස්සප සංයුත්ත)

මෙහි ද බුදුන්වහන්සේ මහ කසුප් තෙරුන්ගේ පටපිළියෙන් කළ සගල සිවුර සිනිඳු බව අඟවා, එය තමන් වහන්සේට පිළිගන්වාගෙන තමන් පෙරවූ හණ රෙද්දෙන් කළ පරණ සිවුර කසුප් තෙරුන්ට පොරවන්නට දීම, බුදුරදුන් හා මහ කසුප් තෙරුන් අතර පැවැති සමාන හා මිත්‍ර ආකල්පයක ලකුණු පෙන්වයි.

දිනක් පඤ්චවග්ග දයක නම් බමුණෙක් සිය නිවසෙහි මිදුලට පිටු පා වාඩි වී සිට ආහාර අනුභව කෙළේය. බැමිණිය ඔහුට ව්‍යංජන බෙදමින් සිටියාය. බුදුන්වහන්සේ ඒ දෙදෙනාගේ හේතු සම්පත් දැක ඔවුන්ට යහපතක් කරනු සඳහා ඒ නිවසට පිඬුසිගා වැඩිසේක. බැමිණිය මිදුලේ වැඩ සිටින බුදුරදුන් දැක "බමුණා දැන් බුදුරදුන් දුටුවොත් අනුභව කරමින් සිටින කෑමටික පාත්‍රයට බෙදනු ඇත. එසේ වුවහොත් මට නැවතත් උයන්නට සිදුවේ" යයි සිතා, බමුණාට බුදුන් නොපෙනෙන ලෙස මුවා කරගෙන අහර බෙදූහ.

බුදුරදුන්ද එතනින් නොගොසින් එහිම සිටිනු දුටු බැමිණිය බමුණාට නොපෙනෙන ලෙස ඔළුව වනා බුදුරදුන්ට යන්නටයයි සංඥා කළාය. බුදුහුද ඔළුව වනා නොයන බව ඇගවූහ. එතරම් ශ්‍රේෂ්ඨ රාජවංශික මහා තවුසෙකු හිස වැනූ හැටි දැක බැමිණියට බක බක ගා හිනා ගියේය. හදිසියේ බැමිණිය සිනාසුණේ කා සමග දැයි ඇසූ බමුණා මිදුල දෙස බැලීය. පිඬු සිගා වැඩ සිටි බුදුරදුන් දුටු ඔහු බාගයක් පමණ අනුභව කොට බඳුනේ ඉතුරු වී තිබුණු කොටස බුදු රජුන් ගේ පාත්‍රයෙහි බහා ලී ය. බුදුහු ඉඳුල් බත්යයි ප්‍රතික්ෂේප නොකොට

> "බමුණ" 'අග කොටස හෝ මැද කොටස හෝ අවසාන කොටස හෝ අපට සුදුසුය.

අපි වනාහි පරදත්තූපජීවි ප්‍රේතයන් වැන්නෙමු'යි කීහ.

බමුණා රාජවංශයෙහි උපන් මෙතරම් උත්තමයෙකු "මට ඉඳුල් බත් එපා" යයි නොකියා පිළිගත්තේ යයි බුදුරදුන් ගැන තදින්ම පැහැදුනේ ය.

(ධම්මපදට්ඨකථා - පකිණ්ණකවග්ග දයක බ්‍රාහ්මණ වත්ථු)

ඉඳුල් බත් වළඳ හෝ අනුන්ට සේවය කිරීමට යහපතක් සෙතක් සැලසීමට බුදුරදුන් තුළ පැවැති ඕනෑකම මෙයින් පෙණේ.

දිනක් බුදුන් වහන්සේ පෙරවරුවෙහි සිවුරු ගැටවටු ගන්වා පාත්‍රය අතින්ගෙන උදය නමැති බමුණාගේ ගෙදරට පිඬුසිගා වැඩිසේක. බුදුරදුන් දුටු බමුණා පාත්‍රය පුරවා බත් පිළිගැන්විය. බමුණාට පින්දී බුදුහු විහාරයට වැඩියහ. දෙවැනි දින ද බුදුහු ඔහුගේ ම ගෙදරට පිඬුසිගා වැඩියහ. එදින ද බමුණා පාත්‍රය පුරවා බත් පිළිගැන්විය. බමුණාට පින්දී බුදුහු විහාරයට වැඩියහ. තුන්වැනි දින ද බුදුහු ඔහුගේ ම ගෙදරට පිඬුසිගා වැඩියහ. එදින ද බමුණා පාත්‍රය පුරවා බත් බෙද

"ඔබ පුන පුනා (නැවත - නැවත) මෙහි එන්නෙහිය. කෑම ගැන කෑදර කෙනෙකැයි සිතමි"

යි ඇනුම් පදයක් කීය. එවිට බුදුහු

"ගොවියෝ පුන පුනා වී වපුරති. ***පුනප්පුනං චෙව වපන්ති බීජං*** වැස්ස පුන පුනා වසී. ***පුනප්පුනං වස්සති දෙවරාජා*** ගොවියෝ පුන පුනා කෙත සී සාති. ***පුනප්පුනං ඛෙත්තං කසන්ති කස්සකා*** ධාන්‍ය ජාති පුන පුනා රටට ලැබේ. ***පුනප්පුනං ධඤ්ඤමුපෙති රට්ඨං*** යාචකයෝ පුන පුනා ඉල්ලති. ***පුනප්පුනං යාචකා යාචයන්ති*** දන පතිහු පුන පුනා දන් දෙති. ***පුනප්පුනං දනපතී දදන්ති*** දන්දී පුන පුනා ස්වර්ගයට යති. ***පුනප්පුනං දනපති දදිත්වා*** කිරි දෙවන්නෝ පුන පුනා කිරි දෙවති. ***පුනප්පුනං සග්ග මුපෙන්තිඨානං*** වස්සා මව කරා පුන පුනා එළඹේ. ***පුනප්පුනං ඛීරනිකා දුහන්ති*** සත්වතෙමේ පුන පුනා ක්ලාන්තද වෙයි, ***පුනප්පුනං වච්ඡො උපෙතිමාතරං*** කම්පිතද වෙයි. ***පුනප්පුනං කිලමති ඵන්දතිච*** බාල තෙමේ පුන පුනා ගැබට පැමිණෙයි, ***පුනප්පුනං ගබ්භමුපෙති මන්දෙ*** පුන පුනා උපදයි. මිය යයි. ***පුනප්පුනං ජයාති මීයති ච*** පුන පුනා සොහොනට ගෙන යනු ලබයි. ***පුනප්පුනං සීවථිකං හරන්ති*** නුවණ ඇත්තා නිවණ ලැබ පුන පුනා නූ පදී." කීහ. ***මග්ගඤ්ච ලද්ධා අපුනබ්භවාය න පුනප්පුනං ජායති භූරිපඤ්ඤො ති.***

(සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්ත)

මෙහිද බුදුන් වහන්සේ උදය බමුණාගේ ගෙදරට තනිව ම තුන්වරක් ම පිඬුසිගා වැඩියේ මුලින් බමුණා සිතූ පරිදි ආහාරයට ඇති ගිජුකමක් නිසා නොව ධර්මාවබෝධයට හේතු සම්පත් ඇති බැවින් ඔහු කෙරෙහි කරුණාවෙන් මය. ඔහු කියූ **"පුනප්පුනං"** ("නැවත නැවත") යන්නම මාතෘකා කොට බණ කියා ඔහු පැහැදවූහ. මෙයද මහාකාරුණික මිනිස් ලක්ෂණයකි.

"මහණෙනි, ලාභ සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය. මේ ලාභ සත්කාර, කීර්ති, ප්‍රශංසා මිනිසාගේ හමේ සිවිය සිඳී. සිවිය සිඳ හම සිඳී. හම සිඳ මස් සිඳී. මස් සිඳ නහර සිඳී. නහර සිඳ ඇට සිඳී. ඇට සිඳ ඇට මිදුලු කාගෙන ගොස් සිටී. **"දරුණො භික්ඛවේ ලාභ සක්කාර සිලොකො ලාභ සක්කාර සිලොකො භික්ඛවේ ඡවිං ඡින්දති. ඡවිං ඡෙත්වා චම්මං ඡිනදති. චම්මං ඡෙත්වා මංසං ඡින්දති. මංසං ඡෙත්වා නහාරුං ඡින්දති. නහාරුං ඡෙත්වා අට්ඨිංමිඤ්ජං ආහච්ච තිට්ඨති.** *(සංයුත්ත නිකාය - ලාභ සක්කාර සංයුත්ත)*

ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා, බලකාමය, ධන කාමය, තනතුරු ගිජුකම, නම්බුව, ප්‍රසිද්ධිය යන මේවා ඉතාම දරුණු, භයානක, විනාශකාරී, විපත්තිදායක ඒවා බව ප්‍රකාශ කළේ දෙවියෙකු විසින් නොව, අත්හද බැලීමෙන් ම ආදීනව දැක



"ආනන්දය, මම දැන් ජරාවට, වැඩි වයසට, මහලු බවට, වයස්ගත බවට, පත්වීමි. මගේ වයස අසූවකි. දිරූ රියක් රෝද බැඳීම් ආදි ප්‍රතිසංස්කරණයෙන් අල්ලා සිටිනවා වගේ මගේ කයද අර්හත් බලවේගයෙන් බඳනා ලදුව අල්ලා සිටී."

4 පිටුව බලන්න

පිළිකුල් කොට අත්හැර දැමූ උත්තරීතර මනුෂ්‍යයෙකු විසිනි.

"කාශ්‍යපය, දැන් ඔබ ඉතා මහලුය. මා විසින් පොරවා අත්හළ හණ පිළියෙන් කළ, හැම තැනම මසා ඇති පාංශුකූල චීවරය ඔබට දැන් බර වැඩිය. ඒ නිසා සැදැහැවතුන් පූජා කළ සාමාන්‍ය සිවුරක් පොරවගෙන සිටින්න. පිඬු සිඟා යෑමෙන්ම ජීවත් වීමේ පිළිවෙත අත්හැර ගෙදරවල දනය වැළඳීම සඳහා කරන ආරාධනා ද බාර ගන්න. දැන් ඉතින් මා ළඟම නැවතී සිටින්නැ"යි බුදුහු කස්සප තෙරුන්ට කීහ.

"ස්වාමීනි, මම දීර්ඝ කාලයක සිට ආරණ්‍යයකව ම වාසය කරමි. ආරණ්‍ය වාසයේ ගුණත් නිතර කියමි. දීර්ඝ කාලයක සිට පිඩුසිඟා යෑමෙන්ම යැපෙමි. පාංශුකූලික සිවුරු ම දරමි. එහි ගුණ ද කියමි. සැහැල්ලු දිවි පෙවෙතෙන් වසමි. විවේකී ව වසමි. සමූහයාගෙන් ඈත්ව තනිව ම වසමි. එහි ගුණ ද කියමි. නිතරම පටන්ගත් වීර්‍යයෙන් යුක්තව ම වසමි. ඒ නිසා ස්වාමිනි: මේ ප්‍රතිපත්ති ක්‍රමය මේ විදියට ම දිගට ම ගෙනයන්නට කැමැත්තෙමි"

යි කාශ්‍යප මහරහතන් වහන්සේ කීහ. බුදුන් වහන්සේ

> "බොහොම හොඳයි කාශ්‍යප, බොහොම හොඳයි කාශ්‍යප, බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස ලෝකයාට අනුකම්පා පිණිස හණ සිවුරම දරමින් පාංශුකූලිකව ම වෙසෙමින් පිඩු සිඟාගෙන ම ජීවත් වෙමින් වනයෙහි ම වසන්න." (**"ජිණ්ණොසිදනිත්වං කස්සප ගරුකානි වො තෙ ඉමානි සාණානි පාංකුලානි නිබ්බසනානි. කස්මාතිහත්වං කස්සප ගහපතිකානි චෙව චීවරානි ධාරෙහි, නිමන්තනෙසුච භුඤ්ජාහි, මමඤ්ච සන්තිකෙ විහරාහි, අහඤ්ච බො භන්තෙ දීඝරත්තං ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්සච වණ්ණවාදී ආරද්ධ විරියොචෙව විරයාරම්භස්ස වණ්ණවාදී දේච බො අහංභන්තෙ අත්තවසෙ සම්පස්සමානොදීඝරත්තං ආරඤ්ඤකො චෙව ආරඤ්ඤකත්තස්ස වණ්ණවාදී - පෙ - සාධු! සාධු! කස්සප බහුජන හිතාය කිරත්වං කසප්ප පටිපන්නො බහුජන සුඛාය-පෙ-අරඤ්ඤසෙදච විහරාහීති."**)

(සංයුත්ත නිකාය-කස්සප සංයුත්ත)

මෙයින්ද කැපී පෙනෙන්නේ කාරුණික මිනිස් ගතියකි. "මහලු නිසා බර ඇති දිරූණු රළු සිවුරු පොරොවන්ට එපා. දිගටම පිඬුසිඟා යන්ට එපා. දිගටම වනාන්තරේම ඉන්න එපා දැන් ඉතින් මා ළඟ නැවතී සිටින්න" යන මේ වචන ටිකේ ඇත්තේ කෙතරම් දයාබර, කාරුණික, මානුෂික මිත්‍රශීලීලාවක්ද මෙබඳු දහසක් කරුණුවලින් බුදුන්වහන්සේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා බව ඔප්පුවේ. උන්වහන්සේට දේවත්වයක් ආරෝපණය කොට ඇත්තේ උන්වහන්සේ විසින් නොව බැතිමතුන් විසින් මිනිසාට වඩා දෙවියන් ලොකුකොට සළකන්නන් විසිනි.

බුදුහාමුදුරුවෝ මැවුම් කාරයෙක් ද නොවෙති. උන්වහන්සේ උපන්නේ ලෝකයක් මවාගෙන නො ව, මැවී ඇති ලෝකයකයි. නොකළ හැකි, නොපිළිගත හැකි වැඩ උන්වහන්සේ කිසි විටකත් බාර නොගත්හ. තමන් පිට පටවා නොගත්හ. බුදුන්වහන්සේට ලෝකය පෙනුණේ දුක උඩ ඇති දෙයක් ලෙසය. දිනක් කෙනෙකු ලෝකය කොහි පිහිටියේ දැයි

"කස්මිං ලෝකෝ පතිට්ඨිතො" ඇසුවිට බුදුරදුන් එයට පිළිතුරු දුන්නේ "ලෝකය දුක උඩ පිහිටියේය" කියායි. (**"දුක්ඛෙ ලොකො පතිට්ඨිතො"**).

බුදුරදුන්ට පෙනුණේ මැවී ඇති සියලුම දෙයෙහි විද්‍යමාන වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණ තුනයි. උන්වහන්සේ නොයෙක් විට ඒ ගැන සාකච්ඡා කළා මිස මවන්නෙකු ගැන කථා කෙළේ නැත, සැළකිල්ල දැක්වූයේ නැත. එය එතරම්ම නිෂ්ඵල වූවක් බැවිනි. එවැනි දේ ගැන බුදුහු ස්වකීය අගනා කාලය මිඩංගු කිරීමට කැමති නුවූහ. නිෂ්ඵල ප්‍රශ්නවලදී උන්වහන්සේ බොහෝ විට නිශ්ශබ්ද වූහ. පිළිතුරු නො දී සිටියහ.

බුදුහාමුදුරුවෝ ගැලවුම් කාරයෙක් ද නොවෙති.

ආත්මයක් නැතැයි "අනත්ත" වදළ බුදුහු නැති ආත්මයක් ගැලවූයේද නැත. එතුමෝ විමුක්තියේ "දුකින් මිදීමේ", මාර්ගය පෙන්වා දුන්හ.

"තමන්ට පිහිට තමන්මය, අනිකෙක් කෙසේ පිහිට වේ දැ" යි "***අත්තාහි අත්තනො නාථො- කොහි නාථො පරොසියො***"**යි** අනුන්ගේ පිහිට පතන්නන් ගෙන් බුදුහු එක එල්ලේම ඇසූහ. ආත්ම ගෞරවයක් නැති, අනුන්ගෙන් උදව් උපකාර බලාපොරොත්තු වන, ස්වකීය මිනිස් බුද්ධියෙහි හා ශ්‍රමයෙහි වටිනාකම නො දත්, අභ්‍යන්තරික ගුණධර්ම බලයක් නැති, නොපෙණෙන බලවේගවලට වැඳ වැටෙන, යාච්ඤාකරණ. හීන, දීන හැඟීම් ඇති අයට මේ බුද්ධ වචනය හොඳ පාඩමකි. බුදුන්වහන්සේ කිසිම කෙනෙකු ගැලවූයේ නැත. එහෙත් සසර දුකින් මිදීමේ මාර්ගය ඉතා පැහැදිලි ලෙස පෙන්වා දුන්හ. එබැවින් උන්වහන්සේ ගැලවුම් කාරයක් ද නොවෙති.

ඉහත සඳහන් කරුණුවලින් බුදුන් වහන්සේ දෙවියෙකු හෝ මැවුම් කරුවෙකු හෝ ගැලවුම් කරුවෙකු හෝ නොව මානව සංහතියෙහි මෙතෙක් උපන් උත්තරීතර මනුෂ්‍යයා බව ඔප්පුවෙයි.

උන්වහන්සේ මිනිසෙකු වූ නිසාම බුදුවරයෙක් වූහ. බුදුවීම මිනිසෙකුට ම මිස වෙන මොනම දෙවියෙකුටවත් කළ හැක්කක් නොවේ. බුදුවීමෙන් උන්වහන්සේ මිනිස් බුද්ධියට, මිනිස් කමට, මිනිසෙකු විසින් ලබාදිය හැකි උසස්ම තැන, උසස්ම ගෞරවය ලබා දුන්හ. බුද්ධිමත්, ගුණවත් මිනිසා දෙවියන්ටත් වඩා උතුම් බව, බලවත් බව, ශ්‍රේෂ්ඨ බව පෙන්නූ එකම මනුෂ්‍යයා, එකම ශාස්තෘවරයා බුදුහාමුදුරුවෝයි.

"දෙවියෝ බුදුන් හමුවන්නට අවුත් වැඳ එකත් පසෙක හුන්හ."***("අඤ්ඤතරා දේවතා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි")*** බ්‍රහ්මයෝ බුදුන් හමුවන්නට අවුත් දකුණු දණ බිම ගසා ඇඳිලි බැඳ ප්‍රශ්න ඇසූහ."

"අථඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරා සංගං කරිත්වා දක්ඛිණ ජානුමණ්ඩලං පුථුවියං නිහනිත්වා යෙන භගවා තෙන අඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච."

මහබඹුට, දෙවිවරුන්ට, මැවුම් කරුවන්ට වැඳුම් පිදුම් කළ රටක, එබඳු යුගයක, මිනිසෙකු වූ බුදුන්වහන්සේ ඉපිද අනික් මිනිසුන් බල බලා සිටිද්දී දෙවියන්ගෙන්, බඹුන්ගෙන් වැඳුම් පිදුම් ලැබූහ. ගරු බුහුමන් ලැබූහ. ඇප උපස්ථාන ලැබූහ. මීට වඩා ආශ්චර්යයක් ඒ යුගයේදී ලෝකයේ කවර නම් මනුෂ්‍යයෙකුගෙන් සිදු වී තිබේ ද? සිල්වත් ගුණවත් මිනිසාට දෙවියන් පවා ගරු බුහුමන් කරන බව බුදුහු පැවසූහ.

තමන්ට නොපෙනෙන, නොවැටහෙන හැම බලයක්ම දෙවියන් පිට පැටවූ මිනිසාට ඒ දෙවියන්ගේ පිහිට නැතුව, තමන්ගේම පිහිට ලබාගන්නා ලෙස "**අත්ත දීපා විහරථ, අත්ත සරණා න අඤ්ඤ සරණා**" බුදුහු වදළහ. ආත්ම ශක්තිය, ආත්ම විශ්වාසය, ආත්ම ගෞරවය, ආත්මාභිමානය හා ජිවත්වීමේ නියම ක්‍රමය පිළිබඳව මෙයට වඩා විචාරාත්මක, බුද්ධිමත් ප්‍රකාශයක් තවත් ඇද්ද? මිනිස් බුද්ධියෙන්, මිනිස් ශ්‍රමයෙන්, මිනිස් බලයෙන් ලොව කළ නොහැකි දෙයක් නැති බවත් ඒවා අනුන් පිට පවරා මිනිසුන් ස්වකිය බුද්ධිය හා ශ්‍රමය ක්‍රියාවේ නොයොද එයින් වැඩ නොගෙන නිකම් සිටිම මිනිස්කමට මදිකමක් බවත් පැවසූ බුදුන් වහන්සේ

> හොඳ වැඩ ආරම්භ කරව්! ඒ වැඩ සඳහා නික්මෙව්!! ඒ වැඩවල යෙදෙව්! යි කීහ.
> **"ආරභථ! නික්ඛමථ!! යුඤ්ජථ!!! බුද්ධසාසනෙ"**

යයි හමුද පතියකුමෙන් ස්වකීය සුචරිත හමුදව දිරි ගැන්වූහ, ඉදිරියට යැවූහ.

බෞද්ධයන් වශයෙන් අපට ඇති ලොකුම සතුට, ප්‍රීතිය සැනසීම හා ආඩම්බරය නම් අප අදහන අපේ ශාස්තෘවරයා ඉතිහාසයක් නැති දෙවියෙකු නොව්, ඉතිහාසයක් ඇති උත්තරීතර මනුෂ්‍යයකු වීමයි.

චුන්ද කර්මාරපුත්‍රයාගේ ආහාර වැළඳීමෙන් පසු බුදු රදුන්ට දරුණු රෝගයක් වැළඳුණේය. එවිට බුදුහු "ආනන්දය, හොඳටම වතුර පිපාසයි. ඉක්මනට පැන් ටිකක් ගෙනත් දෙන්න." ය යි තෙවරක් ම අනඳ තෙරුන්ගෙන් ඉල්ලා සිටියහ.

4 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම ආචාර්යවරයාණෝයි

අධ්‍යාපන විද්‍යාවත්, අධ්‍යාපන මනෝ විද්‍යාවත් මනාව දත් ආචාර්යවරුන්, මහාචාර්යවරුන් හා දිසාපාමොක් ආචාර්යවරුන් අතර බුදුන් වහන්සේ ප්‍රධාන තැන ගති. බෞද්ධයෝ උන් වහන්සේ තිලෝගුරු නමින් හඳුන්වයි. බුදුරදුන් තරම් අතිවිශාල ශිෂ්‍ය සංඛ්‍යාවකගේ අවංක ආදරය, අවංක ගෞරවය හා අවංක භක්තිය දිනාගත් ගුරුවරයෙක් ගුරු සංහතියෙහි මෙතෙක් ඉපදී නැත.

මුලින්ම උන්වහන්සේට සිටියේ ශිෂ්‍යයන් පස්දෙනෙකි. පිරිනිවන් පාන විට දඹදිව නොයෙක් නගරවල, නොයෙක් පළාත්වල සැතපුම් සියගණන්, දහස්ගණන් ඈත පවා විසිරී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව ලක්ෂ ගණනකි. මිනිස් ඉතිහාසයෙහි තමන් කළ කථාවලින්, දේශනාවලින්, අවවාදවලින්, උගැන්වීම්වලින් ඉතාම විශාල පිරිසක් තමන් වෙත අවනත කරගත් එකම කථිකයා, එකම දේශකයා, එකම අනුශාසකයා, එකම ගුරුවරයා බුදුන්වහන්සේයි.

උන්වහන්සේගේ දේශනා අසා අන්‍ය ශාස්තෘවරුන්ගේ බැතිමත්තු සිය ගණනින් දහස් ගණනින් බුදුන්වහන්සේ සරණ යන්නට පටන් ගත්හ. ඒ ශාස්තෘවරු, බුදුරදුන්, මායාකාරයෙකි ආවර්තනි මායාවක් දනිතැ"යි කියන්ට වූහ. මෙය ඇසූ භද්දිය නම් ලිච්ඡවි රජු,

"ඔබ වහන්සේ, මිනිසුන් ඇද ගැනීමේ, බැඳ ගැනීමේ, අල්ලා ගැනීමේ ක්‍රමය (ආවර්තනි මායාව.) දන්නවාය කියන්නේ, සැබෑද? යි විචාළහ. එවිට බුදුහු,

"භද්දියෙනි, ඇසූ පමණින්, පරම්පරාවෙන් ආ පමණින්, ඉතිහාසයේ ආ පමණින්, පෙළෙහි ආ පමණින්, තර්කයට ගැලපුණු පමණින් න්‍යායට ගැලපුණු පමණින් කිසිවක් නොපිළිගත යුතුය. තමාටම සත්‍ය යයි පෙනුණොත්, වැටහුණොත්, අවබෝධ වුණොත් පමණක් පිළිගත යුතු යයි වදාළහ."

"සුතං මෙතං භන්තෙ මායාවී සමණො ගොතමො ආවට්ටනි මායං ජානාති. සො අඤ්ඤ තිත්ථියානං සාවකෙ "ආවට්ටෙතීති - පෙ-එථ තුම්හෙ භද්දිය මා පරම්පරාය මා ඉතිකිරාය-පෙ-අත්තනාව ජානෙය්‍යාථ."

(අංගුත්තර නිකාය - චතුක්ක නිපාත - භද්දිය සුත්ත)

මෙසේ වදාළ බුදුහු තමන් කුසල් අකුසල් පෙන්නා දෙනු මිස "ඔබ මගේ ශ්‍රාවකයෙකු වෙන්න" යයි කිසිකලක කිසිවෙකුට කියා නැති බව පැවසූහ. බුදුන්වහන්සේ කරා තම ශ්‍රාවකයන් දහස් ගණනින් ඇදී යනු දුටු අනික් ශාස්තෘවරුන් බුදුරදුන් ගැන ඊර්ෂ්‍යා කළ බව මෙයින් පෙනේ.

එකල උගැන්වීමේදී උපයෝගී කරගත් ප්‍රධාන ක්‍රමය නම් ගුරුවරයා දේශනා කරනවිට ශිෂ්‍යයා අසාගෙන සිටීමයි. "ශ්‍රාවක" යනු "අසා සිටින්නා" යනුයි. බුදුරදුන්ගෙන් බණ ඇසුවෝ "බුද්ධශ්‍රාවක නමින් හඳුන් වනු ලැබූහ.

බුදුහාමුදුරුවෝ මහා කාරුණික බැවින් කිසි දිනක තම ශිෂ්‍යයන්ට තරවටු නොකළහ. බැණ නොවැදුණහ, බිය නොවැද්දූහ, එලවා නොගත්හ, ශාරීරික දඬුවම් නොදුනහ.

උගැන්වීමේදී සිසුන්ට නොතේරෙන එකද

වචනයක් භාවිත නොකළහ. අධ්‍යාපන විද්‍යාවත්, මනෝවිද්‍යාවත් හොඳට දත් බුදුහු ශිෂ්‍යයන්ගේ චරිතයත්, අදහස්-උදහසුත් විනිවිද දැන, ඔවුන්ට යෝග්‍ය පරිදි උගැන්වූහ. බුදුරදුන්ට වඩා තුමුත් උගත්තුය ජගත්තු යයි සිතා බුදුරදුන් හමුවන්නට ප්‍රශ්න, අසන්නට ආ හැම කෙනෙක්ම අන්තිමට උන්වහන්සේගේ කිකරු ගෝලයෝ වූහ.

ඕනෑම කෙනෙකු දුටුහැටියේ ම මොහු මෙබඳු චරිතයක් ඇත්තෙකි, මෙබඳු සිතුම් පැතුම් ඇත්තෙකි. මොහුගේ අනාගතය මෙසේය. මොහුගේ අතීතය මෙසේයයි පමණක් නොව ඔහු උපන් පූර්ව ආත්මභාව ගණනක් පෙනෙන **"පරචිත්ත විජානන - පුබ්බෙ නිවාසානුස්සති"** නුවණක් මේ ශ්‍රේෂ්ඨතම ගුරුවරයාට තිබුණේය.

බුදුන්වහන්සේ මුරණ්ඩු ශිෂ්‍යයෙකුට දුන් ලොකුම දඬුවම "බ්‍රහ්ම දණ්ඩ" නමැති දඬුවමයි. "බ්‍රහ්ම දණ්ඩ" යනු උතුම් ශ්‍රේෂ්ඨ දඬුවම යනුයි. ආශ්‍රය කරන්නන් වැරදිකරු සමග කතා බස් නොකිරීමෙන් පමණක් ඔහු වර්ජනය කිරීමයි.

ඡන්න තෙරුන්ට මේ දඬුවම දෙන ලදි. බුදුරදුන් උපන්දින උපන්, සිදුහත් කුමාර කාලයේ ළඟින්ම ඇසුරු කළ රියැදුරුව සිටි ඡන්න තෙමේ ඒ ලොකු-කම හිතට ගෙන මහණ වූ පසුත් සැරියුත් මුගලන් ආදී මහරහතුන්ට පවා ගරු සරු නොකෙළේය. බුදුරදුන් හැර අනිත් අය නොතකා හැරියේය. එබැවින් බුදුහු ඔහුගේ මාන්නය දුරුකරනු පිණිස "බ්‍රහ්ම දණ්ඩ" නමැති දඬුවම නියම කළහ.

බුදුන්වහන්සේගේ උගැන්වීමෙහි ඇති විශේෂ ලක්ෂණයක් නම් උපමා, උදහරණ හා නිදර්ශණ කථා හැකි තරම් ගෙනහැර දක්වමින් උගන්වන කරුණ ශිෂ්‍යයාගේ හිතට තදින්ම අවබෝධකර ගැනීමට සැලැස්වීමයි. උන්වහන්සේ ඉගැන්වීමේදී උපයෝගි කරගත් උපමා පමණක් ගණන්කර බැලුවොත් දහස් ගණනකි. ඒ සියලු උපමා ගෙන ඇත්තේ එදිනෙද ජීවිතයෙන් හා වටාපිටාවෙනි.

ඉන් කීපයක් මෙසේය.

"ගොනාගේ පා අනුව යන කරත්ත රෝදය මෙන්" **(චක්කංච වහතො පදං)**.

සිරුර නොහැර යන සෙවනැල්ලක්මෙන්" **("ඡායාව අනපායිනී")**

"නයා දිරූ හම අරින්නාක් මෙන්" **("උරගො ජිණ්ණාමිච තචං පුරාණං")**

"වලාකුලින් නිකුත් සඳමෙන්" **("අබ්භාමුත්තොච චන්දිමා")**

"වාතය දුබල ගස පෙරලා දමන්නාක් මෙන්" **("වාතොරුක්ඛංච දුබ්බලං")**

"හැන්ද රස නොදන්නාක් මෙන්" **("දබ්බි සූප රසං යථා")**

"ගොනකු මෙන් වැඩෙයි" **("බලි වද්දෙව ජීරති")**

"දෙවු වහාම කිරි නොමිදෙන්නාක් මෙන්" **("සජ්ජු ඛීරංච මුච්චති")**

"දියාලුවෝ තමන් කැමති තැනට ජලය ගෙනයත්."

("උදකං හි නයන්ති නෙත්තිකා")

"ගොපල්ලා දණ්ඩෙන් ගසා ගවයන් ගොදුරට දක්කන්නා සේ" **("යථා දණ්ඩෙන ගොපාලො ගාවොපාජෙති ගොචරං")**

"කුඩාමැට්ට ගොයමට දෙසකි" **("තිණා දෙසානි ඛෙත්තානි.")**

මෙබඳු උපමාවලින් බුද්ධ දේශනාව පිරී ඇත.

ශිෂ්‍යයන්ට කරුණු අවබෝධ කිරීම සඳහා බුදුහාමුදුරුවෝ නොයෙකුත් කතන්දර දහස් ගණනක් ගෙනහැර දැක්වූහ. පන්සිය පණස් ජාතක පොතේ සඳහන් කතා සියල්ල ඒ ඒ අවස්ථාවල දී ඒ ඒ සිද්ධි අරභයා ශ්‍රාවකයන්ට දේශනා කළ කථාය.

බුදුරදුන්ගේ අනුපම රූසපුවෙන් වශී වී ඒ දෙස ම බලා සිටීම සඳහා මහණවී සිටි වක්කලි තෙරුන් අමතා 'වක්කලිය මේ කුණු සිරුරෙන් ඔබට ඇති ඵලය කුමක්දැයි'? ඇසූහ. මෙයින් උන්වහන්සේගේ සිරුර දෙතිස් කුණුපයෙන් යුත් මිනිස් සිරුරක් බව පැහැදිලි වෙයි.

4 වෙනි පිටුව බලන්න

ප්‍රශ්න ඇසීමෙන් ද, ශිෂ්‍යයන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් ද. යම්කිසි සිද්ධියක් නිමිති කරගෙන ධර්ම දේශනා කිරීමෙන්ද, සාකච්ඡා කිරීමෙන් හා ඔවුන්ට ම කරුණු අවබෝධ කරගන්ට උපක්‍රම යෙදවීමෙන් ද බුදුහු ස්වකීය අධ්‍යාපන සේවය සිදු කළහ.

උන්වහන්සේ වැඩ සිටි හැම ආරාමයක ම දම්සභා මණ්ඩපයක් විය. එහි මැද මුලසුන බුදුරදුන් සඳහා වෙන්කොට තිබුණි. භික්ෂූන් ධර්ම සාකච්ඡාවල යෙදී සිටින විට බුදුන්වහන්සේ ද එහි ගොස් තමන් සඳහා පනවා ඇති අසුනේ වැඩහිඳ සාකච්ඡාවට හවුල් වෙති.

"මා එන්නට පෙර කුමන කතාවක යෙදී සිටියාහුදැ? යි" (**"කායනුත්ථ භික්ඛවෙ එතරහි කථාය සන්නිසින්නාති"**) භික්ෂූන්ගෙන් අසති.

සම්පූර්ණ නිශ්ශබ්ද තාවයෙන් සිටි භික්ෂූන් අතරින් එක් භික්ෂුවක් නැගී සිට

"ස්වාමීනි, අපි රජුන් ගැන කථා, සොරුන් ගැන කථා (**"රාජ කථා, චෝර කථා"**) ආදි දේතිස් කථාවල යෙදී නොසිටියෙමු. අසවල් භික්ෂුව පිළිබඳ අසවල් සිද්ධිය ගැන කථා කරමින් සිටියෙමු" යි කියයි.

එවිට බුදුහු ඒ පිළිබඳ එතෙක් කිසිවකු නොදත් අපූරු විස්තරයක් ගෙනහැර දක්වති. ඒ ඇසූ භික්ෂුහු බුදුරදුන් ගැන වඩ වඩාත් පැහැදෙති, වඩ වඩාත් භක්තිමත් වෙති.

අනික් බොහෝ ගුරුවරුන් මෙන් බුදුන්වහන්සේ උගැන්වීම සඳහා ස්වකීය ආරාමයම, දම්සභා මණ්ඩපය ම, පමණක් උපයෝගි කර නොගත්හ. උන්වහන්සේ වැඩි වශයෙන් සිසුන්ට උගැන්වූයේ එළිමහනේදීය. උද්‍යාන. සුසානභූමි, ගල්තලා, වැලිතලා, රුක්සෙවණ, කුඹුරු, තණපිට්ටනි, දුගී පැල්පත්, මගතොට, මහවනය වැනි නිදහස් වටපිටාවක් ඇති තැන් උන්වහන්සේ ශිෂ්‍යයනට උගැන් වූ පන්ති කාමරයි.

ඒ ඒ තැනදී ඒ ඒ තැනින්ම, ඇස්හමුවේ ඇති දෙයින්ම උපමාගෙන හැර දැක්වූහ. ශිෂ්‍යයෙකු පා සෝදන්නට පැන් බඳුනක් ගෙනැත් තැබූවිට, ඒ පැන් බඳුන ම උපමා කොට එහිදී ම ඒ ශිෂ්‍යයා රහත් බවට පමුණුවන තරම් අගනා පාඩමක් උගන්වති.

චුල්ල පන්ථක තෙරුන්ට පිරිසිදු සුදුරෙදි කැබෙල්ලක් දී පායපු ඉරදෙස බලාගෙන ඇතින් එය පිරි මැද **"රජෝ හරණං රජෝ හරණං"** යයි කියමින් සිටින්ට උගැන්වූහ. එක ගාථාවක් හාරමසක් මුලුල්ලේ පාඩම් කොටත් කට පාඩම් කළ නොහැකිව කලකිරී සිටි ඒ තරුණ භික්ෂූනම බුදුරදුන්ගේ මනෝ විද්‍යාත්මක පාඩමෙන් රහත් බවට පත්විය.

කුඹුරු වැඩ කරන තැනකට වැඩිය විට නගුල, යොත, සී සෑම ගොවියා, ධාන්‍ය, හා ගවයින් උපමා කොට පාඩම් උගන්වති. මිනිසුන් නාමින් සිටින ගඟක් ළඟට වැඩිය විට ශුද්ධ නදියක නෑමෙන් පව්සෝද හැරිය නොහැකි බව කරුණු ඇතුව පෙන්වති. (**"කිං සුන්දරිකා කරිස්සති? කිං පයාගා?)**

වනයට වැඩිය විට එහි ගස්වල කොළ පෙන්වා තමන් දෙසූ දහම් හා නොදෙසූ දහම් එහි වැටී ඇති කොළවලට හා නොවැටී ඇති කොළවලට උපමා කරති. සුසාන භූමියකට වැඩි විට මළ සිරුරක් පෙන්වා එය නිදර්ශනයට තබාගෙන උගන්වති.

සිරිමා නමැති සුරූපී සුප්‍රසිද්ධ ගණිකාව හදිසියේ මැරුණු බව බුදුරදුන්ට ආරංචි විය. බුදුහු රූ සපුවෙන් මුළු නගරයම වසී කළ ඇගේ මිනිය ආදහන නොකොට සතුන්ට ළංවිය නොහැකි පරිදි දවස් හතරක් යන තුරු සුසාන භූමියේ ආරක්ෂා සහිතව තබන ලෙසත්, සතරවන දින නගරවාසී සියලු දෙනාම එහි රැස් කරවන ලෙසත් කොසොල් රජුට දන්වා යැවූහ. රජු එසේ කරවිය.

රජ අණ පරිදි නියමිත දින නියමිත වේලාවට සුසාන භූමියට පැමිණි මහජනකායෙන් අතුරු සිදුරු නැති විය. බුදුහු ශ්‍රාවකයන් සමග නියමිත වෙලාවට සුසාන භූමියට වැඩියහ. පැයට මසුරන් දහස් ගණනින් අගය කළ සිරිමාගේ සිරුර වෙන්දේසි කරන ලෙස රජුට කීහ.

"කැමැති කෙනෙකු ඉල්ලන්නට" යයි කියූ කොසොල් රජු වෙන්දේසිය මසුරන් දහසෙන් ආරම්භ කළේය. කිසිවෙකු නොඉල් වූ බැවින් මසුරන් පන්සියට බස්සවා, අන්තිමට එක මසුරම දක්වා ගණන පහත් කෙළේය. එසේ කොටත් කිසිවෙකු නොඉල් වූ විට නොමිළයේ ගෙනයන ලෙස දැන්වීය.

ඉදිමී පුයාව වැගිරෙමින් දුගඳ හැමූ ඒ මිනියට කිසිවෙකු කැමැති නොවූ බැවින් බුදුහු මේ අවස්ථාවෙහි එහි රැස්ව සිටි අතිවිශාල ජනකාය ඉදිරියෙහි රූපයෙහි අනිත්‍යභාවය, රූපය මායාවක් බව, රූපයට වාල්වීම මෝඩ කමක් බව පවසමින් රූසපුව ගැන රැවටීම පිළිබඳ ඉතා ප්‍රයෝජනවත් පාඩමක් උගැන්වූහ.

බුදුහු ඇතැම් විට ඇතැම් අයට බණ නොකීහ. අවවාද නොකළහ. ඔවුන්ටම කරුණු අවබෝධ කර ගැනීම පිණිස අගේ ඇති උපක්‍රම යෙදූහ.

කිසා ගෝතමී නමැති කාන්තාවකගේ එකම පුත්‍රයා කාලක්‍රියා කෙළේය. බොහෝ සුඛෝපභෝගී පවුලක උපන් ඇය මළ කෙනෙකුට පණ ලබා දෙන්නට නොහැකි බව නොදැන සිටියාය. නොයෙක් වෙදුන් ගෙන්වා තම මළ පුතාට පණ ලබා දෙන්නට බොහෝ උත්සාහ කොට බැරි තැන මළසිරුරත් රැගෙන බුදුරදුන් වෙත ගියාය. බුදුරදුන්ගේ පාමුල කුඩා පුතාගේ මිනිය තැබූ කිසා ගෝතමිය එයට පණ ලබාදෙන ලෙස ඉල්ලා සිටියාය.

මහාකාරුණික මනෝවිද්‍යාඥයා, ඇගේ ඒ ඉල්ලීම එකවරම ප්‍රතික්ෂේප නොකෙළේය. දරු ස්නේහයෙන් පිස්සු වැටී සිටි ඇයට බණ කීමෙන් පලක්, නැති බැව් දත් බුදුහු,

"හා ... හොඳයි පණ උපදවා දෙන්නම්" යයි බාරගත්හ.

හැම වෙදුන්ම බැරියයි කීම නිසා පිස්සු වැටී සිටි මේ තරුණ මවගේ හිසේ තිබුණ බර, බුදු වදනින් ටිකක් අඩුවිය.

"මා කියන බෙහෙත ගෙණැත් දුන්නොත් දරුවාට පණ උපදවා දෙමි" යි දෙවෙනි වරට බුදුහු කීහ.

"කුමක්ද ස්වාමීනි, බෙහෙත?"

"අබ මිටක් ...."

"හා ... ඒක මොකක්ද?, ඉක්මනටම ගෙනැත් දෙන්නම්" යයි කියමින් යන්ට පිටත් වූවාය.

"ඔහොම ඉන්න. හැබැයි ඒ අබමිට කෙනෙකු නොමළ ගෙදරකින් වෙන්නට ඕන"

"හොඳයි මම ගෙනැත් දෙන්නම්, බුදුහාමුදුරුවනේ."

කිසාගෝතමිය පුතුගේ මළ සිරුර කර පින්නාගෙන දෙව්රම් වෙහෙරින් නික්ම සැවැත් නුවර මහ විදියට බැස පළමුවෙන් ම හමුවුණු නිවසට ගොඩනගී.

"අනේ කරුණාකර මේ මගේ මැරුණු දරුවාට පණ උපදවා දෙන්නට අබමිටක් ගෙනෙන්නය කියා බුදුහාමුදුරුවෝ කිවා. කරුණාකර මට අබමිටක් දෙන්න."

ගෘහණිය ගෙට දුවගොස් අබමිටක් ගෙනවිත් දෙයි. කිසා ගෝතමිය එය අතට ගෙන

"මේ ගෙදර කවුරු හරි මැරිල තියෙනවද?

"ඔව්, අපේ සීයා මැරුණා. තාත්තා මැරුණා සහෝදරයක් මැරුණා."

"එහෙනම් මේ අබ මට එපා. මට ඕනෑ කෙනෙකු නොමළ ගෙදරකින් අබ මිටක්. මම එහා ගෙදරට යනවා."

මෙසේ කියමින් කිසාගෝතමිය ඊළඟ ගෙදරට ගියාය. එතැනින්ද අබ ලැබුණේය. එහෙත් එහිද නොමළ කෙනෙකු නැති නිසා ඊළඟ ගෙදරට ගියාය. මේ ක්‍රමයෙන් නගරයේ ගෙවල් සියගණනකට ගිය ඇයට ලැබුණේ එක සමාන පිළිතුරුය. එයින් ඇයට ක්‍රම ක්‍රමයෙන් හොඳ නුවණ පහළ වන්නට විය. මරණය, තම පුතාට පමණක් නොව තව බොහෝ දෙනෙකුට සිදුවී ඇති බව දැනගත හැකි විය.

එක අතකින් ඇයට හොඳ නුවණ පහළ වුණු අතර අනික් අතින් මළමිනියෙන් හමන



"මහණෙනි මේ සිටින එක භික්‍ෂුවකට හරි මා ගැන, ධර්මය ගැන, සංඝයා ගැන, මාර්ග ගැන, ප්‍රතිපද ගැන මොන විධියේ හෝ සැකයක් තිබේ නම් දැන් මගෙන් අහන්න. අපේ ශාස්තෘවරයා ජිවත්ව සිටියදී මේ ප්‍රශ්න අසන්නට බැරිවුනාය. මේ සැකය අත්හැර ගන්නට බැරි වුනාය කියා පසුව කනගාටු වෙන්ට එපා. ඒ නිසාම ඇසිය යුතු යමක් ඇත්නම් දැන්ම මගෙන් අසා දැනගන්න. මට ඇති ගෞරවය නිසා යමෙක් මගෙන් ප්‍රශ්න අසන්නට අකමැති නම් යහළුවකු ලවා හරි අස්වාගන්න"

4 පිටුව බලන්න

දුර්ගන්ධය ඉවසන්ට බැරිවිය. මරණය පිළිබඳ හරි අවබෝධයක් ලැබූ ඇය මළ මිනිය අමුසොහොනක දමා බුදුරදුන් වෙත ගොස් වැඳ වැටී මහණ කරන ලෙස අයැද සිටියාය. බුදුහු,

"මා ඉල්ලූ අබ අහුර ගෙනාවාදැ"යි ඇසූහ.

"අනේ ස්වාමිනි, මරණය ගැන මට දැන් හොඳ අවබෝධයක් ලැබුණා. කරුණාකර මා මහණ කරවා සදාකාලික මරණයක් නැති තත්ත්වයක් ලබා දුන මැනවි."

බුදුහු, ඇය මහණ කරණු සඳහා මෙහෙණි අසපුවට යැවූහ. මහණ වූ ඇය නොබෝ දිනකින් රහත් වූවාය.

මේ කතාවෙන් බුදුරදුන් බණ නොකියා, පාඩමක් උගැන්නූ හැටි පෙනේ. බණ කියා සිත සනසන්නට බැරි තරමට කිසා ගෝතමිය දරු සොවින් පිස්සු වැටී සිටි මවකි. ඇයට ඒ අවස්ථාවෙහි බණකිම සුදුසු නොවිය. එබැවින් බුදුහු බණ නොකීහ. ඒ වෙනුවට මරණය පිළිබඳ තත්වාවබෝධයක් ඇයටම ලබා ගන්නට උපක්‍රමයක් යෙදූහ.

ඇතැම් ගුරුවරු ශිෂ්‍යයන් නොදත් දේ දැන ගැනීම සඳහා ප්‍රශ්න ඇසීම ගැන කැමති නැත. බුද්ධ කාලයෙහි බුදුරදුන්ට වඩා වැඩි මහලු වූ, ශාස්තෘන් ලෙස පෙනී සිටි, පැවිදි සමූහයකගේ ආචාර්‍ය්‍ය වූ සුප්‍රකට වූ බොහෝ ලාභ සත්කාර ලැබූ, දර්ශනවාදී, බොහෝ දෙනාගේ ගෞරවයට පාත්‍ර වූ "**සඞ්ඝිනො, ගණිනො, ගණාචරියා, ඤාතා, යසස්සිනො, තිත්ථ කරා, සාධු සම්මතා බහු ජනස්ස**" පූර්ණ කාශ්‍යප ආදී ශාස්තෘවරු සදෙනෙක් විසූහ.

සභිය නමැති පරිබ්‍රාජකයා ඔවුන් එක් එක්කෙනා හමුවෙන්නට ගොස් ප්‍රශ්න ඇසූ විට පිළිතුරු නොදෙති. කිපෙති, දෙස් පවරති, නොසතුටු වචන හා ඉරියවු දක්වති. (**"සභියෙන පරිබ්බාජකෙන පඤ්හෙ පුට්ඨෙ නෙව සම්පායන්ති අසම්පායන්තා කොපඤ්චදෙසඤ්ච අප්පඤ්චයඤ්ච පාතු කරොන්ති"**)

එවිට සභිය පරිබ්‍රාජකයා මෙසේ සිතිය.

"මේ මහණ බමුණෝ ඉතා තලතුනාය, වෘද්ධය, මහලුය, බොහෝ කල් ජීවත් වූ අයය, වයස්ගතය, මහණකමින් ස්ථිරය, ශාස්තෘන් ලෙස ලෝකයා පිළිගත් අයය, මහණ වී බොහෝ කල් ගිය අයය. (**"ජිණ්ණා, වුද්ධා. මහල්ලකා, අද්ධගතා, වයො අනුප්පත්තා, ථෙරා රත්තඤ්ඤු, චිර පබ්බජිතා"**) එහෙත් නොදන්නා දෙයක් දැන ගැනීම සඳහා ප්‍රශ්නයක් ඇසූවිට කිපෙති, තරහ වෙති, කඩාගෙන පනිති, දෙස් පවරති. මොවුන්ගේ හැටි මෙහෙම නම්, මගේ මේ පරිබ්‍රාජක වේශය අත්හැර ගිහි වීම හොඳය කියා හිතෙනවා. කෙසේ වුවත් ශ්‍රමණ ගෞතමයන් හමු වී ප්‍රශ්න අසා බලන්න ඕන.

ශ්‍රමණ ගෞතමයෝ ඉතාම තරුණය. පැවිද්දෙන්ද නවකය. (**"සමනො හි ගොතමො දහරො චෙ ව ජාතියා. නවො ච පබ්බජ්ජාය."**) එසේ වුවත් ශ්‍රමණ ගෞතමයන් තරුණය. ලාබාල යයි පරිභව නොකළ යුතුය. ඔහු මහා සෘද්ධිමත්ය, මහානුභාව සම්පන්නය. (**"සමණො බො දහරොති න පරිභව තබ්බො. දහරොපි චෙස සමණො ගොතමො මහිද්ධිකෙහොති මහානුභාවො"**) එබැවින් බුදුරදුන් හමුවී ප්‍රශ්න අසමි" යි

සිතා බුදුරදුන් වෙත ගොස් පිළිසඳර කතා බස් කොට,

"මගේ සිතේ සැක සහිත කරුණු රාශියක් තිබේ. ඒ පිළිබඳ ප්‍රශ්න අසන්නට කැමැතියි. ඔබ වහන්සේ ඒවාට පිළිතුරු දෙනවා දැයි ඇසිය.

"සභිය, ඔබ බොහෝ දුර සිට (යොදුන් 700 ක්) මගෙන් ප්‍රශ්න ඇසීමේ බලාපොරොත්තුවෙන් ආවෙහිය. ඕනෑ තරම් ප්‍රශ්න අසන්න. ඒ ප්‍රශ්න එකින් එකට පිළිවෙළින් ධර්මානුරූපව අර්ථානුරූපව පිළිතුරු දෙමි"යි බුදුහු කීහ. (**"දූරතොව**

ආගතොසි සභිය පඤ්හෙ පුච්ඡිතුං ආකංඛ මානෝතෙ සන්තකරො භවාමි පුච්ඡො - අනුපුබ්බං අනුධම්මං ව්‍යාකරොමි තෙ.")

සභිය ඒ අසා පුදුමයෙනුත් පුදුමයට පත්ව

"ඇත්තෙන්ම හරිම පුදුමයි. අනික් මහණ බමුණන්ගෙන් ප්‍රශ්න අසනවා තබා, ප්‍රශ්න අහන්න අවසර ගන්නවත් බොහොම අමාරුයි. එහෙත් මේ ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් ඉතා සතුටින් අවසර ලැබුණා. **'අච්ඡරියං වත භො අබ්භුතං වත භො යාවතාහං අඤ්ඤසු සමණ බ්‍රාහ්මණෙසු ඕකාස කම්ම මත්තම්පි නාලත්ථං කිං මෙ ඉධ සමණෙන ගොතමෙන ඕකාස කම්මං කතං'**

යයි ප්‍රීතියෙන් පිනාගොස් ප්‍රශ්න අසන්ට පටන් ගත්තේය.

(සුත්ත නිපාත - සභිය සූත්‍රය)

මෙයින් ගුරුවරයෙකු වශයෙන් බුදුරදුන්ගේ ඇති ශ්‍රේෂ්ඨත්වය වටහාගත හැකිය. බුදුහු තමන්ගෙන් ප්‍රශ්න ඇසූවිට නිර්භීතව මුහුණ දී ඒවාට නියම පිළිතුරු දුන්නා මිස, කිසි විටෙක ප්‍රශ්න ඇසීම ගැන අසතුටු බවක් නොදැක්වූහ. ප්‍රශ්නවලින් පැන යන්නට කිසි විටක නොසිතූහ. ප්‍රශ්න අසන තරමට කැමැති වූහ. බුදුරදුන්ගෙන් ප්‍රශ්න අසන හැම කෙනෙකුගේම හදවත උන්වහන්සේගේ නුවණැසට පෙනේ. බුදුහු එය දකිමින් ඔවුන්ගේ සිතුම් පැතුම් අනුව පිළිතුරු දෙති. ඇතැම් උගත් බමුණෝ බුදුරදුන් වෙහෙසට පත්කිරීම සඳහා ප්‍රශ්න ඇසූහ. ඒ ප්‍රශ්නවලට දක්ෂලෙසින් පිළිතුරු දුන් බුදුහු ඔවුන්ගේ මානය බිඳ, නිහතමාන කොට, ඔවුන් ලවා ම

"භගවත් ගෞතමයන් වහන්ස ඔබතුමන්ගේ දහම් දෙසුම ඉතාම හොඳයි "භගවත් ගෞතමයන් වහන්ස ඔබ තුමාගේ ප්‍රශ්න විසඳීම ඉතාම යහපත්ය. යටිකුරු කරන ලද්දක් උඩුකුරු කොට තබන්නේ යම්සේද, වසන ලද්දක් විවෘත කොට දක්වන්නේ යම්සේද, මංමුළා වූවෙකුට මග කියන්නේ යම්සේද එපරිද්දෙන්ම ඔබ තුමන් විසින් නන් අයුරින් දහම් දෙන ලදී. ඔබ තුමන් ද, ධර්මය ද, සංඝයා ද,සරණ යමි. අද පටන් දිවි හිමිකොට තෙරුවන් සරණගිය උපාසකයෙකැයි මා ගැන සිතාගනු මැනැවැ"යි කියවා ගත්හ.

("අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ ව තල පජ්ජොතං ධාරෙය්‍ය ... භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මං ච භික්ඛු සංඝඤ් ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතං")

(සංයුත්ත නිකාය - බ්‍රාහ්මණ සංයුත්ත - ධනං ජානි සූත්‍රය)

සච්චක, අම්බට්ඨ, සෝණදණ්ඩ, කූටදත්ත, පොට්ඨපාද, පායාසි, සභිය, සේල ආදි ත්‍රිවේද පාරප්‍රාප්ත බමුණන්ටත් **ආලවක** ආදී යක්ෂයන්ටත් ප්‍රශ්න ඇසීමෙන් බුදුරදුන් පරදවන්ට නොහැකි විය.

එක් ශිෂ්‍ය භික්ෂුවක් බුදුරදුන් ඉදිරියෙහි අකීකරු ලෙස හැසුරුණේය. ඔවුන්ගේ **අතීත** චතගොත හොඳින් දත් බුදුහු ඔවුන් කෙරෙහි කිසි කලෙක නොකලකිරුණහ. ඔවුන්ට අනුකම්පාව ම දැක්වූහ.

"සැවැත් නුවර පොහොසත් පවුලක ගෘහපතියෙක් බිරිඳ මියගිය පසු මහණ වී ගෙදර තිබුණු බඩුමුට්ටු, රෙදිපිළි ධනධාන්‍ය ආදී සියල්ල පන්සලට ගෙන්වා ගෙන, වැඩකරුවන් ලවා හොඳට උයවා පිසවාගෙන, කමින් බොමින්, දවාලට පොරවන සිවුර රෑට නොපොරවා, රෑට පොරවන සිවුර දවාලට නොපොරවා, බොහෝ පිරිකර බඩු භාණ්ඩ ඇතිව විසිය. ඔහු "**බහු භාණ්ඩික**" නමින් ප්‍රසිද්ධ විය.

දිනක් තමන් සතු සිවුරු, ඇඳ ඇතිරිලි ආදිය



"මහණෙනි, දීමෙහි හා බෙදීමෙහි අනුසස් මම දන්න තරම් අනික් අයත් දන්නව නම් ඒ කිසිවෙක් ටිකක් හරි අනුන්ට නොදීනම් අනුභව කරන්නෙ නැහැ. මසුරු කමට ඉන්නෙ නැහැ. තමන් කකා සිටින අන්තිම බත් පිඩෙන් කොටසක් හරි එය පිළිගන්ට කෙනෙකු සිටිනවා නම් ඉන් කොටසක් හරි නොදී අනුභව කරන්නෙ නැහැ."

5 පිටුව බලන්න

රාශියක් අව්වේ වනා වේලෙන තුරු පැත්තකට වී බලා සිටින විට, දනව් සැරිසරණ භික්ෂුහු එහි පැමිණ "රද තොටෙක පිළිවනාපියා තුබුවා සේ බොහෝ සිවුරු හා පිළි වනාපියා තුබුවා දැක" මේවා කාගේ දැ? යි විමසූහ.

බහුභාණ්ඩික භික්ෂුව ඒ සියල්ල තමන්ගේ බව කි විට

"ඇවැත්නි, බුදුන් අනුදැන වදළේ තුන්සිවුරු පාත්‍ර පමණක් නොවේද? අල්පේච්ඡ වූ බුදුන්ගේ සස්නේ මහණව මෙතරම් පිරිකර ගොඩක් එකතුකර ගෙන සිටින්නේ මන්දැ"යි අසා

බුදුරදුන් ළඟට එක් කරගෙන ගොස් ඒ බව පැමිණිලි කළහ. එවිට බුදුහු,

"මා සැහැල්ලු ජීවිතයෙහි අනුසස් කියමින් සිටියදී ලත් ලත් දෙයක් දන්නොදී බොහෝ පිරිකර රැස් කරගෙන සිටින්නේ ඇයි දැ? යි ඇසූහ.

භික්ෂුවට ක්ෂණයෙන් තරහ ගියේය. පොරවාගෙන සිටි සිවුර සිව්වනක් පිරිස මැද පැත්තකට විසි කොට

"ඔබ වහන්සේ කියන්නේ මට මෙහෙම ඉන්නදැ? යි ඇඳ තිබුණු අඳනයෙන් පමනක් යුක්තව සිටියේය.

බුදුරදුන් ඉදිරියෙහි ඒ භික්ෂුව දැක්වූ අවිනිත, දඩබ්බර කම ගැන සෙනග මවිත වී බලාසිටියහ. එවිට බුදුහු ඔහු කෙරෙහි මහා කරුණාව යොදවා

"මහණ මේ ඔබ ඔබ කෙරෙහි අතිශයින් අනුකම්පා කටයුතු අවස්ථාවකි. අද ඔබ ලැජ්ජා බිය නැතුව මෙසේ සිටියත්, මීට පෙර ආත්මයක දියරකුසෙක්ව ඉපිද අවුරුදු දෙළහක් මුළුල්ලේ "ලැජ්ජා බිය" යනු කුමක්දැ යි දැනගනු සඳහා එය සොයමින් සිටියෙහිය ***(දේවධම් ජාතකය).***

එකල ලැජ්ජා බිය ගැන එතරම් සැලකිල්ලක් දැක්වූ ඔබ මේ ගරු කටයුතු සසුනෙහි පැවිදිව සිවුපිරිස මැද සිවුර විසි කොට ලැජ්ජා නැතිව සිටින්නේ කුමක් නිසාදැ"යි ඇසූහ.

භික්ෂුවට හොඳ සිහිය ලැබී හණික බිම තිබුණු සිවුරගෙන පොරවා ගත්තේය.

(සද්ධර්ම රත්නාවලිය - බහුභාණ්ඩික තෙරුන්ගේ වස්තුව)

මෙබඳු තන්හිදී බුදුහු ශ්‍රෙෂ්ඨ ගුරුවරයෙකු තුළ තිබිය යුතු මහා කාරුණික බව පෙන්වූහ.පුරාණ කාලයේ දඹදිව වේදය හා වෛද්‍ය, නක්ෂත්‍ර, යන්ත්‍ර, මන්ත්‍ර, නාට්‍ය, සංගිත ආදි හැම ශාස්ත්‍රයක් ම දත් දක්ෂ ගුරුවරුන් අතර "**ගුරු මුෂ්ඨිය**" රැක ගැනීමේ සම්ප්‍රදය තදින්ම පැවැත්තේය. කොටින්ම තමන් දත් ශාස්ත්‍රය සම්පූර්ණයෙන්ම ශිෂ්‍යයන්ට නොඉගැන්වූහ. ආත්ම ආරක්‍ෂව සඳහා ඉතාම හොඳ කොටසක් අනුන්ට නොදී රැක ගත්හ.

එබඳු සම්ප්‍රදයක් පැවැති යුගයක උපන් බුදුහු තමන් දත්, අනුන්ට අවශ්‍ය සියල්ලම නිර්ලෝභීව උගැන්වූහ.

"ආනන්දය තථාගතයන් වහන්සේගේ ධර්මයෙහි ගුරු මුෂ්ඨියක් නැතැයි **"නත්ථානන්ද තථාගතස්ස ධම්මේසු ආචරිය මුට්ඨී"** බුදුහුම අනඳ තෙරුන්ට කිහ.

තමන් දත් දෙය අනුන්ට කියාදීමේ බලවත් කැමැත්ත බුදුරදුන් තුළ කෙතරම් තදින් තිබුණේ දැයි කියතොත් අසූ වයසට පැමිණ පිරිනිවන් පාන්ට සූදනම්ව මරණමඤ්චකයේ වැඩසිටිමිනුත් භික්ෂුන් අමතා උන්වහන්සේ තුන්වරක්ම ප්‍රකාශ කළේ,

"මහණෙනි යමක් මගෙන් දැනගන්නට තිබේනම්, දැන්ම අසන්න. පසුව කනගාටු වෙන්න එපා. බුදුරදුන් ජීවත්ව සිටියදි අපට අසවල් කරුණ ගැන අසා දැනගන්නට බැරිවුණා යයි කියා. ඒ නිසා ඕනෑම දෙයක් දැන් මගෙන් අහන්න බැරිනම් මිත්‍රයෙකු ලවා අස්වන්න. මම ඒ ඕනෑම ප්‍රශ්නයකට ඉතාම සතුටින් පිළිතුරු දෙන්නම්." යනුවෙනි.

(මහා පරිනිබ්බාණ සූත්‍රය)

අනික් සියලුම ශාස්තෘවරයෝත්, ගැලවුම්

කරුවොත්, මැවුම් කරුවොත්, නායකයොත් තමන් සමාන තවත් කෙනෙකුගේ ඇතිවීමක් හෝ පහළ වීමක් හෝ නොදැක්වූහ. නොකැමැති වූහ. නොපැතූහ.

එහෙත් අපේ බුදුහාමුදුරුවෝ ලෝකයේ හැම කෙනෙකුන්ම තමන් සමාන බුදුවරුන් වෙතොත් ඒ තරමට කැමැති වූහ. ඒ තත්ත්වය ලබාගන්නා ක්‍රම උගැන්වූහ. තමන් දැරූ ශ්‍රේෂ්ඨත්වය, තමන් ලැබූ සම්‍යක්සම්බුද්ධ භාවය අන් හැම දෙනාට ම ලැබේවා යනු උන්වහන්සේගේ අවංක ප්‍රාර්ථනාව විය.

> උත්සාහ ගණිතොත්, වීර්‍ය්‍ය වඩතොත් පෙරුම් පුරතොත් හැම කෙනෙකුන්ට ම බුදුවරුන් විය හැකියයි උන්වහන්සේ වදාළහ.

බුදුහාමුදුරුවෝ "මෙය මෙසේ කරව, මෙසේ නොකළහොත් මම තොපට මෙසේ දඬුවම් කරමි"යි කිසි දිනක කිසිවෙකුට තරවටු නොකළහ. "හොඳ මේය, නරක මේය, හොඳ කළොත් මෙබඳු යහපත් විපාක ලැබේය. නරක කළොත් මෙබඳු නරක විපාක ලැබේයයි" කරුණා, සීතල හදවතකින් යුක්තව හොඳ නරක හා එහි පලවිපාක පෙන්වා දුන්හ.

මේ මහා කාරුණික ගුරුතුමා තුළ පෞද්ගලිකත්වයක්, ආත්ම ලාභයක් ඉඳිලාවත් නැත. ගෝලයන්ගෙන් වැඳුම් පිදුම් ලාභ ප්‍රයෝජන පුද පූජා කිසිවක් කිසි දිනක බලාපොරොත්තු නොවූ මේ පුදුම ගුරුවරයා ලාභ. සත්කාර, කීර්ති, ප්‍රශංසා දරුණුය. තියුණුය. අනුත්තර වූ රහත් බව ලැබීමට අන්තරාය කරයයි පිළිකුල් කළහ.

මේ පුදුම ගුරුන්නාන්සේ කිසිම කෙනෙකු "නරක" යයි හංවඩු නොගැසූහ. අත් නොහළහ. එළවා නොදැමූහ. සමාජය විසින් නරක යයි හංවඩු ගසනු ලැබූ මිනිසුන් සොය සොයා ගොස් ඔවුන් හමුවී කාරුණිකව කතාබස් කොට හොඳ මිනිසුන් කළහ.

ගුරුභක්තියේ මූර්තියක් වූ අංගුලිමාල එකල දඹදිව විසූ හැම කෙනෙකුන්ට ම අතිභයංකර මිනිමරුවෙකි. නම ඇසූ පමණින් රජු ඇතුලු මුලු රටවැසියා ම බියෙන් කම්පිත වූහ. මොහු මරා දමන්නට කළ හැම ප්‍රයත්නයක්ම ව්‍යර්ථ විය. **මේ දරුණු මිනී මරුවා තුළ රහතන්වහන්සේ කෙනෙකු සැඟවී සිටි බව හෙවත් රහත්වීමේ භාග්‍යය තිබෙන බව ඒ කිසිවෙක් නොදුටුවෝය. තිලෝගුරු තුමා පමණක් දුටුවේය**. මඟ දෙපස ජනකාය,

> "අනේ, ස්වාමිනි ඔහේ වඩින්න එපා, අංගුලිමාලයා සිටිනවා, ඔහු දුටුවන් මර මරා ඇඟිලි කපා ගන්නවා. ඔබතුමා ගියොත් ඔබතුමාද මරා ඇඟිලි කපා ගනීවි. වඩින්න නම් එපා"

යයි වැඳ වැටී පෙරැත්ත කරමින් කියද්දී ඒ කිසිත් නොතකා මේ නිර්භීත ගුරුවරයා අකීකරු චණ්ඩි පුතෙකු සොයා යන දයාබර පියෙකු මෙන් අංගුලිමාලයා කරා ගොස් ඔහු හික්මවා, කීකරු කොට අහිංසක භාවයේ අති උච්චස්ථානය හෙවත් අන්තිම හිනි පෙත්ත වූ මහ රහත් බවට පැමිණෙව්වේය. මෙසේ කළේ අමුතු විජ්ජා බලයකින් නොව මහා කරුණා බලයෙනි.

සුප්‍රසිද්ධ අම්බපාලි නගර සෝභිනිය විහාරයට අවුත් දනට ආරාධනා කළවිට

> "නුඹ ප්‍රසිද්ධ වෙශ්‍යාවක්ය. නුඹේ නිවසට මා අවුත් දන් වැළඳුවොත් රටේ නොයෙක් කතා ඇතිවේය ඒ නිසා මට බැරිය"යි

ඒ ආරාධනය ප්‍රතික්ෂේප නොකළහ. සතුටින් පිළිගත්හ.

ලිච්ඡවී රජුන් ද එදිනම දනට ආරාධනා කළවිට මුලින් අම්බපාලියගේ ආරාධනය පිළිගෙන සිටි බැවින් රජුගේ ආරාධනයයි නොතකා ප්‍රතික්ෂේප කළහ.

ශ්‍රාවකයන් සමග අම්බපාලියගේ නිවසට වැඩිය බුදුහු දන් වළඳ දහම් දෙසා, ඇය ගණිකා වෘත්තියෙන් සදහටම මිදුණු මහා උපාසිකා බවට පත් කළහ.

හැම ගුරුවරයෙකුගේම ශ්‍රේෂ්ඨ ගතිගුණ මෙන්ම

බුදුහු "මහා කාශ්‍යපය ඔබේ මේ සිවුර සිනිඳුය" යි කීහ. "ස්වාමිනි මට අනුකම්පාකොට මේ සිවුර ඔබ වහන්සේ පිළිගනු මැනවි" "කාශ්‍යපය, පෙරවීමෙන් පරණ වී හණ වැහැරියෙන් කළ මගේ පාංශුකූල සිවුර පොරවා ගන්නට ඔබ කැමැත්තෙහිද?" "එසේය මම කැමැත්තෙමි."

7 පිටුව බලන්න

සුළු සුළු දුර්වලකම් ද තිබිය හැකිය. ගුරුවරයෙකු මැන ගැනීමේ පුදුම දක්ෂ කමක් ශිෂ්‍යයන්ට තිබේ. එහෙත් කිසිම ශිෂ්‍යයෙකුට කිසිම කලක, කිසිම දුර්වලකමක්, කිසිම අඩු-පාඩුවක් පෙනෙන්නට නැතුව සිටි එකම ගුරුවරයා බුදුන් වහන්සේය. උන්වහන්සේ වටා සිටි දහස් ගණන් ශිෂ්‍යයන් අතර එකද ශිෂ්‍යයෙකුටවත් උන්වහන්සේගේ උත්තරීතර තත්වය මෙපමණ යයි මැනගන්නට නොහැකි විය. ගුරුවරයෙකු තුළ පිහිටිය යුතු ඉතාම අවශ්‍ය ගුණාංග සියල්ලම මේ මහා ආචාර්ය වරයා තුළ විද්‍යමාන විය.

මෛත්‍රිය, කරුණාව, ඉවසීම, චරිත ශුද්ධිය ආදර්ශවත් බව, උගන්වන හැම විෂයයක් පිළිබඳ සැබෑ ඇනුම බුද්ධිමත් භාවයෙන් අගතැන්පත් බව, ශිෂ්‍යයන්ට හොඳට තේරෙන ලෙස කියාදීම, ශිෂ්‍යයනට සැක සිතෙන කිසිවක් නැති බව, රහසේවත් වැරදි නොකරන බව, පරානුකම්පාව, ඊර්ෂ්‍යා ක්‍රෝධ ආදී දුර්වලකම් සියල්ලම නැති බව, ආදී දහසක් ගුණධර්ම වලින් පිරුණු මේ උත්තරීතර ගුරුවරයා කරා, රජවරු රාජ්‍ය සම්පත් අත්හැර, සිටුවරු සිටු සම්පත් අත්හැර, ඇමතිවරු ඇමතිකම් අත්හැර, ස්වාමිපුරුෂයෝ භාර්යාවන් අත්හැර, භාර්යාවෝ ස්වාමිපුරුෂයන් අත්හැර, මවුපියෝ දූ දරුවන් අත්හැර, දූදරුවෝ මව් පියන් අත්හැර, ගෘහපතියෝ ගෙවල් දෙරවල් අත්හැර අවුත් ශිෂ්‍යයන් බවට පත්වූහ.

අඞ්ගුත්තරාපයෙහි "**ආපණ**" නම් නියම් ගමට වඩින විට බුදුන්වහන්සේ පසුපස පේළියට ගිය ශිෂ්‍ය පිරිස 1250 කි. ප්‍රශාන්ත සංයමයෙන් හා ඉන්ද්‍රිය දමනයෙන් යුක්තව පෙලට වැඩිය බුදුරදුන් ප්‍රධාන භික්ෂු සංඝයා දුටු මුලු නියම්ගමම ආලෝලිත විය. ගෙවල්වල සිටි ස්ත්‍රී පුරුෂ හැම දෙනම මග දෙපසට පැමිණ බලා සිටින්නට වූහ. එහි විසූ සුප්‍රසිද්ධ "**කේණිය**" නමැති ධනවත් ජටිලයා මේ මහා ශ්‍රමණ පිරිස දැකීමෙන් ම පැහැදී පසු දින දවල් දනය සඳහා ආරාධනා කෙළේය. බුදුහු

"අප පිරිස ඉතා වැඩිය. මෙතරම් විශාල පිරිසකට පසුදින දන් පිළියෙල කිරීම දුෂ්කරය "යි

ආරාධනාව නොපිළිගත්හ. තුන්වරක් ම ඉල්ලා සිටීමෙන් පසු පිළිගත්හ.

"**කේණිය**" ජටිලයා මුළු ගමේ ම සෙනග රැස්කරවා දනය පිළිබඳව කටයුතු ඔවුනොවුන්ට බාර දී පසු දින 1250 ක් වූ බුදුපාමෙක් මහසඟනට දන් දුන්නේය.

"අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛු සංඝෙනාති, එවං වුත්තෙ භගවා කෙණියං ජටිලං එතදවොච. මහා බො කෙණිය භික්ඛු සංඝො අඩ්ඪතෙළසානි භික්ඛු සතානි. ත්වඤ්ච බො බ්‍රාහ්මණෙසු අභිප්පසන්නොති. - පෙ - දුතියම්පි බො භගවා කෙණියං ජටිලං එතදවොච. මහා බො කෙණිය භික්ඛු සංඝො. අඩ්ඪ තෙළසානි භික්ඛුසතානි... තතියම්පි වො ගෞතම කෙණියො ජටිලො භවන්තං එතදවොච කිඤ්චාපිවො මහා භික්ඛු සඞ්ඝො අඩ්ඪ තෙළසානි භික්ඛු සතානි. අහඤ්ච බො බ්‍රාහ්මණේසු අභිප්පසන්නො. අධවාසෙත් වෙච මේ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛු සංඝෙනාති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන."

(සුත්ත නිපාත - සෙල සූත්‍රය)

1250ක් වැනි විශාල පිරිසකට එක දිනක දී දන් පිළියෙල කිරීමේදී දයකයන්ට විඳින්නට සිදුවන කරදර මැනැවින් දත් බුදුහු අනුන්ට පීඩාවන විදියේ සංග්‍රහ ලබන්නට කැමති නුවූ හ. ආරාධනය තුන් වරක්ම ප්‍රතික්ෂේප කිරීමෙන් ඒ බව පෙනේ.

මේ උත්තරීතර ගුරුවරයා ගුරු ගෞරවය ඉතා උසස් හැටියට සැළකූහ. බුදු වීමෙන් පසු පළමු කොටම සොයා බැලුවේ ගෞරව දැක්වීම සඳහා අවවාද අනුශාසනා ලැබීම සඳහා තමන්ට ගුරුවරයෙක් සිටීද කියායි. සොයා බැලූ විට

ගුරුවරයෙකු තබා තමන්ට සමාන කෙනෙකුවත් නැති බව පෙණුනේය.

"න මෙ ආචරියො අත්ථි සදිසො මෙ නවිජ්ජති"
"මට ගුරුවරයෙක් නැත".

එබැවින් බුදුහු ධර්මය ගුරුවරයා හැටියට තබා ගත්හ. **ලෝකයේ සිටින සියලුම ගුරුවරුන්ට බුදුන් වහන්සේ ආදර්ශයකි. ගුරුවරුන් ගුරුකම් කිරීමේදී බුදුන් වහන්සේ ශිෂ්‍යයන් තැනූ හැටි, ශිෂ්‍යයන්ට උගැන් වූ හැටි, ශිෂ්‍යයන් අවනත කරගත් සැටි, ශිෂ්‍යයන් යහමග යෙදවූ හැටි, ශිෂ්‍යයන්ගේ ජීවිත සාර්ථක කළ හැටි. ශිෂ්‍යයන් ගේ පරමාර්ථ ඉෂ්ට කළ දුන් හැටි ගැන හොඳින් සළකා බැලිය යුතුයි.**

සාධු චර්යාවේ මූර්තිය

බුදු හිමියො උන් වහන්සේ විසින් දේශනා කරන ලද සියලුම
සාධුචර්යාවන්හි මූර්තියයි.
ඉතා විචිත්‍රවුත්, අතිශය සාර්ථක වුත් 45ස් වසරක ධර්ම සේවයේදී
බුදුරජාණන් වහන්සේ තමන් විසින් දේශනා කළ
සියළු දේ ක්‍රියාවට නගාලූහ. කිසිම අවස්ථාවකදී
උන්වහන්සේ මානුෂික දුර්වලතාවයකට ඉඩ නුදුන්හ.
බුදු හිමියන් වහන්සේ විසින් වදාරන ලද
සාධු චර්යා පද්ධතිය ලෝකයට මෙතෙක් ලැබුණු
සර්ව සම්පූර්ණ සාධු චර්යා පද්ධතිය වේ.

ජර්මන් විද්වතකු වන මහාචාර්ය මැක්ස් මුලර්

තුන්වැනි දින ද බුදුහු ඔහුගේ ම ගෙදරට පිඩුසිගා වැඩියහ. එදින ද බමුණා පාත්‍රය පුරවා බත් බෙද 'ඔබ පුන පුනා (නැවත - නැවත) මෙහි එන්නෙහිය. කෑම ගැන කෑදර කෙනෙකැයි සිතමි' යි ඇනුම් පදයක් කිය.

8 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම අවිහිංසාවාදියාණෝයි

බුදුන්වහන්සේ අබෞද්ධයකු බෞද්ධ කිරීමේ දි පොරොන්දු පහකට බඳවා ගත් හ. එයට පඤ්චශීල යයි කියනු ලැබේ. ඒ පඤ්චශීලයේ පළමු පොරොන්දුව හෝ ගිවිසුම පණ ඇති සතකු නො මරණ බවට පොරොන්දු වෙමි යනුයි. **මෙයින් පෙනෙන්නේ බෞද්ධයකු වීමේ දී මූලික වශයෙන් තිබිය යුතු ගුණය අවිහිංසාවාදී බව ය යනු යි.** බුදුන්වහන්සේ හැම ක්‍රමයක ම හිංසාව හෙළා දැක්කා හ. මිනිසුන්ට පමණක් නොව සියලු සතුන්ට ම මෛත්‍රිය දක්වන ලෙස නියම කළ හ.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ

සියලු දෙන ම දඬුවමට භයවෙත්, සියල්ලෝ ම මරණයට බිය වෙත්. ඒ නිසා තමාත් දඬුවමට හා මරණයට බිය බැවින් තමා ම උපමා කොට සිතා අනුනන් නො නැසිය යුතු ය. නො මැරි යුතු ය.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස -සබ්බෙසං ජීවිතං
පියංඅත්තානං උපමං කත්වා -න හනෙය්‍ය න ඝාතයෙ

සියලු දෙනා ම දඬුවමට තැති ගණිත්. සියල්ලන්ට ම ජීවිතය ප්‍රියය. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතු ය.

බුදුන් වහන්සේ හා මහාවිර හැර අනික් ශාස්තාවරු තිරිසන් සතුන්ට කරුණාව නො දැක්වූහ. තිරිසන් සතුන් මරා මස් පිණිස අනුභව කිරිමට අනුබල දුන් හ. එබැවින් තිරිසන් සතුන් ගේ ගෞරවයට අනික් ශාස්තෘවරු හිමි නො වෙති. මහාවීර අවිහිංසාව පිළිබඳ ව සීමාව ඉක්මවීය. ඔහු ගේ පරම ධර්මය අවිහිංසාවයි. ඔහු ජලයට පවා පණ ඇතැයි සලකයි. ජලය මැඩ ගෙන ඔරු පාරු ආදි යාත්‍රාවලින් යැම පවා පාපයක් කොට සලකයි. ආශ්වාස ප්‍රශ්වාස කිරිමේ දි පවා කුඩා ප්‍රාණීන් මැරෙන බැවින් මුඛවාඩමක් පාවිච්චි කරන ලෙස නියම කරයි. බුදුරදුන් අනුදැන වදළ ත්‍රිකෝටි පාරිශුද්ධ මාංසය පවා නොපිළිගනි. මේ නිසා කිසි ම ජෛන ආගමිකයෙක් මස් මාළු අනුභව නො කරයි. මේ සීමාන්තික අවිහිංසවාදය නිසා ජෛන ආගම ඇදහිමට දුෂ්කර එකක් විය. ඉන්දියාවෙන් පිටතට එය පැතිර ගියේ නැත. ගොවිකම් කිරිමේ දී පවා සතුන් මැරෙන බැවින් ජෛනයෝ වෙළෙඳම හැර ගොවිකම් ආදී වෙන කර්මාන්තවල නො යෙදෙති.

බුදුන් වහන්සේ ගේ අනුශාසනය මධ්‍යම ප්‍රතිපදව බැවින් උන් වහන්සේ සීමාන්තය අත්හළහ. එබැවින් ම උන් වහන්සේ ගේ අනුශාසනය ලෝකයේ ඕනෑම රටක ඕනෑම වැසියකුට පිළිපැදිය හැකි තරමට මධ්‍යස්ථය. උන්වහන්සේ සතුරු මිතුරු, ලොකු කුඩා අඳුනන නාඳුනන, දුටු නුදුටු හැම සතකුගේ ම ජීවිතය ප්‍රාණය, ඒ සතාට ප්‍රිය බව සැළකූහ. මෛත්‍රී කිරිමේ දි හැම තරාතිරමක ම, හැම සතකුම, අඩංගු වනු සඳහා

අපාදකෙහි මෙ මෙත්තං - මෙත්තං ද්වීපාදකෙහි මෙ
චතුප්පදෙහි මෙ මෙත්තං -මෙත්තං බහුප්පදෙහි මෙ

මා ගේ මෛත්‍රිය පා නැති නයි පිඹුරු පොළොං ආදි දිර්ඝ ජාතින් හා ය. මා ගේ මෛත්‍රිය දෙපා ඇත්තන් හා ය. මා ගේ මෛත්‍රිය සිවුපා ඇත්තන් හා ය. මා ගේ මෛත්‍රිය පැත්තෑ, කංකුඩු ආදි බොහෝ පා ඇත්තන් හා ය.

සබ්බෙ සත්තා සබ්බෙ පාණා - සබ්බෙ භූතා ච කෙවලා
සබ්බෙ භද්‍රානි පස්සන්තු - මා කඤ්චි පාපමාගමා

හැම සත්වයෝ ද හැම ප්‍රාණීහු ද හැම භූත යෝද යන මේ හැම දෙන ම යහපතක් ම දකිත්වා. මොවුන් කෙරෙන් කිසිවකු කරාත් දුකක් නො පැමිණෝවා යනුවෙන් බුදුන් වහන්සේ හැම කෙනෙකුට ම මෙත් වඩන ලෙස උගැන්වූහ.

උන් වහන්සේ ගේ දේශනාවෙහි අනුන්ට හිංසා

පීඩා හා පාඩු අලාභ සිදු වන විදියේ තබා එවැන්නක් සිදුවීමට තුඩු දෙන විදියේ වචනයක් හෝ අදහසක් අඩංගු වී නැත. කකචූපම සූත්‍රයෙන් බුදු මෙසේ වදරති. **උභතො දණ්ඩකෙන පි චෙ භික්ඛවෙ කකචෙන චොරා ඔචරකා අඞ්ග මඞ්ගානි ඔකංකෙයයුං තත්‍රා පි යො මනො පදුසෙයන, න මෙ සො තෙන සාසනකරො. තත්‍රාපි වො භික්ඛවෙ එවං සික්ඛිතබ්බං න චෙව නොචිත්තං විපරිණාතං භවිස්සති. නච පාපිකං වාචං නිච්ඡාරෙස්සාම. හිතානුකම්පිච විහරිස්සාම මෙත්තචිත්තා න දොසන්තරා තඤ්ච පුග්ගලං මෙත්තාසහගතෙන චෙතසා එරිත්වා විහරස්සාම. තදරම්මණංච සබ්බාවන්තං ලොකං මෙත්තා සහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන එරිත්වා විහාරිස්සාමානි. එවංහි වො භික්ඛවෙ සික්ඛිතබ්බං.**

මහණෙනි. ඉදින් දරුණු හොරුන් අවුත් දෙපැත්තේ දඬු ඇති මහකියතකින් ශරීරයේ කොටස් කැලිවලට කපද්දි යමෙක් ඒ හොරුන් කෙරෙහි හිත අමනාප කර ගත්තොත්, දූෂිත හිතක්, තරහ හිතක් ඇති කර ගත්තොත් හෙතෙමේ මගේ අනුශාසනය කරන්නෙක් නො වේ. පිළිපදින්නෙක් නො වේ. මහණෙනි, එබඳු අවස්ථාවක දි වුවත් තොප විසින් මෙසේ සිතිය යුතු ය. අපේ හිත වෙනස් වන්නේ නැත. මොවුන්ට තද වචන නො කියන්නෙමු. හිතානුකම්පි ව. තරහ නො වී මෛත්‍රිය පතුරුවමු. ඒ මෙත් සිතට අරමුණු වූ සියලු ලෝකයා කෙරෙහි මහත් වූ අප්‍රමාණ වූ වෛර නැති මෛත්‍රිය පතුරුවා වසන්නෙමු යි කියායි මහණෙනි හතුරකු කෙරෙහි වුවත් මෙසේ සිතන්නට පුරුදු විය යුතු යි.

(කකචූපම සූත්‍රය - මජ්ඣිම නිකාය)

"තමන් ගේ සිරුර කැලිකැලිවලට කපන හතුරා කෙරෙහිත් මෛත්‍රිය නො වඩා තරහ හිතක් ඇති කර ගත්තොත් ඔහු බුදුරදුන් ගේ අවවාද පිළිපදින්නෙක් නො වේ ය. බුදුරදුන් අනුගමනය කරන්නෙක් නො වේ ය"යි බුදුහු පවසති. මෙය මෙසේ නම් හිංසාව ගැන කුමන කතාද? මොන ම කරුණක් නිසා වත්, මොන ම කෙනෙකුට වත් හිංසාවක්. පීඩාවක් කිරීමට බුදුන් වහන්සේ ගේ ධර්මයෙන් බෞද්ධයෙකුට ඉඩක් නැත. එබැවින් සැබෑ අවිහිංසකවාදියා බුදුන් වහන්සේ ය. සැබෑ සිතින් බුදුන් වහන්සේ අදහන හැබෑ බෞද්ධයන් අතර හිංසාවක්, පීඩාවක්, ප්‍රාණඝාතයක්, කලහයක්, ආරවුලක්. අමනාපයක්, ගහ බැණ ගැනීමක්, ලේ හැලීමක් ඇති වන්නට මොන ම ඉඩක් වත් නැත. යම් පිරිසක් අතර මේවා සිදුවෙතොත් එහි තේරුම ඔවුන් හැබෑ බෞද්ධයන් නො වන බව යි. මෛත්‍රියේ මූර්තිය වූ බුදුන් වහන්සේ අවිහිංසාවාදයේ ද මූර්තියයි.

බුදුන් වහන්සේ ගේ අවිහිංසා ප්‍රතිපත්තිය ආසියාතිකයන් තුළ කොතරම් දුරට බල පැවැත්වූයේ දැයි කියතොත් ජාතින් අතර හා රටවල් අතර යුද්ධ කිරීම බොහෝ දුර අඩු විය. යුද්ධ කොට ජය ගෙන යුද්ධ කිරීම සඳහට ම නැවැත්වූ **ධර්මාශෝක** වැනි අවිහිංසාවාදි මහාඅධිරාජයෙක් පහළ විය. **සිරිසඟබෝ** වැනි ධාර්මික රජ වරු ඇති විය. **මහත්මා ගාන්ධි ජවහර්ලාල් නේරු** වැනි අවිහිංසාවාදී ලෝක ප්‍රසිද්ධ ජනනායකයෝ පහළ වූහ. පෙරදිග, අපරදිග යන දෙදිගෙන් ඉතා ම වැඩියෙන් ප්‍රාණඝාතය හෙවත් සතුන් මැරීම කෙරෙන්නේ අපරදිග ය. සතුන් මැරීම තබා මස් මාංසවත් අනුභව නො කරන ඉතා ම වැඩි පිරිසක් සිටින්නේ පෙරදිග ය. කුරු කුහුඹියකුටවත් හිංසාවක් නො කොට සියලු සත්වයෝ නිදුක් වෙත්වා යි අවංක කරුණාවෙන් ප්‍රාර්ථනා කරන්නන් ඉතා ම වැඩි පිරිසක් සිටින්නේ පෙරදිග ය. මෙයට හේතුව අවුරුදු 2500ට පසුත් බුදුන් වහන්සේ ගේ අවිහිංසා ධර්මය පෙරදිග මිනිස් සමාජයේ සිත් තුළ බල පැවැත්වීම යි, බෞද්ධ සිතුම් පැතුම් ජන ජීවිතයට කාවී තිබීමයි.

දිනක් කෙනෙකු ලෝකය කොහි පිහිටියේ දැයි 'කස්මිං ලෝකෝ පතිට්ඨිතෝ' ඇසූවිට බුදුරදුන් එයට පිළිතුරු දුන්නේ ලෝකය දුක උඩ පිහිටියේය' කියායි. ('දුක්ඛෙ ලොකො පතිට්ඨිතො'). 'බුදුරජුන්ට පෙනුණේ මැවී ඇති සියලුම දෙයෙහි විද්‍යමාන වන අනිත්‍ය, දුක්ඛ , අනාත්ම යන ලක්‍ෂණ තුනයි.

10 පිටුව බලන්න

පරිච්ඡේදය 4

බුදුහාමුදුරුවෝ මේ මිහිපිට උපන් මිනිසුන් අතර ඉතාම වැඩියෙන් දුක්වින්ද මිනිසායි

බුදුරජාණන් වහන්සේ සිද්ධාර්ථ තාපස කාලයෙහිත් එයට පෙර ආත්ම භාව රාශියකත් විමුක්තිය, මෝක්ෂය සෙවූ තවුසකු වශයෙන් අප්‍රමාණ දුක් වින් ද හ. මෝක්ෂය ලැබීමේ - ශුද්ධිය ලැබීමේ එක ම මාර්ගය ශරීරයට දුක් දීම යයි විශ්වාස කළ තවුසන් ගේ උපදෙස් පරිදි බෝධිසත්වයන් වහන්සේ ද විඳිය හැකි හැම දුකක් ම විඳ ඇත. සිරුරට දුක් දෙන හැම තපස් ක්‍රමයක ම යෙදී ඇත.

"ශාරිපුත්‍රය, මම වස්ත්‍ර නො හැඳ, අචේලක ව, නිගණ්ඨයෙක් ව ශිෂ්ටසම්මත ආචාරවිධි අත් හැර විසීමි. අතට බෙදු ආහාර අනුභව කොට අත ලෙව කෑවෙමි. ආහාර ගැනීමට නිවසට එන ලෙස ආරාධනා කළත් ඒ ආරාධනා නො පිළිගත්තෙමි. තමන් උදෙසා පිළියෙල කළ ආහාර, කළමුවින් නගා දෙන ආහාර හැළිමුවන් නගා දෙන ආහාර, එළිපත අතර කොට සිට දෙන ආහාර, දණ්ඩක් අතර කොට සිට දෙන ආහාර මොහොළක් අතර කොට සිට දෙන ආහාර, ගැබිනියක අතින් දෙන ආහාර, කිරි පොවන්නියක අතින් දෙන ආහාර, බල්ලකු බලා සිටිද්දී ඌට නොදී දෙන ආහාර, මැස්සන් රුස්ව ඇති තැන දී දෙන ආහාර නොපිළිගැනීමේ ව්‍රතවල යෙදුනෙමි. දියමස් ගොඩමස් හා සුරා පිළී නොගතිමි.

ශාරිපුත්‍රය, මම පිඩු පිණිස එක ම ගෙයකට පමණක් ගියෙමි. එකම, පිඩෙකින් පමණක් යැපුනෙමි. පිඩු පිණිස ගෙවල් දෙකකට පමනක් ගියෙමි. පිඩු දෙකකින් පමණක් යැපුනෙමි. පිඩු පිණිස ගෙවල් හතකට ගියෙමි. පිඩු හතකින් පමණක් යැපුනෙමි. කුඩා බත්තැටියකින් දෙකකින් හතකින් යැපුනෙමි. දවසකට වරක් දෙදවසකට වරක් සත්දවසකට වරක් අඩ මසකට වරක් ආහාර ගතිමි. ඒ මම, අමුපලා පමණක් ආහාර කොට ගතිමි. බඩහමු, ඌරුහැල්, කපාහළ, සම්කසට, මැලියම්, හාල්කුඩු දඩුබත්, මුරුවට, තණකොළ ගොම වන මුල් සවයං පතිත ගෙඩි ජාති, පමණක් අනුභව කෙරෙමින් තපස් රැක්කෙමි. ඒ මම, හණ වැහැරි නොයෙක් නූල් වගී මිශ්‍ර කොට විසූ වස්ත්‍ර මළමිනි එතූ පාංශුකූල වස්ත්‍ර, රුක්පතුරෙන් කළ පිළී අඳුන් දිවිසම්, කුසතණවැහැරි, නියදවැහැරි, පුවරුවැහැරි, කෙස්වලින් කල කම්බිලි, අස්ලොමින් කල කම්බිලි හා බකමුහුණු පියාපතින් කළ වැහැරි ද ඇන්දෙමි. ඒ මම හිස රැවුල්බූ ගානු වෙනුවට තල් ඇටෙන් කෙස් රැවුල් උගුලා දැම්මි. කිසිම ආසනයක වාඩි නො වීමේ ව්‍රතවල යෙදුනෙමි. උඩුකුරුව සිටිම උක්කුටුක ව හිඳීම,කටු ඇතිරියෙහි සක්මන් කිරීම, කටු සවි කළ වැතිරෙන පුවරුවෙහි නිඳ ගැනිම වැනි ව්‍රතවල යෙදුනෙමි. මෙසේ සිරුරට දුක් දීමේ නන්වැදෑරුම් තපස්ක්‍රම පිළිපැද්දෙමි.

ශාරිපුත්‍රය. ඒ මම කොතරම් දරුණු රුක්ෂප්‍රතිපදවල යෙදුනෙම් දැයි කියතොත් අවුරුදු ගණනක් නො නා සිටිමෙන් දුවිලි දඩිය ඇඟේ ගොඩ ගැසී ඇඟට ඇලී ඇඟේ තැනින් තැන පැල්වලම් පැලී තිබුණි. මගේ ශරීරය ඉතා පැරැණි පතුරු ගැසී ඇති තිඹිරිකණුවක් බඳු විය. එහෙත් මේ ගොඩ ගැසුනු දඩිය හා දූවිලිපිස

දමමි, නැතහොත් අනිකකු ලවා පිස දම්මවා ගනිම් යි මට සිතුනේ නැත. මාගේ තපස්ක්‍රමයේ ඇති අතිශය රූක්ෂ බව හෙයින් වටහා ගත හැකිය.

ශාරිපුත්‍රය, ඒ මම පවට කොතරම් පිළිකුල් කෙළෙම් දැයි කියතොත් කුඩා ප්‍රාණිහු නො මැරෙත්වා යි ඉතා පරිස්සමින් එහා මෙහා ගමන් කෙළම්. දියබින්දුවෙහි පවා කුඩා සතුන් ඇතැයි දයාව පෙන්වීම්.

ශාරිපුත්‍රය, ඒ මම සම්පූර්ණ විවේකය පතාවනයෙහිදි ගොපල්ලකු හෝ තණ කපන්නකු හෝ වනකැම්යෙක් හෝ දිටිම් නම් ඒ වනය අත් හැර වෙන වනයකට ගියෙමි. වනමුවකු මිනිසුන් දැක වනයකින් වනයකට ලැහැබකින් ලැහැබකට යන්නා සේ මිනිස්සු මා නො දකිත්වා. මම මිනිසුන් නො දකිම්වා යන සිතින් මිනිසුන් දැකිමෙන් සම්පූර්ණයෙන් ම ඈත් විමි.

ශාරිපුත්‍රය, ඒ මම දෙනුන් වෙතට පැමිණි වසුපැටවුන්ගේ ගොම, දෙදණ දෙවැලමිට බිම තබා ගෙන අනුභව කෙළෙම්. මා ගේ ම මළමුත්‍ර ද පස් හා අළු ද අනුභව කළෙම්.

ශාරිපුත්‍රය, ශුද්ධිය සෙවීමේ තවුසකු වූ මම තදින් හිම වැටෙන සමයෙහි සීතලෙන් වෙව්ලවෙව්ලා මහ රෑ මහ වනයෙහිගත කෙළෙම්. තද ග්‍රීෂ්මසමයෙහි එළිමහනෙහි විසීම්. විතරාගියකු හැර වෙන ඕනෑ ම කෙනෙකු බියෙන් වෙව්ලන සුලු මහවනයෙහි හුදෙකලා ම වාසය කළෙම්.

ශාරිපුත්‍රය, ඒ මම සොහොනෙහි මිනි ඇට, කොට්ටය වෙනුවට හිස තබාගෙන සයනය කෙළම්. එකල මා වෙතට ගොපලු දරුවෝ පැමිණ කෙළ ගැසූ හ. මුත්‍ර කළහ. පස් දැමූ හ. කන්සිදුරුවල කෝටු ගැසූහ. එහෙත් මම ඔවුන් කෙරෙහි පව්ටු සිතක් පහළ නො කෙළම්.

ශාරිපුත්‍රය, ආහාරයන් ශුද්ධිය වෙතැ යි බලාපොරොත්තු වූ ඇතැම් මහණ බමුණන් මෙන් මම ද එකම ඩෙබර ඵලයක් අනුභව කොට විසීම්. එකල ඩෙබරඵල ලොකුවට තිබෙන්නට ඇතැයි ඔබට සිතිය හැකිය. ඇත්තෙන් ම එකල ඩෙබරඵල මෙකල ඩෙබරඵල හා සමානයි. කිසිදු වෙනසක් නැත. එකම ඩෙබරපලයක් ආහාර කොට ගත් මගේ කය අතිශයින් කෘශ විය.

මගේ අග පසග ආසිතිකවැල්පුරුක්, කැල්වැල් පුරුක් බඳු විය. මගේ තට්ටම්දෙක වටුකුරයක් බඳු විය. මගේ කොඳු ඇටය ඇට එකට ඇමුනු ඇටවැලක් හා සමාන විය. මගේ ඉල ඇට දිරා වැටුනු ගෙයක පරාල හා සමාන විය. මගේ ඇස්දෙකේ තාරකා දෙක ගැඹුරු ළිඳක දිය යටින් පෙනෙන තාරකා මෙන් යටට කිඳ තිබුණේය. මගේ හිසේ සිවිය තිත්ත ලබුගෙඩියක් අමුවෙන් කඩා අව්වේ වේලා ගත්කල යම් සේ ද එසේ විය.

ශාරිපුත්‍රය අල්ප ආහාරය නිසා මා කොතරම් කෙට්ටු වුනා දැයි කියතොත් මම උදරසිවිය පිරිමදිමින් (බඩ අතගාමින්) අත ගෑ කල්හි මා අතට අහුවුනේ පිටකටුවය. පිටකටුව ඇල්ලූ විට මා අතට අහුවුනේ උදරසිවිය ය. අල්ප ආහාර නිසා මගේ උදරසිවිය පිටකටුව හා ඇලී තිබුණේ ය. මා මළමුත්‍ර පහකරන්නට ගිය විට යටිකුරුව වැටෙයි. මා අතින් මගේ ඇග අතගාන විට මුල් දිරූ ලෝම බිමට ඇද හැලෙයි.

ශාරිපුත්‍රය, අල්ප ආහාරයෙන් ශුද්ධිය වෙතැයි විශ්වාස කළ තවුසන් අනුව ගිය මම ද මුං ඇටයකින්, සහල් ඇටයෙන් යැපුනෙමි. ශාරිපුත්‍රය, එක හාල්ඇටයක් හුගක් ලොකුවට තිබෙන්නට ඇතැයි ඔබට සිතිය හැකි ය. ඇත්තෙන්ම නැහැ. එකල හාල් ඇටය ද මෙකල හාල් ඇටය හා සමාන ම ය. කිසිදු වෙනසක් නැත.

ශාරිපුත්‍රය, මම මෙබඳු දුෂ්කරක්‍රියා කොටත්

ආත්ම ගෞරවයක් නැති, අනුන්ගෙන් උදව් උපකාර බලාපොරොත්තු වන, ස්වකීය මිනිස් බුද්ධියෙහි හා ශ්‍රමයෙහි වටිනාකම නො දත්, අභ්‍යන්තරික ගුණධර්ම බලයක් නැති, නොපෙනෙන බලවේගවලට වැඳ වැටෙන, යාච්ඤාකරණ. හීන, දීන හැඟීම් ඇති අයට මේ බුද්ධ වචනය හොඳ පාඩමකි. බුදුන්වහන්සේ කිසිම කෙනෙකු ගැලවූයේ නැත. එහෙත් සසර දුකින් මිදීමේ මාර්ගය ඉතා පැහැදිලි ලෙස පෙන්වා දුන්හ. එබැවින් උන්වහන්සේ ගැලවුම් කාරයක් ද නොවෙති.

11 පිටුව බලන්න

මනුෂ්‍යධර්මයට වැඩි වූ ආයර්ෂභාවය කිරීමට සමර්ථ වූ ඥානදර්ශන විශේෂයක් නො ලැබුවෙමි."

(මජ්ඣිම නිකාය - මහාසීහනාද සූත්‍රය)

බුදුරදුන් තමන් වින්ද අප්‍රමාණ දුක් පිළිබඳ ඉහත සඳහන් විස්තරය කෙළේ එසේ මෙසේ කෙනෙකු සමග නොව අග්‍රශ්‍රාවක වූ සැරියුත් මහරහතන් වහන්සේ සමග ය. ඒ විස්තරයෙන් උන් වහන්සේ කොතරම් දුක්විඳපු කෙනෙක් ද යනු මනාව වටහා ගත හැකි ය.

මානව ඉතිහාසයෙහි කිසිම මිනිසෙක් බුදුරදුන් තරම් දුක් විඳ නැත. මෙසේ දුක් වින්දේ පෞද්ගලික ප්‍රයෝජනය පිණිස නොව ලෝකයාට ඇති දයාව නිසාය. සත්‍යය සොයා ගනු පිණිසය. නිවන අවබෝධ කර ගනු පිණිස ය. මිනිසකුට වින්ද හැකි අන්තිම ඉහළ ම දුක් වින්ද බුදුහු, බුදුවීමෙන් පසු ඒ බව ස්වකීය ප්‍රධාන ගෝලයා සමග නිහතමානී ව පැවසූ හ. දුක් විඳ, දුක් පත්ව සිට, උසස් වූ විට ඒ බව පැවසීමට මැලිවීම බොහෝ දෙනාගේ සිරිත ය. බොහෝ දෙනා එ සේ පැවසීම තමන්ට මහත් මදිකමක්, අවනම්බුවක් කොට සලකති. එහෙත් බුදුන් වහන්සේ බුද්ධත්වය නැමැති ශ්‍රේෂ්ඨත්වය ලබා ගත්තේ මහාමන්දිරවල සුඛෝපභෝගි ජිවිත ගතකරමින් සිට නො ව ඒ හැම කම්සැපයක් ම අත් හැර දමා දුක් විඳීම් නැමැති "අත් හඳ බැලීම් හා පලපුරුදු මගින් බව ප්‍රකාශ කළහ. ශ්‍රේෂ්ඨපරමාර්ථ ඉෂ්ට කර ගැනීමට, ශ්‍රේෂ්ඨත්ව ලබාගැනීමට දුක් නො විඳ නො හැකි බවට බුද්ධචරිතය හොඳ නිදසුනකි. සැප විඳිමින් උසස් පරමාර්ථ ඉෂ්ඨ කර ගත් අය ඉතා දුර්ලභය. සැප විඳීමෙන් උසස් සේවයක් කළ අය ද දුර්ලභ ය. උසස් සේවයක් කිරීමට නම් දුක් විඳිය යුතු ය. සැප සම්පත් අත් හළ යුතු ය. පොදු මහජනයා ගේ තත්ත්වයට වැටිය යුතු ය. මහජනයා විඳින දුක දැක්ක යුතු ය. එහිරස විඳිය යුතු ය. තමන් දුක් නොවිඳ අනුන් ගේ දුක් නැති කළ නො හැකි ය. ලෝකයාට අවංකව ම සේවය කිරීමට නම් බුදුන් වහන්සේ මෙන් දුක් විඳිමෙන් ලත් අත්දැකිම් ඇත්තකු විය යුතු ය.

සහනය - සාමය - මෛත්‍රිය

ඉබේම පැන නගින අනිවාර්ය ප්‍රශ්නය නම්
බුදුහිමියන්ගේ ශ්‍රේෂ්ඨ සංදේශය අද ලොවට කොපමණ ගැලපේද
යන්නයි. එය අද ලොවට ගැලපෙන්නේ විය හැකියි. අද ලොවට
නොගැලපෙන්නේත් විය හැකියි. එසේ වුවද, අපි බුදුහිමියන් විසින්
අනුදන්නා ලද ප්‍රතිපත්ති අනුගමනය කරන්නෙමු නම් අපට අන්තිමේදී
ලෝක සාමයත්,
ජගත් ශාන්තියත් දිනාගත හැකිවේ.

ශ්‍රී නේරු ඉන්දියාවේ හිටපු අගමැති

බුදුහාමුදුරුවෝ ලෝකයා වෙනුවෙන් ඉතාම වැඩි පරිත්‍යාග කළ උතුමාණෝයි

බුදු වීම සුවිසි අසංඛ්‍ය කල්ප ලක්ෂයක් වැනි අතිදීර්ඝ කාලයක් මුළුල්ලේ අප්‍රමාණ පරිත්‍යාග කිරීමෙන් ම ලැබිය යුතු තත්ත්වයකි. බුදුවරයකු වීමට අවශ්‍යයෙන් ම පිරිය යුතු ගුණධර්ම දහය අතර පරිත්‍යාගය - දානය ප්‍රධාන තැන ගනී. ධනය, කාලය, ශ්‍රමය, සැපසම්පත් අඹුදරුවන්, ඇස්, ඉස්, මස්, ලේ හා මුළු ශරීරය ද එක් වරක් දෙ වරක් නො ව දසදහස්වරක් බෝධිසත්ත්වවරයකු විසින් පරිත්‍යාග කළ යුතු ය. බෝධිසත්ත්වවරයකුට වඩා පරිත්‍යාග ශීලියෙක් මිනිසුන් අතර වෙන නැත. බුදුවරයෙකු පරිත්‍යාග නො කෙළේ අසවල් දෙය ය යි කිය හැකි දෙයක් නැත. පරිත්‍යාගයෙහි අගය හොඳින් ම දැන ගත් එකම උතුමා බුදුන් වහන්සේ ය.

> "මහණෙනි, දීමෙහි හා බෙදීමෙහි අනුසස් මා දන්නා තරම් අනික් අයත් දනිත් නම් කිසිවෙක් බත් හැන්දක් වත් නො දී අනුභව නො කරත්, මසුරු කමට නො සිටිත්. තමන් ආහාර ගන්නා බඳුනෙහි ඇති අන්තිම බත්පිඩ වුවත් පිළිගන්ට කෙනෙකු සිටියොත් නො දී නො වළඳත්"

යයි එක් අවස්ථාවකදී බුදුහු වදාළ හ.

> **"එවං චෙ භික්ඛවෙ සත්තා ජානෙය්‍යුං දනසංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, න අදත්වා භුංජෙය්‍යුං න ච තෙසං මච්ඡෙරමලං චිත්තං පරියාදය තිට්ඨෙය්‍ය, යොපි තෙසං චරිමො ආලොපො චරිමං කබලං තතො' පි න අසංවිභජිත්වා භුංජෙය්‍යුං සචෙ තෙසං පටිග්ගාහකා අස්සු."** **(ඉතිවුත්තක - 74 පිටු)**

බෝධිසත්ත්වයන් වහන්සේ බුද්ධත්වය පතා කළ පරිත්‍යාග මෙතෙකැ යි කිය හැකි සමතෙක් නැත. කොටින් ම නො කළ පරිත්‍යාගයක් නැත. **සිවිරාජ ජාතකයෙහි**, සිවි රජු

> මා ගේ ශරීරයෙන් කිසි අවයවයක් කිසි යාචකයෙක් ඇවිත් ඉල්ලුයේ වී නම් රාජ්‍යාභිෂේකයට වඩා එය උතුම් කොට සිතමි. කිසි යාචකයෙක් මා ගේ හෘදයමාංසය ඉල්ලුයේ වී නම් කඩුවකින් ලය පලා හැර සහමුලින්ම පියුමක් උදුරා ගන්නා කලක පරිද්දෙන් උපුටා ගෙන ලේ බින්දු වගුරුව වගුරුවා හෘදයමාංස දන් දෙමි. ඉදින් කිසිවෙක් මස් ඉල්ලුයේ වී නම් තියුණු සැතකින් කපා මස් දෙමි. ඉදින් කිසිවෙක් ලේ ඉල්ලුයේ වී නම් සියලු ශරීරය යතෙහි ලා පෙලා ගෙන භාජන පුරා දන්දෙමි. ඉදින් කිසිවෙක් ඇස් ඉල්ලුයේ වී නම් තල්ලොදක් පරිද්දෙන් උපුටා ඇස් දන් දෙමි. මිනිසුන් දිය යුතු සියලු වස්තුවෙන් මා නුදුන් දනෙක් නැත'

යි කියා ඇස් අන්ධ මහලු බමුණාට ඇස් දෙක ම දන් දුන්නේය.

(සිවිරාජ ජාතකය)

වෙස්සන්තර රජතුමා තම පුත් කුමාරවරුන් දෙදෙනා ගේ මුහුණින් වැහෙන කඳුළු මහාබෝධිසත්ත්වයන්ගේ සුත්ඵුල්ල රත්නපද්ම වණී වූ පා පිට වැටෙන්නේය. මහා බෝධිසත්ත්වයන්ගේ මුහුණ තෙමා බස්නා කඳුළු රත් පුවරු සදෘශ වූ ඔවුන්ගේ පිට තෙමා වැටෙන්නේය.

එකල බෝධිසත්වයානන් වහන්සේ කුමරුන් නැගුටුවා අස්වසාලමින්,



මහබඹුට, දෙව්වරුන්ට, මැවුම් කරුවන්ට වැදුම් පිදුම් කළ රටක, එබඳු යුගයක, මිනිසෙකු වූ බුදුන්වහන්සේ ඉපිද අනික් මිනිසුන් බල බලා සිටිද්දී දෙවියන්ගෙන්, බඹුන්ගෙන් වැඳුම් පිදුම් ලැබූහ. ගරු බුහුමන් ලැබූහ. ඇප උපස්ථාන ලැබූහ.

11 පිටුව බලන්න

"දරුවෙනි, තොප මහා නෞකා කොට ගෙන මේ අනවරාග්‍ර සංසාර සාගරය, යේ පරතෙරට එතෙර වනු කැමැත්තෙමි. මම එතෙර ව තොපත් ඇතුළු දෙවියන් සහිත ලෝකයා සංසාරසාගරයෙන් එතෙර කරන්නෙමි. දරුවෙනි, තොප මා ගේ දනාධ්‍යාසය නො දන්නාහු ද? දරුවෙනි, මාගේ දන පාරමිතාව මස්තකප්‍රාප්ත කරවා ලුව මැනැවැ"

යි කියා අස්වසාලමින් කුමාරවරුන් ගේ අත් ගෙන

"බ්‍රාහ්මණය, මැත එව මා දරුවන් කෙරෙහි ප්‍රිය නැත්තෙමි දෙන්නෙමි නො වෙමි. මෙයට වඩා සර්වඥතාඥානය සත සහශ්‍රගුණයෙන් ම මට ප්‍රියතරවන්නේ ය. මා දරුවන් දන් දෙමින් ඒ කුශල බලයෙන් මතු සර්වඥතාඥානයට පැමිණ මුළු ලොවට සෙත් කෙරෙමි" යි

කියා බුදු බව ප්‍රාර්ථනා කෙරෙමින් කමඩලාවෙන් බමුණු අත පැන් වත් කොට දරුවන් දන් දුන් සේක.

"මා පිටින් වාහින ලේ නො පෙණේද? රත්සුණු ආලේප කොට සුවඳ දියෙන් නහවා සමන්මල් පිට ලා මා වැඩුයේ මෙබඳු වූ දුක් දී පියන්ට ද?"

යනාදින් කුමාරවරු අනේක විලාප කිය කියා යන කල්හි මහා බෝධිසත්ත්වයන් වහන්සේට ඉතා බලවත් වූ සෝක උපන්නේය. හෘදයවස්තුව හුණු විය. බලවත් ව නික්මෙන ආශ්වාසප්‍රශ්වාසයට නාසය නො සෑහිමෙන් මුඛයෙන් අති උෂ්ණ වූ ආශ්වාස ප්‍රශ්වාසය නික්මෙන්නට වන. ඇසින් ලේ කඳුලු වසින්නට වන. හෘදය පැලී යන සේ බලවත් වූ සෝකයෙන් තැවෙත් තැවෙත් සර්වඥතාඥානය ම සිහි කෙරෙමින් ප්‍රඥාබලයෙන් ශෝකසල්ලය නැති කොට ගත් සේක. **(වෙස්සන්තර ජාතකය)**

ඉහත සඳහන් සිව්රාජ හා වෙස්සන්ර ජාතක කතා ජේද දෙකෙන් බෝධිසත්වයන් වහන්සේ ගේ පරිත්‍යාගශීලි භාවය ගැන සිතා ගත හැකි ය. මිනිසකුට විඳිය හැකි උසස්ම ගිහි සැප වින්ද සිදුහත් කුමරා රාජ්‍යයත් තම එකම පුත්‍රයාත් යසෝදරා දේවියත් අත් හැර මහ වනයට ගොස් අමු සොහොනක මළමිනියක් ඔතා තිබුනු තිඹක් පමණ පණුවන් ගෙන් යුත් රෙදිකඩක් සෝද අව්වේ වේලා හැඳගෙන තව්සකු බවට පත්වීම වැනි අරුම පුදුම පරිත්‍යාගයක් කළ මිනිසෙකු සිදුහත් කුමරා හැර මිනිස් ඉතිහාසයේ වෙන නැත. මේ අනුපමෙය පරිත්‍යාගය මේ මහා අභිනිෂ්ක්‍රමණය කෙළේ අන් කිසිම දෙයක් තකා නො ව බුදුබව ම තකා ය. පරාර්ථය ම තකා ය. ලෝකයාට සේවය කිරීම පිණිස ය. සත්‍යය සොයා ගැනිම පිනිසය.

එබැවින් ප්‍රථම අංකයේ බෝධිසත්ත්ව ගුණය නම් පරිත්‍යාගශිලි භාවයයි. පරිත්‍යාග නො කොට ශ්‍රේෂ්ඨත්වයක් ලබාගත නො හැකිය. පරිත්‍යාග නො කොට සේවයක් කළ නො හැකිය. පරිත්‍යාග නො කොට කරන සේවය නියම සේවයක් නොවේ. සැබෑ සේවයක් නොවේ.

සුමේධ තාපසයෝ තපස්බවට පැමිණෙන්ට පෙර මහා ධන සිටුවරයෙකි. ස්වකිය භාණ්ඩාගාරයේ තිබුණු හත්මුතු පරම්පරාවක ධනය ඒවා හිමිව සිටි තම වැඩිහිටියන් කිසිවකු විසිනුත් ගෙන නො ගිය බැවින් තමා ඒවා ගෙන යා යතු යැයි සිතා කෙළේ කුමක් ද නුවර බෙර ලවා රටවැස්සන් ගෙන්වා තම තමන් කැමැති පරිදි සියලුම ධනය ගෙන යන ලෙස කියා මන්දිරයේ සියලුම දෙරවල් විවෘත කොට තබා, තමා මිදුලෙහි අසුනක වාඩි වී ඒ ධනය ගෙන යනු බලා සිටිමින් මහත් ප්‍රීතියට පැමිණී ම යි.

පරිත්‍යාගයෙහි පුදුම බලයක් තිබේ. පරිත්‍යාගයෙන් කළ නොහැකි හපන්කමක් නැත. ලැබිය නොහැකි ශ්‍රේෂ්ඨතත්වයක් මේ මිහිපිට නැත. කළ හැකි විශාල ම පරිත්‍යාගය නොකොට කිසිවකුට බුදුවිය නොහැකිය. පරිත්‍යාගයෙන් එක් අතකින් අනුන්ට යහපතක් වන අතර, තමන්ගේ සිත් තුළ ඇති අංක එකේ දරුණු ම ක්ලේශය වූ තෘෂ්ණාව අඩුවෙයි.

නිවන් දැකිමට ඇති ලොකු ම බාධාව තෘෂ්ණා වයි. තෘෂ්ණාවෙහි ඇලී ගැලී සිටින ප්‍රජාව

වේගයෙන් දිවු භාවකු ගැහෙන්නාක් මෙන් ලෝභ කමින් ගැහි ගැහී සිටිතැයි බුදුහු වදළහ.

පරිත්‍යාගයෙහි දන් දීමෙහි අනුසස් නොයෙක් තැන නොයෙක් ලෙසින් වර්ණනා කළ බුදුහු ලෝකය පවතින්නේ ගෙන යන්නේ තෘෂ්ණාවෙන් බවත් සියලු දෙනා ම තෘෂ්ණා නැමැති මේ එක ම දෙයට වසග වි යට වි සිටින බවත් වදාළහ.

තණ්හාය නීයති ලොකො
තණ්හාය පරිකස්සති
තණ්හාය එකධම්මස්ස
සබ්බෙව වසමන්වගූ'

(සංයුත්ත නිකාය - දේවතා සංයුත්ත)

තියෙන එක්කෙනා තව තවත් එකතු කරගෙන ගොඩ ගසා ගැනිමට ම නොසිතා නැති එක් කෙනාටත් දීමෙන්, අනුන්ගේ යහපතටත් වෙහෙස වීමෙන් අනුන් ගැන ද සොයා බැලීමෙන් අනුන් වෙනුවෙනුත් වෙහෙස වීමෙන්, අනුන් ගේ යහපතට ද වැඩ කිරීමෙන් කවරකුට වුවත් පරිත්‍යාගශීලි විය හැකි යි. පරිත්‍යාගශීලි නො වන්නෝ තෘෂ්ණාවට වාල් වූ අවාසනාවන්තයෝ යි. ලෝභියා, මසුරා තරම් සිතින් දුක විඳින කිසිවෙක් නැත. ලක්ෂපතියෙකු වුවත් ලෝභියෙකු නම් ඔහු අවාසනාවන්තයෙකි. ධනවත්කම වාසනාව මැනීමේ කෝදුව කර ගැනීම බුද්ධාගම නො දන්නාකමයි.

මසුරන් පොදියක් දුටු බුදුන් වහන්සේ අනඳ තෙරුන්ට පෙන්නුවේ ආනන්ද අන්න සර්පයෙක් සිටිනවා ය කියාය.

ධනවත් තරමට තෘෂ්ණාව වැඩිය. තෘෂ්ණාව වැඩි තරමට නිවණ දුරය. බුදුන් වහන්සේගේ පරිත්‍යාගශීලිභාවය ගැන හොඳට දන්නා තැනැත්තා තමා සතු ධනයෙන් තමනුත් ප්‍රයෝජන ගනිමින් අනුන්ගේ යහපතට ද යොදවමින් එයින් නියම ප්‍රයෝජන ගනියි. බුදුන් වහන්සේ ගැන සිතන විට උන් වහන්සේ තුල පැවැති පුදුම පරිත්‍යාගශීලි භාවය ගැන කිසිසේත් අමතක කළ නොහැකි ය.

බුද්ධ සංදේශය

බුදු හිමියෝ අනම්‍ය ආගමික ක්‍රමවලටත් විවිධ සාමාජික මතවාද
වලටත් වඩා ශ්‍රේෂ්ඨය. බුදුහිමියන් වහන්සේගේ
සනාතනික සංදේශය කාලාන්තරයක් මුළුල්ලේ
මානව වංශය ප්‍රමෝදයට පත් කළේය. බුදුහිමියන් වහන්සේගේ සාමය
පණිවුඩය දුකින් පෙළෙන, දෝමනස්සයට නැඹුරු වූ
මානව වංශයට අද යුගයේදී පමණ
අවශ්‍ය වූ වෙන අන් සමයක් අතීත ඉතිහාසයේ නොතිබුණේ විය හැකිය.

ශ්‍රී නේරු ඉන්දියාවේ හිටපු අගමැති

"ඔබ වහන්සේ, මිනිසුන් ඇද ගැනීමේ, බැඳ ගැනීමේ, අල්ලා ගැනීමේ ක්‍රමය (ආවර්තනී මායාව.) දන්නවාය කියන්නේ, සැබෑද? යි විචාළහ. එවිට බුදුහු,"භද්දියෙනි, ඇසූ පමණින්, පරම්පරාවෙන් ආ පමණින්, ඉතිහාසයේ ආ පමණින්, පෙළෙහි ආ පමණින්, තර්කයට ගැලපුණු පමණින් න්‍යායට ගැලපුණු පමණින් කිසිවක් නොපිළිගත යුතුය. තමාටම සත්‍ය යයි පෙනුණොත්, වැටහුණොත්, අවබෝධ වුණොත් පමණක් පිළිගත යුතු යයි වදාළහ."

13 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ මිනිසුන් අතර උපන් ඉතාම නිර්භීත පුරුෂයාණෝ'යි

බුදුන් වහන්සේ තරම් අතිශය නිර්භීත මනුෂ්‍යයෙකු මානව සංහතියේ මෙතෙක් ඉපදී නැත. "භය" යනුවෙන් හැඳින්වෙන ගතිය උන්වහන්සේ ගේ සිත තුළින් සහමුලින් ම සදහට ම මුලිනුපුටා දමා ඇත. "භය ඇති වීමට එකම හේතුව තෘෂ්ණාවයි. (**තණ්හාය ජායති භයං**)"

> මහණෙනි, භය යන මේ වචනය කාමයන්ට නමකි. කුමක් නිසා භය යන වචනය කාමයන්ට නමක් වේ ද? කාමරාගයෙන් රත් වූ තැනැත්තා ඡන්ද රාගයෙන් බැඳී මෙලොවදී ඇතිවන භියෙනුත් නො මිදෙයි. පරලොව දී ඇතිවන භියෙනුත් නොමිදේ. එහෙයින් භය යන මේ වචනය කාමයන්ට නමකි" (**භයන්ති භික්ඛවෙ කාමානමෙතං අධිවචනං. කස්මා? කාමරාගරත්තායං භික්ඛවෙ ඡන්ද රාගවිනිබද්ධා දිට්ඨධම්මිකාපි භයා න පරිමුච්චති. සම්පරායිකාපි භයා නං පරිමුච්චති තස්මා භයන්ති කාමානමෙතං අධිවචනං**)

(අංගුත්තර නිකාය - ඡක්ක නිපාත - භය සූත්‍රය)

මිනිස්සු නොයෙක් හේතූන් නිසා බිය වෙති. ජීවිතයට ඇති ආසාව නිසා මරණයට ඇති අකැමැත්ත නිසා අඹු දරුවන්ට, ගේ දොර ඉඩකඩම් ධන ධාන්‍ය ආදියට ඇති තෘෂ්ණාව නිසා බිය වෙති. බිය වීමට හේතු වූ ඒ කිසිවක් බුදුන් වහන්සේට නැත. සැබවින් ම උන් වහන්සේ තුළ පැවැත්තේ පුදුම නිර්භීත කමකි. තැති ගැනිමක් කම්පාවීමක් උන් වහන්සේ ගේ සිත තුළ මොන ම ක්‍රමයකින් වත් ඇති විය නොහැකිය. බියෙන් තැති ගත් මිනිස්සු පර්වත, වනාන්තර, ආරාම, වෘක්ෂ සරණ යතැ'යි වරක් උන් වහන්සේ වදාළහ. බිය වීම මිනිසා තුළ පවත්නා හීන දීන ක්ලේශධර්මයක් බවත්, මිනිසකු තවත් මිනිසකුට තබා මොනම යකෙකුටවත් මොනම දෙවියකුට වත් බිය විය යුතු නැති බවත් වදාළහ. හිරිඔත්තප්ප නමින් හැඳින් වෙන ලජ්ජා භය දෙක ඇති කර ගත යුත්තේ පව් කිරීමට වැරදි වැඩ කිරීමට මිස පුද්ගලයන් සඳහා නො වන බව ප්‍රකාශ කළහ.

නිර්භීත කමේ මූර්තිය වූ බුදුන් වහන්සේ කිසි දිනක කිසිවකු බිය ගත්වා නැත. බියසුල්ලෝ බුදුරදුන් දැක නිර්භයවූහ. වනයෙහි වසන භික්ෂූන්ට බියක් ඇති වුව හොත් බිය නැති බුදුරදුන් සිහි කරන ලෙස පැවසූහ. සිහි කොට නිර්භීත වන ලෙස අවවාද කළ හ.

> "මහණෙනි, මම ද නුඹලාට මෙසේ කියමි. වනයට ගියා වූ හෝ රුක්මුලකට ගියා වූ හෝ පාලුගෙයකට ගියා වූ හෝ නුඹලාට බයක් හෝ තැති ගැන්මක් හෝ ලොමු ඩැහැ ගැන්මක් හෝ ඇතිවුවහොත් එකල්හි මා ගැනම සිහිකරවු. (**අහඤ්ච ඛො භික්ඛවෙ එවං වදමි සචෙ තුම්හාකං භික්ඛවේ අරඤ්ඤගතානං වා රුක්ඛමූලගතානං වා සුඤ්ඤාගාරගතානං වා උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලෝමහංසො වා මමෙව තස්මිංසමයෙ අනුස්සරෙය්‍යාථ**)

(ධජග්ග සූත්‍රය)

"දෙපාගෙනැ පරසක්වල ගසමි" යි කිපී දිවූ **ආලවකයා** කඩුවෙන් පැහැර දෙකඩ කොට ඇඟිලි කපා ගනිමි" යි දිවූ **අඟුල්මල්** සොරහු සැර පහරින් විද කසලු කරම්හ" යි ආ දුනුවායන්, රජමහවත් මැද ඇද හෙලවා දළින් පයින් ඇන මඩවා සුනු විසුනු කරම්හ" යි මෙහෙයූ **නාලාගිරි** මතැත්හු, සිප ගෙන ඇඟ රෝමයෙන් විද අමුනන්ට දිවූ

සුචිරෝම නම් යකා ඇග ඩහ සොල්වා වාද කෙරෙම්' යි දිවු **සච්චකයා**, මට වැඩි මහත්හු නැතැයි මන් ගත් සාරදස් අටසියක් යොදුන් **අසරිඳුහු**, මට වැඩි මහත් හු නැතැයි මන් ගත් **බක** නම් මහ බඹහු, මා සේ ලොව්හි බුදුහු නැතැ' යි වියත් කම්හි බැහැවුනු **උරුවෙලකාශ්‍යප,** ඉසට ගල් පෙරලු **දෙව්දත්හු**, හැම දමා, හැම හික්මවා, හැම කුලගැති කොට, හැම සරණ ගන්වා තමන් සිරි පා වැන්දවු බුදුන් සරණ යෙයි' යි බුත්සරණ යා යුතු,'

බුත්සරණ කතුවරයාගේ මේ ප්‍රකාශයෙන් ද නිර්භීත භාවය දරුණුමිනිසුන් මෙල්ල කිරීමේ ශක්තිය ඔප්පු වේ.

බුදුරදුන් ආලවක යකා ගේ භවනයෙහි සිටිනු දුටු ඔහු කෝපයෙන් දැවි දැවී ගොස් (**නික්ඛම සමණා'ති**) "මහණ, බැහැපන් දෙට්ට" ය යි සැරෙන් අණ කෙළේය. (**සාධාවුසොති භගවා නික්ඛමි**)' "හොඳයි පින්වත" යයි බුදුහු නික්මුණ හ. (**පවිස සමණාති**)' "මහණ, ආපහු ගෙට එනු' යයි ආලවකයා බුදුන්ට අණ කළේය. මේ සේ තුන් වරක් අණ ලැබූ බුදුහු හතර වෙනි වාරයෙහි (**නඛ්වාහං ආවුසො නිකඛම්ස්සාමි යං තෙ කරණීයං තං කරොහි**) මම යන්නෙ නැහැ. 'නුඹට කල හැකි දෙයක් තිබේ නම් කරපන්' යි බුදුහු නිර්භීත ව කීහ.

එවිට **ආලවකයා (පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි සචෙ මෙ න ව්‍යාකරිස්සසි, චිත්තං වා තෙ ඛිපිස්සාමි හදයං වා තෙ ඵාලෙස්සාමි පාදෙසුවා ගහෙත්වා පාරගංගායං ඛිපිස්සාමි) 'ශ්‍රමණය.** මම ඔබෙන් ප්‍රශ්නයක් අසන්නෙමි. ඉදින් ඔබ පිළිතුරු නො දුන්නොත් ඔබ පිස්සකු කරන්නෙමි. ඔබේ හදවත පලා දමන්නෙමි. නැත හොත් කකුල්කෙටි දෙකින් අල්ලා පරසක්වලට විසි කරන්නෙමි' යි ආලවකාය තර්ජන ස්වරූපයෙන්පැවැසීය.

එවිට බුදුහු

> **(නඛ්වාහං ආවුසො පස්සාමි. සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො මෙ චිත්තංවා ඛිපෙය්‍ය හදයං වා ඵලෙය්‍ය පාදෙසු වා ගහෙත්වා පරගඞ්ගාය ඛිපෙය්‍ය. අපි ච ත්වං ආවුසො පුච්ඡ යථා ආකඞ්ඛසි)** "පින්වත, දෙවියන් මරුන් බඹුන් සහිත අවකාශ ලෝකයේ හරි මහණ බමුණන් හා දෙව් මිනිසුන් සහිත සත්ව ලෝකයේ හරි මා පිස්සු වැට්ටවීමට මගේ හදවත පලා දැම්මට මගේ දෙපයින් අල්ලා පරසක්වල ගැසීමට පිළිවන් සමතෙකු මම නම් දැක්කෙ නැහැ. එසේ වුවත් නුඹට ඕනෑ නම් ඕනෑ ප්‍රශ්නයක් මගෙන් අහපන්" යනුවෙන් බුදුහු නිර්භීත ව පැවසූහ.

සේල නමැති බමුණෙක් 300 ක් පමණ බමුණු මානවකයන් සමග බුදුරදුන් හමු වන්නට ගියේය. බුදුරදුන් වැඩ සිටි තැනට ආසන්න වූ විට සේල බමුණා මානවකයන්ට මෙසේ කීය.

> "භවත්නි, වැඩිය ශබ්ද කරන්ට එපා. හීන් සැරේ පා තබමින් එන්න භවත්නි. බුදුවරු සිංහයන් මෙන් තනිව හැසිරෙන අයයි. ඔවුන් ලගට කිට්ටුවීම අමාරුයි. මම ශ්‍රමණ ගෞතමයන් සමග කතා කරන විට ඒ අතරට පැනලා කතා කරන්න එපා. මා කතා කරලා ඉවර වුණායින් පස්සෙ එන්න" **(අථ ඛො සෙලො බ්‍රහ්මණො තීහි මානවක සතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසංකමි. අථ කො සෙලො, බ්‍රාහ්මණො තෙ මානවකෙ ආමන්තෙසි. අප්පසද්ද භොන්තො ආගච්ඡන්තු පදෙ පදං නික්ඛිපන්තා. දුරාසද හි තෙ භගවන්තො සීහාව එකචරා යදහං භොන්තො සමනෙන ගොතමෙන සද්ධිං මන්තෙය්‍යං මා මෙ භොන්තො අන්තරන්තරා කථං ඔපාතෙථ කථාපරියොසානං මෙ භවන්තො අගමෙන්තු.)**

(සුත්ත නිපාත - සෙල සූත්‍රය)

මෙයින් ත්‍රිවේදපාරප්‍රාප්ත බමුණ් පවා බුදුරදුන්ට දැක්වූ ගෞරව සම්ප්‍රයුක්ත භයක හැටි සිතා ගත හැකි යි සියලු සතුරන් වසී කර ගෙන මම භය නැතුව සතුටින් සිටිමි. **(සබ්බාමිත්තෙ වසී කත්වා**



බුදුන්වහන්සේ මුරණ්ඩු ශිෂ්‍යයෙකුට දුන් ලොකුම දඬුවම "බ්‍රහ්ම දණ්ඩ" නමැති දඬුවමයි. "බ්‍රහ්ම දණ්ඩ" යනු උතුම් ශ්‍රේෂ්ඨ දඬුවම යනුයි. ඡන්න තෙරුන්ට මේ දඬුවම දෙන ලදී. බුදුරදුන් උපන්දින උපන්, සිදුහත් කුමාර කාලයේ ළඟින්ම ඇසුරු කළ රියැදුරුව සිටි ඡන්න තෙමේ, බුදුරදුන් හැර අනිත් අය නොතකා හැරියේය. එබැවින් බුදුහු ඔහුගේ මාන්නය දුරුකරනු පිණිස "බ්‍රහ්ම දණ්ඩ" නමැති දඬුවම නියම කළහ.

14 පිටුව බලන්න

මොදම් අකුතොභයං) යනු බුදු රදුන් තමන් වහන්සේ ගැන පැවසූ හැටි යි. ඔබ වහන්සේ ප්‍රහීන කළ භය ඇති සිංහරාජයෙකි. ***(සීහොති අනුපාදනො පහිණභය භෙරවා, සුත්තත නිපාත - සභිය සූත්‍රය)***

ආලවක, සුචිරෝම, ඛරරෝම, ආරවාළ, වැනි දරුණු යක්ෂයෝ ද, **චූලෝදර, මහෝදර, අග්ගිසිඛ, ධූමසිඛ, මුචලින්ද** වැනි නාගරාජයෝද **සච්චක** වැනි වාදිබ සිංහයෝ ද **අම්බට්ඨ** වැනි මාණවකයෝ ද **පොක්ඛරසාති, සෝණ දණ්ඩ, කූටදත්ත, කසිභාරද්වාජ** වැනි මානාධික බ්‍රාහ්මණයෝ ද **නාලාගිරි** වැනි හස්තිරාජයෝ ද බුදුරදුන් ගේ නිර්භීත භාවය ඉදිරියෙහි දන ගැසූහ.

එබඳු නිර්භීත භාවයක් ඇති බුදුරදුන් අදහන හැම කෙනෙකුන් මත් නිර්භීත විය යුතු ය. භය යනු කුමක් දැයි නොදත්තවුන් විය යුතු ය. බියගුල්ලන් වීම මිනිස් කමට, බෞද්ධ කමට මදිකමකි. මිනිසකුට මිනිසකු බිය වීම දීන කමකි. මවුපියන්ට වත්, ගුරුවරුන්ට වත්, වැඩිහිටියන්ට වත්, යකුන්ට වත්, දෙවියන්ට වත්, බුදුහාමුදුරුවන්ට වත්, බිය විය යුතු නැත. ඒ උතුමන්ට ගරු කළ යුතුය. කීකරු විය යුතු ය. සැලකිලි දැක්විය යුතුය. එහෙත් බිය විය යුතු නැත.

බිය වීම වැරදි කරපු නිසා ම නුගත්කම නිසා ම තෘෂ්ණාව නිසා ම ඇති වන ක්ලේශධර්මයකි. දුර්වලකමකි. බුදුන් රහතුන් තුළ මේ ක්ලේශධර්මය නැත. ලැජ්ජා විය යුත්තේ, බිය විය යුත්තේ පුද්ගලයන්ට නො ව වැරදි කිරීමට ය.

බුදුදහමින් හැදුණු වැඩුණු පැරැණි සිංහලයෝ මේ රටේ නිර්භීතව විසූහ. නිර්භීතකම් කළ හ. සිංහලයන් බුදුදහමින් ඈත් වත් ඈත්වත්ම බියගුලුකම ද ඔවුන් වෙත ළගා විය. එබැවින් නියම බෞද්ධයන් වීමට නම් බුදුන් වහන්සේ අනුගමනය කරමින් උන් වහන්සේ තුල පැවැති කැපී පෙනෙන ලක්‍ෂණයක් වූ නිර්භීතභාවය තමන් තුළත් ඇති කර ගත යුතුය.

ප්‍රඥාව අසිපතයි - සතුරා මෝහයයි

බෞද්ධ ඉතිහාසයේ එකම පිටුවක්වත්
චෝදනාකාර ගින්නෙන් දැවුනේ වත් වෛතුල්‍ය වාදී
දුමෙන් අඳුරු වුයේවත් නැත. මිථ්‍යාදෘෂ්ඨික නගර ගිනිබත් කරනු
ලැබුවේ නැත. ආගමික වෛරයට ගොදුරු වූ නිර්දේෂී තැනැත්තන්ගේ
ලෙයින් රත් පැහැ ගැන්වුනේත් නැත.
ප්‍රඥාව පිළබඳ අසිපත විසින් පිළිගනු ලබන එකම සතුරා නම්
මෝහයයි. මෙය ඉතිහාසය සපයන සක්‍ෂියයි.
එය කිසිසේත් ප්‍රතික්ෂේප කළ නොහැක.

මහාචාර්ය බාපත් "දෙදහස් පන්සිය වසරක බුදු දහම" නම් ග්‍රන්ථයෙනි.



බුදුහාමුදුරුවෝ සැබෑ ඉතිහාසයක් ඇති ශාස්තෘවරයාණෝයි

බොහෝ ශාස්තෘවරු මැවුම් කරුවෝ ගැලවුම් කරුවෝ හා දෙවිවරු ඓතිහාසික පුද්ගලයෝ නො වෙති. ඔවුන් ගෙන් සම හරුන් විසූ බවට පිළිගත හැකි ඉතිහාසගත සාක්ෂි නැත. එහෙත් බුදුන්වහන්සේ සත්‍ය පුද්ගලයකු බවට ඇත්ත වශයෙන්ම විසූ බවට ඇති නානාවිධ සාක්ෂි බොහෝය. එබැවින් ම උන් වහන්සේ ඓතිහාසික පුද්ගලයකු බවට මුළු ලෝකය ම පිළිගෙන ඉවර ය.

උන් වහන්සේ ගේ වංශය (**ශාක්‍ය**) ගෝත්‍රය (**ගෞතම**) නාමය (**සිද්ධාර්ථ**) පැරැණි ඉන්දියානු සාහිත්‍යයෙහි සඳහන් ව ඇත. හීනයාන හා මහායාන ග්‍රන්ථවල ලියවී ඇත. උපන් නගරය බුදු වූ තැන ප්‍රථම දහම් දෙසූ තැන පිරිනිවන් පෑ තැන අද දක්වා ම දක්නට ඇත. ඒ තැන්වල ධර්මාශෝක මහරජතුමා පයින් ම ගොස් වැඳ පුදා ඒ තැන්වල සෙල්ලිපි පිහිටුවා ඇත. උන් වහන්සේ දෙසූ දේශනාවල සඳහන් නගර ග්‍රාම පර්වත ගංගා අද දක්වා ම ඇත. උන් වහන්සේට මුන ගැසුනු **බිම්බිසාර, කොසොල්, අජාසත්, ලිච්ඡවි** ආදි රජවරු ද ඓතිහාසික පුද්ගලයෝ යි.

බුදුන් වහන්සේ උත්පත්තිය ලැබූ ලුම්බිනියට ගිය අශෝක රජතුමා එහි ශිලාස්ථම්භයක් පිහිටු විය. එහි මෙසේ සඳහන් වේ.

> **(දේවානං පියන පියදසිනා ලාජිනා විසති වාසාභි සිත්න අත්න ආගාච මහියිතෙ හිද බුධෙ ජාතෙ සාක්‍ය මුනිති සිලා විගඩ භිචා කලා පිත සිලා ථභෙව අස පාපිතෙ හිද බගවං ජාතේති ලුංමිනි ගාමෙ උබලිකෙ කට අට ගාගියෙච)** දේවානම්පිය රජු විසින් අභිෂේකයෙන් විසි වෙනි වර්ෂයෙහි තමා ම පැමිණ ශාක්‍යමුනි වූ බුදුහු මෙහි උපන් හ යි මෙහි දී වැඳුම් පිදුම් පවත්වන ලද්දේය. ශිලා වූ බිත්තියක ද කරවන ලදි මෙහි භාග්‍යවතුන් වහන්සේ උපන් සේක'
>
> යි ශිලාස්ථම්භයක් පිහිටුවන ලදි. ලුම්බිනි ගම අයබද්දෙන් නිදහස් කරන ලදි. අෂ්ටභාගය ද ගමට දෙන ලදි.
>
> *(ලුම්බිණී ශිලා ලිපිය)*

අශෝක රජු ගේ ශිලාලිපි රාශියක බුදුන් වහන්සේගේ නම සඳහන් වී ඇත. ත්‍රිපිටකයෙහි සඳහන් වන "**එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ" "එකං සමයං භගවා සක්කෙසු විහරති කපිල වත්ථුස්මිං නිග්‍රොධාරාමෙ," එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලාය," "එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ" එකං සමයං භගවා රාජගහෙ විහරති මොරනිවාපෙ" "එකං සමයං භගවා සාකෙතෙ විහරති කාලකාරාමෙ" "එකං සමයං භගවං රාජගහෙ විහරති ගිජ්ජකූටෙ පබ්බතෙ," "එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ," "එකං සමයං භගවා අන්තරා ච උක්කුට්ඨං අන්තරා ච සෙතව්‍යං අද්ධාන මග්ගපටිපන්නො හොති" එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ, භෙසකලාවනෙ මිගදායෙ", "එකං සමයං භගවා කොලියෙසු විහරති සජ්ජනෙලං නාම කොලියානං නිගමෙ", එකං සමයං භගවා කුසිනාරායං විහරති උපවත්තනෙ මල්ලානං සාලවනෙ", එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරාමාතු පාසාදෙ "එකං සමයං භගවා නාලිකෙ විහරති නිචුලවනෙ" "එකං සමයං භගවා බාරාණසියං විහරති ගිජ්ඣකාවසථෙ", "එකං සමයං භගවා කිම්බිලායං විහරති ඉසිපතනෙ**

අනික් බොහෝ ගුරුවරුන් මෙන් බුදුන්වහන්සේ උගැන්වීම සඳහා ස්වකීය ආරාමයම, දම්සභා මණ්ඩපය ම, පමණක් උපයෝගි කර නොගත්හ. උන්වහන්සේ වැඩි වශයෙන් සිසුන්ට උගැන්වූයේ එළිමහනේදීය. උදා:. සුසානභූමි, ගල්තලා, වැලිතලා, රුක්සෙවණ, කුඹුරු, තණපිට්ටනි, දුඟී පැල්පත්, මගතොට, මහවනය වැනි නිදහස් වටපිටාවක් ඇති තැන් උන්වහන්සේ ශිෂ්‍යයනට උගැන් වූ පන්ති කාමරයි.

16 පිටුව බලන්න

මිගදායෙ" "එකං සමයං භගවා ආලවියං විහරති අග්ගාලවෙ චෙතියෙ" "එකං සමයං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණී තීරෙ" "එකං සමයං භගවා මගධෙසු විහරති මණිමාලකෙ චෙතියෙ" "එකං සමයං භගවා රාජගහෙ විහරති සීත වනෙ" යන ආදී නොයෙක් තන්හි බුදුන් වහන්සේ වැඩ සිටි බව දැක්වෙයි. මේ හැම තැනක් ම අදත් උතුරු ඉන්දියාවෙහි දක්නට ඇත.

උන් වහන්සේ නොයෙක් විට සඳහන් කළ **ගංගා, යමුනා, අචිරවති, ගෝධාවරී** ආදී ගංගාවෝ අදත් ඒ ලෙසින් ම ගලා බසිති. උන් වහන්සේ නොයෙක් තැන්හි ගෙණහැර දැක්වූ **හිමාලය, ගිජ්ඣකූට** ආදී කඳු අදත් ඒ ලෙසින් ම දක්නට ඇත. උන් වහන්සේ ගෙන් ප්‍රශ්න ඇසූ බමුණන් වැනි බමුණෝ අදත් ඉන්දියාවේ සිටිති. උන් වහන්සේ නිසරු ලෙස පෙන් වූ යාග හෝම අදත් ඒ ලෙසින් ම පවත්වනු ලැබේ. එකල තුබුනු කුලභේදය අදත් ඒ ලෙසින්ම දක්නට ලැබේ. උන් වහන්සේ චාරිකාවෙහි හැසුරුණු ප්‍රදේශ අදත් එලෙසින් ම පවතී.

බුදුන් වහන්සේ සැදැහැවත් කුල පුත්‍රයකු විසින් දැක්ක යුතු සංවේග ඉපදවිය යුතු ස්ථාන හතරක් ගැන සඳහන් කරන ලදි.

> ඒ හතර නම් උන් වහන්සේ උපන් ස්ථානය (**ලුම්බිනිය**) බුදු වූ ස්ථානය (**බුද්ධගයාව**) දම්සක් පැවතුම් සූත්‍රය දෙසූ ස්ථානය (**ඉසිපතනය**) හා පිරිනිවන් පෑ ස්ථානය (**කුසිනාරාව**) යි. **(චත්තාරිමානි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනියානි සංවෙජනියානි ඨානානි. කතමානි චත්තාරි ඉධ තථාගතො ජාතොති ඉධ තථා ගතො අනුත්තරං සම්මා සම්බෝධිං අභි සම්බුද්ධොති ඉධ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතන්ති ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බාණ ධාතුයා, පරිනිබ්බුතොති)** *(මහා පරිනිබ්බාන සූත්‍රය)*

බුදුන් වහන්සේ විසින් ම පෙන්වා දුන් මේ ස්ථාන හතර බැලීමට දහස් ගණන් බැතිමත්හු අදත් යති. බලා ඇත්ත වශයෙන් ම සංවේගයට පත් වෙති. එකල රමණීය ස්ථාන හැටියට බුදුන් වහන්සේ අනඳ තෙරුන්ට පෙන්වා දුන් ස්ථාන අදත් දැක්ක හැකිය. **(රමණීයා ආනන්ද වෙසාලි රමණීයං උදේනචේතියං රමණීයං- ගොතමකචෙතියං රමණීයං සත්තම්බක චෙතියං රමණීයං බහුපුත්තචෙතියං රමණීයං ආනන්ද සාරන්දද චෙතියං රමණීයං චාපාලචේතියං)** *(මහා පරිනිබ්බාන සූත්‍රය)*

බුදුරදුන් පිරිනිවන් පාන සමයෙහි ආනන්ද හමුදුරුවෝ උන් වහන්සේ ළඟට පැමිණ,

> "ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, මේ කුඩා නගරයක උපනගරයක ශාඛා නගරයක පිරිනිවන් නොපානු මැනවි. ස්වාමිනි මේ දඹදිව **චම්පා, රාජගහ, ශ්‍රාවස්ති, සාකේත, කෝසම්බි, බාරාණසී** වැනි මහා නගර තිබේ. මෙයින් මහා නගරයක පිරිනිවන්පානු මැනැවි යයි ඉල්ලා සිටියහ. **(මා භන්තෙ භගවා ඉමස්මිං කුඩ්ඩනගරකෙ උජ්ජංගල නගරකෙ සාඛානගරකෙ පරිනිබ්බායි. සන්ති භන්තෙ අඤ්ඤානි මහානගරානි සෙය්‍යථීදං, චම්පා රාජගහං සාවත්ථි සාකේතං කොසම්බි බාරාණසී එත්ථ භගවා පරිනිබ්බායතු)** *(මහා පරිනිබ්බාන සූත්‍රය)*

බුදුන් වහන්සේ පෙන්වා දී ඇති බුද්ධකාලයෙහි ඉතා දියුනුව පැවැති සොලොස්මහ ජනපද නම් **අංග, මගධ, කාසි, කෝසල. වජ්ජි, මල්ල. චේති, වංග, කුරු, පංචාල, මච්ඡ, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කම්බෝජ** යන මේවාය. **(සෙය්‍යථාපි විසාඛෙ යො ඉමෙසං සොලසන්නං මහාජනපදං පහූත සත්ත රතනානං ඉස්සරියාධිපච්චං රජ්ජංකාරෙය්‍ය සෙය්‍යථිදං, අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ් ජීනං මල්ලානං චේතීනං වඞ්ගානාං කුරූනං පංචාලනං මච්ඡානං සුරසේනානං අස්සකානං අවන්තිනං ගන්ධාරානං කම්බෝජානං**

(අංගුත්තර නිකාය - තික නිපාත)

මේ සොලොස් මහ ජනපද ඉතිහාසය අතින් ඉතා

ලුම්බිණි

බුද්ධගයා

කුසිනාරා

පිරිනිවන් මඤ්චකය - කුසිනාරා

සාරනාත් - ධම්මික සෑය



වජ්‍රාසනය - බුද්ධගයා



සර්වඥ ධාතු කරඬුව කපිලවස්තු - (දිල්ලි කෞතුකාගාරය)

කපිලවස්තු (සර්වඥ ධාතු සහිත ස්ථූපය)



බුද්ධගයා



බුද්ධගයා



බුද්ධගයා - සක්මන් මළුව

විශාලා මහනුවර

අජන්තා මූර්ති



ශ්‍රීපාද සටහන - බුද්ධගයා

පුරාණ කපිලවස්තු

වැදගත් තැනක් ගනී. බුදුන් වහන්සේගේ සිරුර ආදාහනය කළ තැන පිළිස්සුනු පස් කලුපාටින් යුක්තව අදත් දැකිය හැකිය. උන් වහන්සේ වැඩ සිට බුදුවූ තැන තිබුණු බෝධිය අදත් තිබේ. එහි ශාඛාවක් දැනුත් අනුරාධපුයේ ඇත. බුදුන් වහන්සේගේ දැගසව්වන් වූ සැරියුත් මුගලන් දෙනමගේ ධාතු සහිත කරඬු දෙක එංගලන්තයේ ඇල්බට් කෞතුකාගාරයේ තිබී නැවත ගෙනවුත් සාංචි විහාරයෙහි තැන්පත් කොට ඇත. ඒ කරඬු දෙකේ "**සරිපුතස - මුගලනස**" යන වචන දෙක කොටා ඇත. බුදුරන්ගේ දන්ත ධාතුවක් අපේ රටේ මහනුවර දළදා මැදුරෙහි තැන්පත් කොට තිබේ. උන් වහන්සේ දෙසූ ධර්මය වූ ත්‍රිපිටකය අදත් බෞද්ධ රටවල ආරක්ෂිතව තිබේ. උන්වහන්සේ ඇතිකළ සංඝ පරම්පරාව අදත් දහස් ගණනින් බෞද්ධ රටවල වෙසෙති. පළමුවෙනි ශතවර්ෂයෙහි විසූ කණිෂ්ක රජු බුද්ධ රූපය සහිත කාසියක් නිකුත් කලේය. 7 වැනි ශත වර්ෂයෙහි විසූ **පාහියන්** හා **හියුං සියැං** යන චීන දේශාටකයන් දෙදෙනා බුදුරදුන් වැඩ විසූ හැමතැනටම ගොස් ඇත. ආසියාවේ බුද්ධාගම පැවැති හැම රටකම බුද්ධ රූප බුද්ධ ප්‍රතිමා සිය දහස් ගණනින් නොව ලක්‍ෂ ගණනින් දක්නට ඇත.

එබැවින් බුදුන් වහන්සේ ඉතිහාසයක් ඇති ඉතිහාසයක් තැනූ ඓතිහාසික මහා පුරුෂයෙකි. මිනිස් ඉතිහාසය හා ලෝක ඉතිහාසය අලංකාර කළ මහා පුරුෂයන් අතර බුදුන් වහන්සේ ප්‍රධාන තැන ගනිති.



රජ අණ පරිදි නියමිත දින නියමිත වේලාවට සුසාන භූමියට පැමිණි මහජනකායෙන් අතුරු සිදුරු නැති විය. බුදුහු ශ්‍රාවකයන් සමග නියමිත වෙලාවට සුසාන භූමියට වැඩියහ. පැයට මසුරන් දහස් ගණනින් අගය කළ සිරිමාගේ සිරුර වෙන්දේසි කරන ලෙස රජුට කීහ.

16 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ ඉතාම වැඩියෙන් බැනුම් ඇසු සමාජ සේවකයාණෝයි

රටට, ජාතියට, ආගමට, සමාජයට සහ ලෝකයාට සේවය කිරීමේ දී සමාජයෙන් බැණුම් නොඅසා සේවයක් කළ කිසිවෙක් නැත. හැම රටකම ජාතියක ම, හැම සමාජයක ම සේවයට විරුද්ධ පිරිසක් ද සිටිති. සේවය වරදවා සිතා ගත් අය ද, සේවය නිසා අවාසි වන අය ද සිටිති. ඒ අය විරුද්ධ වීම ස්වාභාවිකය. රටට අහිතකර සම්මත චාරිත්‍ර වාරිත්‍ර විරාගත විශ්වාස මුල් බැස ගත් ඇදහිම් හා යල් පැනපු සිතුම් පැතුම් හැම රටක ම දක්නට ඇත. බුද්ධිමත් සමාජසේවකයකු සමාජයේ යහපත තකා ඒවාට විරුද්ධව වැඩ කරන විට ඇතැම් අය නොයෙක් උපක්‍රමයෙන් ඔහු මරා දමන්නට වුවත් පසු බට නො වෙති. ලෝකයේ නොයෙක් රටවල එසේ මැරුම් කෑ සමාජ සේවකයන් ගැන අප අසා ඇත.

බුදුන් වහන්සේ දඹදිව ආරම්භ කලේ සමාජ සිරිත් විරිත් හා සිතුම් පැතුම් පිළිබඳ මහාවිප්ලවයකි. එය අවිහිංසාවාදි ව ම කරුණා මෛත්‍රියෙන් යුක්තව ම ඉතා ශාන්ත දන්ත ව ක්‍රියාවෙහි යෙදවූ නිසා ම උන්වහන්සේ ගේ ජිවිතය බේරුණේය. උන් වහන්සේ අනික් ශාස්තෘවරුන් අතර කැපී පෙනෙන්නට පෙනෙන්නට වඩාත් ජනප්‍රිය වන්නට වන්නට උන් වහන්සේට ගරු බුහුමන් දක්වන්නන් වැඩි වුවාක් මෙන් ම විරුද්ධකාරයෝ ද වැඩි වු හ. එහෙත් බුදුන් වහන්සේ ගම් නියම්ගම්, නගරවල ශ්‍රාවක පිරිස සහිත ව හුදෙකලාව ද සැරි සැරු නමුත් කිසි දිනක උන් වහන්සේ ගේ ජිවිතාරක්ෂාව පිණිස පොලිස් භටයෝ නො යොදනු ලැබුහ. උන් වහන්සේ තුළ පැවැති ශ්‍රෙෂ්ඨ ගුණධර්මයෝ උන් වහන්සේ ආරක්‍ෂා කල හ.

දඹදිව පැවති රාජවංශ අතර මානාධික රාජවංශය ලෙස පතල ව තිබුනු ශාක්‍යවංශයෙහි උපන් කුමාරයකු රාජ්‍ය සම්පත් අත් හැර මහමග හිගා කන තවුසකු බවට පත්වීමෙන් දඹදිව එකල පැවැති ධනවාදයටත්, ඒකාධිපතිවාදයටත්, කුලවාදයටත්, සුඛෝපභෝගි ජිවිත ගත කරන්නන්ටත්, රාජර්ධියටත් වැදුනේ බලවත් පහරකි. රජවරුත් රාජවංශිකයෝත් සිදුහත් කුමරා ගේ පලා යෑම ගැන අසතුටු වුහ. ඔටුන්න හිමි කුමරකු රජ මැදුරු බලබලා විදිවල පිඩුසිගා යෑම ගැන වඩාත් අසතුටු වුහ. සැපසම්පත් පිලිබඳ අන්තිම උච්චස්ථානයේ සිටියකු ඒ සියල්ල අත් හැර සාමාන්‍ය පොදු ජනයා අතරට බැස කිසිවක් නැත්තකු බවට පත්වීම ගැන ද සමහරු කැමැති නුවුහ.

එකල මහජනයා පිලිගත් ශාස්තෘන් ලෙස පෙනී සිටි අයට වඩා වෙනස් මගක් ගැනීම ගැන වැඩිහිටි ශාස්තෘවරු ද ඔවුන් ගේ අනුගාමිකයෝ ද විරුද්ධ වුහ. නුගත් මහජනයා රවටා ගෙන රට කකා සිටි බමුණන්ගේ කුලවාදයට විරුද්ධව දේශනා කිරිම නිසා බොහෝ බමුණෝ විරුද්ධ වුහ. දෙව්දත්තෙර ද ඔහුට පක්‍ෂපාතව සිටි අජාසත් රජු ද විරුද්ධ වුහ.

බුදුරදුන්ට ලෝකයාට සේවය කරන්නට සිදු වුයේ මෙවැනි බලවත් විරුද්ධකාරයන් පිරිසක් මැද ය. බුදුරදුන් මරන්නට ගල් පෙරළුහ. දුනුවායන් යෙදවු හ. රා පොවා මත් වු ඇතුන් යෙදවු හ. **සුන්දරී පරිබ්‍රාජිකාව** හා **චිංචිමානවිකාව** ලවා කළ හැකි අන්තිම බරපතල චෝදනාව කරවු හ. මිනි මැරුම් චෝදනාවක් එල්ලකළ හ. මෙසේ අප්‍රමාණ විරුද්ධකාර්යන් ගෙන් බැනුම් හා චෝදනා ලැබුහ. එක් බමුණෙක් බුදුරදුන්ට වසලයා ය මුඩුමහණ යයි මුණට ම බැන්නේ ය. එහෙත් බුදුහු ඒ කිසිවකින් කම්පා නො වු හ. ඒ හැම කෙනෙකු කෙරෙහි ම රාහුල කුමාරයාට දැක්

වු කරුණාව හා අනුකම්පාව කිසි වෙනසක් නැතුව දැක්වූහ.

අපහාස කිරීම්වලින් ඇනුම් බැනුම්වලින් විරුද්ධකම්වලින් බුදුහු කිසි විටෙක ස්වල්පමාත්‍ර වු කලකිරීමක් ඇති කර නො ගත්හ. තම රට අත් හැර යන්නට නො සිතූ හ. සේවය අඩු කරන්නට නොසිතූහ. පළි ගන්නට නොසිතූහ. එසේම බිය නොවූහ. කම්පා නුවූහ. හැම කෙනෙකුට ම සම සේ මෛත්‍රිය කළ හ . ඒ මෛත්‍රී බලයෙන් හැම විරුද්ධකාරයෙක් ම මෙල්ල වු හ. දමනය වූහ.

විරුද්ධකම් කරන්නට කරන්නට උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය වඩාත් ප්‍රකට විය. දෙව්දත්තයෙකු ඇති නුනා නම් සමහර විට බුදුරදුන් ගේ ගුණ එතරම් ප්‍රකට නො වන්නට තිබුනි. පළි ගැනිම නිසා දෙව්දත්තයෙක් ඇති විය. පළිනොගෙන විරුද්ධකාරයාට මෛත්‍රිය කිරීම නිසා බුදුකෙනෙක් ඇති වූහ. පළිගැනිම ගැන හොඳම නිදසුන දෙව්දත්තයාය. පළිනොගැනීම ගැන හොඳම නිදසුන බුදුහාමුදුරුවෝය. බැන්නොත් තරහ වන, බැනුම් අහන්නට අකැමැති සමාජ සේවකයන්ට, පාලකයන්ට, නායකයන්ට බුදුහාමුදුරුවෝ හොඳම නිදසුනකි.

සමාජ වැඩට ගොස් බැනුම් අහන්නට අකැමැති අය සමාජ වැඩට ගොස් බැනුම් අහන්නට අකැමැති අය සමාජ වැඩට නො බැසිය යුතු ය.

බැනුම් ඇසීමේ බලාපොරොත්තුවෙන් ම සමාජ වැඩට බැසිය යුතු ය. කිසි වැඩක් නොකර සිටින අයට බැනුම් නො අසා සිටිය හැකිය. එහෙත් ඒ අය වැඩ කරමින් බැනුම් අසන්නන් තරම් ශ්‍රේෂ්ඨ නැත. සේවය කිරීමේ දී බැනුම් අසන්නට ලැබීම සේවයෙහි ඇති වටිනාකම පෙන්වන නිදසුනකි.

යමෙකු බැනුම් ඇසීමෙන් කලකිරුනොත් හෝ පසු බට වුනොත් ඔහු නියම සමාජසේවකයෙක් නොවෙයි. සේවය කිරීමේ දීත් බැනුම් ඇසීමේ දීත් නිතර ම බුදුන්වහන්සේ ගැන සිතා උන් වහන්සේ පිළිපැද්ද හැටියට පිළිපදින්නට උත්සාහ දැරිය යුතු ය. බුදුන් වහන්සේ බැනුම් ඇසූ හැටිත් ඒවා ඉවසූ හැටිත් බෞද්ධයන් වු අප බැනුම් අසන හැම විට ම සිහි පත් කළ යුතු ය.

ජීවන සැලැස්ම

බුදුසමය යනු දිවිපෙවෙතින් උසස්ම ප්‍රතිඵල ලද හැකි ආකාරයෙන් ජීවත්වීම පිළිබඳ සැලැස්මකි. එය බුද්ධිය හා ප්‍රඥාව පිළිබඳ ආගමකි. එය අවබෝධයට හා දැනුමට මුල්තැන දෙන ප්‍රඥාව පිළිබඳ ආගමකි. බුදුහිමියන් ධර්මය දේශනා කළේ පුද්ගලයන් සිය ආගමට හරවාගනු පිණිස නොව ධර්මයට සවන් දෙන්නන්ට යථාතත්ත්වය අවබෝධ කරවීමටයි.

බටහිර ලේඛකයෙක්

දරු ස්නේහයෙන් පිස්සු වැටී සිටි ඇයට බණ කීමෙන් පලක් නැති බව දත් බුදුහු, "මා කියන බෙහෙත ගෙනැත් දුන්නොත් දරුවාට පණ උපදවා දෙමි" යි කීහ. "කුමක්ද ස්වාමීනි, බෙහෙත?" "අබ මිටක්." "හා, ඒක මොකක්ද?, ඉක්මනටම ගෙනැත් දෙන්නම්" යයි කියමින් යන්ට පිටත් වූවාය. "ඔහොම ඉන්න. හැබැයි ඒ අබමිට කෙනෙකු නොමළ ගෙදරකින් වෙන්නට ඕන" - "හොඳයි මම ගෙනැත් දෙන්නම්, බුදුහාමුදුරුවනේ."
17 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම ප්‍රතිපත්තිය පෙන්වූ නායකයාණෝයි

මිනිස් සමාජයේ යහපත සඳහා සහ ලෝක සාමය සඳහා නොයෙක් නොයෙක් රටවල නීතිවේදීන් හා දේශපාලනඥයින් විසින් ගෙන ඇති පනවා ඇති ව්‍යවස්ථා න්‍යාය හා නීතිරීති බොහෝ ය. එහෙත් ඒවා මුළු ලෝකයාගේ ම යහපත පිණිස හේතු වී නැත. මුළු ලෝකයටම සාධාරණ වී නැත. ඒ නීතිරීති හා ප්‍රතිපත්ති වල නොයෙක් අඩුලුහුඬුකම් ඇත.

එහෙත් බුදුන් වහන්සේ බොහෝ කලක සිට උත්සාහ ගැනීමෙන් හා දුක් විඳීමෙන් පර්යේෂණ පවත්වා ක්‍රියාවේ යොද අත්හඳ බලා සොයා ගත් මැදුම්පිළිවෙත තරම් ලෝකය යම් තාක් පවතී ද ඒ තාක් කල් පවත්නා මිනිස් සමාජය යම් තාක් දියුණු වේ ද ඒ තාක් යෝග්‍ය වන ප්‍රතිත්තියක් අන් කිසිවකු සොයා ගෙන ඇත.

සිද්ධාර්ථ තාපසයා කුමාර කාලයෙහි සීමාන්තික සැප වින්දේ ය. තාපස කාලයෙහි සීමාන්තික දුක් වින්දේය.

මේ ක්‍රම දෙකෙහි ම ඇති නිසරු බව (**හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො දුක්ඛො අනරියො අනත්ථ සංහිතො**) හොඳින් වටහා ගෙන ඒ සීමාන්ත අත්හැර මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා, (**චක්ඛුකරණී, ඤාණකරණී, උපසාමය අභිඤ්ඤාය සම්බොධාය ... නිබ්බාණාය සංවත්තති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි**) "පෙර නොඇසූ විරූ ධර්මයන් කෙරෙහි ඇස පහළ විය. නුවණ පහළ විය. විද්‍යාව පහළ විය. ප්‍රඥාව පහළ විය. ආලෝකය පහළ විය. යයි" උදන් ඇනුවේය.

බුද්ධිය පිළිබඳ ව උන්වහන්සේ ලැබූ ඒ පුදුම අවබෝධ ය, ආලෝකය වහ වහා ම ලෝකයා ඉදිරියෙහි තබනු සඳහා උත්සුක වූ හ. කොටින් ම බුදු බව ලැබුවේ ඒ උතුම් මධ්‍යම ප්‍රතිපදවෙහි පිහිටා ය.

මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා බුදුවන්නට පිලිවන් නම් වෙන ලබා නොගත හැකි දියුණුව යහපත කුමක්ද? මධ්‍යම ප්‍රතිපදව ලෝකයේ පැවැත්ම පිළිබඳ ආරක්ෂක ධර්මයෙකි. විශ්වයේ ග්‍රහලෝක පවා ගමන් කරන්නේ කර කැවෙන්නේ මධ්‍යම ප්‍රතිපදව නැමැති ගමන් මගෙහි ය. යම් ලෙසකින් ග්‍රහලෝකයක් සීමාව ඉක්මවා භ්‍රමණය උනොත් එය කඩා වැටී හෝ විනාශ වී යා හැකිය. මේ මහා පෘථිවිය පවා රඳ පවත්නේ මධ්‍යම ප්‍රතිපදව උඩය. හැම දෙයකම හැම ක්‍රියාවකම සීමාව ඉක්මවීම විනාශයට හේතු ය.

අප දින පතා බුදින බත් අපේ ජීවිතය රැක දෙයි. එහෙත් බත් පිඟන් කීපයක් හෝ බත්හැලියක් එක වර කෑවොත් එය විනාශයට හේතු වේ. බොන ජලය අපේ ජීවිතය රැක දෙයි. එහෙත් වතුර පනිට්ටු ගණනක් බීවොත් ජීවිත විනාශයට හේතු වේ. සීමාව ඉක්මවා මත්පැන් බොන්නෝ ඉක්මනින් විනාශයට පත් වෙති. සීමාව ඉක්මවා නිදි මරන්නෝ පිස්සු වැටෙති.සීමාව ඉක්මවා බෙහෙත් බීවොත් මරණයට හේතු වේ.

මිනිසකු ජීවත් විය යුතු වැඩ කල යුතු සීමාවක් තිබේ. එය ඉක්මෙව්වොත් ඔහුගේ විනාශයකි. ස්ත්‍රියක හැසිරිය යුතු සීමාවක් තිබේ. එය ඉක්මෙව්වොත් ඇගේ විනාශයකි. භික්ෂු නමක් පිළිපැදිය යුතු සීමාවක් තිබේ. එය ඉක්මෙව්වොත් ඔහුගේ විනාශයකි. නිලධාරියකු, මැති ඇමතියකු, අගමැතියකු, රජකු පිළිපැදිය යුතු සීමාවක් තිබේ.එය ඉක්මෙව්වොත් ඔවුන් ගේ විනාශයෙකි. රටක්, ජාතියක් ජනකායක් සමාජයක් යා යුතු සීමාවක් තිබේ. එය ඉක්මෙව්වොත් ඒ රටේ

ජාතියේ ජනකායයේ සමාජයේ විනාශයකි. සීමාන්තික වාදය භයානක ය. විනාශකාරී ය. බුදුහු එය අත්හඳ බලා හින ය. ග්‍රාම්‍යය අනායෳීය. අනර්ථකරය. යයි පැවසුහ. සීමාන්තික බලතල ඇති දේශපාලනධම් ඇති රටවල් තිබිය හැකි ය.

මධ්‍යම ප්‍රතිපදාවෙන් දීර්ඝ කාලයක සිට සකස් වුණ රටවල් අතර ලංකාව ප්‍රධාන තැන ගනී. අපේ බෞද්ධ රජවරු අන්තඃපුර තබා ගෙන සීමාන්තික සැප නො වින්ඳහ. සීමාව ඉක්මවා වැසියන් නො පෙළූහ. අන් රටවල් අල්ලා ගැනිමට යත්න නොදැරූහ. අන්රටවල දේශපාලන ධම් කොපි කර නො ගත් හ. අනෙක් රටවල පාලකයන් පසු පස නො දිවූ හ. මහ ජනයාට අවශ්‍ය ආහාර පාන සපයා ගැනිම සඳහා රට පුරා වැව් තනවා ගොවිතැන් දියුණු කොට හොඳට කන්නට අඳින්නට දුන්හ. රටවැසියා නීතිගරුක විනීත ජනකායක් කරුණු සඳහා දගැබ් විහාර පන්සල් තනවා ආගම භක්තිය මිනිස් සිත් තුළ කවා වැසියන් අතර සාමකාමී සහජීවනයක් ඇති කළහ. මේ සියල්ල කෙළේ බුද්ධාගමෙන් ලැබුණු මධ්‍යම ප්‍රතිපදාව උඩ යි.

> "මෙලොව හිතසුව පිණිස පවත්නා ප්‍රතිපත්තියක් හැටියට සමජිවිකතාව බුදුරදුන් පෙන්වා දී ඇත. සමජිවිකතාව නම් භෝගවල අයවැය විමසා වැඩිත් අඩුත් නො කොට සමව ජිවිකාව ගෙන යාමයි." **(යතො බ්‍යායං ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො අයං ච හෝගානං විදිත්වා, වයං ච භොගානං විදිත්වා සමං ජීවිකං කප්පෙති, න අච්චොගාළ්හං, න අති හීනං එවං මෙ ආයො වයං පරියාදාය ඨස්සති." න ච මෙ ආයො වය ං පරියාදාය ඨස්සති" නවමෙ ආයො වයං පරියාදාය ඨස්සති අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සමජිවිකතා.)**

බුදුන් වහන්සේ දෙසූ මේ මධ්‍යම ප්‍රතිපදාව ධර්මාශෝක රජතුමා කොතරම් ගරු කොට සැලකුවේ දැ යි කියතොත් එතුමා ගේ ගිරි ලිපියක "**අය වැය දෙක්හි මධ්‍යම ප්‍රතිපදාව යහපත් ය.**"

(අපව්‍යයතා අපභාඩතා සාධු ගිරි ලිපි අංක 3)

යනුවෙන් රටවැසියා ගේ දැන ගැනිම පිණිස ලියවා ඇත. එබැවින් බෞද්ධයන් අනුගමනය කළ යුත්තේ අනෙක් මොන ම ප්‍රතිපත්තියක් වත් නො ව බුදුහාමුදුරුවන් ගේ මධ්‍යම ප්‍රතිපදාවයි.

ඕනෑ ම පුද්ගලයකුට, සමාජයකට, රටකට, ජාතියකට, ජනකායකට ඔරොත්තු දෙන, ගැළපෙන, උසුලා ගෙන සිටිය හැකි එක ම ක්‍රමය එකම ප්‍රතිපත්තිය මධ්‍යම ප්‍රතිපදාවයි. වේගයෙන් නැගුන පුද්ගලයින්, ජාතින් හා රටවල් වේගයෙන් වැටුන හැටිත්, උඩ පැන්න අය බිම වැටුන හැටිත්, ලෝකය දෙස බැලූ විට අපට පෙනේ.

එබැවින් අපේ ජිවිත සකස් කර ගත යුතු ව ඇත්තේ තනිකර ම මධ්‍යම ප්‍රතිපදාව අනුව යි.

යහපත් දැකිම යහපත් කල්පනාව. යහපත් වචනය, යහපත් වැඩ, යහපත් දිවි පෙවෙත, යහපත් වෑයම, යහපත් සිහිය, යහපත් ලෙස සිත එකග කර ගැනිම යන මේ ශ්‍රෙෂ්ඨ මාර්ග අටෙහි මිනිසා ගමන් කරන විට නිරායාසයෙන් ම ඔහු ගේ ප්‍රතිපත්තිය - පිළිපැදිම මධ්‍යම ප්‍රතිපදාව වේ. හැම බෞද්ධ ජිවිතයක් ම ගෙන යා යුත්තේ මේ උතුම් ප්‍රතිපත්තිය උඩයි.

මානව ආගම

ඉර හඳ පවතින තෙක් බුදු දහම පවතී. මිහි තලයෙහි මානව සංහතිය පවත්නා තෙක් බුදු සමය පවතී. මක්නිසාදයත් එය මිනිසා ගේ මුලු මහත් සංහතියේ ආගම හෙයිනි.

ශ්‍රී ලංකාවේ හිටපු අගමැති එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක

සභිය පරිබ්‍රාජකයා බුදුරදුන් වෙත ගොස් පිළිසඳර කතා බස් කොට, 'මගේ සිතේ සැක සහිත කරුණු රාශියක් තිබේ. ඒ පිළිබඳ ප්‍රශ්න අසන්නට කැමැතියි. ඔබ වහන්සේ ඒවාට පිළිතුරු දෙනවා දැයි ඇසීය. 'සභිය, ඔබ බොහෝ දුර සිට (යොදුන් 700 ක්) මගෙන් ප්‍රශ්න ඇසීමේ බලාපොරොත්තුවෙන් ආවෙහිය. ඕනෑ තරම් ප්‍රශ්න අසන්න ඒ ප්‍රශ්න එකින් එකට පිළිවෙළින් ධර්මානුරූපව අර්ථානුරූපව පිළිතුරු දෙමි'යි බුදුහු කීහ.

19 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ සංඝශාසනය නැමැති තරුණ සංවිධානයක් ඇති කළ තරුණ ශාස්තෘවරයාණෝය

සිද්ධාර්ථ තාපසයා බුදු වන විට වයස අවුරුදු 35 ක තරුණයෙකි. ප්‍රථම ශිෂ්‍ය පිරිස වූ **යසකුලපුත්‍රයා** ඇතුලු හැට නම තරුණයෝ ය. දෙවෙනි ධර්මදූත පිරිස වූ **භද්දවග්ගිය** කුමාරවරුන් තිස් දෙනා ද තරුණයෝ ය.

ඉන් පසු මහණ කළ **උරුවෙලකාශ්‍යප ජටිලයා** ඇතුළු 500ද, **නදීකාශ්‍යප** ඇතුළු 300 ද **ගයාකාශ්‍යප** ඇතුළු 200 ද යන මේ 1000 ම තරුණ තවුසෝ යි. ඉන් පසු මහණ කොට අගසවු තනතුරු දෙනු ලැබූ **කෝලිත උපතිස්ස** දෙනම ද ඔවුන් ගේ 250 ක් පිරිස ද තරුණයෝ යි.

ඉන් පසු කපිලවස්තුපුරයේ දි මහණ කළ **නන්ද, රාහුල, භද්දිය, අනුරුද්ධ, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත** යන ශාක්‍ය කුමාරවරු ද **උපාලි** කපුවා ද යන මේ සියල්ලෝම වයසින් පෙනුමෙන් ඇඟපතින් ශක්තියෙන් බුද්ධියෙන් පැසුනු අය නො ව, තරුණයෝ යි.

1500 ක් පමණ වූ මේ තරුණ පැවිදි පිරිස සැතපුම් සිය ගණන පයින් ඇවිද්ද හැකි, අධික ශීත උෂ්ණ ඉවසිය හැකි, දුක් විඳිය හැකි ශක්තිමත් නිරෝගී සිරුරු ඇති තරුණ ධර්මදූත හමුදවකි.

දඹදිව හින්දු ජීවිතය බ්‍රහ්මචාරී, ගෘහස්ත, වානප්‍රස්ථ සන්න්‍යාසි යයි කොටස් හතරකින් යුක්තය. ආවාහ වනතුරු බ්‍රහ්මචාරීව සිට නියමිත වයසේදී ආවාහ වී දූ දරුවන් පිළිබඳ යුතුකම් ඉටු කිරීමෙන් පසු අවුරුදු පනහ හැට වුවායින් පසු ආශ්‍රමයක් කරා යෑම හෝ තපෝවනයකට යෑම හින්දු ජීවිතයේ අවසාන යයි. මේ ක්‍රමය බුදුන් වහන්සේ නො පිලිගෙන අමුතු ම ආගමික සංස්ථාවක් ගොඩ නැගූ හ. තමන් වහන්සේ ද තරුණයෙක් වි තම පිරිසෙන් ඉතා වැඩි කොටසක් තරුණ පැවිද්දන්ගෙන් ම යුක්ත කළ හ.

කල් යෑමේ දි මේ තරුණ පැවිදි සංවිධානයේ සාමාජිකයන් මහළු බවට පත් වුවන් ආරම්භයේ දි වැඩි දෙනා තරුණයන් බවත් පසු කාලවල දි මෙයට ඇතුළු වූවන් ගෙන් වැඩි දෙනා ද තරුණයන් බවත් පිළිගත යුතු ය. එබැවින් මෙයට තරුණ පැවිදි සංවිධානයකැයි කීවාට වරද නැත.

බුදුරදුන් ජීවමාන ව සිටි කාලයෙහි විසූ අනෙක් සියලුම ශාස්තෘවරු බුදුරදුන්ට වැඩිමහල් අය වූ හ. **(ජින්නා. වුද්ධා මහල්ලකා. අද්ධගතා වායො අනුප්පත්තා)** වයස් ගත අය වූ හ. තලතුනා අය වූහ.

වැඩිමහල්ලන්ට සැලකිම ගරු කිරීම ආයජීමනුෂ්‍යයන් අතර බොහෝ කලක සිට පවත්නා උතුම් චාරිත්‍රයෙකි. එහෙත් බුදුන් වහන්සේ තමන් ළගට පැමිණි කිසිම වැඩිහිටියකුට අමුතු ගරුබුහුමනක් නො දැක් වූහ. **බුද්ධි මහිමයෙන් හා ශීල සමාධි ආදි උතුම් ගුණදහම්වලින් උන් වහන්සේට වඩා උසස් කෙනෙකු නැති බැවිනි.**

දිනක් **වේරඤ්ජ** නැමැති වැඩිහිටි මහලු බමුණෙක් බුදුරදුන් හමු වන්නට පැමිණ,

> "භවත් ගෞතමයන් වහන්ස. ඔබ වහන්සේ වෘද්ධ වයස්ගත වැඩි මහලු මහණ බමුණන් පැමිනි විට ඔවුනට වැඳීම්, හුනස්නෙන් නැගිටීම්, අසුන් පැනවීම ආදි ගරු බුහුමන් කරන්නේ නැතැ යි අසා

ඇත්තෙම්. එය සැබෑ ද සැබෑ නම් ලොකු වරදක් නො වේ දැ" යි ඇසී ය.

එයට පිලිතුරු දුන් බුදුහු ,

"මා විසින් වැඳිම් පිදීම් ආදියෙන් ගෞරව කළයුතු, ඒ ගෞරව ඉසිලිය හැකි කෙනෙක් දෙව්මිනිසුන් අතර දක්නට නැත. කෙස් පැහුනු තරමින් ගෞරව ලැබිය යුත්තෙක් නොවේ.

යමෙකු තුළ සත්‍යයත් ධර්මයත් අවිහිංසාවත්, තැන්පත් කමත්, ඉන්ද්‍රිය දමනයත්, බුද්ධිමත් කමත්, කෙලෙස් රහිත බවත් ඇත්නම් අන්න ඒ අය වැඩිහිටි අය ලෙස ගරු බුහුමන් ලැබිය යුතු ය වදාළහ.

දිනක් කොසොල් රජු බුදුරදුන් හමුවන්නට ගොස්

"භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේත් නිරුත්ත වු සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙම් යි වදරණ සේක් දැ" යි ඇසිය.

එවිට බුදුහු

"මහරජ, යමෙක් නිරුත්තර වු සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළේ යයි ඇත්ත වශයෙන් ම හැබෑවට ම කියතොත් ඒ කිය යුත්තේ මා සඳහා යි. මහරජ මම නිරුත්තර වු සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙම්" යි කි හ.

ඒ ඇසු කොසොල් රජු

"භවත් ගෞතමයන් වහන්ස, විශාල පැවිදි පිරිසක් ඇති, පැවිදි පිරිසක ගේ නායකත්වය දරණ පැතිරි ගිය කිර්ති ඇති, බොහෝ දෙනා විසින් ගරු බුහුමනින් පිළිගනු ලැබු **පූර්ණ කාශ්‍යප, මක්ඛලි ගෝසාල, නිගණ්ඨනාතපුත්ත, සංජය බෙල්ලට්ඨපුත්ත, පකුධ කච්චායන, අජිත කේසකම්බලි** යන ශාස්තෘවරු තමන් සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ බව නොකියති. එහෙත් ඔබ වහන්සේ වයසිනුත් තරුණ ය. පැවිද්දෙනුත් නවකය. එසේ තිබිය දි මම සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙම් යි කියති. කොහොම ද මා එය පිළිගන්නේ?"

"මහරජ මේ ලෝකයේ හතර දෙනෙකු ගැන ළදරු ය කියා අවමන් කරන්ට හොඳ නැත. **රාජකුමාරයා, සර්පයා, ගින්න, භික්ෂුනම** යන මේ හතර දෙනා ළදරුය. තරුණය කියා පහත්කොට සැලකිම හොඳ නැත.

රාජකුමාරයා කෝප කළොත් රජ වු විට ඔහු ගෙන් පලිගත හැකිය. නයා කුඩා වුවත් දෂ්ට කළොත් මිනිස් ජිවිතයක් නැති කළ හැකිය. ගින්න ටික වුවත් අත පිළිස්සිය හැකි ය. විශාල වි මුලු ප්‍රදේශයක්ම විනාශ කළ හැකිය. පැවිද්ද කුඩාවුවත් සිල්වත්කමින් පරිපූර්ණ නම් ඔහු ගේ සිල් තෙද බලවත් ය.

(සංයුත්ත නිකාය - කෝසල සංයුක්ත)

බුදුසසුන්හි මහලු වි මහණ වූවන් සිටියේ ස්වල්ප දෙනෙකි. නාකි වි මහණ වූවන්ට **බුඩ්ඪපබ්බජිත** යයි කියනු ලැබේ. බුදුරදුන් පිරිනිවන් පෑ විට හඬා වැළපෙන භික්ෂුන් අමතා,

"අඬන්න එපා ප්‍රිතිවන්න. අපට දැන් ප්‍රධානියකු නැති නිසා ඕනෑ හැටියකට වැඩ කළ හැක්කැ"

යි කිවේ සුභද්‍ර නැමැති බුඩ්ඪපබ්බජිතයෙකි. වැඩිමහලු මහතෙරවරුන් ගෙන් වැදුම් ලබමින් සිටි ථුල්ලතිස්සද ද එබන්දෙකි.

මහණකමට ගැලැපෙන්නේ කුඩා කල සිට ජිවිතය සකස් වූ විටයි. කෙසේ හෝ බුදුන් වහන්සේ තම ශාසන ආයතනය මහලුමඩමක් කරන්නට නො සිතා වැඩි වශයෙන් තරුණයන් ම මහණ කළ හ.

උන් වහන්සේ බුද්ධිමත්ව සකස් කළ මේ ශ්‍රෙෂ්ඨ ආයතනය අවුරුදු 2500 ක් වැනි දිර්ඝකාලයක්

"මා සැහැල්ලු ජීවිතයෙහි අනුසස් කියමින් සිටියදී ලත් ලත් දෙයක් දන්නොදී බොහෝ පිරිකර රැස් කරගෙන සිටින්නේ ඇයි දැ? යි බුදුරජානන් වහන්සේ ඇසූහ. භික්ෂුවට ක්ෂණයෙන් තරහ ගියේය. පොරවාගෙන සිටි සිවුර සිව්වනක් පිරිස මැද පැත්තකට විසි කොට , "ඔබ වහන්සේ කියන්නේ මට මෙහෙම ඉන්නද? යි ඇඳ තිබුණු අඳනයෙන් පමනක් යුක්තව සිටියේය.

22 පිටුව බලන්න

පවතින්නේ ද තරුණකමටත් බුද්ධියටත් විනයටත් මුල් තැන දුන් බැවිනි.

බුද්ධිමත් දක්ෂ තරුණයන්ට නියම තැන නො දෙන මොන ම ආයතනයක් වත් ප්‍රබල බවට ස්ථිර බවට පත් නො වේ. අන්ධයන්, කොරුන් බිරන් ලෙඩුන් වැනි අය මහණ කිරීම තහනම් කිරීමෙන් ම පෙනී යන්නේ සංඝ ශාසනය අඩුලුහුඩුකම් නැති දුර්වලකම් නැති. ප්‍රබල පැවිද්දන් ගෙන් ම සමන්විත විය යුතු බව යි.

වැඩ කළ හැකි සේවය කළ හැකි දක්ෂයන් ගෙන් යුක්ත විය යුතු බවයි. **කෙසේ වුවත් බුදුන් වහන්සේ සංඝ ශාසනය ආරම්භ කිරීමේ දී තරුණකම ගැන විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ.**



දහම් මගට යතුර ප්‍රඥාවයි

කාමසුඛකල්ලිකානු යෝගයෙන් තොරව
දිවි පෙවෙත විඳ දරා ගත හැකිද? අමරණීයත්වය ගැන
ඇදහීමකින් තොරව මිනිසාට සුචරිතවාදී විය හැකිද? දෙවියන්
ඇදහීමෙන් තොරව මිනිසාට ධර්මිෂ්ඨ බව වෙත යා හැකිද?
බුදුහිමියන් ගේ පිළිතුර "ඔව්" යන්නයි.
මේ අරමුණ ප්‍රඥාව මගින් දිනා ගත හැකියි.
උත්තරීතර මාර්ගයට එකම යතුර නම් ප්‍රඥාවයි.
මිනිස් දිවි පෙවෙතට ශාන්තිය හා සාමය සපයනු ලබන්නේ ප්‍රඥාව
විසිනි. ප්‍රත්‍යක්ෂ ලෝකයෙහි අර්බුද ගැන
මිනිසාට උපෙක්ෂා සහගත විය හැක්කේ ඒ මගිනි.

මහාචාර්ය කාල් පියර්සන්

බුද්ධාගම පොතපතට හා වැඳුම් පිදුම්වලට පමණක් සීමා කළයුතු ආගමක් ද?

මේ රටේ බෞද්ධයන් දැනට බුද්ධාගම අදහා ගෙන යන තාලයෙන් පෙනි යන්නේ වැඩිකල් නොගොසින් බුදුන් වහන්සේ බලාපො රොත්තු වුනාට වඩා හාත්පසින්ම වෙනස් වු ඇදහිලි ක්‍රමයක් බවට බුද්ධාගම පරිවර්තනය වන බව යි. බෞද්ධයකුගේ මූලික ගුණධර්ම පහක් වු පන්සිල්, උත්සවයක හෝ රැස්වීමක හෝ ආරම්භයේදී කියනු ලබන පාඨ පහක් බවට පත්ව ඇත. සියයට සියයක් ම ක්‍රියාවේ යෙදවිය යුතු පන්සිල් සියයට සියයක් ම ක්‍රියාවේ නො යෙදෙන පාලිවචන බවට පත් ව ඇත.

එදිනෙද ජීවිතයේ සිදුවන සිදු විය හැකි වැරදි පහක් පව් පහක් නො කරමි යි පොරොන්දු වන එකම මිනිස් ජනකාය බෞද්ධයෝ යි. මේ පොරොන්දු පහ ඇත්ත වශයෙන් ම කඩ නොකොට රකිතොත් ඒ මිනිස් ජනකායගේ ඇති ශ්‍රේෂ්ඨකම කිව නොහැකි තරම් ය.

බුද්ධාගම අදහන අතරම පිළිපැදිය යුතු ආගමකි. බුද්ධාගම යනු මිනිසකු ජීවත් වියයුතු හොඳම ක්‍රමයයි. ජීවිතයක් ගෙන යායුතු නියම ක්‍රමය උගන්වන ආගම බුද්ධාගමයි. බුද්ධාගමේ සඳහන් කරුණු පොත්වල තිබීමෙන් හෝ ඒවා ගැන සිත සිතා සිටීමෙන් හෝ කිසි පලක් නැත. එහි සඳහන් ගුණ ධර්ම, ප්‍රතිපත්ති එදිනෙද ජීවිතයට යොද අත්හද බැලිය යුතු ය. ක්‍රියාවේ යෙදවිය යුතු ය. එසේ නොකොට මේ ලංකාව වෙහෙර විහාරවලින් පිරුණත්, බෞද්ධයන් ගෙන් පිරුණත්, මේ රටේ හැබෑ බුද්ධාගම නියම බුද්ධාගම ඇතැයි කියා කිව නො හැකි ය.

වෙහෙර විහාරත්, පුදපූජාත්, වැඳුම් පිදුණුත් බුද්ධාගමේ හරය නො වේ. ගහට පොත්ත මෙන් ඒවා ආගමක් ජීවත් වීමට අවශ්‍ය දේ යි. ආගමික ගොඩනැගිලි, පුද පූජානැති වන විට ආගම මිය යයි. එබැවින් ඒවා ද අවශ්‍ය ය. එහෙත් ඒවා ආගමක නියම පරමාර්ථය නොවේ. ආගමක් ඇත්තේ තිරිසනුන්ගේ ප්‍රයෝජනයට නො ව තනි කර මිනිසා ගේ ප්‍රයෝජනයට යි.

මිනිසා ආගම නො අදහයි නම්, නැතහොත් මිනිසා ආගමෙන් ප්‍රයෝජන නොගනී නම් ආගම අනුව ජිවිතය හැඩ ගසා නොගනී නම් ඒ ආගම පොතට හා සිරිත් විරිත්වලට පමණක් සීමා වනු ඇත. ලංකාවේ බුද්ධාගමේ තත්ත්වය ද ඒ අතට හැරී ගෙන එයි. බුදුන් වහන්සේ ඇත්ත වශයෙන් ම බලාපොරොත්තු වුයේ මැටියෙන්, ඉටියෙන්. සිත්තමෙන්. ගලෙන්. බදමෙන් උන් වහන්සේ ගේ රූපය අඹා ගෙන, හද ගෙන, ඇඳගෙන, තනාගෙන ඒවාට වැඳ වැඳ සිටින පුද පුජා කර සිටින පිරිසක් නොවේ. ඒවාට වැඳිම පිදිම හොඳ ය. වරදක් නැත. එහෙත් බෞද්ධයන් ගෙන් උන් වහන්සේ බලාපොරොත්තු වූයේ එය ම නොවේ. උන් වහන්සේ බලාපොරොත්තු වූ එකම දෙය නම් උන්වහන්සේ පෙන්වූ ඒ ශ්‍රේෂ්ඨ මාර්ගයෙහි ගමන් කිරිම යි.

ඒ ශ්‍රේෂ්ඨ මාර්ගය නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. ඒ මාර්ගයේ ගමන් නොකොට උදේ සිට හැන්දෑ වන තුරු දවසක් දෙකක් නො ව අවුරුදු සියයක් වැඳ වැඳ සිටියත් පුද පුද සිටියත්, ගරු කරමින් සිටියත් නිවන් දැක්ක නො හැකිය. නිවනට යාමට උන් වහන්සේ පෙන්වූ මාර්ගයෙහිම යා යුතු ය. යමෙකු නියම බෞද්ධයකු වන්නේ බුදුන් වහන්සේ පෙන්වූ මාර්ගයෙහි එනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන් කලොත් පමණකි.

බුද්ධාගම පුද්ගලයකු අදහන ආගමක් නොවේ.

ගුරුභක්තියේ මූර්තියක් වූ අංගුලිමාල එකල දඹදිව විසූ හැම කෙනෙකුන්ට ම අතිභයංකර මිනිමරුවෙකි. නම ඇසූ පමණින් රජු ඇතුළු මුලු රටවැසියා ම බියෙන් කම්පිත වූහ. මොහු මරා දමන්නට කළ හැම ප්‍රයත්නයක්ම ව්‍යර්ථ විය. මේ දරුණු මිනි මරුවා තුළ රහතන්වහන්සේ කෙනෙකු සැඟවී සිටි බව හෙවත් රහත්වීමේ භාග්‍යය තිබෙන බව ඒ කිසිවෙක් නොදුටුවෝය. තිලෝගුරු තුමා පමණක් දුටුවේය.

23 පිටුව බලන්න

ගුණධර්ම අදහන ආගමකි. බුදුන් වහන්සේ ශාස්තෘවරයා හැටියට අප සලකන්නේ උන් වහන්සේ තුළ පැවැති ශ්‍රේෂ්ඨතම ගුණධර්ම නිසා යි. අපි වඳින්නේ උන් වහන්සේ ගේ සිරුරට නොව ගුණ ධර්මවලටයි. ඒ නිසා අපේ ශාස්තෘවරයා, ශ්‍රේෂ්ඨ ගුණධර්මයි. ගුණධර්ම නැති තැන බුද්ධාගමක් නැත. බෞද්ධකමක් නැත. පරිත්‍යාගශීලි බව,නිර්ලෝභිබව, මෛත්‍රිය, කරුණාව දයාව, නිහතමානි බව, සමානාත්මතාව, පරාර්ථකාමී බව, ඉවසීම, ආදි දහසක් ගුණධර්ම බෞද්ධකමෙහි අඩංගු වී ඇත. මේ ගුණධර්ම නැති තැන බෞද්ධකමක් නැත.

හොරකම, කපටිකම. වංකකම, බොරුව, තණ්හාව, ඊර්ෂ්‍යාව ආදි දහසක් අගුණවලින් හෙවත් දුර්වලකම් වලින් බෞද්ධ නමින් සිටින වැඩි දෙනා වෙලී සිටිති. ධන ලෝභයෙන්, බලලෝභයෙන්, කීර්තිලෝභයෙන්, තනතුරු ලෝභයෙන් බොහෝ දෙනා මහත් සටනක් කරති. බෞද්ධකම තබා ශිෂ්ඨකම හා මිනිස්කම පවා අමතක කොට ඇත. ආගම නිතර සිහි කරණ අය දුර්ලභය. පාංශුකූලයටත්. දනයටත්. පිරිතටත්. පන්සිල් සමාදන් වීමටත් එය සීමා වී ඇත. බුද්ධාගම එක් තැනකය. බෞද්ධයෝ අන් තැනකය.

දරු සොවින් පෙළුනු කිසාගෝතමියට බුදුරදුන් බණ කිවේ නැත. මරණය ගැන ඇයට ම අවබෝධවන ක්‍රමයක් සැලැස්සූ හ. ඒ නිසා බණෙන් හැදිය නො හැකි මිනිසුන් හැදිය හැකි තවත් නොයෙක් ක්‍රම ඇත. අප එම ක්‍රම ගැන සොයා බැලිය යුතුය. ගිහි පැවිදි සම්බන්ධය දැන් මේ රටේ දුරස් ව ඇත. එයට හේතු රාශියකි. ඒවා සොයා බලා ඒ සම්බන්ධය ඇති කර ගැනිමේ ක්‍රම සම්පාදනය කළයුතු ව ඇත.

භික්‍ෂුනමකට කළහැකි සේවය අපරිමිත ය. සමාජසේවය භික්ෂු ජිවිතයේ ප්‍රධාන අංගයක් කළ යුතුව ඇත. භික්ෂුන් වහන්සේ මිනිසුන්ට අවශ්‍ය වන පරිදි, නැතිව ම බැරි වන පරිදි ප්‍රයෝජනවත්වන පරිදි සකස් විය යුතු ව ඇත. භික්ෂුන් වහන්සේ ගේ සේවය දනයට පිරිතට හා පාංශුකූලයට පමණක් සීමිත ව තිබු කාලය ගත වි ඇත. භික්ෂුන් වහන්සේ සමාජය පෙරමුණේ, සමාජයත් සමග ම භික්ෂුත්වය ද රැක ගනිමින් යා යුතු ය. ජීවත් විය යුතුය. අවංක ව රට දැයට වැඩ කිරිමට හිත ඇති, කාලය ඇති, ශක්තිය ඇති ඕනෑකම ඇති පිරිසක් භික්ෂුන් වහන්සේලා හැර වෙන නැත. උන් වහන්සේ ලා කෙරෙහි පෞද්ගලිකත්වයක් නැත.

ඇවැද්ද සපයා තියන්ට, මුදල් තනා තියන්ට, මුදල් රක්ෂණය කර තියන්ට භික්ෂුන්වහන්සේ ගෙන් යැපෙන බලාපොරොත්තු වන එසේ නො කලොත් දෙස් කියන සාප කරන පිරිසක් නැත. ඒ නිසා ම කිසිවකුට බැඳීමක් නැත. එබැවින් ම නිදහසේ සේවය කිරීමට පිළිවන්කම ඇති එකම පිරිස භික්ෂුන් වහන්සේලා ය. මේ බුද්ධිමත්, භක්තිමත් පිරිසෙන් මේ රට නියම ප්‍රයෝජන නො ගන්නේ මොන අභාග්‍යයක් නිසාද? යම් කිසි ශ්‍රේෂ්ඨ ආයතනයක් වෙනුවෙන් මුළු ජිවිතයම පරිත්‍යාග කොට සිටින කැපකොට සිටින බුද්ධිමත් අව්‍යාහක විසි දහසක් පමණ වු සමාජ සේවක පිරිම් හමුදවක් මේ රටේ සිටිති. ඒ බෞද්ධ භික්ෂුන් වහන්සේ ලා යි. ගම්වල දියුණුව සඳහා උන් වහන්සේලා ගෙන් ගත හැකි ප්‍රයෝජනය අප්‍රමාණය. රජුත්, මැති ඇමැතිවරුනුත්. නිලධාරිනුත් උන්වහන්සේලා කොන් කොට තබා තිබෙන තුරු මේ රට එතරම් ලේසියෙන් හැදිය හැකි නොවනු ඇත.

භික්ෂුන් වහන්සේලා ද රටට ගැළපෙන පරිදි සමාජයට ගැලපෙන පරිදි සමාජයේ අවශ්‍යතා විසඳලිය හැකි පරිදි සමාජයට අනුශාසනා කල හැකි පරිදි සකස් විමට කාලය පැමින ඇත.

බුද්ධාගම පොතපතට හා වැඳුම්පිදුම්වලට පමණක් සීමාවීම වැලැක්විය හැක්කේ එවිටය.

බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මාර්ග දේශකයාණෝයි

තථාගතවරයෝ වනාහි මාර්ගදේශකයෝ "**අක්ඛාතාරො තථාගථා**" යැයි බුදුන්වහන්සේ විසින්ම වදාරන ලදී. **මග්ගඤ්ඤූ මග්ගවිදූ, මග්ගකෝවිදෙ** යන නම්වලින් ද බුදුවරු හඳුන්වනු ලබති. නියම මාර්ගය, ආර්ය මාර්ගය දත් තැනැත්තා යනු එහි තේරුමයි. මේ නියම මාර්ගය නම් දුකින් මිදීමේ මාර්ගයයි, නිවන් මගයි. බුද්ධඥානයෙන් සොයා ගත් මගයි. මිනිසෙකු විසින් යායුතු මගයි. ඒ මග ගමන් කළ කිසිවෙකුට කිසි විට වැරදී නැත.

බුදුහාමුදුරුවන්ට ඕනෑ කළ එකම දෙය නම් නොමග යන ලෝකයා හරි මගෙහි ගමන් කරවීමයි. මේ හරිමග නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. අංග අටකින් යුත් මේ මගෙහි ගමන් කරන්නාගේ ප්‍රතිපදාව මධ්‍යම ප්‍රතිපදාවයි. සීමාව නොඉක්මවූ මැදුම් පිළිවෙතයි. **සම්මා දිට්ඨි** - යහපත් දැකීම, - **සම්මා සංකප්ප** - යහපත් කල්පනාව, - **සම්මා වාචා**- යහපත් වචනය, - **සම්මා කම්මන්ත** - යහපත් වැඩ, - **සම්මා ආජීව** - යහපත් දිවි පෙවෙත, - **සම්මා වායාම** - යහපත් වෑයම - **සම්මා සති** - යහපත් සිහිය - **සම්මා සමාධි** - යහපත් ලෙස සිත එකඟකර ගැනීම යන මේ අංග අටකින් යුත් ශ්‍රේෂ්ඨතම මාර්ගය බුදුරදුන් විසින් සොයා ගන්නා ලදි.

ඉහත සඳහන් අති උතුම් මාර්ග අටෙන් එක මගක වුවත් ගමන් කළොත් ඔහු මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් වෙයි. දෙකක් පිළිපැද්දෙත් ඔහු වඩාත් ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙක් වෙයි. මේ අටම පිළිපැද්දෙත් ඔහු මිනිසුන්ට පමණක් නොව දෙව් බඹුන්ටත් වඩා උතුම් මනුෂ්‍යයෙක් වෙයි.

බුදුන් වහන්සේ අපට පෙන්වා දුන්නේ "හොඳ මේවාය, නරක මේවාය. කුසල් මේවාය. අකුසල් මේවාය. කළ යුතු දේ මේවාය. නොකළ යුතු දේ මේවාය. ගත යුතු දේ මේවාය, නොගත යුතු දේ මේවාය. පිළිපැදිය යුතු දේ මේවාය. අත් හල යුතු දේ මේවාය. හොඳ දේ කළොත් මේ මේ විදියේ හොඳ විපාක ලැබේය. නරක දේ කළොත් මේ මේ විදියේ නරක විපාක ලැබේය. මා මෙසේ කියන්නේ නිකම්ම නොවේ. අත්හදා බැලීමෙන්ය. පලපුරුද්දෙන්ය. එම නිසා හොඳ දේ කරන්න. නරක දේ අත්හරින්න"යි කියාය.

දයාබර පියෙකු මෙන්, දයාබර මෑණියෙනෙකු මෙන්, කාරුණික අනුශාසකයෙකු මෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට හොඳ මග හරි මග, නියම මග පෙන්වා දුන්හ. එබැවින් උන්වහන්සේ ශ්‍රේෂ්ඨතම මාර්ග දේශකයාණෝයි. මේ උතුම් මාර්ග දේශකයානන්ගෙන් අප ප්‍රයෝජන ගත යුත්තේ කෙසේ ද?

එතුමන්ට වැඳ වැඳ සිටීමෙන්ම ද? පුද පුද සිටීමෙන්ම ද? එතුමන්ගේ විශාල ප්‍රතිමා තැනවීමෙන්ම ද? නැතහොත් එතුමන් ඇඟිල්ල දික්කොට පෙන්නූ හරි මගෙහි ගමන් කිරීමෙන් ද? උන්වහන්සේ නිවන් මග පෙන්වා දීම ගැන අපි උන්වහන්සේට සදා ණයගැති වෙමු.

ඉහත සඳහන් ගරු බුහුමන් පුද පූජා උන්වහන්සේ වෙනුවෙන් අප කළ යුතුය. එයින් අපට පින්සිදු වේ. එහෙත් ඒ ආමිස පූජා පමණක් නිවන් දැකීමට ප්‍රමාණවත් නොවේ. නිවන අප ළඟ ඇති දෙයකි. එය අප විසින්ම ලබාගතයුතු දෙයකි. අප විසින්ම සොයා ගත යුතු දෙයකි. කාගෙවත් පිහිටෙන් ලබාගත හැකි දෙයක් නොවේ. බුදුන්වහන්සේ ඇත්ත වශයෙන්ම බලාපොරොත්තු වූයේ විශාල ගෝල බාල පිරිසක් තනාගෙණ, ඔවුන් පිරිවරාගෙණ මහා



"මහණෙනි, තොපට මම පහුරකට උපමා කොට ධර්මය දෙන්නෙමි. එය එතරවීම පිණිසයි. කර තබා ගෙන යෑම, ආරක්ෂාකර ගැනීම පිණිස නොවේ. මට මේ පහුර බොහෝ උපකාරී විය. මම මේ පහුර නිසා එගොඩ වීමි යි සිතා එය හිස උඩ තබාගෙන හෝ කර ගහගෙන යන්නෙමැයි සිතතොත් එය බුද්ධිමත් සිතිවිල්ලක් නොවේ. එපරිද්දෙන්ම මා දෙසූ ධර්මයද සසරින් එතරවීම පිණිස මිස, කර තබාගෙන යාම පිණිස නොවේ."

67 පිටුව බලන්න

අධිපතියෙකු මෙන් ජීවත්වීමට නොවේ. මිනිසෙකුට විඳිය හැකි අන්තිම ඉහළම දුක් විඳ සොයාගත් ඒ ශ්‍රේෂ්ඨ මාර්ගයෙහි ඒ විසුද්ධි මාර්ගයෙහි ඒ නියම මගෙහි ගමන් කරණ පිරිසකි. උන්වහන්සේ අනුව යන, අනුගමනය කරන පිරිසකි. උන් වහන්සේ සිතූ හැටියට සිතන පිරිසක, උන්වහන්සේ වැඩ කළ හැටියට වැඩකරණ පිරිසකි. උන්වහන්සේ කථාකළ හැටියට කථා කරණ පිරිසකි. උන්වහන්සේ පිළිපැද්ද හැටියට පිළිපදින පිරිසකි.

කොටින්ම උන්වහන්සේ කි දේ අසා සිටින පිරිසක්වත්, එය ලියා තබාගෙන කටපාඩම් කරමින් සිටින පිරිසක්වත්, එයට වැඳ වැඳ සිටින පිරිසක්වත් නොව, කි දේ කරණ, අත්හද බලන ක්‍රියාවේ යොදන පිරිසකි.

බුදුරදුන් පෙන්වූ මාර්ගයෙහි නොගොස් උන්වහන්සේගේ නාමයට, උන්වහන්සේගේ රූපයට ගරු කර කර සිටීමෙන් පමණක් නිවන් දැකිය නොහැකිය.

අපි උදාහරණයක් ගෙන බලමු. මරදානේ දුම්රියපොළට පැමිණි අයෙක් එහි සිටි කෙනෙකු ගෙන් නිදහස් මන්දිරයට යන්නේ මොන පාරෙන් දැයි අසයි. එහි සිටි තැනැත්තා අසවල් අසවල් පාරෙන් යයි යායුතු මග කියා දෙයි. එවිට මාර්ගය ඇසූ තැනැත්තා මාර්ගය පෙන්වා දුන් තැනැත්තා ට වඳිමින්, පුදමින්, ගරු කරමින්, ස්තුති කරමින් එතැනම සිටියොත් හෝ එහි නොගියොත් හෝ නිදහස් මන්දිරයට ගියා වන්නේ නැත. නිදහස් මන්දිරය දැකගන්නේ නැත. ඔහුට ස්තුති කොට, පෙන්වූ මාර්ගයෙහි ම යා යුතුය. නිදහස් මන්දිරයට යැවෙන්නේ ඔහු පෙන්වූ මාර්ගයෙහි ගමන් කොළොත් පමණකි.

බුදුන් වහන්සේ අපට පෙන්වූ ආර්ය මාර්ගය දුම්රිය පොළේ සිටි තැනැත්තා නිදහස් මන්දිරයට යෑම සඳහා පෙන්වූ මාර්ගයට වඩා දහස් ගුණයකින් උතුම් මාර්ගයකි. ඒ ශ්‍රේෂ්ඨ මාර්ගය, ඒ උතුම් නිවන් මග පෙන්වා දුන් උතුමාට දවසට තුන්වරක් වත් වැඳිය යුතුය. පිදිය යුතුය. ගරු කළ යුතුය. එහෙත් නිවන් දැකීමට, නිවණට යෑමට, ඒ උතුම් තත්වය ලබා ගැනීමට වැඳීම්, පිදීම්, ගරුකිරීම් වැනි ආමිස පූජා පමණක් ප්‍රමාණවත් නොවේ. උන්වහන්සේ පෙන්වා දුන් මාර්ගය හැර වෙන කිසිම මගක් නිවන් දැකීමට නම් නැත. අනිවාර්යයෙන් ඒ මගෙහිම යායුතුය.

එයට හොඳ නිදසුනක් මෙන්න. "බුදුන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි වැඩ සිටිද්දී පෘථග්ජන භික්ෂුහු හඬා වැලපෙන්නට වූහ. කෙලෙස් රහිත භික්ෂූහු තුෂ්ණිම්භූතව සංස්කාර ස්වභාවය සිතමින් සිටියහ. මේ අතර ධම්මාරාම නමැති භික්ෂු නමක්

> "අපේ බුදුහාමුදුරුවන් වහන්සේ අන්තිම හුස්ම හෙලන්නට පෙර මම කොහොම හරි ඒ උතුමා දුන් අවවාදයක් අනුව පිළිපැද කිසියම් ප්‍රතිඵලයක් ලබාගනිමි"යි

ඉවාගෙන පැත්තකට ගොස් හුදෙකලාව භාවනාකොට චිත්තපාරිශුද්ධිය ලබාගත්තේය.

ස්වකීය මහාකාරුණික ගුරුවරයා අන්තිම හුස්ම හෙලද්දී ඒ ගැන කිසිදු හැඟීමක් නැතිව පැත්තකට වී සිටි ධම්මාරාම භික්ෂු නම දුටු අඬා වැලපෙමින් සිටි අනෙක් භික්ෂූහු එතැනට පැමිණ ඔහුගේ අතින් අල්ලාගෙන

> "අපේ අමා මෑණියන් අප අත්හැර සදහටම අපෙන් වෙන්ව යද්දී මේ මහණාට පමණක් කිසිම ශෝකයක් දුකක් නැත. මොහු හිතක් පපුවක් නැත්තෙකැ"යි

බුදුහාමුදුරුවන් ලඟට ඇදගෙන ගියහ.

පිරිනිවන් මඤ්චකයෙහි වැඩ සිටි බුදුහු තමන් ලඟට අකැමැත්තෙන් භික්ෂුනමක් ඇදගෙන එනු දැක

> "කුමක් නිසා භික්ෂු නමක් ඇදගෙන එන්නහු දැ" යි ඇසූහ.

එවිට අනිත් භික්ෂූහු ,

> "අනේ ස්වාමීනි ඔබ වහන්සේ පිරිනිවන් පාන්නට සූදානම් ය. ඔබ වහන්සේ නැතිව

අපිට ජීවත් වීමෙන් පලක් නැත. අප කාගේ මුහුණ බලා සැනසෙන්නද? මින් පසු අපට හද පිරුණු කරුණාවෙන් අවවාද අනුශාසනා කරන්නේ කව්ද ? ඒ නිසා අපට ඇති ශෝකය හා දුක අප්‍රමානය. එහෙත් මේ භික්ෂුනමට පමණක් කිසිම දුකක් හෝ ශෝකයක් හෝ නැත. පැත්තකට වී බිම බලාගෙන බුම්මාගෙන සිටිනවා. එබැවින් අපි මොහු ඔබවහන්සේ ළගට ඇදගෙන ආවෙමු"යි කිහ.

බුදුහු

"මොවුන් කියන දේ සැබෑද"යි ඒ භික්ෂුනමගෙන් ඇසූහ.

"එහෙයි ස්වාමීනි, මම මොවුන් මෙන් කිසි පලක් නැති හඬා වැලපීම් නොකොට, පැත්තකට වී ඔබ වහන්සේ දුන් රන් අගනා උපදෙස්වලින් එකක් අනුව පිළිපැද, ඔබ තුමන් ඇස් දෙක පියාගන්නට මත්තෙන්, ඔබ තුමන්ගේ ඇස් හමුවේ දී ම එයින් ප්‍රයෝජන ගනිමියි ඉටා ගත්තෙමි. මගේ ඒ අධිෂ්ඨානය, මගේ ඒ උත්සාහය අතිශයින්ම සාර්ථකයි. මම දැන් මොවුන් මෙන් හඬා වැලපෙන බොළඳ තත්වය ඉක්මවා සිටින්නෙක්මි"යි කිය.

ඔහු කෙලෙස් ප්‍රහීණ කළ රහත් භික්ෂුවක්ව සිටින බැව් දැනගත් බුදුහු පිරිනිවන් මඤ්චකයෙහි වැතිරී සිටි අයුරින්ම සිටගෙන දැත එක්කොට සාධු! සාධු! සාධු! යයි තුන්වරක් සාධුකාර දී අඬා වැලපෙන භික්ෂූන් අමතා ,

"මහණෙනි, මා වෙනුවෙන් හඬා වැලපෙන තෙපි මට හැබෑ ආදරය හා ගෞරවය ඇත්තෝ නොවහු. මගේ එක වචනයක් අනුව පිළිපැද ඉන් ප්‍රයෝජන ගත් මෙන්න මේ භික්ෂුවයි මට සැබෑ ආදරය හා ගෞරවය ඇත්තෙ. මට සැබවින්ම ගරු කරන්නන් මගේ වචනයට ගරු කළ යුතුය. මගේ වචනය ගරු කිරීම නම් එය රන් පත් ඉරුවල, රිදී පත් ඉරුවල, සෙල්ලිපිවල ලියාගෙන ආරක්ෂා කරගෙන සිටීම හා ඒවාට වඳිමින්, පුදමින් සිටීම පමණක් නො ව ඒ වචන අනුව, ඒ අවවාද අනුව පිළිපැදීමයි. ඒවා ක්‍රියාවෙහි යෙදවීමයි. ඒ උපදෙස් අනුව ජීවිතය සකස් කරගැනීමයි."

"සුවඳ මලින් පමණක් මා පුදන්නෝ මා නිසිලෙස පුදන්නෝ නොවෙති. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නෝ ම මා නිසි ලෙස පුදන්නාහු නම් වෙති." "න හි මය්හං මාලාගන්ධාදීහි පූජං කරොන්තා මම පූජං කරොන්තා මම පූජං කරොන්ති නාම. ධම්මානුධම්මං පටිපජ්ජන්තා පන මං පූජෙන්ති නාම."

(ධම්මපදට්ඨ කතා - ධම්මාරාම වත්ථු)

ඉහත සඳහන් කථාවෙන් බුදුහාමුදුරුවන් වහන්සේ කවරෙක් ද යනුත්, උන්වහන්සේගේ බලාපොරොත්තුව කුමක් ද යනුත් අපට මනාව වටාගත හැකිය. උන්වහන්සේ බලාපොරොත්තු වූයේ එතුමන්ගේ දිලිසෙන සිරුරට හෝ රූපශ්‍රීයට හෝ මිහිරි කටහඬට හෝ මහන්තත්ත්වයට හෝ නායකත්වයට හෝ අනුපම පෞරුෂත්වයට හෝ වසීවුනු, අන්ධානුකරණයෙන් හා අන්ධභක්තියෙන් වෙලුනු දහස් ගණන් ගෝලබාල පිරිසක් වටකර ගෙන ඔවුන් ලවා වැඳුම්, පිදුම්, ගරු බුහුමන් කරවා ගැනීම නොවේ.

චිරාභිවාදනය කරවා ගැනීම නොවේ. ඔවුන්ට අවවාද කරමින්, අණ දෙමින්, ඔවුන් යටත් කරගෙන, වසග කරගෙන, කීකරු කරගෙන නායකත්වය හුවාදැක්වීම නොවේ. ධර්මය අනුව පිළිපදින, ධර්මය අත්හඳ බලන, ධර්මය ජීවන ක්‍රමය - ජීවන මාර්ගය කොට සලකන, ප්‍රතිපත්තියට දිවිදෙන, සෘජුත්වයට තැන දෙන, නීතියට ගරු කරන, සත්‍යයට යුක්තියට ගරුකරන, ඉදිරියට යන, නොපසුබසින, නිර්භීත, ධෛර්යවත්, සිල්වත්, ශිෂ්ට සමාජයක් ගොඩ නැංවීමයි උන් වහන්සේ බලාපොරොත්තු



උතුම් පරමාර්ථ පිට සකස් කළ මේ භික්ෂු පිරිස පෞද්ගලිකත්වය සහමුලින්ම අත්හළ පොදු බවේ මූර්තිභූ වූහ. ගෘහ බන්ධන ආදී හැම බන්ධනයකින් ම මිදුනෝ වූහ. වස්තුකාම, ක්ලේශකාම ආදී හැම ආශාවක්ම දුරුකළ අය වූහ. පියාපත් බර පමණක් ඇති පක්ෂින් මෙන් "සපත්තභාරො පක්ඛිසකුණා විය." සිතූ සිතූ තැන යා හැක්කෝ වූහ. 67 පිටුව බලන්න

වූයේ. ඒ සමාජයේ උසස් ම පිරිස භික්ෂු පිරිසයි. උතුම් පරමාර්ථ පිට සකස් කළ මේ පිරිස පෞද්ගලිකත්වය සහමුලින්ම අත්හළ පොදු බවේ මූර්තිභූ වූහ. ගෘහ බන්ධන ආදී හැම බන්ධනයකින් ම මිදුනෝ වූහ. වස්තුකාම, ක්ලේශකාම ආදී හැම ආශාවක්ම දුරුකළ අය වූහ. පියාපත් බර පමණක් ඇති පක්ෂීන් මෙන් "**සපත්තභාරො පක්ඛිසකුණා විය.**" සිතූ සිතූ තැන යා හැක්කෝ වූහ. එද උන්වහන්සේ පසු පස ගියේ, අනුගමනය කෙළේ ශිෂ්ටත්වයේ මූර්තින් බඳු පිරිසකි.

බුදුන්වහන්සේ තමන්ට තබා තමන් දෙසූ ධර්මයටවත් අනවශ්‍ය ගරු සැලකිලි, පුද පූජා හා මමත්වයක් දැක්වීම අනුමත නොකළහ.

"**කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි. නිත්ථරණත්ථාය නො ගහණත්ථාය**" "මහණෙනි, තොපට මම පහුරකට උපමා කොට ධර්මය දෙසන්නෙමි. එය එතරවීම පිණිසයි. කර තබා ගෙන යෑම, ආරක්ෂාකර ගැනීම පිණිස නොවේ." මට මේ පහුර බොහෝ උපකාරී විය. මම මේ පහුර නිසා එගොඩ වීමි යි සිතා එය හිස උඩ තබාගෙන හෝ කර ගහගෙන යන්නෙමැයි සිතතොත් එය බුද්ධිමත් සිතිවිල්ලක් නොවේ. එපරිද්දෙන්ම මා දෙසූ ධර්මයද සසරින් එතරවීම පිණිස මිස, කර තබාගෙන යාම පිණිස නොවේ."

"**බහුකාරො වො මේ අයං කුල්ලො යන්නූනාහං ඉමං කුල්ලං සීසෙ වා ආරොපෙත්වා ඛන්ධෙ වා උච්චරෙත්වා යෙන කාමං පක්කමෙය්‍යං**"

(මජ්ඣිම නිකාය - අලගද්දූපම සූත්‍රය)

එසේම බුදුන්වහන්සේ දෙසූ ධර්මය පොත්වල ලියා ගෙන අල්මාරිවල තැන්පත් කොට පුද පූජා පැවැත්වීම පිණිස හෝ සඟවාගෙන තබාගැනීම් පිණිස හෝ නොව, හැම දෙනාටම කියවන්ට සලස්වා හැකි තරම් ප්‍රචාරය කිරීම කළයුතු බව උන්වහන්සේගේ හැඟීමයි.

("**තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්ම විනයො විවටොව විරොචති, නොපටිච්ඡන්නො**")

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූ තරමට බබලයි. වැසී තිබෙන තරමට නොම බබලයි."

(අංගුත්තර නිකාය - තිකනිපාත කරණ්ඩු වග්ග - 9 සූත්‍රය)

මේ කරුණුවලින් පෙනී යන්නේ බුදුරදුන්ට ඕනෑ කළේ මාර්ග දේශකයකු මෙන් පෙනී සිට ලෝකයාට නියම මාර්ගය පෙන්වීමයි. ලෝකයා නියම මාර්ගයෙහි ගමන් කරවවීමයි. එසේ නැතුව ලෝකයාගෙන් පුද සත්කාර ලබා ගැනීම නොවේ. ලෝකයාගෙන් ලැබෙන ගරු බුහුමන් ගැන හෝ නින්ද අපහාස ගැන හෝ උන්වහන්සේ කිසි විටක කිසිදු තැකීමක් නොකළහ.

බුද්ධං සරණං ගච්ඡාමි. යන්නෙහි නියම තේරුම බුදුන් අනුව යමි. බුදුන් අනුගමනය කරමි. බුදුන් ගිය මග යමි යනුයි. බුදුහාමුදුරුවෝ මෙයට අවුරුදු දෙදහස් පන්සිය තිස් දෙකකට (2542ට) පෙර පිරිනිවන් පෑහ. අද ජීවතුන් අතර නැති කෙනෙකුගෙන් පිහිට ඉල්ලන්නේ කෙසේද? ඉල්ලීමෙන් ඇති ඵලය කුමක් ද? අද නැති උන්වහන්සේගෙන් ගතහැකි එකම පිහිට, එකම සරණ, එකම ප්‍රයෝජනය නම් උන් වහන්සේ පෙන්වූ මග ගමන් කිරීමයි, උන්වහන්සේ දුන් අවවාද පිළිපැදීමයි.

දුක සේ සොයාගත් සත්‍යය අවබෝධකර ගැනීමයි. එසේ නොකොට වෙන කුමක් කළත් නියම හැටියට බුදුන් සරණ ගියා වන්නේ නැත.

ධම්මං සරණං ගච්ඡාමි යන්නෙහි නියම තේරුම ධර්මය අනුව පිළිපදිමි යනුයි. ධර්මය පුද්ගලයෙක් නොවේ. ද්‍රව්‍යයක් ද නොවේ. එයින් ලබාගත හැකි එකම ප්‍රයෝජනය නම් ඒ අනුව පිළිපැදීමයි.

සංඝං සරණං ගච්ඡාමි යන්නෙහි නියම තේරුම

නම් "සංඝයාගේ අවවාද අනුශාසනා පිළිපදිමි. සංඝයා අනුව යමි. සංඝයා සතු උතුම් ගුණධර්ම තමන් තුළත් ඇති කර ගනිමි. යනුයි. සංඝයා සරණ ගියා වන්නේ එවිටයි.

කල් යත් ම බෞද්ධයෝ බුදුන්වහන්සේගෙන් ඈත් වෙති. බොහෝ දෙනාට උන්වහන්සේ ගැන නියම අවබෝධයක්, හැබෑ ඇඳිනීමක් නැත. වැරදි අවබෝධයෙන් යුක්තව, අන්ධ භක්තියෙන් යුක්තව උන්වහන්සේ ඇදහීමෙන් ගතයුතු නියම පල ලබාගත නොහැකිය. බෞද්ධයෙකුගේ ප්‍රධානතම යුතුකම බුදුන්වහන්සේ කවරෙක් දැයි හරි හැටි දැන හැඳින ගැනීමයි. බුදුහාමුදුරුවන් ගැන සැබෑ අවබෝධයක් නැති කිසිවකුට හැබෑ බෞද්ධයකු විය නො හැකි ය.

ලොව උපන් ශ්‍රේෂ්ඨතම මාර්ගදේශකයා වූ බුදුන් වහන්සේ අපට පෙන්වාදී ඇති අතිපරිශුද්ධ මාර්ගයෙහි ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන් කරන්නට හැම උත්සාහයක් ම දැරිය යුතු ය.

ආත්මය

*සියළු වැරදිවලට මුල ආත්මය පිළිබඳ විශ්වාසයයි.
ආත්මයක් නැතැයි යන ප්‍රකාශය නිසා බුදුසමයට මානව චින්තනයෙහි
අසහාය ස්ථානයක් හිමිවේ.
බුදුහිමියන්ගේ ඉගැන්වීමට අනුව, ආත්මයක් පිළිබඳ අදහස
මනඃකල්පිතයකි, මිථ්‍යා විශ්වාසයකි.
එවැන්නක් යථා තත්ත්වයෙහි නොමැත.
මේ හේතු කොටගෙන "මමය, මාගේය," වැනි අදහස් උදහස් සහ
ආත්මාර්ථකාමය, තණ්හාව, ආශාව, බැඳීම, ක්‍රෝධය, ද්වේශය,
මාත්සර්යය, උද්ධච්ඡ බව, ආත්මය මානය ආදී කෙලෙස් මාර්ග හා
අපවිත්‍රතාත් අර්බුදත් හටගනී.
පෞද්ගලික ගැටුම්වල පටන් ජාතීන් අතර යුද කෝලාහල දක්වා
සියලුම අවුල් වියවුල්වලට මුල එයයි.
කොටින් කිවහොත් ලෝකයේ සියළුම නරක නපුරුකම්වලට මූලික
හේතුව මේ මිථ්‍යා විශ්වාසයයි.*

පූජ්‍ය ආචාර්ය වල්පොල රාහුල මහා ස්ථවිරයෝ ගේ "බුදුහිමියන්ගේ ඉගැන්වීම" නම් පොතිනි.



මේ හරිමග නම් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. අංග අටකින් යුත් මේ මගෙහි ගමන් කරන්නාගේ ප්‍රතිපදාව මධ්‍යම ප්‍රතිපදාවයි. සීමාව නොඉක්මවූ මැදුම් පිළිවෙතයි. (සම්මා දිට්ඨි) යහපත් දැකීම, (සම්මා සංකප්ප) යහපත් කල්පනාව, (සම්මා වාචා) යහපත් වචනය, (සම්මා කම්මන්ත) යහපත් වැඩ, (සම්මා ආජීව) යහපත් දිවි පෙවෙත, (සම්මා වායාම) යහපත් වෑයම (සම්මා සති) යහපත් සිහිය, (සම්මා සමාධි) යහපත් ලෙස සිත එකගකර ගැනීම යන මේ අංග අටකින් යුත් ශ්‍රේෂ්ඨතම මාර්ගය බුදුරදුන් විසින් සොයා ගන්නා ලදි.

62 පිටුව බලන්න

පරිච්ඡේදය 13

බුදුහාමුදුරුවෝ චින්තන විප්ලවයක් හා සමාජ විප්ලවයක් කළ පළමුවන ශාස්තෘවරයාණෝය.

ආදිම යුගයේ සිට මිනිසාට පුරුදු වී තිබුනේ මවුපියන්, ගුරුවරුන්, වැඩිහිටියන්, පූජකයන්,රජවරුන් හා ප්‍රධානින් අනුකරණය කිරීමයි. වැඩිදෙනා ඔවුන් සිතන සැටියට සිතූහ. ඔවුන් කියන හැටියට කළහ. එයට වඩා වෙනස්ව සිතීම වෙනස්ව වැඩ කිරීම, චාරිත්‍ර කැඩීමක්. නීති රීති කැඩීමක්. අකීකරු කමක් පමණක් නොව පාපයක් ලෙස සලකන්නට පුරුදු වූහ. ඒ නිසා මිනිසාගේ චින්තන ශක්තිය නොයෙක් ක්‍රමයෙන් පාලනය විය. සීමා විය.

විශේෂයෙන් දඹදිව වැසියන්ගේ සිතුම් පැතුම් තදින් ම පාලනය කෙළේ එකල සමාජයේ ප්‍රධාන තැනක් ගෙන සිටි බමුණන් විසිනි. රජුගේ පටන් මුළු සමාජයේ සියලු දෙනාම උපදෙස් ගත්තේ බමුණන් ගෙනි. බමුණෙකු යමක් ප්‍රකාශ කොළොත් එය සත්‍යයක් ලෙස හැම දෙනා විසින් ම ඒකාන්තයෙන් ම පිළිගත යුතුය.

මෙබඳු ගතානුගතික සිතුම් පැතුම් හා සිරිත් විරිත් වලින් පිරී තුබුනු යුගයකයි බුදුන්වහන්සේ පහළවූයේ. එබැවින් උන්වහන්සේට බලගතු චින්තන විප්ලවයක් හා සමාජ විප්ලවයක් කරන්නට සිදුවිය.

උන්වහන්සේ එය කෙළේ පසු කලෙක යුරෝපයේ ඇති වූ ප්‍රංශ විප්ලවය, රුසියන් විප්ලවය වැනි විප්ලවවල මුහුණුවරින් නොවේ. ලේ වැගිර වීමෙන්, හිංසා පීඩා කිරීමෙන්, මිනීමැරීමෙන්, වේගවත් කතා පැවැත්වීමෙන්, මිනිසුන්ගේ සිත් ප්‍රකෝප කිරීමෙන් නොවේ.

තනිකරම මහාකරුණාව පදනම් කරගෙනය. අවිහිංසාවාදී සාමකාමී මෛත්‍රී සහගත පිළිවෙත් අනුවය. එහි ප්‍රතිඵල අද දක්වාම පෙරදිග රටවල් රාශියක කෝටි සංඛ්‍යාත ජනකායකගේ සිත් තුළ කැවී ඇත්තේ එබැවිනි. පසු කලෙක යුද්ධකොට ජයගෙන යුද්ධ කිරීම සඳහටම නැවැත් වූ අශෝක වැනි අවිහිංසාවාදී ජනනායකයන් ඇති වූයේත් බුදුන්වහන්සේගේ මහා කාරුණික චින්තන විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙනි.

උන්වහන්සේ එකල සමාජයේ පැවති මිථ්‍යාමත මිථ්‍යා විශ්වාස, මිථ්‍යා ඇදහීම්, හිංසා ජනක යාග විධි, සමාජ පරිහානියට හේතු වූ සිරිත් විරිත්, වන්දන මාන, පුද පූජා, මේ මේවා යැයි ඉතා කරුණාවෙන්, එහෙත් නිර්භීතව පෙන්වා දුන්හ.

සියලු යසඉසුරෙන් පිරි රජපවුලක උපන් සිද්ධාර්ථ කුමාරයා අනික් රජ කුමරුන්ට වඩා කුඩා කල පටන් චින්තන විප්ලවකාරී බවක් දැක්විය. පිය මහරජාණන්ගේ කුලු පග තවුසෙකු වූ කාලදේවල තාපසයා ළදරු කුමරා දැකගන්ට ආවිට, පියරජු කුමරා වඩාගෙන අවුත් ඔහුට වන්දවන්ට හැදූ කල්හි කුමරා කළේ තවුසාගේ ජටාවට පාදෙක තැබීමයි.

තරුණ කාලයේ ජීවිතයේ පළමු වරට රෝගියෙකු දුටු විට

> "ඒ අමුතු තත්වයක් දැරූ මිනිසා කවරෙක්ද? ඔහුට එසේ වීමට හේතුව කුමක්ද? එසේ වූවෝ තවත් සිටිත් ද? තමනුත් රෝගියකු විය හැකි ද?"

ආදි ප්‍රශ්න රාශියක් ජන්න ඇමතියාගෙන් ඇසීය. පසුව මහල්ලකු දුටු විටත්, මළමිනියක් දුටු විටත්, පැවිද්දකු දුටු විටත්, එබඳුම ප්‍රශ්න ඇසී ය.

> "මේ සතර පෙර නිමිති ජීවිතය කුමක් ද? ජීවිතයේ පරමාර්ථය කුමක්ද? ජීවිතයේ අවසානය කුමක් ද? ජීවිතගෙන යන්නේ

කුමන හේතුවක් නිසා ද?"

ආදී දහසක් ප්‍රශ්න සිදුහත් කුමරාගේ සිත් තුළ පහළ කරවිය. හෙවත් චින්තන විප්ලවයක් ඇති කරවිය. ලෙඩ වීමත්, නාකි වීමත්, මරණයත් ගැන සිතන්න සිතන්න සිදුහත් කුමරාට තමා විඳින රජ සැප එපාවිය.

මුළු රජ මාලිගය ම ගින්නෙන් පිරුණු ගිනි ගොඩක් මෙන් දිස්විය. උපන් සැමදෙනා ම නිසැකයෙන් ම ඒකාන්තයෙන් ම මැරෙණවානම්, මිනිසුන් මේ කරණ විගඩම කුමක් දැයි සිතිය. මුළු ලෝකයාම දුක් ගොඩක සිටින බව පෙනුනේය. මේ දුකට හේතුවත්, එය නැති කර ගැනීමේ මාර්ගයත් කෙසේ හරි සොයා ගතයුතු යැයි අධිෂ්ඨාන කර ගත්තේ ය. මුළු ලෝකයම එපාවිය.

සිතත් සමග මහාසටනක යෙදුනු සිදුහත් කුමරුන් සනසන්නට රාජකීය නාටිකාංගනාවෝ රාත්‍රියෙහි පැය ගනනක් ගී ගයමින්, නටා ඒ කිසිවකිනුත් කුමරාගේ මුහුනේ සිනාසීම් මාත්‍රයක් වත් නොදැක, වෙහෙස නිසා ඒ ඒ තැන වැටී නිඳ ගත්හ. නාටිකාංගනාවන් නිඳ සිටි විලාසය දුටු සිදුහත් කුමරුන්ට ගිහිගෙය හැර යෑමට ඒ දර්ශනය වඩාත් ඉක්මන් කළේය.

තමන් සතුටු කිරිම සඳහා ම යෙදී සිටින සුරූපී කාන්තාවන් රාශියක් රාත්‍රියෙහි එකතැන බිම වැටී නිදනු දැක කලකිරී රටත්, රාජ්‍යයත්, රජ සැපත්, අඹුදරුවනුත් යන සියල්ල අත්හැර පැනගිය, මිනිස් ඉතිහාසයේ සඳහන් එකම තරුණයා, එකම මිනිසා, සිදුහත් කුමරාය. සුරූපී නලගනන් නිඳ සිටි තැන ඔහුට පෙණුනේ අමු සොහොනක් ලෙසය.

තම බිරිඳට පුතකු ලැබුණු බව අසන්නට ලැබීම තරම් ප්‍රීතියක් පියෙකුට වෙන නැත. එහෙත් යශෝදරාවට පුතකු ලැබුණු බව දූතයකු අවුත් සිදුහත් කුමරුන්ට කිව්ට ඔහු එක වරට ම කීවේ

"රාහු ජාතො බන්ධනං ජාතං" "මට ඒ ලැබුණේ බන්ධනයක් - බැඳීමක් අල්ලා - ගැනිමක්ය"

කියායි.

මෙබඳු ප්‍රකාශයක් කළ මිනිස් ඉතිහාසයේ සඳහන් එකම පියා සිදුහත් කුමරාය.

තම බිරිඳත් පුත් කුමරාත් රජ මැදුරත් රාජ්‍යයත් රජ සැපත් අත්හැර හොරා පැන ගොස් මහ වනයට වැද අමුසොහොනක මළ මිනියක් ඔතා තිබුණු තිඹක් පමණ පණුවන් ඇති රෙදි කඩක් සෝද අවුවේ වේලා හැඳගෙන වාම් කමේ සැහැල්ලු දිවි පෙවෙතේ අන්තිම පත්ලටම බැස්ස, මිනිස් ඉතිහාසයේ සඳහන් එකම රාජ කුමාරයා සිදුහත් කුමරායි. මෙය සුඛෝපභෝගී ජීවිත පිළිබඳ මහා විප්ලවයකි.

සිදුහත් තවුසා නොයෙක් තවුසන් ලග තපස් ක්‍රම සය අවුරුද්දක් මුලුල්ලෙහි ඉගෙණ ගත්තේ ය. ඔවුන්ගේ ඉගැන්වීම් වලින් කිසිසේත් තෘප්තියට පත් නුවුයේ ය. ඔවුන් ලග තමන් සොයන දේ නැතැයි කියා අන්තිමට තම සිතත් සමග කෙලෙස් සටනක යෙදී කෙලෙස් නසා ජය ගත්තේය.

බුදු වීමෙන්, පසු කලෙක පියරජුගේ මාලිගයට වැඩමවා, එහිදී දන් වළඳ දෙවෙනි දින රජ මැදුර ඇති එම වීදියෙහිම ගෙපිළිවලින් පිඩුසිගා ගියේය. ඔටුන්න හිමි රජ කුමරෙකු රජ මැදුරෙන් පැනගොස් තවුසකු වී ආපසු එම නගරයට ම අවුත්, තම රජ මැදුර බල බලා මහා වීදිය දිගේ, ගෙයක් ගානේ හිගා කෑම, රටක් රාජ්‍යයක්, ජනතාවක් කම්පා කරවන අපූරු සිද්ධියකි.

රාජවංශය, රාජතේජස, රාජ ඓශ්වර්‍යය, මහේශාක්‍ය භාවය පිළිබඳ මහා විප්ලවයකි. ධනවාදී ලෝකයට කළ මහා සමච්චලයකි. රාජාභිමානයට ගැසු මරු පහරකි. මෙය දුටු පිය රජු සිහිසන් නැතිව, කැහැපට ගන්වාගෙන පසු පස්සේ දුවගොස්,

"අප රාජ වංශයට අවනම්බු කරන්න එපා."

යැයි කිව්ට,

"ඔබ රාජවංශයෙහිය. එහෙත් මම බුද්ධ වංශයෙහිය. සිගා කැම බුදුවරුන්ට අයත් චාරිත්‍රයකි. යි කීමද බුදුමුවකින් ම, චින්තන විප්ලවයක් කල කෙනෙකු මෙන් ම පිටවිය යුතු ශ්‍රේෂ්ඨ කියමනකි.

ආදරණීය පියෙකු මෙන්, දයාබර මෑණියෙකෙනෙකු මෙන්, කාරුණික අනුශාසකයෙකු මෙන් අපේ බුදුහාමුදුරුවෝ අපට හොඳ මග හරි මග, නියම මග පෙන්වා දුන්හ. එබැවින් උන්වහන්සේ ශ්‍රේෂ්ඨතම මාර්ග දේශකයාණෝයි.

62 පිටුව බලන්න

"පෙර අසා ඇති නිසාවත්, පාරම්පරික චාරිත්‍ර වශයෙන් ඇති නිසාවත්, මෙය මෙසේ යැයි ඉතිහාසයෙහි සඳහන්ව ඇති නිසාවත් පිටකයෙහි තිබෙන නිසාවත් තර්කයට ගැලපෙන නිසාවත් න්‍යායට ගැලපෙන නිසාවත් විචාරයට හසුවන නිසාවත් පිළිගත් මතයට අනුකූල නිසාවත්, කෙනෙකුගේ දක්ෂ තාවය නිසාවත්, ඒ තෙමේ අපේ ආචාර්‍යවරයා යයි යන හැඟීම නිසා වත්, යමක් පිළිගත යුතු නොවේ. තම බුද්ධියෙන් විමසා බලා සත්‍ය යයි තමන්ට වැටහෙනොත් පමණක් පිළිගත යුතුය" **(කාලාම සූත්‍රය)**

මේ වනාහි ශාස්තෘවරයකු විසින් අන්ධානු කරණයට හා ගතානුගතික බවට දෙන ලද පොරෝ පහරකි. චින්තන විප්ලවයක මාතෘකා පාඨයකි. අවුරුදු 2500 කට පෙර ප්‍රගතිශීලී, විද්‍යානුකූල මෙබඳු ප්‍රකාශයක් කල එකම මිනිසා එකම ශාස්තෘවරයා එකම චින්තකයා බුදුන් වහන්සේයි.

දඹදිව වැස්සන් පමනක් නොව මුලු ලෝවැස්සන්ම ආත්මයක් ගැන විශ්වාස කරද්දී බුදුන්වහන්සේ ඉපිද ආත්මයක් නැතැයි (අනන්ත) නිර්භීතව ප්‍රකාශ කලහ. ඇතැයි කියන්නවුන් නිරුත්තර කලහ. ආත්මයක් නැත යන මේ ප්‍රකාශය අතින් සියලුම ආත්මවාදී ශාස්තෘවරුන්ගේ දෘෂ්ටිවලට එක එල්ලේම දෙන ලද චින්තන විප්ලවීය පහරකි.

කුල භේදය මුලු සමාජයත් මුලු රටත් පිළිගත් අවශ්‍ය ආයතනයක් බවට පත්ව තිබුණ සමයක බුදුහාමුදුරුවෝ

"ජාතියෙන් වසලයෙක් නොවේ. ජාතියෙන් බමුණෙක් නොවේ. ඔහු කරණ ක්‍රියාව අනුව වසලයෙක් හෝ බමුණෙක් හෝ වෙතැ" යි

කියමින් මුලු රටම පිළිගෙන තිබුණු ඒ සමාජ බෙදුමට විරුද්ධ මතයක් ඉදිරිපත් කළහ.

එකළ දඹදිව කුල භේදයට විරුද්ධව කතා කොට සමාජයෙන් ගුටි නොකෑ, බැට නොකෑ, මැරුම් නොකෑ එකම මනුෂ්‍යයා බුදුන්වහන්සේයි. දීර්ඝකාලයක් සිට බමුණෝ බුදුහාමුදුරුවන් විසින් සැබෑ බමුණන් ලෙසින් පිළිගනු නොලැබූහ.

න ජටාහි න ගොත්තෙන
න ජච්චා හොති බ්‍රාහ්මණො
යම්හි සච්චංච ධම්මො ච
සො සුචි සෝච බ්‍රාහහ්මණො

"හිසේ බැඳ තිබෙන ජටාවලින් හෝ ගෝත්‍රයෙන් හෝ ජාතියෙන් හෝ බමුණෙක් නොවේ. යමෙකු තුළ සත්‍යයක් ධර්මයත් පවතී නම් ඔහු පිරිසිදු කෙනෙකි. එසේම ඔහු බ්‍රාහ්මණයෙකි.

යස්ස කායෙන වාචාය
මනසා නත්ථි දුක්ඛතං
සංවුතං තීහි ඨානෙහි
තමහං බෲමි බ්‍රාහ්මණං

"යමෙකුගේ කයින් වචනයෙන් හා සිතින් සිදුවෙන වරදක් නැද්ද තිදෙරින් සංවරවේද, අන්න ඔහුට "බ්‍රාහ්මණයා" යයි මම කියමි."

කිං තෙ ජාටාහි දුම්මේධ
කිං තෙ අජින සාටියා
අබ්භන්තරං තෙ ගහනං
බාහිරං පරිමජ්ජසි

"අනුවනය, ඔබේ ජටාවලින් හෝ අඳුන් දිවි සමින් හෝ ඇති වැඩේ කුමක් ද? ඔබේ ඇතුළත කෙලෙස්වලින් පිරී තිබේ. පිටත පමණක් ඔපයෙන් යුක්ත ය."

දිනක් බුදුන්වහන්සේ **අග්ගිකභාරද්වාජ** නම් බමුණා ගිනි මැලයක් දල්වාගෙන හෝම විධි පවත්වන තැනට වැඩියහ. බමුණා එහි එන බුදුරදුන් දැක කෝප වී "මුඩු මහණා, වසලයා" යයි බැණ වැදුනේය. බුදුහු ඒ බැනුම් වලින් කිසිදු වෙනසක් නොවී, ප්‍රීති මුහුණින් යුක්තව,

"බමුණ නුඹ "වසලයා" ය කියන්නේ කාට ද වසලයකු වීමට හේතුවන කරුණු මොනවාද? කියා දන්නෙහිදැ"යි ඇසූහ.

"මම නොදනිමි. ඔබ දනිතොත් කියා දෙන්නැ" යි බමුණා කීය. එවිට බුදුහු,

"කෙනෙක් උත්පත්තියෙන් වසලයෙක් නොවේ. කෙනෙක් උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක් ද නොවේ. ඔහු කරණ ක්‍රියා අනුව වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් වේ."

"වහා කිපෙන්නා, බැඳගත් වෛර ඇත්තා, පව්ටු ගුණමකුවා, තම දෙස් වසන තැනැත්තා, සතුන් මරණ, සතුන්ට දයාව නැත්තා, ගම් නියම් ගම් වනසන මංකොල්ල කන්නා, ණය ගෙන ආපසු නොදෙන්නා, පුළුවන් කම තිබියදී නාකි මවු පිය දෙදෙනාට නොසළකන්නා, බුදුන්ට සවුවන්ට හා නොයෙකුත් පැවිද්දන්ට ගරහන්නා, තමා උසස් කොට අනුන් පහත් කොට සලකන්නා, නිතර කිපෙන තැනැත්තා, තද මසුරා, ලජ්ජා බිය නැත්තා, බොරු කියන්නා, අන්අඹුවන් කරා යන්නා යන මේ අය මොන විදියේ උසස් කුලයක, ගෝත්‍රයක, වංශයක, ජාතියක, උපන්නත් ඔවුන් වසලයන් බව දැනගන්නැ"යි

බමුණාට කීහ. මේ වනාහි විශේෂයෙන් බ්‍රාහ්මණ ජාතිකයන්ටත්, පොදුවේ වැරැදි කරණ සැම දෙනාටත් දෙන ලද බලවත් පහරකි.

බුදුන්වහන්සේ "වසලයා" යැයි කීවේ කුලයෙන් වසලවූවන්ට නොව වැරදි වැඩ කරණ අයටයි. ජාතිය, ගෝත්‍රය, කුලය ගැන උන්වහන්සේ එතරම් සැළකිල්ලක් නොදැක් වූහ.

මිනිසා උපන්නේ නිදහස්ව බවත්, මිනිසා හා මිනිසා අතර මසින්, ලෙයින්, අඟපසඟින්, කිසි වෙනසක් නැති බවත්, වෙනස ඇත්තේ සිතුම් පැතුම්වල හා කරණ ක්‍රියාවල බවත් බුදුහු නොයෙක් අවස්ථාවල පෙන්වා දුන් හ.

එකල ගස් ගල්, පර්වත, ආරාම චෛත්‍ය ආදිය සරණගිය දඹදිව වැස්සන් දුටු බුදුහාමුදුරුවෝ

"බියගුලු මිනිස්සු ගස් ගල්, පර්වත ආදිය සරණ යති. දුකෙන් මිදෙන්නට නම් ඒවා සරණ යැමෙන් කිසිකලෙක පුළුවන් කමක් නැතැ"යි *(ධම්මපදය)*

බහුංවේ සරණං යන්ති පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි මනුස්සා භය තජ්ජිතා
නෙතං ඛො සරණං ඛෙමං නෙතං සරණ මුත්තමං
නෙතං සරණමාගම්ම සබ්බාදුක්ඛා පමුච්චති

එසේ සරණ යන්නවුන් ඉදිරියෙහි එක එල්ලේම ප්‍රකාශ කළහ. සූර්යයාට වඳින අය, චන්ද්‍රයාට වඳින අය, ගින්නට වඳින අය, ජලයට වඳින අය, නාගයන්ට වඳින අය, හා තවත් නොයෙක් ක්‍රමයෙන් වන්දනා මාන කරන්නෝ බුදු රජුන්ගේ සමයෙහි දඹදිව විසූහ. ඒ වන්දනා ක්‍රමවල ඇති නිෂ්ඵල බව පෙන්වා දුන් බුදුහු ඒවා ගැන බුද්ධිමත්ව සිතන්නට උගැන්නූහ.

අවිද්‍යාවෙන් පිරුණු මහජනයාට විද්‍යාමය දැනුමක් ලබාදෙනු සඳහා චිරාගත මිථ්‍යාමත හා සම්මත සිරිත් විරිත් නැමැති රාමු දෙදරවා ලූහ.

තම පියාගේ අන්තිම ඉල්ලීම අනුව සදිසාවන්ට වඳිමින් සිටි "සිගාල" මානවකයා දුටු බුදුහු ,

"උතුරු, දකුණු ආදි දිසාවලට වැඳීම ගරු කිරීම මෝඩ ක්‍රියාවක් බව පෙන්වූහ. දිසා ලෙස බුදුරදුන් පෙන්වා දුන්නේ මවුපිය දෙදෙනා නැගෙනහිර දිසාව ලෙසත්, ගුරුවරුන් දකුණු දිසාව ලෙසත්, පුත්‍රදාරාවන් බටහිර දිසාව සෙත්, මිතුරන් උතුරු දිග ලෙසත්, මෙහෙකරුවන් යට දිසාව ලෙසත්, මහණ බමුණන් උඩ දිසාව ලෙසත්ය.

මෙකල බෞද්ධයන් සිගාල මානවකයා මෙන් දිසාවලට නොවැන්දත් ගමන්බිමන් යැම් වැඩ ඇල්ලීම් ආදි වැදගත් ක්‍රියාවලදී නැගෙනහිර බලා උතුර බලා ගමනාරම්භ කිරීම් ආදියෙන් බුදුරදුන් මිථ්‍යා විශ්වාස ලෙස පෙන්වූ දිසාවන්ට ගරු කිරීමේ පුරුද්ද තවමත් කරගෙන එන බව පෙනේ.

සමාජය භාවිත කරන, විශ්වාස කරන, මංගල කරුණු බුදුහු නියම මංගල කරුණු ලෙස නොසැළකූහ. මංගල කරුණු මොනවා දැයි



බුදුහු "මොවුන් කියන දේ සැබෑදැ"යි ඒ භික්ෂුනමගෙන් ඇසූහ. - "එහෙයි ස්වාමීනි, මම මොවුන් මෙන් කිසි පලක් නැති හඬා වැලපීම් නොකොට, පැත්තකට වී ඔබ වහන්සේ දුන් රන් අගනා උපදෙස්වලින් එකක් අනුව පිළිපැද, ඔබ තුමන්ගේ ඇස් හමුවේ දී ම එයින් ප්‍රයෝජන ගනිමියි ඉටා ගත්තෙමි. මගේ ඒ අධිෂ්ඨානය, මගේ ඒ උත්සාහය අතිශයින්ම සාර්ථකයි." ඔහු කෙලෙස් ප්‍රහීණ කළ රහත් භික්ෂුවක්ව සිටින බැව් දැනගත් බුදුහු පිරිනිවන් මඤ්චකයෙහි වැතිරී සිටි අයුරින්ම සිටගෙන දෑත එක්කොට සාධු! සාධු! සාධු! යයි තුන්වරක් සාධුකාර දුන් සේක

65 පිටුව බලන්න

බුදුරදුන්ගෙන් ඇසූ විට උන්වහන්සේ පෙන්වා දුන්නේ එකල සමාජයේ පැවැති මංගල කරුණු නොව අමුතුම කරුණු රැසකි. එනම්

> "අසත් පුරුෂයන් සේවනය නොකිරීම, සත්පුරුෂ පණ්ඩිතයන් සේවනය කිරීම, පිදිය යුත්තන් පිදීම, ගමනාගමන ආදි පහසුකම් ඇති ප්‍රදේශයක විසීම, පෙර කළ පින් ඇති බව, හිත හොඳින් තබා ගැනීම, බහුශ්‍රැත බව ශිල්ප ශාස්ත්‍ර දත් බව,හික්මුණු ගති ඇති බව, යහපත් වචන කථා කරණ බව, මවු පිය උපස්ථානය, අඹුදරුවන්ට සංග්‍රහ කිරීම, නිරවුල් කර්මාන්ත ඇති බව, දන් දීම, දස කුසලෙහි හැසිරීම නෑයන්ට සංග්‍රහ කිරීම, ගරු කළ යුත්තන්ට ගරු කිරීම, විනීත පැවතුම් ඇති බව, ලද දෙයින් සතුටුවීම, කෙළෙහි ගුණ දන්නා බව, ඉවසීම, කීකරුකම, සිල්වත් කම, යහපත් හැසිරීම, ලාභ, අලාභ, කීර්ති, අපකීර්ති, මල්මාලා ගල්මුල් ආදිය ලැබීමේදී කම්පා නොවීම"

වැනි කරුණු නියම මංගල කරුණු ලෙසිනි.

බුදුන් වහන්සේ නොයෙක් අවස්ථාවලදී කල ප්‍රකාශවලින් සමහරක් මෙසේයි.

හුගක් කථා කරමින්, උගත්කමක් නැතිව පණ්ඩිතකම් පෙන්නු අයට

> **"න තෙන පණ්ඩිතො හොති යාවතා බහු භාසති"** හුගක් කථා කළ තරමට යමෙක් පණ්ඩිතයෙක් නොවේ."

නිකම්ම කෙස් පැහුණු පමණින් ලොකුවට සිතාගත් අයට

> **"න තෙන ථෙරො හොති යෙනස්ස ඵලිතං සිරො"** "හිස කෙස් පැහුණු පමණින් යමෙක් වැඩිහිටියෙක් නොවේ."

සිල් නැති බොරු කියන භික්ෂුන්ට

> **"න මුණ්ඩකෙන සමණො, අබ්බතො අලිකං භණං"** "සිල් නැති බොරු කියන පුද්ගලයා හිස බූ ගෑ පමණින් මහණෙක් නොවේ.

කථා නොකර සිටි බොරුකාර තපසුන්ට

> **"න මොනෙන මුනි හෝති"** "කථා නොකර සිටි පමණින් මුනිවරයෙක් නොවේ."

පව් සෝද ගැනීම සඳහා **සුන්දරිකා, ප්‍රයාග, බහුකා** ආදි ගඟ දියෙන් ජලස්නානය කරන්නන්ට

> **"කිං සුන්දරිකා කරිස්සන්ති කිං පයාගා කිං බාහුකානදී?"** "පවු කළ අයගේ පවු සෝදන්නට සුන්දරිකා නදියට පිළිවන් ද" "ප්‍රයාගයට පුළුවන් ද?" "බාහුකා නදියට පිළිවන් ද" ඇත්තෙන් ම බැහැ. ජලයෙන් පවු සෝද හළ හැකිනම් ජලයේම වසන මත්ස්‍යයෝ - මැඩියෝ කොයි තරම් පුණ්‍ය වන්තයෝ" දැයි

බුදුහු වරක් ඇසූහ.බුදුන් වහන්සේ තරම් නිදහස - හැබෑ නිදහස ලබාගැනීම සඳහා මුළු ජීවිතයම එක් වරක් නොව, දස දහස වරක් කැප කළ පූජා කළ අන් කිසි මිනිසෙක් නැත.

මුක්ති- විමුක්ති, මොක්ෂ- විමොක්ෂ, නිර්වාණ යන මේ හැම වචනයකම තේරුම බැම්වලින්. බැඳීම්වලින්. තෘෂ්ණාවෙන් මිදීම යනුයි.

එනම් සංසාර බන්ධනයෙන්, තෘෂ්ණා බන්ධනයෙන්, මිදීමය. මවු පියන්, අඹු දරුවන්, රජකම්, මැති ඇමැති කම්, ධනය, බලය, කිර්තිය, හා මමත්වය යන මේවා කෙනෙකුගේ නිදහස නැති කරණ, කෙනෙකු බැඳ තබන රැහැන් බව බුදුහු වදළ හ. ඒ සියල්ල පිළිබඳ ආශාව, මමත්වය, අත්හළ විට සිතත් කයත් දෙකම නිදහස් බව උන්වහන්සේ ප්‍රකාශ කළහ.

බුදුන් වහන්සේ කිසිවෙකුට හානියක් හෝ පීඩාවක් නොවන, යමක නියම තත්ත්වය සොයා බලන, **"යථා භූත ඥාණ"** යමක ප්‍රභවයේ සිට සිහි කරණ, **"යොනිසො මනසිකාර"** හැම දෙයකම හේතුව හා ඵලය විමසා බලන. චින්තන රටාවක්, චින්තන ක්‍රමයක් පෙරදිග වැස්සන්ට පුරුදු කළහ. සිතීමේ හා කථා කිරීමේ නිදහස ලබා දුන්හ.

බුද්ධියට ප්‍රධාන තැන දුන් ආසියාතික ආයජී චින්තන ක්‍රමය සීමාන්තික නැත. මධ්‍යම

ප්‍රතිපදවෙන් යුක්තය. මෛත්‍රිය හා කරුණාව පදනම් කොට ඇත. අවිහිංසාවාදීය.

මේ චින්තන ක්‍රමය නිසා ආසියාව අවුරුදු දහස් ගණනක් යුද්ධවලින් තොර සාමකාමී මහාද්වීපයක් බවට පත්විය. ලෝක මහා යුද්ධ දෙකම ආරම්භ කළේ යුරෝපයෙන් මිස ආසියාවෙන් නොවේ. සර් එඩ්වින්ඩ් ආර්නෝල්ඩ් පඬිතුමා බුදුන්වහන්සේ හැඳින් වූයේ ආසියාවේ ආලෝකය නමිනි.

බුදුන්වහන්සේ ද බුද්ධඥානය ලැබූ හැටියේම ප්‍රකාශ කෙළේ "විජ්ජා උදපාදි" "ආලෝකො උදපාදි" කියායි. **සිතීමේ හා කථා කිරීමේ නිදහස ලබාදී චින්තන විප්ලවයක් හා සමාජ විප්ලවයක් කළ බුදුන් වහන්සේ අපේ ශාස්තෘවරයා වීම අපට මහත් සැනසීමකි. නම්බුවකි.**

අප උන්වහන්සේට කරන ලොකුම සැලකිල්ල නම් නිදහස්ව බුද්ධිමත්ව සිතන්ට පුරුදු වීම යි.

බෞද්ධයා කිසිවෙකුගේ වහලෙක් නොවේ

බෞද්ධයෙක් පොතකට වහල් නොවේ.
ඔහු සෙසු අයෙකුටද වහල් නොවේ.
බෞද්ධයෙකු වීමෙන් ඔහු සිතිමේ නිදහස කැපකරන්නෙ නැත.
ඔහුට සිය නිදහස් චින්තනය භාවිතා කළ හැක. බුද්ධත්වය ලැබීම සඳහා වුවත්
ඔහුට සිය ප්‍රඥාව දියුණු කොට ගත හැකිය.
මක් නිසාද යත් හැමෝම බුදු කෙනෙකු වීමේ වාසනාව සහිත හෙයිනි.

නාරද මහා ස්ථවිරයන් වහන්සේ ගේ "බුදු සමය යනු කුමක්ද?" නම් පොතෙන්.



"හුගක් කතා කළ තරමට යමෙක් පණ්ඩිතයෙක් නොවේ, හිස කෙස් පැහුනු පමණින් යමෙක් වැඩි හිටියෙක් නොවේ. සිල් නැති බොරු කියන පුද්ගලයා හිස බූ ගෑ පමණින් මහනෙක් නොවේ, කතා නොකර සිටි පමණින් මුනිවරයෙක් නොවේ. පව් කළ අයගේ පව් සෝදන්නට සුන්දරිකා නදියට පිළිවන් ද, ප්‍රයාගයට පිළිවන් ද, බාහුකා නදියට පිළිවන් ද, ඇත්තෙන්ම බැහැ, ජලයෙන් පව් සෝද හළ හැකි නම්, ජලයේම වසන මත්ස්‍යයෝ-මැඩියෝ කොයිතරම් පුණ්‍යවන්තයෝ ද?"

76 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ සත්‍යය සොයාගත් මහා වීරවරයාණෝයි

මේ ලෝකයේ නොයෙක් ක්‍රමයේ වීරවරයෝ වූ හ. ඔවුන්ගෙන් සමහරු යුද්ධ කොට ජය ගැනිමෙන්, රටවල් යටත් කර ගැනීමෙන් අධිරාජ්‍ය ගොඩ නැංවීමෙන් වීරයෝ වූ හ. සමහරු අලුත්දේ නිපදවීමෙන්, අලුත් දේ සොයා ගැනිමෙන්, ග්‍රහලෝකවලට ගොස් ආපසු ඊමෙන් විරයෝ වූ හ. සමහරු පරසතුරු උපද්‍රව වලින් රට ජාතිය බේරා ගැනිමෙන් වීරයෝ වූ හ. එහෙත් ඉහත කි වීරයන්ගේ පරමාර්ථවලට වඩා උතුම් පරමාර්ථයක් සඳහා ජීවිතය කැප කිරීමෙන් බුදු හාමුදුරුවෝ වීරයෙක් වූහ.

ලෝක සත්ත්වයා දුකින් මුදවා ගැනිමේ පරමාර්ථයෙන් පරම සත්‍යය සොයා ගැනිම නිසා උන්වහන්සේ වීරත්වයට පැමිණියහ. සත්‍යය සොයනු සඳහා ආත්මභාව දහස් ගණනක් ඇස්, ඉස්, මස්, ලේ අඹුදරුවන් හා සිය ජීවිතය ද පරිත්‍යාග කොට අන්තිම ආත්මභාවයේ දි පවා අවුරුදු හයක් හැම දුකක් ම විඳ, හැම අත්හද බැලිමකම යෙදි අවසානයෙහි නියම සත්‍යය, පරමසත්‍යය, චතුරාර්‍ය්‍ය සත්‍යය සොයා ගත්හ.

එබැවින් අනික් සියලුම වීරවරයන් ගේ විරක්‍රියාත්, බුදුරදුන්ගේ වීරක්‍රියාත් අතර ඇත්තේ විශාල පරතරයෙකි. අනික් වීරයන්ගේ විරක්‍රියාවල පෞද්ගලිකත්වය ගැබ් වි ඇති අතර බුදුන් වහන්සේ ගේ වීරක්‍රියාවෙහි පොදු බව හා ලෝකෝත්තර බව ගැබ් වී ඇත. මේ නිසා උන් වහන්සේ **බුද්ධවීර, මහාවීර, ශාක්‍යසිංහ, ලෝකනාථ, දසබල ලෝකවිදූ, සර්‍වඥ, ජින** ආදි නම්වලින් හඳුන්වනු ලැබූ හ.

මහාවීර යයි උන්වහන්සේට බුදුවන්නටත් පෙර ඇමතුවේ මිනිසුන් නො ව තුසිත දෙව්ලොව දෙවියන් ය.

"මහාවීරය, මව්කුස ඉපදීමට මේ සුදුසු කාලයයි." **(කාලොයං තෙ මහාවීර උප්පජ්ජ මාතුකුච්ඡියං)**

"මාර සංග්‍රාමය දිනූ වීරයන් වහන්ස, සාර්ථවාහයන් වහන්ස. කාමච්ඡන්ද නැමැති ණය නැත්තාණන් වහන්ස,නැගී සිටිනු මැනව්" **(උට්ඨෙහි වීර, විජිතසඞ්ගාම, සත්ථවාහ, අණන)**

(මජ්ඣිම නිකාය - අරියපරියෙසන සූත්‍රය)

යනුවෙන් බුදුරදුන්ට වීරයා යයි ඇමතුවේ සහම්පතී මහා බ්‍රහ්මයා ය.

බුදුන් වහන්සේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කර ගන්නට මත්තෙන් සත්‍ය කුමක්දැයි සොයන්නෙකු **(කිංසච්චගවෙසී)** ව නොයෙක් තවුසන් වෙත ගොස් නොයෙක් තපස්ක්‍රම පිළිපැද ඔවුන් දත් සත්‍යය පරම සත්‍යය නොවන බව දැන, දුක් විඳීම අත්හැර මධ්‍යම ප්‍රතිපදවෙහි පිහිටා "සත්‍යය අවබෝධ කර ගෙන මිස නැතුව නො නැගිටිමි"යි ඉටා ගෙණ අන්තිමට පරමසත්‍යය අවබෝධ කර ගත්හ.

සත්‍යාවබෝධයත් සමග ම උන් වහන්සේට,

පුදුම දැකීමක්, පුදුම දැනීමක්, පුදුම නුවණක්, පුදුම විද්‍යාවක්, පුදුම ආලෝකයක් පහළ විය. පෙර නො ඇසූ විරූ ධර්මයන් පිළිබඳ ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව දැනුම පහළ විය. ආලෝකය පහළ විය. **("පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මේසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි")**

උන්වහන්සේට එද බෝ මැඩදී ඒ ඇති වූ වෙනස,

ප්‍රබෝධය, ඥානය ගැන උන්වහන්සේට ම හැර වෙන කිසිවකුට වචනයෙන් කියා විස්තර කළ නොහැකි ය. උන් වහන්සේට ඇති වූ ප්‍රීතිය නිම් හිම් නැත.

> "මම දිනුවෙමි. මම දිනුවෙමි. මම සොයා ගත්තෙමි. මම සොයා ගත්තෙමි" යි උදන් ඇනුහ.

එයිනුදු නො නැවති මේ සොයා ගත් පරම සත්‍යය, මේ ලැබුණු පුදුම තත්ත්වය, පුදුම දැනුම, පුදුම අවබෝධය ලෝකයා හමුවෙහි තැබිය යුතුයයි පිටත්ව ගොස් පස්වග මහණුන්ට කී හ. ඒ අදහස් උණු උණුවේ ම දේශනා කළ හ.

සීමාව ඉක්මවා සැප විඳීමේත්, සීමාව ඉක්මවා දුක් විඳීමේත් ආදීනව හා මධ්‍යම ප්‍රතිපදාවේ ඇති ආනිසංසත්, චතුරාර්‍ය සත්‍යය හා ආර්‍ය අෂ්ටාංගික මාර්ගයත් දේශනා කළහ.

බුදුරදුන් ගේ මේ අභිනව සොයා ගැනීම් එකල විසූ නානා විධ තවුසන් අතර පමණක් නො ව, රටවැසියා අතරත් ප්‍රසිද්ධ වන්නට විය. අලුත මහණ කළ පැවිදි සිසුන් පිරිවරා ගත් බුදුන් වහන්සේ තරු පිරිවැරූ චන්ද්‍රයා මෙන් ගම් නියම්ගම්, දනව්, නගර, උපනගර ආදියෙහි සැරිසරන්ට ශ්‍රාවකයන් කෙරෙහි දක්නට නොලැබුණු විදියේ තාපසරූප සෝභාවක්.ශාන්ත සංයම සුන්දර දර්ශනයක් ක්‍රමානුකුල යැම් - ඊම් - ඉදුම් - හිටුම් ආදි ඉරියව්වක්, බුද්ධිමත් ව සකස් වුණු ප්‍රසාදනීය සංවිධානයක් මේ මහා තාපසයා හා පන්සියක් පමණ වූ ශ්‍රාවකගණයා තුළින් විද්‍යමාන විය. මේ පුදුම දර්ශනයෙන් දුටු දුටුවෝ වශී වී ගෙවල් දෙරවල්, අඹුදරුවන් අත් හැර පසු පස එන්නට වූහ.

ශාක්‍ය පුත්‍ර වූ ශ්‍රමණගෞතමයන් වහන්සේ ශ්‍රමණ ගණයා පිරවරා ගෙන අසවල් ගමට, අසවල් නගරයට වඩිතැයි යන මේ පුවත රට පුරා පැතිර ගියේ ය. එය ඇසූවෝ එතුමන් දැක ගන්නට, දන් දෙන්නට, බණ අසන්නට, ප්‍රශ්න අසන්නට, සාකච්ඡා කරන්නට පුලපුලා සිටිය හ. ශාක්‍ය කුලයෙන් පැවිදි වූ "පුදුම තවුසෙක් පුදුම දෙයක් සොයා **(චතුරාර්‍යසත්‍යය)** ගෙන සිටී" යන කීර්ති රාවය දඹදිව නොයෙක් පෙදෙස්හි නොයෙක් රාජ්‍යවල කටින් කට පැතිර ගියේය.

> **("අස්සොසි ඛො පොක්ඛරසාති බ්‍රාහ්මණො සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසංඝෙන සද්ධිං පංචමත්තෙහි භික්ඛුසතෙ හි"**

(දීඝනිකාය - අම්බට්ඨ සූත්‍රය)

බුදුන් වහන්සේ පිළිබඳ කීර්ති ඝෝෂාව පොක්ඛරසාති නැමැති බමුණු අධිපතියාට අසන්නට ලැබුණු හැටියි මේ.

බුදුන් වහන්සේ පන්සියයක් මහරහතන් වහන්සේලා වැඩිමහල් පිළිවෙළින් පේළියට එන්නට සලස්වාගෙන බිමට හෙළූ ඇස් ඇති ව, ශාන්තදාන්ත වූ පා ගමනින් ගම්, නියම්ගම් හා නගර මැදින් වඩින විට ඇති විය යුතු ඒ පුදුම දර්ශනය අදත් භික්ෂූන් වහන්සේලා සියයක් පමණ පේළියට යනු දුටු කෙනකු ගේ මනසේ විත්‍රිත ව දිස් වනු ඇත.

බුදුරදුන් තරම් සත්‍යයට, පරම සත්‍යයට දිවි පිදූ වීරයෙක් වෙන නැත. **බුද්ධ, සම්බුද්ධ, සම්මාසම්බුද්ධ යන නම්වලින් උන් වහන්සේ හඳුන්වන්නේ පරම සත්‍යය, ආර්‍ය සත්‍යය අවබෝධ කර ගත් උතුමා බැවිනි.** "බුද්ධාගම" යනු සත්‍යයත්, සත්‍යය සොයා ගත් උතුමාත් ඇදහූ ආගමයි. සත්‍යයෙන් තොර යමක් ඇත් නම් එය බුද්ධාගම නො වෙයි.

බුදුන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නේ උන් වහන්සේ ගේ සිරුරට නො ව, ඉතා දුක් විඳ ලබා ගත් බුද්ධිමහිමයට යි. බුද්ධියට වඳින, පුදන, ගරු කරන, බුද්ධිය උසස් කොට සලකන ආගම බුද්ධාගම යි. බුදුන් වහන්සේ පිළිබඳ ව සත්‍යයෙන් තොර යමක් ලියවී ඇත් නම් ඒවා බුද්ධධර්මය නො වේ. බුද්ධවචන නොවේ.

බෞද්ධයකු ගේ ලොකු ම යුතුකම සත්‍යයේ වීරයා වූ බුදුරදුන් අනුගමනය කරමින් නිතර ම

එකල ගස් ගල්, පර්වත, ආරාම චෛත්‍ය ආදිය සරණාගිය දඹදිව වැස්සන් දුටු බුදුහාමුදුරුවෝ 'බියගුලු මිනිස්සු ගස් ගල්, පර්වත ආදිය සරණ යති. දුකෙන් මිදෙන්නට නම් ඒවා සරණ යැමෙන් කිසිකලෙක පුළුවන් කමක් නැතැ'යි එසේ සරණ යන්නවුන් ඉදිරියෙහි එක එල්ලේම ප්‍රකාශ කළහ. සූර්‍යයාට වඳින අය, චන්ද්‍රයාට වඳින අය, ගින්නට වඳින අය ජලයට වඳින අය, නාගයන්ට වඳින අය, හා තවත් නොයෙක් ක්‍රමයෙන් වන්දනා මානන කරන්නෝ බුදු රජුන්ගේ සමයෙහි දඹදිව විසූහ.

74 පිටුව බලන්න

සත්‍යයෙහි පිහිටීම යි. සත්‍යය ගරු කිරීමයි. සත්‍යය නැති තැන බුද්ධාගමක් නැත. බෞද්ධ කමක් වත් නැත. බෞද්ධ කමේ ප්‍රධාන ලක්ෂණය සත්‍යවාදී වීම යි. සත්‍යය රැක ගැනීම් සඳහා ජීවිතය වුවත් පුද කළ යුතු ය. පුද කිරීමට අප ඉටා ගත යුතු ය.

බුදුවරයකු වීමට වඩා වීරක්‍රියාවක් වෙන නැත. මහා වීරයකුට හැර වෙන කිසිවකුටත් බුදුවරයකු විය නොහැකි ය.

ඔහු විසින් පිරිය යුතු පාරමිතා දහයක් තිබේ. ඒ දහය නම්:

"**දාන , සීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, සහ උපේක්ෂා** යනුයි.

මේ දහයෙන් එක එකක්ම පිරීමේ දි හෙවත් ක්‍රියාවේ යෙදවීමේදී බුදු වීමට බලාපොරොත්තු වන්නකු ඕනෑ ම වෙලාවක, ඕනෑම අවස්ථාවක මේ එක එකක් සඳහා ජීවිතය පරිත්‍යාග කරන්නට වුවත් සූදානම් විය යුතුය. මේ එක එකක් අන්තිම ඉහළ ම මට්ටමට ක්‍රියාවේ යෙදවීමෙන් බුදුබව ලබා ගත යුතු ව ඇත.

අතිශයින් අවශ්‍ය මේ සුදුසුකම් දහය නැත්තකුට බුදු විය නො හැකි ය. මෙම දස පාරමිතා නම්,

දාන පාරමිතාව: ත්‍යාගශීලී භාවය, බෝසතුන් වහන්සේගේ ත්‍යාගශීලී භාවයේ උච්චතම අවස්ථාව පිළිබිඹු වන්නේ වෙස්සන්තර ජාතකයෙනි.

ශීල පාරමිතාව: අධ්‍යාත්මික ශික්ෂණය, ශීල යනුවෙන් හැඳින්වේ.

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව: මේ පාරමිතාවෙන් අදහස් වන්නේ ගිහිගෙය අත්හැර දමා ලීමේ ගතිය. ලෞකික දේ කෙරෙහි කළ ඇල්ම තුරන් කිරීමත් මින් හැඟේ.

ප්‍රඥා පාරමිතාව: ආධ්‍යාත්මික ගුණ සමුදය දියුණු කොට ගැනීමේ ලා අවශ්‍යවන බුද්ධිය ප්‍රඥා නම් වේ.

වීර්‍ය පාරමිතාව: මින් ඇඟෙන්නේ අප්‍රතිහත ලෙස සිය අරමුණ කරා යෑමේ අචල ශක්තියයි.

ක්ෂාන්ති පාරමිතාව: තමන්ගේ සිරුර කඩ කඩ කළද, තමන්ට කවරා කාර ගැහැටක් කළද ඒ සියල්ල ඉවසා දරාගෙන, උදහස්නොවී සිටීමේ ගතිය ක්ෂාතිය නම් වේ.

සත්‍ය පාරමිතාව: තමන්ගේ ජීවිතය වුවත් පරදුවට තබා සත්‍ය රැකගැනීමේ සත්‍යවාදී ගතිය සත්‍ය පාරමිතාව නම්.

අධිෂ්ඨාන පාරමිතාව: නොසැලී, නොවෙනස්ව අප්‍රතිහතව, තමන්ගේ අරමුණ කරා ගමන් කිරීම අධිෂ්ඨාන පාරමිතාව නම් වේ.

මෛත්‍රී පාරමිතාව: මිතුරු-සතුරු වශයෙන් වෙනසක් නොකොට හැම විටම හැම දෙනෙකුම කෙරෙහි සම සිත් සහිත වීම මෛත්‍රී පාරමිතාවේ ලක්ෂණයයි.

උපේක්ෂා පාරමිතාව: මැදහත් බව අන්තගාමී නොවන බව, උපේක්ෂා නම්.

වීර්‍ය යනු වීරයා ගේ ස්වභාවයයි. මිනිස් සිතකට "බුදු වේවා" යි පළමු වරට සිතුණේ ද පුතකු තම මෑණියන් කර පින්නා ගෙන මහමුහුදේ මහා සටනක යෙදී සිටිය දී ය. බුදු වීමට පෙර බෝසතුන් ගේ හැම ක්‍රියාවක් ම වීරක්‍රියාවකි.

තම අත් පා කපද්දි එසේ කළ අය කෙරෙහි මෛත්‍රී කිරීම, ඉල්ලූ අයට තමන් සතු සියල්ල ම දී අන්තිමට ජීවිතය පවා පරිත්‍යාග කිරීම්, සාවුරුද්දක් නො කා නො බී දුෂ්කරක්‍රියා කිරීම ජීවිතය නැති වුවත් තමන් සතු ගුණදහමක් නැති කර නො ගැනීම, ජීවිතය නැති වුවත් කෙනෙකුට හිංසාවක් - පීඩාවක් - අලාභයක් - හානියක් නො කිරීම, ජීවිතය නැති වුවත් බොරුවක් නො කීම, වැනි දහසක් වීරක්‍රියා බුදුන් වහන්සේ බුදු වන්නටත් පෙර එක් වරක් නොව දසදහස් වරක් සිදු කොට ඇත. මේ හැම වීරක්‍රියා වක් ම කෙළේ

ආත්මාර්ථය පතා නො වේ. සැප සම්පත් පතා නොවේ. තනිකර ම දුකත්, දුක ඉපදීමට හේතුවත්, දුක නැති කිරීමත්, දුක නැති කිරීමේ මාර්ගයත් සොයා ගනු සඳහා යි. සොයා අවබෝධ කර ගෙණ ලෝකයා ඉදිරියෙහි තැබීම් සඳහායි. ලෝකයා ඉදිරියෙහි තබා ලෝකයා ඒ දුකින් මිදවීම් සඳහායි.

මේ පරම සත්‍යය සොයා ගැනීම සඳහා බුදුරදුන් වින්ද අප්‍රමාණ දුක ගැණ, ගත් අප්‍රමාණ උත්සාහය ගැණ අප අමතක නොකළ යුතු යි. නිතර සිහි කළ යුතු ය. ඒ පුදුම උත්සාහය සුළු කොට නො තැකිය යුතුය. එබැවින් සත්‍යයට ගරු කිරීම හෙවත් සත්‍යයෙහි පිහිටීම බුදුන් වහන්සේට කරණ ගෞරවයකි. සත්‍යයට පිටිපෑම බුදුන් වහන්සේට පිටු පෑමකි.

බුද්ධාගමෙහි වුවත්, බුද්ධ ධර්මයෙහි වුවත්, බුදුන් වහන්සේ ගැන වුවත් දීර්ඝ කාලයක් ගත වීම හා අන්ධභක්තිය නිසා සත්‍යයෙන් තොර කරුණු අඩංගු වී ඇතොත් අප ඒවා කිසි දු පැකිළීමක් නැතුව වෙන් කළ යුතුය. අස් කළ යුතු ය. පිළි නොගත යුතුය.

පොල්ගෙඩිය වටා ලෙල්ල මෙන් සත්‍යය වටා අතිශයෝක්ති හා වර්ණනා එමට තිබිය හැකිය. සත්‍යය සොයා ගැනීමට සත්‍යය තෝරා බේරා ගැනීමට ඒවා බාධක නො වේ. නියම බුද්ධ වචනයෙහි සියයට සියයක්ම සත්‍යය ඇත. **චතුරාර්ය සත්‍යය, අෂ්ටාංගික මාර්ගය, පටිච්ච සමුප්පාදය** වැනි ධර්ම පිරිසිදු බුද්ධ වචනයි. ඒවා තුළින් බුදුන් වහන්සේ ගේ බුද්ධිය හා රූපය අපට පෙනේ. උන් වහන්සේ අනුගමනය කරන හැම කෙනෙකුන් ම හැම දෙයකම නියම සත්‍යය, පරම සත්‍යය කුමක් දැ යි සොයන්නන් විය යුතු ය. නිතර ම සත්‍යය කථා කරන සත්‍ය ගරුකයන් විය යුතුය.



ජීවන සැලැස්ම

බුදුසමය යනු දිවිපෙවෙතින් උසස්ම ප්‍රතිඵල
ලද හැකි ආකාරයෙන් ජීවත්වීම පිළිබඳ සැලැස්මකි.
එය බුද්ධිය හා ප්‍රඥාව පිළිබඳ ආගමකි. එය අවබෝධයට හා දැනුමට
මුල්තැන දෙන ප්‍රඥාව පිළිබඳ ආගමකි.
බුදුහිමියන් ධර්මය දේශනා කළේ පුද්ගලයන්
සිය ආගමට හරවාගනු පිණිස නොව
ධර්මයට සවන් දෙන්නන්ට යථාතත්ත්වය අවබෝධ කරවීමටයි.

බටහිර ලේඛකයෙක්



බුදුහු ඒ බැනුම් වලින් කිසිදු වෙනසක් නොවී, ප්‍රීති මුහුණින් යුක්තව "බමුණ නුඹ "වසලයා" ය කියන්නේ කාට ද වසලයකු වීමට හේතුවන කරුණු මොනවාද? කියා දන්නෙහිදැ"යි ඇසූහ. "මම නොදනිමි. ඔබ දනිතොත් කියා දෙන්නැ" යි බමුණා කීය. එවිට බුදුහු "කෙනෙක් උත්පත්තියෙන් වසලයෙක් නොවේ. කෙනෙක් උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක් ද නොවේ. ඔහු කරණ ක්‍රියා අනුව වසලයෙක් හෝ බ්‍රාහ්මණයෙක් වේ."

73 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ විචිත්‍ර ධර්මකථිකයෙකි

මිනිසුන් අතර කථිකයන් සිටින්නේ ටික දෙනෙකි.කථිකයන්අතර ද තම කථාවට හැම දෙනා ගේම කන් යොමු කරවා ගත හැකි දක්ෂ කථිකයන් ඇත්තේ ඉතා ටික දෙනෙකි. ඉනුත් තම කථාවට හැමදෙනා ම වශී කරවා ගත හැකි විචිත්‍ර කථිකයන් සිටින්නේ ඉතා ම ටික දෙනෙකි.

විචිත්‍ර කථිකයන් අතර ද තම කථාව අසා සිටින හැම දෙනා ගේ ම අදහස් දැන කථා කළ හැකි කෙනෙක් සිටියේ නම් ඒ බුදුන් වහන්සේ යි. උන් වහන්සේ වැඩ සිටි කාලයෙහි මෙකල මෙන් ලේඛනකලාව දියුණු වී නොතිබුණේ ය. හැම අදහසක් කටින් ම ප්‍රකාශ කළ යුතු විය. බුදුහාමුදුරුවෝ අවුරුදු 45 ක් මුළුල්ලෙහි ස්වකීය උතුම් සිතුම් පැතුම් දහස් ගණන් සෙනග (සිවු පිරිස) ඉදිරියේ ව්‍යක්ත ලෙස පැවසූහ. උන්වහන්සේ කථා කරන විට රැස් ව සිටි සියයක් හෝ, දහසක් හෝ, දස දහසක් හෝ, සියක් දහසක් හෝ හැමදෙනෙක් ම ඉතා නිශ්ශබ්දතාවයෙන් ඉතා ඕනෑකමින් අසා සිටිය හ. සෙනග අතර කසු කුසුවක්, කෙඳිරිමක්, රහසේ කතා බහක් කිසිදු විටෙක ඇති නො වී ය. බුදුහාමුදුරුවන් "මේ කතා කරන්නේ මට ය, මේ බණ කියන්නේ මා උදෙසාම" යැයි හැම දෙනා ම සිතූ හ.

උන් වහන්සේගේ මුවින් පිට වූ ශ්‍රේෂ්ඨ වචන ලියා ගන්නට මෙකල මෙන් වාර්තාකරුවෝ නො සිටිය හ. ඒ බුද්ධ වචන කෙතරම් මිහිරි ද, කෙතරම් අගනා ඒවා දැයි කියතොත් යම් කිසි ආශ්චර්යවත් පුද්ගලයකු තම මුඛයෙන් මුතු මැණික්, දියමන්ති, වෛරෝඩි, ආදි අගනා රත්නජාති වගුරුවන විට එහි අගය දත්තවුන් ඒවා භාජනවලට පුරවාගෙන සුරක්ෂිත ව තබා ගෙන ඉන් ප්‍රයෝජන ගන්නාක් මෙන් බුදුරදුන් ගේ කරුණාසීතල හෘදයස්පර්ශියෙන් සිසිල් වී ශ්‍රී මුඛයෙන් පිට වූ මුතු- මැණික්වලටත් වඩා අගනා බුද්ධවචන සිත් නැමැති භාජනවල පුරවා ගෙණ ධාරණය කර ගැනීම් සඳහා ශ්‍රාවක සමූහයා නිතර ම පාහේ උන් වහන්සේ වටා එක්රොක් ව සිටියහ. ඒවා කටපාඩම් කරගෙන උදේ සවස සජ්ඣායනා කරමින් අමතක වන්නට ඉඩ නොදී මහඟු දයාදයක් මෙන් පරම්පරාවෙන් පරම්පරාවට රැකගෙන ආවෝය. පසු කලෙක රන්පත්වල රිදීපත්වල ලියා නිදන් කර තැබූහ. සෙල්ලිපිවල, තල්පත්වල ලියා රැක ගෙන ආවෝ ය. වෙන කිසිම කථිකයකු ගේ මුවින් පිටවුනු වචන මේ අයුරු රැකගෙන අවුත් නැත.

එකල විසූවන් අතර තිබුන පුදුම බලයක් නම් ධාරණ ශක්තිය යි. මේ බලය ඇති ශ්‍රාවකයෝ ත්‍රිපිටක බුද්ධවචන කටපාඩමින් අවුරුදු සිය ගණනක් රැකගෙන ආවෝය. මොවුහු **දීඝභාණක**, **මජ්ඣිමභාණක**, **සංයුත්තභාණක** ආදී නම් වලින් හඳුන්වනු ලැබූහ. **ත්‍රිපිටකධාරී** යන නමින් හඳුන්වනු ලැබූහ.බුදුන් වහන්සේගේ නික්ලේශී අභ්‍යන්තරයෙන් නැගී එන කටහඬ ඉතා මිහිරිය. වචන කාරුණිකය. පෑ ගණනක් වුවත් අසා සිටීමට තරම් රසවත්ය. අර්ථවත්ය. ප්‍රයෝජනවත්ය. ඒ වචන වල අතිශෝක්ති නැත. අලංකාර නැත. පුනරුක්ති නැත. බොරු නැත. බොල් නැත.එහෙත් ලොවී ලොව්තුරු රසයෙන් රසවත්ය. හැම වචනයක්ම මෙලෝ පරලෝ දෙකේ යහපත ගෙණ දෙන සුලුය.

බුදුන් වහන්සේ දැන සිටි දේ බොහෝය. දේශනා කළ දේ ස්වල්ප ය. ඒ බව දිනක් බුදුරදුන් ඇට්ටේරියා වනයක වැඩ සිටිද්දි බිම වැටි තිබුනු ඇට්ටේරියා කොළ අහුරක් අතට ගෙන "ආනන්දය. මා මෙතෙක් දෙසූ දහම් මගේ මේ අතේ ඇති කොළ අහුර තරම් ස්වල්පයකි. දෙසන්නට ඇති, මෙතෙක් නොදෙසූ දහම් මේ මහවනයේ ගස්වල ඇති කොළ තරම් බොහෝ ය"යි පැවසීමෙන් සිතා ගත හැක. උන් වහන්සේ හතලිස් පස් අවුරුද්දක් මුලුල්ලේ දිවා රෑ නො බලා, අව්ව වැස්ස නො තකා, දුර බැහැර නො සිතා, මේ දුප්පතා ය. මේ පොහොසතා ය. මේ බලවතා ය මේ දුබලයායි කිසි විශේෂයක් නො සළකා, හැම දෙනා ගේ ම යහපත පිණිස දෙසූ දහමින් අපට

දැනට ලැබී ඇත්තේ ඉතා ස්වල්පයකි. ආනන්ද හාමුදුරුවන් වහන්සේට මතක තුබූ හරිය පමණකි. ආනන්ද මහ තෙරුන් වහන්සේ බුදුන් වහන්සේ පිළිබඳ හැම සිද්ධියක් ම, උන් වහන්සේ ගේ මුවෙන් පිට වූ හැම ප්‍රකාශයක් ම ස්වකීය සිත් නැමැති පොතෙහි ධාරණ නමැති පෑනෙන් ලියා තැබූහ. ත්‍රිපිටකයෙහි හැම ග්‍රන්ථයක ම, හැම සූත්‍රයක ම පාහේ **"එවං මේ සුතං"** යන්න මුලට සඳහන් වේ. මේ මා විසින්, **එවං මෙසේ, සුතං** - අසන ලදි යනු එහි තේරුම යි. මෙය කෙතරම් සත්‍ය, කෙතරම් ශිෂ්ට කියමනක් ද? **බුද්ධ වචනයෙහි අයිතිය බුදුන් වහන්සේට ම තබා තමන් එය ඇසුවකුගේ තත්ත්වයෙන් ම පෙනී සිටිති.** උන් වහන්සේ ගේ නිහතමානිකම හා ධර්මයට ඇති ගෞරවය මෙයින් පෙනේ. බුදුන් වහන්සේ ගේ හැම කථාවක ම මුල, මැද අග යන තුන් තැන ම යහපත් ය. හොඳ තේරුමක් ඇත. හොඳ අදහසක් ඇත. නො තේරෙන නිසරු එක ද වචනයක් නැත. **"සො ධම්මං දෙසෙති. ආදිකල්‍යාණං, මජ්ඣෙකල්‍යාණං, පරියොසාන කල්‍යාණං, සාත්ථං, සබ්‍යඤ්ජන, කෙවලපරිසුද්ධං පරිපුණ්ණං"**

එබැවින් බුදු රදුන් ගේ දේශනයක් අසා නො වැටහුනු කෙනෙක් නැත. නො පැහැදුනු කෙනෙක් නැත. පැහැදුනු බොහෝ දෙනා මෙසේ කීහ. "භවත් ගෞතමයන් වහන්ස, ඔබ තුමන්ගේ ධර්ම දේශනාව ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කොට තැබූ භාජනයක් උඩුකුරු කොට තබන්නාක් මෙන්, යටපත් වූ නිධානයක් මතු කරන්නාක් මෙන්, මංමුලාවූවකුට මග කියන්නාක් මෙන්, ඇස් ඇත්තෝ රූප දකිත්වා යි අන්ධකාරයෙහි තෙල් පිරූ විලක්කුවක් දරන්නාක් මෙන්, ඔබ තුමන් විසින් නොයෙක් කරුණු ගෙනහැර දක්වමින්දහම් දෙසන ලදි. ඒ මම බුදු රදුන් ද ධර්මය ද සංඝයා ද සරණ කොට යමි. "භවත් ගෞතමයන් වහන්ස, අද පටන් මා දිවි කෙළවර කොට සරණ ගිය උපාසකයෙකැයි සිතා ගණු මැනැවි." බුදුරදුන් ගේ කථා අසා අන්තිමට ම පැහැදුනු බොහෝ දෙනෙකුගේ මුවෙන් පිටවුනු උදනයකි. ඉහත සඳහන් පාලි පාඨයෙහි දැක්වෙන්නේ. බුදුරදුන් ගේ දේශනා ඇසූ සමහරු "භවත් ගෞතමයන් වහන්සේ ලග මහණ වන්නට කැමැත්තෙමි. උපදම්පද වන්නට කැමැත්තෙමි" යි. කියා සිටියහ. **"ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදං ඉති."** සමහරු එදින ම මහණ වූ හ. උපසපන් වූ හ. සමහරු මිනිස් දුර්වලකම් සියල්ලම දුරු කොට රහත් වූ හ.

බුදුවරු දහම් දෙසන්නාහු සරණගමනය, සීලය, පැවිදි වීම් ආදියෙහි හේතු සම්පත් තිබේ දැයි සොයා බලා ඔවුන් ගේ අදහස් අනුව දහම් දෙසූ හ. ශාස්තෘන් වහන්සේ ඔහුගේ හේතු සම්පත් බලා දහම් දෙසන්නේ පිළිවෙළ කථාව (අනුපුබ්බිකථා) දෙසූ හ. අනුපුබ්බි කථාව නම් දන්දීම, සිල් රැකීම. සවර්ගයට යෑම, කාමයන් ගේ ආදීනව, පහත් බව හා කිලිටි බව, ගිහි ගේ හැර යෑමේ අනුසස් ද පැවසීමයි.

(අංගුත්තර නිකාය -අට්ඨක නිපාතය)

දීමේ, පරිත්‍යාග කිරීමේ, නිර්ලෝභිකමේ, පරාර්ථ සේවයේ අනුසස් දෙසීමෙන් කතාව ආරම්භ කරණ බුදුහු වැරදි වැඩ නො කොට හොඳ වැඩකිරීමේ හා යහපත් ගති ගුණ ආරක්ෂා කිරීමේ (සීල) වටිනාකම පෙන්වා දෙති. එසේ දන් දී සිල් රක්නා අය සවර්ගයට යන හැටිත්, සවර්ගය කම් සැප ඇති තැනක් බවත්, කම්සැපවල ඇති නිෂ්ඵල බවත්, ගිහිගෙය අප්‍රමාණ කරදර කම්කටොලුවලින් පිරී ඇති බවත්, විවේක තපස් ජීවිතයෙහි ඇති අනුසසුත් ක්‍රමයෙන් පෙන්වා දෙන විට බුදුරදුන් ගේ මේ ක්‍රමානුකූල, බුද්ධිගෝචර දේශනය අසනා සිටින්නන් ගෙන් වැඩිදෙනෙකුට, ඒකාන්තයෙන් ගිහිගෙය එපා වෙයි. මහණ වන්නට සිත් දෙයි. නොයෙක් බාධා නිසා මහණ විය නො හැක්කෝ තිසරණ පන්සිල් ගෙන බුදු සව්වන් බවට පැමිණෙති. බුදුරදුන් ගේ බණ අසා සිටින ඕනෑම කෙනෙකුට ශ්‍රද්ධාව උපදවන හෙයින් **(සද්ධාජනනතො)**, ප්‍රඥාව උපදවන හෙයින් **(පඤ්ඤාජනනතො)**, අර්ථ සහිත බැවින් **(සාත්ථතො)**, ව්‍යංජන සහිත බැවින් **(සබ්‍යංජනතො)**, ප්‍රකට වචන ඇති බැවින් **(උත්තානපදතො)**, ගැඹුරු අරුත් ඇති හෙයින් **(ගම්භීරත්ථතො)**,කණට මිහිරි හෙයින් **(කණ්ණ සුඛතො)**, හද පත්ලෙන් ම පැන නගින හෙවත් හෘදයංගම හෙයින් **(හදයංමතො)**, තමන්ගේ උසස් බව පමණක් නො කියන හෙයින් **(අනත්තුක්කං ගසනතො)**, අනුන් හෙලා නො දකින හෙයින් **(අපරවම්භනතො)**, කරුණා සීතල හෙයින් **(කරුණාසීතලතො)**, ප්‍රඥාවෙන් පිරිසිදු හෙයින්



"පෙර අසා ඇති නිසාවත්, පාරම්පරික චාරිත්‍ර වශයෙන් ඇති නිසාවත්, මෙය මෙසේ යැයි ඉතිහාසයෙහි සඳහන්ව ඇති නිසාවත් පිටකයෙහි තිබෙන නිසාවත් තරකයට ගැලපෙන නිසාවත් න්‍යායට ගැලපෙන නිසාවත් විචාරයට හසුවන නිසාවත් පිළිගත් මතයට අනුකූල නිසාවත්, කෙනෙකුගේ දක්ෂ තාවය නිසාවත්, ඒ තෙමේ අපේ ආචාර්යවරයායයි යන හැඟීම නිසා වත්, යමක් පිළිගත යුතු නොවේ. තම බුද්ධියෙන් විමසා බලා සත්‍ය යයි තමන්ට වැටහෙතොත් පමණක් පිළිගත යුතුය" (කාලාම සූත්‍රය) 73 පිටුව බලන්න

(පඤ්ඤාවදනතො), ඉන්ද්‍රියයන්ට රමණීය හෙයින් **(ආපාථරමණීයතො)**, මැඩීමට සමත් හෙයින් **(විමද්දක්ඛමතො)**, ඇසීමට සැප හෙයින් **(සූයමානසුඛතො)**, විමසීමට හිත හෙයින් **(විමංසියමානහිතතො)** සර්වතොභද්‍ර ය. හැම අතින් ම යහපත් ය. බුදුරදුන්ගේ බණඅසා පැහැදි ප්‍රීතියෙන් පිනාගිය බමුණෙක් මෙසේ කරයි. ඉක්බිති බ්‍රහ්මායු බමුණා අසුනෙන් නැගිට, උතුරුසළුව සකස් කොට පොරවා, භාග්‍යවතුන් වහන්සේ ගේ පා මත හිසින් වැටී උන්වහන්සේ ගේ පා දෙක මුවින් සිඹියි. ඇතින් පා පිරිමදියි. "භාග්‍යවතුන් වහන්ස, මම බ්‍රහ්මායු නැමැති බමුණා වෙමි" යි තම නම කියා හඳුන්වා දෙයි.

බුදුන් වහන්සේගේ දහම් දෙසීමේදි කිය යුතු දෙය සුදුසු කලට සලකා බලා දෙසති. සත්‍යයම දෙසති. අර්ථ නිර්ශ්‍රිතව ම දෙසති. නිරත්ථක එක වචනයකුදු නො දෙසති. නව ලොකොත්තර ධර්මනිඃශ්‍රිතවම දෙසති. විනය **(සංවර-ප්‍රහාණ)** නිශ්‍රිතවම දෙසති. **(දීඝනිකාය - කස්සපසීහනාද සූත්‍රය)**

බුදුන් වහන්සේ ආරම්භ කළ කථා පැවැත්වීමේ, දේශනා කිරීමේ, රට හැදීමේ, මිනිසුන් හැදීමේ, මිනිසුන්ට උගැන්වීමේ ක්‍රමය උන් වහන්සේගේ අභාවයෙන් පසු බුද්ධශ්‍රාවකයෝත් අනුගමනය කළහ. බුදු සව්වන්ගේ කථා හෙවත් ධර්මදේශනා කෙතරම් ජනප්‍රිය වීදැයි කියතොත් පුවත්පත්, ගුවන්විදුලිය, ශබ්දවාහිනී යන්ත්‍ර නොතිබුනු එකල රටවැසියා ගෙන් ඉතාම වැඩි පිරිසක් එක් තැනකට ගෙන්වාගැනීමේ,එක් රැස් කරවීමේ ශක්තිය හෙවත් ප්‍රචාරක මාධ්‍යය වූයේ බෞද්ධ ධර්මකථිකයන් වහන්සේ යි. උන් වහන්සේලාට රජුන්, ඇමතියන්, සිටුවරුන්, උගතුන්, බුද්ධිමතුන් තම දක්ෂ කථාවෙන් වසග කර ගත හැකිවිය. මිහිඳු මහරහතන් වහන්සේ රජු ප්‍රධාන ලක් වැසියන් ස්වල්ප කාලයක් තුලදී බෞද්ධයන් බවට පත් කළේ ප්‍රාතිහාර්‍ය්‍ය පෑමෙන් හෝ විජ්ජා පෙන්වීමෙන් හෝ නොව තනිකර කටේ බලයෙනි. කථා පැවැත්වීමෙනි. බණ කීමෙනි. මේ ශ්‍රේෂ්ඨ ධර්ම කථිකයන් තුළ පිරිසිදු හදවතක් හා සුපිරිසිදු චරිතයක් තුබුනේය. ලාභ, ප්‍රයෝජන, කීර්ති, ප්‍රශංසා දූවිල්ලක් තරම් නොතැකූ ඔවුහු ලෝකසත්වා වෙත පතළ මහා කරුණාවෙන් ම කථා කළහ. දහම් දෙසූහ. අසා සිටින්නන්ට ඒ උතුමන් තුළ පැවති අවංකකම, නිහතමානී කම, නිර්ලෝභී කම, දයාව, කරුණාව, මෛත්‍රිය, පරානුකම්පාව ආදි ශ්‍රේෂ්ඨ ගතිගුණ දර්පණතලයකින් මෙන් ඒ ධර්ම දේශනා තුළින් ම විනිවිද පෙනෙන්නට විය. එබැවින් ම බුදුබණ ඇසුවෝ බුදු සව්වන්ට වශී වූහ. ඒ අනුව පිළිපැද්දේය. බුදුරදුන් ගේ ධර්ම දේශනා ගැණ බමුණකු කරන වර්ණනාවක් මෙසේයි. "බුදුරදුන් විසාලා මහනුවර මහවනයෙහි කූටාගාර ශාලාවේ වැඩ වසන කල්හි "කාරණපාලි" නැමැති බමුණෙක් ලිච්ඡවී රජුන් ගේ නවකර්මාන්ත කරවයි. දිනක් ඔහු "පිංගියානි" නැමැති බමුණකු දැක, මේ මහ දවල් ඔබ කොහිසිට, එන්නෙහි ද? යි අසා බුදුරදුන් හමු වී එන බව කී විට "හැබෑට ම බුදුහාමුදුරුවෝ බුද්ධිමතෙක් ද? ව්‍යක්තයෙක් ද?පණ්ඩිතයෙක් ද"යි පිංගියානි බමුණා ගෙන් ඇසීය. "ඔබ කුමක් කියන්නෙහි ද? බුදුරදුන් ගේ ගුණ කියන්නට මම මොන මිනිහෙක් ද? ඒ වගේ ම උත්තමයකුට මිස මා වගේ කෙනෙකුට පිළිවන් ද?" පිංගියානි, ඔබ බුදුරදුන් ගැණ උදරප්‍රශංසාවක්මේ කරන්නෙ. හොඳයි, බුදුරදුන් ගේ මොන විදියේ ගුණයක් දැකලද මේ තරම් පසසන්නේ?

"අග්‍රම රසයෙන් තෘප්තිමත් වූවකු තිත්ත, කටුක රසයකට කැමැති වන්නේ නැතුව වගේ බුදුහාමුදුරුවන් ගේ බණ සූත්‍ර වශයෙන් හරි, ගාථා ධර්ම වශයෙන් හරි, ව්‍යාකරණ වශයෙන් හරි, අද්භූත ධර්ම වශයෙන් හරි යමෙක් ඇසුවොත් මේ ලෝකයේ සිටින අනික් මොනම මයණ බමුණෙකු ගේ මොන බණකටවත් පහදින්නේ නැහැ. සඳුන් ගැටයක් අරගෙණ කොතනින් ඉඹල බැලුවත් සුවඳ දැනෙන්න වගේ, තද රෝගයකින් පෙළෙන්නකු ගේ රෝගය දක්ෂ වෙදෙකු එක වරටම සුව කරන්නා වගේ, බුදුහාමුදුරුවන් ගේ බණ මොන ක්‍රමයකින් ඇහුවත් තදින් ම පැහැදීමක් ම යි ප්‍රීතියක්ම යි සොම්නසක්ම යි ඇති වන්නේ. අසන්නා ගේ හිතේ තිබෙන දුක් දෙම්නස් සියල්ල ම නැති වෙනවා" කියා පිංගයානි බමුණා බුදුබණෝ ගුණ වැණීය."

බුද්ධො පවදතං වරො" යනුවෙන් කතා කරන්නවුන් අතර බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨ බව සඳහන් වෙයි. **"වදතංපවරො"** යනුද බුදුරදුන්ට නමකි, එහි තේරුම් ද කථාකරන්නවුන්ගේ ශ්‍රේෂ්ඨයා යනුයි. එබැවින් කතාවෙන්, කටින් පිට වූ වචනවලින්, මේ ලෝකයේ ඉතා ම වැඩි සේවයක් සිදු කොට ඇති උතුමා හෙවත් විචිත්‍ර ධර්ම කථිකයා බුදුන් වහන්සේයි.

බුදුහාමුදුරුවෝ ශාස්තෘවරුන් අතර ප්‍රගතිශීලී ශාස්තෘවරයාණෝයි

බුදුන් වහන්සේ මීට අවුරුදු 2542කට පෙර වැඩ සිටි උතුමකු වුවත්, උන් වහන්සේ දෙසූ ධර්මය එක කාලයකට පමණක්, එක යුගයකට පමණක් යෝග්‍ය වී නැත, සීමා වී නැත. හැම කාලයට ම සුදුසු ය. සමාජය ප්‍රගතිශීලිවන්ට වන්ට බුද්ධධර්මය ද ඒ ප්‍රගතිශීලි සමාජයට යෝග්‍ය ය. එබැවින් බුද්ධධර්මය කාලයත් සමග ගමන් කරයි. ඇතැම් අය ගේ අදහස් සිතුම් පැතුම් හා උගැන්වීම් ක්‍රම කලක් ගත වන විට යල් පැන ගිය ඒවා බවට පැමිණේ. එහෙත් බුදුන් වහන්සේ කිසි විටෙක යල් පැනපු අදහස් පවසා නැත. සත්‍යය හැම කල්හි සත්‍යය යි. සත්‍යය නො වූ වචනයක් බුදුරදුන් ගේ මුවින් කිසි විටක පිට වී නැත.

බුදුන් වහන්සේ හැම දෙනාටම ලෝකය හැර යන්ට කිවේ නැත. හැම දෙනාට ම මහණ වන්ට කිවේ නැත. හැමෝට ම උපාසක උපාසිකාවන්ට කිවේ නැත. හැමෝට ම රහත් වන්නට කීවේ නැත. උන් වහන්සේ කෙලේ සත්‍යය සොයා ගැනිමයි. සොයාගත් සත්‍යය අනුන්ට ප්‍රකාශ කිරිම යි. විමුක්තියට, මෝක්ෂයට යන මග පෙන්වීම යි. උන් වහන්සේ

> **“ආරභථ නික්ඛමථ, යුඤ්ජථ, බුද්ධසාසනෙ-“අරඹව්, නික්මෙව්, බුදුසසුන්හි යෙදෙව්”** යනුවෙන් ස්වකිය ශ්‍රාවකයන් උනන්දු කරවූ හ, දිරි ගැන්වූ හ. පසු නො බසින ලෙස අවවාද කළ හ. ප්‍රමාදය තදින් හෙළා දැක්කාහ.
>
> අප්‍රමාදයට අමෘතපද යයි නම් කළ හ: **අප්පමාදෙ අමතපදං - පමාදෙ මච්චුනො පදං.**

පිරිනිවන් මඤ්චකයෙහි වැඩ සිට ගෙන පවා කළ අන්තිම අවවාදය, නම්

> **“වයධම්මා සංඛාරා - අප්පමාදෙන සම්පාදෙථ”** යනුයි පසු නො බසින ලෙස උකටලී නොවන ලෙස නොකලකිරෙන ලෙස භික්ෂූන්ට නිතර අවවාද කළ බුදුහු **අප්පමත්තා න මියන්ති - යෙ පමත්තා යථා මතා**“-නො පමා වූවෝ නො මැරෙත්. පමා වූවෝ නො මළත් මළවුන් වැනිය” යි වදළ හ.

උට්ඨාන වීර්යයෙහි (**උට්ඨානවතො**), දෘඪවීර්යයෙහි (**දළ්හවිරියෙ**) අනුසස් කිහ. දැඩි වීර්ය ඇති භික්ෂූන් පැසසූ හ. බුදුවරයකු වීමට අවශ්‍ය පාරමිතා දහය අතර වීර්ය පාරමිතාව ද එකකි.

කුසීත, හීන විරිය ඇති, නින්දට කැමැති, අලස භික්ෂූන්ට ගැරහූ බුදුහු ඉදිරියට යන සුලු නිර්භීත ධෛර්ය සම්පන්න භික්ෂූන් පැසසූහ. එබැවින් බුදුන් වහන්සේ අතිශයින් ප්‍රගතිශීලී ශාස්තෘවරයෙකි. දියුණුව කරා යන අයට දිරි දුන් බුදුහු පිරිහෙන අය කවුද, පිරිහීමේ දෙරටු මොනවා දැ යි පරාභව සූත්‍රයෙන් පෙන්වා දුන්හ.

දවසේ පැ විසිහතරෙන් ඉතාම වැඩි වේලාවක් වැඩෙහි යෙදුණු, අනුන්ගේ යහපත සඳහා ම සේවයෙහි යෙදුණු, අවංක සමාජසේවකයා බුදුන් වහන්සේ ය.

> **ආරද්ධවිරියො පරමත්ථපත්තියා**
> **අලීනචිත්තො අකුසීතවුත්ති**
> **දළ්හනික්කමො,ථාමබලූපපන්නො**
> **එකො චරෙ ඛග්ග විසාණකප්පො**
>
> ***(සුත්ත නිපාත - ඛග්ගවිසාණ සුත්‍රය)***

මේ ගාථාවෙහි එන හැම වචනයක ම ප්‍රගතිශීලි

තම රජ මැදුර බල බලා මහා වීදිය දිගේ, ගෙයක් ගානේ හිගා කෑම, රාජවංශය, රාජතේජස, රාජ ඓශ්වර්‍ය්‍ය, මහේශාක්‍ය භාවය පිළිබඳ මහා විප්ලවයකි. රාජාභිමානයට ගැසූ මරු පහරකි. මෙය දුටු පිය රජු සිහිසන් නැතිව, කැහැපට ගන්වාගෙන පසු පස්සේ දුවගොස් "අප රාජ වංශයට අවනම්බු කරන්න එපා." යැයි කිව්ට "ඔබ රාජවංශයෙහිය. එහෙත් මම බුද්ධ වංශයෙහිය. සිගා කෑම බුදුවරුන්ට අයත් චාරිත්‍රයකි. යි කීමද බුදුමුවකින් ම, චින්තන විප්ලවයක් කල කෙනෙකු මෙන් ම පිටවිය යුතු ශ්‍රේෂ්ඨ කියමනකි. 71 පිටුව බලන්න

ලක්ෂණ අඩංගු වී ඇත.

"**විරියං මෙ ධුරධොරය්හං**" මා ගේ වීර්‍යය ප්‍රඥා නැමැති යුග නගුල් සංඛ්‍යාත ධුරය උසුලන්නේ ය.

("**ගච්ඡති අනිවත්තන්තං යත්ථ ගන්ත්වා න සොචති**") යම් තැනකට ගොස් ශෝක නො කරයි ද, එතැන දක්වා නොනැවති යන්නේ ය. *(සුත්ත නිපාත - කසීභාරද්වාජ සූත්‍රය)*

"**විරියෙන දුක්ඛං අච්චෙති**": වීර්‍යයෙන් දුක නැති කෙරේ. "**උට්ඨාතා වින්දතෙ ධනං**" නැගී සිටි වීර්‍ය ඇත්තා ධනය ලබයි. "**සඞ්ගාමෙ මෙ මතං සෙය්‍යො - යඤ්චෙ ජීවෙ පරාජිතො**": පැරදී ජීවත් වනවාට වඩා යුද්ධයෙහි මිය යෑම යහපති. "**උට්ඨහථ නිසීදථ කො අත්ථො සුපිනෙන වො**": නැගිටිව්, හිඳ ගණිව්, නිදගැනීමෙන් තොපට ඇති ඵලය කුමක් ද?

(සුත්ත නිපාත - උට්ඨාන සූත්‍රය)

"මහණෙනි, මෙසේ මා විසින් ධර්මය මනා කොට දේශනා කරන ලදී, ප්‍රකට කරණ ලදී, විවෘත කරන ලදී, ප්‍රකාශ කරන ලදී, නිකසල කරන ලදී, මෙසේ මා විසින් මොනවට දේශනා කරන ලද, ප්‍රකට කරන ලද, විවෘත කරන ලද, ප්‍රකාශ කරන ලද, නිකසල කරන ලද ධර්මය ඇති කල්හි, ශ්‍රද්ධාවෙන් පැවිදි වූ කුලපුත්‍රයා විසින් සිරුරෙහි සම ද, නහර ද, ඇට ද, ඒකාන්තයෙන් ඉතිරි වේවා. මස්, ලේ වියලේවා යි පුරුෂ ශක්තියෙන්, පුරුෂ වීර්‍යයෙන්, පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුතු ඒ යමක් වේ නම්, ඊට නො පැමිණ වීර්‍යය නො නවත්වමින් වීර්‍යය වැඩිය යුතු ය.

(ඒවං ස්වාක්ඛාතො භික්ඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡින්නපිලොතිකො. ඒවං ස්වාක්ඛාතෙ ඛො භික්ඛවෙ මයා ධම්මේ උත්තානෙ විවටෙ පකාසිතෙ ඡින්න පිලොතිකෙ අලමෙව සද්ධාපබ්බජිතෙන කුලපුත්තෙන විරියං ආරභිතුං කාමං තචො ච නහාරූ ච අට්ඨී ච අවසිස්සතු, සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසත්ථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං නං තං අපාපුණිත්වා, විරියස්ස සණ්ඨානං භවිස්සති.

මහණෙනි, කම්මැලි කුසීත පුද්ගලයා පවිටු අකුසල්වල යෙදී දුකසේ වාසය කරයි. මහත් වූ යහපත් අර්ථය පිරිහෙළයි. මහණෙනි ආරබ්ධවීර්‍ය ඇති පුද්ගලයා පවිටු අකුසල්වලින් මිදී සුව සේ වෙසෙයි. මහත් වූ යහපත් අර්ථය සම්පූර්ණ කර ගනී. **(දුක්ඛං හි භික්ඛවෙ කුසීතො විහරති වොකිණ්ණො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි, මහන්තකඤ්ච සදත්ථං පරිහාපෙති. ආරද්ධවිරියො ච ඛො භික්ඛවෙ සුඛං විහරති පවිවිත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි, මහන්තඤ්ච සදත්ථං පරිපූරෙති.)**

මහණෙනි. හීන වූ ස්වල්ප වූ ශ්‍රද්ධා, වීර්‍ය, සති, සමාධි ආදියෙන් අග්‍ර වූ රහත් බවට පැමිණිය නො හැකි ය. අග්‍ර වූ ශ්‍රද්ධා වීර්‍ය ආදියෙන් ම, අග්‍ර වූ රහත් බවට පැමිණිය හැකි ය. මහණෙනි මේ බ්‍රහ්මචර්‍යය - ශ්‍රේෂ්ඨ හැසිරීම ප්‍රසාදජනක මිහිරි පානයක් බඳුය. ඔබට ශාස්තෘන් වහන්සේ හමු වී සිටිති. ඒ නිසා නො පැමිණි ධර්මයකට පැමිණීම පිණිස අවබෝධ නොකළ ධර්මය අවබෝධ කිරීම පිණිස ප්‍රත්‍යක්ෂ නො කළ ධර්මය ප්‍රත්‍යක්ෂ කර ගැනීම පිණිස වීර්‍ය කරන්න. මෙසේ අප ගේ පැවිද්ද වඳ නො වන්නේ ය, හිස් නො වන්නේය, සඵල වන්නේ ය. වැඩීම සහිත වන්නේය. අපි යම් කෙනෙකු ගේ සිවුපසය වළඳමෝ නම්, ඔවුන් ගේ ඒ සත්කාර අප විෂයයෙහි මහත් ඵල මහානිසංස වන්නේ ය" යි තොප විසින් මෙසේ හික්මිය යුතුය. මහණෙනි, ආත්මාර්ථය හෙවත් ස්වකීය දියුණුව බලාපොරොත්තු වන්නහු විසින් වහා

ම අප්‍රමාද ව කටයුතු කළ යුතු යි. පරාර්ථ සේවය කරන්නහු විසින් ද වහාම අප්‍රමාද ව කටයුතු කළ යුතු යි". (**න භික්ඛවෙ හීනෙන අග්ගස්ස පත්ති හොති, අග්ගෙන ච බො අග්ගස්ස පත්ති හොති. මණ්ඩපෙය්‍යමිදං භික්ඛවෙ විරයං ආරභථ, අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡි කිරියාය. "එවං නො අයං අම්හාකං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋදයා, යෙසං මයං පරිභුඤ්ජාම චීවරං පිණ්ඩපාත සේනාසන- ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාර තෙසං තෙකාරා අම්හෙසු මහප්ඵලා භවිස්සන්ති මහානිසංසාති. එවං හි වො භික්ඛාව සික්ඛිතබ්බං අත්තත්ථං වා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං පරත්ථංවා හි භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සම්පාදෙතුං උභයත්ථං වා භ භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අප්පමාදෙන සමාදෙතුන්ති."**

(සංයුත්ත නිකාය - අභිසමය සංයුත්ත - දසබල සූත්‍රය)

මෙබඳු ප්‍රගතිශීලි ප්‍රකාශ සිය දහස් ගණනක් බුද්ධවචනයෙහි දක්නට ඇත. බුද්ධ ධර්මය මිනිසා කලකිරවන, ආ පස්සට යවන, උනන්දුව අඩු කරවන, මුළුගන්වන දහමක් නොව අතිශයින් ප්‍රගතිශීලි දහමකි. බුදුන් වහන්සේ මිනිසා පරලොවට වඩා මෙලොවදි සැපවත් කරන ප්‍රීතිමත් කරන දහමක් දෙසූහ. මිනිස් ජිවිතය සකස් කර ගත යුතු හැටි, හැඩ ගසා ගත යුතු හැටි, සමාජයෙහි විසිය යුතු හැටි, උන් වහන්සේ වදළහ. හොඳ මේවාය, නරක මේවාය, කළ යුතු දේ මේවා ය, නොකළ යුතු දේ මේවා ය, ආශ්‍රය කළ යුතු අය මොව්හු ය, ආශ්‍රය නොකළ යුතු අය මොව්හු ය. යනාදි වශයෙන් අතිශය ශිෂ්ඨසම්පන්න ප්‍රගතිශීලි සමාජයක් ගොඩ නැංවීමෙහිලා අවශ්‍ය හැම උපදේශයක් ම දුන් හ.

උන් වහන්සේ යා යුතු මග සමාජයට පෙන්වා දුන් හ. ප්‍රගතිගාමී අදහස් උන් වහන්සේ තුළ තුබුණේ ම නැත. ප්‍රතිගාමී බමුණුමතවලට තදින් පහර දුන් හ. කාන්තාවන්ට මානුෂික නිදහස දුන් හ. ජාති ගෝත්‍ර කුල භේද හැම විට ම නොසලකා හැරිය හ.

"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා" "සියලු සත්වයෝ සුවපත් වෙත්වා" යි

හැම කෙනෙකුට ම එක සමාන ව මෛත්‍රිය පැතුරූ හ. උන් වහන්සේ ගේ මෛත්‍රියෙහි විවිධත්වයක් නැත. හැමටම එක සමානය.

ප්‍රගතිශීලි ලෝකයට උන් වහන්සේ ගේ ධර්මය අතිශයින් ගැළපෙනු ඇත. උන්වහන්සේ ගේ ධර්මයෙන් සකස් වුණු සමාජයට වඩා ප්‍රගතිශීලි සමාජයක් වෙන නැත.

එ බඳු සමාජයක් වෙන මොන ම කෙනෙකු ගේ වත් ධර්මයෙන් සකස් කළ නො හැකි ය. එබැවින් ශාස්තෘවරුන් අතර ප්‍රගතිශීලි ප්‍රජාතන්ත්‍රවාදි ශාස්තෘවරයා බුදුන් වහන්සේ ය.

බුදුන් වහන්සේ සමස්ත මානව සංහතියටම දයාදයකි

බුදු හිමියෝ හුදෙක් බෞද්ධයන්ට පමණක් අයත්වූ වස්තුවක් නොවෙති.
එතුමාණන් වහන්සේ සියල් ලෝවැසියනටම අයත්ය.
උන් වහන්සේ ගේ උගැන්වීම් කාටත් පොදුය. ලොව පහල වූ
හැම ආගමක් ම බුදු හිමියන්ගෙන් හොඳ අදහස්
බොහොමයක් ලබා ගෙන ඇත්තේ ය.

බෞද්ධ නොවන උගතෙක්

තම බිරිඳත් පුත් කුමරාත් රජ මැදුරත් රාජ්‍යයත් රජ සැපත් අත්හැර හොරා පැන ගොස් මහ වනයට වැද අමුසොහොනක මළ මිනියක් ඔතා තිබුණු තිඹක් පමණ පණුවන් ඇති රෙදි කඩක් සෝද අවුවේ වේලා හැදගෙන වාම් කමේ සැහැල්ලු දිවි පෙවෙතේ අන්තිම පත්ලටම බැස්ස, මිනිස් ඉතිහාසයේ සඳහන් එකම රාජ කුමාරයා සිදුහත් කුමරායි.

71 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ උපමා හා කතන්දර කීමෙහි අති දක්ෂයෙකි

බුදුන් වහන්සේ අසා සිටින අයට නොතේරෙන එකද වචනයක් ප්‍රකාශ නො කළහ. හැම දෙනාට ම තේරෙණ භාෂාවෙන් දහම් දෙසූහ. ගොවි ජනයාට දහම් දෙසන විට කුඹුර, නියර, වී, හාල්, වී බොල්, කෙවිට, නගුල, කුල්ල, හරකුන්, ගොපල්ලන්, ගැල්, ධාන්‍ය, ජලය ආදිය උපමා වශයෙන් යොදා ගත් හ.

එක් සමයෙක්හි බුදුන් වහන්සේ මගධ රට දක්ෂිණාගිරි නැමැති පෙදෙසෙහි ඒකනාළ නම් බමුණුගම වැඩ වසද්දී දිනක් අළුයම පා සිවුරු ගෙණ, **කසීභාරද්වාජ** නැමැති බමුණා පන්සියයක් පමණ නගුල්වලින් සී සාන තැනට ගොස්, ඔහු ඇතුළු පිරිස ආහාර අනුභව කරද්දී එතැනට පිඬු පිණිස වැඩිය හ. ඒ දුටු බමුණා,

"ශ්‍රමණභවත් ගෞතමයන් වහන්ස, මම නම් සී සාන්නෙමි. වපුරන්නෙමි. සී සා, වපුරා ධාන්‍ය ලබා ගෙන අනුභව කරමි. ඔබත් මා වගේ සී සාන්න. වපුරන්න. සී සා වපුරා ධාන්‍ය ගෙණ අනුභව කරන්න" ය යි කී ය.

එවිට බුදුන් වහන්සේ,

"මමත් සී සාන්නෙමි. වපුරන්නෙමි. සී සා, වපුරා අනුභව කරන්නෙමි" යි කී හ. එවිට බමුණා,

"ඔබ සී සා වපුරා අනුභව කෙරෙමි" යි කියයි. "එහෙත් ඔබේ විය ගහක්, නගුලක්, සී වැලක්, කෙවිටක් හා ගවයන් මම කිසි දිනක නො දැක්කෙමි" යි කී ය.

සද්ධා බීජං තපො වුට්ඨි
පඤ්ඤා මෙ යුගනංගලං
හිරි ඊසා මනො යොත්තං
සති මෙ ඵාලපාචනං

"මාගේ කෘෂිකර්මයෙහි ශ්‍රද්ධාව බිත්තර විය. සීලය වර්ෂා ජලය යි. මගේ විදර්ශනාප්‍රඥාව හා මාර්ගප්‍රඥාව විය ගහ හා නගුල යි. ලජ්ජාව නගුලිස යි. සිත වියබාන යි. සිහිය සීවැල හා කෙවිට යි"

යනුවෙන් තමන් වහන්සේත් එක් ක්‍රමයක ගොවියකු බව කියා දහම් දෙසූ හ. බණ ඇසූ බමුණා බුදුරදුන් ළඟ මහණ වී උපසම්පදාව ද ලැබ පසු කලෙක රහත් බව ද ලබා ගත්තේ ය.

(කසීභාරද්වාජ සූත්‍රය)

බුදුන් වහන්සේ භික්ෂුන්ට දහම් දෙසන විට පවා කෘෂිකර්මය උපමා කොට පෙන්නූ හ.

(**තීණිමානි භික්ඛවෙ කස්සකස්ස ගහපතිස්ස පුබ්බෙ කරණීයානි. කතමානි තීනි? ඉධ භික්ඛවෙ කස්සකො ගහපති පටිගච්චෙව ඛෙත්තං සුකට්ඨං කරොති සුමති කතං, පටිගච්චේව ඛෙත්තං සුකට්ඨං කාරොත්වා සුමතිකතං කාලෙන බීජානි පතිට්ඨපෙති. කාලෙන බීජානි පතිට්ඨපෙත්වා, සමයෙන උදකං අභිනෙතිපි අපනෙතිපි ඉමානි ඛො භික්ඛවෙ තීණි කස්සකස්ස ගහපතිස්ස පුබ්බෙ කරණීයානි**.) "මහණෙනි, ගොවියා විසින් කළ යුතු පූර්ව කෘත්‍ය තුනක් ඇත. එනම් පළමු කොට කුඹුර සී සා සම කළ යුතු ය. දෙවනු ව සුදුසු කලට වී වැපිරිය යුතු ය. තුන් වෙනු වට වී වැපිරීමෙන් පසු සුදුසු කලට ජලය දිය යුතු ය. සුදුසු කලට ජලය අස්කළ යුතු ය.

මේ ගොවියා විසින් කළ යුතු පූර්ව කෘත්‍ය තුනයි."

(අඞ්ගුත්තර නිකාය - තීක නිපාත)

රජුන්ට දහම් දෙසන විට අධාර්මික පාලනයෙහි, යුද්ධයෙහි, සටනෙහි, දිනීමෙහි, (**ජයං වෙරං පසවති.**) කෝපයෙහි, පලි ගැනීමෙහි, වෛරයෙහි, තෘෂ්ණාවෙහි ආදීනව දක්වමින් නොයෙක් උපමා හා කතන්දර ගෙණ ඇර පෑහ.

බමුණන්ට දහම් දෙසන විට කුලභේදයෙහි ආදීනව දක්වමින්, මානයෙහි, අහංකාරකමෙහි, කුලගර්වයෙහි, යාග හෝමවල නිස්සාර භාවය පෙන්නූ හ. ජාතියෙන් නියම බ්‍රාහ්මණයකු නො වන බවත් ක්‍රියාවෙන් ම නියම බ්‍රාහ්මණයකු වන බවත් පැවසූහ. බමුණන් ගේ මිථ්‍යාමත වලට පහර ගැසූ හ. **අලගද්දූපම වත්ථූපම, චූල සීහනාද, මධුපිණ්ඩික, කකචූපම, වම්මික, රථවිනීත, චූල්ල හත්ථිපදොපම, මහා හත්ථිපදොපම, මහාසාරොපම, චූල සාරොපම** ආදී සූත්‍රවල ඒ ඒ උපමා අඩංගු වේ. එබඳු උපමා දහස් ගණනක් ත්‍රිපිටකයේ සඳහන් වේ.

සිංහයා, ඇතා, අශ්වයා, දිවියා, ව්‍යාඝ්‍රයා, කගවේනා, සුනඛයා, ගවයා, මුවා, හිවලා, සෙමර මුවා ආදී සිවුපා සත්තු බුදුරදුන් ගේ උපමා වලට අඩංගු වූ හ. උරග වර්ගයෙන් නයා හා පිඹුරාත්, පක්ෂීන් ගෙන් ඇත්කඳලිහිණියා, ගිජුලිහිණියා, උකුස්සා, මොනරා, හංසයා, කොකා, කිරළා, කෝකිලයා, ගිරවා ආදීනුත්, මීමැස්සා, වේයා, කුහුඹුවා වැනි කුඩා සතුනුත් බුදුහු උපමාවලට ගත් හ.

අඹ, කොහොඹ, සල්, තල්, නුග, ඇසටු, උණ, උක් ආදී ගස් වර්ගත් අඹ, නෙල්ලි ආදී ගෙඩි වර්ගත් වී, අබ, තල වැනි ඇට වර්ගත් පස් පියුම් ආදී පුෂ්පවර්ගත් රන්, රිදී, මුතු, මැණික් ආදී රත්නවර්ගත් ගංගා, යමුනා, අචිරවතී ආදී නදී හා සමුද්‍රත්, මහමෙර, හිමාලය ආදී කඳුත්, ඉර හඳ, තරු, අහස, වලාකුල්, වාතය, වර්ෂාව, පර්වත, උයන්, පිට්ටනි, වැලිතලා, වැව්, පොකුණු, ගංවතුර, තිර්ථ, වෙරළ, රැළි, නැව, පහුර ආදියත් බුදුරදුන් ගේ උපමාවලට නිතර නිතර අඩංගු විය.

භික්ෂූන්ට දහම් දෙසන විට පැවිදි බවේ හා සිල්වත් කමේ අනුසස් ද දුසිල් බවේ ආදීනව ද නිතර ගෙන ඇර දැක් වූහ.

බුදුන් වහන්සේ ස්වකීය අතීත ආත්මභාව පන්සිය පනහක් (550) ක් ගැණ අතීත කතා පන්සිය පනහක් ගෙන ඇර දක්වූහ. මේ කතාවලට ජාතක කතා යයි කියනු ලැබේ. මේ ජාතක කතා ලෝකසාහිත්‍යයට අඩංගු වී ඇත.

බුදුන් වහන්සේට ඇති නම්වලින් ලෝක විදූ යනු එකකි. ලෝකවිදූ යනු ලෝකය ගැණ හොඳට දන්නා යනු යි. බුදුන් වහන්සේ තරම් ලෝකයත් ලෝකයේ තත්ත්වයත් ලෝකවාසී හැම කෙනෙකුන් ගේ ම චරිතයත් මනාව දැන සිටි අන් කිසිවෙක් නැත. **සබ්බඤ්ඤූ** යනු ද උන් වහන්සේට තවත් නමකි. සියල්ල දන්නා යනු එහි තේරුම යි. බුදුවරයකු විසින් දත යුතු සියල්ල ම උන් වහන්සේ මනාව දැන සිටිය හ.

උන් වහන්සේ දත් දේ බොහෝ ය. ඉන් ප්‍රකාශ කෙළේ අපට ලැබුනේ ඉතා ම ස්වල්පයකි. දිනක් උන් වහන්සේ අනඳ තෙරුන් සමග ඇට්ටේරිය වනයක් මැදින් වඩිද්දී බිම වැටී තුබුනු ඇට්ටේරිය කොළ අහුරක් අතින් ගෙන

> "ආනන්දය මේ මගේ අතේ තිබෙන ඇට්ටේරිය කොළ ද වැඩි නැත්නම් මේ මහ වනයේ තිබෙන ඇට්ටේරිය කොළ ද?යි ඇසූහ.
>
> "මහවනයේ තිබෙන ඇට්ටේරිය කොළ සිය දහස් ගුණයකින් වැඩි ය"යි ආනන්ද තෙරණුවෝ පිළිතුරු දුන් හ.
>
> "ආනන්දය, මා මෙතෙක් කල් තොපට දෙසූ දහම් මා අතේ ඇති මේ ඇට්ටේරිය කොළ තරම් ඉතා ස්වල්පයෙක. මාං දත් එහෙත් නො දෙසූ දහම් මේ වනයේ ඇති ඇට්ටේරිය කොළ රාශිය තරම් ඉතා බොහෝ ය" යි කීහ.

දිනක් අශ්වයන් හීලෑ කිරීමෙහි ඉතා ප්‍රසිද්ධ කේසී නමැති රියැදුරෙක් (**කෙසී අස්සදම්මසාරථී**) බුදුරදුන් හමු වීමට පැමිණ වැඳ එකත්පසෙක සිටියේ ය. එවිට බුදුහු "කේසිය" ඔබ අසුන් හීලෑ කිරීම පිළිබඳ ඉතා ම දක්ෂයෙකි. හීලෑ නො වූ, අශ්වයකු පළමු කොට ඔබ හීලෑ කරන්නේ කෙසේ

නාටිකාංගනාවන් නිද සිටි විලාසය දුටු සිදුහත් කුමරුන්ට ගිහිගෙය හැර යෑමට ඒ දර්ශනය වඩාත් ඉක්මන් කළේය. තමන් සතුටු කිරීම සඳහා ම යෙදී සිටින සුරූපී කාන්තාවන් රාශියක් රාත්‍රියෙහි එකතැන බිම වැටී නිදනු දැක කලකිරී රටත්, රාජ්‍යයත්, රජ සැපත්, අඹුදරුවනුත් යන සියල්ල අත්හැර පැනගිය, මිනිස් ඉතිහාසයේ සඳහන් එකම තරුණයා, එකම මිනිසා, සිදුහත් කුමරාය. සුරූපී නලඟනන් නිද සිටි තැන ඔහුට පෙණුනේ අමු සොහොනක් ලෙසය.

71 පිටුව බලන්න

ද?" "ස්වාමීනි, මම තරුණ අශ්වයකු පළමු කොට ඉතා ම මෘදු මොළොක් ක්‍රමයට හීලෑ කරමි. තද පරුෂ ක්‍රමයට ද හීලෑ කරමි. මෘදු මොළොක් හා තද පුරුෂ ක්‍රමයට ද හීලෑ කරමි"යි කිය.

"කේසිය, ඉදින් ඔබෙ අශ්වයා ඒ ක්‍රම තුණෙන් ම හීලෑ කර ගන්ට බැරි වුනොත් ඔබ කුමක් කරන්නෙහි දැ"යි බුදුහු ඇසූ හ.

"ස්වාමීනි, එසේ හීලෑ කරන්ට බැරි වුනොත් මගේ ඇදුරුකුලයට අපකීර්තියක් නො වන පිණිස මම ඌ මරා දමමි"යි කි ය.

එසේ කී කේසී අශ්වරථාචාර්‍යයා බුදුරදුන් ගෙන්ද ප්‍රශ්නයක් ඇසී ය.

"ස්වාමීනි, මා **අස්සදම්මසාරථී** යන නමින් හඳුන්වනු ලබන්නාක් මෙන් ම ඔබ වහනසේ ද **පුරිස දම්මසාරථී** යනුවෙන් හඳුන්වනු ලබති. මා අශ්වයන් දමනය කරන හැටි ඔබ වහන්සේට දැන් කිවෙමි. ඔබ වහන්සේත් පුරුෂයන් දමනය කරන හැටි මට කියනු මැනවි."

කේසිය, මම ද මෘදු මොළොක් වචනයෙනුදු පුරුෂයන් දමනය කරමි. තද පරුෂ භාවයෙනුදු පුරුෂයන් දමනය කරමි.

"කේසිය" මෘදු මොළොක් භාවයෙන් පුරුෂයන් දමනය කරන්නේ කායසුචරිතය මෙ බඳු වෙයි. කායසුචරිතයා ගේ විපාකය මෙ බඳු වෙයි. වචී සුචරිතය මෙ බඳු වෙයි. එහි විපාකය මෙ බඳු වෙයි. මනො සුචරිතය මෙ බඳු වෙයි. එහි විපාකය මෙ බඳු වෙයි. දෙවියෝ මෙබඳු වෙති. මනුෂ්‍යයෝ මෙ බඳු වෙති යන මේ ක්‍රමයට කරුණු පහදා දීමෙනි.

පරුෂ භාවයෙන් මිනිසුන් දමනය කරන්නේ කායදුශ්චරිතය මෙසේ ය. එහි විපාක මෙ සේ යත වාග්දුශ්චරිතය මෙසේ ය. එහි විපාක මෙසේ ය. මනෝ දුශ්චරිතය මෙසේ ය. එහි විපාක මෙ සේ ය. නිරය මෙ සේ ය. තිරශ්චීනයෝනිය මෙ සේ ය. ප්‍රේතවිෂයය මෙ සේ ය. යනුවෙන් කරුණු පහඳ දීමෙනි. මෘදු හා පරුෂභාවයෙන් මිනිසුන් දමනය කරන්නේ "කායසුචරිතය මෙ සේ ය. එහි විපාක මෙ සේ ය. කායදුශ්චරිතය මෙසේය. එහි විපාක මෙසේ ය. වචී සුචරිතය මෙසේ ය. එහි විපාක මෙසේ ය. නිරය මෙබඳු ය. තිරිසන් යෝනිය මෙබඳුය. ප්‍රේතයෝනිය මෙබඳුය. මනෝ සුචරිතය මෙසේ ය. එහි විපාක මෙසේ ය. මනෝදුශ්චරිතය මෙසේ ය. එහි විපාක මෙසේ ය. දෙවියෝ මෙබඳු ය. මනුෂ්‍යයෝ මෙබඳු ය. වචීදුශ්චරිතය මෙසේ ය. එහි විපාක මෙසේ ය. යනුවෙන් කරුණු විස්තර කර දීමෙනි.

"ස්වාමීනි, යම් කිසි ලෙසකින් ඔබ වහන්සේට ඉහත සඳහන් ක්‍රම තුණෙන් ම මිනිසකු දමනය කරන්නට නොහැකි වුව හොත් ඔබ වහන්සේ කුමක් කරන්න හු දැ යි? කේසී ඇසී ය.

බුදුහු "මම ඔහු මරමි" යි කී හ. එවිට "තථාගතයන් වහන්ස, බුදුවරුන්ට ප්‍රාණඝාතය කැප නැහැ, ප්‍රාණඝාතය සුදුසු නැහැ නො වේ ද?"

"කේසිය, එය ඇත්ත. ඉහත සඳහන් ක්‍රම තුනෙන් ම අවවාද අනුශාසනා කොට එයින් ඔහු හදා ගන්නට නොහැකි වුනොත්, හික්මවා ගන්නට නොහැකි වුනොත් මම ඔහුට තවත් අවවාද අනුශාසනා නො කර හරිමි. අවවාද අනුශාසනා නො කළ යුත්තකු කොට අත් හරිමි. ඔහු ඇසුරු කරන බුද්ධිමත් අනික් පිරිස ද අවවාද අනුශාසනා නො කළ යුත්තකු කොට ඔහු අත් හරී. මා විසිනුත් මගේ ශ්‍රාවකයින් විසිනුත් කෙනෙකු වෙන් කිරීම, කොන් කිරීම, අවවාද නො කොට හැරීම ආර්‍යය විනයෙහි මරා දැමීම යි. බරපතල ම දඬුවම යි"

කේසි රියැදුරා බුදුරදුන් ගේ මේ උපමාවෙන් අතිශයින් පැහැදී දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු බවට පත් විය. ***(අංගුත්තර නිකාය - චතුක්ක නිපාත - කේසි සුත්ත)***

දිනක් බුදුන් වහන්සේ ස්වකීය අතේ මාපටඇඟිල්ලේ නියපිටට පස් ටිකක් ගෙන, භික්ෂූන් අමතා "මහණෙනි, මගේ මේ අතේ නියපිට

තිබෙන පස් ද වැඩි මේ මේ මහපොළොවේ තිබෙන පස් ද වැඩි" යයි ඇසූ හ. "ස්වාමීනි නියපිට තිබෙන පස් ඉතා ම ස්වල්පයකි. මහපොළොවේ පස් ඉතා ම වැඩි ය. අප්‍රමාණ ය" යි භික්ෂුහු කී හ.

"එසේ ම මහණෙනි, සත්ත්වයන් අතර මිනිසුන් ව උපදින්නෝ මගේ මේ නියපිට තිබෙන පස් ටික තරම් ඉතා ම ස්වල්ප දෙනෙකි. මනුෂ්‍ය ආත්මභාවය නො ලැබ අනික් සතුන් ව උපදින්නෝ මහ පොළොවේ පස් තරම් ඉතා ම වැඩි ය" යි වදළහ.

(සංයුත්ත නිකාය - ඕපම්ම සංයුක්ත - නඛසිඛා සූත්ත)

දිනක් බමුණෙක් බුදුරදුන් හමුවන්නට අවුත් උන් වහන්සේට හොඳට ම බැන්නේ ය. බුදුහු ඒ සියල්ල ම අසා ගෙණ සිටිය හ. බමුණා ඔහුට ඇති තරම් බැණ, යන්නට පිටත් විය. එවිට බුදුහු ඔහු ආපසු තමන් වහන්සේට ළගට ගෙන්වා ගෙන,

"නුඹ දැන් නුඹට ඇති තාක් මට බැන්නෙහි ය. මම ඒ සියල්ල ම නිශ්ශබ්දව අසාගෙන සිටියෙමි. හොඳයි මම නුඹෙන් ප්‍රශ්නයක් අහන්න එයට පිළිතුරු දෙනවා දැ? යි ඇසූහ". "හොඳයි අසන්න" එවිට බුදුහු, "නුඹේ ගෙදරට අමුත්තකු ආ විට නුඹ ඔහුට කුමක් කරන්නෙහි දැ? යි" ඇසූ හ. "මම ඔහුට ආහාරපාන ආදියෙන් හොඳට සංග්‍රහ කරන්නෙමැ" යි කීය. යම් ලෙසකින් නුඹේ ඒ සංග්‍රහ ඔහු නො පිළිගත්තොත් නුඹ ඒවාට කුමක් කරන්නෙහි දැ? යි බුදුහු ඇසූ හ. බැමිණියත් මාත් එකතු වී ඒවා භුක්ති විඳින්නෙමු" යි බමුණා කීය.

"අන්න ඒ වාගේ ඔබ මීට ස්වල්ප වේලාවකට පෙර මට හොඳටම බැන්නෙහි ය. ඒ බැනීම් සංඛ්‍යාත සංග්‍රහය මම නො පිළිගත්තෙමි. එබැවින් ඔබ එය පිළිගෙන බැමිණියත් සමග භුක්ති විඳින්න"ය යි බුදුහු කී හ.

දිනක් බුදුරදුන් **රාහුල** තෙරුන් වැඩ සිටි සෙනස්නකට වැඩිය විට රාහුල තෙරණුවෝ බුදුරදුන් ගෞරවයෙන් පිළිගෙණ වැඩ හිඳීමට අසුන් පණවා පා ධෝවනය පිණිස දිය ද ගෙණවුත් තැබූ හ. බුදුහු කුඩා බඳුනකින් ජලය ටික ටික ගෙන දෙපා මතට වත් කරමින් පා ධෝවනය කොට කුඩා බඳුන යටිකුරු කොට තබා රාහුල තෙරුන් අමතා, "දැන් මේ කුඩා බඳුනෙහි ජලය ටිකක් වත් තිබේ දැ" යි ඇසූ හ. "යටිකුරු කොට තබන ලද බැවින් එහි ජලය ස්වල්පමාත්‍රයක් වත් නැතැ" යි රාහුල හිමි කී ය. එවිට බුදුහු රාහුල අමතා,

"රාහුලය, යම් සේ යටිකුරු කොට තැබූ බඳුනෙහි ජලය ස්වල්පයක් වත් නො රඳා ද එ සේ ම බොරු කියන තැනැත්තා කෙරෙහි ගුණධර්ම ස්වල්පයක් වත් රඳා නො පවති" යයි පැවසූ හ.

දිනක් බුදුහු අලවු රට හරකුන් ගමන් කරණ මගක් ඇති ඇට්ටේරිය වනයෙහි වැටී ඇති කොළ අහුරා ගෙන ඒ මත වැඩ හුන් හ. එකල **හත්ථක ආලවක** නම් රාජපුත්‍රයා අළුයම එතැනින් යද්දී කොළ ඇතිරිය උඩ වැඩ හුන් බුදුරදුන් දුටුවේ ය. දැක බුදුරදුන් වෙත ගොස් වැඳ එකත්පස්ව සිට, "කොහොමද? ස්වාමීනි, ඔබ වහන්සේ සැප සේ සයනය කළ සේක් දැ?" යි ඇසිය. "කුමාරය, එසේ ය. සුවසේ සැතපුනෙමි. මේ ලෝකයේ සැප සේ නිදන අය ගෙන් මමත් එක් කෙනෙක්මි" යි බුදුහු කිහ.

"ස්වාමීනි, හේමන්ත ඍතුව හිම වැටෙන කාලය යි. රෑට ඉතාම ශීතල යි. මෙහි බිම ඉතා ම රළු යි. හරක් කුරවලින් පොළව බිඳිල තියෙනවා. කොළ අතුරපු තැන, කොළත් ඉතා ම තුනී යි. ගසේකොළත් හැලිල, කාසාය වස්ත්‍රයත් ශීතලයි. සීතල වේරම්භ වාතයත් හමනවා. මෙසේ තියෙද්දිත් ඉතාම සැප සේ බුදියන අය ගෙන් ඔබ වහන්සේත් එක් කෙනෙක් ය කියනවා.

"කුමාරය, හොඳයි මම මේ කරුණ ගැන ඔබෙන් ම ප්‍රශ්නයක් අහන්නම්. කැමැති නම් උත්තර දෙන්න. මේ ලෝකයෙහි යම් කිසි ගෘහපතියකුට හරි, ගෘහපතිපුත්‍රයකුට හරි, ශීතවාතය ඇතුළට නො එන හැටියට තැනූ හොඳ දොර ජනෙල් ඇති කූටාගාරයක ඉතා ම වටිනා පලස් ජාති බිම එලා,

තරුණ කාලයේ ජීවිතයේ පළමු වරට රෝගියෙකු දුටු විට "ජ අමුතු තත්වයක් දැරූ මිනිසා කවරෙක්ද? ඔහුට එසේ වීමට හේතුව කුමක්ද? එසේ වූවෝ තවත් සිටිත් ද? තමනුත් රෝගියකු විය හැකි ද?" ආදී ප්‍රශ්න රාශියක් ඡන්න ඇමතියාගෙන් ඇසීය. පසුව මහල්ලකු දුටු විටත්, මළමිනියක් දුටු විටත්, පැවිද්දකු දුටු විටත්, එබඳුම ප්‍රශ්න ඇසී ය. "මේ සතර පෙර නිමිති ජීවිතය කුමක් ද? ජීවිතයේ පරමාර්ථය කුමක්ද? ජීවිතයේ අවසානය කුමක් ද? ජීවිතගෙන යන්නේ කුමන හේතුවක් නිසා ද?" ආදී දහසක් ප්‍රශ්න සිදුහත් කුමරාගේ සිත් තුළ පහළ කරවිය. 70 පිටුව බලන්න

උඩුවියන් බැඳ, හිස් දොර හා පාමුල සුවඳ තෙල් පහන් දල්වා, සුරූපී තරුණියන් හතර දෙනකු ලවා උපස්ථාන ලබමින් ඉතා ම සියුම් ලොම් ඇතිරිලි අතුළ යහනක සැතපෙන්නට ලැබෙනවා යයි සිතමු. කුමාරය, ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා සැප සේ බුදියනවා ය යි ඔබ සිතනවා දැ?" යි බුදුහු ඇසූ හ.

"එහෙයි ස්වාමීනි, මේ ලෝකයේ සැප සේ බුදියන්නන් ගෙන් ඔහුත් එක් කෙනෙක්ය කියා මම හිතනවා" "සුරූපී තරුණියන් සතර දෙනෙකු සමග එ සේ බුදියන ඒ ගෘහපතියාට හෝ ගෘහපති පුත්‍රයාට රාගයෙන් උපන් ගින්නකින් ඔහු ගේ හිත, කය දෙක දැවෙන බවත් ඒ දැවිල්ලෙන් යුක්ත ව දුක සේ බුදියන බවත් ඔබ පිළිගන්නවා දැ"යි බුදුහු ඇසූ හ. "එසේ ය, මම පිළිගනිමි" යි කුමාරයා කී ය.

"එ බඳු රාග - ද්වෙෂ - මෝහයෙන් හිත කය දෙකේ ඇතිවන දැවීම් මම සදහට ම සහමුලින් ම නැවත නූපදනා පරිදි මුලිනුපුටා දමා ඇත්තෙමි. ඒ නිසා කුමාරය, මේ ලෝකෙ ඉතා ම සැප සේ බුදියන්නන් ගෙන් මමත් එක් කෙනෙක් මි" යි බුදුහු කී හ.

(එකං සමයං භගවා ආලවියං විහරති ගොමග්ගෙ සිංසපාවනෙ පණ්ණසන්ථරෙ. අථ ඛො හත්ථකො ආලවකො ජඞ්ඝා විහාරං අනුචංකමානො අනුවිචරමානො අද්දස භගවන්තං ගොමග්ගෙ සිංසපාවනෙ පණ්ණසන්ථරෙ නිසින්නං. දිස්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො හත්ථකො ආළවකො භගවන්තං එතදවොච කච්චි භන්තෙ භගවා සුඛමසයිත්ථාත්‍රි එවං කුමාර සුඛමසයිත්ථං, යෙ ච පන ලොකෙ සුඛං සෙන්ති අහං තෙසං අඤ්ඤතරොති.)

(සීතා භන්තෙ හෙමන්තිකා රත්ති, අන්තරට්ඨකො හිමපාත සමයො, ඛරා ගොකණ්ටකහතා භූමි තනුකොපණ්ණසන්ථරො, විරලානි රුක්ඛස්ස පත්තානි, සීතානි කාසායානි වත්ථානි, සීතො ච වෙරම්බවාතො වාති. අථ ච පන භගවා එවමාහ එවං කුමාර සුඛමසයිත්ථං යෙච පන ලොකෙ සුඛං සෙන්ති අහං තෙසං අඤ්ඤතරොති)

(තෙන හි කුමාර තඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි, යථා තෙ ඛමෙය්‍ය, තථා නං ව්‍යාකරෙය්‍යාසි, තං කිංමඤ්ඤසි කුමාර? ඉධස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා කූටාගාරඋල්ලිත්තාවලිත්තං නිවාතං ඵුස්සිතග්ගලං පිහිතවාතපානං තත්‍රස්ස පල්ලඞ්කො ගොණකත්ථතො පටිකත්ථතො පටලිකත්ථතො කාදලිමිගපවරපච්ච- ත්ථරණො සඋත්තරච්ඡදො උභතොලොහිතකූපධානො, තෙලප්පදීපොචෙත්ථ ඣායෙය්‍ය. චතස්සො ච පජාපතියො මනාපමනාපෙන පච්චුපට්ඨිතාස්සු, තං කිම්මඤ්ඤසි කුමාර සුඛං වා සො සයෙය්‍ය නොවා, කථං වා තෙ එත්ථ හොතීති?)

(සුඛං සො භන්තෙ සයෙය්‍ය, යෙච පන ලොකෙ සුඛං සෙන්ති, සො තෙසං අඤ්ඤතරොති).

(තං කිංමඤ්ඤසි කුමාර? අපි නු තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා උප්පජ් ජෙය්‍යුං රාගජා පරිළාහා කායිකා වා චෙසිකා වා යෙහි සො රාගජෙහි පරිළාහෙහි පරිඩයිහමානො දුක්ඛං සයෙය්‍යාති? එවං භන්තෙ. යෙහි ඛො සො කුමාර ගහපති වා ගහපති පුත්තො වා රාගජෙහි පරිළාහෙහි පරිඩය්හං මානො දුක්ඛං සයෙය්‍ය, සො රාගො තථාගතස්ස පහීණො උච්ඡින්නමූලො තාලවත්ථූකතො අනුභාවකතො ආයතිං අනුප්පාදධම්මො තස්සමාහං සුඛමසයිත්ථං. තං කිම්මඤ්ඤසි කුමර? අපිනු තස්ස ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා උප්පජ්ජෙය්‍යුං දෙසාජා පරිළාහා - පෙ - උප්පජ්යෙුං මොහජා පරිළාහා කායිකා වා චෙතසිකා වා යෙහි සො මොහජෙහි පරිළාහෙහි පරිඩහමානො දුක්ඛං සයෙය්‍යාති? එවං භන්තෙ යොහ ඛො සො කුමාර ගහපති වා ගහපතිපුත්තො වා මොහජෙහි පරිළාහෙහි පරිඩය්හමානො දුක්ඛං සයෙය්‍ය. සො මොහො තථාගතස්ස පහීණො උච්ඡින්නමූලො තාලාවත්ථූ කතො අනුභාවකතො ආයතිං අනුප්පාදධම්මො තස්මාහං සුඛමසයිත්ථංති.")

(අංගුත්තර නිකාය - තිකනිපාත - දේවදූතවග්ග)

බුදුහු කොසොල්දනව්වෙහි එක්තරා වන ලැහැබෙක උඩුකය කෙළින් තබා කමටහන් අභිමුඛ කොට සිහි එළවා බද්ධ පයඞ්කයෙන් වැඩ හුන් හ. එවිට භාරද්වාජවංශික බමුණෙක් තමා ගේ ගොනුන් 14 දෙනෙකු නැති වී සොය සොයා ඒ වනලැහැබට පැමිණි විට බුදුරදුන් දැක තමා ගේ ගොණුන් 14 දෙනෙකු නැති වු බවත් කියා ගෙදරදොරේ ඇති නොයෙක් කම්කටොලු ගැන විස්තරයක් කොට, "මේ කිසි කරදරයක් ඔබ වහන්සේට නැති බැවින් ඔබ වහන්සේ සැපසේ සිටිති" යි කී ය. එවිට බුදුහු ඔහු ගේ කතාව ම මාතෘකා කොට ගෙන මෙසේ වදළ හ.

"බමුණ, නුඹ නුඹේ ගොනුන් 14 දෙනා සොයමින් දවස් 6ක් මුළුල්ලේ ඇවිදිනවා. මට ගොන්නු නැහැ. ඒ නිසා මම සැපෙන් සිටිනවා." (**න හි මය්හං බ්‍රාහ්මණ බලිවද්ද චතුද්දස-අජ්ජසට්ඨිං න දිස්සන්ති තෙනාහං බ්‍රාහ්මණා සුඛී**)

"බමුණ, නුඹට නුඹේ කෙතේ හැදී ගෙන එන තල ද එකක් දෙකක් කොළ ඉතිරි වූ තල ද, තිබෙනවා. ඒවා මට නැහැ ඒ නිසා මම සැපෙන් සිටිනවා." (**න හි මය්හං බ්‍රාහ්මණ තිලාබෙත්තස්මිං පාපිකා-එක පණ්ණා දු පණ්ණා ච තෙනාහං බ්‍රාහ්මණා සුඛී**)

"බමුණ, නුඹේ හිස් වූ ගබඩාවේ මීයෝ එහෙ මෙහෙ දුව පැන ඇවිදිනවා. මට එබන්දක් නැහැ. ඒ නිසා මම සැපෙන් සිටිනවා". (**න හි මය්හං බ්‍රාහ්මණ තුච්ඡකොට්ඨස්මිං මූසිකා-උස්සොළ්හිකාය නච්චන්ති මති තෙනාහං බ්‍රාහ්මණා සුඛී**)

"බමුණ, නුඹේ හත්මසක් පැරැණි තණඇතිරිය එහි ම උපන් පනුවන් ගෙන් පිරිලා තියෙනවා, මට එබඳු එකක් නැහැ. ඒ නිසා මම ප්‍රීතියෙන් සිටිනවා".**න හි මය්හං බ්‍රාහ්මණ සන්නාරො සත්ත මාසිකො උප්පාටකෙහි සඤ්ජන්නො තෙනාහං බ්‍රාහ්මණා සුඛී**)

"බමුණ, නුඹට එක පුතෙකුත් පුතුන් දෙදෙනෙකුත් ඇති කණවැන්දුම් දූල හත් දෙනෙක් සිටිනවා. මට එක්කෙනෙක් වත් නැහැ. ඒ නිසා මම සැපෙන් සිටිනවා" (**න හි මය්හං බ්‍රාහ්මණ විධවා සත්ත ධීතරො-එක පුත්තා ද්වි පුත්තා ච තෙනාහං බ්‍රාහ්මණා සුඛී**.)

"බමුණ, බළල් ඇස් ඇති, තල්කැලලින් යුත් සිරුරක් ඇති නුඹේ බැමිණිය නුඹ නින්දට ගිය විට කුද්දන්නෙ පයින් ඇනලා. මට එබන්දෙක් නැහැ. ඒ නිසා මම සැපෙන් සිටිනවා". (**න හි මය්හං බ්‍රාහ්මණ පිංගලා තිලකා හතා-සොත්තං පාදෙන බොධෙති තෙනාහං බ්‍රාහ්මණා සුඛී**)

"බමුණ, ණයහිමියන් උදයෙන් ම අවුත් නුඹෙන් මුදල් ඉල්ලනවා. නුදුන්නහම බැණ වදිනවා. මට එවැනි කරදරයක් නැහැ. ඒ නිසා මම නුඹ වගේ දුක් විඳින්නෙ නැති ව බොහොම සැපෙන් සිටිනවා යැ"යි බුදුහු කීය.

(සංයුත්ත නිකාය, බ්‍රාහ්මණ සංයුත්ත,අරහන්ත වර්ගය)

මෙහි දී බමුණා කී ගෙදර විස්තරය ම උපමා කොට ඔහු දුක් විඳින හැටිත් තමන් සැප විඳින හැටිත් බුදුහු පෙන්වා දුන්හ.

දිනක් කොසොල් රජු සිරිත් පරිදි තිඹක් හෙවත් ලාස් හතරක් බත් අනුභව කළ හැටියේ ම වාගේ බුදුරදුන් හමු වන්නට ගොස් වැඳ, හති දදා එකත්පසෙක වාඩි වූයේ ය. කොසොල් රජු ගේ මේ හති දැමීම දැක ඔහු බත් අනුභව කරන ප්‍රමාණයත් දත් බුදුහු මෙසේ කී හ. "හොඳ සිහියෙන් යුක්තව පමණ දැන ආහාර ගන්නා තැනැත්තාට කිසි වේදනාවක් දුකක් නැත, එසේ ම වැළඳු ආහාර ද හොඳට දිරවයි. එසේ ම ඔහු ගේ ආයුෂ ද ආරක්‍ෂා වෙයි." **"මනුජස්ස සදා සතිමතො මත්තං ජානතො ලද්ධභොජනෙ, තනු තස්ස *භවන්ති වෙදනා සනිකං ජීරති ආයුපාලයන්ති*"**

රජු ගේ සුදස්සන නමැති මාණවකයා ද රජු පිටිපසින් සිටියේය. රජතුමා ඔහුත් සමග මාලිගයට ගොස් ඔහු අමතා, "සුදස්සන, නුඹ බුදුරදුන් හමු වී ඒ කියාපු ගාථාව නැවත අසා කඩපාඩම් කර ගෙණ අවුත් මා ආහාර අනුභව කරන විට මා ලඟින් සිට දින පතා කියව. මම නුඹට කහවණු සියයක වැටුපක් දෙමි" යි කී ය.

ඒ අනුව සුදස්සන එ සේ කෙළේ ය. කලක් යන

එබැවින් උන්වහන්සේට බලගතු චින්තන විප්ලවයක් හා සමාජ විප්ලවයක් කරන්නට සිදුවිය. උන්වහන්සේ එය කෙළේ පසු කලෙක යුරෝපයේ ඇති වූ ප්‍රංශ විප්ලවය, රුසියන් විප්ලවය වැනි විප්ලවවල මුහුණුවරින් නොවේ. ලේ වැගිර වීමෙන්, හිංසා පීඩා කිරීමෙන්, මිනිමැරීමෙන්, වේගවත් කතා පැවැත්වීමෙන්, මිනිසුන්ගේ සිත් ප්‍රකෝප කිරීමෙන් නොවේ. *70 පිටුව බලන්න*

විට ක්‍රමයෙන් බත්වල ප්‍රමාණය අඩු වෙවී ගොස් අන්තිමට සහල් නැළියක බතට බැස්සේ ය.

ඒ සමග ම රජු ගේ මහ බඩගෙඩිය ද අඩු වී තරබාරු සිරුර ද සැහැල්ලු වී තම අතින් ඇගපත අත ගාමින් "අපේ බුදුහාමුදුරුවෝ මෙලොව අභිවෘද්ධියෙනුත්, පරලොව අභිවෘද්ධියෙනුත් යන දෙකින් ම මට අනුකම්පා කළ හ"යි **(උභයෙන වත මං සො භගවා අත්ථෙන අනුකම්පි දිට්ඨධම්මිකෙන චෙව අත්ථෙන සමපරායිකෙන ච)** ප්‍රීතිවාක්‍ය පහළ කෙළේ ය.

(සංයුත්ත නිකාය - කෝසල සංයුත්ත - දොණපාක සූත්‍රය)

මෙහි දී බුදුහු සීමාව ඉක්මවා ආහාර අනුභව කිරීමේ ආදීනව රජු ගේ හිත නො තැලෙන තාලෙට ප්‍රකාශ කළ හ.

දිනක් කොසොල් රජතුමා බුදු රදුන් හමු වන්නට ජේතවනාරාමයට පැමිණ බුදුන් වැඳ එකත්පසෙක සිට පිළිසඳර කතා කරමින් සිටියේ ය. ඒ අතර රාජපුරුෂයකු පැමිණ යටහත් පහත් ව රජු ලගට ගොස් කණට කොඳුරා "මල්ලිකාදේවිය කාලක්‍රියා කළා" යැයි කීය. ඒ ඇසූ රජු බලවත් ශෝකයට පැමිණ එතන ම දිගා වී බිම බලා ගෙන සිහි නැති වූවකු මෙන් සිටි යේ ය. **(එවං වුත්තෙ රාජා පසෙනදී කොසොලො දුක්ඛී දුම්මනො පත්තක්ඛන්ධො අධොමුඛො පජ්ඣායන්තො අප්පටිභාණො නිසීදි)**

සිය බිසව ගේ මරණය පිළිබඳ පුවතින් සිහි නැති ව වැටී සිටින කොසොල් රජු දුටු බුදුහු රජු අස්වසමින්

> "මහ රජ මේ ලෝකයේ මොන ජගතකු විසින් වත් ලැබිය නො හැකි කරුණු පහක් තිබේ. ඒ පහ නම් **ජරාවට නොපැමිණී සිටීම, ලෙඩ නොවී සිටීම, ක්ෂය නොවී සිටීම, නො මැරී සිටීම, වෙනස් නොවී සිටීම** යන මේවා යි".

මේවා මට නොලැබේවා ! යි මිනිසෙක් හෝ දෙවියෙක් හෝ මරෙක් හෝ, බඹෙක් හෝ වෙන ඕනෑම ජගතෙක් හෝ බලාපොරොත්තු වුවත්, ප්‍රාර්ථනා කළත් නො ලැබෙන බව පවසා රජු අස්වසා මාලිගයට පිටත් කර හැරියහ.

බුදුහු භික්ෂුන් සමග කොසොල් රට සැරිසරමින් ඉච්ඡානංගල නම් බ්මුණු ගමට ගොස් එහි වනලැහැබක වැඩ සිටිය හ. "ශාක්‍යකුලයෙන් පැවිදි වූ ශාක්‍යපුත්‍ර ගෞතමයන් වහන්සේ එම ගමට වැඩිය හ යි ගම පුරා පැතිර ගියේ ය. ඒ පුවත ඇසූ ගම් වැසි බමුණෝ නොයෙක් කෑම්, බීම්, පුද පූජා රැගෙන වනලැහැබට ඇතුල් වන දොරටුව ලගට එක් වී මහ හයියෙන් කෑ ගසන්නට වූ හ.

එකල බුදුරදුන් ගේ උපස්ථායකයා ව සිටියේ නාගිත තෙරණුවෝ ය. බුදුහු නාගිත තෙරුන් අමතා "නාගිතයෙනි, "මාලු කඩයක වගේ අර කෑ ගසන්නේ කවුදැයි" ඇසූ හ. **(කො පනෙතෙ නාගිත උච්චා සද්දා මහාසද්දා කෙවට්ටා මඤ්ඤෙ මඤ්ඤෙ මච්ඡවිලොපෙති)**

"ස්වාමිනි, ඉච්ඡානංගල ගම්වැසි බ්‍රාහ්මණයෝ බුදු පාමොක් මහසගනට දනය රැගෙන අවුත් බිහිදෙර කොටුවෙහි සිටිති යි කීය. "නාගිතයෙනි." "මට ලාභ කීර්ති ප්‍රශංසා සමග කිසිම සම්බන්ධයක් වන්න ඕනෑ නැහැ." "ලාභ කීර්ති ප්‍රශංසා මා සමගත් කිසිම සම්බන්ධයක් වන්න ඕන නැහ." **(මාහං නාගිත යසේන සමාගමො, මා ච මයා යසො)** මට මේ තිබෙන නෛෂ්ක්‍රම්‍ය සැපය, විවේකය සැපය, උපසම සැපය හොඳටම ඇති."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ කොහේ වැඩියත් ඒ වැඩිය ප්‍රදේශයේ සියල්ලෝම ඔබ වහන්සේ සිටින දිහාවට නැමෙනවා, ඇදී එනවා." **(යේන යේන පදේසං භන්තේ භගවනා ගමිස්සති තන්නින්නාව භවිස්සන්ති බ්‍රාහ්මණ ගහපතිකා නෙගමා චෙව ජානපදා ච)** එබැවින් ස්වාමීනි, ඒ දන මානාදිය ඉවසා වදරණු මැනවි.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මහා වර්ෂාවක් වැස්සහම ඒ ජලය පහත් බිම කරාම ගලා එන්නාක් මෙන් ඔබ වහන්සේ යම් කිසි දිශාවකට වැඩියොත් ඒ පලාතේම සිටින බමුණු ගෘහ

පතියෝත් ගම් නියම් ගම් ජනපද වැසියෝත් ඒ දිහාවට නැඹුරු වන්නාහ. ගලා එන්නාහ. ඒ කුමක් නිසා ද? ඔබ වහන්සේ ගේ ඇති ශීලයත් ප්‍රශ්‍රද්ධාවත් නිසා මයි. ***(තං කිස්ස හේතු තථා හි භන්තේ භගවතෝ සීලපසද්සද්ධාතං)*** එබැවින් ස්වාමීන් වහන්ස, ඔවුන්ගේ දනය පිළිගනු මැනවි.

නාගිතය, මම ලාභ කීර්ති ප්‍රශංසා සමග කිසිම සම්බන්ධයක් ඇති කරගන්නේ නැහැ. ඒ වා මා සමග සම්බන්ධ වන්නට ඕනැත් නැහැ. නාගිතය, මම නිදහස් නිවහල් විවේක සැපය ලබන්ටයි කැමති. එය මට කරදරයක් හිරිහැරයක් නැතිව ලැබෙන්ට ඕනැ. කෑම්, බීම්, රසවිදීම්, නාගිතය ලොකු වැඩ නොවේ. මල මුත්‍ර තමයි ඒ වායේ ප්‍රතිඵලය. ***(අසිතපීතඛායිත සායිතස්ස බෝ නාගිත උච්චාරපස්යාවො, ඒ සො තස්ස නිස්සන්දෙ:)***

(අංගුත්තර නිකාය- පඤ්චක නිපාත නාගිත සූත්‍රය)

දිනක් අභය රාජ කුමාරයා තම නිවසෙහි බුදුරදුන්ට දන් දී අවසානයෙහි, තම ළදරු කුමාරයාද ඇතින් වඩා ගෙන, සිටින ගමන් ප්‍රශ්ණයක් ඇසිය.

"ස්වාමීනි, ඔබ වහන්සේ අනුන්ට අප්‍රිය වන, අනුන්ගේ හිත නරක් වෙන විදියේ වචනත් පවසනවා නේද? "දෙව්දත්, නිරයට යනවා, දෙව්දත් අපායට යනවා, ඔහුට පිළියමක් කරන්ට කිසිවෙකුටත් බැහැ" යි කී විට, ඔහු කිපුනා. ඔහුට තරහ ගියා. ඉතින් මෙහෙම අප්‍රිය අමනාප වචන කතා කලාම ඔබ වහන්සේගේත්, පෘථග්ජනයින් ගේත් අතර වෙනසක් නැහැනේ?

රාජ කුමාරය, මම ඇත්ත ඇති සැටියෙන් කියනවා මිසක් කාටවත් අප්‍රිය වචනයක් කියන්නේ නැහැ. හොඳයි, ඔබේ අතේ සිටින ඔය ළදරුවා ගල් කැටයක් හරි, කුනු කැල්ලක් හරි කටේ දමා ගත්තොත් ඔබ මොකද කරන්නෙ?

මම දරුවා වඩාගෙන ඒ ගල් කැටය හෝ කුනු කැබැල්ල අරන් දනවා.

හොඳයි ,පහසුවෙන් අරන් දන්න බැරි වුනොත්?

මම වමතින් දරුවා ගේ හිස අල්ලාගෙන, දකුනතේ එක ඇඟිල්ලක් නවා දරුවාගේ කට තුලට යවා, කරකවා කෙසේ හරි ඒක අරන් දනවා.

එසේ කරන කොට දරුවාගේ උගුරෙන් ලේ එන්න පුලුවන්, දරුවට රිදෙන්න පුලුවන් නේද? එහෙයි ඉතින් එසේ කළේ දරුවාට ඇති ආදරයෙන් ද? නැත්නම් අනාදරයෙන් ද?

ඇත්තෙන්ම දරුවාට ඇති ආදරය නිසාමයි.

අන්න ඒ වාගේ මම ඇත්ත ඇති සැටියෙන් කීවාම, සමහරුන්ට රිදෙන්න පුලුවන්, සමහරුන්ට තරහ යන්න පුලුවන්, එහෙම වුනත් මම ඒ කියන්නෙ ඔවුන්ට රිදවන්ට නොවේ. ඔවුන්ට ඇති අප්‍රමාණ කරුණාව නිසා මයි."

(අත්ථි රාජකුමාර තථාගතස්ස සත්තෙසු අනුකම්පා)

(මජ්ඣිම නිකාය - අභය රාජකුමාර සූත්‍රය)

මෙ බඳු සිය ගණනක් නොව, දහස් ගණනක් උපමා කතාන්දර ත්‍රිපිටකයෙහි දක්නට ඇත.

බුදු රදුන් සමාන්‍ය පොදු ජනයාගේ සිත් තුළට කා වැද්දෙන ලෙස කරුණු අවබොධ කිරීමේදී උපමා හා කතාන්තර අතිශයින්ම උපයෝගී කර ගත් බව පෙනේ. අද දක්වාම සාමාන්‍ය ජනයා බණ ඇසීමේ දී මතක තබා ගන්නේ එහි කියවුනු කතාවක් පමණකි. බුදු රදුන්ගේ මේ ධර්මදේශනා ක්‍රමයට සාමාන්‍ය මහජනයා අදත් ප්‍රිය කරති.

සත්‍යාවබෝධයත් සමග ම උන් වහන්සේට පුදුම දැකීමක්, පුදුම දැනීමක්, පුදුම නුවණක්, පුදුම විද්‍යාවක්, පුදුම ආලෝකයක් පහළ විය. පෙර නො ඇසූ විරූ ධර්මයන් පිළිබඳ ඇස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව දැනුම පහළ විය. ආලෝකය පහළ විය. උන්වහන්සේට එද බෝ මැඩදී සොයා ගත් පරම සත්‍යය, ලැබූ පුදුම තත්ත්වය, පුදුම දැනුම, පුදුම අවබෝධය ලෝකයා හමුවෙහි තැබිය යුතුයයි සිතා, පස්වග මහණුන් සොයා ගොස් ඔවුන්ට කී හ. ඒ අදහස් උණු උණුවේ ම දේශනා කළ හ. 79 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මානසිකවෛද්‍යවරයාණෝයි

වෛද්‍යවරු කායික වෛද්‍යවරුය. (ශරීරි ගත ලෙඩට වෙදකම්රන්නෝය) මානසික වෛද්‍යවරුන් ය (හිතේ හට ගත් ලෙඩට වෙදකම් කරන්නෝය) යි කොටස් දෙකකින් යුක්ත ය. එසේම රෝග ද කායික රෝගය, මානසික රෝගය යැයි කොටස් දෙකකින් යුක්තය.

"මහණෙනි, රෝගයෝ දෙදෙනෙකි. කායික රෝගය, මානසික රෝගය කියා මෙයින් කායික රෝගවලින් නො පෙළී අවුරුද්දක්, දෙකක්, තුනක්, හතරක්, පහක්, දහයක්, විස්සක්, තිහක්, හතලිහක්, පනහක්, ඇතැම් විට සියයක් නිරෝගීව වසන අය සිටිත්. එහෙත් මානසික රෝගවලින් ,හිතේ ලෙඩින එක මොහොතක් නො පෙළී - පීඩා නොවිඳ සිටින අය රහතන් වහන්සේලා හැර වෙන සොයා ගැනීම දුෂ්කරය". **(දිස්සන්ති භික්ඛවෙ සත්තා කායිකෙන රොගෙන එකංපි වස්සං ආරොග්‍යං පටිජානමානා ද්වෙපි වස්සානි ආරෝග්‍යං පටිජානමානා-පෙ-වස්ස සතංපි ආරෝග්‍යං පටිජානමානා තෙ භික්ඛවෙ සත්තා දුල්ලාභා ලොකස්මිං යෙ චෙතසිකෙන රොගෙන මුහුත්තංපි ආරොග්‍යං පටිජානාති අඤ්ඤත්‍ර ඛිණාසවෙහි)**

(අංගුත්තර නිකාය - චතුක්ක නිපාත - රෝග සූත්‍රය)

ඉහත සඳහන් දෙ වැදෑරුම් වෛද්‍යවරුන් අතර බුදුන් වහන්සේ මානසික වෛද්‍යවරයෙකි. හිතේ ලෙඩවලට බෙහෙත් කිරීමට බුදුහාමුදුරුවන් තරම් දක්ෂ වෛද්‍යවරයෙකු ලොව ඉපදී නැත. ස්වකීය හිතේ ලෙඩ මානසික රෝග සියල්ලම මුලිනුපුටා දැමූ උන්වහන්සේ එ බඳු රෝග ඇති ලක්ෂසංඛ්‍යාත ජනකායක් සුවපත් කළ හ.

බුදුරදුන්ට පෘථග්ජන සියල්ලන්ම පෙණී ඇත්තේ පිස්සන් මෙනි. **(උම්මත්තකා විය හි සබ්බෙ පුථුජ්ජනා දිස්සන්ති)** බොහෝ දෙනා සිරුරින් නිරෝගී වුවත් සිතින් රෝගීහු වෙති. බුදුහු මිනිසා ගේ සිතේ ඇතිවන කෙලෙස් ලෙඩ මැනවින් හැඳින ගෙන රෝගනිදන හොඳින් වටාහා ගෙන එයට සුදුසු ඖෂධ දුන් හ. එබැවින් උන් වහන්සේ සේල නමැති බමුණාට,

"බමුණ,මම සම්බුද්ධ වෙමි. එසේ ම ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛදවරයා ද වෙමි" යි **(සොහං බ්‍රාහ්මණ සම්බුද්ධො සල්ලකත්තා අනුත්තරෝ)** පැවසූහ.

(සුත්ත නිපාත - සේල සූත්‍රය)

බුදුරදුන් ගේ ශල්‍යකර්ම නම් මිනිසුන් ගේ සිත්තුළ ඇති රාගාදි උල් ඇද දැමීම යි. තවත් තැනක දි උන් වහන්සේ භික්ෂූන් අමතා,

"මහණෙනි ධර්මඖෂධය තරම් හොඳ ඖෂධයක් වෙන නැත. එය පානය කරව්." **(ධර්මාඖසධසමං නත්ථි එතං පිබථ භික්ඛවො)** යයි වදාළ හ.

මහණෙනි, වෛද්‍යවරයෝ පිතෙන් හට ගත් රෝග සුව කිරීම පිණිස සෙමෙන් හට ගත් රෝග සුව කිරීම පිණිස, වාතයෙන් හට ගත් රෝග සුව කිරීම පිණිස විරේචන බෙහෙත් දෙති.

මහණෙනි, මමද ආයජී විරේචන දෙන්නෙමි. ඉපදීම ස්වභාව කොට ඇති සත්වයෝ ඉපදිමෙන් මිදෙත්. ජරාව මරණය ස්වභාව කොට ඇති සත්ත්වයෝ ජරාවෙන් හා මරණයෙන් මිදෙත්. සෝක විලාප දුක් දෙම්නස් උපායාසා ස්වභාව කොට ඇති සත්ත්වයෝ ඒවායින් මිදෙත්. **(තිකිච්ඡකා භික්ඛවෙ විරෙචනං දෙන්ති**

පිත්තසමුට්ඨානානංපි ආබාධානං පටිඝාතාය සෙම්හසමුට්ඨානානංපි ආබාධානං පටිඝාතාය වාත සමුට්ඨානානංපි ආබාධනං පටිඝාතාය අහං ච බො භික්ඛවෙ අරියං විරෙචනං දෙසිස්සාමි. යං විරෙචනං සම්පජ් ජති,ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති සොකපරිදෙව දුක්ඛ දෙමනස්සුපායාස ධම්මා සතතා සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුබ පායාසෙහි පරිමුච්චන්ති.)

(අංගුත්තර නිකාය - දසම නිපාත - සඥ්ඥාවග්ග)

මහණෙනි වෛද්‍යවරු පිතෙන් සෙමෙන් වාතයෙන් හට ගත් රෝගවලට වමනය කරවත්. මහණෙනි, මම ද ආයර්‍ය වමන කරවන්නෙමි. ඒ වමනයෙන් ජාතිය. ජරාව මරණය සෝක පරිදේව, දුක්, දෙම්නස්. උපායාස ස්වභාව කොට ඇති සත්ත්වයෝ ඒවායින් මිදෙත්. **(තිකිච්ඡකා භික්ඛවෙ වමනංදෙන්ති පිත්තසෙම්හසමුට්ඨානානංපි ආබාධානං පටිඝාතාය. අහං චෙව බො භික්ඛවෙ අරියං වමනං දෙසිස්සාමි)**

(අංගුත්තර නිකාය - දසම නිපාත - සඥ්ඥාවග්ග)

ඉහත සඳහන් කෙළේ බුදුරදුන් මිනිසුන් ගේ සිත් තුළ පවත්නා කෙලෙස් උල් ගලවා දමන ශල්‍ය වෛද්‍යවරයකු බවත් ජාති ජරා මරණසෝක පරිදේව දුක් දෙම්නස් විරේචනයෙන් හා වමනයෙන් සුවපත් කරන වෛද්‍යවරයෙකු බවත්ය.

තවත් තැනක දී බුදුහු බමණකු අමතා,

"බමුණා. මම දහම් දෙසුව මැනව යි කරණ ඉල්ලීම් පිළිගැනිමට සුදුසු හැම කල්හි ධම් දනය සඳහා සේදූ අත් ඇති පශ්චිමශරීරය දරන්නා වූ උතුම් වෛද්‍යවරයක්මි. රාගාදි කෙලෙස් මුල් අදුරා දමන ශල්‍ය වෛද්‍යවරයෙක් මි. රාගාදි කෙලෙස්මුල් උදුරා දමන ශල්‍ය වෛද්‍යවරයෙක්මි"

(අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො සද පයතපාණී අන්තිම දෙහධරො භිසක්කො සල්ලත්තා.)

(ඉතිවුත්තක - චතුක්ක නිපාත)

"මහණෙනි කැමැති කැමැති පරිදි ධම්දනය කරන නිසා ඉල්ලීමට සුදුසු වූ හැම කල්හි ධම්දනය සඳහා දිගු කල අත් ඇති අන්තිම සිරුරක් දරණ සසර දුක් නැමැති රෝගයන්ට පිළියම් කරණ නිසා උසස් වෛද්‍යවරයෙක් වූ රාග දෙස මෝහ ආදිය මුලිනුපුටා දමන හෙයින් ශල්‍යකර්තෘ වෛද්‍යවරයෙක් වූ මම වනාහි බැහැර කළ පව් ඇති හෙයින් පරමාර්ථ වශයෙන් බ්‍රාහ්මණයෙක්මි.

මහණෙනි, තෙපි වනාහි ඒ මා ගේ මුඛයෙන් දේසිත ධම්යෙන් උපන් හෙයින් මුඛයෙන් උපන් ශාසන ධර්මයෙහි උපන් හෙයින් ධර්මජ වූ ධම්යෙන් ම නිර්මිත වූ ධර්මය දයාද කොට ඇති ආමිසය ද දයාද කොට නැති ඖරස පුත්‍රයෝ ය. **(අහමස්මි භික්ඛවෙ බ්‍රාහ්මණො යාචයොගො සද පයාතපාණී අන්තිම දෙහධරො අනුත්තරො භිසක්කො සල්ලකත්තා තස්ස මෙ තුම්හෙ පුත්තා ඔරසා මුඛතො ජාතා. ධම්මජා ධම්මනිම්මිත්තා ධම්මදයාද නො ආමිසදයාද)**.

(ඉතිවුත්තක පාලි - චතුක්ක නිපාත - බ්‍රාහ්මණ සූත්‍රය)

බමුණන් මහ බඹුගේ මුඛයෙන් උපන්නේ යැයි කියන්නාක් මෙන් භික්ෂූන් බුදුන් වහන්සේ ගේ ධර්ම නැමැති මුඛයෙන් උපන්බවත් තමන් වහන්සේ ක්ලේශ රෝග නිවරාණය කරණ බැවින් ශ්‍රේෂ්ඨතම වෛද්‍යවරයකු බවත් භික්ෂූන්ට ඇති උසස්ම දයාදය ආමිසදයාදය නොව ධම් දයාදය බවත් ඉහත සඳහන් පාලි පාඨයෙන් දැක්වේ. බුදුරදුන් මිනිස් සිත්හි ඇති අප්‍රමාණ රෝග අතර රෝග 44ක් **සල්ලෙඛසූත්‍රයෙහි** දක්වා තිබේ. ඒ චෛතසික රෝග හතළිස් හතර හා ඒවාට බෙහෙත් මෙසේය.



දිනක් බුදුන් වහන්සේ ස්වකීය අතේ මාපටඇඟිල්ලේ නියපිටට පස් ටිකක් ගෙන, භික්ෂූන් අමතා 'මහණෙනි, මගේ මේ අතේ නියපිට තිබෙන පස් ද වැඩි මේ මේ මහපොළොවේ තිබෙන පස් ද වැඩි' යයි ඇසූ හ. 'ස්වාමීනි නියපිට තිබෙන පස් ඉතා ම ස්වල්පයකි. මහපොළොවේ පස් ඉතා ම වැඩි ය. අප්‍රමාණ ය' යි භික්ෂූහු කී හ. 'එසේ ම මහණෙනි, සත්ත්වයන් අතර මිනිසුන් ව උපදින්නෝ මගේ මේ නියපිට තිබෙන පස් ටික තරම් ඉතා ම ස්වල්ප දෙනෙකි. මනුෂ්‍ය ආත්මභාවය නො ලැබ අනික් සතුන් ව උපදින්නෝ මහ පොළොවේ පස් තරම් ඉතා ම වැඩි ය' යි වදාළහ.

97 පිටුව බලන්න

රෝගය	බෙහෙත
අනුන්ට හිංසා කිරීම	අනුන්ට හිංසා නොකිරීම හෙවත් අවිහිංසාව
සතුන් මැරීම	සතුන් නොමැරීම
අනුන් සතු දේ ගැනීම	අනුන්සතු දේ නො ගැනීම
කාමයෙහි වරදවා හැසිරීම	කාමයෙහි වරදවා නොහැසිරීම
බොරු කීම	ඇත්ත කීම
කේලාම් කීම	කේලාම් නොකීම
පරුෂ වචන කීම	පරුෂ වචන නොකීම
නිෂ්ප්‍රයෝජන වචන කීම	නිෂ්ප්‍රයෝජන වචන නොකීම
අනුන්ගේ දේ ගැන ඇති ආශාව	අනුන්ගේ දේ ගැන ආශා නොකිරීම
දූෂිත නරක සිත් ඇති බව	දූෂිත නරක සිත් නැති බව
වැරැදි සහිත දර්ශනය	නිවැරැදි දර්ශනය
වැරැදි අකුසල සංකල්ප	නිවැරැදි කුසල් සිතුම් පැතුම්
වැරැදි වචන කතා කිරීම	යහපත් වචන කතා කිරීම.
වැරැදි කර්මාන්ත කිරීම	නිවැරැදි කර්මාන්ත කිරීම
වැරැදි ජීවිකාව	නිවැරැදි ජීවිකාව
වැරැදි ව්‍යායාමය	නිවැරැදි ව්‍යායාමය
වැරැදි සිහිය	නිවැරැදි සිහිය
වැරැදි සමාධිය	නිවරැදි සමාධිය
නරක ක්‍රියාකොට කෙළෙ හොඳ ක්‍රියා යයි සිතීම	යහපත් නුවණඇති බව
වැරැදි විමුක්තිය	නිවැරැදි විමුක්තිය
ථිනමිද්ධයෙන් මඩනා ලද බව.	පහ වූ ථිනමිද්ධ ඇති බව
උඩගු බව	නිහතමානි බව
සැක ඇති බව	නිසැක බව
කිපෙන සුලු බව	නො කිපෙන සුලු බව
බද්ධවෛර ඇති බව	බද්ධ වෛර නැති බව
ගුණමකු බව	ගුණමකු නොවූබව
යුගග්‍රාහ ඇති බව	යුග්‍රාහ නැති බව
ඊර්ෂ්‍යාවන්තකම	ඊර්ෂ්‍යාව නැති බව
මසුරු බව	මසුරුකමක් නැති බව
කෛරාටික බව	කෛරාටික කමක් නැති බව
මායා ඇතිබව	මායා නැති බව
තද බව	තදකම නැති බව
මානාධික බව	මාන්නය නැති බව
අකීකරු බව	කීකරු බව
පාපමිත්‍රයන් ඇති බව	කල්‍යාණ මිත්‍රයන් ඇති බව
ප්‍රමාද බව	අප්‍රමාද බව
සැදැහැ නැති බව	සැදැහැ ඇති බව
ලජ්ජා නැති බව	ලජ්ජා ඇති බව
පවට බිය නැති බව	පවට බිය ඇති බව
ඇසූ පිරූ තැන් නැති බව	ඇසූ පිරූ තැන් ඇති බව
කුසීත බව	ආරබධවීර්‍ය්‍ය ඇති බව
සිහි මුළා බව	සිහි නුවණ ඇති බව
මෝඩ බව	නුවන ඇති බව
තම අදහස ම දැඩි කොට ගත් බව	තම අදහස ම දැඩි කොට නො ගත් බව

ඉහත සඳහන් රෝග හෙවත් ක්ලේශ හතළිස් හතර සිත ප්‍රධාන කොට සිතෙහි ඇති වන ඒවා යි. හිතට වාල් වීම නිසා මනාව පිහිටුවා නො ගැනීම නිසා මිනිස් සිතේ ඇති වන දුර්වලකම් ය. සිත පිළිබඳ හැම රෝගයකට ම හොඳ බෙහෙත බුදුදහම යි. ඒ බෙහෙත සොයා ගත් වෙදමහතා බුදුහාමුදුරුවෝ යි.

"මහරජ, බුදුන් වහන්සේ විසින් සොයා ගන්නා ලද ඖෂධයෝ රාශියක් වෙති. බුදුහු ඒ බෙහෙත් වලින් දෙව්මිනිසුන්ට පිළියම් කරති. ඒ බෙහෙත් නම් **සතර සති පට්ඨානයෝය. සතර සම්‍යක් ප්‍රධානයෝ ය. සතර ඍද්ධිපාදයෝය. පඤ්ච ඉන්ද්‍රියයෝය. පඤ්ඤ බලය සප්ත බොධ්‍යංගය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයය.** යන මොහු ය.

මේ ඖෂධ වලින් භගවත් තෙමේ මිථ්‍යාදෘෂ්ටිය මිථ්‍යාසංකල්පය ආදිය විරේචනය කර හරියි. සියලු කෙලෙස් වමනය කොට හරියි. **(ඔසධානි මහාරාජ බගවතා අක්ඛාතනි යෙහි ඔසදේහ සො බගවා දෙවමනුස්සෙ තිකිච්ඡති: සෙයතථීදං - චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, දත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාද, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣංගා, ආරියො අග්ඨංගිකො මග්ගො, එතෙහි ඔසධෙහි භගවා මිච්ඡාදිට්ඨිං විරෙචති මිච්ඡා සංකප්පං විරෙචති සබ්බකිලෙසවමනං කරොති.**

(මිලින්ද පඤ්ඤ අනුමාන වග්ග)

කිසා ගෝතමිය තම එක ම පුතා මැරුණු විට රටේම සිටින වෙදුන් ගෙන්වා පන උපද්දවා ගන්ට නොහැකි වූ තැන අන්තිමට ගියේ වෙදමහතානන් වූ බුදුරදුන් ලඟටය. මළ පුතාට පණ උපද්දවා දෙන්ට ගෙනෙන්ට කියූ අබම්ට ඇයට සොයා ගන්නට බැරි විය. ඇයට බුදුරදුන් ගෙන එන්නට දැරූ මව රෝගියෙකි. ඇය රෝගියෙකු නිස යි එසේ බලාපොරොත්තු වූයේ. ඒ බැවින් ම බුදුහු මළමිනියට නො ව පිවත්ව සිට ඇයට ඇගේ මානසික රෝගයට බෙහෙත් කොටා නැවත එවැනි රෝගයක් නොවැලදෙන නිරෝගියකු බවට පත් කළහ.බොහෝ ශාරීරික රෝගවලට පවා මනස හේතු වී ඇතිබව වර්තමාන වෛද්‍යවරයෝ කියති. බුදුහාමුදුරුවෝ හැම කරුණකට ම ප්‍රධාන හිත බව මීට අවුරුදු දෙදහස් පන්සියයකට පෙර දී සොයා ගත්හ. සිත හා සිතිවිලි පිලිබඳව උන් වහන්සේ විග්‍රහ කොට ඇති දීර්ඝ විස්තරය ගැන සලකා බලන විට බුදුරදුන් මානසික වෛද්‍යවරයකු පමණක් නොව මනෝවිද්‍යාඥයකු බව මොනවට ඔප්පු වේ.

බුද්ධත්වය යනු මනස දියුණු කර ගැනීම පිළිබඳව මිනිසකුට ලැබිය හැකි අන්තිම උසස්ම තැන යි. නිර්වාණය යනු එසේ මනස දියුණු කරගත් තැනැත්තා ලබන අති උත්තම ලෝකෝත්තර තත්ත්වයයි.

මෙතෙක් ලොව උපන් මානසික වෛද්‍යවරුන් අතර හෙවත් සිත පිළිබඳ රෝගවලට වෙදකම් කරන වෙදමහතුන් අතර ලෙඩුන් ඉතා ම වැඩි සංඛ්‍යාවක් බෙහෙත් ගත් වෛද්‍යවරයා බුදුන් වහන්සේ යි. මානසික ලෙඩුන් ඉතාම වැඩි සංඛ්‍යාවකට ප්‍රතිකාර කොට සුව කළ වෛද්‍යවරයා බුදුන් වහන්සේ යි.

බුදුන් වහන්සේ භික්ෂූන් ගේ කායික රෝගවලට ද නියම කල බෙහත ගැන මහාවග්ග පාලියෙහි **භෙසජ්ජ ඛන්ධකයෙහි** සඳහන් වෙයි.

"වනයෙහි වසන භික්ෂූන්ට විෂකුරු සර්පයන් ගෙන් නොයෙක් විට අනතුරු පැමුනුනේය. සර්ප විසට මල මුත්‍ර, උණු අලු හා මැටි යන මහාවිකට හතර අනුදැන වදාළහ. පාණ්ඩුවට ගවමුත්‍ර දැමූ අරළු ද, උදර වාතාබාධයට ලුණු කාඩි ද, ග්‍රහණියට බත්කාරම් ද, වසක් පෙවුනු විට අසුචි දිය කර පෙවීම ද, වණයක් හැදුනු විට අබ කුඩු එලීම ද, ඇග දහඩිය ගැන්වීම සඳහා ස්වෙදකර්මය ද, ඇස් ලෙඩට අඳුන් ගෑම ද, ඇග කැසීමට ගොම මැටි හා තම්බා ගත් කහටකුඩු ද, නොයෙක්

(අපාදකෙහි මෙ මෙත්තං - මෙත්තං ද්විපාදකෙහි මෙ - චතුප්පදෙහි මෙ මෙත්තං -මෙත්තං බහුප්පදෙහි මෙ) "මා ගේ මෛත්‍රිය පා නැති නයි පිඹුරු පොළොං ආදි දීර්ඝ ජාතීන් හා ය. මා ගේ මෛත්‍රිය දෙපා ඇත්තන් හා ය. මා ගේ මෛත්‍රිය සිවුපා ඇත්තන් හා ය. මා ගේ මෛත්‍රිය පැත්තෑ, කංකුඩු ආදි බොහෝ පා ඇත්තන් හා ය."

28 පිටුව බලන්න

බෙහෙත් සඳහා වලගසාල්, තිප්පිලි, ගම්මිරිස්, අරළු, බුලු, නෙල්ලි, කුකුරුමුවන් වැනි පලා වර්ග ද, මුදු ලුණු, කළු ලුණු, සිඳි ලුණු, බළල් ලුණු ආදී ලුණු වර්ග ද: කොසඹ කොළ, කෙළිඳ කොළ, දුම්මැල්ල කොළ, කපු කොළ වැනි කොළ වර්ග ද: කහ, ඉගුරු, වද කහ, හෙළ වද කහ, අතිවිඩයං, කටුකරෝසන, සැවැන්දරා, කලාදුරු වැනි මුල් වර්ග ද: වලස් තෙල්, මත්ස්‍ය තෙල්, කිඹුල් තෙල්, ඌරු තෙල් වැනි තෙල් වර්ග ගනී.

හන්දි රුදව සඳහා ලේ ඇරීම ද, කකුල් පැලීම නවත්වනු පිණිස පය තෙල් ගැල්වීම ද තුවාල සඳහා කහට වතුර ද, ඉනා බෙහෙතක් කැවුන විට නගුලෙහි හී වැලෙහි ඇළුනු මඩ ජලයෙන් දියකර පෙවීම ද, මස් දලුව ලුණු කැටයකින් කැපීම ද, වණයට දුම් ඇල්ලීම ද, ,නස්‍ය කිරීම ද, වැනි ප්‍රතිකාර හා ඖෂධ රාශියක් භික්ෂූන් රෝග සඳහා බුදුහු අනුදැන වදාළහ.

උන් වහන්සේ සිය දහස් ගණන් ශ්‍රාවක පිරිස සමග ගම් නියම් ගම් දනව් හා මහා වනාන්තරවල සැරිසරන විට බෙහෙත් ද්‍රව්‍ය රැගෙන හෝ වෛද්‍යවරයා සමග හෝ නොවැඩියහ. භික්ෂුනමකට අසනිපයක් වු විට අවස්ථාවේ හැටියට පිලියම් කළහ. එබැවින් බුදුන් වහන්සේ මානසික වෛද්‍යවරයකු පමණක් නොව කායික වෛද්‍යවරයකු හැටියට ද සැළකිය හැකිය.

මිනිසා මැඩිය නොහේ

මිනිසා සොබා දහමේ අඳුරු බලවේග වලට වඩා ශ්‍රේෂ්ඨයි. මක් නිසාද
යත් මිනිසා ඒ බලවේග විසින් මඩිනු ලැබුවත්
ඔහු ඒ බලවේග තේරුම් ගැනීම හේතු කොට ගෙන
ඒවාට වඩා ඉහලින් නැගී සිටින හෙයිනි. එපමණක් නොවේ.
බුදු සමය විසින් සත්‍ය ඊටත් වඩා ඈතට ගෙන යනු ලැබේ.
සත්‍යාවබෝධය මගින් මිනිසාට සිය ඉරණම පාලනය කොට ගත හැකි
බැව් බුදු සමය විසින් දක්වනු ලබන හෙයිනි.
මිනිසාට ඒ බලවේග විසින් තමන් මැඩලීම නවත්වාලිය හැකියි.
ඒවා සතු ඥානයත් තමාගේ උත්තරීතර බව
ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

පැස්කෝල්

බුදුහාමුදුරුවෝ අනුපම රූපසම්පත්තියෙන් යුත් උතුමාණෝයි

දුටු, හමු වුනු, කතා බස් කළ, හැම කෙනෙකුන්ම වශී වුනු, පුදුම වුනු, පැහැදුනු මිනිස් රූපයක් මේ ලෝකයේ යමකුට තිබුනේ නම් ඒ බුදුන් වහන්සේට යි. ලෝකයේ කලින් කල ජීවත්ව සිට මිය ගිය ප්‍රසිද්ධ පුරුෂයන් ගේ නායකයන් ගේ ප්‍රතිමා අතර බුද්ධ ප්‍රතිමාව තරම් ජනප්‍රිය ප්‍රතිමාවක් රූපයක් වෙන නැති වීමෙන් බුදුන් වහන්සේගේ අනුපම රූප සම්පත්තිය ගැන සිතා ගත හැකි යි. වොටුනු සහිත සිවුසැට අබරණින් සැරසුණු මහාධිරාජයකු ගේ ශ්‍රී විභූතියෙන් ඔප් නැගුනු රූප ශ්‍රීයත්, සියලු ස්ත්‍රී ආභරණයෙන් අලංකාර වුනු මහා රූපිනක ගේ රූපශ්‍රීයත් දැක මවිත නු වූ, පුදුම නු වූ, වසී නු වූ ලක්‍ෂ සංඛ්‍යාත ජනකායක් ශාන්ත, සුන්දර, සංයම තාපස රූපය - පැවිදි රූපය බුද්ධ රූපය දැක පැහැදී ඇත. අදත් පැහැදෙති. උතුරු ඉන්දියාවේ සාමාන්‍ය පවුලක උපන් ස්වාමි විවේකානන්දගේ රූපය සියැසින් දුටුවකුට උතුරු ඉන්දියාවේ ශාක්‍ය රාජවංශයක උපන් සිද්ධාර්ථ කුමාරයන් ගේ රූපය කෙසේ තිබෙන්නට ඇද්දැයි සිතා ගත හැකි ය.

තමන් තරුණ කාලයේ සැප වින්ද හැටි පිළිබඳ කෙටි විස්තරයක් බුදු වීමෙන් බොහෝ කලකට පසු දිනක බුදුන් වහන්සේ භික්ෂුන්ට විස්තර කෙළේ මෙසේ යි. "මහණෙනි, මම තරුණ කාලයෙහි අතිශයින්ම සියුමැලි ය. අන්තිමට ම සියමැලිය. මහණෙනි, මගේ පියා ගේ නිවසෙහි මා වෙනුවෙන් ම ඉතා රමනිය පොකුණු තනවා තිබුණේ ය. ඉන් එකක් නිලුපුල් මලින් පිරී තිබුණේය. එකක් හෙළ පියුමෙන් පිරී තිබුණේය. එකක් රත් පියුමෙන් පිරී තිබුණේය. ඒවා තනි කර මා පිණවීම පිණිස ය.

මහණෙනි, මම වනාහි ඉතාම සියුම් නුවූ සළුවක් නො දැරුවෙමි. මහණෙනි, කසී සළුවෙන් කළ මගේ හිස් වෙළුම ඉතා ම සියුම් ය. සැට්ටය ඉතා ම සියුම්ය. මගේ ඇඳුම් ඉතා ම සියුම්ය. මගේ උතුරු සළුවද ඉතා ම සියුම්ය. රෑ දවල් සීත, උෂ්ණ, පිණි, දූවිලි නො වැදෙනු සඳහා මා මත සේසතක් දරුණු ලැබිය. මහණෙනි, ඒ මට තුන් පහයෙක් විය. එකක් හේමන්තයට සුදුසු පරිදිය. එකක් ගිම්හානයට සුදුසු පරිදි ය. එකක් වර්ෂා සෘතුවට ගැළපෙන පරිදිය. ඒ මම වැසි සාරමාසයෙහි එකලට යෝග්‍ය ප්‍රාසාදයෙහි පිරිමින් නැති තනි කර ස්ත්‍රීන් ගෙන් යුත් පඤ්චාංගතූර්‍ය වාදනයෙන් පිණවනු ලැබුවෙමි. උඩුමහලේ සිට පාතමාලට නො බැස්සෙමි. මහණෙනි, වෙන අය ගේ ගෙවල්වල මෙහෙකාරයන්ට කාඩි හොදි හා නිවුඩුහාලේ බත් දෙති. එහෙත් මගේ පියා ගේ නිවසෙහි මස් සහිත ඇල් හාලේ බත් දුන්නේ ය. සොළොස් හැවිරිදි කල මම මෙ බඳු සෘද්ධියකින් යුක්තව විසීමි. "(**සුකුමලො අහං භික්ඛවෙ පරම සුකුමාලො, අච්චන්ත සුකුමාලො මම සුදං භික්ඛවෙ පිතුනිවෙසනෙ පොක්ඛරණියොකාරිතා හොන්තිං එකත්ථං සුදං උප්පලං පුප්පති, එකත්ථ පදුමං එකත්ථ පුණ්ඩරිකං, යාවදෙව මමත්ථාය න බො පනස්සාහං භික්ඛවෙ අකාසිකං චන්දනං ධාරෙමි කාසිකංසු මෙත භික්ඛවෙ වෙඨනං හොති, කාසිකා කඤ්චුකා, කාසිකං නිවෙසනං, කාසිකො උත්තරාසංගො, රත්තිං දිවං බො එනස්සු මෙතං භික්ඛවෙ.සෙතච්ජත්තං ධාරියති,මා නපුසීසීතංවා උණ්හං, වාරජො වාණංවා උස්සාවො වා ති. තස්ස මය්හං භික්ඛවෙ තයො පාසාදා අහෙසු එකො හෙමන්තිකො, එකො ගිම්හිකො, එකො වස්සිකො සො බො අහං භික්ඛවෙ වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො, මාසෙ නිප්පුරිසෙහි තුරියෙහි පරිචාරියමානො න හෙට්ඨා පාසාදං ඔරොහාමි. යථා බො පන භික්ඛවෙ අඤ්ඤෙසං නිවෙසනෙසු දාසකම්මකර පොරිසස්ස**



ශාරිපුත්‍රය, ශුද්ධිය සෙව්මේ තවුසකු වූ මම තදින් හිම වැටෙන සමයෙහි සීතලෙන් වෙව්ල වෙව්ලා මහ රෑ මහ වනයෙහි ගත කෙළෙමි. තද ග්‍රීෂ්මසමයෙහි එළිමහනෙහි විසීමි. විතරාගියකු හැර වෙන ඕනෑ ම කෙනෙකු බියෙන් වෙව්ලන සුලු මහවනයෙහි හුදෙකලා ම වාසය කළෙමි.

32 පිටුව බලන්න

කණ්ණජකං භොජන දියති, බිලිංග දුතියං එව මෙවස්සු මෙ භික්ඛවෙ පිතු නිවෙසනෙ දාස කම්මකාරපොරිසස්ස සාලිමංසොදනො දියති).

(අංගුත්තර නිකාය - තික නිපාත)

ඉහත සඳහන් විස්තරයෙන් සිදුහත් කුමරා මිනිසකුට වින්දහැකි ඉහළ අන්තිම මට්ටමේ සැප වින්ද තරුණයකු බව බුදුවීමෙන් පසු සිය මුවෙන් ම පැවසී ඇත. එබඳු සැපවින්ද අතිශය වාසනාවන්ත තරුණයකුගේ රූපශ්‍රිය ගැණ කියන්නට දෙයක් නැත.

දිනක් සිදුහත් කුමරා උයනට ගොස් ආපසු මාළිගයට එද්දී නගරයේ ප්‍රාසාදයක උඩුමහලේ සිට පිටත බලා සිටි කිසාගෝතමී නැමැති රාජ කුමරිය "යම් කිසි මවකට, පියකුට මේ විදියේ පුතකු ලැබුණොත් ඒ දෙපොළ තරම් වාසනාවන්ත නිවී සැනසුනු මවුපිය දෙපළක් මේ ලෝකයේ තවත් නැත. යම්කිසි තරුණියකට මේ විදියේ ස්වාමිපුරුෂයකු ලැබුණොත් ඒ කාන්තාව තරම් වාසනාවන්තියක් මේ ලෝකයේ තවත් නැත"යි යනුවෙන් පැවසූ නිබ්බුතපද සිදුහත් කුමරා ගේ අනුපම රූපශ්‍රීයට දෙස් දෙයි.

සිදුහත් කුමරා තවුසකු වශයෙන් ද දුටුවන් වසීකරණ සුලු තවුස් වෙසකින් යුක්ත ව සිටි බව එතුමා රජගහනුවර වීදියේ පිඩු සිගනු දුටු මුළු නුවර වැස්සෝ බෝසතුන් ගේ රූපය දැකීමෙන් ධනපාල ඇත්රජු පිවිසි රජගහනුවර මෙන් ද, අසුරේන්ද්‍රයා පිවිසි දෙව්ලොව මෙන් ද කැළඹී ගිය හ. රාජපුරුෂයෝ රජු හමුවී දේවයිනි, දෙවියෙක් ද මනුෂ්‍යයෙක් ද නාගයෙක් ද සුපර්ණයෙක් දැ"යි කිය නොහැකි අමුතුම විදියේ සත්ත්වයෙක් නගරයේ පිඩුසිගා යතැයි කී හ. රජු උඩු මහල් තලයෙහි සිට ඔහු දැක ආශ්චර්‍ය්‍ය අද්භූත පුරුෂයෙකැයි කියා ඔහු කැඳවා ගෙන එන්ට නියම කෙළේය.

(ජාතකට්ඨකථා - නිදාන කථා)

බුදුවීමෙන් පසු ගයාවේ සිට බරණැසට වඩිද්දී අතරමග උපක නම් ආජීවකයකු බුදුරදුන් දැක "පින්වත ඔබේ ඉඳුරන් ඉතා ප්‍රසන්නය. ඔබේ හමේ වර්ණය ඉතා පිරිසිදු ය. ඉතා සුදුපාට ය. ඔබ කවුරුන් උදෙසා මහණ වූයෙහි ද? (**විප්පසන්නානි ඛො අවුසො ඉන්ද්‍රියානි පරිසුද්ධො ජව්වණ්ණො පරියොදාතො. කංසි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො)** (මහා වග්ග - මහා ඛන්ධක)

මේ ආ ජීවකයාටද බුදුන් වහන්සේ ගේ රූප සම්පත්තිය විශේෂයෙන්ම පෙනී ඇත.

එක් කලෙක බුදුරදුන් වෛශාලි නුවර මහවනයෙහි කූටාගාර ශාලාවේ වැඩ වසද්දී පන්සියයක් පමණ ලිච්ඡවීහු උන් වහන්සේට ඇප උපස්ථාන කළ හ. ඔවුන් ගෙන් සමහරු නිල්පාට ය. නිල්පාට වස්ත්‍ර හැඳගෙන, නිල්පාට ආභරණ පැළඳගෙන සිටියහ. සමහරු කහපාට ය. ඔවුහු කහපාට වස්ත්‍ර හැඳගෙන කහපාට ආභරණ පැළඳ ගෙන සිටියහ. සමහරු රතුපාට ය. ඔව්හු රතුපාට වස්ත්‍ර හැඳගෙන රතුපාට ආභරණ පැළඳගෙන සිටි ය හ. සමහරු සුදු පාට ය. ඔව්හු සුදුපාට වස්ත්‍ර හැඳගෙන සුදුපාට ආභරණ පැළඳගෙන සිටිය හ. භාග්‍යවතුන් වහන්සේ වර්ණයෙන් ද යසසින් ද ඒ හැමදෙනාම ඉක්මවා බබලමින් සිටිසේක. (**එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛොපන සමයෙන පඤ්චමාත්තානි ලිච්ඡවිසතානි භගවන්තං පයිරුපාසන්ති. අප්පෙකච්චේ ලිච්ඡවී නීලා හොන්ති, නීලවණ්ණා නීලවත්ථා, නීලාලංකාර අප්පෙකච්චෙ ලිච්ඡවීපීතා හොන්ති, පීතවණ්ණා, පීතවත්ථා. පීතාලංකාරා, අප්පෙකච්චෙ ලිච්ඡවී, ලොහිතකා හොන්ති, ලොහිතවණ්ණා ලොහිතවත්ථා, ලොහිතාලංකාරා, අප්පෙකච්චේ ලිච්ඡවී ඔදාතා හොන්ති ඔදාවණ්ණා ඔදතවත්ථා ඔදතාලංකාරා, ත්‍යාස්සුදං භගවා අතිරොචති වණ්ණෙන චෙව යසසාච.** *(අංගුත්තර නිකාය පඤ්චක චතුත්ථ)*

(පණ්ණාසක - සොණවග්ග)

මෙයින් ද පෙනියන්නේ දඹදිව එකල විසූ ඉතාම රූපසම්පන්න මනුෂ්‍ය ගෝත්‍රය වූ ලිච්ඡවී රාජවංශිකයන්ටත් වඩා බුදුරදුන් වර්ණයෙන් පියකරු බවයි.වක්කලි නමැති මාණවකයෙක් දිනක් බුදුරදුන් දැක ඒ අනුපම රූපශ්‍රීයෙන් වසී

වී ඒ දෙස ම බලා සිට, මේ අරුම පුදුම රූපය මුළු ජීවිතයේ දීම දැක දැක ඉන්නට කළ යුතු එකම දෙය උන් වහන්සේ ළග මහණ වීම යයි සිතා බුදුරදුන් හමුවීමට ගොස් උන්වහන්සේ ළග පැවිද්ද ලබා ගත්තේ ය.

පැවිදි වූයේ සසර කලකිරී හෝ නිවන් දැකීමට හෝ නොව තනිකරම බුදුරදුන් ගේ රූපය දැක දැකම සිටීමට බැවින් බුදුරදුන් යම් තැනක ද එතැනට ගොස් ජේන තෙක් මානයේ කොතැනක හෝ වාඩි වී සිට බුදුරදුන් දෙස බලා සිටීම දිනචරියාවක් ලෙස කර ගෙන ආවේ ය. භාවනා නොකොට බුදුරදුන් දෙස ම බලා සිටින වක්කලී භික්ෂුහුගේ මේ ක්‍රියාව දැනගත් බුදුහු "**අපේහි වක්කලී අපේහි වක්කලී කිං තුය්හිමිනා පූතිකායෙන**" වක්කලිය වහා ම යන්න. වහා ම යන්න. මේ කුනු සිරුර දෙස බලා සිටීමෙන් තොපට ඇති ඵලය කුමක් ද? යි කියා වක්කලී භික්ෂුව එළවා ගත්තේය. ඉන් පසු බුදු සිරුර දෙස බලා සිටීම අත් හළ ඔහු බණ භාවනා කොට රහත් විය.

මාගන්දි නමැති බමුණකු බුදුරදුන් දැක තම රූමත් දියනිය බුදුරදුන්ට පාවා දෙන්නට සැරසුනු සැටි සද්ධර්මරත්නා- වලියෙහි සඳහන් ව ඇත්තේ මෙසේ ය.

"ඕ තොමෝ කුරුරට මාගන්දි නම් බමුණකගේ දුව ය. ඇගේ මව් ද මාගන්දි නම්. සුළු පියා ද මාගන්දි නම් විය. ඒ මාගන්දි නම් බැමිණි තොමෝ අධික වූ රූ ඇත්තී ය. දිව්‍යාංගනාවක සේ ශෝභමාන ය. ඇගේ පියතෙම තමා ගේ ඒ දුවට සුදුසු ස්වාමි පුත්‍රයකු නොලබන්නේ බොහෝ ධන ඇති මහත් වූ පරිවාර ඇති ඉසුරුමත් කුලවලින් තම දුව විචාරා ආකල්හි තෙපි මගේ දියණියන්ට නුසුදුස්සව" යි නින්ද බැණ නික්මවන්නේ ය.

ඉක්බිති එක්දවසක් බුදුහු අළුයම් වේලෙහි මහාකරුණා- සමාපත්තින් නැගී ලොව බලන සේක් මාගන්දි බමුණා අඹුව හා අනාගමි ඵලයට පැමිණෙන උපනිඃශ්‍රය සම්පත් ඇති බව දැක තමන් වහන්සේ ගේ පාසිවුරු තමන් වහන්සේ ම ඇරගෙන මාගන්දි බ්‍රාහ්මණයා ගේ ගමින් පිටත ගිනි දෙව්යා පුදනට තැනට වැඩි සේක. බමුණුතෙම බුදුන් ගේ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා අසූ අනුලකුණෙන් හොබනා රූපයෙන් අග පැමිණි ආත්මභාවය දැක මෙලොව මේ පුරුෂ රත්නය හා සමාන අනික් පුරුෂයෙක් නැත. මෙතෙම මා ගේ දුවට ම සුදුස් ය. මා දුව මෝහටම පාවා දෙමි, සිතා බුදුන් කරා එළඹ "හෙම්බල මහණ, මගේ දුවක් ඇත, ඈ මම මෙතෙක් දවස් සුදුසු පුරුෂයකු නො දැක ගෙහි ම රක්ෂාකොට තබාගෙන හුන්නෙමි. දැන් තොප ගේ රුව දුටු නියාමට ඕ තොපට සුදුසුය. තෙපි ද ඈට සුදුස්සව. දැන් ඒ මාගේ දුව තොපට පාදපරිචාරිකා කොට පාවා දෙමි. ඈ කැඳවාගෙන මා එන තෙක් මේතැන් හිම සිටුව යි කී ය.

බුදුහු යහපත - නපුර යන දෙක ම නො වදළ සේක. බමුණු තෙම ගෙට දිවගෙණ ගොසින් තමා ගේ අඹු බැමිණිය බණවා "හෙම්බල පින්වත, තී කුමක් කෙරෙයි ද? දැන් මම තී ගේ දුවට සුදුසු වූ සමාන කෙනෙකුන් දැක මග සිටුවාලා ආමි. තිගේ දුව සරහාගෙණ වෙලෙව් ව එව" යි කියා දුව සරහවා අඹුව හා සමග දුව කැඳවා ගෙණ නික්මින.

මෙසේ බමුණා නික්මෙන්නා දැක මුළු නුවර වාසිහු අසුරයන් වන් දෙව්පුරයක් සේ එක පැහැර ක්ෂොභ ව "මේ කුමන ආශ්වර්‍යයක් ද? පෙර මේ බමුණා අගු - මගධ කශී - කෝසල වජ්ජි මල්ලාදී වූ ඒ දේශයෙහි බොහෝ උත්තම පුරුෂයන් තමා ගේ දුව සරණ විචාරා ආකල උන් උන් ගේ යශොපරිවාර භොග සම්පත් ආදී වූ විද්‍යාමාන ආශ්වර්‍ය දැක දැකත් මා දුව ගේ රූප ශ්‍රී වූ නියාවට තෙපි නුසුදුස්සව යි සරණ නො දෙයි. අද මෙ තෙම මගේ දුවට සුදුසු වූ සමණ කෙනෙකුන් දිටිමි යි ඉක්මන් ඉක්මන් කොට කැඳවා ගෙණ යෙයි. ඒ කෙබඳු පුරුෂ රත්නයෙක් දෝ හෝ ඔවුන් බැලුව මැනැව යි" ආශ්වර්‍යවත් ව මහජනයෝ බමුණා පස්සෙහි වන්හ. මෙසේ ඔහු දුව කැඳවා ගෙණ එන කල්හි බුදුහු බමුණා සිටුවාලා ගිය තැන නො සිට



මිනිස්සු නොයෙක් හේතූන් නිසා බිය වෙති. ජීවිතයට ඇති ආසාව නිසා මරණයට ඇති අකැමැත්ත නිසා අඹු දරුවන්ට, ගේ දෙර, ඉඩකඩම්, ධන ධාන්‍ය ආදියට ඇති තෘෂ්ණාව නිසා බිය වෙති. බිය වීමට හේතු වූ ඒ කිසිවක් බුදුන් වහන්සේට නැත. සැබවින් ම උන් වහන්සේ තුළ පැවැත්තේ පුදුම නිර්භීත කමකි. 40 පිටු බලන්න

එතැන් හි ශ්‍රී පාදය ඔබා පෙණෙන පරිද්දෙන් අධිෂ්ඨාන කොට මදක් ඉවත් ව වැඩ සිටි සේක.

බුදුන් ගේ පියවර එබු තැන්හි පෙණෙව යි යන අධිෂ්ඨානයක් ඇති ව විනා නො පෙණෙන්නේ යි. මෙ තෙක් දෙනාට පෙණව යි අධිෂ්ඨාන කළ කල ඔවුන්ට මුත් සෙස්සවුන්ට නො පෙණෙයි මෙ තෙක් කල් තිබෙව යි අධිෂ්ඨාන කළ කල සතර මහ දිවයින වැසි වැස එක හෙළා වැතුරු හෙළා නමුදු කෙතෙක් ඇත් අස් ගව මහිෂාදීහු මැඩගෙන යෙත් නමුත් කෙසගක් පමණ තෙනට උවදුරෙක් නො වෙයි. ඒ පියවර මකන පිණිස ඉදින් සෘද්ධිමත් කෙනෙක් වේරම්භ වාතය වැනි මග සුළගක් මවා පැවාහු වී නමුදු බුදුහු පියවර එබු තැනින් ලේඩිත්තක සා රජස් සුගකුත් සොල්වා පිය නො හෙති. කිසි කෙනෙකුදු පියවර මකා ලිය නො හෙති.

ඉක්බිති බැමිණි, බමුණා මුහුණ බලා "ඒ තොප දුටු තැනැත්තෝ කොහි දැ" යි විචාළී ය. එබසට බමුණු, උන් මෙ තැන්හි සිටුවා ලා ගියෙමි. කොයි ගියේ දෝ හෝ යි බලනුයේ වැඩ සිටි තෙන තුබූ ශ්‍රීපාදය දැක මේ සිටි උන් පියවර යයි බුදුන් ගේ ශ්‍රීපාදය දැක්විය. බැමිණි, පියවර බලා පියා තමා වේදත්‍රයෙහි කෙළ පැමිණි බැවින් හා ලක්‍ෂණ මන්ත්‍ර දන්නා හෙයින් හා පියවර ලකුණු බලා බමුණ, තෝ කුමක් කියයිද? ගෑනුන් ගෙ තන නැමැති මස් ගඩුවෙහි තමන්ගේ ලය පහරවා අපවිත්‍ර කරණ කෙනෙකුන් එබු පියවරක් නොවෙයි. දෙතිස් ලකුණු කොටසකින් යුක්ත වූ ගැහැනියක ගේ බොල් කෙළ නමැති අසුචි පිරුණ මුඛ නැමැති වැසිකිළියට තමන්ගේ මුහුණ යොමු කරන කාමාතුර කෙනෙකුන් ගේ පියවරෙක් නො වෙයි. හුදෙක් රාගයට දුරු වූ ද්වේෂයට විෂය වූ මෝහයට ආදෘශාඤ්ජනයක් හා සමානවූ සකල ක්ලේශයන් ප්‍රහීණ කොට සියල්ල දත්තා වූ උතුමාණෙකුන් ගේ පියවරෙක්ම යයි කීවා ය.

ඉක්බිති බමුණා කියනුයේ "හෙම්බල බැමිණිය, තෝ තලියේ පැනෙහි කිඹුලුන් දක්නා එකක වැන්නෙහි ය. ගෙමැද සැගවී වසන සොරුන් දක්නා එකක් ද? තෙල මැත නො දොඩා බැණ නො නැඟී හිඳුව" යි කී ය.

එබසට බැමිණි තොමො හෙම්බල බමුණ, තා බමුණු කුලයෙහි ඉපදත් මෙ පමණ ශාස්ත්‍ර මාත්‍රයක් පවා නො දන්නා කල තා කැමැත්තෙක් ම කී ය. තෝ කුමක් කියයි නමුත් මේ පඤ්චකාම ගුණයන් සේවනය කරණ කෙනෙකු ගේ පියවරක් නොවේ ම යයි කිව. එතෙපුල් අසා බමුණු ඇත මැත බලනුයේ අමාපිඩක් සේ වැඩ සිටි බුදුන් කරා එළඹ "හෙම්බල මහණ, මා දුව තොපට සරණ පාවා දෙනු දැක "අර මා කී තෙනැත්තෝ මු වෙත් දැ" යි කියමින් බුදුන් නිසා ගෙණාමි. පාවා ගන්ව" යි කී ය. එතෙපුල් අසා බුදුහු "තොපගේ දියනියන් ගෙන් අපට ප්‍රයෝජන ඇත නැත" යන දෙක ම නො වදරා "බමුණ තට එක් කාරණයක් කියමි, වදරා කිය මහණ" යි කී කල්හි මහාභිනික්මණෙහි පටන් වදරණ සේක්.

එම්බල, බමුණ සසරෙහි කළ හයින් දිව්‍යපුරයක් හා සමාන කිඹුල්වත් පුරය වැනි රාජධානියක් හා යසෝදරාවන් වැනි අගබිසෝ කෙනෙකුන් හා රහල්කුමරුවන් වැනි පුත් රුවනක් හැර හස්තප්‍රාප්ත වූ චක්‍රවර්ති රාජ්‍යයෙහි ලෝභ නොකොට සතළිස් දහසක් පමණ දෙවගනන් බඳු වරගනන් උන්නා වූ රාජභවනයෙන් මධ්‍යම රාත්‍රියෙහි පිටත් ව දිවන්න මෝ සැපින්නක් හොත් සුඹසෙක ලෝභ නොකොට දිවන්නාසේ පසු නො බලා දිවුම් හ.

සාවුරුද්දක් මුළුල්ලෙහි අප පසුපස්සෙහි ජායාවක් සේ ඇවිදිනා මාරයා පවා අප ගේ කාමවිතර්කයකුදු සොයා ගත නො හී මසැ යි සිතා කැලමල් රැක ගෙණ හුන් කැනහිලකු සේ සිට වෙහෙස පියා පලා ගියේ ය. සාවුරුද්දක් මහාවියවී කොට ඉක්බිති බෝමැඩ විදුරසුන් නැඟී මාර පරාජය කොට වාපොලොවෙහි පටන් අකනිටා බඹලොව දක්වා දසදහසක් සක්වළ එක පැහැර වෙවුල්වා පියා, බුදු වුම් හ. පසු ව පියාට වූ පරිභව පසිඳුම් හ යි කියා වහසි බැණ ගෙණ ආවා වූ තණ්හා ය, රතී ය, රගා ය, යන මාරස්ත්‍රීන් තුන් දෙනා ගේ එ වැනි තුන් මුහුණට

අනිත්‍යය, දුකඛය, අනාත්මය යන තුන් ලකුණු ම යෙදු බව මුත් රාගයක් නො යෙදුම් හ. කාමයෙහි අග පැමිණි සවැනි දෙවුලොව එ වැනි දිව්‍ය ස්ත්‍රීන් දැක පවා රාගචිත්තයක් නො ඉපද වූ අපි දැන් තාගේ දුව යැ යි කියන ලද අසූචි හා මුත්‍ර පිරූ නවසිල් බඳනෙහි ලෝභ කරමෝ ද? එසේ වූ තා ගේ දුව අතින් ළං කොට සිප ගන්නා තබා පා පිස්නා බිස්සක් සේ පය පිස්නට පවා කැත ඇත්තැම් හ."

දිස්වාන තණ්හං අරතිං රගංච
නා හොසි ඡන්දෙ අපි මෙථුනස්මිං
කිමේවිදං මුත්තකරීස පුණ්ණං
පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ

(සද්ධර්ම රත්නාවලිය - මාගන්ඩි වස්තුව)

මේ කථාවෙන් ද බුදුරදුන් ගේ රූපසම්පත්තිය ගැන හිතා ගත හැකි ය.

බුදුරදුන් ශ්‍රාවකයන් 1250 ක් සමග **(සද්ධිං අඪ්ඪ තෙළසෙහි භික්ඛුසතෙහි)** අඞ්ගුත්තරාපයෙහි නියම් ගමක චාරිකාවෙහි හැසිරෙන විට ත්‍රිවේදපාරප්‍රාප්ත, එ සේ ම මහාපුරුෂ ලකෂණ පිළිබඳ විශේෂඥ සේල නමැති බමුණු ඇදුරෙක් ශිෂ්‍ය මාණවකයන් 300 ක් සමග ගොස් බුදුරදුන් හමු විය. ත්‍රිවේදයෙහි එන මහා පුරුෂලක්ෂණ **(අගතානි ඛො පන අස්මාකං මන්තෙසු ද්වත්තිංස මහා පුරිස ලක්ඛණානි)** දුටු සේල බ්‍රාහ්මණයා බුදුරදුන් ගේ රූපසම්පත්තිය උන් වහන්සේ ඉදිරිපිට දීම වර්ණනා කෙළේ ය.

ඔහු දත් ලක්ෂණ ශාස්ත්‍රය අනුව ඒකාන්තයෙන් ම බුදුවරයකු බව පිළිගත් මහාශාස්ත්‍රඥ සේල බ්‍රාහ්මණයා අන්තිමට ශිෂ්‍ය මාණවකයන් 300 ත් සමග බුදුරදුන් වෙත මහණ ව උපසම්පදව ලබා රහත්බවට පත් විය. මේ උගත් බමුණු පඬිවරයා බුදුන් සරණ ගියේ බුදුරදුන් ගෙන් බණ අසා නො ව, තමා උගත් ශාස්ත්‍රයෙහි සඳහන් දෙතිස් මහා පුරුෂලක්ෂණ බුදුරදුන් වෙත විද්‍යමානවූ හෙයිනි.හෙවත්රූප සම්පත්තියෙන්ම පැහැදීමෙනි.

යසෝධරා දේවිය රාහුල කුමාරයාට බුදුරදුන් පෙන්වමින් කළ හැඳින්වීමක විලාසයෙන් තනා ඇති සුප්‍රසිද්ධ "නරසීහ ගාථා" වලින් කෙරෙණ අනුපම වර්ණනය මිනිස් සංහතියෙහි බුදුන් වහන්සේට ම හැර වෙන කිසි ම කෙනෙකුට ලැබිය හැක්කක් හෝ දැරිය හැක්කක් නො වේ.

"සමණො බලු ගොතමො අභිරූපො දස්සනියො පාසාදිකො පරමාය වණ්ණ පොක්ඛරතාය සමන්නාගතො බ්‍රහ්මවණ්ණී බ්‍රහ්ම වච්ජසී අක්කුද්දව කාසො දස්සනාය" භවත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ අනික් සියලුම මිනිසුන්ට වඩා රූපත් ය, දැකීමෙන් තෘප්තියට නො පැමිණෙන සුලු ය. නැවත නැවතත් දකින්ට හිතෙන සුලු ය. දැකීමෙන් ම පැහැදෙන සුලු ය. වර්ණ සෞන්දර්යෙන් යුක්ත ය. රන්වන් පැහැයෙන් යුක්ත ය.මහා බ්‍රහ්මයාගේ සිරුර මෙන් දිලිසෙන්නේ ය. සිය සිරුරෙහි දැක්මට නො මද වූ අවකාශ ඇත්තේ ය" යයි සෝණදණ්ඩ බමුණා කී ය. **(දීඝ නිකාය - සෝණ දණ්ඩ සූත්‍රය)**

"සිඞ්ගී නික්කසවණ්ණො රාජගහං පාණාවිසි භගවා" දඹරන් පැහැ ඇති භගවත් තෙමේ රජගහ නුවරට පිවිසියේ ය. (මහා වග්ග) මේ ප්‍රවෘත්ති වලින් ද බුදුරදුන් ගේ රූප ශෝභාව ගැන සිතා ගත හැකි ය.

බුද්ධ ප්‍රතිමාව තරම් ජනප්‍රිය වී ඇති ප්‍රතිමාවක් වෙන නැත. **මහාකවි බර්නාඩ් ෂෝ** ගේ කාමරයෙහි මේසය මත ද බුද්ධ ප්‍රතිමාවක් විය. ගලෙන් කෙටු අචේතනික බුද්ධ ප්‍රතිමාවෙහි පවා ඕනෑ ම කෙනෙකුට මානසික සැනසීමක් ලබා දිය හැකි කමක් තිබේ. ලෝක ප්‍රසිද්ධ නායකයකු වූ **ජවහර්ලාල් නේරු** තුමා අනුරාධපුරයේ ඇති සමාධි පිළිමයේ ඡායාරූපයක් දෙස බලමින් බන්ධනාගාරයෙහි දී සැනසුම් සුවය ලැබී ය. බුද්ධ රූපයෙහි දක්නට ලැබෙන නික්ලේශී ශාන්ත සංයම අපූරු පියකරු දර්ශනය අනික් මොන ම රූපයක වත් නැත.

මේ කරුණු වලින් බුදුන් වහන්සේ අනුපම රූපසම්පත්තියකින් යුක්ත ව විසූ බව ඔප්පු වෙයි.



උන්වහන්සේ කිසි දිනක පෙරදිග මිනිසුන්ගේ යහපත පිණිස, අපරදිග මිනිසුන්ගේ යහපත පිණිස, දඹදිව මිනිසුන්ගේ යහපත පිණිස, දුප්පතුන්ගේ යහපත පිණිස, ධනවතුන්ගේ යහපත පිණිස, කුලහීනයන්ගේ යහපත පිණිස, කුලීනයන්ගේ යහපත පිණිස, ආයජීයන්ගේ යහපත පිණිස, අනායජීයන්ගේ යහපත පිණිස යයි සේවය කිරීමේදී මිනිස් ජාතිය කොටස්වලට නොබෙදූහ. උන් වහන්සේ ගේ මහා කරුණාව සියලු සත්වයන් වෙත එක සමාන විය.

166 පිටුව බලන්න



පුරාණ කාලයේ ඉතා යහපත් බමුණන් සිටි බවත්, ඔවුන් තුළ උතුම් ගුණ ධම් තිබුනු බවත්, ඒ බමුණු ගුණ ධම් මෙකල බොහෝ බමුණන් කෙරේ නැති බවත්, දැන් ඒ බමුණු ධර්ම ඇත්තේ සුනඛයන්තුළ බවත් බුදුහු නිර්භීතව ප්‍රකාශ කළහ. "මහණෙනි, පුරාණ බ්‍රාහ්මණයන් තුළ පැවති මේ බමුණු ධම් හෙවත් චාරිත්‍ර පහ දැන් සුනඛයන් කෙරේ දක්නට ලැබේ. එහෙත් ඒවා දැන් සිටින බමුණන් කෙරෙහි නම් දක්නට නැත."

161 පිටුව බලන්න

පරිච්ඡේදය 20

බුදු හාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම මනෝවිද්‍යාඥයාණෝයි

සිද්ධාර්ථ කුමාරයා බුදුවන්නට පෙර හැම උත්සාහයක්ම දැරුවේ මිනිසාත්, මිනිස් සිතත් පිළිබඳ ඉගෙනීමට ය. පර්යේෂණ පැවත්වීමටය. බුදු වීමෙන් මිනිසාත් මිනිස් සිතත් පිළිබඳ දත යුතු සියල්ල අවබෝධ කර ගත්හ.

පරසිත් දන්නා නුවණ හෙවත් පරචිත්තවිජානන ඥාණය උන් වහන්සේට තිබුණේය. තමන් කරා පැමිණි හැම කෙනෙකුගේ ම චරිතය සිතුම් පැතුම් පමණක් නොව ඔහුගේ පූර්ව ජන්මය ද මරණින් පසු උත්පත්තිය ද යන ආදි, ඔහු පිළිබඳ සියලු වගතුග බුදුහු දැන සිටිය හ. එබැවින් බුදුරදුන් ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයකට භාජනය වීමට ලැබීම එකල කෙනෙකු ලැබූ ලොකුම භාග්‍යය විය. එසේ භාජනය වූ හැම කෙනෙක්ම උසස් තත්ත්වයක් ලැබූහ. සාර්ථක ප්‍රතිඵල ලැබූහ.

බුදුරදුන් හමු වූවන් ගෙන් සියයට අනූ නව දෙනෙක් ම භාග්‍යසම්පන්නයෝ වූහ. නොයෙක් දෙනා ආපසු ගෙවල්වලට නො ගොස් තමන් සතු ගේ දෙර වතු පිටි අඹුදරු ආදි සියල්ල අත හැර දමා සියල්ල අමතක කොට උන් වහන්සේ ළගම නැවතුනෝ ය. ශ්‍රාවකයෝ වූහ.

මිනිස් සිත ගැන පරතෙරට ම දැන ගත් මනෝ විද්‍යාඥයා බුදුන් වහන්සේයි. ඒ පිළිබඳ උන් වහන්සේට තුබුනු අපූරු දක්ෂකම් උන් වහන්සේගේ වචනයෙන් ම මෙසේ යි.

> මහණෙනි", මම යම් තාක් කැමති වෙම් ද ඒ තාක් නොයෙක් විදියේ ඍද්ධි ක්‍රම ක්‍රියාවේ යොදවමි. එක් කෙනෙක් ව ඉඳගෙන බොහෝ දෙනෙකු ලෙස පෙනී සිටිමි. බොහෝ දෙනෙකුන් ලෙස පෙනී සිට එක් කෙනෙක් වෙමි. කාටත් දැක්ක හැකිව සිට කාටත් නො පෙනෙන ලෙස සිටිමි. බිත්ති හරහා ප්‍රාකාර හරහා පර්වත හරහා අහසේ වගේ නොගැටී යමි. දියෙහි මෙන් මතු වීම කිමිදීම කරමි. පොළොවෙහි යන්නාක් මෙන් දිය මතු පිට ද යමි. ලිහිණියකු මෙන් අහසෙන් ද යමි. අහසෙහි පොළවෙහි මෙන් සක්මන් කරමි. සඳ හිරු දෙදෙනා අතින් පිරිමදිමි.

මහණෙනි මම යම් තාක් කැමැති වෙම් ද ඒ තාක් පෙර විසූ කඳපිළිවෙල සිහි කරමි. ජාති එකක් දෙකක් පමණක් නොව සියදහස් ජාතියක් ද කල්පයක් ද සිහි කරමි. අසවල් තැන මෙනම් ඇත්තෙක් වී සිටියෙමි. මෙබඳු ජාතියක, ගෝත්‍රයක මෙබඳු කෑම බීම් ඇතිව මෙපමණ කලක් ජිවත් වූයෙමි. එයින් මැරී අසවල් තැන ඉපදුනෙමි". එහි ද මෙබඳු නම් ඇති ව මෙබඳු ජාතිගෝත්‍ර ඇතිව මෙබඳු ආයුෂ ඇති ව ජිවත් ව සිට එයින් චුත ව ගොස් අසවල් තැන ඉපදුනෙමි. යි සිහිකළ හැකිය.

මහණෙනි මම යම් තාක් කැමැති වෙම් ද? ඒ තාක් මිනිස් ඇස ඉක්මවා පැවැති දිව ඇසින් මැරෙන උපදින උසස් පහත් හොඳ නරක ගති ඇති නොයෙක් තරාතිරම්වල මිනිසුන් දැනගනිමි. අසවල්, තැනැත්තා දුශ්චරිත කොට අසවල් අපායෙහි උපන්නේය යි මට දත හැකිය. අසවල් තැනැත්තා සුචරිතයෙහි යෙදී සිට අසවල් යහපත් තැනක උපන්නේ යයි දැක ගත හැකිය.

(අහං භික්ඛවෙ, යාවදෙව ආකඞ්ඛාමි අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොමි. එකොපි හුත්වා බහුධා හොමි බහුධාපි හුත්වා එකො හොමි. අවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බං අසජ්ජමානො



"මහණෙනි, බොහෝ දෙනාගේ හිත පිණිස, බොහෝ දෙනාගේ සැප පිණිස ලෝකයාට අනුකම්පාව පිණිස, මිනිසුන්ට පමණක් නොව දෙවියන්ටත් හිත වැඩ පිණිස, ගමක් ගමක් පාසා, නියම් ගමක් නියම් ගමක් පාසා, නගරයක් නගරයක් පාසා හැසිරෙව්. දෙන්නෙක් එක මග නොයව්. මුල, මැද, අග, යන තුන් තන්හි ම හොඳක් ම යහපතක්ම ගෙනදෙන දහම් දෙසව්. මම ද උරුවෙලාවෙහි සේනානි නැමැති නියම් ගමට දහම් දෙසීමට යන්නෙමි.

166 පිටුව බලන්න

ගච්ඡාමි, සෙය්‍යථාපි ආකාසෙ. පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොමි, සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභෙජ්ජමානො ගච්ඡාමි, සෙය්‍යථාපි පඨවියං. ආකාසෙපි පල්ලඞ්කෙනචඞ්කමාමි, සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසාමි පරිමජ්ජාමි. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසංවත්තෙමි. කස්සපොපි භික්ඛවෙ යාවදෙව ආකඞ්ඛති අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොහොති - පෙ - යාව බ්‍රාහ්මලොකාපි කායෙන වසං වත්තෙති. අහං භික්ඛවෙ යාවදෙව ආකඞ්ඛාමි අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරාමි එකම්පි ජාතිං ජාතිසතසහස්සම්පි.)

(සංයුත්ත නිකාය - කස්සප සංයුත්ත)

මිනිස් සිත ගැන පරතෙරටම දැන ගත් එකම මනෝ විද්‍යාඥයා බුදුන් වහන්සේ යි. "මහණෙනි, ස්ත්‍රීරූපය මෙන් පුරුෂයා ගේ සිත් ඇද ගන්නා අනෙක් එකද රූපයක් මම මගේ නුවණැසින් නො දකිමි.

මහණෙනි, ස්ත්‍රී රූපය පුරුෂයා ගේ සිත තදින් ම ඇදගනී. **(නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි, යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං. ඉත්ථිසද්දං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදය තිට්ඨති)**

මහණෙනි, ස්ත්‍රී ශබ්දය මෙන් පුරුෂයා ගේ සිත් ඇද ගන්නා අනික් එක ද ශබ්දයක් මම නුවණැසින් නො දකිමි. මහණෙනි, ස්ත්‍රී ශබ්දය හෙවත් ස්ත්‍රීය ගේ හඬ පුරුෂයා ගේ හිත තදින්ම ඇද ගනී. **(නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනු පස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති. යථයිදං භික්ඛවෙ ඉත්ථිසද්දං ඉත්ථිසද්දං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති.)**

එසේම මහණෙනි, ස්ත්‍රී ගන්ධය, ස්ත්‍රී රසය, ස්ත්‍රී ස්පර්ශය තරම් පුරුෂයා ගේ සිත් ඇද ගන්නා ගඳක්, රසයක් හා ස්පර්ශයක් මම නුවණැසින් නො දකිමි. එසේ ම පුරුෂ රූපය, පුරුෂ ශබ්දය, පුරුෂ ගන්ධය, පුරුෂ රසය හා පුරුෂ ස්පර්ශය තරම් ස්ත්‍රියගේ සිත් ඇද ගන්නා අනික් රූපයක්, ශබ්දයක්, ගන්ධයක්, රසයක්, වශයෙන් නො ස්පර්ශයක් මම නුවණැසින් නො දකිමි.

මහණෙනි, භාවනා වශයෙන් වඩනා ලද දමනය නො කරන ලද, දියුණු නො කරන ලද හිත තරම් මහත් අනර්ථය පිණිස, විනාශය පිණිස පවත්නා අන් එක ද ධර්මයක් මම නුවණැසින් නො දකිමි. **(නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අභාවිතං මහතො අනත්ථාය සංවත්තති. යථයිදං චිත්තං)**

"මහණෙනි, වඩනා ලද, හික්මවන ලද දියුණු කරණ ලද හිත තරම් මහත් අර්ථය පිණිස දියුණුව පිණිස සැප පිණිස පවත්නා අන් එක ද ධර්‍මයක් මම නුවණැසින් නො දකිමි. **(නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මංපි සමනුපස්සාමි, යං එවං භාවිතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං)** "මහණෙනි, මේ භවාංග සිත ප්‍රභාස්වර ය පැහැදිලි ය. පිරිසිදු ය. එය ආගන්තුක කෙලෙස්වලින් කිලුටු වූයේය. **(පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලේසේහි උපක්කිලිට්ඨං)**

(අංගුත්තර නිකාය - එකක නිපාත)

කරුණා මෛත්‍රියෙන් තෙත් වූ හදවතක් ඇති බුදුහාමුදුරුවන් වහන්සේ දහම් දෙසුවේ මිනිසුන් ගේ හදවතට ය. ඒ දහම් මිනිස්සු හදවතින් ම පිළිගත්හ. බුදුරදුන් දහම් දෙසන විට දහසක් දෙන එය අසා සිටියාහු නම් ඒ එක එක්කෙනා ම මේ කියන්නේ මට මය. මේ කියන්නේ මා ගැනමය වෙන වෙනම සිතූහ. බුදුරදුන් තමන් හමු වන හැම කෙනෙකුගේම මනස විනිවිද දැක සිටියේ ද යන්නට මීට වඩා නිදසුනක් අවශ්‍ය නැත.

බුදුරදුන්ගේ බණ අසා නොපැහැදුනු කිසිවෙක් නැත. බුදුරදුන්ගේ සුහද සාකච්ඡාවට කතාවට දේශනාවට, ප්‍රශ්නවලට පිළිතුරු දීමට හොඳ නැතැයි කියා අප්‍රසාදයට පත් වූ කිසිවෙක් නැත. බුදුරදුන් සමු වීමට අවුත් උන් වහන්සේගේ කතාවට අසතුටු වී ගිය දෙනා මාගන්දි බමුණා හා ඔහුගේ දියණියත් පමණකි. ඔවුන් අසතුටු

වුයේ බමුණා කළ විවාහ යෝජනාවට බුදුරදුන් අකැමැති වීම නිසාය.**මිනිස් සිත පිළිබඳව (මනෝපුබ්බංගමා ධම්මා මනෝ සෙට්ඨා මනෝමයා) යනුවෙන් මිනිසා කරන කියන හැම දෙයක දීම සිත පෙරමුණ ගන්නා බවත් සිත ප්‍රධාන බවත් සියල්ල විසින්ම නිපැදෙන බවත් බුදුහු පැවසූහ.** සිතෙහි ස්වභාවය පිරිසිද දැනීමෙන් (චේතෝපරියඤාණ) බුදුහු හැම කෙනෙකුගේම සිතුම් පැතුම් ගැන නිවැරදි අවබෝධයක් ඇතිව සිටියහ.

නවීන විද්‍යාවේ හැම දියුණුවක් ම ලබා ගත්තේ හිත මුල් කර ගෙනය. සිත දියුණු කර ගෙනය. දවස් ගණන් මාස ගණන් අවුරුදු ගණන් සිතමින් සිත පුරුදු කරමින් යන්ත්‍ර සූත්‍ර නිපදවා ඇත. අළුත් දේ සොයා ගෙන ඇත. අළුත් නිර්මාණ නිපදවා ඇත. සිත ක්‍රමානුකූලව හික්මවා ගෙන දියුණු කිරීමෙන් නවීන විද්‍යාඥයෝ අරුම පුදුම දේ කර ගෙන යති. හඳට පවා ගියේ සිත යාන්ත්‍රික අතේ දියුනු කිරීමෙනි. මිනිස් සිත යාන්ත්‍රික අතේ දියුණු කිරීමෙන් මේ දක්වා කොට ඇති විස්මය ජනක ක්‍රියා ගැන සලකන විට ලෝකොත්තර වශයෙන් හෙවත් අභ්‍යන්තර වශයෙන් සිත දියුණු කළොත් ධ්‍යාන භාවනා අතින් දියුණු කළොත් නො කළ හැකි අරුම පුදුම දෙයක් නැත. සිත අභ්‍යන්තරික වශයෙන් අන්තිම ඉහලට ම දියුණු කල මනෝවිද්‍යාඥයා බුදුන් වහන්සේ ය.

ආභ්‍යන්තරික වශයෙන් සිත දියුණු කිරීමේ ඒ උතුම් ක්‍රමය ඒ යෝග ක්‍රමය මිනිසා තුලින් ක්‍රමයෙන් අතුරුදහන් වී යෑම මිනිසා සතුව පැවැති මිනිස් සිතෙන් කල හැකි ව තුබුනු ඉතා ම වටිනා හපන්කමක් නැතිව යෑමකි. එය මිනිස් සමාජයට සිදු වී ඇති බලවත් පාඩුවකි. මිනිස් සිතෙන් ලැබිය හැකි ඒ අනුපම බලය ගැන මෙකල සාමාන්‍ය ජනයාට විශ්වාස කරන්නටවත් බැරි තරම්ය. පෙරදිග බුද්ධිමත් මිනිසුන් පමණක් සිත දියුණු කිරීමෙන් ලැබූ ඒ සෘද්ධි ප්‍රාතිහාර්ය ගැන අපරදිග මිනිස්සු තාමත් විශ්වාස නො කරති.

එහෙත් බුද්ධ ධර්මය හොඳින් කිය වූ ඕනෑම කෙනෙකුට චිත්ත බලයට වැඩිය ලොකු කිසිවක් නැති බව වැටහෙනු නිසැකය. කොටින් ම නිර්වාණය යනු සිත පිලිබඳ ධර්මයකි. තත්ත්වයකි. තෘෂ්ණාව මිනිස් සිතින් සදහට ම මුලිනුපුටා දැමූ කල්හි සිතේ හා කයේ ඇති වන සැහැල්ලුමකම පුලුන්පිඩක් බඳු බර නැති කම නික්ලේශී කෙනෙකුට ම මිස වෙන කෙනෙකුට දත නො හැකිය. කෙලෙස්බරින් බර වී ඇති සිරුර ඉන් මිදුනු විට සැහැල්ලු වීමෙහි වාතය මෙන් පාවී යෑමෙහි කිසිදු පුදුමයක් නැත.

ලෝකයේ හැම හපන්කමක්ම කර ඇත්තේ පණ ඇති සිත ඇති මිනිසුන් විසිනි. මළකඳක් හෝ අචේතනික වස්තූන් හෝ කළ අරුම පුදුම ක්‍රියාවක් නැත. අචේතනික මහා භූතයන් හික්මවා පුදුම දේ නිපදවා ඇත්තේ මිනිස් සිත විසිනි. පණ ඇති සිරුරකින් සිත වෙන් වූ හැටියේම එහි දක්නට ලැබෙන පුදුම වෙනසෙන් සිතේ ඇති බලය කොපමණ දැයි වටහා ගත හැකිය.

මිනිස් සිත බුදුන් වහන්සේ තරම් ඉතා ගැඹුරට විග්‍රහ කළ එහි විවිධ ස්වභාවය පෙන්වූ වෙන කිසිවෙක් නැත. විද්‍යාඥයන් සිතේ. උපකාරයෙන් හපන්කම් කළත් සිත පිළිබඳව සොයා ගෙන ඇත්තේ ඉතා ස්වල්පයකි. යෝග ධ්‍යාන භාවනා සමාධි මගින් ලබා ගත හැකි අරුම පුදුම තත්ත්වයක් ගැන නවීන විද්‍යාඥයන් මෙතෙක් අමතක කොට ඇත. එබැවින් ඔවුන්ගේ නිපදවීම් මිනිස් සිතේ දියුණුවට - අභ්‍යන්තරික දියුණුවට හේතු වී නැත. සිත උසස් වූ තරමට මිනිසා ද උසස් වේ.

සිත උපරිම මට්ටමෙන් දියුණු කළ බුදු, පසේබුදු, රහත්වරු උසස්ම සිත් ඇත්තෝ ය. සිත පහත් වූ තරමට මිනිසා ද පහත වැටේ. අහසින් ගිය යෝගීවරු ධ්‍යානලාභී තාපසයෝ කෙලෙස් සිතක් පහළ වූ ක්ෂණයකින් ධ්‍යානයෙන් පිරිහී බිම පතිත වූහ.මහාමන්ධාතු රජු ගේ ධාර්මික කමට පැහැදුනු ශක්‍රයා ඔහු ශක්‍රභවනයට ගෙන ගොස් ශක්‍ර රාජ්‍ය දෙකට බෙදා කොටසක් පාලනය කිරීමට බාර දුන්නේ ය. දෙව්සැප විඳින මහාමන්ධාතු රජුට ශක්‍රයා මරා ඔහු ගේ කොටසක් අයත් කර ගන්නට ඇත් නම් හොඳයයි

කොසොල් රජු බුදුන් වහන්සේ හමුවෙන්නට ගොස් උන්වහන්සේ සමග පිළිසඳරේ කතාකරමින් සිටින විට රාජ දූතයෙක් ගොස් මල්ලිකා දේවියට දුවක් ලැබුණු බැව් කණට කොඳුරා රහසේ කීය. ඒ ඇසූ රජුගේ මුහුණ නරක් විය. රජුගේ මුහුණ නරක්වී තිබෙනු දුටු බුදුහු 'මහරජ: ඇතැම් ස්ත්‍රීහුද ශ්‍රේෂ්ඨය, දක්‍ෂය, බුද්ධිමත්ය. එහෙයින් මල්ලිකාවට ලැබුණු දියණිය හොඳින් පෝෂණය කරනු මැනවි: නුවණැති සිල්වත්, නැදිමයිලන් දෙවිකොට වෙසෙන, පතිවත රක්නා ස්ත්‍රිය, උතුම්ය. එවැන්නියකගේ පුතෙක් රටක්වුවත් පාලනය කරයි' වදාළහ. 158 පිටුව බලන්න

සිතක් පහළ විය. ඒ තණ්හාපති කැත සිත පහල වීමක් සමග ම ඔහු ඔහුගේ ම උද්‍යානයේ සිටිනු ඔහුට ම පෙණුනේ ය. මිනිස් සිතට හොඳ සිතිවිල්ලක් පහළ වූ හැටියේ නැංග නැගිල්ලේත් නරක සිතිවිල්ලක් පහළ වූ හැටියේම වැටුනු වැටිල්ලේත් හැටි පිළිබඳ මේ කථාව සිත්පිත් ඇති අප කාටත් හොඳ පාඩමකි.

බුදුන් වහන්සේ සිත දියුණු කිරීමෙන් ධ්‍යාන සැප විදර්ශනා සැප නිවන් සැප වින්ද මිස ඍද්ධිප්‍රාතිහාර්ය හාස්කම් ගරු කොට නො සැලකූහ. මිනිසුන් පැහැදවීමට ඒවා කළ අයට දෙස් කීහ. උන් වහන්සේ හාස්කම් කොට මිනිසුන් පුදුම කරවා විජ්ජාකාරයකු ලෙස පෙනී සිටින්නට කිසි විටෙකත් නොසිතූහ. මිනිස් සිත හද මිනිසුන් හදනු මිස ආභ්‍යන්තරික ගුණධර්ම වැඩීමට කිසි දු පිහිටක් නැති ප්‍රාතිහාර්ය විජ්ජා ඇස්බැන්දුම් වැනි ක්‍රියා අවශ්‍ය දේ හැටියට නො තැකූහ. ප්‍රාතිහාරය පෑ පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් ට දෙස් කීවේ එබැවිනි.

දිනක් බුදුහු නාලන්ද නුවර අසල පාවාරික නම් අඹ වනයෙහි වැඩවසති. කේවඩ්ඩ නම් ගෘහපතියෙක් උන්වහන්සේ වෙත පැමිණ වැඳ, එකත් පසෙක සිට

> "ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස. මේ නාලන්ද නගරය ඉතාම දියුණුය සරුසාරය. බොහෝ ජනයාගෙන් පිරී ඇත්තේ ය. මෙහි වසන බොහෝ දෙනා ඔබ වහන්සේ කෙරෙහි ඉතා පැහැදී සිටිති. යම් ලෙසකින් ඔබ වහන්සේ ගේ ශිෂ්‍ය භික්ෂු නමක් මේ නගරවාසී මිනිසුන්ට පෙනෙන හැටියට ඍද්ධිප්‍රාතිහාර්ය පාන්නේ නම් මේ සියලුම මිනිස්සු ඔබවහන්සේ කෙරෙහි වඩ වඩාත් පහදති. කරුණාකර එසේ කරන ලෙස එක් භික්ෂුනමකට අණකරනු මැනැවි" යි යාඥා කර සිටියේය.

එවිට බුදුහු

> කේවඩ්ඩ මහණෙනි තෙපි මෙසේ එවූ සුදුවත් හඳින ගිහියන්ට උතුරු මිනිස් දහමින් පෙළහර කරවු යයි මම භික්ෂුන්ට දහම් නො දෙසම් යි ඔහු ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. මෙසේ තුන්වරක් ම ඉල්ලු නමුත් බුදුහු ඒ තුන්වර ම ප්‍රතික්ෂේප කළහ.

"එවං මෙ සුතං එකං සමයං භගවා නාලන්දායං විහරති පාවාරිකම්බවනෙ අථකො කෙවඩ්ඩො ගහපති පුත්තො යෙන භගවා තෙනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි එකමන්තං නිසින්නො ඛො කෙවඩ්ඩො ගහපති පුත්තො භගවන්තං එතදවො ච, අය භන්තෙ නාලන්දා ඉද්ධාචෙ ච ඵීතා ච, බහුජනා ආකිණ්ණ මනුස්සා, භගවති අතිප්පසන්නා, සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදියතු යො උත්තර මනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාලන්දා භියොසොමත්තාය භගවති අතිප්ප සීදිස්සන්ති.

එවං වුත්තෙ භගවා කෙවඩ්ඪං ගහපතිපුත්තං එතදවො ච: න ඛො අහං කෙවඩ්ඪ භික්ඛුනං එවං ධම්මං දෙසෙමි. එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධි පාටිහාරියං කරොථ"ති දුතියම්පි ඛො කෙවඩ්ඩොගහපතිපුත්තො භගවන්තං එතදවොච." තතියම්පි ඛො කෙවඩ්ඩො ගහපති පුත්තො භගවන්තං එතදවො ච.

(දීඝ නිකාය - කෙවඩ්ඪ සූත්‍රය)

ප්‍රාතිහාර්ය ගැන බුදුරදුන් ගේ හැඟිම් පිළිබඳ හොඳ කතාවක් මෙන්න.

දිනක් බුදුහු ශ්‍රාවකයන් කීප දෙනෙකුන් සමග ගඟක තොටුපලක් අසල සිටියහ. තොටුපලේ තොටියා මගියකු එගොඩ කොට මෙගොඩට ඔරුව පැද ගෙන එමින් සිටියේය. මේ අතර හිස රැවුල් දිගට වැඩුනු වැහැරී ගිය සිරුරු ඇති තවුසෙක් එතනට අවුත් බුදුරදුන් දැක සරදම් සිනාවකින් හා බැල්මකින් යුතු ව ඉදිරිපිට ඇති ගඟේ දිය මතුපිට පාගමනින් එගොඩට ගියේ ය. ඔහු කළ ඒ ප්‍රාතිහාර්යය හෙවත් හාස්කම දුටු එක්

ශ්‍රාවකයෙක් බුදුරදුන්ට මෙසේ කි ය.

අනේ බුදුහාමුදුරුවනේ, අර නාකි තවුසා දිය මතුපිටින් ගිය හැටියට ඔබ වහන්සේත් වඩිනවා දකින්ට හරි ආසයි.

බුදුහු මද සිනාවක් පහල කොට

ඇවැත්නි, ඒක මොකක් ද ඒකේ කිසි වටිනාකමක් නැහැ. හොඳයි එහි ඇති වටිනාකම තව මොහොතකින් මම පෙන්වන්නම්. අර තොටියා මෙගොඩට ඔරුව පැද ගෙන එනතුරු ඉන්න.

මෙගොඩට ආ තොටියා බුදුරදුන් දැක උන් වහන්සේ ලගට අවුත් වැන්දේ ය.

එවිට බුදුහු "උඹ දැන් මිනිහෙක් එගොඩ කළා. ඔහු උඹට කීයක් ගෙවු වද?" ස්වාමිනි, අඩමස්සක් (අඩ්ඪමාසකං, වටිනාකමින් ඉතා ම අඩු කාසිය) ගෙව්වා.

බුදුහු ශ්‍රාවකයා දෙසට හැරී,

අන්න බලන්න. ඒ තවුසා ගේ හාස්කමේ වටිනාකම අඩමස්සයි. එහෙම උනත් ඒ යෝගි බලය ලබා ගන්නට ඔහු බොහෝ කලක් ශරීරයට දුක් දෙන්නට ඇති. ඉතින් අඩමස්සකින් කළ හැකි වැඩකට ඊට වඩා මිනිසා ගේ යහපත සඳහා යොදවන්ට තිබෙන මගේ මේ වටිනා කාලය අපතේ යවන්නේ මොනවටද" යි බුදුහු ඇසූහ.

බොහෝ දෙනාට ඇති ලොකු ම අඩුවක් නම් තමන් ඇසුරු කරන තමන් වටා සිටින අනිත් අය ගැන සැබෑ දැනුමක් නැති කම යි. මවුපියෝ දූදරුවන් ගේ අභ්‍යන්තර අදහස් නො දනිති. ගුරුවරු ශිෂ්‍යයන් ගේ සිතුම් පැතුම් හරිහැටි නො දනිති. පාලකයෝ රට වැසියා ගේ සිතුම් පැතුම් නො දනිති. හැම අවුලක් ම සිදුවන්නේ මේ නිසාය.

රටේ සිටින සැම දෙනාම මනෝවිද්‍යාඥයෝ නො වෙති. අනුන් ගේ සිත් දන්නෝ ඉතා ම ටික දෙනෙකි. ඒ නිසා ම අනුන් ගේ සිත් සතුටු කළ හැක්කේ ඉතා ටික දෙනෙකුට ය.

ඉතා ම වැඩි පිරිසක ගේ සිත් සතුටු කළ අප දන්නා මනෝවිද්‍යාඥයා බුදුන්වහන්සේ යි. මනෝ විද්‍යාඥයකු වශයෙන් උන් වහන්සේ ගෙන් අප ගත යුතු ලොකු ම ගුරුකම හැම අවස්ථාවක දිම මිනිසුන් ගේ සිත් දැන ගෙන වැඩ කරන්නට පිළිපදින්නට පුරුදු වීමයි.

ලෝකය හා විශ්වය අතෘප්තිකර ලෝකය

බුදු හිමියෝ ලෝකය හා සමග කෝප නොවූහ.
ලෝකය අතෘප්තිකර ස්ථානයක් වශයෙන් උන් වහන්සේ දුටු සේක.
බුදුහිමියන් ලොව දුටුවේ අනිත්‍ය ස්ථානයක් වශයෙන්
මිස නපුරු ස්ථානයක් වශයෙන් නොවේ.
මෝහයෙන් පිරි ස්ථානයක් වශයෙන් නොවේ.
සිය වදන් නොඅසන අය ගැන බුදු හිමියෝ කලබලයට පත් නොවූහ.
ඒ ගැන කෝපයට ද පත් නොවූහ.

මහාචාර්ය එලියට් 'බුදුසමය හා හින්දු සමය' නම් පොතින්

"යමෙක් නිතර කිපෙන ගති ඇත්තේද, බැඳගත් වෛර ඇත්තේද, පවිටු ගුණ මකුවෙක් වේද?, වැරදි දෘෂ්ටි (දර්ශන) ඇත්තේ ද, තම දෙස් වසන මායාවෙන් යුක්ත වේද, මෙබඳු පුද්ගලයා වසලයෙකි. "යමෙක් ණය ගෙන හිමියා ඉල්ලූ විට නොදී මගහරින්නේ ද හෙතෙම වසලයෙකි. "යමෙක් පිළිවන්කම තිබියදී දුර්වල වූ මහලු වූ මවට හෝ පියාට හෝ නොසලකා ද ඔහු වසලයෙකි." "අනුන්ගේ ගෙවලට ගොස් හොඳට කාල බීල අවුත් තමන්ගේ ගෙදරට ඔවුන් ආ විට හොඳට නො සලකන්නා වසලයෙකි." බුදුන් වහන්සේ සමාජයේ සිටින "වසලයන්" නම් කළේ ඉහත සඳහන් ක්‍රමයටයි.

161 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ ධර්මරාජ්‍යයක් ගොඩ නංවා පාලනය කළ ධර්මරාජයෙකි

බුදුන් වහන්සේට අපි බුදුරජාණන් වහන්සේ යැයි කියමු. උන්වහන්සේ ලෞකික රාජ්‍ය සම්පත් අත්හැර දමා වනාන්තරයට ගොස් පොරවා- ගෙන සිටි සිවුරට හා පාත්‍රයට හැර අන් කිසිවකට අයිතියක් නැති තවුසකු බවට පත්ව, උතුම් ගුණ ධර්ම පුරණ ගුණගරුක හමුදවක් ඇති කොට ධර්මරාජ්‍යයක් ගොඩ නංවා, ලෝකයේ අනික් සියලු ම රජවරුන්ට වඩා හාත්පසින් ම වෙනස් විධියේ රජකු බවට පත්වූ හ. ධර්මරාජ යනු උන් වහන්සේට ඇති නම්වලින් එකකි.

දිනක් ත්‍රිවේදපාරප්‍රාප්ත සේල නමැති බමුණෙක් බුදුරදුන් හමුව උන් වහන්සේ ගේ මහාපුරුෂ ලක්ෂණ දැක,

> "භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ කෙරෙහි මහාපුරුෂ ලක්ෂණ ඇත්තේ ය. චක්‍රවර්ති රජෙක් වී රාජ්‍ය නොකරන්නේ මන් දැ"යි ඇසී ය.

එයට පිළිතුරු දුන් බුදුහු.

> "සේල බ්‍රාහ්මණය, මම රජෙක්මි ශ්‍රේෂ්ඨ ධර්ම රාජයෙක්මි. අන් කිසිවකුට පැවැත්විය නොහැකි ධර්ම රාජ්‍යය මම පවත්වා ගෙන යමි" යි කීහ. **(රාජාහමස්මි සේල ධම්මරාජා අනුත්තරෝ ධම්මෙන චක්කං වත්තෙමි චක්කං අප්පතිවත්තියං)**
>
> ***(සුත්ත නිපාත - සේල සූත්‍රය)***

ඔබතුමා රජෙක් නම් ඔබතුමා ගේ සේනාපතියා කවරෙක් දැයි සේල බමුණා ඇසූ විට ළඟ සිටි සැරියුත් මහතෙරුන් දෙසට අත දිගු කොට.

මයා පවත්තිතං චක්කං ධම්මචක්කං අනුත්තරං සාරිපුත්තො අනුවත්තෙති - අනුජාතො තථාගතං

යනුවෙන්,

> 'මා විසින් පවත්වන ලද අනුත්තර ධර්මචක්‍රය මා නිසා පහළ වූ සැරියුත් තෙර තෙමේ දරයි යි කී හ.

එබැවින් සැරියුත් හාමුදුරුවෝ ධර්මසේනාපති නමින් හඳුන්වනු ලැබූ හ. ධර්මරාජ වූ බුදුරදුන් ගේ ධර්ම රාජ්‍යයෙහි අග නුවර ධර්මනගර නම් විය. මේ ධර්මනගරය ගැන මිලින්ද ප්‍රශ්නයෙහි නාගසේන හාමුදුරුවෝ මිලිඳු රජුට මෙ සේ විස්තර කරති.

> "මහරජාණෙනි, අප ලොව්තුරා බුදුන් ගේ
> **සද්ධර්ම** මහනුවර වටා කෙලෙස් සොරුන් වැද්ද නො දෙන
> **සීලමය** ප්‍රාකාර ඇත්තේ ය.
> **ලජ්ජා** නැමැති මඩ අගල් ඇත්තේ ය.
> **ඥාන** නමැති වාහල්කඩ ඇත්තේ ය.
> **වීර්‍ය්‍ය** නැමැති අට්ටාල ඇත්තේ ය.
> **ශ්‍රද්ධා** නමැති ඉන්ද්‍රඛීල ඇත්තේය.
> **සිහි** නමැති දෙර ඇත්තේ ය.
> **ප්‍රඥා** නමැති මහා ප්‍රාසාද ඇත්තේ ය.
> **සූත්‍රාන්තධර්ම** නැමැති රාජංගන ඇත.
> **අභිධර්ම** නමැති සතර මංසන්දි ඇත.
> **විනයධර්ම** නමැති විනිශ්චය ශාලා ඇත.
> **සතර සතිපට්ඨාන** නමැති සතර මහා වීථි ඇත්තේ ය.

මහරජාණෙනි, මේ මහා වීදි සතරෙහි නොයෙක් පුෂ්ප ජාති විකුණන ආපනශාලා ය. සුවඳ ද්‍රව්‍ය විකුණන ආපනශාලා ය. පළතුරු ජාති විකුණන ආපනශාලා ය. විෂ නසන බෙහෙත්හල් ය, ඖෂධශාලාය,

අමෘත ආපන ශාලා ය. රත්නජාති ඇති ආපනශාලාය. හැම ද්‍රව්‍යයක් ම ඇති ආපනශාලා යයි සල්පිල් අටක් වෙයි.

මෙයින් මල් ජාති විකුණනට සල්පිලෙහි **අනිච්ච. දුක්ඛ, අනත්ත. අසුභ, ආදීනව, පහාණ. විරාග, නිරොධ, සබ්බලොකෙ අනභිරත, සබ්බ සංඛාරෙසු අනිච්ච, අනාපානසති, උද්ධුමාතක, විනීලක විපුබ්බක. විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්ත, හත වික්ඛිත්ත, ලොහිත, පුළවක, අට්ඨික, මෙත්තා, කරුණා, මුදිතා, මරණානුස්සති. කායගතාසති** යන මේ සංඥාවන් අරමුණු කොට ගැණීමෙන් රාග දෝස මොහාදිය ප්‍රහීණ කොට රහත් බැව්හි හිත යෙදවුවන් නැමැති පුෂ්පාජාතිහු වෙති.

සුවඳ වර්ග සල්පිලෙහි සිල්සුවඳින් යුත් **සරණසීල, පඤ්චසීල, අට්ඨංගසීල, දසසීල ප්‍රාතිමෝක්ෂසංවර සීල** ආදි දසදිසාවෙහි ම හමා යන සිල්සුවඳ ඇති සිල්වන්තයන් නමැති සුවඳ ද්‍රව්‍යයෝ වෙති.

පළතුරු සල්පිලෙහි **සෝවාන් ඵල, සකෘදගාමි ඵල, අනාගාමි ඵල, අර්හත් ඵල** දරුවන් නැමැති පළතුරු වර්ගයෝ වෙති.

විෂ නසන බෙහෙත් හලෙහි **දුක්ඛසත්‍යය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, දුක්ඛනිරෝධගාමිනී ආයඝ්පටිපද සත්‍යය** යන කෙලෙස් විෂ නසන බෙහෙත් වෙති. ඖෂධ සල්පිලෙහි **සතර සතිපට්ඨාන, සතර සම්මප්පධාන, සතර සෘද්ධිපාද, පඤ්චින්ද්‍රිය, පංචබල, සත්ත බොජ්ඣංග අරිය අට්ඨංගිකමග්ග** යන ඖෂධයෝ වෙති.

අමෘත සල්පිලෙහි හෙවත් අමාපැන් සල්පිලෙහි **"අමතං තෙ භික්ඛ වෙ පරිභුඤ්ජන්ති යෙ කායගාතසතිං පරිභුඤ්ජන්ති"** යනුවෙන් බුදුන් වදළ පරිදි සියලු දෙව්මිනිසුන් **ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෙමනස්ස, උපායාස** යන මේවායින් මිදවීම සඳහා ඉසින ලද අමෘතය වූ කායගතා සති, අමෘත රසය තිබේ.

රත්න සල්පිලෙහි **ශීලරත්න, සමාධිරත්න, ප්‍රඥාරත්න. විමුක්තිරත්න, විමුක්තිඥාන දර්ශනරත්න, පටිසම්භිද රත්න, බොජ්ඣංග රත්න** වැනි රත්නජාතිහු වෙති.

හැම ද්‍රව්‍යයක්ම ඇති සල්පිලෙහි බුදුරදුන් ගේ **නවාංගබුද්ධ වචනය, ශාරීරික** හා **පාරිභෝගික චෛත්‍ය** හා **සංඝරත්නය** ද ඇත.

බුදුරදුන්ගේ ධර්මනගරයෙහි වාසය කරන නාගරිකයෝ නම් **සූත්‍රාන්තිකයෝ ය, විනයධරයෝ ය, අභිධර්මධරයෝ ය. ධර්මකථිකයෝ ය. ජාතකභාණකයෝ ය. දීඝනිකාය භාණකයෝ ය. මැදුම්සඟි භාණකයෝ ය, සංයුත් සඟි-භාණකයෝ ය, අංගුත්තර භාණකයෝ ය, කුදු ගොත්සඟි භාණකයෝ ය,**

ශීලසම්පන්නෝ ය, සමාධි සම්පන්නයෝ ය, ප්‍රඥාසම්පන්නයෝ ය, බෝධ්‍යංග භාවනාවෙහි ඇලී වසන්නෝ ය, **විදර්ශනා වඩන්නෝ ය,** අර්ථයෙන් යුක්ත වුවෝ ය, **ආරණ්‍යකයෝ ය, වෘක්ෂ මූලිකයෝ ය, අබ්භෝකාසිකයෝ ය, පලාලපුංජකයෝ ය,**

සෝසානිකයෝ ය හෙවත් සොහොනක සිට භාවනා කරන්නෝ ය, සයනයක පිට නොතබා නො නිඳ සිටීමෙන් භාවනා සිටීමෙන් භාවනා කරන්නෝ ය, සතර මාර්ගයට පිළිපන්නෝ ය, සතර ඵලයට පැමිණියෝ ය. **ශෛක්ෂයෝ ය පූර්වෙනිවාසානු ස්මෘති ඥානය** ආදි ත්‍රිවිද්‍යාවෙන් යුක්ත වූවෝ ය. දිවැස් ඇති නුවණ, දිව කන් ඇම නුවණ, අනුන් ගේ සිත් දන්නා නුවණ, පෙර විසූ කඳ පිළිවෙළ ආ **ෂඩ්අභිඥාලාභීහු ය. චතුර්විධ සෘඞ්** ඇති මහ රහතන් වහන්සේලා ය. **නොයෙක්**



බුදුහාමුදුරුවන් වහන්සේ උතුරු ඉන්දියානු සමාජයෙන් ඉතා සැළකිය යුතු කොටසක් සකස් කෙළේ සංශෝධනය කෙළේ තිසරණ නමැති සරණ තුනින් යුත් පසද්වශීල නමැති ප්‍රතිපත්ති පහකිනි. එදිනෙද ජීවිතයෙහි නිතර සිදුවිය හැකි වැරදි ක්‍රියා පහකින් වැලකී සිටින බවට පොරොන්දු කරවා ගැනීම පසද්වශීල ප්‍රතිපත්තියයි. 163 පිටුව බලන්න

සමාපත්තීන්හි දක්ෂ වූ මහ රහතන් වහනසේලා යන මේ පුරවැසියන් ගෙන් ඒ සද්ධර්මනගරය පිරී ඇත.

මේ නගරයෙහි වැසි ධර්මචක්‍රය පවත්වාගෙන යන **ප්‍රඥා පාරමිතාව** පිරූ මහරහතන් වහන්සේලා ධර්මසේනාධිපති වරු වෙති.

මහා සෘධිමත් සිව්පිළිසිඹියා පත්, මහරහතන් වහන්සේලා පුරෝහිතයෝ වෙති.

ධූතංගධර මහරහතන් වහන්සේලා විනිශ්චය කරුවෝ වෙති.

පෙරුම් පුරා ලැබූ දිවැස් ඇති මහරහතන් වහන්සේලා මේ නගරය අලංකාර කරන නගරජෝතිකයෝ වෙති.

බහුශ්‍රැති ධර්මධර විනයධර නවඩ්ගශාසන ධර භික්ෂුන් වහන්සේලා ධර්මය ආරක්ෂා කරන අමාත්‍යයෝ වෙති.

රෑ දවල් නො නිඳ භාවනාවෙහි යෙදෙන භික්ෂුන් වහන්සේලා නගරාරක්ෂකයෝ වෙති.

ධර්මරත්න නැමැති ධනයෙන් ද පයඃිප්ති නමැති ධනයෙන් ද යුත් භික්ෂුන් වහන්සේ ලා ධර්ම සිටුවරු වෙති.

මහරජ මෙසේ ධර්මරාජයන් ගේ ධර්මනගරය මොනවට නිර්මිත ය. සුපරිපූරිත ය. ව්‍යවස්ථාපිත ය. සුරක්ෂිතය සිල් නැති ගුණදහම් නැති සතුරන්ට (හොර වැසියන්ට) ඇතුල් වීම දුෂ්කර ය.

(මිලින්ද ප්‍රශ්න - මහානුමානප්‍රශ්නය - 556 - 588 පිටු)

බුදුන් වහන්සේගේ ධර්මරාජ්‍යයේ පුරවැසියන්ට තනතුරු පත් කළ හැටි මුළු ලෝකයේම පාලකයන්ට හොඳ ආදර්ශයකි. ඒ පත් කිරීම්වල තමන් ගේ කම. නෑදෑකම. කුලය, ගෝත්‍රය,ජාතිය, පළාත, පක්ෂපාතකම හා ඡන්දය. ද්වේෂය, මෝහය, භය යන මේ කිසිම කරුණක් බල පා නැත. පත් කලායින් පසු ඒ පත් කිරීම ගැන කිසි කලෙක කිසි කසුකුසුවක් ඇති වී නැත. සැරියුත් මුගලන් දෙනමට අගසවු තනතුරු දීමේදී

"**නාහං මුඛං ඔලො කෙත්වා දම්මි** "මම මුහුණ බලා තනතුරු නොදෙමි" යි කිහ.

රටවල් පාලනය කරන වර්තමාන පාලකයන්. මැති ඇමතිවරුන් නිලධාරීන් ඒ ඒ අයට පත්වීම් දීමේ දී බුදුන් වහන්සේ අනුගමනය කල යුතු ය. ආදර්ශයට ගත යුතු ය.

බුදුන් වහන්සේ හැම පත්වීමක්ම හැම තනතුරක් දිමේදී පත්වීම ලබන්නාගේ චරිතයට ප්‍රධාන තැනක් දුන්හ. එහෙත් අනුන් ගේ කිසිම චරිත සහතිකයක් නො පිළිගත් හ.

උන්වහන්සේ ම ඒ අය ගේ චරිතය එක ආත්මභාවයක පමණක් නො ව ආත්මභාව ගණනක තදින් පරීක්ෂා කර බැලූහ. බලා දක්ෂකම අනුවම. සුදුසුකම අනුව ම ගුණධර්ම අනුව ම ඒ ඒ තනතුරුවලට පත් කල හ.

මේ ආදර්ශවත් රාජ්‍යයෙහි ගුණ ධර්ම අතින් අග තැන් පැමිණි පුරවැසියන් ගෙන් කිසිවෙක් තනතුරු නො ඉල්වූහ. තනතුරු සඳහා තරග නොකළහ. තනතුරුවලට කෑදර නොවූහ. තනතුරු ලැබුවායින් පසු මුල අමතක නොකළහ. දුබලයන් දුප්පතුන් අමතක නො කළ හ. අහසින් ආපු අමුතු පිරිසක් මෙන් බොරු මහන්තත්ව මවා නො ගත්හ.

මහජනයා විඳින දුක හොඳින් අවබෝධ කරගෙන ඔවුන් එයින් මුදලීම සඳහා රෑ දවල් දෙකෙහි නිදි නැතිව සොහොන්බිම්වල පාලු අම්බලම්වල ගස් යට මහ වනයෙහි තණපිට්ටනිවල ගල්තලාවල කල් ගත කරමින් රස නිරස නො බලා ලැබුනු දෙයකින් යැපෙමින් තමන් සිල්වත්ව අනුනුත් සිල්වත් කරුණු පිණිස තමන් සුඛිත වී අනුනුත් සුඛිත කරනු පිණිස තමන් සසර දුකින් ගැලවී අනුනුත් සසර දුකින් ගලවනු පිණිස වැඩ කළ හ.

බුදුරජාණන් වහන්සේ අතින් තනතුරු ලැබූ

පුරවැසියන් අතර,

"චිරරාත්‍රඥ (බොහෝ පැරැණි) ශ්‍රාවකයන් ගේ අග්‍රස්ථානය **අඤ්ඤා කොණ්ඩඤ්ඤ** මහරහතන් වහන්සේ ලැබූහ. මහ නුවණැති ශ්‍රාවකයන් අතර **සැරියුත්** හාමුදුරුවෝ ද, ඍද්ධිමතුන් අතර **මහමුගලන්** හාමුදුරුවෝ ද, විය

ධුතංගධරයන් අතර **මහාකාශ්‍යප** හාමුදුරුවෝද, දිවැස් ඇත්තන් අතර **අනුරුද්ධ** හාමුදුරුවෝද, උසස්කුලිකයන් අතර **භද්දිය** හාමුදුරුවෝද, මිහිරි කට හඬ ඇතියන් අතර **ලකුණ්ටක භද්දිය** හාමුදුරුවෝ ද, සිංහනාද කරනුවන් අතර **පිණ්ඩෝල භාරද්වාජ** හාමුදුරුවෝ ද,විය

ධර්ම කථිකයන් අතර **මන්තානිබැමිනිය** ගේ පුත් **පුණ්ණ** හාමුදුරුවෝ ද, සැකෙවින් කියූ දෙස හොඳට විස්තර කර දෙන්නන් අතර **මහාකච්චායන** හාමුදුරුවෝද, මනෝමය සිරුර මවන භික්ෂූන් අතර **චූල්ලපන්ථක** හාමුදුරුවෝද, අරූප ධ්‍යානයෙහි දක්ෂ භික්ෂූන් අතර **මහාපන්ථක** හාමුදුරුවෝ ද විය.

කෙලෙස් රහිත විහරණ ඇතියන් අතර **සුභූති** හාමුදුරුවෝ ද, දක්ෂිණාවට සුදුස්සන් අතර **සුභූති** හාමුදුරුවෝ ද, අරණ්‍යවාසි භික්ෂූන් අතර **රේවත** හාමුදුරුවෝ ද, ධ්‍යානයෙහි ඇලුනවුන් අතර **කංඛාරේවත** හාමුදුරුවෝ ද ආරබ්ධවීර්ය ඇත්තන් අතර **සෝණ** හාමුදුරුවෝ ද, ප්‍රියංකර වචන ඇත්තවුන් අතර **කුටිකණ්ණසෝණ** හාමුදුරුවෝ ද, සිවුපස ලාභීන් අතර **සීවලී** හාමුදුරුවෝ ද, විය.

ඉතාම සැදැහැවත් භික්ෂූන් අතර **වක්කලී** හාමුදුරුවෝ ද, ශික්ෂාකාමීන් අතර **රාහුල** හාමුදුරුවෝද, ශ්‍රද්ධාවෙන් පැවිදි වූවන් අතර **රට්ඨපාල** හාමුදුරුවෝද, පළමුව සලාක ගන්නවුන් අතර **කුණ්ඩධාන** හාමුදුරුවෝ ද, සම්පූර්ණ වැටහීම් ඇත්තන් අතර **වංගීස** හාමුදුරුවෝ ද විය.

සෙනසුන් පැනවීමෙහි දක්ෂයන් අතර **මල්ලරාජපුත්‍ර දබ්බ** හාමුදුරුවෝ ද, දෙවියන්ට ප්‍රියමනාප වූවන් අතර **පිළින්දිවච්ඡ** හාමුදුරුවෝ ද, වහාම ලැබූ අභිඥා ඇත්තන් අතර **දරුචීරිය බාහිය** හාමුදුරුවෝ ද, විචිත්‍ර කථිකයන් අතර **කුමාරකාශ්‍යප** හාමුදුරුවෝ ද, පිළිසිඹියා පත් ශ්‍රාවකයන් අතර **මහාකොට්ඨිත** හාමුදුරුවෝ ද, විය.

බහුශ්‍රැතයන්, ධාරණශක්තිය ඇත්තවුන්, ප්‍රඥා ගති ඇත්තවුන්, වියඞ්වන්තයන් හා උපස්ථායකයන් අතර **ආනන්ද** හාමුදුරුවෝ ද, මහා පිරිස ඇත්තවුන් අතර **උරුවෙලකස්සප** හාමුදුරුවෝ ද, කුල පහදවන්නවුන් අතර **කාලුදායී** හාමුදුරුවෝ ද, පෙර විසූ කඳපිළිවෙල සිහි කරන්නන් අතර **සෝභිත** හාමුදුරුවෝ ද, නිරෝගී ශරීර ඇත්තවුන් අතර **බක්කුල** හාමුදුරුවෝ ද, විනයධරයන් අතර **උපාලි** හාමුදුරුවෝ ද, විය. භික්ෂුණීන්ට අවවාද කරනන් අතර **නන්දක** හාමුදුරුවෝ ද, ඉඳුරන් කෙරෙහි වැසූ දෙර ඇති භික්ෂූන් අතර **නන්ද** හාමුදුරුවෝ ද, භික්ෂූන්ට අවවාද කරන්නන් අතර **මහාකප්පින** හාමුදුරුවෝ ද, තේ ජෝ ධාතු සමාපත්තියට සම වැදීමෙහි දක්ෂයන් අතර **සාගත** හාමුදුරුවෝ ද, ධර්මදේශනා වටහා ගැනීමට යෝග්‍ය කතා කිමෙහි දක්ෂයන් අතර **රාධ** හාමුදුරුවෝ ද, රූක්ෂ සිවුරු දරණ භික්ෂූන් අතර **මොඝරාජ** හාමුදුරුවෝ ද අග්‍ර ස්ථාන ලැබූහ. ප්‍රධාන තනතුරු ලැබූහ.

චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර මහා **ප්‍රජාපතී ගෝතමී** තොමෝ ද, මහාප්‍රාඥ භික්ෂුණීන් අතර **ඛේමාවෝ** ද, ඍද්ධිමත් භික්ෂුණීන් අතර **උප්පලවණ්ණාවෝ** ද, විනයධර භික්ෂුණීන් අතර **පටාචාරාවෝ** ද,



බුදුහු බමුණා සිටුවාලා ගිය තැන නො සිට එතැන් හි ශ්‍රී පාදය ඔබා පෙණෙන පරිද්දෙන් ඉවත් ව වැඩ සිටි සේක. එතනට පැමිණි බමුණා හා බැමිණිය , උන් වහන්සේ නොසිටි බව දැන, බමුණා ගේ මුහුණ බලා "ඒ තොප දුටු තැනැත්තෝ කොහි දැ" යි විචාළී ය. එබසට බමුණු, උන් මෙ තැන්හි සිටුවා ලා ගියෙමි. කොයි ගියේ දෝ හෝ යි බලනුයේ වැඩ සිටි තෙන තුබූ ශ්‍රීපාදය දැක මේ සිටි උන් පියවර යයි බුදුන් ගේ ශ්‍රීපාදය දැක්විය. බැමිණී, පියවර බලා පියා තමා වේදත්‍රයෙහි කෙළ පැමිණි බැවින් හා ලක්‍ෂණ මන්ත්‍ර දන්නා හෙයින් හා පියවර ලකුණු බලා බමුණ, තෝ කුමක් කියයිද? මේ නම්, සකල ක්ලේශයන් ප්‍රහීණ කොට සියල්ල දත්තා වූ උතුමාණෙකුන් ගේ පියවරෙක්ම යයි කීවා ය.

118 පිටුව බලන්න

ධර්මකථික භික්ෂුණීන් අතර **ධම්මදින්නාවෝ** ද, ධ්‍යානයෙහි ඇලුනු භික්ෂුණීන් අතර **නන්දශ්‍රාවිකාව** ද, අරබ්ධ වීර්‍යය ඇති භික්ෂුණීන් අතර **සෝණා** භික්ෂුණිය ද, දිවැස් ඇති භික්ෂුණීන් අතර **සකුලා** මෙහෙණ ද, මහා අභිඥා ලැබූ භික්ෂුණීන් අතර **භද්‍රාකුන්ඩලකේසී** මෙහෙණි තොමෝ ද, පෙර විසූ කඳ පිළිවෙල සිහි කරන භික්ෂුණීන් අතර **භද්‍රා කාපිලානි** මෙහෙණ ද මහාඅභිඥා ලැබූ භික්ෂුණීන් අතර **භද්දකච්චානා** මෙහෙණි ද, රූක්ෂ සිවුරු දැරූ භික්ෂුණීන් අතර **කිසා** ගෝතමියද අධික ශ්‍රද්ධාවෙන් යුක්ත භික්ෂුණීන් අතර **සිගාලමාතා** තොමෝ" ද අග්‍රස්ථානය ලැබූහ. මේ ධර්මරාජ්‍යයෙහි තනතුරු ලැබූ කාන්තාවෝ යි.

අනේපිඬු, **විශාඛා** ආදි ගිහි භවතුන්ට ද බුදුහු තනතුරු දුන්හ. මේ හැම තනතුරක් ම ගුණධර්ම පිරීම පිළිබඳ දක්ෂතාව උඩ දෙන ලද තනතුරු ය.

එබැවින් රාජ්‍ය පාලන්යේදි පාලකයන් විසින් අනුගමනය කල යුතු ශ්‍රේෂ්ඨතම පාලකයා ධර්මරාජ වූ බුදුන් වහන්සේ යි. පසුගිය අවුරුදු දෙදහස් පන්සිය තුළ ලෝකයෙහි පහළ වූ සියලු ම රාජ්‍ය හා අධිරාජ්‍ය අවුරුදු සියක් දෙසියක් ගිය තැන යුද්ධ ඇති වී කඩා වැටී සුණු විසුණු වී ගොස් ඇත. ජය පරාජය නැගීම් වැටීම් ආදි නොයෙක් ක්‍රමයේ වෙනස් වීම්වලට භාජනය වී ඇත. එහෙත් අවුරුදු දහසකට වැඩි කාලයක් බුදුරදුන් ඇති කළ ධර්මරාජය සුරක්ෂිත ව පැවැත්තේ ය. පිරිසිදු සංඝ ශාසනය යම් තාක් කල් පවත්නේ ද රජකු නැති ව වුවත් මේ ධර්මරාජ්‍ය ඒ තාක් කල් පවතිනු ඇත. රජකු නැතිව අවුරුදු (දෙදහක්) 2000 වැනි දීර්ඝ කාලයක් පවත්නා එකම රාජ්‍ය බුදුරදුන් ඇති කළ ධර්ම රාජ්‍යයයි.

බුදු සමය අසදෘශයි

බෞද්ධ හා අබෞද්ධ කම් පිළිබඳව නොතකා මෙම ලෝකයේ
හැම සාමයික ක්‍රමයක් ම විමසා බැලුවෙමි.
බුදු හිමියන් විසින් දේශනා කරන ලද ආර්ය අෂ්ඨාංගික මාර්ගයත්,
චතුරාර්‍යය සත්‍යයත් සතු විභූතිය සහ පෘථුල බව
ඉක්මවා යන කිසිම දහමක් මට ඒ අනික් ආගම් එකක
වත් දැකිය හැකි නොවේ.
බුදුහිමියන්ගේ මාර්ගයට අනුව මගේ දිවි පෙවෙත සකස් කොට
ගැනීමෙන් මම තෘප්තිමත් වන්නෙමි.

මහාචාර්‍ය රීස් ඩේවිස්.

බුදුසමයේ අව්චාරී මත නැත

බුදුසමය සතු විභූතිය නම්, විමුක්තිය සඳහා
සම්බෝධි ඥාණය අවශ්‍ය බව දක්වාලීමයි. බුදු
සමයෙහි ප්‍රඥා-ශීල දෙක එක්නෙකින් වෙන්කළ
නොහේ. උසස් ජීවනයේ පදනම ශීලයයි. ප්‍රඥාව
හා අවබෝධය නිසා ඒ උසස් ජීවනය
සර්ව සම්පූර්ණ වේ.
පටිච්ච සමුප්පාදය පිළිබඳ සම්පූර්ණ
අවබෝධයකින් තොරව කිසිවෙකුට සත්‍ය වශයෙන්
ශීල සම්පන්න විය හැකි නොවේ. ඒ සඳහා
ප්‍රඥාව හා විදර්ශනාව ද අවශ්‍යයි. මෙහිලා, බුදු
සමය අන් ආගම් සියල්ලටම වඩා වෙනස්ය.
ඒකදේවවාදී ආගම් සියල්ලම ආරම්භ වන්නේ
යම් කිසි අනම්‍ය විශ්වාස සමූහයක් පදනම්
කොට ගෙනයි. ප්‍රඥාව නිසා ඒ පදනම දෙදරා
ගිය කල්හී දුක අධික වේ. එහෙත්, බුදු සමය
ආරම්භ වන්නේ එවැනි අනම්‍ය විශ්වාස පදනම්
කොට ගෙන නොවේ. බුදු සමය පිහිටා සිටින්නේ
යථා තත්ත්වය නමැති පර්වතය මතය. ඒ නිසා
එය හැම විටම බුද්ධිය පිළිබඳ දීප්තිමත්
ආලෝකයට මුහුණ පාන්නේය.

මහාචාර්ය ලක්ෂ්මී නරසු "බුදු සමයේ හරය" නම් ග්‍රන්ථයෙනි.



කුසීත, හීන වීරිය ඇති, නින්දට කැමැති, අලස භික්ෂූන්ට ගැරහූ බුදුහු ඉදිරියට යන සුලු නිර්භීත ධෛර්‍ය සම්පන්න භික්ෂූන් පැසසූහ. එබැවින් බුදුන් වහන්සේ අතිශයින් ප්‍රගතිශීලි ශාස්තෘවරයෙකි.

89 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ පරලොව පෙන්වා මෙලොව දියුණුව සැලැස් වූ ශාස්තෘවරයාණෝයි

බුදුන් වහන්සේ ලෝ වැසි සියලු දෙනාම උපාසකයන් කරන්නට හෝ මහණ කරන්නට හෝ රහත් කරන්නට හෝ නිවන් දක්වන්නට හෝ කිසි විටෙකත් නො සිතූහ. උන් වහන්සේට ඕනෑ කළේ නිවන් දකින්නට තරම් මේරූ බුද්ධිය ඇති, සුදුසුකම් ඇති අයට නිවන්මග පෙන්වාදීමත්, ඉතිරි හැම දෙනාගේ ම අවිද්‍යාව - නුගත්කම නැති කොට වැරදි වැඩ නො කරන සුචරිතයෙහි යෙදෙන සුඛිත මුදිත ජනතාවක් කිරීමත්ය.

මිනිස් ජීවිතයක ඇති වටිනාකමත් ඒ සේ ම එහි ඇති අස්ථිරභාවයත් පෙන්වා ඉන් ගත හැකි උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට සැලැස් වීම යි. කුසිත කම් දුරලා අද අද ම වහ වහා ම වැඩෙහි යෙද වීම යි.

"**අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ**. අද ම වැඩ ඇරඹිය යුතුයි. හෙට මැරේ ද කියා කවුද දන්නේ?"

යනු උන් වහන්සේ ගේ ප්‍රශ්නයකි.

දවසේ පැය 24 න් පැය 2ක් හැර ඉතිරි පැය 22 හි ම සේවය කළ උන් වහන්සේ වෙහෙස ය. මහන්සිය කරදර ය. විවේකයක් නැතැ යි කිසි විටෙක කිසිවකුට නො කීහ. උන් වහන්සේ ගේ ධර්මය අනුගමනය කළ අසෝක රජු පවා

"**නිතියංයෙ කිලන්තෙ සියා න තෙ උගපෙ** - පාලනයේ දී වෙහෙස දැනෙන වෙහෙසට පැමිණෙන පාලකයා උසස් පාලකයෙක් නොවේ." ***(කාලිංග ගිරිලිපි 1)***

ය යි කියා ඇත.

කෙනෙකු බෞද්ධ කිරීමේ දී ඔහු තිසරණ පන්සිල්හි පිහිටෙව්වේ දෙව්ලොව යවන්ට නො වේ. මෙලොව ජිවත් වීමේදී එදිනෙද ජීවිතයෙහි සිදු වන වැරදි වැඩ පහකින් මුදවා යහපත් වාසනාවන්ත මිනිසකු කිරීම සඳහා ය. පන්සිල් රකින කිසිවකුට උසාවි යන්ට ඕනෑ වන්නේ නැත. බැනුම් අසන්ට සිදු වන්නේ නැත. ගැහුම් කන්ට සිදු වන්නේ නැත. ධාර්මික වාසනාවන්ත ජීවිතයක් නිසැකයෙන් ගත කරන්ට ලැබෙනු ඇත.

දන් දීමෙහි ආනිසංස කිවේ, ලෝබකමින් මසුරුකමින් තමා සතු ධනයෙන් නියම ප්‍රයෝජන නො ගෙන හිතෙන් දුක් විඳින්නන් සුඛිත කරනු සඳහා ය. ඇති අය ගෙන් නැති අයට යමක් ලබා දෙන සඳහා ය. පන්සල් පාසල් ආරෝග්‍යශාලා වැනි පොදු ආයතනවලට ඇති අයගේ ධනයෙන් කොටසක් පරිත්‍යාග කිරීමට පොළඹවනු සඳහා ය.

ධනය රැස්කර ගෙන සඟවා ගෙන සිට ඉන් ප්‍රයෝජන නො ගෙන තණ්හාපති කමින් සිට මැරී ගොස් ගෙවලයන් වී ප්‍රේතයන් වී උපදිනවා යයි කිවේ පරලොව ගැන භය වද්ද මෙලොව පරිත්‍යාගශීලීන් කරවනු සඳහාය.

සිල් රකින්නට කිවේ මිනිසා තුල පවත්නා දරදඬු දඩබ්බර ඔල මොට්ටල ගති නැති කොට ශාන්ත දාන්ත විනීත ශිෂ්ට පුරවැසියකු කරනු සඳහා ය.

භාවනා කරන්ට කීවේ ගෙදර දෙරේ කටයුතු සඳහා මුළු කාලය ගත කරමින් ගතින් හිතින් දුක් විඳින, කිසිම මානසික සන්සුන් කමක් නැති මිනිසා ගේ සිතට සැනසිල්ලක් විවේකයක් එකගකමක්, සමාධියක් ලබා දෙනු සඳහා ය.

සිගාලෝවාද සූත්‍රයෙහි හා ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි බුදුහු ගිහි ගෙයි වසන කෙනෙකු ජිවත්විය යුතු

ක්‍රමය ඉතා මැනවින් විස්තර කොට ඇත.

"ධනය විනාශ වන දෙරටු භය, මත්පැන් බිමෙහි දෝෂ භය, අවේලාවෙහි වීදිවල හැසිරීමේ දෝෂ භය, සිනමා බැලීමට යාමෙහි ආදීනව භය, සූදු කෙලියෙහි දෙෂ භය, අලසබවෙහි දෝෂ භය, කල්‍යාණ මිත්‍රයෝ, පාප මිත්‍රයෝ, ඇසුර කළ මිත්‍රයෝ, ඈත් කළ යුතු මිත්‍රයෝ, කවුරු ද යන බව, මවුපියන්ට ගුරුවරුන්ට සලකන හැටි, ස්වාමි පුරුෂයාට, භාර්යාවට පිළිපැදිය යුතු හැටි, මෙලොව දියුණුවට හේතු වන කරුණු, ආයමුඛ අපායමුඛ, පමණ දැන වියදම් කරන හැටි"

ආදිය ගැන දීර්ඝ විස්තරයක් දේශනා කොට තිබේ. පිරිහීමට හේතු වන කරුණු 21 ක් පරාභව සූත්‍රයෙහි දක්වා ඇත.

අයහපත් අය ප්‍රියවීම, සත් පුරුෂයන් අප්‍රියවීම, නරක අදහස් ප්‍රියකිරීම, නින්දට කැමැත්ත, නිකරුණේ කතාබහ කරමින් එක්ව සිටීම, ක්‍රියාකාරිවීමේ ශක්තිය නැතිකම, අලසබව, කෝපයට පත්වන ගතිය, තමාට ශක්තිය තිබුණු නමුත්, තමාගේ වයස්ගත දෙමාපියන්ට නොසැළකීම, ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් වංචාවෙන් රැවටීම, ඉමහත් ධනය හා ආහාර-පාන තිබුනත් ඒවා තනිව පරිභෝග කිරීම, සිය ජන්මය පිළිබඳව ආඩම්බරවීම, සිය ධනය පිළිබඳව ආඩම්බරවීම, තමන්ගේ නෑදැයන් නොතකා හැරීම, ස්ත්‍රී ධූර්තය, සුරා ධූර්තය, සූදුව, සිය බිරියගෙන් නොසතුටුව වෛශ්‍යාවන් සහ අන් අඹුවන් හා සමග හැසිරීම, ගෙවී ගිය යෞවන භාවය ඇතිඅයෙකු ඉතා තරුණ කාන්තාවක් භාර්යාව කොට ගැනීම, කාන්තාවක් හෝ පුරුෂයෙක් සුරාවට ලොල් නම්, ධනය නාස්ති කරන සුළු නම්, එවැනි අයට නායකත්වය පැවරීම, ධනය නැති අයෙකු ක්ෂත්‍රියයෙකු වුවත් රජකම ගැනීම.

මංගල කරුණු 38 ක් මංගල සූත්‍රයෙහි දක්වා ඇත. දියුණුවට කැමැති අය විසින් කළ යුතු කරුණු මොනවාද කියා කරණීය මෙත්ත සූත්‍රයෙහි දක්වා ඇත. මිනිස් ජීවිතයක් ලෞකික වශයෙන් සැපවත් කරගන්නා හැටි සඳහන් අත්පොත් හැටියට ඉහත සඳහන් සූත්‍ර ගැන සැළකිය හැකි යි.

ගොවියකු කුඹුරක් කරණ විට පිළිපැදිය යුතු හැටි පවා බුදුරදුන් කියා දී තිබේ. කුඹුර අසල වාසය කරන්නන් සමග මිත්‍ර ව සිටීම ඉතාම අවශ්‍ය බව ද එසේ නැතහොත් අසල්වැසියන්ට කුඹුර විනාශ කළ හැකි බව ද බුදුරදුන් පෙන්වා දී ඇත.

ලැබෙන ආදයම කොටස් හතරකට බෙද ඉන් එක කොටසකින් එදිනෙද ජීවිකාවත් දෙකොටසක් කර්මාන්තවල යෙදවීමත් එක් කොටසක් හදිසි අවස්ථාවක දී ප්‍රයෝජනය ගැනීම සඳහා ආරක්ෂා කොට තැබීමත් කළ යුතු බව වදළ හ. මේවා ප්‍රකාශ කළේ නිවන් යෑමටම නොව මෙලොව හොඳින් ජීවත් වීමට ය. කුසල් කරන හොඳ වැඩ කරන අයට දෙව්ලොව සැප පෙන්වූයේ ඔවුන් හොඳ වැඩ කිරීම සඳහා වඩාත් උනන්දු කරවීමට ය.

මිනිස්සු ස්වභාවයෙන් වැරදි වැඩවලට පෙලඹෙති. ඔවුන් ඒවායින් වළක්වා ලීම සඳහා යෙදවිය හැකි හොඳ ම උපක්‍රමය පරලොව දී ලැබෙන භයානක විපාක පෙන්වීමයි. එසේ නො පෙන්වා ඔවුන් නරක වැඩවලින් මුදවා ගැනීම දුෂ්කර ය. එබැවින් බුදුහු වැරදි කරන්නන්ට විපාක විඳින්නට සිදු වන අපායවල් මේ මේවාය යි පෙන්වා දුන් හ.

හොඳ වැඩ කිරීමට පොලඹවනු සඳහා පින්දහම් කරන්නන්ට යන්ට ලැබෙන දිව්‍යලෝක මේ මේවා යයි පෙන්වූ හ.

පරලොව පෙන්වා හෝ බුදුන් වහන්සේට ඕනෑ කෙළේ මිනිසුන් ගේ මෙලොව ජීවිත සැපවත් කිරීම යි.



බුදුන්වහන්සේ ඉතා බුද්ධිමත්ව සකස් කළ 'භික්ෂු ශාසන නමැති ආයතනය සාර්වභෞම ප්‍රජාතන්ත්‍රීය ආයතනයකි. මිනිස් ඉතිහාසයෙහි එබඳු ක්‍රමානුකූල ආයතනයක් පළමුවරට ඇතිකළ තැනැත්තා බුදුන්වහන්සේයි. එහි සියලුම සාමාජිකයෝ සංඝ නමින් හඳුන්වනු ලබති. පිරිමි පිරිස භික්ෂු නමින්ද, ගැහැණු පිරිස භික්ෂුණී නමින්ද හැඳින්වෙයි. ඕනෑම රටක, ඕනෑම ජාතියක, ඕනෑම කුලයක අයට මේ ආයතනයට ඇතුළත් විය හැකියි.

166පිටුව බලන්න

එබැවින් බුදුන් වහන්සේ මිනිසුන්ට පරලොව පෙන්නුවේ මෙලොව ජීවිත සකස් කර ගනු සඳහා ය. සාර්ථක කර ගනු සඳහාය.

මෙලොව දී දුක් විඳින්නකුට පරලොව දී සැප විඳින්නට පුළුවන් කමක් නැත. මෙලොව දී බුද්ධිය දියුණු නො කළ කෙනෙකුට පරලොව දී බුද්ධිය දියුණු කර ගන්නට පුළුවන් කමක් නැත. මෙලොව දී නරක වැඩ කරණ කෙනෙකුට පරලොව දී හොඳ වැඩ කරන්නට හැකි වේ යයි සිතිය නොහැකිය. මෙලොව අවාසනාවන්ත ජීවිතයක් ගත කරණ කෙනෙකුට පරලොව වාසනාවන්ත ජීවිතයක් ලැබේ ය කියා සිතිය නො හැකි ය. මෙලොව වාසනාවන්ත වූ තරමට යි පරලොව ද වාසනාවන්ත වන්නෙ.

බුදුන් වහන්සේ බණ වදළේ ජීවත් ව සිටින මිනිසුන්ට මිස මිය පරලොව ගිය මිනිසුන්ට නො වේ. උන් වහන්සේට ඕනෑ කලේ ජීවත්ව සිටින මිනිසුන් යහමග යැවීම මිස මළ මිනිසුන් යහමග යැවීම නොවේ. එබැවින් බුද්ධ ධර්මය තනි කර ම ජීවත් ව සිටින මිනිසුන් ගේ මෙලොව දියුණුව සඳහා ම දෙසූ දහමකි. බුදුහාමුදුරුවෝ ප්‍රධාන වශයෙන් ලෝකයා ගේ මෙලොව යහපත සඳහාම සේවයකිරීමට පහළ වූ ශාස්තෘවරයෙකි. ජීවත් වීමේ හොඳ ම ක්‍රමය නම් බුද්ධාගම අනුව ජීවිතය ගෙන යෑමයි. බුද්ධාගම අනුව සකස් වූ ජීවිතයක් තරම් ශ්‍රේෂ්ඨ ජීවිතයක් වෙන නැත. එතරම් ධාර්මික, ශාන්තදාන්ත. නිවැරදි ජීවිතයක් වෙන නැත.

බුදුන් වහන්සේ දහම් දෙසුවේ ජීවත් ව සිටින අයගේත් අනාගතයෙහි අවුරුදු සිය දහස් ගණනක් ලෝකයෙහි උපදින අයගේත් ප්‍රයෝජනය සඳහායි. අවුරුදු 2500 කට පසු ඉපදී සිටින අපටත් ඒ ධර්මයෙන් හැම ප්‍රයෝජනයක්ම ගත හැකි ය.

උන් වහන්සේ සත්‍යය සොයා ගැනීම සඳහා වින්ද අප්‍රමාණ දුක් කරදර ගැන අප කිසි කලෙක අමතක නොකළ යුතු ය. නිතර සිහිකළ යුතු ය. උන් වහන්සේ දුක් වින්දේ මා සඳහා මය. මා සඳහා ම යයි අප එක් එක්කෙනා වෙන වෙන ම සිතිය යුතු යි උන් වහන්සේ වින්ද අප්‍රමාණ දුකත් උන් වහන්සේ ගේ මහාකරුණාවත් උන් වහන්සේගේ පරමාර්ථයත් ගැන හරි හැටි දනිතොත් අපේ ජීවිත උන් වහන්සේ වෙනුවෙන් ම කැප කළ යුතු ව ඇත. උන් වහන්සේට ඕනෑ කළ එකම දෙය අප හැදීම යි.

නුගත්කමින් පෙළෙන මිනිසුන් හැදීමයි. දුක් විඳින ජනතාව සුඛිත මුදිත කිරීම යි. මුළු ලෝකයම සාමකාමී සහජීවනයක යෙදවීම යි. හැම රටක් ම හැම ජනකායක් ම උස් පහත්, සුදු කලු, උගත් නුගත්, කුලීන කුලහීන, ධනපති දුප්පත්, පෙරදිග, අපරදිග ආදී කිසි බේදයක් නැතිව, එක පවුලක සහෝදර සහෝදරියන් මෙන්, දයාවෙන් හා සමගියෙන් යුක්තව සිටී මයි.

අත් හඳ බැලීමක් වශයෙන් ඕනෑ ම කෙනෙක් බුදුදහම අනුව මාසයක් ජීවත් වී බලන්න. මාසයක් බුදුදහම අනුව ජීවිත යොදල බලන්න. එවිට බුදුදහමේ අගය, බුදුදහමේ බලය, බුදුදහමේ වටිනාකම වැටහෙනු ඇත. තේරෙනු ඇත. මේ දිව්‍ය බලයෙන්, මේ දිව්‍ය ඖෂධයෙන්, ඇස් ඉදිරියේ සාර්ථක ප්‍රතිඵල දෙන මේ මන්ත්‍රයෙන් මිනිසුන් නියම ප්‍රයෝජන නො ගන්නේ මොන අභාග්‍යයක් නිසා ද? මොන අවාසනාවක් නිසාද?

හැම දෙනා ම තණ්හාවෙන් ගැහි ගැහී **(තණ්හාය තසිතා පජා)** තණ්හාව පස්සේ දුවමින් තණ්හාව ම වැඩි කර ගනිති. පුද්ගලයන් වශයෙනුත්, ජාතින් වශයෙනුත්, රටවල් වශයෙනුත් කර ගෙන යන එකම දෙය තණ්හාව පසු පස්සේ දිවීම යි.

බුදුන් වහන්සේ ගේ දේශනාවේ ප්‍රධාන පරමාර්ථය තෘෂ්ණාව නැති කිරී ම යි.

මිනිසාට දුක් දෙන, මිනිසා බැඳ ගෙන සිටින, නිදහස නැති කරන, රටවල් අතර, ජාතීන් අතර, පුද්ගලයන් අතර ඇනකොටා ගැනීම් ඇති කරන එකම දෙය තෘෂ්ණා වයි.

තණ්හාය ජායතී සොකො
තණ්හායජායතිභයං
තණ්හාය විප්පමුත්තස්ස
නත්ථි සොකො කුතො භයං

"තෘෂ්ණාවෙන් ශෝකය උපදියි. භය උපදියි. තණ්හාව නැති තැනැත්තාට ශෝකයක් නැත. බියක් ගැන කුමන කථාද?"

මිනිසාට ඇති වන ශෝකයත්, බයත් පිළිබඳ ව දීර්ඝකාලයක් මුළුල්ලෙහි කරුණු පරීක්ෂාකර බලා එයට හේතුව හරි හැටි ම සොයා ගත් ශාස්තෘවරයා බුදුන් වහන්සේ ය. මෙය සොයා ගත්තේ මිනිස් සංහතියේ පරලොව දියුණුව පිණිස නො ව මෙලොව දියුණුව පිණිස යි. එ බැවින් බුදුන් වහන්සේ ගේ දේශනාව අනුව බෞද්ධයන් කුසල් කල යුත්තේ පින් කල යුත්තේ දියුණු විය යුත්තේ පරලොව යහපතට වඩා මෙලොව යහපත සඳහා ය. මෙලොව දියුණුව සඳහා ය. ලොව සුඛිත මුදිත වනු සඳහා ය.

බුදුහාමුදුරුවෝ පින්තූර පෙන්වා ශිෂ්‍යයන්ට මනා අවබෝධයක් ලබා දෙන දක්ෂ ගුරුවරයකු මෙන් ස්වර්ගය හා අපාය පෙන්වා මෙලොව ජිවිත සකස් කර ගන්නා හැටි උගැන් වූ ශාස්තෘවරයාණෝ ය.

දිලෙන හිරු

අර්බුද, අරගල. වෛරකම් හා දරුණු කම් ගහණ
මේ ලෝකයෙහි බුදු හිමියන්ගේ සංදේශය
ප්‍රභාශ්වර සූර්යයෙක් සේ බැබළේ. ජලකර බෝම්බ,
පරමාණු බෝම්බ පිළිබඳ යුගයේ දී
පමණ බුදු හිමියන්ගේ සංදේශය ලොවට
අවශ්‍ය වන අන් යුගයක් නොමැති තරම්ය.
බුදු හිමියන්ගේ සංදේශයෙහි ශක්තිය හා
සත්‍යතාව අවුරුදු දෙදහස් පන්සියය ගෙවී යෑම
නිසා තව තවත් අධික වූවා පමණි. අපි ඒ
අමරණීය සංදේශය සිහිපත් කොට ගනිමු. ඒ
උගැන්වීම අනුව අපගේ අදහස් හා ක්‍රියා
පටිපාටිය හැඩගස්වා ගනිමු. එම නිසා අපට
පරමාණු යුගයේ භීෂණය ට උපේක්ෂාවෙන් මුහුණ
පෑ හැකිවනු ඇත. එමෙන්ම සම්මා දිට්ඨිය හා
සම්මා වායාමය තරමකට හෝ දියුණු
කරන්නටත් අපට ඒ බුද්ධ සංදේශය ඉවහල් වනු ඇත.

ශ්‍රී නේරු ඉන්දියාවේ හිටපු අගමැති.



රජවරු, සිටුවරු, මැති ඇමැතිවරු, උන් වහන්සේ හමු වන්නට අවුත් ගරු සරු දක්වන්නට වූහ. ශාක්‍යවංශයේ රාජ කුමාරවරු සිය ගණනින් බුදුරදුන් වෙත පැවිදි වන්නට වූහ. අනේ පිඬු ආදී සිටුවරු දිනපතා රසමුසු අහරින් යුත් මහ දන් පවත්වන්ට වූහ. භික්ෂූන් වෙත මහගඟ මහ වතුරක් මෙන් සිව් පසය ගලා එන්න විය.

167 -169 පිටු බලන්න

බුදුහාමුදුරුවෝ මේ මිහිපිට උපන් මහා කාරුණිකයාණෝයි

බුදුන් වහන්සේ තුළ පැවැති මහා කරුණාව හා සමාන කරුණා ගුණයක්, බුදුවරයකුට මිස වෙන කිසිවකුට නැත. උන් වහන්සේ සැමද ම අලුයම අවදි වී මහාකරුණා සමාපත්තියට සමවැද ලෝක සත්ත්වයා දෙස බලති.

"බුදුවරයකු වශයෙන් අද මගෙන් සිදුවිය යුතු සේවය කුමක් ද? අද මම දුකෙන් සිටින්නකු කෙසේ නිදුක් කරන්නෙම් ද? විපතේ වැටී සිටින්නකු කෙසේ ගලවා ගන්නෙම් ද? වැරදි වැඩ කරන්නෙකු එයින් මුද හොඳ වැඩෙහි යොදන්නෙම් ද, කෙලෙස්වලින් හරිත වූවකු කෙසේ නික්ලේශියකු කරන්නෙම් දැ"යි

සිතමින් මහමග හිඟා කන දුගියා ගේ සිට මහමාලිගාවල රජසැප විඳින රජුන් දක්වා කිසි විශේෂයක් නැතුව, බුදු ඇසින් පරීක්ෂා කොට බලා ස්වකීය කරුණාව-සේවය, අවශ්‍ය වූ තැනැත්තා කරා පා ගමනින් හෝ සෘද්ධියෙන් හෝ ගොස්, ඔහු ගේ මෙලොව පරලොව යහපතට යෝග්‍ය වූ දහමක් දෙසා, ඔහුට කළ හැකි උසස් ම උපකාරය සිදු කොට ආපසු වඩිති.

බුදුරදුන් ගේ දිනචරියාවෙහි හෙවත් දින පතා වැඩසටහනෙහි පළමු අංකය මහා කරුණා සමාපත්තියට සමවැද ලෝකය දෙස බැලීම යි. එසේ බලා සේවයක් අනුපම සේවයක් අමරණීය සේවයක් ලෝකෝත්තර සේවයක් නොකළ එක දිනක්වත් නැත.

උන් වහන්සේ ශ්‍රෙෂ්ඨතම ජීවිතය ගත කළ අවුරුදු හතළිස්පහ මුළුල්ලෙහි දවස් අලුයම් - 16425ක් ලෝකයා වෙත මහාකරුණාව යොදවා සිදු කළ අපරිමිත, අකලංක අලෞකික සේවය මෙපමණය යි කියා නිම කළ නො හැකිය.

එකල දඹදිව විසූ මිනිස් සමාජයේ නොයෙක් තරාතිරමේ විවිධ මට්ටමේ ස්ත්‍රීපුරුෂයෝ උන් වහන්සේගේ කරුණා ඇලට අසු වූහ. ඒ අසු වූ හැම කෙනෙකුන්ට ම යහපතක් ම සිදු විය.

රජවරු, රජබිසෝවරු, කුමාරවරු, කුමරියෝ, මහසිටුවරු, මහඇමැත්තෝ, සේනාධිපතිවරු, ත්‍රිවේදපාරප්‍රාප්ත බමුණෝ, බැමිණියෝ, ගෘහපතිවරු, ගොවියෝ, කම්කරුවෝ, කසල ශෝධකයෝ, වහල්ලු, සැඩොල්ලු හා නොයෙක් ආගමික දෘෂ්ටි ගත්තෝ ඒ අය අතර වූ හ.

මිනීමරුවන්, හොරුන්, ගෝඝාතකයන්, ගණිකාවන්, සල්ලාලයන් හා යක්ෂයන් **(ආලවක)** වැනි අය ද වූහ.

බුදුහු ඔවුන්ගේ උසස්කම්, පහත්කම්, උගත්කම්, කුලීනකම්, කුලහීනකම්, දරුණුකම්, මැරවරකම් හා විෂමාචාරකම් ගැන කිසිදු තැකීමක් නො කොටහැම දෙනාට ම එක සේ සම සේ, කරුණාව පැතුරූහ. යහපත් මිනිස්සු බුදුන් වහන්සේ කරා පැමිණ උන් වහන්සේ ගේ කරුණාවට පාත්‍ර වූ හ.

බුදුන් වහන්සේ නරක මිනිසුන් සොය සොයා ඔවුන් වෙතට පා ගමනින් ම ගොස් ඔවුන්ට කරුණාව යෙදූ හ. ඔවුන් හොඳ මිනිසුන් කළ හ. මිනීමැරුවන් රහතුන් කළ හ. ගෝඝාතකයන් උපාසකයන් කළහ. මසුරු සිටාණවරුන් පරිත්‍යාගශීලීන් කළ හ. ගණිකාවන් උපාසිකාවන් කළ හ. රෝගීන් නිරෝගීන් කළ හ. බුදුන් වහන්සේ ගේ කරුණා මහිමයක හැටි බලන්න.

"සැවැත්නුවර වැසි එක් කුලදරුවාන කෙනෙක් බුදුන් වදාරණ බණ අසා සස්නෙහි ලය දී මහණ ව උපසම්පදව ලදින් තිස්ස

තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ වූ සේක. කල් යාමකින් ඇග මරණින් මුත් පිළියම්න් අසාධ්‍ය, ඉතා බලවත් රෝගයක් ඇති විය. අබඇට තරම් සීන් ගඩු ඇති වෙලා පසුව මුං ඇට තරම් ව, පසුව මෑ ඇට තරම් ව, පසුව නෙල්ලි ගෙඩි තරම් ව, අන්තිමට බෙලිගෙඩි තරම් ව පැසී ගොස් පැලී සිල් වන්ට වන සියල් සිරුර වේයන් කෑ පරඬැල් පතක් මෙන් සිදුරු විය. පසුව දවස් ගණනකින් ඇටත් බිඳින, බැලීමට අක්ෂම වූ සේක. හඳනා පොරෝනා සිවුරු පූයා හා ලෙයින් වැකී පුස් කා ගිය පැණි කැවුම් සේ විය. ශිෂ්‍ය වහන්දෑත් බැලිය නො හී අත් හළ සේක. උන් වහන්සේ ද කිසි පිහිටක් නැති ව මඤ්චපරායණව හොත් සේක.

අළුයම ලොව බලන කල සක්වළ මෝවිට පටන් වැඩ හිඳින ගඳ කිළියට නුවණ පතුරුවා බලන සේක. සවස බලන කල ගඳකිළියේ පටන් සක්වළ මෝවිට දක්වා නුවණ පතුරුවා බලන සේක.

එකල බුදුන්ගේ නුවණ දැළ ඇතුළට ඇගින් කුණු වුවත්, රහත් වන්නට නිසි පිණෙන් කුණ නු වූ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ පෙණුනු සේක. බුදුහු උන් ගේ සන්තානයෙහි මඩක තිබූ මැණිකක් මෙන් රහත්වන්ට නිසි හේතු දැක මුන් සබ්‍රම්සරුන් පිළිදගින්ට බැරි ම හෙයින් අත්හළ වූ ය. කෙලෙස් ලෙඩට පිළියම් දන්නා මා සෙසු ලෙඩටත් පිළියම් දන්නා හෙයින් මා විනා මුන්ට අනික් පිහිටක් නැත. මුන් ගේ රෝගයට ප්‍රතිකාර නොකොට කෙලෙස් පිළියම් කට නො හැක. සෙසු කරන්නවුන් නැති කල මා වත් කළමනා වේ දැයි ගඳකිළියෙන් නික්ම ගිනිහල් ගෙට වැඩ පැන් උණු කරණ හැළිය, කුසරප කලත් වළං සෝද පුරුදු බැවින්, සෝද පියා උදුනේ තබා ලා පැන් නගා ලා පැන් උණුවන තෙක් වැඩ සිටි සේක. සිට ලා පැන් අත ගාලා පැන හුණු වූ නියාව දැන තෙරුන් වහන්සේ වැඩ හොත් තෙනට ගොස් ඇඳෙන් මැත් කරන්ට ඇඳ එක් දිසාවක් අල්වා ගත් සේක.

එවේලෙහි වහන්දෑ ස්වාමීනි. වැඩ සිටිනා බව ය. අපි අල්වම්හ යි ඇඳ පිටින් ම ඔසවා ගෙණ ගිනිහල්ගෙට ගෙන සේක. බුදුහු ඔරුවක් ගෙන්වා එහි උණුපැන් වත් කරවා ලා වහන්දෑ ලවා පොරෝනා සිවුරු මැත් කරවා උණු පැනින් සෝදවා අව්වේ ලැවූ සේක. කෙලෙස්කුනට කැත ඇති පමණක් මුත්, තෙල සේ වූ කුණට කැතයක් නැති බුදුන් වහන්සේ ස්වකීය ශ්‍රීහස්තයෙන් උණු පැන් වත් කොට ඇගඋළා නැවූ සේක. නාවාපි කලට පොරෝණා සිවුර වියලින. එය ගෙණවුත් හඳවලා හඳනා සිවුරු උණුපැනින් සෝදවා අව්වේ ලවා ලූ සේක. නෑ ඇග දිය සිඳී ගත් කලට අඳනයත් වියලින උන්වහන්සේ ද අඳනයත් වැළඳගෙන පොරෝනයත් පෙරෙව පූයා කුණුහැරි ශරීරයත් ලඝුව එකගසිතින් හැඳවැඳ හොත් සේක".

*(සද්ධර්ම රත්නාවලිය - **285, 286** පිටු)*

බුදුන් වහන්සේ ගේ තත්ත්වයේ කෙනෙකු මෙබඳු රෝගියකුට මෙබඳු උපස්ථානයක් කළ බව මිනිස් ඉතිහාසයෙහි සඳහන්ව ඇති නම් ඒ මෙය යි.

"බුදුන් වහන්සේ ජේතවනාරාමයෙහි වස් වසා පවාරණය කොට, අගසව්වන් දෙනමත් සමග දක්ෂිණාගිරියට චාරිකාවෙහි යන්නෙමැ" යි සුදනම් වූ සේක. කොසොල් රජු ද, අනේ පිඬු සිටුවරයා ද, විශාඛා මහා උපාසිකාව ද අනික් බොහෝ දෙනා ද නො වඩින ලෙස අයැද සිටි නමුත් උන් වහන්සේ ගේ ගමන නවත්වන්නට නො හැකි වුහ.

අනේපිඬු සිටුතුමා ගෙදර ගොස් බුදුරදුන් නවත්වා ගන්නට බැරි වුනා ය යි ඉතා දුක්මුසු ලීලාවෙන් කල්පනා කරමින් සිටියේ ය. ඒ දුටු ඔහුගේ පුණ්ණා, නැමැති දාසිය,

"ශ්‍රමණ ගෞතම තෙමේ පවුල් වඳ කිරීම පිණිස, වැන්දඹුවන් ඇතිකිරීම පිණිස, කුල නැසීම් පිණිස වැඩ කරන්නේය. දහසක් ජටිලයන් මහණ කෙළේය. සඤ්ජය අතවැසි දෙසිය පණසක් පරිබ්‍රාජකයන් මහන කෙළේ ය. මගධරට වැසි උසස් කුල පුත්‍රයෝ මහණ වෙති. මීලගට කවුරුන් මහණ කරාවිද දන්නේ නැහැ"යි මිනිස්සු බුදුරදුන්ට දෙස් පවරන්ට, බනින්නට, අගුන කියන්නට, ගරහන්ට පටන් ගත්හ.

169 පිටුව බලන්න

"ස්වාමීනි, වෙනද මෙන් නො ව අද ඔබ තුමා ඉතා දුක්මුසු ලීලාවෙන් සිටින්නේ ඇයි දැ" යි ඇසුවාය.

"ඔව් පුණ්ණා, බුදුන් වහන්සේ චාරිකාවට වඩින්නට සූදනම්, උන්වහන්සේගේ ගමන නවත්වන්ට උත්සාහ ගත් නමුත් නො හැකි වි ය" යි සිටුතුමා කීය.

එවිට පුණ්ණා දසිය

"ස්වාමීනි, මා බුදුන් වහන්සේ නතර කර දුන්නොත් ඔබ මට කුමක් කරන්නෙහි දැ"යි ඇසුවාය.

"වහල් භාවයෙන් මුදවන්නෙමැ"යි සිටුතුමා කීය.

එවිට පුණ්ණා දසිය වේගයෙන් දුව ගෙන ගොස් බුදුරදුන් හමුව පාමුල වැඳ වැටී

"අනේ ස්වාමිනි වඩින්නට එපා. නවතිනු මැනවැ"යි අයැද සිටියා ය.

එවිට බුදුහු

"මගේ නැවැතිමෙන් තොපට ඇති ප්‍රයෝජනය කුමක් දැයි ඇසූහ.

"අනේ ස්වාමීන් වහන්ස, මම දසියක්මි. වහලියක්මි. ඔබ වහන්සේ නැවතුනොත් මට වහල් භාවයෙන් මිදිය හැකිය. වහල් භාවයෙන් මිදුනොත් මට තිසරණයෙහි පිහිටා පන්සිල් අටසිල් සමාදන් වී හුගක් පින් කරගත හැකි" ය යි කීවාය.

ඇය ගැන අනුකම්පාකළ බුදුහු ඇගේ වහල් භාවයෙන් මිදීමත්, අන්තිමට මහණ ව රහත්වීමත් ගරු කොට සලකා ඇගේ ඉල්ලීම පිළිගෙන එක වර ම නැවති ආපසු ජේතවනාරාමයට වැඩි සේක. මෙය ඇසූ සැවැත් නුවර මහජනයා පුදුම විය. කොසොල් රජු ද අනේ පිඩුසිටුතුමා හා විශාකා මහා උපාසිකාව ද පුණ්ණා දසිය කළ හපන්කම ගැණ අතිශයින් පැසසූහ. රටේ රජතුමාත් මහා ධනවතාත් මහ උපාසිකාවන් කළ ඉල්ලීම නොපිළිගත් බුදුහු ඒ මහා ධනවතා ගේ ගෙදර වහල් මෙහෙයෙහි යෙදී සිටි දසියක් කළ ඉල්ලීම පිළිගත්හ. ඒ පිළිගැනීම නිසා ඒ තරුණිය වහල් මෙහෙයෙන් නිදහස් වූවාය. බුදුරදුන්ගේ කරුණා මහිමයක හැටි බලන්න. රජු ද සිටුවරයා හා විශාඛාව ද මේ සම්බන්ධයෙන් බුදුරදුන් ගැණ පැහැදුනා මිස අමනාප නුවූහ. පුණ්ණා දසිය සිටුගෙයි වහල් මෙහෙයන් මිදී භික්ෂුණී ආශ්‍රමයෙහි මහණ ව රහත් වූවාය."

(මනෝරථ පූරණී - සත්තක නිපාත වණ්ණනා)

බුදුරදුන් අනුන්ට ඇති කරුණාව - සේවය කිරීමේ ඕනෑකම කොතරම් දැ යි කියතොත්

"ස්වකීය හදවත දැකීමෙන් වුවත් සත්‍යාවබෝධ කර ගන්නා කෙනෙකු හමු උණොත් ඔහුට ස්වකීය හදවත සෘද්ධිබලයෙන් එළියට ගෙන හෝ දක්වන්නේ ය." **(යදි මහාරාජ කොචි භගවතො හදයං දිස්වා බුජ්ඣෙය්‍ය, තස්සපි භගවා යොගෙන හදයං දස්සෙය්‍ය)**

(මිලින්ද පඤ්හය - 154 පිටුව)

මෙයින් බුදුරදුන් තුළ පැවැති මහාකාරුණික ගුණ කොතරම් දැයි ඔප්පු වේ.

"චුන්ද ය, ශ්‍රාවකයන්ට ඉතා ම හිතවත් අනුකම්පාව ඇති ශාස්තෘවරයකු විසින් අනුකම්පාවෙන් ම යමක් කරන්ට තිබේද? ඒ සියල්ල මම නුඹලාට කෙළෙමි. චුන්දය, මේ තියෙන්නේ ගස්මුල් **(රුක්ඛමූලානි)**, මේ තියෙන්නේ ශූන්‍යාගාර **(සුඤ්ඤාගාරානි)**, චුන්දය, ධ්‍යාන වඩන්න. (භාවනා කරන්න), ප්‍රමාද වන්නට එපා. පස්සෙ දුක් වන්නට කණගාටු වන්නට එපා. මේක තමයි නුඹලාට කරණ මගේ අනුසාසනාව."**("යං බො චුන්ද සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදය. කතං වො තං මයා, එතානි චුන්ද,**

රුක්ඛමුලානි, එතානි සුඤ්ඤාගාරානි. ඣායථ චුන්ද මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ අයං වො අම්හාකං අනුසාසනීති")

(මජ්ඣිම නිකාය - සල්ලේඛ සූත්‍රය)

අංගුලිමාලයා දහස් ගණනක් මරා ඇඟිලිකපමින්, කපන කපන ඇඟිලි කුණු වන බැවින් "අද මගේ මෑණියන් ආවත් ඇගේ ඇඟිලි කපා හරි දහස පුරවා නිම කරමි" යි සිතා සිටි දින ඇත්තෙන් ම මෑණියෝ පුතා දකින්නට මහ වනයට යමින් සිටියහ.

බුදුරදුන් ලොව බලන විට අංගුලිමාලයා දැක අද මා එහි නො ගියොත් ඔහු තම මව මරා ආනන්තරිය පාපයක් කර ගන්නේ යයි දැන, ඔහු වෙත මහාකරුණාව යොදවා, පාගමනින් ම එහි ගොස්, ඔහු දමනය කොට මහණ කරවා රහතන් වහන්සේ කෙනෙකු බවට පත් කළ හ. අංගුලිමාලයා මිනීමරුවෙකැයි ඔහු දුරින් ම දුරු නො කොට ඔහු කරා ගොස් ඔහු තුළ සැඟ වී තිබුණු හොඳ ගුණ ඉස්මතු කොට ඔහු සඳහටම හොඳ මිනිසකු කළ හැකි වූයේ බුදුරදුන් ගේ මහා කරුණාවේ බලමහිමය නිසා ය.

"සැවැත් නුවරට නුදුරු පෙදෙසක එක් ගොවියෙක් කුඹුරක් සී සෑවේ ය. එදිනට ඉස්සරින් ද රාත්‍රි හොරු රංචුවක් සැවැත් නුවර පොහොසත් ගෙයකට ඇතුල්ව රන්රුවන් ආභරණ හා දහසක් බැඳි පියල්ලක් ද ගෙන පැන ගොස් ඒ කුඹුරට ඇතුල්ව, බෙදා ගන්නාහු හදිසියේ බය වී දහසක් බැඳි පියල්ල අමතක ව, අනෙක් බෙදගත් වස්තුවක් රැගෙන පැන ගිය හ.

එදින අළුයම බුදුහු ලොව බලන කල මේ අහිංසක ගොවියා වැටෙන අමාරුව දැක, ඔහු කෙරෙහි කරුණාව යොදවා, අනඳ මහතෙරුන් ද කැඳවා ගෙන එම කුඹුරට වැඩියහ. ගොවියා බුදුරදුන් දැක ළඟට අවුත් වැඳ නැවත සී සෑමෙහි යෙදුනේ ය. බුදුහු කුඹුරේ පසෙක තුබුණු, එතෙක් ගොවියා නුදුටු දහසක් බැඳි පියල්ලදැක අනඳ තෙරුන් අමතා ඒ පියල්ල දෙසට අත දිගු කොට,

"ආනන්දය අර සර්පයා දුටුවෙහි දැ" යි ඇසූහ.

"එසේය දුටුවෙමි" යි අනඳ තෙරහු පිළිතුරු දුන් හ.

මෙය අසා සිටි ගොවියා බුදුරදුන් හා අනඳ තෙරුන් කුඹුර පසු කොට ගිය කල්හි බුදුරදුන් අනඳතෙරුන්ට පෙන්වූ සර්පයා මරා දමමියි කෙවිටක් ගෙන එය ලඟට ගිය විට සර්පයකු නො ව රන් පියල්ල දැක, එය රැගෙන වේල්ල මත තබා පස් ටිකකින් වසා සීසාන්ට පටන් ගත්තේ ය. පෙර දින රාත්‍රි කළ හොරකම ගැන පසු දින නගරය පුරා ආරංචි විය. නොයෙක් දෙනා මේ සොරකම ගැන සොයන විට ඉන් කෙනෙකුට කුඹුරේ වේල්ල මත තුබුනු රන් පියල්ල අසුවී ගොවියා අල්ලාගෙන රජු වෙත ගෙන ගිය හ.

රජු නඩුව අසා ඔහුට වද දී මරන්ට නියම කෙළේය. රාජපුරුෂයන් ඔහුට වද දීදී ගෙන යන විට "ආනන්දයෙනි" සර්පයා දුටුව ද? "එසේය දුටුවෙමි" එසේය දුටුවෙමි" යි කියමින් ගොවියා හඬන්ට විය. ඒ ඇසූ රාජ පුරුෂයෝ එසේ කීමට හේතු විමසා ඒ බව රජුට දැන්වූහ. රජු ගොවියා ආපසු ගෙන්වා ගෙන, බුදුරදුන් ලගට එක්කර ගෙන ගොස් සියලු පුවත් සැළකර සිටියේ ය. බුදුහු

"තමන් වහන්සේ අනඳ තෙරුන් සමග මේ ගොවියා සීසාන කුඹුර ලගට ගිය බවත්, දහසින් බැඳි පියල්ල දැක එය සර්පයෙකැයි කී බවත් ඒ සියල්ල කළේ මොහුට ඇති කරුණාව නිසා බවත්, මා එසේ නොගියේ නම් ඔබ මොහු මා වෙතට කැඳවා ගෙන එනු වෙනුවට, මරවා දමන බවත්"

මහා ප්‍රජාපති ගෝතමී දේවිය බුදුන් උදෙසා ම සියතින් කපුකැට, නූල්තනා, රෙදි වියා සකස් කළ අගනා වස්ත්‍රයක් බුදුරදුන්ගේම ප්‍රයෝජනය පිණිස යොදවන්නට යැයි කියා පිළිගැන්වූ විට එය පිළිනොගෙන "ගෞතමිය සංඝයාට දෙන්න. සංඝයාට දුන් විට මටද දුන්නා වෙයි. සංඝයාට ද දුන්නා වෙයි."

169 -170 පිටු බලන්න

පවසමින් ඔහු ගේ අහිංසකත්වය පෙන්නූ හ. බුදුරදුන්ගේ සාක්කියෙන් නිදෙස් වූ ගොවියා රජු විසින් නිදහස් කරනු ලැබී ය."

(සද්ධර්ම රත්නාවලිය - එක්තරා කර්ශකයක්හු ගේ වත)

සිය සැමියාත්, දරු දෙදෙනාත්, මවත්, පියා සහ සහෝදරයාත් යන පස්දෙනෙකුගේ හදිසි මරණයෙන් ශෝකාකුල වී පිස්සු වැටී, මහ මග දුවමින් ගොස් බුදුරදුන් සිවුවණක් පිරිසට දහම් දෙසද්දී ඇඳි වතට පවා අහිමිව, බුදුරදුන් ඉදිරියට පැමිණි අසරණ අනාථ, අහිංසක පටාචාරාව කෙරෙහි කරුණාව දැක්වූ එකම තැනැත්තා බුදුන් වහන්සේ යි.

ඇගේ අතීතයත්, ඇගේ අතිශය සංවේගදයක තත්ත්වයක් ගැන කිසිත් නො දත්, එහි සිටි පිරිස ඈ එළවා දමද්දී එය නතර කළ බුදුහාමුදුරුවන්

"නැගනියනි, සිහි එළවා ගන්න" යයි කී කරුණාබර වදනින් ඇයට හොඳ සිහිය ලැබුණේ ය. ඇය රජසැප විඳපු සිටු දුවනියක බවත්, සිටුමාලිගයෙහි විසූ වැඩකාර කොල්ලකු සමග පැන ගොස් කුලියට වී කොටා ජීවත් වීමෙන් දුක් වින්ද තැනැත්තියක් බවත්, ඇගේ සැමියාත්, දරු දෙදෙනාත්, මවුපිය දෙදෙනාත්, සහෝදරයාත් යන පස් දෙනෙකුන්ගේ මරණයෙන් හටගත් ශෝකයෙන් පිස්සියක්ව සිටි බවත්

දත් එකම තැනැත්තා බුදුහාමුදුරුවෝ යි. ඒ නිසා ම ඇය කෙරෙහි මහාකරුණාව යොදවා ඇය රහත් මෙහෙණින්නක බවට පත් කළහ.

දරුවන් වඩාගෙන. අතින් එල්ල ගෙන නගරවල වීථි දිගේ ඇවිදින භිගන්නියන් ගේ අතීතය දෙස හාරාපාරා බැලුවොත්, පටාචාරවන් කී සියයක් දැක්ක හැකිද? එබඳු එකියක් ගැන බුදුහාමුදුරුවන් ම හැර වෙන කවරෙක් ශ්‍රේෂ්ඨ මිනිස් ගුණයක් වූ කරුණාව යොදවා ඇද්ද?

දිනක් බුදුහු අලුයම ලොව බලද්දී උන් වහන්සේ ගේ කරුණාදැලට මිථ්‍යාදෘෂ්ටිගත් බමුණෙක් අසු විය. ඒ බමුණා ගඟක් අසල කුඹුරක් කරමින් සිටියේ ය. බුදුහු එහි ගොස් ඒ දෙස බලාගෙන සිටි ය හ. බමුණා බුදුන් දැක කිසි ගණනකට නොගෙන කුඹුරේ වැඩ කෙළේ ය. බුදුහු

"බමුණ කුමක් කෙරේ දැ" යි ඇසූහ.

එවිට බමුණා,

"ශ්‍රමණ ගෞතමය, මම කුඹුරක් ඉදි කෙරෙමි" යි කී ය.

බුදුහු එපමණකින් ආපසු හැරී විහාරයට වැඩිය හ. දෙවෙනි දවස ද එහි ගොස්

"බමුණ, කුමක් කෙරේදැ" යි විචාළහ,

"ශ්‍රමණ ගෞතමය, වී වපුරමි"යි කී ය.

බුදු එපමණකින් හැරී ආපසු විහාරයට වැඩිය හ. ඉන් පසු ගොයමේ වල් නෙලන දවසේ එහි ගොස්

"බමුණ, කුමක් කෙරේදැ" යි ඇසූ හ.

ගෞතමය, ගොයමේ වල් නෙලමි" යි කී ය.

බුදුහු එපමණකින් කතාව නවත්වා විහාරයට වැඩිය හ. ඉන්පසු ගොයම් රක්නා දවසක් බලා බුදුහු එහි ගොස්

"බමුණ කුමක් කෙරේ දැ" යි විචාළහ.

"භවත් ගෞතමය, මම ගොයම රකිමි" යියි කී ය.

කියා මෙසේ සිතී ය. "මේ තැනැත්තා මගේ කුඹුර බිම් තනන, වපුරන, නෙලන, ගොයම් රකින හැම දිනක ම මෙහි පැමිණ කුමක් කරනවා දැ" යි ඇසිය. එබැවින් ගොයම් පැසුනු විට මොවුට කොටසක් දෙමි" යි සිතා.

"ශ්‍රමණය, මේ කුඹුරේ ගොයම් පැසුන විට ඔබට නො දී මම තනියම නො කම්. ඔබ මෙවන් පටන් මාගේ යාළුවෙකැ"යි බමුණා

කිය. බුදුහු එය ද අසා සිට වෙහෙරට වැඩිය හ.

කල්යෑමේදි ගොයම් පැසී කපන්නට සිතා සිටි දිනට පෙරදින රාත්‍රි මහ වැස්සක් වැස ගොයම් යට වී විනාශ වී ගියේය. බමුණා එහි ගොස් ඒ විනාශය දැක මේ කුඹුරේ වැඩ පටන් ගත් දින සිට වී වපුරා, ගොයම් පැලවී, වී පැසෙන තෙක් ම බුදුහු මේ කුඹුර බලන්ට පැමිණිය හ. අස්වැන්නෙන් භාගයක් දෙන බවට ද පොරොන්දු වීමි. එහෙත් ගොයම් ද විනාශ විය. පොරොන්දුව ද ඉටු කළ නොහැකි වී යැයි ඉතා ශෝකයට පැමිණ ගෙදරට වී වැද හොත්තේ ය.

බුදුහු එදින කුඹුරට නොගොස් කෙලින් ම බමුණා ගේ ගෙදරට ගොස් බමුණා කොයිදැයි ඇසූහ. ගොයම් විනාශ වූ දුකින් පෙළෙමින් ගෙය තුළ සිටින බව ගෙයි ඇත්තෝ කිහ. බුදුහු ඔහු ළඟට ගෙන්වා ගෙන,

"කුමක් නිසා ශෝකයෙන් සිටින්නෙහි දැ යි අසා ශෝකයට හේතුව තෘෂ්ණාව බවත් **(තණ්හාය ජායති සොකො)** තෘෂ්ණාව නැතිතැන ශෝකය හා භය සඳහට ම නැති බවත් **(තණ්හාය විප්පමුත්තස්ස නත්ථි සොකො කුතො භයං)** වදාළ හ."

බුදුබණ ඇසූ බමුණා සෝවාන් විය."

බුදුරදුන්ගේ කරුණා මහිමයට පාත්‍රවීමේ භාග්‍යය ඇත්තා කවරකු වුවත්, ඔහු කොතැනක සිටියත් බුදුරදුන් එහි එක් වරක් නො ව කිපවරක් හෝ තනියම හෝ ශ්‍රාවකයන් සමග හෝ එහි වැඩම කොට ඔහුට සෙතක් ම සිදුකළහ. උන්වහන්සේ ගේ මහාකරුණාව යෙදවීමේ දී ගොඩ බිමය, ජලය ය, කඳු මුදුන් ය, ගිරිදුර්ග ය, කුඹුරු ය, මඩගොහොරු ය යි කිසි සැප පහසු කමක් ගැන නො තැකූ හ.

බුදුන් වහන්සේ එක් දුප්පත් මිනිසකු සුබිත කරුණු සඳහා පන්සියයක් භික්ෂූන් සමග දෙළොස් ගව්වක් දුර ගොස් අලව්නුවරට වැඩිය හ. එනුවර වැස්සෝ බුදුපාමොක් මහා සංඝයා ගෞරවයෙන් පිළිගෙන උන් වහන්සේලා වෙනුවෙන් දවල් දනය පිළියෙල කළ හ. එනුවර දුප්පත් මිනිසකු බුදුරදුන්ගෙන් බණ අසන්නට ඉතා කැමැත්තෙන් සිටියේ තම ගොනෙකු නැති වීම නිසා බණ අසන්ට නො ගොස් ගොනා සොයන්ට ගියේ ය. බොහෝ වේලාවකට පසු ගොනා සොයා ගෙන අවුත් ගෙවත්තේ ගහක බැඳ ප්‍රමාද වී වුවත් බණ අසන්ට යමි" යි පිටත් විය.

බුදුහු දන් වළඳ අවසානයෙහි අර දුප්පත් මිනිසා එනතුරු දහම් නො දෙසා වැඩ සිටිය හ. බඩසයින් පෙළෙමින් ආ ඒ මිනිසා දැක වළඳ ඉතුරු වී ඇති දෙයින් යමක් ඔහුට කෑමට දෙන ලෙස දන් දුන් දයකයින් ගෙන් කෙනෙකුට කී හ. ඔහු ඒ දුප්පතාට කෑම ටිකක් දුන්නේ ය. දුප්පතා ආහාර අනුභව කොට බුදුරදුන් වෙතට පැමිණි විට බුදුහු බණ කියන්ට ගත් හ. බණ ඇසූ බොහෝ දෙනා මෙන් ම ඒ දුප්පතා ද සෝවාන් ඵලයෙහි පිහිටියේය." බුදුරදුන්ගේ මේ ක්‍රියාව දුටු ශ්‍රාවකයෝ පුදුමයට පත් වූ හ. ඒ බව දැන ගත් බුදුහු

"එය පුදුම විය යුත්තක් නො වන බවත්, දෙළොස්ගව්වක් මග ගෙවා එහි පැමිණියේ බණ අසනු සඳහා ම බවත්, කුසගින්නේ සිටියකුට ඒ කුසගිනි නො නිවා බණ කීමෙන් ප්‍රයෝජනයක් නැති නිසා එසේ කළ බවත්" වදාළ හ.

බුදුරදුන් ගේ කරුණා මහිමයක හැටි මෙයින් සිතා ගත හැකි යි.

"බුදුන් වහන්සේ ලග මහණ වූ මහාපන්ථකය, චුල්ලපන්ථක ය යි භික්ෂූන් දෙනමක් සිටිය හ. ඉන් චුල්ලපන්ථක හිමියන්ට පෙර කළ කර්මවිපාකයකින් එක් ගාථාවක් සාරමසක් කටපාඩම් කොටත් උගත නොහැකි විය. ගාථාවේ මුල් පදය පාඩම්



යම් කිසි භික්ෂුනමක් වරදක් කළ විට සංඝයා රැස් කරවා, ඒ ඉදිරිපිටට වරද කළ භික්ෂුනම ගෙන්වා ඔහුට විරුද්ධ ව ඇති චෝදනාව ඉදිරිපත් කොට අසවල් විනය නීතිය අනුව වැරැදිකරු බව ඒත්තු ගන්වා ඔහුට නියමිත දඬුවම තුන්වරක් කියවයි. එයට පසු දඬුවම පිළිබඳ ව සියලු ම සංඝයා ගේ අනුමැතිය හා අනුකූලතාව ලබා ගෙන දඬුවම පමුණුවයි. ඡන්න නමැති භික්ෂුනමට දඬුවම් කරණ ලෙස නියම කළහ.

171 පිටුව බලන්න

කොට දෙවන පදයට ගිය කල මුල් පදය අමතක වෙයි. තුන් වන පදයට ගිය කල දෙවන පදය අමතක වෙයි. හතර වන පදයට ගිය කල තුන් වන පදය අමතක වෙයි.

මේ ගැන කළකිරුණු වැඩිමහල් සොහොයුරු මහාපන්ථක තෙරණුවෝ "එක් ගාථාව සාර මසකින් උගත නො හෙන ඔබ ලක්‍ෂ ගණන් පමණ වූ තෙවළා බුදුවදන් කොතෙක් කලිනුත් උගත හෙව් ද? එබැවින් සිවුරු හැර යව"යි කී හ. එසේ වුවත් චුල්ල පන්ථක මහණ කමේ සිටීමට කැමැති බැවින් යාමට මැලි වී ය. එදින ජීවක මහාවෛද්‍යවරයා මහාපන්ථක තෙරුන් හමු වීමට අවුත් බුදුරදුන් ලග භික්ෂූන් කොපමණ සිටිත්දැ? යි අසා, පන්සියයක් දෙනා වහන්සේ සිටින බව කී විට ඒ පන්සියයක් දෙනා වහන්සේ ම ඔහුගේ ගෙදර දනට වැඩම කරණ ලෙස ආරාධනා කෙළේය.

එවිට මහාපන්ථක තෙරණුවෝ" "උපාසකයාණනි, චූල්ලපන්ථකයන් නුවණ මඳ හෙයින් ශාසනයට යෝග්‍යනො වේ. ඔහු හැර අනික් භික්ෂූන් වහන්සේලා දනට වඩිති"යි පැවසුහ. මෙය අසා සිටි චුල්ල පන්ථක හිමි මගේ සහෝදරයාට මා හොඳට ම එපා වෙලා යයි සිතින් සිතා, දෙවන දවස් අළුයම සිවුරු හැර යන්ට ඉටා ගත්තේ ය.

බුදුහු දවස් පතා දෙළොස් කෙළ ලක්‍ෂයක් අර්හත් ඵල සමාපත්තියට හා දෙළොස් කෙළ ලක්‍ෂයක් මහා කරුණාසමාපත්තියට සමවදනා හෙයින් දවස මුළුල්ලෙන් කැටි ව සුවිසි කෙළ ලක්‍ෂයක් පමණ සමවතින් නැගී අළුයම ලොව බලන සේක් මේ කාරණය දැක පළමු කොට ම වැඩ, චුල්ලපන්ථක හෙරණුන් දැ සිවුරු හරණට නික්මුණු මග දෙරටුව කෙරේ සක්මන් කොට වැඩ සිටි සේක. බුදුහු ඔහු ගෙන් තොරතුරු අසා "තෙපි රඳව"යි මොළොක් බසින් වදරාලා බස මොලොකට නො අඩු, ඉතා මොළකැටි අතින් උන් වහන්සේ ගේ හිසත් පිරිමැද කැඳවා ගෙන ගිය හ.(*සද්ධර්මරත්නාවලිය - චුල්ලපන්ථක නම් තෙරුන්ගේ වස්තුව*)

හගවා තත්ථ ආගඡ්ජි
සීසං මය්හං පරාමසී
බාහාය මං ගහෙත්වාන
සංගාරාම පවෙසයි

"භගවත් තෙමෙ එහි පැමිණියේ ය. මගේ හිස අත ගෑවේ ය. මගේ අතින් අල්ලා සංඝාරාමයට එක් කර ගෙන ගියේ ය."

(723 අපදනපාලි - චුල්ලපන්ථකථෙරස්සපදනං)

මේ ගාථාව චුල්ලපන්ථක තෙරුන් ගේ ප්‍රකාශයකි. කටපාඩම් බැරි නිසා වැඩිමහල් සහෝදර භික්ෂූනම විසින් එළවා දමනු ලැබ සිවුරු හැර යන්නට සූදනම් ව සිටි අහිංසක සාමණේර නමකට දයාබර පියකු විසින් සෙනෙහෙබර පුතකුට දක්වන විදියේ කරුණාව හා දයාව දැක් වූ බුදු හාමුදුරුවෝ ඔහු ගේ හිස අත ගා අතින් අල්ලා ගෙන ගොස් පිරිසිදු රෙදිකැබෙල්ලක් දී ඉර පායන දෙස බලා ගෙන

"රජෝහරණං, රජෝහරණං"

කියමින් එය පිරිමදින ලෙස උගන්වා ජීවකයා ගේ ගෙදර දනට වැඩි ය හ.

වැඩි වේලාවක් යන්නට පෙර චුල්ලපන්ථක හෙරණුන් රහතන් වහන්සේ කෙනෙකු- වශයෙන් එම දනයට ම ගෙන්වා ගත් හ. බුදුරදුන් ගේ මහාකරුණාවක හැටි බලන්න.

රජගහනුවර **බිම්බිසාර** රජු හා තක්ෂිලාවේ **පුක්කුසාති** රජු අතර දෙරටේ වෙළඳුන් මගින් මිත්‍රත්වයක් ඇති විය. බිම්බිසාර රජු පඬුරු පාක්කුඩම් යවන

අතර බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධරත්නය තම නගරයෙහිඇති බව රන් පතෙක ලියා පුක්කුසාති රජු වෙත යැවී ය.

එය ඇසූ පමණින් **සිදුහත්** කුමරුන් මෙන් පුක්කුසාති රජු සියලු රජ සැප අත්හැර බුදුරදුන් දැක ගනු සඳහා රට වැසියන් හඬා වැටෙද්දී කහවතක් හැඳ, කහවතක් පොරවාගෙන රජමැදුරෙන් නික්මුනේ ය. මෙ තරම් දුර ගමනක් තනි ව යා නොහැකි බැවින් වෙළෙඳමේ යන ගැල් සමුහයක් පසු පස්සේ දවස් කිපයකින් යොදුන් 192 ක් දුර ගොස් රජගහ නුවරට පැමිණ බුදුරදුන් කොහි වැඩ සිටිනවා දැ? යි අසා, බුදුන් වැඩ සිටින සැවැත් නුවර පසු කොට යොදුන් 45 ක් පැමිණ ඇවිත් ඇතැයි මිනිසුන් කි විට එදින ආ පසු යා නො හැකි බැවින් රාත්‍රි නවාතැන් ගනු සඳහා පැවිද්දන් පැමිණි විට නවතින තැනක් ඇත් දැයි, විමසා බලා, කුම්භකාර ශාලාවක් ඇති බව අසා, එහි ගොස් කුඹලා ගෙන් අවසර ගෙන විඩා හරිමින් සිටියේ ය. බුදුහු,

"අද මගේ කරුණාව යොදවන්නේ කවරකු කෙරෙහි ද? අද මා සේවය කරන්නේ කවරකුට දැ" යි බුදු ඇසින් ලොව බලන විට තමන් රජසැප අත්හැර දැමූ විලසින් ම රජසැප අත්හැර දමා. තමන් වෙනුවෙන් ම පුක්කුසාති රජු, රජගහනුවරට එන බවත්, පසු දින උදේ හදිසි අනතුරකින් අනාථ ව මිය යන බවත්, දැක"

පාසිවුරු ගෙන චාරිකාවේ යන මහණකු මෙන් වෙස් වලා ගෙන සැවැත්නුවරින් පිටත්ව, රජගහනුවරට අවුත් පුක්කුසාති රජු සිටි කුඹල්හල ලගට ගොස් එහි රෑ යක් ගත කිරීමට ඉඩ දිය හැකි දැයි කුඹලා ගෙන් ඇසූහ. පළමුවෙන් පැමිණි තවුසකු නවාතැන් ගෙන සිටින බවත් ඔහු කැමැති නම් නැවතුනාට කාරි නැති බවත් කුඹලා කි ය. එවිට බුදුහු කුඹල් හලට ඇතුල්ව එහි සිටි පැවිද්ද ලගට ගොස්,

"ඔබ කැමැති නම් මටත් මේ ශාලාවේ රෑ යක් ගත කරන්ට ඉඩ දිය හැකි දැයි ඇසූහ.

හොඳයි හිටියට කාරි නැත". යි

තවුසා කි බැවින් බුදුහු ද වලන් කැබිලිති, කුකුලන් ගේ හා ඌරන්ගේ කැතකුණු, දූවිලි ආදියෙන් පිරුණු ශාලාවෙහි ඉඳ ගත් හ.

දැන් මේ වලන් තනන මඩුවේ බිම වාඩි ව සිටින්නේ රාජ්‍ය සම්පත් අත්හළ පුදුම තවුසන් දෙදෙනෙකි. එක් කෙනෙක් සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනින්ද්‍රයන් වහන්සේ ය. අනෙක් තැනැත්තා යොදුන් 100 කට වඩා විශාල මහාරාජ්‍යක් හා රජසැප අත් හැර දමා පැවිදි ගත් **පුක්කුසාති** රජ්ජුරුවෝ ය.

මේ මහා පුරුෂයන් දෙදෙනා පයින් ඇවිද විඩාවට පත් ව සිටි බැවින් වචන කිපයකින් පහත සඳහන් ලෙස පිළිසඳර කථා කොට ධ්‍යානයට සම වැදුනා හ.

බුදුහු: ඔබ කවරෙක් ද? කොහි සිට මෙහි පැමිණියෙහිද?

පුක්කුසාති: මම තක්ෂිලා නුවර පුක්කුසාති රජු.

බුදුහු: ඔබ පැවිදිවුනේ කා වෙනුවෙන් ද? මෙහි පැමිණියේ කුමක් නිසා ද?

පුක්කුසාති: මගේ මිත්‍ර බිම්බිසාර රජු රජගහ නුවර බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධරත්නය තිබෙනබව රන්පතෙක ලියා යවා තුබුනා. ඒ ඇසූ කෙණෙහි මම රාජ්‍ය අත් ඇරලා වෙළෙඳ හලකින් කහවත් දෙකක් ගෙන්වා ගෙන ඇඳ පොරොවා ගෙන ඒ උතුම් බුදුහාමුදුරුවන් දැක ගැනීම පිණිස ආවෙමි. උන් වහන්සේ වැඩ ඉන්නේ සැවැත් නුවර ය කියා මෙහි දී දැන ගත්තා. රෑ බෝ වු නිසා මෙහි නැවතුනා.

හෙට උදේ උන් වහන්සේ දැක ගන්ට යනවා.



බුදුරදුන්ගේ බණඅසා පැහැදී ප්‍රීතියෙන් පිනාගිය බමුණෙක් මෙසේ කරයි. ඉක්බිති බ්‍රහ්මායු බමුණා අසුනෙන් නැගිට, උතුරුසළුව සකස් කොට පොරවා, භාග්‍යවතුන් වහන්සේ ගේ පා මත හිසින් වැටී උන්වහන්සේ ගේ පා දෙක මුවින් සිඹියි. ඇතින් පා පිරිමදියි. "භාග්‍යවතුන් වහන්ස, මම බ්‍රහ්මායු නැමැති බමුණා වෙමි" යි තම නම කියා හඳුන්වා දෙයි. 88 පිටුව බලන්න

බුදුහු: ඔබ බුදුන් දැකල ම නැද්ද?

පුක්කුසාති: නැහැ

බුදුහු: හොඳයි දැක්කොත් ඇඳින ගන්න පුළුවන් ද?

පුක්කුසාති: බැහැ

පිළිසඳර කථාව මෙපමණය. දෙදෙනාම නිශ්ශබ්ද වූ හ. එළි වෙන යාමයෙහි බුදුහු පුක්කුසාති තවුසාට දහම් දෙසූහ.

දහම් ඇසූ පුක්කුසාති රාත්‍රියෙහි තමා සමග සිටි තවුසා බුදුන් වහන්සේ බව හැඳින "ඇවැත්නි ය" යි කළ ආමන්ත්‍රණය ගැන සමාව අයැද සිටිමින් පැවිද්ද හා උපසම්පදව ඉල්ලීය.පාත්‍ර සිවුරු සොයා ගෙන එන්නට යයි බුදුරදුන් කී විට පුක්කුසාති තවුසා කුඹල්හලින් පිටත් ව ගොස් කසල ගොඩක දැමූ රෙදි කැබෙල්ලක් සොයමින් ඇවිද්දේ ය.

මේ අතර බුදුහු සෘඩියෙන් දෙවුරමටවැඩිය හ. තරුණ එළදෙනෙක් කුලප්පු වී කසළගොඩ අවුස්සමින් සිටි පුක්කුසාති තවුසාට අං දෙකෙන් ඇනීම නිසා ඔහු එතැන ම ජීවිතක්‍ෂයට පත් වී ය. අනාගාමී ව සිටින තවුසා මිය ගොස් අවිහ බඹලොව ඉපිද රහත් විය.

බිම්සර රජුට මේ පුවත අසන්ට ලැබී මහත් ගරුබුහුමනින් සිරුර ආදහනය කොට ධාතු ගෙන නිදන් කොට චෛත්‍යයක් බැන්දවිය.

(මජ්ඣිම නිකාය - ධාතු විභඞ්ග සූත්‍රය)

මේ කතා පුවතින්ද බුදුරදුන් තුළ පැවැති කරුණා මහිමයක හැටි සිතාගත හැකිය.

බුදු දහම අන්‍ය ආගම්වලට අභියෝගයක්

සෙසු සියලු ආගම්වලටම තාමත් අභියෝගයක් වන්නේ
මනඃකල්පිත ආදි කාලීන දර්ශනවාදය නොව
සත්‍යවශයෙන්ම වාර්තාගත වී තිබෙන බුදුසමයයි.

බිෂොප් ගෝර් "බුදුහිමියන් සහ ක්‍රිස්තුස්වහන්සේ" නම් ග්‍රන්ථයෙන්.

අකාරුණික වචනයක් නැහැ

බුදුහිමියන් කෝපයෙන් බැන වදුණු
කිසිම අවස්ථාවක් නොමැත. කිසිවිටෙකවත් බුදුහිමියන්ගේ මුවින්
අකාරුණික වචනයක් නොගිලිහුනේය.

ආචාර්ය එස්. රාධක්‍රිෂ්ණන්

පරිච්ඡේදය 24

බුදුහාමුදුරුවෝ ශ්‍රේෂ්ඨතම සමාජ ශෝධකයාණෝයි

දඹදිව පැරණි සිරිත් විරිත්, සිතුම් පැතුම්, වැඳුම් පිදුම්, ඇදහීම්, කුලගෝත්‍ර ආදිය දීර්ඝ කාලයක සිට වෙනස් නොකොට ආරක්ෂා කරගෙන එන කෞතුකා ගාරයක් වැනිය. සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ පහළ වූයේ එබඳු රටක, එබඳු යුගයකය. එකල ඉන්දියානු සමාජය සම්පූර්ණයෙන් ම වාගේ සකස් වී තිබුනේ බමුණු මත අනුවය. ඒ බමුණු මත වල හරි වැරදි පෙන්වීමට තරම ප්‍රබල වූද, නිර්භීත වූද, බුද්ධිමත් වූද, කිසිවෙක් නොසිටියේය. හැම රජෙකුම උපදෙස් ගත්තේ පුරෝහිත බමුණෙකුගෙනි. එබැවින්ම රජු ප්‍රධාන සියලුම රට වැසියා බමුණුමතවලට ගරු කළහ. ඉන්දියානු සමාජයේ නොයෙක් මිථ්‍යාවිශ්වාස හා දූෂණ ශුද්ධ කිරීම සඳහා සාර්වභෞම වීරවරයකුගේ පහළ වීම අවශ්‍ය විය. ඔහු රජ කුලයේ කෙනෙකු ද විය යුතුය. සමාජයේ කාවැදී, මුල් බැසගෙන තිබුනු මිථ්‍යාමතවලට විරුද්ධව සිටීම අතිශය භයානක ක්‍රියාවක් විය. ප්‍රබල සමාජයක් කිපුනු විට ඕනෑම බලවතෙකු දුබල කල හැකි බැවිනි.

උසස් රාජවංශයක ඉපිද, උසස් පරිත්‍යාගයක් කොට පෞද්ගලිකත්වය සහමුලින්ම නැතිකළ, අපේ බුදුහාමුදරුවෝ මේ භාරදූර කාර්‍යය අවිහිංසාවාදීව, ශාන්තදාන්තව භාරගත්හ. භාරගෙන ආඥාදායකයකු, ඒකාධිපතියකු හෝ දේශපාලනඥයකු හැටියට නොව, කරුණාවේ හා මෛත්‍රියේ මූර්තියක් වූ මහා තවුසකු හැටියට ඉදිරිපත් වූහ. එහෙත් බුදුන් වහන්සේ ද ලෝකයේ අනික් හැම සමාජ ශෝධකයන් ලැබූ මල් පොකුරු මෙන් ම ගල් මුල් ද ලබා ගත්හ. එක් අතකින් දහස් ගණනින් ලක්ෂ ගණනින් මහජනයා උන් වහන්සේ වටා එක් රොක් වී ගරු බුහුමන් කරන්නට පටන් ගත් අතර, අනික් අතින් සමහරු උන් වහන්සේගේ ජීවිතයට හානි කරන්නට පවා උපක්‍රම යෙදූහ. ස්ත්‍රී දූෂණ හා මිනී මැරීමේ චෝදනා පවා එල්ල කළහ. එහෙත් උන් වහන්සේ ගේ ආදර්ශවත් චරිතය ද උතුම් සිතුම් පැතුම් ද විසින් උන්වහන්සේ ආරක්ෂා කරනු ලැබූහ.

බුදුරදුන් පළමු කොට ම පහර දෙන්නට පටන් ගත්තේ සමාජයේ ඉහළම මට්ටමේ සිටි බමුණන්ටය. ඔවුන්ගේ යාග හෝම විධිවලට හා කුලභේදයට විරුද්ධව ය. කුමන කරුණක් නිසාවත් සතුන් මැරීම බරපතල පාපයක් බව පෙන්වමින් එකල ප්‍රචලිතව පැවැති බිලිපූජාවලට විරුද්ධව දේශනා කළහ. මානුසික නිදහස පවා නැති කරනු ලැබ සිටි ස්ත්‍රී පක්ෂයට නිදහස ලබා දුන්හ. "බුද්ධිය ඇත්නම් ස්ත්‍රී භාවයෙන් "ගැනු කමෙන්" ඇති බාධාව කුමක් දැ"යි උන් වහන්සේ ඇසූහ.

කොසොල් රජු බුදුන් වහන්සේ හමුවෙන්නට ගොස් උන්වහන්සේ සමග පිළිසඳරේ කතාකරමින් සිටින විට රාජ දූතයෙක් ගොස් මල්ලිකා දේවියට දුවක් ලැබුණු බැව් කණට කොඳුරා රහසේ කීය. ඒ ඇසූ රජුගේ මුහුණ නරක් විය. රජුගේ මුහුණ නරක්වී තිබෙනු දුටු බුදුහු "මහරජ: ඇතැම් ස්ත්‍රීහුද ශ්‍රේෂ්ඨය, දක්ෂය, බුද්ධිමත්ය. එහෙයින් මල්ලිකාවට ලැබුණු දියණිය හොඳින් පෝෂණය කරනු මැනවි: නුවණැති සිල්වත්, නැදිමයිලන් දෙවිකොට වෙසෙන, පතිවත රක්නා ස්ත්‍රිය, උතුම්ය. එවැන්නියකගේ පුතෙක් රටක්වුවත් පාලනය කරයි" වදාළහ.

ඉත්ථීපි හි එකච්චියා - සෙය්‍යා පොස ජනාධිප
මෙධාවිනී සීලවතී - සස්සු දෙවා පතිබ්බතා
තස්සා යො ජායති පොසො සූරො හොති දිසම්පති
තාදිසා සුභගියා පුත්තො - රජ්ජම්පි අනුසාසති

(සංයුක්ත නිකාය - කෝසල සංයුක්ත)

රජුගේ අසතුට නැතිවී ගියේ ඉන් පසු ය.

බුද්ධිය දියුණු කිරීම, ඉගෙනීම, උගැන්වීම, ශාස්ත්‍ර හැදෑරීම, උපදෙස් දීම පිළිබඳ ඒකාධිකාරය බමුණන් ගෙන් නැතිකළ යුතු බවත් ඒවා වාතය ජලය හිරුඑළිය මෙන් කාටත් සාධාරණ බවත් බුදුහු පැවසූහ. බමුණු මතවලට විරුද්ධව

අහිංසක සාමණේර චුල්ලපන්ථකට දයාබර පියකු විසින් සෙනෙහෙබර පුතකුට දක්වන විදියේ කරුණාව හා දයාව ඇත් වූ බුදු හාමුදුරුවෝ ඔහු ගේ හිස අත ගා අතින් අල්ලා ගෙන ගොස් පිරිසිදු රෙදිකැබෙල්ලක් දී ඉර පායන දෙස බලා ගෙන "රජෝහරණං, රජෝහරණං" කියමින් එය පිරිමදින ලෙස උගන්වා ජීවකයා ගේ ගෙදර දනට වැඩි ය හ. *154 පිටුව බලන්න*

ප්‍රසිද්ධියේ දේශනා කළ පළමුවෙනි ඉන්දියානු ජාතිකයා පළමුවෙනි දේශකයා, පළමුවෙනි සමාජ ශෝධකයා බුදුහාමුදුරුවෝය. බමුණු මතවලට විරුද්ධව දේශනා කරන්නට කරන්නට සත්‍ය ගරුක බුද්ධිමත් බමුණෝ උන් වහන්සේට ගරු කරන්ට වූහ. උන් වහන්සේ වෙත මහණ වූහ. අන්තිමට උන් වහන්සේගේ දැගසව්වන් බවට පත්කර ගනු ලැබුවේත් බ්‍රාහ්මණ මාණවකයන් දෙදෙනෙකුව සිටි **සැරියුත්-මුගලන්** දෙනමය. ඇතැම් බමුණෝ බුදුරදුන්ට විරුද්ධව නැගී සිටියහ. "මුඩු මහණා" ය. "**මුණ්ඩකො**" "වසලයා" යයි "**වසලො**" යි බැණ වැදුනාහ.

බුදුරදුන් උපදින්නටත් පෙරසිට පැවැති සමාජ බෙදුම උන් වහන්සේ නොපිළිගත්හ. මිනිසෙකුගේ වැදගත් කම, වටිනා කම මනින කෝදුව ජාතිය හෝ කුලය හෝ ගෝත්‍රය හෝ නොව ඔහුගේ චරිතය හා ක්‍රියා කලාපය යයි බුදුහු නිර්භීතව ම කියන්නට වූහ. මිනිසා මිනිසා ගෙන් වෙන්කළ කොටු තාප්පයක් වැනි කුල භේදය අනුමත නොකළ බුදුහාමුදුරුවෝ බමුණු කුලයෙන් මහණ වී සිටි **වාසෙට්ඨ** නමැති භික්‍ෂුනමක් සමග දිනක් මෙබඳු සාකච්ඡාවක යෙදුනහ.

වාශෙෂඨයෙනි, ඔබ බමුණු කුලයෙන් අවුත් පැවිදි වූ වෙහිය. ඔබට බමුණන් හමු වූ විට බැණුම් දෙඩුම් කරන්නේ නැද්ද? එසේය, ඔවුන් හමුවුනාම ඔවුන් මට බණිනවා,නින්ද කරනවා. කුමක් කියා බණිනව ද? නින්ද කරනවද ?

බමුණාම උසස්ය, පිරිසුදුය. මහ බඹුගේ මුඛයෙන් උපන්නේ බමුණන්ම පමණක්ය. බමුණන් හැර අනික් සියල්ලෝම පහත්ය අපිරිසිදුය. ඔබ උසස් බමුණු කුලය අත්හැර මහ බඹුගේ පාදයෙන් උපන් මුඩුමහණ පිරිස ඇසුරට ගියේ යැයි මට ගරහනවා. දෙස් කියනවා.

වාශෙෂ්ඨයෙනි, ඔබ තරුණ බැමිණියන්, ගැබිණි බැමිණියන්, දරුවන් වැදු බැමිණියන්, දරුවන්ට කිරිපොවන බැමිණියන් දැකල තිබෙනවද? එහෙමයි, මම කොපමණවත් දැකල තියෙනවා. එහෙනම් සියලුම බමුණු බැමිණියන් උපදින්නේ මව්කුසින් බව ඔබ පිළිගන්නවාද?

එහෙමයි, මම පිළිගන්නවා.

එහෙනම් බමුණන් පමණක් මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපදිනවායයි කියන්නේ ඇයි? ඔයි තරම් බොරුවක් තවත් තිබෙනවාද? මව් කුසයෙන් උපදින බමුණන් මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපදිනවායයි කීමෙන් ඔවුන් මහ බඹුට කරන්නේ කොයි තරම් නින්දවක් ද? අපහාසයක් ද? එතකොට මහ බඹුගෙ මුඛයත් අනිත් හැමෝම උපදින තැනත් (යෝනියත්) එක වගෙයි නේද? බලන්න, තමන්ගේ වංශවත් කමත් පිරිසිදුකමත් පෙන්වන්නට ගොස් තමන් ගරුකොට සලකන තමන්ගේ මැවුම් කාරයාට කරන මහා නින්දවක හැටි. ***(දීඝනිකාය - අග්ගඤ්ඤ සූත්‍රය)***

"දඹදිව මිනිස්සු එක කුලයකට අයත් පිරිසකට "බ්‍රාහ්මණ යයි කියති. ඔවුන් මොන විදියේ දරුණු, නීච, කැත වැඩ කළත් ඔවුන්ගේ වංශවත් කමට හානියක් නැතිලු. එහෙත් බ්‍රාහ්මණ යන වචනයේ නියම තේරුම අනුවත්, පැරණි උතුම් බමුණන්ගේ ආචාර ධර්‍ම අනුවත් මෙකල සිටින බොහෝ දෙනා බමුණෝ නොවෙති. මා බ්‍රාහ්මණ යයි කියන්නේ මෙන්න මේ අයටයි."

න ජටාහි න ගොත්තෙන - න ජච්චා හොති බ්‍රාහ්මණො
යම්හි සච්චංච ධම්මොච- සො සුචී සො ච බ්‍රාහ්මණො

"හිසේ බැඳ තිබෙන ජටාවලින් හෝ, ගෝත්‍රයෙන් හෝ ජාතියෙන් හෝ බමුණෙක් නොවේ. යමෙකු තුළ සත්‍යයත් ධර්‍මයත් පවතී නම් ඔහු පිරිසිදු කෙනෙකි. ඔහු ම බ්‍රාහ්මණයෙකි."

යස්ස කායෙන වාචාය - මනසා නත්ථි දුක්කතං
සංවුතං තීහි ඨානෙහි - තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

"යමෙකුගේ කයින් වචනයෙන් හා සිතින් කළ වැරදි නැද්ද? තිදෙරින් සංවර වූ ඔහු බ්‍රාහ්මණයෙකැයි මම කියමි.

අක්කොසං වධ බන්ධඤ්ච - අදුට්ඨො යො තිතික්ඛති
ඛන්ති බලං බලාණීකං - තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

"දුෂ්ටකම් නැති යමෙක් ඇනුම් බැනුම් හා වධ බන්ධන ඉවසා ද, ඒ ඉවසීම බලය හා බල ඇණිය කොට ගත් ඔහු බ්‍රාහ්මණයෙකැයි ම කියමි."

අවිරුද්ධං විරුද්ධෙසු - අත්ත දණ්ඩෙසු නිබ්බුතං
සදානෙසු අනාදානං - තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

"විරුද්ධ කාරයන් අතර මිත්‍රයකු ලෙසත් හිංසකයින් අතර අහිංසකයෙකු ලෙසත්, ආශාවෙන් ඇලී ගැලී සිටින්නන් අතර කිසිම ආශාවක් නැත්තෙකු ලෙසත් වසන පුද්ගලයා බ්‍රාහ්මණයෙකැයි මම කියමි."

ඉන්දියානු සමාජය කුල හීනය, වසලය, චණ්ඩාල යයි නම් කොට කොන් කරණු ලබා සිටි පිරිසට බුදු හාමුදුරුවෝ "වසල" යයි කිසි විටෙකත් නොකිහ. නොපිළිගත්හ. ඔවුන් පැවිදි සසුනට ද ඇතුළත් කර ගත්හ. උන් වහන්සේ විසින් වසල යයි හඳුන්වනු ලැබුවේ මෙන්න මේ අයයි.

කොධනො උපනාහීච - පාප මක්ඛීච යො නරො
විපන්න දිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති.

"යමෙක් නිතර කිපෙන ගති ඇත්තේද, බැඳගත් වෛර ඇත්තේද, පව්ටු ගුණ මකුවෙක් වේද?, වැරදි දෘෂ්ටි (දෘශීන) ඇත්තේ ද, තම දෙස් වසන මායාවෙන් යුක්ත වේද, මෙබඳු පුද්ගලයා වසලයෙකි.

යො හවෙ ඉණ මාදය - චුජ්ජමානො පලායති,
නහි තෙ ඉණමත්ථීති - තං ජඤ්ඤා වසලො ඉති
"යමෙක් ණය ගෙන හිමියා ඉල්ලු විට නොදී මග හරින්නේ ද හෙතෙම වසලයකි.

යො මාතරං වා පිතරං වාජිණ්ණකං ගත යොබ්බනං
පහුසන්තො න හරති තං ජඤ්ඤා වසලො ඉති
"යමෙක් පිළිවන්කම තිබියදී දුර්වල වූ මහලු වූ මවට හෝ පියාට හෝ නොසලකා ද ඔහු වසලයෙකි."

යො වෙ පරකුලං ගන්ත්වා - භුත්වාන සුචි භොජනං
ආගතං න පටිපූජෙති - තං ජඤ්ඤ වසලො ඉති.
"අනුන්ගේ ගෙවලට ගොස් හොඳට කාල බීල අවුත් තමන්ගේ ගෙදරට ඔවුන් ආ විට හොඳට නො සලකන්නා වසලයෙකි."

(වසල සූත්‍රය, 175 -179 පිටු බලන්න)

බුදුන් වහන්සේ සමාජයේ සිටින "වසලයන්" නම් කළේ ඉහත සඳහන් ක්‍රමයටයි.

පුරාණ කාලයේ ඉතා යහපත් බමුණන් සිටි බවත්, ඔවුන් තුළ උතුම් ගුණ ධර්ම තිබුණු බවත්, ඒ බමුණු ගුණ ධර්ම මෙකල බොහෝ බමුණන් කෙරේ නැති බවත්, දැන් ඒ බමුණු ධර්ම ඇත්තේ සුනඛයන්තුළ බවත් බුදුහු නිර්භීතව ප්‍රකාශ කළහ. "මහණෙනි, පුරාණ බ්‍රාහ්මණයන් තුළ පැවති මේ බමුණු ධර්ම හෙවත් චාරිත්‍ර පහ දැන් සුනඛයන් කෙරේ දක්නට ලැබේ. එහෙත් ඒවා දැන් සිටින බමුණන් කෙරෙහි නම් දක්නට නැත." ඒ බමුණු ධර්ම පහ කවරේද?

පුරාණ කාලයේ විසූ බමුණෝ බැමිණියක ලගට යෙත්. බැමිණියක් නොවන කතක් ලගට නොයෙත්. එහෙත් මෙකල සිටින බමුණෝ බැමිණියන් ළගට ද යති. බැමිණයන් නොවන කතුන් ලගට ද යති. එහෙත් සුනඛයෝ සුනඛයන් ළගටම යති. සුනඛ නොවන සතුන් කරා නොයති. මහණෙනි, මේ පළමු වැනි බමුණු දහම මෙකල බමුණන් කෙරෙහි දක්නටනැත. සුනඛයන් කෙරෙහි දක්නට ඇත.

මහණෙනි: පැරණි බමුණෝ බැමිණියන් මිලදී නොගනිත්. එසේම නොවිකුණත්, ප්‍රිය මනාප භාවය මුල් කර ගෙන සහවාසය සඳහා ගෙණ යත්. එහෙත් මෙකල බමුණෝ බැමිණියන් මිල දී ගනිත්. විකුණත්, ප්‍රියමනාප භාවය මුල් කරගෙනත් එසේ නැතුවත් සහවාසය සඳහා ගෙන යත්. එහෙත් සුනඛයෝ සුනඛයන් මිල දී නොගණිත්, නොවිකුණත්.

මහණෙනි, පැරණි බමුණෝ ඍතු වූ බැමිණියක කරා ම යෙත්, එසේ නුවූ බැමිණියක කරා නො යෙත්. මෙකල බමුණෝ ඍතු වුවත් නොවූවත් පැමිණියන් කරා යෙත් එහෙත් සුනඛයෝ ඍතු නොවූ සුනඛයන් කරා නොයෙත්.

මහණෙනි,පැරණි බමුණෝ ධන ධාන්‍ය, රන් රිදී රැස්කොට සඟවාගෙන නොතබත්. මෙකල බමුණෝ ධන ධාන්‍ය, රන් රිදී රැස්කොට සඟවාගෙන සිටිති. එහෙත් සුනඛයෝ ඒවා රැස් කොට ගෙණ නොසිටිති.

මහණෙනි,පැරණි බමුණෝ උදයත් සවසත් ආහාර සිගා යෙත්, මෙකල බමුණෝ බඩ පැලෙන තරමට කා ඉතිරි ඒවා අරගෙන ද යති. එහෙත් සුනඛයෝ ආහාර සොයා ගෙන ගොස් ඒවා කනවා මිසක් රැගෙන නොයෙත්. ඒ නිසා මහණෙනි පැරණි බ්‍රාහ්මණ ධර්මයෝ මෙකල සිටින බමුණන් කෙරෙහි දක්නට නො ලැබෙත්. එහෙත් ඒවා බල්ලන් කෙරෙහි දක්නට ලැබෙත්.

(අංගුත්තර නිකාය - පඤ්චක නිපාතය)

මෙහිදී බුදුහාමුදුරුවෝ එකල පිරිහී තිබුණු බමුණු සමාජයේ විසූ නරක බමුණන් සුනඛයන්ට උපමා කළහ. එකල මෙබඳු එඩිතර නිර්භීත ප්‍රකාශයක් කොට බමුණන් ගෙන් බැට නොකා ජිවත්ව සිටි එකම තැනැත්තා බුදු හාමුදුරුවෝය. පහරදිය යුතු තැනදි නිර්භයව එහෙත් කරුණා මෛත්‍රී පූර්වකව පහර දුන් ලෝක ප්‍රසිද්ධ සමාජ ශෝධකයා, සමාජ සේවකයා බුදුන් වහන්සේ බව මෙයින් අපට සිතාගත හැකිය. පැරැණි ඉන්දියානු සමාජයෙහි ස්ත්‍රී පක්ෂයට කිසිම නිදහසක්

කෙලෙස් ලෙඩට පිළියම් දන්නා මා සෙසු ලෙඩටත් පිළියම් දන්නා හෙයින් මාවිනා මුන්ට අනික් පිහිටක් නැත.

146 පිටුව බලන්න

නොතිබුණු බව මෙහි මුලදී සඳහන් කොට ඇත. ඒ නිදහස නැති කළේ බමුණන් විසිනි.

ස්ත්‍රිය ගෙදරදී මව්පියන්ටත්, විවාහයෙන් පසු ස්වාමි පුරුෂයාටත්, වයස්ගත වූ විට පුත්‍රයන්ටත් යටත්ව, ඔවුන්ගේ ආරක්ෂාව ඇතිව ම විසිය යුතු යැයි බමුණෝ කීය. ඇගේ නිදහස සිය නිවසේ බිත්ති හතරට සීමා කළහ.

එබඳු සමයක බුදුහු ස්ත්‍රීන් මහණකරවා දක්ෂ මෙහෙණින්ට තනතුරු දී විනය නීති අනුව නිදහසේ හැසිරෙන්නට ඉඩ දුන්හ. පැරණි ඉන්දියානු කාන්තාවන් රාශියකගේ කෙටි චරිත කතා ථෙරීගාථාවෙහි සඳහන් වෙයි. එය කියවන විට, වී කෙටීමෙන්, දර පැලීමෙන්, දිය ඇදීමෙන්, කෑම පිසීමෙන්, මෙහෙකාරකම් කිරීමෙන් හා ස්වාමියන්ගෙන්, ස්වාමි දුවරුන්ගෙන්, ස්වාමිපුරුෂයන්ගෙන් නැන්දගෙන්, මාමාගෙන්, එක ගෙයි විසූ සැමියාගේ අනික් බිරියන්ගෙන් බේරී, මිදී, ගැලවී මහණවීමෙන් ලැබූ නිදහස ගැන උදන් ඇනූ මෙහෙණින්ගේ ප්‍රීති වාක්‍ය දැක ගත හැකිය. බුදුන් වහන්සේ නිසා ඇතැම් ඉන්දියානු කාන්තාවන් ලැබූ නිදහස පිළිබඳ හොඳම සාක්ෂිය ථෙරී ගාථා නමැති ග්‍රන්ථයයි. පැරණි ඉන්දියානු සමාජය විසින් බැඳ දමා තිබුණු ස්ත්‍රී පක්ෂය පිළිබඳ බමුණු මත නැමැති යදම් පළමුකොට ම පුපුරුවා ලූ වීරවරයා බුදුන් වහන්සේයි.

බුදුහාමුදුරුවන් වහන්සේ උතුරු ඉන්දියානු සමාජයෙන් ඉතා සැළකිය යුතු කොටසක් සකස් කෙළේ සංශෝධනය කෙළේ තිසරණ නමැති සරණ තුනින් යුත් පඤ්චශීල නමැති ප්‍රතිපත්ති පහකිනි. එදිනෙදා ජීවිතයෙහි නිතර සිදුවිය හැකි වැරදි ක්‍රියා පහකින් වැලකී සිටින බවට පොරොන්දු කරවා ගැනීම පඤ්චශීල ප්‍රතිපත්තියයි. ඇත්ත වශයෙන් ම එකල තෙරුවන් සරණගොස් බෞද්ධයන් වී පන්සිල් සමාදන් වූවෝ ඒ සිල්පද පහ හෙවත් පොරොන්දු පහ අකුරටම ඉටු කළහ. පන්සිල් දිවි දෙවෙනි කොට රැක්කාහ. මෙසේ පන්සිල් අකුරට ම පිළිපැද්ද සමාජයක් තරම් ශිෂ්ටත්වයේ අන්තිම හිනි පෙත්තට නැංග සමාජයක් මේ මිහිපිට නැත. බුදු රදුන් ඇති කළ ඒ උතුම් සමාජය මුළු ලෝකයටම ආදර්ශවත් සමාජයකි. ඇත්ත වශයෙන්ම බුදුරදුන් බලාපොරොත්තු වූයේ මුළු ලෝකයා ම, මුළු රටවැසියාම මහණ කරන්නට හෝ නිවන් දක්වන්නට හෝ නොව පඤ්චශීල ප්‍රතිපත්තියෙහි පිහිටි ධාර්මික සමාජයක්, ධාර්මික ලෝකයක් ගොඩ නැංවීමටය. උන්වහන්සේ ජීවත්ව සිටි කාලයෙහි ත්, ඉන්පසු බොහෝ කලක් යන තුරුත් පන්සිල් අකුරටම රැක්ක අය ආසියාවේ බොහෝ රටවල බහුල වශයෙන් විසූහ.

මෙකල මේ රටේ පවතින්නේ පන්සිල් ගැනීම මිස පන්සිල් රැකීම නොවේ. අකුරටම ක්‍රියාවේ යෙදවිය යුතු දෙයක් වචනයෙන් කීම පමණක් අපේ රටේ බෞද්ධයන්ට පුරුදු වී තිබේ. අපේ රටේ පන්සිල් සමාදන් වීම තනිකර චාරිත්‍රයකි. නොකරන දෙයක් කරමියි පොරොන්දු වීම බලවත් වරදකි. පොරොන්දු වෙමින් පොරොන්දු කඩකිරීමකි. ආගමික පොරොන්දු පහක් දින පතා ම කැඩීම මෙකල පන්සිල් සමාදන් වීමෙන් ලැබෙන ප්‍රතිඵලයයි. බුදුන් වහන්සේ ඇති කළ ඒ උතුම් පඤ්චශීල සමාජය මේ රටේ ද අවුරුදු දෙදහක් වැනි දීර්ඝ කාලයක් පැවැත්තේය. ඒ කාලය තුල මේ රටේ සමාජය අතිශයින්ම ශිෂ්ටසම්පන්නව තිබුණේය. පන්සිල් සමාදන් වීම වචනයට පමණක් සීමා වී චාරිත්‍රයක් බවට පත් වූයේ යම් කලක ද මේ රටේ සමාජයේ ආධ්‍යාත්මික පිරිහීම ආරම්භ වූයේත් එකල සිටය.

බුදුන් වහන්සේ ඇති කළ ඒ ශ්‍රේෂ්ඨ සමාජයත් අද අපේ රටේ තිබෙන සමාජයත් අතර ඇත්තේ ලොකු පරතරයකි. මේ පරතරය තිබෙන තුරු අපි බුදුන් වහන්සේ අනුගමනය කරන්නෝ නොවමු.

ආදර්ශවත් නායකයකු වීමත්, අනුන්ගේ වැරදි පෙන්වීමේදී ඒ වැරදි හැම එකකින්ම තමන් පිරිසිදුව සිටීමත්, සමාජයෙන් එන මල්මාලා හා ගල්මුල් ගැන තැකීමක් නොකිරීමත්, කීර්ති ප්‍රශංසා හා ලාභ ප්‍රයෝජන ගැන සිහිනෙනුදු නොසිතීමත්, සානුකම්පාව ම මුල්කර ගැනීමත් පෞද්ගලිකත්වය සහමුලින්ම බැහැර කිරීමත්, කරුණාවේ හා මෛත්‍රියේ මූර්තියක් වීමත් යන මේ ශ්‍රේෂ්ඨ ගුණාංග නිසා බුදුන් වහන්සේ මෙතෙක් ලොව උපන් සියලුම සමාජ ශෝධකයන්ට වඩා ශ්‍රේෂ්ඨතම සමාජ ශෝධකයාණෝ වූහ.



සියලු සත්වයෝ සුවපත් වෙත්වා (සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා) යනුවෙන් මුළු සත්ව සංහතියේම සැපවත් බව පැතූහ. සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වායි හද පත්ලෙන් නැගුනු අවංක හැඟිමෙන් යුක්තව, බලාපොරොත්තු වීමට, ප්‍රාර්ථනා කිරීමට වඩා උතුම් පුළුල්, ශ්‍රේෂ්ඨ, ප්‍රජාතන්ත්‍රිය, සමාජවාදී පාඨයක්-සූත්‍රයක් කිසිම දේශපාලන දාර්ශනිකයෙකුගෙන් මෙතෙක් කියවී නැත.

166 පිටුව බලන්න

මහණෙනි, ස්ත්‍රී ශබ්දය මෙන් පුරුෂයා ගේ සිත් ඇද ගන්නා අනික් එක ද ශබ්දයක් මම නුවණැසින් නො දකිමි. මහණෙනි, ස්ත්‍රී ශබ්දය හෙවත් ස්ත්‍රිය ගේ හඬ පුරුෂයා ගේ හිත තදින්ම ඇද ගනී.

124 පිටුව බලන්න

බුදුහාමුදුරුවෝ සමාජවාදයේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ ආදිකර්තෘවරයාණෝයි

බුදුන්වහන්සේ යසකුල පුත්‍රයා ඇතුළු ප්‍රථම රහත් භික්ෂූන් හැට නම අමතා (**චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේව මනුස්සානං. මා එකෙන ද්වෙ ආගමිත්ථ. දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදි කල්‍යාණං. මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං අහම්පි භික්ඛවෙ යෙන උරුවෙලා සෙනානි නිගමො තෙනුපසංකම්ස්සාමි ධම්මදෙසනාය,**)

> "මහණෙනි, බොහෝ දෙනාගේ හිත පිණිස, බොහෝ දෙනාගේ සැප පිණිස ලෝකයාට අනුකම්පාව පිණිස, මිනිසුන්ට පමණක් නොව දෙවියන්ටත් හිත වැඩ පිණිස, ගමක් ගමක් පාසා, නියම් ගමක් නියම් ගමක් පාසා, නගරයක් නගරයක් පාසා හැසිරෙව්. දෙන්නෙක් එක මග නොයව්. මුල, මැද, අග, යන තුන් තන්හි ම හොඳක් ම යහපතක්ම ගෙනදෙන දහම් දෙසව්. මම ද උරුවෙලාවෙහි සේනානි නැමැති නියම් ගමට දහම් දෙසීමට යන්නෙමි. ***(මහා වග්ග - මහා ඛන්ධක)***

මෙහි සඳහන් **"බහුජන හිතාය" "බහුජන සුඛාය" "ලොකානු කම්පාය"** යන වචන තුන තරම් සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදී සූත්‍රයක් මිනිස් ඉතිහාසයෙහි කිසිවෙකුගේ මුවින් පිටවී නැත. උන්වහන්සේ කිසි දිනක පෙරදිග මිනිසුන්ගේ යහපත පිණිස, අපරදිග මිනිසුන්ගේ යහපත පිණිස, දඹදිව මිනිසුන්ගේ යහපත පිණිස, දුප්පතුන්ගේ යහපත පිණිස, ධනවතුන්ගේ යහපත පිණිස, කුලහීනයන්ගේ යහපත පිණිස, කුලීනයන්ගේ යහපත පිණිස, ආයජීයන්ගේ යහපත පිණිස, අනායජීයන්ගේ යහපත පිණිස යයි සේවය කිරිමේදි මිනිස් ජාතිය කොටස්වලට නොබෙදූහ. "බොහෝ දෙනාගේ යහපත පිණිස" "වැඩි දෙනාගේ යහපත පිණිස හැමදෙනාගේම යහපත පිණිස මුළු ලෝකයාටම අනුකම්පා කොට යන මේ වචනවල ඇත්තේ සම්පූර්ණ පොදු බවකි. උන්වහන්සේ ගේ මහා කරුණාව සියලු සත්වයන් වෙත එක සමාන විය. කථා කළ හැකි අයට පමණක් නොව කථා නොකළ හැකි තිරිසන් සතුන්ටත් එකසේ කරුණාව දැක්වූ ශාස්තෘවරුන් දෙදෙනා මහාවිර හා බුදුන්වහන්සේත් ය.

සියලු සත්වයෝ සුවපත් වෙත්වා (**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**) යනුවෙන් මුළු සත්ව සංහතියේම සැපවත් බව පැතූහ. සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගි වෙත්වා, සුවපත් වෙත්වායි හද පත්ලෙන් නැගුනු අවංක හැගිමෙන් යුක්තව, බලාපොරොත්තු විමට, ප්‍රාර්ථනා කිරිමට වඩා උතුම් පුළුල්, ශ්‍රේෂ්ඨ, ප්‍රජාතන්ත්‍රිය, සමාජවාදී පාඨයක්-සූත්‍රයක් කිසිම දේශපාලන දාර්ශනිකයෙකුගෙන් මෙතෙක් කියවී නැත. බොහෝ දේශපාලකයන් හා දේශපාලනඥයන් පැතුවේ මිනිසුන්ගේ ආර්ථික සුඛිත මුදිත භාවයයි. එහෙත් බුදුන් වහන්සේ මිනිසුන්ගේ පමණක් නොව, සියලු සත්වයන්ගේ ම ආර්ථික සැපවත් බව පමණක් නොව, මානසික හා කායික, මෙලොව හා පරලොව සැපවත් බවද පැතූහ. ධාර්මික හා අහිංසක ව ඒවා ලබා ගන්නා ක්‍රමය ද පෙන්වා දුන්හ.

බුදුන්වහන්සේ ඉතා බුද්ධිමත්ව සකස් කළ "**භික්ෂු ශාසන** නමැති ආයතනය සාර්වභෞම ප්‍රජාතන්ත්‍රිය ආයතනයකි. මිනිස් ඉතිහාසයෙහි එබඳු ක්‍රමානුකූල ආයතනයක් පළමුවරට ඇතිකළ තැනැත්තා බුදුන්වහන්සේයි. එහි සියලුම සාමාජිකයෝ සංඝ නමින් හඳුන්වනු ලබති. පිරිමි

පිරිස භික්ෂු නමින්ද, ගැහැණු පිරිස භික්ෂුණී නමින්ද හැඳින්වෙයි. ඕනෑම රටක, ඕනෑම ජාතියක, ඕනෑම කුලයක අයට මේ ආයතනයට ඇතුළත් විය හැකියි. මෙසේ ඇතුළත්කර ගැනීමේ දී පහත සඳහන් ශාරීරික දුර්වලකම් ඇති අය පමණක් ඇතුළත් කර ගැනීම හෙවත් මහණ කිරීම තහනම් කොට ඇත. එසේ තහනම් කිරීමට හේතුව එබඳු අය මහණ කිරීමෙන් පසු පැන නැගුනු නොයෙක් ප්‍රශ්නයි.

1. කකුලක් කැඩුනු තැනැත්තා,

2. කකුල් දෙකම කැඩුනු තැනැත්තා,

3. අත් හා පය සිඳුනු පුද්ගලයා,

4. නාසය සිඳුනු පුද්ගලයා,

5. කණ හා නාසය සිඳුනු පුද්ගලයා,

6. ඇඟිලි අග සිඳුනු පුද්ගලයා,

7. ඇඟිලි නැති තැනැත්තා,

8. මහ නහර සිඳුනු තැනැත්තා,

9. ඇඟිලි එකිනෙකට බැඳී ඇති තැනැත්තා,

10. කුදා,

11. මිට්ටා,

12. බෙල්ලෙහි වායුගෙඩියක් ඇත්තා,

13. බරවා පාද ඇත්තා,

14. පාප රෝග ඇත්තා,

15. පිරිස් මැද කැපී පෙනෙන විරූපී පුද්ගලයා,

16. එක ඇසක් කණ වූ පුද්ගලයා,

17. අත පය කොර වූ පුද්ගලයා,

18. කොරා,

19. සිරුරෙන් අඩක් පණනැත්තා,

20. පිළා,

21. ජරා දුර්වල පුද්ගලයා,

22. අන්ධයා,

23. ගොළුවා,

24. බිහිරා,

25. අඳ බිහිරා,

26. ගොළු බිහිරා,

27 කුෂ්ට, ගෙඩි, වණ, ඇදුම හා අපස්මාර යන රෝග ඇත්තා යන මේ ශාරීරික දුර්වල කම් ඇති අය,

28. කවුඩෙකු එළවිය නොහැකි තරම් බාල වයස්කාරයා,

29. රාජ භටයා,

30. ප්‍රසිද්ධ හොරා,

31. හිරගෙයින් පැන ගිය අපරාධකාරයා,

32. අධිකරණයෙහි නම ලියැවී ඇති අපරාධකාරයා,

33. කස පහර දීමේ දඬුවම ලැබූ පුද්ගලයා,

34. සිරුරෙහි සීල් තබා දඬුවම් කරනු ලැබූ පුද්ගලයා,

35. ණය කාරයා,

36. දසයා,

37. දෙමව්පියන්ගෙන් අවසර නොලැබූ පුද්ගලයා,

38. අතක් සිඳුනු පුද්ගලයා,

39. අඳ ගොළු බිහිරි පුද්ගලයා,

ඉහත සඳහන් දුර්වලකම් වලින් යුත් අය සසුනට බඳවා ගැනීම හෙවත් මහණ කිරීම තහනම් කිරීමට හේතු වූ කරුණු බොහෝය.

බුදුරදුන් බුදු වී ස්වල්ප කලකින් උන්වහන්සේගේ කීර්තිරාවය මුලු රට පුරා පැතිරෙන්නට විය.



තියෙන එක්කෙනා තව තවත් එකතු කරගෙන ගොඩ ගසා ගැනීමට ම නොසිතා, නැති එක් කෙනාටත් දීමෙන්, අනුන්ගේ යහපතටත් වෙහෙස වීමෙන්, අනුන් ගැන ද සොයා බැලීමෙන්, අනුන් වෙනුවෙනුත් වෙහෙස වීමෙන්, අනුන් ගේ යහපතට ද වැඩ කිරීමෙන්, කවරකුට වුවත් පරිත්‍යාගශීලි විය හැකි යි.

38 පිටුව බලන්න

රජවරු, සිටුවරු, මැති ඇමැතිවරු, උන් වහන්සේ හමු වන්නට අවුත් ගරු සරු දක්වන්නට වූහ. ශාක්‍යවංශයේ රාජ කුමාරවරු සිය ගණනින් බුදුරදුන් වෙත පැවිදි වන්නට වූහ.

අනේ පිඩු ආදි සිටුවරු දිනපතා රසමුසු අහරින් යුත් මහ දන් පවත්වන්ට වූහ. භික්ෂූන් වෙත මහගග මහ වතුරක් මෙන් සිව් පසය ගලා එන්න විය. මේ ලාභ සත්කාර සම්මාන දුටු නොයෙක් දෙනාට ඒ නිසා ම මහණ වන්නට සිත් විය.

එකල ප්‍රසිද්ධ වෛද්‍යවරයා වූ ජීවක වෙද මහතා රජුටත්, අන්ත පුර වැසියන්ටත්, භික්ෂු සංඝයාටත් වෙදකම් කිරීමට බැඳිසිටි බැවින් අනික් සාමාන්‍ය රෝගීන්ට මහ වෙද මහතා ගෙන් ප්‍රතිකාර ගැනීම දුෂ්කර විය. ඒ නිසා ම සමහර ලෙඩ්ඩු මහණ වී ලෙඩ සුව කර ගෙන ඉන් පසු සිවුරු හැර ගියහ.

කරදරයක් නැති ව හොඳට කකා ඉන්ට සලස්වනු සඳහා සමහර මවුපියෝ අවුරුදු පහේ හයේ දරුවන් මහණ කළ හ. එබඳු මහණ වූ කුඩා දරුවන් සිය ගණනක් රාත්‍රි බඩගිනි වී අඬනු ඇසු බුදුහු තොරතුරු විමසා බලා කුඩා ළමයින් මහණ කිරීම තහනම් කළහ.

ප්‍රසිද්ධ හොරුද, මහ අපරාධකාරයෝ ද, ජීවිත ආරක්ෂාව තකා මහණ වූ හ. මෙසේ බුදු සසුන්හි මහණ වුවන්ගේ ගණන දහස් ගණනින් ශීඝ්‍රව වැඩි වන්නට වූ විට ගිහි ජනගහණය අඩුවේ යයි මහජන මතයක් ද පැන නැංගේය.

"ශ්‍රමණ ගෞතම තෙමේ පවුල් වඳ කිරීම පිණිස, වැන්දඹුවන් ඇතිකිරීම පිණිස, කුල නැසීම් පිණිස වැඩ කරන්නේය. දහසක් ජටිලයන් මහණ කෙළේය. සඤ්ජය අතවැසි දෙසිය පණසක් පරිබ්‍රාජකයන් මහණ කෙළේ ය. මගධරට වැසි උසස් කුල පුත්‍රයෝ මහණ වෙති. මීලගට කවුරුන් මහණ කරාවිද දන්නේ නැහැ"යි මිනිස්සු බුදුරදුන්ට දෙස් පවරන්ට, බනින්නට, අගුණ කියන්නට, ගරහන්ට පටන් ගත්හ.

(මහා වග්ග පාලි - සාරිපුත්ත මොග්ගල්ලාන පබ්බජ්ජා)

මෙබඳු නොයෙක් හේතූන් නිසා මහණ කිරීමට සුදුසුකම් අවශ්‍ය විය. ඉහත සඳහන් දුර්වලකම්වලින් යුක්ත වූ විට මහජනයා අතර කැපී පෙනෙන ජනප්‍රිය නියෝජිත පිරිසක් වීම ද නිරායාසයෙන්ම සිදුවිය.

මේ පිරිස අඳින පොරවන වස්ත්‍රවල පාට ආකාරය හා පොරවන ක්‍රමය පවා ගිහි වස්ත්‍ර අඳින පොරවන ක්‍රමයෙන් වෙනස් කොට ඇත. කහපාට මැසි මදුරුවන් ලං නොවන, දේශගුණයට උචිත, ඇසට ප්‍රිය, ශාන්තකමට ගැලපෙන, කැපී පෙනෙන, වර්ණයකි. හිසකෙස් බූ ගැමෙන් ගිහි ගතියත්, , අහංකාර කමත් නැති නිහතමානී, අහිංසක පිරිසක් බවට පත්කරනු ලබයි.

මේ පිරිසට අයත් හැම සමාජිකයෙකු කෙරෙහිම සැහැල්ලු දිවි පෙවෙත, පරාර්ථ සේවය හා පොදු බවත් තිබිය යුතුය. හැම භික්ෂුවක්ම සම්පූර්ණයෙන් පොදු පුද්ගලයෙකි. ඔහු සතු සියල්ල සංඝයා සතුයි. ඔහු වසන පන්සල ඔහු සතු නොවේ. සංඝයා සතුය. සාංඝිකය. හැම භික්ෂුනමකට ම ඇලීම්, ගැලීම්, බැඳීම් නැත. ඔහුට දෙවැන්නෙක් නැත.

ඔහු නිසා යැපෙන පිරිසක් නැත. ඔහු එනතුරු බලා සිටින පිරිසක් නැත. ඔහු නාවොත් බඩගින්නේ හාමත්වන පිරිසක් නැත. ඔහු වෙනුවෙන් හඬා වැටෙන පිරිසක් නැත. ඔහු කිසිවෙකුට අයිති නැත. එබැවින් "භික්ෂුව කිසි දිනක ශෝක නොකරයි" **"නහි සොචති භික්ඛු කදාචි"**

(සංයුත්තනිකාය)

ඔහුගේ ජීවිතය ශාසනය නමැති ශ්‍රේෂ්ඨ ආයතනයට කැපකොට ඇත. පරිත්‍යාග කොට ඇත. උතුම් පරාමාර්ථයක් උඩ ජීවිත පරිත්‍යාග කොට සිටින පිරිසක් ඇත්නම් ඒ බෞද්ධ භික්ෂු පිරිසයි.

සංඝ යන්නෙහි තේරුම සමූහයා යනුයි. සාංඝික යනු සමූහයාට අයත්ය, පොදුය යනුයි. මේ සංඝ සමාජය සකස් කළ බුදුන්වහන්සේ ම එයට ගෞරව දැක්වූහ. ස්වකීය කුඩා මෑණියන් වූද, කුඩා කල තමන් හඳ වඩා ගත්තාවූද මහා ප්‍රජාපතී ගෝතමී දේවිය බුදුන් උදෙසා ම සියතින් කපුකැට,

නූල්තනා, රෙදි වියා සකස් කළ අගනා වස්ත්‍රයක් බුදුරදුන්ගේම ප්‍රයෝජනය පිණිස යොදවන්නට යැයි කියා පිළිගැන්වූ විට එය පිළිනොගෙන

"ගෞතමිය සංඝයාට දෙන්න. සංඝයාට දුන් විට මටද දුන්නා වෙයි. සංඝයාට ද දුන්නා වෙයි." **"සංඝෙ ගෝතමි දේහි සංඝෙ දින්නෙ අහං චෙව පූජිතො භවිස්සාමි සංඝොච"**

පවසා සංඝයා වෙත පැවරූහ. එසේම බුදුහු සංඝයාගේ ගුණ වැණූහ.

"සංඝයා කෙරෙහි ඉතා යහපත් ප්‍රතිපත්ති **(සුපටිපන්නො)**,

අවංක සෘජු ප්‍රතිපත්ති, **(උජුපටිපන්නො)**

නිවණට පිළිපන්, **(ඤායපටිපන්නො)**

ඉතා ම ප්‍රසාදනීය පිළිසඳර කථා ඇති, **(සාමීචිපටිපන්නො)**,

ඈත සිට හෝ ගෙන්වා ගෙණ, කාටත් වඩා පළමුවෙන් සංග්‍රහ කොට ඇදිලි බැඳ වැඳීමට සුදුසු, **(ආහුනෙය්‍යො, පාහුණෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලි කරණීයො)**,

ලෝකයට පින්බිජුවට වැපිරීමට සරුසාර කෙතක් වැනි, **(අනුත්තරං පුඤ්ඤක් ඛෙත්තං ලොකස්ස)**"

යයි බුදුහු ම බුද්ධපුත්‍රයන්ගේ ගුණ වැණූහ.

බුද්ධ ශ්‍රාවක සංඝයා තරම් ක්‍රමානුකූල ව, විනයානුකූලව සංවිධානය කරනු ලැබූ පැවිදි පිරිසක් දඹදිව එකල සිටියේ නැත. අනික් ආජීවක, ජටිල, අචේලක, පරිබ්‍රාජක ආදි පැවිදිවරුන් ගේ හැටිත් ඔවුන් බෞද්ධ භික්ෂූන්ට දැක් වූ විශේෂ සැළකිල්ලත් ඔවුන් ගේම පිළිපැදීමකින් වටහා ගත හැකිය.

දිනක් අනද තෙරණුවෝ භික්ෂු පිරිසත් සමග දේවකට සොබ්භ නැමැති ස්ථානයට වැඩියහ. එකල එහි විසූ සන්දක නැමැති පරිබ්‍රාජකයා අතවැසි පරිබ්‍රාජකයන් විශාල පිරිසක් පිරිවරා ගෙන මහ හඬින් කොක්හඬ ලමින්, සිනාසෙමින්, නොයෙක් තිරිසන් කථාවල යෙදෙමින් සිටියේ ය. අනද තෙරුන් ඒ අසපුවට එනු දුරදීම දුටු සන්දක පරිබ්‍රාජකයා සිය පිරිස අමතා,

"කෑගහන්ට එපා, කෑ ගහන්ට එපා. සිනා සෙන්ට එපා, ශබ්ද කරන්ට එපා, ශ්‍රමණ ගෞතමයන් ගේ ශ්‍රාවකයෙක් වූ අනද තෙරුන් අර එනවා. ඒ තෙරවරු නිශ්ශබ්ද බවට, නිශ්චල බවට,ශාන්ත බවට, විනීත බවට බොහොම කැමති අය. ඒ නිසා හැම කෙනෙක්ම සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව, ශාන්ත දන්ත ව ඉන්න" යැයි කීය.

එවිට සියලු පිරිවැජි පිරිස තුෂ්ණිම්භූතව සිටියහ.

(අථඛො ආයස්මා ආනන්දෙ සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන දෙවකට සොබ්ඛො තෙනුපසංකමි. තෙනඛොපන මයෙන සන්දකො පරිබබාජකො මහතියා පරිබබාජක පරිසාය සද්ධි නිසින්නො හොති. උන්නාදිනියා උච්චාසද්ද මහා සද්දය අනෙකවිහිතං තිරච්ජාන කතං කථෙන්තියා. අද්දසා ඛො සන්දකො පරිබ්බාජකො ආයස්මන්තං ආනන්දං දුරතොව ආගච්ජන්තං දිස්වාන සකං පරිසං ඝණ්ඨපෙති. අප්පසද්ද හොන්තො හොන්තු මා හොන්තො සද්ද මකත්ථ, අයං සමණස්ස ගෞතමස්ස සාවකො ආගච්ජති සමණො ආනන්දෙ. අප්පසද්ද කාමා ඛො පන තෙ ආයස්මන්තා, අප්පසද්ද විනීතා අප්ප සද්දස්ස වණ්ණවාදිනො අප්පෙවනාම අප්පසද්දං පරිසං විදිත්ව, උපසංකම්තබ්බං මඤ්ඤෙදය්‍යාති, අථඛො තෙ පරිබ්බාජකා තුණ්හි අහෙසුං)

(මජ්ඣිම නිකාය - සන්දක සූත්‍රය)

භික්ෂු ශාසනය විනය නිතිවලින් හික්මීම පිළිබඳ අන්තිම ඉහළම තත්ත්වයට සකස් කරනු ලැබ ඇත. කෑම් බීම්, යෑම් ඊම්, ඉඳුම් හිටුම්, ආදි හැම

ඉරියව්වකදී ම විනයානුකූලව පිළිපැදිය යුතු වෙයි. උතුම් ගුණ ධර්ම වැඩීම පිළිබඳව ජීවිතය කැප කළ හැකි සංවිධානාත්මක ශ්‍රේෂ්ඨ සමාජයක් ගොඩනැංවීමෙහි ලා එයට යෝග්‍ය සාමාජිකයන් බඳවා ගැනීමේදී ඔවුන් තුළ තිබිය යුතු සුදුසුකම්, ඔවුන් විසින් පිළිපැදිය යුතු නීති රීති ඒ විනය නීති කඩන්නවුන්ට දියයුතු දඬුවම් ආදිය පිළිබඳ සියලු විස්තර අඩංගු කොට සංගීතිකාරක මහ තෙරවරුන් **මහාවග්ග, චුල්ලවග්ග** වැනි බෞද්ධ නීති ග්‍රන්ථ සකස් කොට ඇත.

භික්ෂූහු ඒ නීති කෙතරම් ගරුකොට සැලකුවාහු දැයි කියතොත් **"විනය නම් ශාසනයාගේ ආයුෂය"යි (විනයො නාම සාසනස්ස ආයු)** යන කියමනෙන් වටහා ගත හැකිය. නීතිය දත් අය නීතිඥ යයි හඳුන්වන්නාක් මෙන් විනය දත් භික්ෂූහු විනයධර යයි හඳුන්වනු ලැබූහ.

සංඝයා පිළිබඳ විනයකර්ම සියල්ල **ඤත්ති චතුත්ථ** කර්මයෙන් සිදු කරණු ලැබේ. **ඤත්තිය** නම් ඉදිරියෙහි සිදුකිරීමට ඇති සංඝකර්මය පිළිබඳ සම්පූර්ණ විස්තරය කල් ඇතුව ප්‍රකාශ කිරීමයි. කලින් දැන්වීමයි. එය වර්තමාන පාර්ලිමේන්තු ක්‍රමයෙහි එන කෙටුම්පත් හෝ යෝජනා කල් ඇතුව ඉදිරිපත් කිරීම වැනිය. ඉන් පසු **කර්ම වාක්‍යය** තුන්වරක් කිය යුතුය.

එය ව්‍යවස්ථාවක් හෝ යෝජනාවක් පළමුවෙනි, දෙවෙනි හා තුන්වෙනි වරටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වැනිය. සංඝ කර්මවලදී **සංඝ සභා** නමැති පාර්ලිමේන්තුවේ ඡන්දය දීමට සුදුසුකම් ඇත්තේ අවුරුදු විස්සේ සිට ඉහළ අයට පමණකි. හෙවත් උපසම්පද භික්ෂූන්ට පමණකි. උපසම්පද භික්ෂූන් අතර ද පාරාජිකා වූ භික්ෂූන්ට ඡන්ද බලය හිමි නැත. මෙකල තැපෑලෙන් ඡන්දය එවන්නාක් මෙන් පැමිණීමට නොහැකි භික්ෂුවකට කෙනෙකු අතේ ඡන්දය එවිය හැකිය.

වයස විස්ස සම්පූර්ණ වී ඡන්ද බලය හිමි කිරීමේ දී හෙවත් උපසම්පද කිරීමේදී පහත සඳහන් අන්තරායික ධර්ම හෙවත් නුසුදුසු කම් තිබේදැයි උපසම්පදව දෙන සංඝ සභාව ඔහුගෙන් ප්‍රශ්න කරයි.

"කුෂ්ඨය තිබේ ද?
ගෙඩි තිබේද?
වණ තිබේද?
ඇදුම තිබේද?
අපස්මාරය තිබේද?
මනුෂ්‍යයෙක් ද?
පුරුෂයෙක්ද?
දසයෙක් නොවෙහිද?
ණයෙන් මිදුනෙක්ද?
රජ භටයෙක් නොවෙහි ද?
මවුපියන්ගෙන් අවසර ගත්තෙහිද?
සම්පූර්ණ විසි වයස් ඇත්තෙහි ද?
පාත්‍ර සිවුරු සම්පූර්ණ ද?

මෙයින් 1 සිට 5 දක්වා ඇති ප්‍රශ්නවලට ඒ රෝග නැත්නම් "නැත" කියාත්, ඉතිරි ප්‍රශ්නවලට "එසේය" කියාත්, පිළිතුරු දිය යුතුය.

පහත සඳහන් පහළොස් දෙනාට ද සංඝ කර්මවලදී ඡන්ද බලය අහිමි වේ හෙවත් උපසම්පදව නොලැබේ.

පණ්ඩකයා
හොරට
සිවුරු පොරවාගත් තැනැත්තා
තීර්ථකයන් ළග මහණව සිට පැමිණි තැනැත්තා
තිරිසන් සත්වයා
මව මැරූ අය
පියා මැරූ අය
රහතන් මැරූ අය
ඒ ඒ අවස්ථාවෙහි ස්ත්‍රී පුරුෂ ලක්‍ෂණ දෙකම ඇත්තා
උපාධ්‍යාය කෙනෙකු නැත්තා
පාත්‍රයක් නැත්තා
සිවුරක් නැත්තා
පාත්‍ර සිවුරු නැත්තා
ණයට ගත් පාත්‍රයක් ඇත්තා
ණයට ගත් සිවුරු ඇත්තා

සංඝ ශාසනය සංඝයා විසින්, සංඝයා සඳහා, සංඝයාගේ ම පාලන ක්‍රමයකි. වරදක් කළ භික්ෂුනමකට දෙන දඬුවම් ක්‍රමය අතිශයින් නීත්‍යානුකූලය. ප්‍රජාතන්ත්‍රිය ය. මානුෂික ය.



"මහණෙනි, රෝගයෝ දෙදෙනෙකි. කායික රෝගය, මානසික රෝගය කියා මෙයින් කායික රෝගවලින් නො පෙළී අවුරුද්දක්, දෙකක්, තුනක්, හතරක්, පහක්, දහයක්, විස්සක්, තිහක්, හතලිහක්, පනහක්, ඇතැම් විට සියයක් නිරෝගිව වසන අය සිටිත්. එහෙත් මානසිකරෝග වලින් (හිතේ ලෙඩින්) එක මොහොතක් නො පෙළී - පීඩානොවිඳ සිටින අය රහතන් වහන්සේලා හැර වෙන සොයා ගැනිම දුෂ්කරය".

106 පිටුව බලන්න

සාධාරණය. යම් කිසි භික්ෂුනමක් වරදක් කළ විට සංඝයා රැස් කරවා, ඒ ඉදිරිපිටට වරද කළ භික්ෂුනම ගෙන්වා ඔහුට විරුද්ධ ව ඇති චෝදනාව ඉදිරිපත් කොට අසවල් විනය නීතිය අනුව වැරැදිකරු බව ඒත්තු ගන්වා ඔහුට නියමිත දඬුවම තුන්වරක් කියවයි. එයට පසු දඬුවම පිළිබඳ ව සියලු ම සංඝයා ගේ අනුමැතිය හා අනුකූලතාව ලබා ගෙන දඬුවම පමුණුවයි.

ඡන්න නමැති භික්ෂුනමට දඬුවම් කරණ ලෙස නියම කළහ. දඬුවම් කළ සැටි මෙසේ යි.

"පළමු කොට ඡන්න භික්ෂුනමට චෝදනා කළ යුතු ය. චෝදනා කොට කරුණ සිහි පත් කළ යුතු ය. සිහිපත් කරවා ඇවත නැංවිය යුතුය. ඇවත නංවා ව්‍යක්ත ප්‍රබල භික්ෂුනමක් විසින් මෙසේ දැන්විය යුතුය.

> ස්වාමීනි, සංඝතෙමේ මා ගේ වචනය අසාවා, මේ ඡන්න නම් භික්ෂුතෙමේ ඇවතකට පැමිණ ඒ බව පිළිගැනිමට කැමැති නො වේ. ඉදින් සංඝයාට සුදුසු යැයි හැඟේ නම් සංඝයා සමග සම්භෝගය (එකට කටයුතු කිරීම) නැති වන ලෙස **උක්ඛේපණීය කර්මය** කළ යුතු ය. මේ **ඤත්තිය** යි (දැන්වීම යි) ස්වාමීනි, සංඝතෙමේ මා ගේ වචනය අසාවා මේ ඡන්න නම් භික්ෂුනම ඇවතකට පැමිණ ඒ බව පිළිගැනීමට අකැමැතිය. ඒ නිසා සංඝතෙමේ ඡන්න භික්ෂුනමට සංඝයා සමග සම්භෝගය නැති වන ලෙස **උක්ඛේපණීය** කර්මය කරයි. යම් ආයුෂ්මත් කෙනෙකුට මේ දඬුවම රුචි වේ නම් උන් වහන්සේ තුෂ්ණිම්භූත වෙත්වා. යමකුට රුචි නො වේ නම් උන් වහන්සේ ඒ බව පවසත්වා." " මෙසේ දෙවනි වරත් කියමි. තුන්වෙනි වරත් කියමි. මේ දඬුවමට කැමති නම් සංඝයා නිශ්ශබ්දව සිටිත්වා. මේ දඬුවමට අකැමැති නම් ඒ බව පවසත්වා. උන් වහන්සේ ඉන් පසු ඡන්න භික්ෂුනමට **උක්ඛේපණීය** කර්මය කළ හ. සංඝයා එයට කැමති විය. එහෙයින් සංඝයා තුෂ්ණිම්භූත විය. මෙය මෙසේ පිළිගනිමි. "මහණෙනි, ඡන්න නම් භික්ෂු තෙමේ සංඝයා සමග සම්භෝගය නැති වන ලෙස ඇවැත් නො දැකීමෙහි උක්ඛේපණීය කර්මය කරණු ලැබුවේ ය යන මේ පුවත ආවාසයක් පාසා කියන්නට සලස්වමි. ***(චුල්ලවග්ග - කම්මක්ඛන්ධකය)***

මේ කරුණුවලින් බුද්ධනීතියේ ඇති අහිංසක බව, ශිෂ්ට බව, සාධාරණ බව හා ප්‍රජාතන්ත්‍රිය බව වටහා ගත හැකිය.

බුදුන් වහන්සේ ගේ ප්‍රජාතන්ත්‍රිය අදහස් දත් බෞද්ධයෝ ආරාමයක් තනවා සඟ සතුකොට පූජා කිරීමේදී සතර දිගින් වඩින මහා සංඝයා ගේ ප්‍රයෝජනය පිණිස යයි කියා පූජා කරති. එසේ පූජා කළ විට එහි තනි අයිති කරුවක් නැත. මේ රටේ පැරැණි ගුහාවන්හි කොටා ඇති

> **"අගත අනගත චතුදිස සගස දිනි,**
> වර්තමානයේත් අනාගතයේත් සතර දිශාවන්හි වසන සෑම සංඝයා වහන්සේ කෙනෙකුගේ ම ප්‍රයෝජනය පිණිස දෙන ලදී."

යන මේ වචන ටිකේ ඇති වටිනාකම කියා නිම කළ නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී සමාජයක ප්‍රධාන ලක්ෂණය විය යුත්තේ පෞද්ගලික දේපල අයිතියක් නො මැති වීම යි. ඒ පිළිබඳ හොඳම සූත්‍ර පාඨය - **අගත අනගත චතුදිස සගස** යනු යි. මේ පාඨය අපේ රටේ හැම පන්සලකටම ඇතුල් වෙන දොරටුවට උඩින් ඇති බිත්තියේ ලොකු අකුරින් ලියවා තැබිය යුත්තකි.

බුදුන් වහන්සේ ගැණත්, බුද්ධාගම ගැණත් කිසිවක් නොදත් බ්‍රිතාන්‍ය පාලකයෝ මේ රටේ භික්ෂූන් විහාරාධිපති කම්වලට පත් කොට, එතෙක් තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී බව සංඝ සමාජයෙන් ඇත් කළහ. "විහාරවාසී" යනු මිස "විහාරාධිපති" යන වචනය පැරැණි බෞද්ධ සාහිත්‍යයෙහි හෝ පැරැණි සෙල්ලිපිවල හෝ දක්නට නැත. පන්සල්වලට නඩු කියා ගැනීම ඇති වූයේ පොදු විහාරස්ථාන පෞද්ගලික බවට පත් වීමෙන් පසු ය.

බුදුරදුන් තුළ පැවැති සමාජවාදී බව හා ප්‍රජාතන්ත්‍රවාදි බව ක්‍රියාත්මක කිරීමේ දි උන් වහන්සේ අනේපිඬු සිටාණන්, මහධන සිටානන් ආදී ධනවතුන්ට දෙස් නො කීහ. බැණ නො වැදුනා හ. ඔවුන් ගේ ධනය දුප්පතුන් අතර බෙද දෙන්ට යයි ද නො කීහ. එහෙත් ධනයෙන් ප්‍රයෝජන ගත යුතු හැටි පෙන්වා දුන් හ. ධනයට වාල් වීමේ, ගිජු වීමේ, ලෝභකමේ, මසුරුකමේ, තෘෂ්ණාවේ ඇති ආදීනව එක් වරක් දෙවරක් නොව දහස් වරකට වඩා ප්‍රකාශ කළ හ.

කොටින් ම ආත්මයක් නැතැයි වදළ බුදුහු මමත්වයේ හා පෞද්ගලිකත්වයේ ඇති භයානකකම පෙන්වා දුන්හ. ධර්මයටවත්, මමත්වයක් නො දක්වන ලෙසත්, එය සසරින් එතෙර වීමට ඔරුවක් ලෙස පාවිච්චි කළ යුතු බවත් පැවසූහ. දුප්පත් පොහොසත් කම්, නෑ නො නෑකම් අඳුනන නාඳුනන කම්, හතුරු මිතුරු කම්, දයක අදයක කම් නොතකා හැමට ම චන්ද්‍රයා මෙන් එක සමාන ව පිළිපැදිය යුතු යයි බුදුහු භික්ෂූන්ට අවවාද කළ හ.

"මහණෙනි, කිසිවකු කෙරෙහි වෙනසක් නො දක්වමින්, අහසේ පායන චන්ද්‍රයා මෙන් කය ඉවත් කොටම, සිත ඉවත් කොට ම, නිතර ම අලුත් ව, කුලයන්හි නො ගැටී, නොඇලී කුලයන් වෙත (දයක ගෙවල් කරා) එළඹෙවු." **(චන්දූපමා භික්ඛවෙ කුලානි උපසංකමථ අපකස්සෙව කයං අපකස්ස චිත්තං නිච්චනවකා කුලෙසු අප්පගබ්භා.)**

(සංයුක්ත නිකාය - කස්සප සංයුක්ත - චන්දූපම සූත්‍රය)

ඉහත සඳහන් කරුණු හා ත්‍රිපිටක පෙළෙහි එන තවත් බොහෝ කරුණු ගැන සළකා බලන විට **අවුරුදු දෙදස් පන්සියයකට පෙර ප්‍රජාතන්ත්‍රීය අදහස්වලින් යුක්ත ව ප්‍රජාතන්ත්‍රී ආයතනයක් ගොඩ නැංවූ ආදිම ශාස්තෘවරයා බුදුන්වහන්සේ බව කිය හැකි යි.**

ආගම් උමතුවක් නැත

ආගම් උමතුවෙන් තොර එකම ආගම වශයෙන් සැලකිය හැක්කේ බුදුසමය පමණි. බුදුසමයේ හරය නම් ආත්ම විජයයෙන් ආධ්‍යාත්මික විප්ලවයක යෙදෙන පුද්ගලයන් බිහිකිරීමයි. ඒ නිසා සිය ආගමට මිනිසුන් හරවා ගැනීම පිණිස බුදුසමය මිල මුදල් හෝ පොළඹවාලීම් හො බලය හෝ භාවිත කරන්නේ නොවේ. බුදුහිමියෝ විමුක්ති මාර්ගය පෙන්වූදැසේක. ඒ මග ගමන් ගැනීමට තීරණය කිරීම එක් එක් පුද්ගලයාට අයත් කාර්‍යයකි.

මහාචාර්‍ය ලක්ෂ්මි නරසු 'බුදුසමයේ හරය' නම් ග්‍රන්ථයෙනි

වසල සූත්‍රය

සමාජයක් තුළ ඇතිවන අපූර්ව වෙනස්කම් ඇසුරින් ප්‍රතිචාර දැක්වීම බුද්ධ ධර්මයේ අන්තර්ගත විශේෂතාවකි. බුදු රජුන් පහළව සිටි කල්හි දඹදිව් සමාජයේ වංශ හෙවත් කුල ක්‍රමය පිළිබඳව දඩබ්බර තත්ත්වයත් කෙරෙහි උන්වහන්සේ විශේෂ උනන්දුවක් දැක්වූ බව පෙනේ. ඒ ආචීර්ණ කල්පිත සමාජයට අයත්වූ ඇතැම් ජන කොටස් ඉතා කටුක සීමා වලට හසුවී වාසය කළ බවට ඉතිහාසය දෙස් දෙයි.

ඒ තත්ත්වය කෙරෙහි දැඩි අභියෝගයක් දැක්වූ බුදුරජාණන් වහන්සේ මනුෂ්‍ය පුද්ගලයාගේ ගෞරවය ආරක්ෂා කළ සේක. ඒ වනාහි, මනුෂ්‍ය අයිතිවාසිකම් සුරකීම අරමුණු සේ ගෙන නූතන චින්තකයන් ඇතැම් මත වාද ගොඩනැගීමට වර්ෂ 2500 ක් පෙර කල්හිදීය.

තමන් කළ කිසිදු වරදකින් තොරව පෑගීමටත්, හුරාකෑමටත් පත්ව සෙසු සමාජයෙන් නෙරපන ලද ඒ අසරණයන් කෙරෙහි අනුකම්පාවක් දැක්වූ උන්වහන්සේ ලෝක ඉතිහාසයෙහි පහළ වුණු අති ශ්‍රේෂ්ඨ මානව හිතෛෂියා බවට පත්වන සේක.

ජන්මය හෙවත් උපත කරණකොට ගෙන අච්චාදයයෙන් උසස් බවට හිමිකම් කියූ බ්‍රාහ්මණයන්ගේ ආධිපත්‍යය පැවැතුණු සමාජයෙහි බුදුන් වහන්සේ අදහස් විප්ලවයක් ඇති කළහ. ඒ අදහස් එද සිට ඉක්ම ගිය කාලපරිච්ඡේදය තුළ ලොව පුරා රැව් පිළිරැව් නංවමින් අද තෙක්ම පැමිණ ඇත. උන්වහන්සේගේ නොයෙක් දේශන වල ඒ අදහස් සඳහන් වන්නේ නමුත්, ඒවා වඩා තිව්ර ද පැහැදිලිවද ඉදිරිපත් වී ඇත්තේ වසල සූත්‍රයෙහිය. ඒ බුදු රජුන් දේශනා කළේ කුලමානයෙන් ඉදිමුණු බ්‍රාහ්මණයකුටය. තමා පිළියෙළ කරමින් සිටි ගිණි දෙව් පූජා අවස්ථාවකට පිවිසුනු උන්වහන්සේට අපහාස කළ ඔහු ඒ සූත්‍ර දේශනාවෙන් පැහැදී සසුන් ගතව අරහත් ඵලය අවබෝධ කර ගති.

වසල සුත්තං

එවං මෙ සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ බො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය සාවත්ථියං පිණ්ඩාය පාවිසි තෙන බො පන සමයෙන අග්ගිකභාරද්වාජසස බ්‍රාහ්මණසස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා.

අථ බො භගවා සාවත්ථියං සපදනං පිණ්ඩාය චරමානො යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසංකමි, අද්දසාබො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතො ව ආගච්ඡන්තං, දිස්වාන භගවන්තං එතදවොච, තත්‍රෙව මුණ්ඩක, තත්‍රෙව සමණක, තත්‍රෙව වසලක තිට්ඨාහී' ති.

එවං වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච. ජානාසි පන ත්වං බ්‍රාහ්මණ වසලං වා වසලකරණෙ වා ධම්මේ ති. නඛවාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මේ.

සාධු මේ භවං ගොතමො තථා ධම්මං දේ සේතු යථාහං ජානෙය්‍යං වසලං වා වසල කරණෙ වා ධම්මේ ති. තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසි කරොතිහි භාසිස්සාමීති.

එවංහොති බො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච.

**1. කොධනො උපනාහී ච
පාපමක්ඛී ච යො නරො
විපන්නදිට්ඨී මායාවී
තං ජඤ්ඤා වසලො ඉති.**

වසල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජේතවන නම් අනේපිඩු සිටුහු ගේ අරම්හි වැඩ වසන සේක.එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැද පෙරව පාසිවුරු ගෙන සැවැත් නුවරට පිඩු සිගා වැඩි සේක. එසමයෙහි අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාගේ නිවෙස්න සමීපයෙහි හෝම ගින්න දල්වන ලද්දේ වෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ගෙපිළිවෙළින් පිඬු සිගා වඩිනා සේක අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයාගේ නිවෙසට වැඩි සේක. අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණයා දුර ම වඩිනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක තෙල බස් කීයේ ය: ශ්‍රමණකය, මුණ්ඩකය, වසලය ඔහි ම සිටුව යනුයි. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ බමුණාට මෙය වදළහ, "බමුණ, තෝ වසලයා වේව යි, වසල කරන ධම් වේව යි දන්නෙහි" දැ යි ඇසී. භවත් ගෞතමයන් වහන්ස, මම වසලය වේව යි, වසල කරන ධම් වේව යි නො දනිමි. ඉදින් භවත් ගෞතමයන් ගෙන් යම් පරිදි මම් වසල වේව යි වසල කරන ධම් වේව යි දැන ගනිම් ද? එපරිදි භවත් ගෞතමයන් වහන්සේ දහම් දෙසන සේක්වා. බ්‍රාහ්මණය, එසේ නම් අසව. මොනවට මෙනෙහි කරව, කියන්නෙමි යි කීහ. භවත්නි, එසේ ය යි අග්ගික භාරද්වාජ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදළ සේක.

යම් මිනිසෙක් කිපෙන සුලු වුයේත්, බදනා ලද වෛර ඇතියේත්, පව්ටු ළාමක ගුණමකු වුයෙත්, විපයර්ස්ත දෘෂ්ටි ඇතියේත්, මායාවිත් වේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

2. එකජං වා ද්විජං වා පි
යොධ පාණානි හිංසති
යස්ස පාණෙ දයා නත්ථි
තං ජඤ්ඤා වසලෝ ඉති

මෙලොව යමෙක් ඒකජ වේව යි, ද්විජ වේව යි, ප්‍රාණීන් දිවි ගලවා ද? යමක්හට ප්‍රාණීන් කෙරෙහි දයා නැත් ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

3. යො හන්ති පරිරුන්ධති
ගාමානි නිගමානි ච
නිග්ගාහකො සමඤ්ඤාතො
තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ගමුදු නියම්ගමුදු වනසා ද, වටලා ගනී ද, "ගම් පහරන සොරෙකැ" යි ප්‍රකට වේද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

4. ගාමෙ වා යදි වා රඤ්ඤෙ
යං පරෙසං මමායිතං
ථෙය්‍යා අදින්නං ආදියති
තං ජඤ්ඤා වසලො ඉති

ගම්හි වේව යි වල්හි වේව යි අනුන් විසින් මමත්වය කළ (හිමියන් විසින්) නොදුන් වස්තුවක් සොර සිතින් ගනී ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

5. යො හවෙ ඉණ මාදය
චුජ්ජමානො පලායති
න හි තෙ ඉණමත්ථීති
තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් එකැතින් ණය ගෙන චෝදනා කරනු ලබන්නේ 'තට මාගේ ණයක් නැතැ' යි පලායේ නම් ඔහු වසලයෙකැ යි දන්නේ ය.

6. යො වෙ කිඤ්චික්ඛකම්‍යතා
පන්ථස්මිං වජතං ජනං
හන්ත්වා කිඤ්චික්ඛ මාදෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් අල්පමාත්‍ර වූ ද, කිසිවක් කැමැත්තෙන් මගැ යන ජනයා නසා බඩු පැහැර ගනී ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

7. යො අත්තහෙතු පරහෙතු
ධනහෙතු ච යො නරො
සක්ඛිපුට්ඨො මුසා බ්‍රෑති
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් ආත්ම හේතුයෙන් හෝ පරහේතුයෙන් හෝ වේව යි තවද යම් මිනිසෙක් ධනය හේතුවෙන් හෝ සාක්ෂි කොට පුළුවුස්නා ලද්දේ දැන දැන මුසා බස් බෙණේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

8. යො ඤාතීනං සඛීනං වා
දාරෙසු පතිදිස්සති
සහසා සම්පියෙන වා
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් නෑ සබඳුන් ගේ වේව යි යහළුවන් ගේ වේව යි අඹුවන් කෙරෙහි බලහත්කාරයෙන් හෝ දෙදෙනා ගේ සහායෙන් හෝ අනාචාරයෙහි හැසිරේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

9. යො මාතරං වා පිතරං වා
ජිණ්ණකං ගතයොබ්බනං
පහුසන්තො න භරති
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් අර්ථෝපකරණයෙන් පොහොසත් වූයේ ජරාවෙන් දිරූ පහ වූ යොවුන් බව ඇති මව හෝ පියා හෝ නො පුස්නේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

10. යො මාතරං වා පිතරං වා
භාතරං භගිනිං සසුං
හන්ති රොසෙති වාචාය
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් මව හෝ පියා හෝ බෑයා බුහුන, හෝ පෙළා ද, වචනයෙන් හෝ කෝප උපදවා ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

11. යො අත්ථං පුච්ඡිතො සන්තො
අනත්ථ මනුසාසති
පටිච්ඡන්නෙන මන්තෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් අර්ථය පුළුවුස්නා ලද්දේ ඔහුට අහිතයක් ම පවසා ද, අර්ථය ම වුවත් සඟවා කථා කරන්නේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

12. යො කත්වා පාපකං කම්මං
මා මං ජඤ්ඤාති ඉච්ඡති
යො පටිච්ඡන්නකම්මන්තො
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් පව්කම් කොට, මා නහමක් දකීවා යි කැමැති වේ ද, යමෙක් ප්‍රතිච්ඡන්න කර්ම ඇති සෙක් වේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

13. යො වෙ පරකුලං ගන්ත්වා
භුත්වාන සුචිභොජනං
ආගතං න පටිපූජෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් පර කුලයට ගොස් පිනි හොජුන් වළඳ තම නිවෙසට පැමිණයහුට ප්‍රතිපූජා නො කෙරේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

14. යො බ්‍රාහ්මණං වා සමණං වා
අඤ්ඤං වා පි වණිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති
තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් බමුණකු වේව යි, මහණකු වේව යි, යදියකු වේව යි, මුසවායෙන් රවටා ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

15 යො බ්‍රාහ්මණං වා සමණං වා
භත්තකාලෙ උපට්ඨිතෙ
රොසෙති වාචා න ච දෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් හෝජන කාලය එළඹෙත් ම බමුණකු වේව යි, මහණකු වේව ය පරොස් බසින් කෝප උපදවා ද, කිසිත් නොදේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

16. අසතං යො ධ පබ්‍රූති
මොහෙන පලිගුණ්ඨිතො
කිඤ්චික්ඛං නිජිගිංසානො
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් මෝහයෙන් වෙළුණෝ කිසිවක් ගනු කැමැත්තේ අසත් බස් තෙපලා ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

17. යො චත්තානං සමුක්කංසෙ
පරංච මවජානති
නිහීනො සෙන මානේන
තං ජඤ්ඤා වසලො ඉති.

යමෙක් ස්වකීය මානයෙන් ඉතා හීනවූයේ තමා හුවා දක්වා ද, මෙරමා හෙලා දකී ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

18. රොසකො කදරියො ච
පාපිච්ඡො මච්ඡරී සඨො
අහිරිකො අනොත්තාපී
තං ජඤ්ඤ වසලො ඉති.

මෙරමා හට කෝප උපදවනුයේ තද මසුරු වූයේත් ළාමක වූ ඊර්ෂ්‍යා ඇත්තේ ද, මසුරු බැව් ඇත්තේ ද, ශඨ භාවයෙන් යුක්තවේද, පවට ලජ්ජා නැත්තේ වේ ද, බිය නැත්තේ වේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

19. යො බුද්ධං පරිභාසති
අථ වා තස්ස සාවකං
පරිබ්බාජං ගහට්ඨං වා
තං ජඤ්ඤ වසලො ඉති.

යමෙක් සම්මා සම්බුදුනට පරිභව බෙණේ ද නොහොත් උන් වහන්සේ ගේ සවු වූ පැවිද්දකුට වේව යි, ගැහැවියකුට වේව යි අපවාද, කෙරේ ද ඔහු වසලයෙකැ යි දන්නේ ය.

20. යො වෙ අනරහා සන්තො
අරහං පටිජානති
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ
එස ඛො වසලාධමො
එතෙ ඛො වසලා වුත්තා
මයා වො යෙ පකාසිතා

යමෙක් රහත් නො වුයේ මම රහත්මි යි පිළින කෙරේ ද, බඹුන් සහිත වූ ලොව්හි සොරකු වූ මේ තෙමේ ම අධම වූ ම වසලයෙක් වෙයි. මේ පුගුල් කෙනෙක් මා විසින් තොපට පවසන ලද්දහු ද මොහු ඒකාන්තයෙන් වසලයෙකැ යි කියන ලදහ.

21. න ජච්චා වසලො හොති
න ජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති
කම්මනා හොති බ්‍රාහ්මණො

ජාතියෙන් වසල නොවෙ යි, ජාතියෙන් බමුණු ද නොවේ. කර්මයෙන් වසල වෙයි. කර්මයෙන් බ්‍රාහ්මණ වේ.

22. තදමිනාපි විජානාථ
යථා මෙදං නිදස්සනං
ජණ්ඩාලපුත්තො සොපාකො
මාතඞ්ගො ඉති විස්සුතො.

යම් ප්‍රකාරයකින් මාගේ මේ නිදසුන් වේ ද, ඒ කරුණ මේ ප්‍රකාරයෙනුදු දැනගනිවු (කැමට) බලුමස් උයන ශ්වපාක නම් සැඩොල් පුතෙක් මාතංගය යි ප්‍රසිද්ධ විය.

23. සො යසං පරමං පත්තො
මාතඞ්ගොයං සුදුල්ලභං
ආගඤ්ඡුං තස්සුපට්ඨානං
ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

ඒ මාතංග හීන කුලෝත්පන්නයකු විසින් ඉතා දුර්ලභ වූ යම් යශසකට පැමිණියේ ද, ඔහුට උවටැනට බොහෝ ක්ෂත්‍රියෝ ද බ්‍රාහ්මණයෝ ද පැමිණියහ.

24. සො දෙවයාන මාරුය්හ
විරජං සො මහාපථං
කාමරාගං විරාජෙත්වා
බ්‍රහ්මලොකූපගො අහු

හේ බුද්ධාදීන් විසින් පිළිපන් බැවින් මහා මාවතක් වූ අෂ්ට සමාපත්ති යානයට නැගී කාමරාගය දුරුකොට බ්‍රහ්ම ලෝකයට පැමිණියේ විය.

25. න නං ජාති නිවාරෙසි -බ්‍රහ්මලොකූපපත්තියා
අජ්ඣායක කුලෙ ජාතා-බ්‍රාහ්මණා මන්තබන්ධුනො
තෙ ච පාපෙසු කම්මෙසු-අභිණ්හ මුපදිස්සරෙ
දිට්ඨෙව ධම්මේ ගාරය්හා-සම්පරායෙ ච දුග්ගතිං
න තෙ ජාති නිවාරෙති- දුග්ගච්චා ගරහාය වා

ජාතිය බඹලොව උපතින් නො වැළකී ය. වේද හදරණ කුලයෙහි උපන් වේදය පිළිසරණ කොට ඇති, ඒ බ්‍රාහ්මණයෝ ද නිතර පව් කම්හි දක්නා ලැබෙත්.
ඉහාත්මයට ගැරහිමට පත්වූවාහු පරලොව්හි දුගතියට ද පත්වූවාහු දක්නා ලැබෙති. ජාති තොමෝ ඔවුන් සුගතියෙන් හෝ ගැරහීමෙන් නො වළහයි.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එව මෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි. ධම්මං ච භික්ඛුසංඝංච, උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

භවත් ගෞතමයන් වහන්ස, නුඹ වහන්සේ ගේ ධර්ම දේශනාව ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, යටි කුරු කොට තැබූ භාජනයක් උඩුකුරු කොට තබන්නාක් මෙන් යටපත් වූ නිධානයක් විවෘත කරන්නාක් මෙන් මං මුළාවූවකුට මග කියන්නාක් මෙන් 'ඇස් ඇත්තෝ රූප දකිත්වා' යි අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නාක් මෙන් ද භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණුවලින් ධර්මය දේශනා කොට වදරණ ලද්දේ ය. ඒ මම භාග්‍යවතුන් වහන්සේ ද, ධර්මය ද, භික්ෂු සංඝයා වහන්සේ ද, සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවි කෙළවර කොට සරණ ගියා වූ උපාසකයෙකැ යි සිත්හි ලා දරණ සේක්වා.

එක් සමයෙක් හි භාග්‍යවතුන් වහන්සේ, සැවැත් නුවර අනාථපිණ්ඩික සිටුවරයාණන් විසින් තනනලද ජේතවනාරාමයෙහි වැඩ සිටි සේක.
එකල්හි බුදුරජාණන් වහන්සේ පෙරවරු වේලෙහි සිවුරු හැඳ පොරවා පාසිවුරු ගෙන සැවැත් නුවරට පිඬු පිණිස වැඩි සේක.

එවේලෙහි අග්ගිකභාරද්වාජ බමුණා ගේ ගෙදෙර ලග ගිනි දල්වන ලද්දේ වේ. අග්නි පූජාවක් හෙවත් ගිනි හෝමය ආරම්භ කරණ ලද්දේ වේ. බුදුරජාණන් වහන්සේ ගෙපිළිවලින් පිඩු පිණිස හැසිරෙන සේක් අග්ගිකභාරද්වාජ බමුණාගේ ගෙය යම් තැනක ද එතැනට වැඩි සේක.



අග්ගිකභාරද්වාජ බමුණු තෙමේ දුරදීම එන්නාවූ බුදුරජාණන් වහන්සේ දුටුයේම ය. දැක බුදුන් වහන්සේට මෙසේ කීය. හිස මුඩු කල තැනැත්ත, ඔහිම සිටුව. තිත්දිත මහණ ඔහිම සිටුව, නින්දිත සැඩොල ඔහිම සිටුව යනුයි.

බුදුහිමියන් නොසැලී, බමුණාට මෙසේ පැවසූහ: "බමුණ වසලයෙකු යනු කවුදැයි ඔබ දන්නෙහිද? කෙනෙකු වසලයෙකු වන අකාරය ඔබ දන්නෙහි ද? "ගරු ගොයුම් හිමියනි, වසලයෙකු යනු කවුදැයි කියා හෝ කෙනෙකු වසලයෙකු වන ආකාරය හෝ මම නොදනිමි. භගවත් ගෞතමයෙනි, කරුණාකර මට එය කියාදෙන්න. එසේ නම් බමුණ, අහගන්න. හොඳින් හිතේ තබා ගන්නැයි බුදුහිමියෝ පැවසූහ.

කොධනො උපනාහී ච - පාපමක්ඛී ච යො නරො - විපන්නදිට්ඨී මායාවී - තං ජඤ්ඤා වසලො ඉති.

යම් මිනිසෙක් කිපෙන ගති ඇත්තේ ද බැඳගත් වෛර ඇත්තේ ද අනුන් ගුණ නසන පව්ටු ගති ඇත්තේ ද හරි දැකීමෙන් තොර වැරැදි දැකීම් ඇත්තේ ද ප්‍රයෝග ඇත්තේ ද ඔහු වසලයෙකැයි දතයුතුවේ.



එකජං වා ද්විජං වා පි - යොධ පාණානි හිසංති - යසස පාණෙ දයා නත්ථි - තං ජඤ්ඤා වසලෝ ඉති

මේ ලොව යමෙක් එකවරක් උපන්නා වූ හෝ දෙවරක් උපන්නා වූ හෝ සතුන්ට හිංසා කෙරේ ද සතුන් මරයි ද යමෙකුට සතුන් කෙරෙහි දයාවක් නැති ද ඔහු වසලයෙකැයි දතයුතු. සතුන් මරන්නෝ පරපණ නසන්නෝ අන්අයට හිංසා පීඩා කරන්නෝ වසලයන් බව වදාළ සැටියි.



යො හන්ති පරිරුන්ධති - ගාමානි නිගමානි ච - නිග්ගාහකො සමඤ්ඤාතො - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ගම් නියම් ගම් නුවරවල් වනසයි ද එයට සෙනග මෙහෙයවා වැටලීම් කරයි ද කැළැඹීම් ඇති කරන්නෙකැයි ප්‍රකට වේ ද ඔහු වසලයෙකැයි දතයුතු වේ. කැරළි කෝලාහල සණ්ඩුසරුවල් අඬදබර ඇති කරන්නෝ වසලයෝ යයි වදාළ සැටියි.



ගාමෙ වා යදි වා රඤ්ඤෙ - යං පරෙසං මමායිතං - ථෙය්‍යා අදින්නං ආදියති - තං ජඤ්ඤා වසලො ඉති

ගමෙහි හෝ වනයෙහි හෝ යමෙකු තමන්ට අයත් නොවන දේ අනවසරයෙන් සොරා ගනිද, එවැන්නෙක් වසලයෙකැයි දතයුතු වේ. අන්සතු දෑ සොරකම් කරන්නන් වසලයෝ යයි වදාළ සැටිය.

යො හවෙ ඉණං මාදය - චුජ්ජමානො පලායති - න හි තෙ ඉණමත්ථීති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ඒකාන්තයෙන් ණයක් ගෙන ණය හිමියන් චෝදනා කරන කල, නුඹගෙන් ගත් ණයක් නැතැයි නොදී පැනයයි ද ඔහු වසලයෙකැයි දතයුතු. අනුන්ගෙන් ණයට ගෙන, ණය ඉල්ලූ විට එය ප්‍රතික්ෂේප කරණ ණයකාරයන් වසලයෝ බව වදළ සැටියි.

යො වෙ කිඤ්චික්ඛකම්‍යතා - පන්ථස්මිං වජන්තං ජනං - හන්ත්වා කිඤ්චික්ඛ මාදෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් ඒකාන්තයෙන් ටික දෙයක්වත් ගන්නට රිසිව මග ගමන් ගන්නා ජනයා මරා හෝ වද දී හෝ යම් කිසි වස්තුවක් ගනී ද ඔහු වසලයෙකැයි දතයුතු වේ. මං පහරණ සොරකම් කරණ අය වසලයෝ යයි වදළ සැටියි.

යො අත්තහෙතු පරහෙතු - ධනහෙතු ච යො නරො - සක්ඛිපුට්ඨො මුසා බ්‍රෑති - තං ජඤ්ඤා වසලො ඉති

යම් මිනිසෙක් තමා නිසා හෝ අනුන් නිසා හෝ යම්කිසි ධනයක් බලාපොරොත්තුවෙන් හෝ සාක්ෂි අසන ලදුව බොරු කියයි ද ඔහු වසලයෙකැයි දතයුතු. බොරු සාක්ෂි කියා අහිංසකයන් අමාරුවේදමා ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු වන්නන් වසලයින් යයි වදළ සැටියි.



යො ඤාතීනං සඛානං වා - දරෙසු පතිදිසසති - සහසා සම්පියෙන වා - තං ජඤඤා වසලො ඉති

යමෙකු නෑයින්ගේ හෝ යාළුවන්ගේ හෝ බිරින්දන් කෙරෙහි බලාත්කාරයෙන් හෝ එකකුගේ හෝ දෙදෙනාගේම හෝ ආලයෙන් අනාචාරයෙහි හැසිරේද? ඔහු වසලයෙකැයි දතයුතු. පරසතු අඹුවන් පසුපස යන්නෝ වසලයෝ යයි වදළ සැටියි.



යො මාතරං වා පිතරං වා - ජිණ්ණකං ගතයොබ්බනං - පහුසන්තො න හරති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් පොහොසත්කම ඇතිවත් වයස් ගිය මහළු මව හෝ පියා හෝ පෝෂණය නොකරයි ද ඔහු වසලයෙකැයි දතයුතු. දෙමාපියන්ට සැලකීමට තරම් තමාට වත්පොහොසත්කම් නැතත් වෙන නොයෙක් ක්‍රම වලට දෙමාපියන්ට සැලකීම වටී. හැකියාව ඇතිවත් දෙමාපියන්ට නොසලකන්නා වසලයෙක්මය.



යො මාතරං වා පිතරං වා - භාතරං භගිනිං සසුං - හන්ති රොසෙති වාචාය - තං ජඤ්ඤා වසලො ඉති.

යමෙකු සිය මවට හෝ පියාට හෝ , සහෝදර සහෝදරියන්ට හෝ නැදිමයිලන්ට හෝ හිංසා කරයි ද පරොස් බසින් කථා කරයි ද ඔහු වසලයෙකැයි දත යුතු වේ. දෙමාපිය, සහෝදර සහෝදරයින්, නැදිමයිලන්ට නොසලකන්නෝ ද ගරන්නෝද වසලයන් බව වදළ සැටියි.



යො අත්ථං පුච්ඡිතො සන්තො - අනත්ථ මනුසාසති - පටිච්ඡන්නෙන මන්තෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් දෙලෝ වැඩට දියුණුවට කරුණක් විචාරන ලද්දේ ම අවැඩ දැයක් කියයි ද කරුණු සැගවීමෙන් කථා කරයි ද ඔහු වසලයෙකැයි දත යුතුවේ. වැරදි අවවාද හා උපදෙස් දී අහිංසකයන් නොමග යැවීමද විශාල වරදක් බව වදාළ සැටියි.

යො කත්වා පාපකං කමමං - මා මං ජඤ්ඤාති ඉච්ඡති - යො පටිච්ඡන්නකම්මන්තො - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් පව්කමක් කොට මා එය කළ බව වෙන අයෙකු නො දැනීම කැමැති වේ ද යමෙක් අනුන්ට නොදන්වා සඟවා කරන පව්වැඩ ඇත්තේ ද ඔහු වසලයෙකැ යි දතයුතු.රහසෙන්වත් පව් නොකළ යුතු බව වදළ සැටියි.

යො වෙ පරකුලං ගන්ත්වා - භුත්වාන සුචිභොජනං - ආගතං න පටිපූජෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙකු අන් ගෙයකට ගොස් ප්‍රණීත ආහාර පාන අනුභව කොට ඒ ආහාර පාන දුන් අය සිය නිවසට ආ කල්හි ඔවුන්ට ආහාර පානයෙන් සංග්‍රහ නො කරයි ද ඔහු වසලයෙකැයි දතයුතු. ආගන්තුකසත්කාර විද තමන් ගේ වාරය පැමිණිවිට වුවමනාවෙන්ම මගහැර යාම වසල කමක් බව වදාළ සැටියි.



යො බ්‍රාහ්මණං වා සමණං වා - අසද්දං වා පි වණිබ්බකං - මුසාවාදෙන වඤ්චෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙකු පිදිය යුතු බමුණෙකු හෝ මහණ උතුමෙකු හෝ අන් කිසි යාචකයෙකු හෝ බොරු කියා රවටා ද ඔහු වසලයෙකැයි දතයුතු. කොයි ආගමකට අයත්වුවත් පූජ්‍යපක්‍ෂයට ගරහාකිරීමත් යාචකයන් රැවටීමත් වසලකමක් බව වදාළ සැටියි.



යො බ්‍රාහ්මණං වා සමණං වා - භත්තකාලෙ උපට්ඨිතෙ - රොසෙති වාචා න ච දෙති - තං ජඤ්ඤා වසලො ඉති

යමෙකු පිදිය යුතු බමුණෙකු හෝ මහණ උතුමෙකු හෝ ආහාර ගන්නා වේලාවෙහි ගෙදරට ආ කල කිසිවක් නො දෙයි ද පරුෂ වචනයෙන් කථා කරයි ද ඔහු වසලයෙකැ යි දතයුතු. පූජකයෙක් හෝ යාචකයෙක්, කෑම ගන්නා විට ගෙදරකට ආ විට යමක් නොදුන්නත් අපහාස කිරීම නම් වසල කමකි.

අසතං යො ධ පබෲති - මොහෙන පලිගුණ්ඨිතො - කිඤ්චික්ඛං නිජිගිංසානො - තං ජඤ්ඤා වසලො ඉති

යමෙකු, අවිද්‍යාවෙන්, මෝහයෙන් වෙළී කිසියම් දෙයක් ගැනීමේ බලාපොරොත්තුවෙන් අසත් පුරුෂ වචන කියා ද ඔහු වසලයෙකුයි දත යුතුවේ. නොදැනීම නිසා සමහරු නොයෙක් අපරාධවලට පෙළඹෙන බලවත් මෝහයෙන් වැඩීගිය නිසා සත්‍ය අසත්‍ය යහපත අයහපත තෝරා ගැණීමට නොහැකි බැවිනි.



යො චත්තානං සමුක්කංසෙ - පරංච මවජානති - නිහීනො සෙන මානේන - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් තම මානයෙන් ගුණදහමින් පිරිහුණු එකෙකු වී තමන් උසස් කොට සලකා ද අනුන් පහත් කොට සලකා ද ඔහු වසලයෙකැ යි දතයුතු. මානයෙන් උඩගු වී අන් අය පහත් කොට සිතා අවමන් කරන්නෝ වසලයෝ යයි වදාළ සැටියි.

රොසකො කදරියො ච - පාපිච්ඡො මච්ඡරී සඨො - අහිරිකො අනොත්තාපී - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් අනුන්ට කෝප කරයි ද, තද මසුරෙක් වේ ද, පව් අදහස් ඇති ද, මසුරු ද, සට කපට ද, පවට බිය නැතිද ඔහු වසලයෙකැයි දතයුතු.

යො බුඬං පරිභාසති - අථ වා තස්ස සාවකං - පරිබ්බාජං ගහට්ඨං වා - තං ජඤ්ඤා වසලො ඉති

යමෙක් බුදුන්ට හෝ තවත් උන් වහන්සේගේ සව්වෙකුට හෝ පිරිවැජියෙකුට හෝ ගිහියෙකුට හෝ නින්ද අපහාසයෙන් කථා කරයි ද ඔහු වසලයෙකැයි දත යුතුවේ. කොයි ආගමට අයත්වුවත් පූජ්‍ය පක්‍ෂයට ගැරහීම වසල කමක් බව දෙසූ සැටියි.



යො වෙ අනරහා සන්තො - අරහං පටිජානති - චොරො සබ්‍රහ්මකෙ ලොකෙ- එස බො වසලාධමො - එතෙ බො වසලා වුත්තා - මයා වො යෙ පකාසිතා *යමෙක් රහත් නොවීම රහත් යයි අගවාද දෙවියන් බඹුන් සහිත ලොවෙහි මෙතෙම ඒකාන්තයෙන් ම මහ සොරෙකි. අධම වසලයෙකි. මා විසින් නුඹලාට යම් වසල කෙනෙක් පළ කරන ලද්දාහු ද ඒ වසලයෝ කියන ලද්දහුය. බොරු සිල් පෙන්වන මහණබමුණන් වසලයන් බව වදළ සැටියි.*

න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො - කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො

යමෙක් උත්පත්තියෙන් වසලයෙක් නොවන්නේය. යමෙක් උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක්ද නොවන්නේය. යමෙක් වසලයෙක් වන්නේ ද ක්‍රියාවෙනි. යමෙකු බ්‍රහ්මණයෙකු ද වන්නේ ක්‍රියාවෙනි. ක්‍රියාවෙන් මිස උපතින් කිසිවෙක් උස්පහත් නොවන බව දෙසූ සැටියි.



තදමිනාපි විජානාථ - යථා මෙදං නිදස්සනං - චණ්ඩාලපුත්තො සොපාකො - මාතඞ්ගො ඉති විස්සුතො

යම්සේ මාගේ මේ නිදසුනක් වේද? ඒ මේ නිදසුනින් ද දැන ගනිව්. මාතංග යයි ප්‍රකට වූ සෝපාක නම් සැඩොල් පුතෙක් විය. ආධ්‍යාත්මික ගුණවගාවන් නිසා සෝපාක, පහත් කුලයක උපන්නත් මහජනයාගෙන් වැඳුම් පිදුම් ලැබුවගයි.



සො යසං පරමං පත්තො - මාතඞ්ගොයං සුදුල්ලභං - ආගඤ්ජුං තස්සුපට්ඨානං - ඛත්තියා බ්‍රාහ්මණා බහු

ඒ මාතංග පඬිවරතෙම ඉතා දුකසේ ලැබිය යුතු උතුම් යසසට පැමිණයේය. ක්ෂත්‍රියෝ ද බ්‍රාහ්මණයෝ ද යන බොහෝ දෙනා ඔහුට උවටැන් කිරීමට පැමිණියාහු ය. ඒ සියල්ලෝම මාතංග මහා පුරුෂයෙකු සේ සැළකූහ. ඔහුගේ පහත් ජන්මය ගැන නොතැකූහ. පහත් ජන්මය ඔහුගේ උසස් බවට බාධාවක් නොවූ වගයි.



සො දෙවයාන මාරුය්හ - විරජං සො මහාපථං - කාමරාගං විරාජෙත්වා - බ්‍රහ්මලොකූපගො අහු

ඒ මාතංග පඬිවර තෙමෙ නොකිලිටි බුද්ධාදී උතුමන්ගේ මහ මාවතක් වූ අටසමවත් යානයට නැගී කාම රාගය දුරුකොට බඹලොවට පැමිණියේ විය. සෝපාකට අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්මලෝකයට යාමට සිය පහත් ජන්මය බාධාවක් නොවූ වගයි.



න නං ජාති නිවාරෙසි - බ්‍රහ්මලොකුපපත්තියා - අප්පඩායක කුලෙ ජාතා-බ්‍රාහ්මණා මන්තබන්ධුනො ....

වේදයන්හි පාර ප්‍රාප්ත බ්‍රාහ්මණයෝ පවා, බොහෝ විට පාප කර්මයන්හි යෙදෙති. ඔවුහු මේ ආත්මයේදීම ගැරහුම් ලබති. මරණින් මතු ඔවුහු, අපායෙහි උපදිති. උත්පත්තිය නිසා ඔවුන්ට අපායේ ගමන වළක්වා ගත නොහේ. එසේම ඔවුන්ට ඒ වරප්‍රසාදය නිසා, ගැරහුම්, නින්ද - අපහාස වලින් වැළකී සිටින්නටත් බැරිය.

සර්වඥ ධාතූන් වහන්සේ

දීර්ඝ වූත් මහිමවත් වූත් මනුෂ්‍ය ඉහාසය තුළ නැගී සිටි ශ්‍රේෂ්ඨයන් අනුස්මරණය කරන සුවිසල් නිර්මාණ ලොවෙහි බොහෝ තැන්වල විද්‍යමාන වෙයි. මිසරයේ පිරමීඩ සහ ඉන්දියාවේ තජ් මහල් මන්දිරය පුරාණ කල්හි විසූ ඒ ඇතැම් කීර්තිධරයන් ගේ නම් හා සම්බන්ධ ව පවතින පුදුමකාර නිර්මාණ වෙයි.

එහෙත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතු ඉමහත් සැදැහැයෙන් යුක්ත ව නිදන් කොට ඉදි කරන ලද අනේක ස්තූප (ථූප, චේතිය, චෛත්‍ය, ධාතුගර්භ, දගැබ්, වෙහෙර වහන්සේ) හා සම්බන්ධ ව පවතින පුරාණ කථාව හා සම වූ දැයක් මුළු මහත් මනුෂ්‍ය ඉතිහාසයේ නො පවතී.

අන් බොහෝ නිර්මාණවල මහිමය රැඳෙන්නේ ස්වල්ප කාලයක් පුරා පමණි. එහෙත්, සර්වඥ ධාතු සදාකාලික ව සෑම මොහොතක් පාසා ජීවමාන අගයෙන් යුක්ත ය. වත්මනෙහි ද ඒ ධාතු සියලු බෞද්ධ රාජ්‍යවල සද පූජනීයත්වයෙන් යුක්ත ව ගෞරව සම්මානයට පත් වෙයි.

ඉන්දියානු ස්වාමීන් වහන්සේ නමක් විසින් නොබෝ ද තායිවාන් රාජ්‍යයට පූජා කරන ලද දන්ත ධාතූන් වහන්සේ තායිලන්තයේ බැංකොක් නගරයට වැඩමවනු ලැබූ අවස්ථාවේ රාජ්‍ය ගෞරවයට පත් වුණු සේක. සැබවින් ම උත්කර්ෂවත් උත්සවයක් වූ එය ද, ඒ සදාකාලික ව ලැබෙන සම්මානය පිළිබඳ නිදර්ශනයකි.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතු සියවස් විසි පහක් තුළ ලත් පූජා සම්මාන අතිශය සම්භාවනීය සිදුවීම් රාශියක් හා සම්බන්ධ ය. කාලය ගෙවී යෑමත් සමග ම බුද්ධ ධර්මය පිළිබඳ අවබෝධය ලොව පුරා පැතිරෙත් ම සර්වඥ ධාතු පිළිබඳ ඒ සම්භාවනීයත්වය වැවෙමින් වැඩෙමින් පවතී. සර්වඥ ධාතු කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය.

1. ශාරීරික ධාතු:

   මේවා බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රී දේහය හා සම්බන්ධ ය.

2. පාරිභොගික ධාතු:

   මින් ගැණෙන්නේ බුදුරජාණන් වහන්සේ විසින් සිය ජීවමාන සමයේ දී පරිභෝග කළ විවිධ දේ මෙසේ බුදුහිමියන් විසින් පරිභෝග කරන ලද ධාතූන් වහන්සේ ලා අතර බුදුහිමියන් ගේ පාත්‍රා ධාතූන් වහන්සේ, චීවරාදිය ඇතුලත් වේ. බුදු හිමියන් සම්මා සම්බොධි ඥානය ලැබීමේ දී එතුමන් වහන්සේට ශ්‍රී මහා බෝධීන් වහන්සේත්, බුදු රජාණන් වහන්සේගේ පාරිභෝගික ධාතූන් වහන්සේ ගණයෙහි ඇතුල් වෙති.

3. උද්දේසික ධාතු:

   මේ උද්දේසික ධාතු ගණයෙහි ලා ඇතුලු වන්නේ බුදු හිමියන් වහන්සේ සහ උන් වහන්සේ ගේ ගුණ කදම්බය සිහිපත් කොට ගැනීමට සැදැහැවත් බැතිමතුන්ට උපකාරී වන විවිධ වස්තූන්ය. බුදු හිමියන් උදෙසා ඉදි වුනු විවිධ ප්‍රතිමා වහන්සේ උද්දේසික ධාතූන් වහන්සේලා ගේ ගණයට අයත් වෙති. විවිධ සංස්කෘතීන් විසින්, විවිධ ලක්ෂණ සහිතව සකස් කරන ලද දස දහස් ගණනක වූ බුදු පිළිම වහන්සේ ලොව පුරා නොයෙක් දේශයන්හි පවතී.

ඉහත කී ත්‍රිවිධ ධාතුන් වහන්සේ අතුරින් උද්දේසික ධාතුන් වහන්සේ, බෞද්ධ ලෝකය මුලුල්ලේ අතිශය පෘථුල ලෙස පවතී. සර්වඥ ශාරීරික ධාතුන් වහන්සේ පිළිබඳ ප්‍රවෘත්ති සමුදය, අධි ආධ්‍යාත්මික වේගයක් දනවන ව්‍යක්ත බවකින් හෙබි කථා සම්භාරයකි. මේ ශාරීරික ධාතුන් වහන්සේ හා සම්බන්ධ සිද්ධි සහ ප්‍රවාද, බැතිමතුන් තුළ ඉමහත් ශ්‍රද්ධා භක්තියක් දැන වීමෙහිලා පොහොසත් ය.

බුදු හිමියන්ගේ ශාරීරික ධාතුන් වහන්සේ පිළිබඳ කථාවේ ප්‍රභවය.

විශ්මයකට මෙන් බුදු රජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතුන් වහන්සේ පිළිබඳ ශ්‍රේෂ්ඨ ප්‍රවෘත්ති සමුදය ආරම්භ වන්නේ, සිද්ධාර්ථ තවුසාණන් සම්මා සම්බෝධි ඥානය සාක්ෂාත් කොට ගත් තැන් පටන් ම යැයි පෙනී යන්නේ ය.

බුදු රජාණනන් වහන්සේ ලෝකෝත්තර ධ්‍යානයට සම වැද ඉන් නැගී සිටිය හ. ඒ අවස්ථාවෙහි, තපස්සු භල්ලුක නම් වෙළඳ දෙබෑයෝ වර්තමාන ඔරිස්සාවේ හි උක්කලාවේ සිට බුදු හිමියන් වැඩ වසන පෙදෙස බලා ගමන් ගනිමින් සිටිය හ.

දේවතාවෙකු ගේ මග පෙන්වීමට අනුව, ඒ වෙළඳ දෙබෑයෝ බුදු හිමියන් හමු වූහ. හමුවී, බුදු හිමියන්ට ආහාර පිළි ගැන්වූහ. (එක් ප්‍රවාදයකට අනුව, වෙළඳ දෙබෑයන් විසින් බුදු හිමියන්ට පිළි ගන්න්වන ලද්දේ විළඳ සහ මී පැණි ය.) මේ පූජා සිදු වූයේ බුද්ධ චරිතයේ ඉතාම මුල් අවදියේ යි. ඒ නිසා, ඒ වන විට, මේ ආහාර පූජාව පිළි ගන්නා පිණිස බුදු හිමියන් වෙත් පාත්‍රයක් වත් නොතිබිණ.

එවිට සිව්වරම් මහ රජ වරුන් විසින් බුදු හිමියන් ට පාත්‍රා හතරක් පිරි නමන ලදී. බුදු හිමියෝ වෙළඳ දෙබෑයන් ගේ ආහාර පූජාව පිළිගත්හ.

මෙසේ බුදු හිමියන් සරණ ගිය ප්‍රථම උපාසකයන් වූයේ තපස්සු භල්ලුක දෙදෙනායි. ඔවුන් සරණ ගියේ බුද්ධ සහ ධම්ම යන දෙසරණයි. මේ වන විට සංඝයා වහන්සේ නොසිටිය හ. ඒ නිසා සංඝ සරණ යා නොහැකි විය. ඒ වෙළඳ දෙබෑයන් ගේ සැදැහැවත් ගතියෙන් පැහැදුනු බුදු හිමියෝ සිය හිස පිරිමැද කේශ ධාතු ස්වල්පයක් ඒ දෙබෑයන්ට පිරි නැමූ හ.

බෞද්ධ සාහිත්‍යයට අනුව, බුදු හිමියන් ගේ ශාරීරික ධාතුන් වහන්සේ පිළිබඳව ප්‍රථමයෙන්ම සඳහන් වන ස්ථානය මෙයයි. තපස්සු භල්ලුක දෙබෑයෝ ඒ කේශ ධාතුන් වහන්සේ තැන්පත් කොට ඔරිස්සා වේ වෙහෙරක් ඉදි කළහ. පසුව ඒ කේශ ධාතු බුරුමයේ (මියන්මාර්) ශ්වේදගොන් චෛත්‍යයෙහි නිදන් කරන ලදැයි පැවසේ.

සර්වඥ ධාතු ක්‍රමානුකූල ව බෙදී යන්නට වූයේ බුදුන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසු ව ය. ඒ පිළිවෙළ උන් වහන්සේ ම ස්වකීය ජීවමාන කාලය තුළ දී විස්තර කළ අයුරු මහා පරිනිබ්බාණ සූත්‍රයෙන් හෙළි වේ.

උන් වහන්සේ ගේ අවසාන කාලයේ දී ම, උන් වහන්සේ ගේ දේහය පිළිබඳ කටයුතු කළ යුතු පිළිවෙළ පිළිබඳ ව ආනන්ද ස්ථවිරයන් වහන්සේ උන් වහන්සේ ගෙන් විමසූ හ.

'ආනන්දයෙනි, මා ගේ දේහය හා සම්බන්ධ අවසාන කටයුතු ගැන ඔබ උනන්දු වීම අනවශ්‍ය ය. ඔබ ගේ ම මාර්ගඵලාවබෝධය ගැන නුවණත් දිරියත් යොදන්න. මා වෙත සැදැහැ බඳ නුවණැති ක්ෂත්‍රියයන්, බ්‍රාහ්මණයන් සහ ගෘහපතියන් සිටිනවා. ඔවුන් තථාගත දේහයට ගෞරව දක්වාවි, යයි සර්වඥයන් වහන්සේ පිළිතුරු දුන් සේක.

සර්වඥයන් වහන්ස, තථාගත දේහයට කෙසේ ද සැලකිය යුත්තේ?'

'ආනන්දයෙනි, තථාගත දේහයට සැලකිය යුත්තේ චක්‍රවර්තී රජකු ගේ දේහයට සලකන ආකාරයෙන් ම ය.

'සර්වඥයන් වහන්ස, චක්‍රවර්තී රාජ දේහයකට සැලකිය යුත්තේ කෙසේ ද?'

''ආනන්දයෙනි, චක්‍රවර්තී රාජ දේහය පළමු ව නව පිළියෙන් වෙළනු ලබයි. ඉක්බිති ව,

නෙළන ලද කපුවලින් ද, යළිත් නව පිළියෙන් ද වෙළනු ලබයි. මෙසේ චක්‍රවර්තී රාජ දේහය නව පිළියෙන් ද, නෙළන ලද කපුවලින් ද පන්සිය වාරයක් වෙළනු ලබයි. ඉක්බිති ව, තෙලින් පිරුණු ලෝහමය මංජුසාවක එය තැන්පත් කොට, ලෝහමය පියනකින් වසනු ලබයි. ඉන්පසු නොයෙක් සුවඳ දරවලින් සාදන ලද චිතකයක් මත එය තබා ගිනි දල්වනු ලබයි. අවසනට සතර මං සන්ධියක ඒ රජුට ගෞරව සඳහා ස්තූපයක් ඉදි කරනු ලබයි. තථාගත දේහයට ද සැලකිය යුත්තේ මෙසේය.

සතර මං සන්ධියක ඉදි කෙරෙන ස්තූපයට මලින් හා සුවඳින් පුද දී ගරු කරන්නෝ එහි දර්ශනයෙන් චිත්තප්‍රීතියට පත් ව බොහෝ කල් ආයු ලබති.

"ආනන්දයෙනි, වෙහෙරක් ඉදි කොට අනුස්මරණය කළ යුතු පුද්ගලයන් සතර දෙනෙක් සිටිති. ඒ චතුර්විධ පුද්ගලයෝ කවර හුද?

තථාගත සම්මා සම්බුදු රජාණනන් වහන්සේ වෙහෙරක් තනා අනුස්මරණය කිරීමට සුදුසු වෙති.

මහරහතුන් වහන්සේ වෙහෙරක් තනා අනුස්මරණය කිරීමට සුදුසු වෙති.

පසේ බුදු වරුන් උදේසා ස්ථූප තැනීම සුදුසු ය.

චක්‍රවර්ති රජවරු වෙහෙර තනා අනුස්මරණය කිරීමට සුදුසු වෙති.

"ආනන්දයෙනි, තථාගතයන් වහන්සේ හා මහරහතුන් වහන්සේලා උදෙසා ස්ථූප ඉදි කිරීමේ හේතුව කවරේ ද ?.

එවැනි ස්ථූපයක් තනාලූ කල්හි බොහෝ දෙනා ගේ සිත් සතන් පහන් වේ. ඔවුහු මෙසේ කියති. "මෙය භාග්‍යවතුන් වහන්සේ උදෙසා තනන ලද වෙහෙරකි."

එසේ ඔවුන්ගේ සිත් සතන් පහන් වූ කල්හී, ඔවුන්ගේ මරණින් මත්තෙහි ඔවුහු දිව්‍ය ලෝකයන් හි උපත ලබති.

"ආනන්දයෙනි, මේ කරුණු නිසාම තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ අනුස් මරණය කිරීම පිණිස ස්ථූප පිහිටුවා ලීම උචිත වේ.

"ආනන්දයෙනි, පසේ බුදු වරුන් උදෙසා විහාර ඉදි කළ යුත්තේ මක් නිසා ද ?

"ආනන්දයෙනි, එවැනි ස්ථූපයක් දුටු විට සැදැහැවත් බැතිමත්හු මේ පසේ බුදුන් වහන්සේ උදෙසා තනන ලද වෙහෙරකි."

එසේ ඔවුන්ගේ සිත් සතන් පහන් වූ කල්හී, ඔවුන්ගේ මරණින් මත්තෙහි ඔවුහු දිව්‍ය ලෝකයන් හි උපත ලබති. පසේ බුදු වරුන් උදෙසා වෙහෙර ඉදි කිරීම සුදුසු වන්නේ මේ නිසාය.

"ආනන්දයෙනි, බුදු හිමියන් ගේ ශ්‍රාවකයන් වහන්සේ උදෙසා ස්ථූප ඉදි කළ යුත්තේ මක් නිසා ද ?

"ආනන්දයෙනි, එවැනි ස්ථූපයක් දුටු විට සැදැහැවත් බැතිමත්හු "මේ බුදු හිමියන්ගේ ශ්‍රාවකයන් වහන්සේ නමින් ඉදි වූ වෙහෙර කියා පහන් සිත් සහිත වෙති. ඔවුන්ගේ සිත් සතන් තුටු පහටු වූ විට ඔවුහු මරණින් මත්තෙන් දෙව්ලොව උපදිති.

බුදු හිමියන් ගේ ශ්‍රාවකයන් වහන්සේ උදෙසා වෙහෙර ඉදි කිරීම සුදුසු වන්නේ මේ නිසාය.

සර්වඥ ධාතු වන්දනාව බුදු රජාණන් වහන්සේ ගේ මූලික ඉගැන්වීම් හා අනුකූල බව, උන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේට දුන් මේ පිළිතුරෙන් පැහැදිලි වේ. සර්වඥ ධාතු පිළිබඳ ප්‍රධාන ආරම්භක පුවත් මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි අවසන් භාගයෙන් හෙළිදරවු වෙයි.

උන් වහන්සේ ගේ දේහය තැන්පත් කරනු ලැබූ චිතකය දැල්වීමට මල්ල රට ප්‍රධානයන් දිරි දැරුවත්, එය සිදු වුණේ නැත. මහා කාශ්‍යප රහතුන් වහන්සේ ප්‍රමාද ව පැමිණ, චිතකය වටා තෙවරක් ප්‍රදක්ෂිණා කොට ගෞරවය දැක්වූ පසු එය කවරකු ගේ වත් උත්සාහයෙන්

තොර ව ඉබේ ම දැල්විණ, බුදු සිරුරින් ඉතුරු වුණේ ඇට කැබලි පමණි - අළු වත් ඉතුරු වුයේ නැත.

බුදු රජුන් පිරිනිවන් පෑ කුසිනාරා පියස අයත් මල්ල රාජ්‍යයේ ප්‍රධානීහු සිය රාජ්‍ය සභා ගැබ තුළ ඒ ධාතු සතියක් පුරා මුර-ආචාර සහිත ව ප්‍රදර්ශනය කරමින් මහජන ගෞරවයට පත් කළ හ.

මේ පළමු ධාතු ප්‍රදර්ශන කාලය තුළ දී ගායන, වාදන හා නැටුම් පැවැත්විණි. මල් සහ මාලා පුදන ලදී.

ධාතු බෙදීමේ අවස්ථාවේ අට වැදෑරුම් පිරිසක් ඒ පිළිබඳ අයිතිවාසිකම් ඉදිරිපත් කළ හ:

1. මගධ රාජ්‍යයේ වේදේහපුත්ත අජාතසත්ත රජහු - තමන් ද බුදුන් සේ ම ක්‍ෂත්‍රියයකු නිසා.

2. වේසාලි රාජ්‍යයෙහි ලිච්ඡවිහු - තමන් ද ක්‍ෂත්‍රිය නිසා.

3. කපිලවස්තුවෙහි ශාක්‍යයෝ - බුදුන් ස්වකීය කුල-ජ්‍යෙෂ්ඨ නිසා

4. අල්ලකප්පයෙහි බුලියයෝ - බුදුන් තමන් ගේ ද කුළ ජ්‍යෙෂ්ඨ නිසා

5. රාම ග්‍රාමයෙහි කෝලියයෝ - බුදුන් තමන් ගේ ද කුළ - ජ්‍යෙෂ්ඨ නිසා.

6. වේඨදීප බ්‍රාහ්මණයා - ධාතු ස්වල්පයක් ලැබීමට තමා සුදුසු නිසා.

7. පාවායෙහි මල්ලයෝ - තමන් ද ක්‍ෂත්‍රිය නිසා

8 කුසිනාරාවෙහි මල්ලයො - තමන් ගේ රාජ්‍යයෙහි බුදුන් පිරිණිවි හෙයින්, ධාතු සියල්ල ම තමනට අයත් බව හා එයින් ස්වල්පයක් වත් බැහැරට නොදෙන බව.

මේ වාද විවාද හේතු කොට ගෙන, අර්බුදකාරී තත්ත්වයක් පැන නැගුනේය. ද්‍රෝණ නම් බ්‍රාහ්මණයා මේ අර්බුදය නිරාකරනය කරනු පිණිස ඉදිරිපත් වුයේ මේ අවස්ථාවෙයි. වාද විවාද කරන දෙපක්ෂය අතර සාමය පිහිටුවා ලීමට ඔහු සැරසුනේය. බමුණා මෙසේ කියේය.

"මිනිසුන් අතර ශ්‍රේෂ්ඨතමයා වූ බුදු රජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතූන් වහන්සේ බෙද ගැනීමේ දී, මෙවැනි වාද-භේද ආදිය ඇතිකොට ගැනීම කිසි සේත් සුදුසු නොවේ. බුදු රජාණන් වහන්සේ උගැන් වූයේ කරුණාව මෛත්‍රිය සහ ඉවසීමයි. ඒ නිසා අපි ඉවසීමෙන් සහ සුහද බවෙන් යුක්තව මේ අර්බුදය නිරාකරණය කොට ගනිමු.

ද්‍රෝණ බමුණාගේ අදහස නිවරද බව, එසේ වාද-විවාද වල යෙදුනු අයට පැහැදිළි වුයේ ය. ඒ අය මෙසේ පැවසුහ.

"හිතවත් ද්‍රෝණ බමුණානෙනි, මේ ධාතූන් වහන්සේ සාධාරණ ලෙස බෙද ලීමේ කාර්යය ඔබටම ඉටු කළ හැකි වේ".

ඒ ඉල්ලීම පිළිගත් ද්‍රෝණ බමුණා සවීඥ ධාතූන් වහනසේ අට කොටසකට බෙදලුයේය. එසේ වුව ද ද්‍රෝණ බමුණාට ඒ ධාතූන් වහන්සේලා ගෙන් කොටසක් නොලැබුනේය.

"මේ ධාතූන් වහන්සේ බෙද ලීම සඳහා භාවිතා කරන ලද නැළිය මට දෙන්න". මෙසේ ද්‍රෝණ බමුණාට ඒ නැළිය දෙන ලදී.

මහා පරිනිබ්බාණ සූත්‍ර විස්තරය අනුව, පිප්ඵලිවනයෙහි මෝරියයෝ ද - ප්‍රමාද ව පැමිණ, තමන් ද ක්‍ෂත්‍රිය බව ප්‍රකාශ කොට ස්වකීය අයිතිවාසිකම් ද ඉදිරිපත් කළ හ. ඔවුනට හිමි වුයේ දරසෑයේ අඟුරු පමණකි.

මහා පරිනිබ්බාන සූත්‍රයෙහි ඒ පුවත ඒ ආකාරයෙන් සඳහන් වුවත් මේ ගැන රට වඩා තරමක් වෙනස් කතාවක් ද ඇත්තේ ය. ශ්‍රී ලංකාවේ මහා සාහිත්‍ය කෘතියක් වන ථූපවංශයෙහි, කියවෙන ආකාරයට ඒ සිද්ධිය සිදු වුයේ මෙසේ ය.

"සියලුම ධාතූන් වහන්සේ තැන්පත් කොට තිබුණු කරඬුවෙහි පියන් පත, ද්‍රෝණ බමුණා විසින් විවෘත කරන ලදී. එය විවෘත කළ විට, එහි සිටි රාජ, රාජාමාත්‍ය වරු, කුලීනයන් සහ සෙසු සියලු දෙනාම ප්‍රබල හැඟීම් වලින්

ආලෝලනය වූහ. ඔවුන් සියලු දෙනාම අඬන්නට, වැලපෙන්නට, විලාප කියන්නට පටන් ගත්හ.

ඒ ආලෝලිත කලබල අස්සේ ද්‍රෝණ බමුණා බුදුරජාණන් වහන්සේ ගේ දන්ත ධාතුවක් ගෙන එය සිය කොණ්ඩයෙහි සඟවා ගත්තේය.

ද්‍රෝණ බමුණා විසින් කරන ලද ක්‍රියාව ශක්‍ර දේවේන්ද්‍රයාට පෙනුනේය. බුදුහිමියන්ගේ දන්ත ධාතුන් වහන්සේට කළ යුතු ගරු බුහුමන් නිසිසේ කරන්නට ද්‍රෝණ බමුණා අසමත් බව, ශක්‍ර දේවේන්ද්‍රයාට දිවැසින් පෙනුනේය.

ඒ නිසා, ශක්‍ර දේවේන්ද්‍රයා ඒ ද්‍රෝණ බමුණා විසින් සඟවා ගන්නා ලද දන්ත ධාතුන් වහන්සේ බමුණා ගේ කොණ්ඩයෙන් ගත්තේ ය. රැගෙන, එය රන් කරඬුවක බහා දෙව් ලොවට ගෙන ගියේ ය. මේ දන්ත ධාතුන් වහන්සේ දෙව් ලොව සිළුමිණි සෑයේ නිදන් කරන ලදී.

දඹදිව සර්වඥ ධාතු පිළිබඳ ඉතිහාසය

ඉක්බිති ව දඹදිවෙහි සර්වඥ ධාතු නිදන් කොට චෛත්‍ය දහයක් ඉදි කරන ලදී.

1. මගධ රාජ්‍යයේ වෛදේහ පුත්ත අජාතසත්ත රජු විසින් රජගහ නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

2. වේසාලි නුවර, ලිච්ඡවි රජ දරුවෝ විසින් වේසාලි නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

3. කපිල වස්තු පුර ශාක්‍යයෝ විසින් කපිලවස්තු නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

4. අල්ල කප්ප නුවර බුලියයෝ විසින් අල්ලකප්ප නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

5. රාමග්‍රාමයෙහි කෝලියයෝ විසින් රාමග්‍රාමයෙහි නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

6. වේඨදීප නුවර වැසි වේඨදීප බ්‍රාහ්මණයා විසින් වේඨදීප නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

7. පාවායෙ හි මල්ලයෝ විසින් මල්ලයන් විසින් පාවා නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

8. කුසිනාරාවේ මල්ලයෝ විසින් කුසිනාරා නුවර ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

9. ද්‍රෝණ බමුණා විසින් (නැළිය නිදන් කොට) ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

10. පිප්ඵලි වනයේ මෝරියයෝ විසින් (අඟුරු නිදන් කොට) ස්ථූපයක් ඉදි කොට සර්වඥ ධාතු නිදන් කොට ඇත.

සර්වඥ ධාතු පූජෝත්සව හා සර්වඥ ධාතු ප්‍රදර්ශනෝත්සව ආරම්භවුයේ සර්වඥ ධාතුන් වහන්සේ නිදන්කොට මුලින් වෙහෙර දශයක් තනා ලීමෙන් පසුවයි.

සර්වඥ ධාතුන් වහන්සේ නිදන් කොට වෙහෙර තැනවූ රජවරු, ඇමතිවරු ආදීහු, මේ මුල් සර්වඥ ධාතු ප්‍රදර්ශනයට සහ පූජෝත්සවයනට අනුග්‍රහය සැපයුවෝත් වූහ.

බෞද්ධ ඉතිහාසයෙහි ආගත ප්‍රවාදයනට අනුව, සර්වඥ ධාතුන් වහන්සේ උදෙසා ඉතාම විභූතිමත් පූජෝත්සව පවත්වන ලද්දේ මගධ දේශයේ අජාතසත්ත රජු විසිනි. තමන්ට ලැබුනු සර්වඥධාතුන් වහන්සේලා, ඒ අජාසත්ත රජු විසින් කුසිනාරාවේ සිට සිය අගනුවර වන රජගහ නුවරට වැඩමවා ගෙන යන ලද්දේ මහ පෙරහරකිනි. කුසිනාරාවේ සිට රජගහනුවරට දුර ගව් සියයකි.

අජාසත්ත රජු විසින් සංවිධානය කරන ලද සර්වඥ ධාතු පූජා උත්සවය කොපමණ විභූතිමත් විද කිවහොත් ඒ පෙරහැරට කුසිනාරාවේ සිට රජගහනුවරට ළඟා වන්නට සත් අවුරුදු, සත්මස් සත් දිනක් ගත වුයේ යැයි ප්‍රවාදයන් හි සඳහන් වේ.

මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ උපදේශයනට අනුව, අජාසත්ත රජු ඒ සර්වඥ ධාතුන් වහන්සේලාගෙන් විශාල කොටසක්

විශේෂයෙන් ආරක්ෂිත චෛත්‍යයක නිදන් කළේය. අජාසත්ත රජු ඒ චෛත්‍යය තුළ මහාඝ් මාණික්‍යයක් ද තැන්පත් කළේ ය. මත්තේ එය ඒතරම් ඉසුරුමත් නොවන රජදරුවන්ට ඒ මාණික්‍යය විකොට, සර්වඥ ධාතු පූජෝත්සව සඳහා ධනය ලබාගත හැකි බැව් අජාසත්ත රජු සිතුවේය.

අජාසත්ත රජු ඒ චෛත්‍යයෙහි යන්ත්‍රමය ආරක්ෂක රූප පිහිටුවනු ලදැයි ද ප්‍රවාදයන්හි සඳහන් වේ.

අජසත්ත රජු, ඒ විහාර ගර්භය තුළ, බුදු හිමියන්ගේ අසූ මහ සව්වන්ගේ පිළිරූත්, ශුද්ධෝදන රජුගේ සහ මහාමායා දේවියගේ පිළිරුවත්, යසෝදරා දේවියගේත්, කාලුදයි ස්ථවිරයන්ගේත් ජන්න ඇමතියාගේත් ප්‍රතිරූපත් තැන්පත් කළේ ය.

මත්තේදී අශෝක අධිරාජයා දඹදිව පහළවන බවත්, ඒ අධිරාජ්‍යයා විසින් දඹදිව අස්සක් මුල්ලක් නෑර වෙහෙර - විහාර කරවන බවත්, මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විසින් දිව්‍යඥානයෙන් දුටු සේක.

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ විසින් කල්තියාම දක්නා ලද පරිදි, පසුකලෙක අශෝක අධිරාජ්‍යයා දඹදිව පහළවූයේ ය. නිග්‍රෝධ නම් සාමණේරයන් වහන්සේ ගේ සන්සුන් ඉරියව් දැක පැහැදුණු, අශෝක අධිරාජ්‍යයා බුදු සමය වැළඳ ගත්තේ ය.

ඒ අධිරාජ්‍යයා ඉන්පසුව ධර්මාශෝක යැයි නම් ලද්දේය. ඒ අධිරාජ්‍යයාගේ අනුදැනීමෙන් අසූහතර දහසක් වෙහෙර විහාර තනවන ලදී. ඒ අසූහතර දහස තනවන ලද්දේ බුදුහිමියන්ගේ අසූහතර දහසක් ධර්ම ස්කන්ධය සංකේතවත් කරනු. පිණිසයි.

වෙහෙර විහාර තැනවීමෙන් පසුව, ධර්මශෝක අධිරාජ්‍යයාට බැරෑරුම් ප්‍රශ්ණයකට මුණපාන්නට සිදු වූයේය.ඒ ප්‍රශ්ණය නම් මේ වෙහෙර විහාරයෙහි නිදන් කරනු පිණිස සර්වඥ ධාතූන් වහන්සේ ලබාගන්නේ කොහෙන්ද? යන්නය.

ධර්මාශෝක අධිරාජ්‍යයා ආදි යුගයේ දී මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ උපදේශයෙන් අජාසත්ත රජු විසින් තනවන ලද ගුප්ත වෙහෙර විහාර පිළිබඳ රහස දැනගත්තේය.

ආරක්ෂාව සඳහා පිහිටුවා තිබුණු යාන්ත්‍රික දෙර ඉවත් කළ ධර්ම අශෝක අධිරාජ්‍යයා ඒවා ඉවත් කොට සර්වඥ ධාතූන් වහන්සේ රැගෙන, ඒවා තමන්ගේ අනු දැනීමෙන් තනන ලද අසූ හාරදහසක් වෙහෙර විහාර වල නිදන් කළේ ය.

මෙයින් පිළබිඹු වන්නේ මේ සමයෙහි ඉන්දියාවේ සියලු පළාත්වල එක සේ බුදු දහම ව්‍යාප්ත ව පැවති බව ය. ඒ අනු ව රජතුමාට අනුශාසනා කළ මොග්ගලිපුත්ත තිස්ස රහතුන් වහන්සේ ඉන්දියාව වටා පිහිටි බොහෝ රාජ්‍යවලට බෞද්ධ ධර්ම දූත පිරිස් යැවීමට උපදෙස් දුන් සේක.

මගධ දේශයෙහි යාන්ත්‍රික රූප විශේෂඥයන් ගේ ආධාරය ඇති ව අක්‍රිය කළ රජ ධාතු ගර්භයෙහි යතුර සොයා ගති. එහි එතුමාට හමු වූයේ අජසත්ත රජු කල තැන්පත් කරල ලද මාණික්‍යය යි. එහි මෙසේ සඳහන් විණි.

'අනාගතයෙහි පහළ විය හැකි ධන සම්පත්තියෙන් වඩා අඩු රජහු මේ අනගි මාණික්‍යය ගෙන එයින් සිය වත්කම් නංවා ගෙන, ධාතු උත්සව පවත්වත්වා!

අශෝක රජ තුමා මෙයින් මඳ නොසැනසිල්ලට පත් ව තමා 'ධන සම්පත්තියෙන් වඩා අඩු' නොවන බැවින් 'මා කිසි සේත් දුප්පත් නැති යි සිතා, ගර්භය තුළට පිවිසුණේ ය. එහි මහා කාශ්‍යප රහතන් වහන්සේ විසින් කරන ලද මේ අනාවැකිය ද හමු විය:

'අනාගතයෙහි දී පියදස්සි නම් රජෙක් 'ධර්මාශෝක' නමින් මහ රජ වෙයි. ඔහු මේ ධාතු අත්පත් කර ගෙන දඹදිව පුරා අසූ-හාර දහසක් ස්තූප තනා, මේ එහි නිදන් කරයි'.

මෙය කියවූ රජ ප්‍රීතියෙන් ප්‍රමෝද ව, අත් පොළා, 'මේ ස්තූපය ඉදි කළ කල්හි මහා කස්සප රහතන් වහන්සේ මා ගැන පෙර-දැක්මෙන් දැන ගෙන සිටි බව පෙනෙනවා' යි පැවසිය. මෙයින් උද්‍යෝගයට පත් රජතුමා

සිය රජයෙහි ද, එහි සීමාවෙන් පිට ප්‍රදේශවල ද බුදු දහම පතුරුවා හැරීම තමා ගේ කාර්‍යභාරය බව තහවුරු කර ගති.

මොග්ගලිපුත්ත තිස්ස රහතන් වහන්සේ ගේ ප්‍රධානත්වයෙන් ධම්ම සංගායනාවක් පැවැත්වූ එතුමා, යම් හෝ අයුරින් තෙවළා දහම අපිරිසිදු ව පැවැතේ නම්, ඒ ඇ එයින් බැහැර කොට, ඇතැම් රාජ්‍යවලට ධර්මදූතයන් යැවී ය.

ගන්ධාර, කාශ්මීර, හිමාලය ප්‍රදේශය, අපරන්තක, වනවාසි, ස්වර්ණභූමි, තම්බපණ්ණි (ලංකාව) සහ ඈත බටහිර යන රාජ්‍ය කරා මේ පිරිස් පිවිසිය හ.

සිරියාවේ දෙවැනි ඇන්ටියෝකුස්, මිසරයේ ටොලමි, මැසිඩෝනියාවේ අන්ටිගෝනුස්, එපිරුස්හි අලිකසුන්දර ආදී රජුන් හා මේ ධර්මදූතයන් සම්බන්ධතා ඇති කර ගත් බව පැවසේ.

මේ පිරිස් ශාරීරික ධාතු ද රැගෙන ගිය බව අනුමාන කළ හැකි ය. මහින්ද මහ රහතන් වහන්සේ අප ගේ දිවයිනට බුදු සමය හඳුන්වා දුන් අවස්ථාවේ මෙහි ස්තූපවල ධාතු නිදන් කිරීමේ උත්සව පැවැත්වූ බව මෙනෙහි කිරීමෙන් ඒ නිගමනයට බැසීම තර්කානුකූල ය.

චීනයෙහි හා ඉන්දියාවේ ඇතැම් පළාත්වලින් ද මෙද අනාවරණය වන සර්වඥ ධාතු මේ ඈත සමයෙහි නිදන් කරන ලද ධාතු බව අනුමාන කළ හැකි ය. පුරාණ ස්ථාන අලුතින් සොයා ගැනෙමින් පවතින්නා වූ ද, නව සියුම් පුරාවිද්‍යාත්මක තාක්ෂණික ක්‍රම පුළුල් ව ක්‍රියාත්මක වන්නා වූ ද මේ සමයෙහි බලාපොරොත්තු නැති ස්ථානවලින් පවා සර්වඥ ධාතු හමු විය හැකි ය.

ශ්‍රී ලංකාවේ සර්වඥ ධාතු

ශ්‍රී ලංකාවේ සර්වඥ ධාතු පිළබඳ කතා පුවත ද රසවත් ය.

මහාවංස පුවතක් අනු ව, බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ලංකා ගමනේ දී මහා සුමන දිව්‍යරාජයාට දුන් කේශ ධාතු නිදන් කොට මහියංගන ථූපය ඉදි කරන ලදී. උන්වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසු, සරභූ තෙරුන් විසින් ගෙන එන ලද ග්‍රීවා ධාතුව ද ඒ ථූපයේ ම නිදන් කොට එය දෙළොස් රියන් කොට සැදිණි.

එහෙත් සර්වඥ ධාතු පිළිබඳ වඩා තිරසර සාධක පවතින්නේ මහින්දගමනයෙන් බුදු දහම මෙහි ස්ථාපිත වූවාට පසු කාලය හා සම්බන්ධ ව ය. අශෝක රජු ගේ මුණුබුරු සුමන සාමණේරයන් වහන්සේ ද මහින්ද රහතන් වහන්සේ ලංකාවට පැමිණි සේක.

බුදු දහම පිළිගත් දේවානම්පිය තිස්ස රජු (ක්‍රි.පූ. 247-07) ඉදි කළ ස්තූපය සඳහා ආපසු දඹදිවට ගොස් ධාතු ගෙනාවේ මේ සාමණේරයන් වහන්සේ ය. ඒ ගෙනා ධාතු අතර බුදු රජුන් ගේ දකුණු අකු ධාතුව ද, තවත් පුවතක් අනු ව, පාත්‍ර ධාතුව ද විය. අකු ධාතුව ථූපාරාමයෙහි නිදන් කරන ලද්දේ ය.

දුටු ගැමුණු රජු (ක්‍රි. පූ. පළමු සියවස) ඉදි කළ සුවිසල් රුවන්වැලි ස්තූපය සඳහා ධාතු ගෙන ආවේ නාගයන් යැයි පැවසේ.

කෝලියයන් රාමග්‍රාමයෙහි ඉදි කළ ස්තූපය මුහුදට සෝදා ගියෙන් එහි නිදන් කරන ලද ධාතුකරඬුව අත්පත් කර ගෙන එය නිදන් කර චෛත්‍යයක් සෑදූ නාගයෝ රුවන්වැලි සෑයේ ධාතු උත්සවය අවස්ථාවේ දී එය එහි නිදන් කිරීම සඳහා සෝනුත්තර සාමණේරයන් වහන්සේට දුන් බව සඳහනි.

කීර්ති ශ්‍රී මේඝවර්ණ සමයෙහි (ක්‍රි. ව. 302 දී පමණ) කාලිංග දේශයෙහි දන්ත කුමරු හා හේමමාලා කුමරිය විසින් ගෙන එන ලද දන්ත ධාතුන් වහන්සේ සිංහල රජ දරුවන් ගේ ආරක්ෂාවට පත් ව පැවතුණෙන්, රාජධානි වෙනස් වත් ම, ඒ ඒ නගරවල දළදා මන්දිරයක් ද තැනුණි.

මහනුවර ශ්‍රී දන්ත ධාතු මන්දිරයෙහි අද වැඩ සිටින ඒ ධාතූන් වහන්සේ සියවස් 17 ක් කල් බෞද්ධ ලෝකයා විසින් ප්‍රණාමයට පත් වුණු අති පූජනීය වස්තුවකි. ඒ වෙනුවෙන් ඇසළ පුන් පොහෝ සතියෙහි විශ්ව කීර්තියට පත් වාර්ෂික මහා පෙරහැරකින් කෙළවර වන

පූජෝත්සවයක් පැවැත්වෙන බව ප්‍රකට කරුණකි. ඒ අතරෙහි විශේෂයෙන් නම් කළ නොහැකි කැබලි වශයෙන් පවතින ධාතු රාශි විටින් විට ලංකා භූමිය කරා පැමිණියේ ය. දේවානම්පිය තිස්ස කල්හි දී ම පාත්‍ර ධාතුව පුරා ඒ ධාතු පැමිණි බව මහාවංසයේ සඳහනි.

ඒ ආදී වශයෙන් පැමිණි ධාතු අද ශ්‍රී ලංකාවේ බොහෝ විහාරස්ථානවල පවතිමින් සැදැහැවතුන් ගේ පූජාවට පත් වේ.

ප්‍රදර්ශන කෙරෙන ධාතූන් වහන්සේ

මේ ප්‍රදර්ශනයට ඉදිරපත් කොට තිබෙන සර්වඥ ධාතූන් වහන්සේ ලා ලබාගෙන තිබෙන්නේ, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ පැරණි විහාරස්ථාන කිහිපයකිනි.

මේ ධාතූන් වහන්සේලා ලබා ගන්නා ලද එක් විහාරස්ථානයක් නම්, මහියංගන සිද්ධාස්ථාන යයි. මේ සිද්ධස්ථානය හේතු කීපයක් නිසාම ශ්‍රේෂ්ඨ ශුද්ධ භූමියකි. බුදු හිමියන් ශ්‍රී ලංකාවට වැඩම කළ ප්‍රථම ගමනේ දී බුදුරජාණනන් වහන්සේ සම්ප්‍රාප්ත වූයේ මේ සිද්ධස්ථානය පිහිටි තැනටයි.

බුදුහිමියන් ශ්‍රී ලංකාවට ප්‍රථමවරට වැඩම කළේ, බුදුවී නවවන මාසයේදීය. බුදුහිමියන් මෙහි වැඩම කළේ, යක්ෂයන් නිසා ශ්‍රී ලංකාවට එළඹ තිබුනු බිය දුරු කිරීම පිණිසයි. බුදු හිමියන් යක්ෂයන් දමනය කළාට පසුව, දෙව් දේවතාවෝ බුදුහිමියන් ගෙන් බණ අසනු පිණිස එහි එක් රැස්වූහ.

ඒ බණ අසා සුමන දිව්‍ය පුත්‍රයා සෝවාන් වූයේය. තමන් විසින් වැඳ-පුද ගත හැකිවනු පිණිස අනුස්මරණ වස්තුවක් දෙන ලෙස සුමන දිව්‍ය පුත්‍රයා බුදු හිමියන්ගෙන් අයැද සිටියේ ය. බුදු හිමියෝ, ඒ සුමන දිව්‍ය පුත්‍රයාට තමන්ගේ කේශ ධාතු අතළොස්සක් පිරිනැමූ සේක. ඒ කේශ ධාතු නිදන් කොට මහියංගන ස්ථූපය තනවන ලදී. ඒ ස්ථූපය තනවන ලද්දේ බුදු හිමියන් ජීවමානව වැඩ වෙසෙන සමයේ දීය.

පැරණි ප්‍රවාදයනට අනුව, මේ මහියංගන ස්ථූපයෙහි තවත් ධාතූන් වහන්සේ නමක් නිදන් කොට ඇත්තේය. එනම්, බුදු හිමියන්ගේ ග්‍රීවා ධාතුවයි. බුදු හිමියන්ගේ චිතකය, දැවෙමින් තිබෙද්දීම, සරභූ නම් ස්ථවිරයන් වහන්සේ නමක්, බුදු හිමියන්ගේ ග්‍රීවා ධාතුව ඒ සෑයෙන් ගන්නා ලදයි, ප්‍රවාදයන්හි පැවසේ.

මෙහි ප්‍රදර්ශනයවන තවත් සමහර ධාතූන් වහන්සේලා ලබා ගන්නා ලද්දේ තිස්ස මහාරාමය නැමැති පැරණි සිද්ධස්ථානයෙනි. ශ්‍රී ලංකාවේ දකුණු පෙදෙසේ පිහිටි තිස්සමහාරාම විහාරය ලෝක ප්‍රසිද්ධ සිද්ධස්ථානයකි. මේ සිද්ධස්ථානය, අවුරුදු 2226 ක් මුළුල්ලේ පැවත එන්නේ ය.

තිස්සමහාරාම විහාරය ඉදි කරන ලද්දේ කාවන්තිස්ස, රජු විසිනි. බුදු හිමියන් එහි වැඩම කළ හෙයින් එය විශේෂ ශුද්ධ භූමියකි. බුදුහිමියන් මෙහි වැඩම කළේ, බුදු හිමියන් ශ්‍රී ලංකාවට වැඩම කළ තෙවන වාරයේ දී ය. බුදු හිමියෝ, මේ තිස්සමහාරාමය පිහිටා සිටින භූමියෙහි ධ්‍යානයට සමවැද සිටියහ.

තිස්සමහාරාමය පිහිටුවන ලද්දේ වර්ෂ 315 කට පෙරදීය. තිස්සමහාරාම වෙහෙරෙහි තැන්පත් කොට තිබෙන ප්‍රධාන ධාතූන් වහන්සේ නම් බුදු හිමියන්ගේ ලලාට ධාතූන් වහන්සේ ය. ප්‍රවාදයනට අනුව මේ විහාරයෙහි රන් බුදු පිළිමයක් නිදන් කොට ඇත්තේ ය.

ඒ රන් පිළිමයෙහි නළල් තලයෙහි, බුදු හිමියන්ගේ ලලාට ධාතූන් වහන්සේ නිදන් කොට ඇත්තේ ය.

ශතවර්ෂ ගණනක් මුලුල්ලේම මේ සිද්ධස්ථානය ශාස්ත්‍රාගම පිළිබඳ ප්‍රබල මධ්‍යස්ථානයක්ව පැවැත්තේය.

බෞද්ධ ධර්මය පිළිබඳ සාකච්ඡා සඳහා භික්ෂු සංඝයා වහන්සේ මෙහි එක් රැස් වූහ. මෙහි එක්තරා ප්‍රාතිහාර්මය ලක්ෂණයක් වෙයි. විහාරය දෙසට විහිදෙන කොහොඹ අතුවල, කොළ තිත්ත රස රහිතය.

මෙහි ප්‍රදර්ශනය වන තවත් ඇතැම් ධාතූන් වහන්සේ තෙල්වත්තේ විහාරයෙනි. මේ විහාරයෙහි පැරණි නම, "රන්පත් වෙහෙරයි." මේ සිද්ධස්ථානයේ විශිෂ්ඨ කීර්තියට හේතු වූයේ පසළොස්වන ශතවර්ෂයේ එහි වැඩ විසූ

තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් වහන්සේය. මනුෂ්‍යත්වය ඉක්මවා යන බලපරාක්‍රමයෙන් හෙබි තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් වහන්සේ, යක්ෂයන්ගෙන් පවා වැඩ ගත්තේ යැයි ජනප්‍රවාදයෙහි සඳහන් වේ.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් අපවත්වන්නට පෙර ඉතා බලවත් බෙහෙතක් වැළඳූහ. ඒ හේතුකොට ගෙන ඒ හිමියන්ගේ දේහය නොදිරා ඉදුරු ගල්ලෙනෙහි තැන්පත්ව තිබුණේ යැයි ද ජනප්‍රවාදයන්හි පැවසෙන්නේ ය.

මේ විහාරස්ථානය, මහා ශාස්ත්‍රීය මධ්‍යස්ථානයක් විය. ඒ කීර්තිය තාමත් නොනැසී පවතී. ශතවර්ෂ ගණනාවකට පෙර එහි තැන්පත් කරන ලද ධාතූන් වහන්සේ තාමත් පවතී.

දර්ශනය සහ ආදර්ශය

මානව හිතවාදියෙකු හැටියට බුදු හිමියෝ පුරෝගාමියෙකි. එසේම, බුදු හිමියෝ දර්ශනවාදී මහා ප්‍රඥායෙකි. මේ සියල්ල එතුමන්ගේ දිදුලන ප්‍රබල චරිතයෙහි, එකට සංකලනය වී පවතී. එතුමන් පවසා වදල දේවල්, අවුරුදු 2500 ක් තිස්සේ දැණුම පිළිබඳ උල්පත වටා එක් රැස්ව වාද විවාද පවත්වා කතා බහ සංවාදයන් හි යෙදී කාලය ගෙවීමෙන් පසුවත් අද යුගයේ කිසිම ස්ත්‍රියක හෝ පුරුෂයකු විසින් අමතක කළ හැකි නොවේ. බුදු හිමියන්ගේ මහා ප්‍රඥාවටත් වඩා ශ්‍රේෂ්ඨයැයි සැලකිය හැකි වන්නේ එතුමාණන් වහන්සේ ගේ ආදර්ශයයි.

මෝනි බැගී විසින් 'අපේ බුදුන්' නම් ග්‍රන්ථයෙනි.



මහා පරිනිර්වාණ සූත්‍රය

එ සමයෙහි මහා කාශ්‍යප රහතන් වහන්සේ පන්සියයක් පමණ භික්ෂුන් පිරිවරාගෙන පාවා නගරයේ සිට කුසිනාරා නගරය තෙක් පා ගමනෙහි යෙදී සිටි සේක්, මහමගින් බැහැරට පා තබා එක් රුක් සෙවණක හිඳ ගත්හ. එකල, කුසිනාරාවෙන් මන්දර මලක් නෙළා ගත් ආජීවකයෙක් පාවා නගරයට යමින් සිටියේය. ඔහු ඈතින්ම දුටු රහතන් වහන්සේ මෙසේ ඔහු ඇමතූ සේක:

"යහළුව, ඔබ අපගේ ශාස්තෘන්වහන්සේ හඳුනනවාද?" "ඔව් යහළුව, දනිමි. ශ්‍රමණ ගෞතමයන් පිරිනිවි අදට සත් දවසකි. මේ මන්දර මළ මා නෙළා ගත්තේ ඒ ස්ථානයෙනි."

එවිට, තවම කෙළෙස් පහ නොකළ භික්ෂුන් වහන්සේලා අත් ඔසවා වැළපෙන්නටත්, බිම හෙවි පෙරළෙන්නටත් පටන් ගත්හ.

" බුදුරජානන් වහන්සේ අප සිතුවාට වඩා ඉක්මණින් පිරිනිවන් පෑ සේක .... සුගත තථාගතයන් වහන්සේ කලින්ම පිරිනිවන් පෑ සේක. ලෝකයට පෑවූ නේත්‍රය කලින්ම නිවී ගියේය" යි

ඔවුහු වැළපුණහ. අභීත් භාවයට පත් භික්ෂුහු සන්සුන් සිතින් යුක්ත වූවෝ

'සියළු සංස්කාර අනිත්‍යය. අන් කවර ධර්මයක් නිත්‍ය වේදෑ?'යි

මෙනෙහි කරමින් පසුවූහ.

මහළු වියෙහිදී මහණව සිටි සුභද්‍රනම් භික්ෂු නමක් ඒ පිරිවරෙහි සිටියේය. ඒ බුඩ්ඪ පබ්බජිත තෙමේ මේ භික්ෂුන් අමතා

'ඇති යහළුවෙනි' හඬා වැළපෙන්න එපා, මහා ශ්‍රමණයන් වහන්සේගෙන් අපි දැන් සම්පූර්ණයෙන් නිදහස්. "මෙය ඔබට කැපයි, නොකැපයි යන උපදේශයෙන් අප මෙතෙක්

පෙළෙන්නට වුණා. දැන් අපට කැමති දේ කරන්නටත් නොකරන්නටත් පුළුවන්, යනුවෙන්'

කීවේය. ඉක්බිතිව මහා කාශ්‍යපප රහතන් වහන්සේ මෙසේ පැවසු සේක: "ඇවත්නි, දැන් ඇති. හඬා වැළපෙන්නට එපා. බුදු රජාණන් වහන්සේ අපට කලින් කියා නැද්ද?, අප යහපත් සේත් වටිනා සේත් පිළිගන්නා සියළු දේ අත්හැර, එයින් වෙන්වී, ඒ හා පැවති සියළු බැදුම් බිඳ හැර යන බව? සංස්කාරයක් වශයෙන් උපත ලබා, ජරා - ජීර්ණ වීමට පත්ව ඇති විනාශ නොවන තත්ත්වයක් කොතැනද ඇත්තේ? එවැනි තත්ත්වයක් ඇති වන්නේ නෑ. තථාගතයන් වහන්සේගේ දේහය කෙළවරකට පත් නොවන සේ විශ්වාස කළ හැකි තත්ත්වයක් ඇතිවන්නේ නැහැ"

එකල්හි මල්ල රටේ ප්‍රධානීහු හිස් සෝදා, නා, නව පිළි හැඳ 'සර්වඥ දේහය සහිත චිතකය ගිණි දල්වමු. යි සිතා පැමිණි නමුත් ඒ කාර්යය ඉටු කිරීමට අපොහොසත් වූහ.

එවිට කුසිනාරාවේ මල්ලයෝ අනුරුද්ධ රහතන් වහන්සේගෙන් මෙසේ විමසූහ. "අනුරුද්ධ රහතන් වහන්ස, මේ සිව් මල්ල ප්‍රධානීහු හිස් සෝද, නා, නව පිළි හැඳ බුදුරජුන්ගේ ශ්‍රී දේහය සහිත චිතකය දල්වන්නට තැත් කරන්නේ නමුත්, ඔවුන් මෙසේ අසමත් වන සේතුව කුමක්ද?"

"වසිට්ටයෙනි, දෙවියන්ගේ අභිප්‍රාය වෙනස්ය." "හිමියනි, දෙවියන්ගේ අභිප්‍රාය කිමෙක්ද"?

"වසිට්ටයෙනි, මහා කාශ්‍යපප රහතන් වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිවරා, පාවා නගරයේ සිට කුිසිනරාව බලා පැමිණෙති. මහා කාශ්‍යපප රහතන් වහන්සේ සිය හිස නමා සර්වඥයන් වහන්සේ ගේ දෙපා නමදින තෙක්, ඒ චිතකය දැල්වෙන්නේ නැත". "හිමියනි, දෙවියන් ගේ අභිප්‍රාය ඉටු වේවා"

කුසිනාරාවේ මල්ලයන් ගේ මකුටබන්ධන චේතිය සමීපයෙහි වූ චිතකය වෙත මහා කාශ්‍යපප රහහන් වහන්සේ ළඟා වූ සේක. එහි සපැමිණ, සිවුරු එකාංශ කොට එනම්, එක් උරයක් වසා" පොරොවා, දෙහොත් නමා වැඳ ගන චිතකය වටා තෙ වරක් පැදකුණු කොට, ශ්‍රී පාද යුග්මය අනාවරණය කොට හිස නමා නමස්කාර කළ සේක. පන්සියයක් භික්ෂූන් වහන්සේ ද එසේ ම කළ හ. ඒ අවසන් වත් ම, චිතකය සැනෙකින්ම දැල්වී ගියේ ය. ඒ ආදාහන කටයුත්තෙන් හමෙහි, මසෙහි, නගරයෙහි අළු දැලි ආදිය ඉතුරු වුයේ නැත. ඉතුරු වූයේ ඇට කැබලි පමණි. ගිතෙල් හෝ තෙල් දැවී ගිය කල අළු හෝ දැලි ඉතුරු නොවන්නා සේය. ශ්‍රී දේහය දවටා ලූ පිළි අතරින් ඇතුළතින් ම වූ පිළියත් පිටතින් ම වූ පිළියත් දැවී ගියේ නැත. ශ්‍රී දේහය දැවී ගිය පසු අහසින් වැසි ධාරා වැටී ඒ චිතකය නිව්වේය. සල්ගස්වලින් වැටුණු දිය ධාරා ද ඒ චිතකය නිවී ය. කුසිනාරාවේ මල්ලයෝ ද විවිධ සුවඳ කැවූ පැනින් ඒ චිතකය නිව්වෝ ය.

කුසිනාරාවේ මල්ලයෝ බුදු රජුන් ගේ ශාරීරික ධාතු රාජ සභා ගැබ් හී මණ්ඩපයක තැන්පත් කොට, දුනු පේළියකින් ආරක්ෂා කොට, නච්ච-ගීත-වාදන -මාලා සුගන්ධයෙන් සතියක් පුරා පූජා පැවත්වූ හ.

ධාතුන් වහන්සේ ඉල්ලා සිටීම.

මගධ රාජ තැන්පත් වේදේහි පුත්‍ර අජාසත්ත රජ් ජුරුවෝ බුදුරජුන් කුසිනාරාවේදී පිරිනිවන් පෑ බව ඇසූහ. එසේ ඇසූ අජාසත්ත රජු කුසිනාරාවේ මල්ලවයන්ට මෙසේ සන්දේශයක් යැවී ය. "බුදු හිමියෝ ක්‍ෂත්‍රියයෙක් වූ සේක. මම ද ක්‍ෂත්‍රියයෙක්මි. ඒ නිසා, බුදුරජාණන්වහන්සේ ගේ ශාරීරික ධාතුන්වහන්සේ ගෙන් කොටසක් ලැබීමට මම ද සුදුස්සෙ මි. බුදුහිමියන් ගේ ශාරීරික ධාතුන් වහන්සේ නිදන් කොට මමද සෑයක් බඳින්නෙමි. එසේම, සර්වඥ ධාතුන්වහන්සේ සඳහා සුදුසු විදියේ සර්වඥ ධාතු පූජෝත්සවයක් ද මම පවත්වන්නෙමි.

බුදු හිමියන් කුසිනාරාවේදී පිරිනිවන් පෑ බව දැනගත් වේසාලියේ ලිච්ඡවීහු, කුසිනාරාවේ මල්ල රජදරුවන්ට මෙසේ සන්දේශයක් යැවූහ. "බුදුහිමියෝ ක්‍ෂත්‍රියයෙක් වූහ. අපි ද ක්‍ෂත්‍රියයෝ වෙමු. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතුන්වහන්සේලාගෙන් කොටසක් ලැබීමට අපිද සුදුස්සෝ වෙමු. බුදුරජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතු නිදන් කොට අපිද සෑයක් බඳින්නෙමු.

අපිත් සර්වඥ ධාතුන්වහන්සේ ගේ ගෞරවයට සුදුසුවන පරිද්දෙන් සර්වඥ ධාතු පූජෝත්සවයක් පවත්වන්නෙමු. බුදුහිමියන් කුසිනාරාවේදී පරිනිවන් පෑ බැව්, කපිල වස්තුවේ ශාක්‍යයන්ට ද සැල වූයේ ය. කපිලවස්තුවේ ශාක්‍යයෝ කුසිනාරාවේ මල්ල රජ

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රී දේහය තැන්පත් කොට තිබෙන චිතකය වෙතට පැමිණි සේක. මහා කාශ්‍යප හිමි නමස්කාර පූර්වකව දෑත් එකතු කොට චිතකය ප්‍රදක්‍ෂිනා කළ සේක. උන් වහන්සේ බුදු හිමියන්ගේ දෙපා මත සිය හිස තබා නැමැද එතුමාණන්ට සිය හරසර දැක්වූහ. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ මෙසේ බුදු හිමියන්ගේ පා නැමදූ විගසම චිතකයට ගිණි දැල් වුනේය.

දරුවන්ට මෙසේ සන්දේශයක් යැවූ හ. "බුදුහිමියෝ අප ගේ උත්තම ඥාතියෙකි. බුදුරජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතූන් වහන්සේ ගෙන් කොටසක් ලබන්නට අපිද සුදුස්සෝ වෙමු. අපිද සර්වඥ ධාතූන් වහන්සේ නිදන් කොට සෑයක් තනවන්නෙමු.සර්වඥ ධාතූන් වහන්සේට ගෞරව පිණිස සර්වඥ ධාතු පූජෝත්සවයක් ද පවත්වන්නෙමු."

අල්ලකප්පයේ බුලි රජ දරුවෝත්, බුදුරජාණන් වහන්සේ කුසිනාරාවේ දී පිරිනිවන් පෑ බව ඇසූහ. ඔවුහු, මෙසේ සන්දේශයක් යැවූ හ."බුදුහිමියෝ ක්ෂත්‍රියයෙකි. අපි ද ක්ෂත්‍රියයෝ වෙමු. අපිද සර්වඥ ධාතූන් වහන්සේ නිදන් කොට සෑයක් බඳින්නෙමු. අපිද උචිතාකාරයෙන් සර්වඥ ධාතු පූජෝත්සව පවත්වන්නෙමු."

රාමග්‍රාමයේ කොලිය රජ දරුවන්ටත් බුදුහිමියන් කුසිනාරාවේ දී පිරිනිවන්පෑමේ පුවත සැලවිය. රාමග්‍රාමයේ කෝලිය රජදරුවෝ දූතයෙකු අත කුසිනාරාවේ මල්ල රජ දරුවන්ට මෙසේ සන්දේශයක් එවූහ. "බුදුහිමියෝ ක්ෂත්‍රියයෙකි. අපිද ක්ෂත්‍රියයෝ වෙමු. සර්වඥධාතූන් වහන්සේ ගෙන් කොටසක් ලැබීමට අපි ද සුදුස්සෝ වෙමු. අපි ද සර්වඥ ධාතූන්වහන්සේට ගරු - බුහුමන් පිණිස සර්වඥ ධාතු පූජෝත්සවයක් පවත්වන්නෙමු."

බුදුහිමියන් කුසිනාරාවේ දී පිරිනිවන් පෑ බව වේඨදීපයේ බ්‍රාහ්මණයාට ද සැලවුණේය. වේඨදීපයේ බ්‍රාහ්මණයා, කුසිනාරාවේ මල්ල රජ දරුවන්ට මෙසේ සන්දේශයක් යැව්වේ ය. "බුදුහිමියෝ ක්ෂත්‍රියයෙකි. මම බ්‍රාහ්මණයෙක් මි, සර්වඥ ධාතූන් "වහන්සේ ගෙන් කොටසක් ලැබීමට මම ද සුදුස්සෙක්මි. මම ද සර්වඥ ධාතූන් වහන්සේ නිදන් කොට සෑයක් බඳින්නෙමි. මම ද සර්වඥ ධාතූන් වහන්සේ උදෙසා පූජෝත්සවයක් පවත්වන්නෙමි.

පාවාහි මල්ල රජ්ජුරුවෝ ද. බුදුහිමියන් කුසිනාරාවේ දී පිරිනිවන් පෑ බව ඇසූහ. අසා පාවාහි මල්ල රජ දරුවෝ කුසිනාරාවේ මල්ල රජ දරුවන්ට හිමියෝ ක්ෂත්‍රියයෙකි. අපි ද ක්ෂත්‍රියයෝ වෙමු, අපි ද සර්වඥ ධාතූන් වහන්සේ ගෙන් කොටසක් ලැබීමට සුදුස්සෝ වෙමු. අපි ද සර්වඥ ධාතු නිදන් කොට සෑයක් බඳින්නෙමු අපි ද සර්වඥ ධාතූන් වහන්සේ උදෙසා පූජෝත්සවයක් පවත්වන්නෙමු"

මෙසේ සන්දේශ එවූ කල්හි කුසිනාරාවේ මල්ල රජ දරුවෝ, ඒ රැස්ව සිටි පිරිසට මෙසේ පැවසූහ "බුදුහිමියන් පිරිනිවන් පෑයේ අප ගේ රාජධානියේය. අපි සර්වඥ ධාතූන් වහන්සේ කිසිවෙකුටත් කොටස් කොට නොදෙන්නෙමු."

ද්‍රෝණ බමුණා ඉදිරිපත් වීම

මෙසේ පැවසූ කල්හි ද්‍රෝණ බමුණා රැස්ව සිටි පිරිස අමතා මෙසේ පැවසුවේ ය: "සත්පුරුෂ යෙනි මගේ මේ වදනට සවන් දෙන්න. අපගේ බුදුරජාණන් වහන්සේ ඉවසීමේ ගුණය දෙසාලූ සේක. එවැනි මහා පුරුෂයෙකුගේ ශාරීරික ධාතූන් වහන්සේ පිළිබඳව ගැටුමක් ඇතිවීම නොමැනවි. සත් පුරුෂයෙනි, ඒ නිසා අපි මෛත්‍රී පූර්වකව සිත් සතුටින් මේ ධාතූන් වහන්සේලා කොටස් අට කට බෙදමු. එවිට හැම දෙසකම ස්තූප තැනිය හැකිවේ. සර්වඥයන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධාව බොහෝ දෙනා තුළ වැඩෙනු ඇත. "එසේ නම් බමුණ තෙපිම, ධාතූන් වහන්සේ කොටස් අට කට බෙදනු මැනවි"

රැස්ව සිටි පිරිසට පිළිතුරු දෙමින් ද්‍රෝණ බමුණා මෙසේ කීවේ ය: "සත්පුරුෂ යෙනි, එසේ නම් එය එසේම වේවා. එසේ පවසා ද්‍රෝණ බමුණා සර්වඥයන් වහන්සේ ගේ ශාරීරික ධාතු නිසි පරිදි කොටස් අට කට බෙදූ වේය.

ඉක්බිතිව හෙතෙමේ රැස්ව සිටි පිරිස අමතා මෙසේ පැවසූ වේය:"සත්පුරුෂයෙනි, මේ ධාතූන් වහන්සේ බෙදීමේ දී මා භාවිතා කළ නැළිය මට දෙනු මැනවි මම ඒ නැළිය නිදන් කොට සෑයක් බඳින්නෙමි එසේම, ඒ පූජනීය වස්තුව උදෙසා පූජෝත්සයක් පවත්වන්නෙමි" රැස්ව සිටි පිරිස ඒ නැළිය ද්‍රෝණ බමුණාට පිරිනැමූහ.

පිප්ඵලී වනයේ මෝරියවරන්ට බුදුහිමියන් කුසිනාරාවේ දී පිරිනිවන් පෑ බව සැලවූයේ ය. ඔවුහු කුසිනාරාවේ මල්ල රජ දරුවන්ට මෙසේ සන්දේශයක් යැවූ හ. "බුදුහිමියෝ ක්ෂත්‍රියයෙකි. අපි ද ක්ෂත්‍රියයෝ වෙමු. අපි ද සර්වඥ ධාතූන් වහන්සේ



කුසිනාරාවේ මල්ල රජ දරුවෝ බුදු හිමියන්ගේ ධාතූන් වහන්සේ සිය රාජ සභාවෙහි ගෞරව පූර්වකව තැන්පත් කොට සම්මාන දැක්වූහ. මේ සම්මාන උත්සවය සතියක් පුරා පැවැත්තේ ය.සර්වඥ ධාතූන් වහන්සේ රාජ සභාවේ තැන්පත් ව තිබුනු කාලය මුළුල්ලේම සර්වඥ ධාතූන් වහන්සේට ආරක්ෂාව සැපයුයේය. මෙය බෞද්ධ ඉතිහාසයෙහි ප්‍රථම සර්වඥ ධාතු ප්‍රදර්ශනයයි.

ලැබීමට සුදුස්සෝ වෙමු. අපි ද බුදුහිමියන්ගේ ශාරීරික ධාතු නිදන් කොට සෑයක් බඳින්නෙමු. අපි ද සර්වඥ ධාතූන් වහන්සේට උචිත පූජෝත්සව පවත්වන්නෙමු."

ඒ වන විට සර්වඥ ශාරීරික ධාතූන් වහන්සේ බෙද අවසානව් තිබිණ. "ඔබට බුදුහිමියන්ගේ සෑයෙන් අඟුරු දිය හැකි වෙයි" ඔවුහු ඒ සෑයෙන් අඟුරු රැගෙන ගියහ.

සෑ බැඳීම

මගධ දේශයේ රජුවන වේදේහපුත්‍ර අජාසත්ත බුදුහිමියන් ගේ ශාරීරික ධාතු නිදන් කොට රජගහ නුවර සෑයක් බැන්දවිය. සර්වඥ ධාතු පූජෝත්සව පැවැත්වියි.

වේසාලියේ ලිච්ඡවි රජ දරුවෝ සර්වඥ ධාතු නිදන් කොට වේසාලියෙහි සෑයක් බැන්දවිය. පූජෝත්සව පැවැත්වූහ.

කපිලවස්තුවේ ශාක්‍යයෝ සර්වඥ ධාතු නිදන් කොට කපිලවස්තු පුරයෙහි සෑයක් බැඳ සර්වඥ ධාතු පූජෝත්සව පැවැත් වූහ.

අල්ලකප්පයේ බුලි රජ දරුවෝ අල්ල කප්පයෙහි සර්වඥධාතු නිදන් කොට වෙහෙරක් තැනවූහ සර්වඥ ධාතු පූජෝත්සව පැවැත් වූහ.

රාමග්‍රාමයේ කෝලිය රජදරුවෝ සර්වඥ ධාතූන් වහන්සේ නිදන් කොට වෙහෙරක් කළහ. ඔවුහු සර්වඥ ධාතු පූජෝත්සව පැවැත් වූහ.

වේඨදීපයේ බ්‍රාහ්මණය වේඨදීපයෙහි සර්වඥධාතු තැන්පත් කොට වෙහෙරක් කරවා ධාතු පූජෝත්සව පැවැත්වූයේ ය.

පාවාහි මල්ල රජ දරුවෝ සර්වඥධාතූන් වහන්සේ තැන් පත් කොට පාවා නුවර වෙහෙරක් කළහ. ඔවුහු සර්වඥධාතු පූජෝත්සව පැවැත් වූහ. කුසිනාරාවේ මල්ල රජ දරුවෝ කුසිනාරාවෙහි සර්වඥ ධාතූන්වහන්සේ තැන්පත් කොට වෙහෙරක් කළහ. ඔවුහු සර්වඥධාතූන් වහන්සේ උදෙසා පූජෝත්සව පැවැත් වූහ. ද්‍රෝණ බමුණා සර්වඥ ධාතූන් වහන්සේ බෙදනු පිණිස භාවිතා කළ නැළිය නිදන් කොට වෙහෙරක් කළේය. ඔහුද පූජෝත්සව පැවැත්වූයේ ය.

පිප්ඵලිවනයේ මෝරිය රජ දරුවෝ බුදුහිමියන්ගේ සෑයෙහි අඟුරු නිදන් කොට වෙහෙරක් කළ හ. ඔවුහු ද පූජෝත්සවයක් පැවැත් වූහ. මෙසේ බුදුහිමියන්ගේ ශාරීරික ධාතු තැන්පත් කොට වෙහෙර අටක් තනන ලදී.

නවවැන්න තනන ලද්දේ නැළිය නිදන කොට ය. පිරිවන් චිතකයෙහි අඟුරු නිදන් කොට දසවන වෙහෙර බඳින ලදී.

මෙසේ ඒ ආදී සමයයෙහි ඒ විහාර තැනවිනි. බුදුහිමියන් ගේ ශාරීරික ධාතු ප්‍රමාණයෙන් දේණ අටකි. ඉන් දේණ හතක් දඹදිව දී වැඳුම් - පිදුම් ලබති.

බුදුහිමියන් ගේ ශාරීරික ධාතු වලින් එක් දේණයක් රාමග්‍රාමයේ නාග රාජයාණන්ගේ පුද - පූජා ලබන්නේය.

දන්ත ධාතූන් වහන්සේලා හතළිස් නමක් ද කේශ ධාතූන් වහන්සේ ද ශ්‍රී සම්බුද්ධ කයේ රෝම ධාතූන් වහන්සේ ද දෙවියන් පිණිස විවිධ ලෝක ධාතූන් වෙත ගෙන යනු ලැබූහ. බුදුහිමියන් ගේ එක් දන්ත ධාතූන් වහන්සේ නමක් තාවතිංසා දෙව් ලොව දී පුද පූජා ලබති.

තවත් දන්ත ධාතූන් වහන්සේ නමක් ගාන්ධාරයේ පුද පූජා ලබන සේක. තවත් දන්ත ධාතූන් වහන්සේ නමක් කාලිංග දේශයේ වැඩ සිටින අතර තවත් දන්ත ධාතූන් වහන්සේ නමක් නාග ලෝකයේ වැඳුම් - පිදුම් ලබන සේක. ඒ සර්වඥධාතූන්වහන්සේ නිසා මේ මුළු ලෝකයම බැබළෙන්නේ ය.

මෙසේ බුදුරජාණන් වහන්සේ ගේ ශාරීරික ධාතූන් වහන්සේ ශ්‍රේෂ්ඨතමයන්ගෙන් පුද-පූජා ලබති මෙසේ සර්වඥ ශාරීරික ධාතූන් වහන්සේ දේව-නර-නාග නායකයන්ගේ පුද-පූජාවලට පාත්‍ර වෙති. **බුදුහිමියෝ කල්ප ලක්ෂ ගණනක් ඇවෑමෙන් පහළවන මහා උතුමෙකි ඒ මහා පුරුෂයාණන් වහන්සේට නමස්කාර වේවා!**

වේරගොඩ සාරද හිමියන් ගේ වෙනත් පොත්

ධර්ම භාණ්ඩාගාරය (සිතුවම් සහිත ධම්ම පදය)
පෙරදිග පහන
Treasury of Truth - Illustrated Dhammapada
Life of The Buddha in Pictures
Parents and Children - Key to Happiness
The Highest Blessing - Maha Mangala Sutta
Morals of the Young
Nature of Life and Death (In Print)
Buddhist Way of Meditation
Reflection on Death
Buddha Word
Meditation on Loving Kindness
Life of the Buddha for Children
Vision of the Buddha - (Publisher)
Light of Asia - (Publisher)



කවරයේ චිත්‍රය

මුළු මහත් මානව සංහතියෙහිම කරුණා මෛත්‍රී ගුණ පිළිබඳ ශ්‍රේෂ්ඨතම මූර්තිය නම් බුදු රජාණන් වහන්සේයි.

එතුමාණන් වහන්සේ මෑදු බවෙහි මහා ම සංකේතය වන සේක. මේ ග්‍රන්ථයෙහි කවරයෙහි චිත්‍රයෙන් පිළිබිඹු වන්නේ, බුදු රජාණන් වහන්සේගේ අසහාය මෛත්‍රිය පිළබඳ මහා සාගරයෙන් බිංදු මාත්‍රයක් පමණි.

බුදු හිමියෝ වරක් සිය ශාන්ත ගමනින් සක්මණක යෙදී සිටියහ. බුදු හිමියන් ගමන් කළ මග අසල බ්‍රාහ්මණයන් කණ්ඩායමක් අග්නි පූජාවක් සඳහා සැරසෙමින් සිටියහ. අලුත උපන් සුකුමාල මෑදු බැටළු පැටවෙකු සියතින් ගත් එක් බමුණෙක්, ඒ අහිංසක සත්වයා ගේ හිස අසිපතින් සැරසී සිටියේය. මේ බියපත්, අහිංසක, අසරණ, මෑදු බැටළු පැටවා බුදු හිමියන්ගේ මහා කරුණා දැලට අසුවූයේය. ඒ අහිංසක ජීවන බිඳුව නැති කරලීමට මොහොතකට පෙර බුදු හිමියෝ ඒ බැටළු පැටවා සියතට ගත් සේක. බුදු හිමියන් විසින් මාරයාගේ ග්‍රහනයෙන් බේරා ගන්නා අසංඛ්‍ය ජීවිත සමුදය පිළිබඳ සංකේතයක් බවට පත්වූයේය ඒ අහිංසක බැටළු පැටවායි. මේ සඳ කාලික මොහොත චිත්‍ර ශිල්පියා සිය තෙලි තුඩින් ග්‍රහණය කොට ගත් ආකාරය කවරයේ චිත්‍රයෙන් දැක්වෙන්නේය.

WORLDLY CONDITIONS

හා ! යොබ්බනා ජරා අන්තා
HA! YOBBANA JARA ANTA
Alas! Youth ends with old age.

හා ! විනාසා මහද්ධනා
HA! VINASA MAHADDHANA
Alas! Great fortunes end with destruction.

හා ! සංයොගා වියොගන්තා
HA! SANYOGA VIYOGANTA
Alas! Meetings end with separation.

හා ! මතන්තා සජීවකා
HA! MATANTA SAJEEVAKA
Alas! The living ends with death.

හා ! උන්නතා ඕනතන්තා
HA! UNNATA ONATANNTA
Alas! Rise ends with fall.

හා ! පියාසොක අන්තකා
HA! PIYASOKA ANTAKA
Alas! Pleasure ends with grief.

හා ! ථොමනා විනිඳන්තා
HA! THOMANA VININDANTA
Alas! Praise ends with disgrace.

හා ! දුක්ඛා සබ්බසො සුඛා
HA! DUKKHA SABBASO SUKHA
Alas! Happiness in every way ends in suffering.

Reflecting thus all craving will come to an end.

The Buddha.

දර්ශනය සහ ආදර්ශය

මානව හිතවාදියෙකු හැටියට බුදුහිමියෝ පුරෝගාමියෙකි. එසේම, බුදුහිමියෝ දර්ශනවාදී මහා ප්‍රාඥයෙකි. මේ ගති සියල්ල එතුමන්ගේ දිදුලුදෙන ප්‍රබල චරිතයෙහි, එකට සංකලනය වී පවතී. එතුමන් පවසා වදාළ දේවල්, අවුරුදු 2500 ක් තිස්සේ දැනුම පිළිබඳ උල්පත වටා එක් රැස්ව වාද විවාද පවත්වා කතාබහ සංවාදයන්හි යෙදී කාලය ගෙවීමෙන් පසුවත් අද යුගයේ කිසිම ස්ත්‍රියක හෝ පුරුෂයකු විසින් අමතක කළ හැකි නොවේ. බුදුහිමියන්ගේ මහා ප්‍රඥවටත් වඩා ශ්‍රේෂ්ඨ යැයි සැළකිය හැකි වන්නේ එතුමාණන් වහන්සේගේ ආදර්ශයයි.

මෝනි බැගී විසින් "අපේ බුදුන්" නම් ග්‍රන්ථයෙනි.

මෛත්‍රියෙන් මෝක්ෂය

ආධ්‍යාත්මික සුවයත්, සියළු සතුන් කෙරෙහි මෛත්‍රියත්, බුදුරජාණන් වහන්සේ විසින් අනුදන්නා ලද්දේ වෙයි. බුදුරජාණන් වහන්සේ පාපය ගැන නොවදාරති. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ අවිද්‍යාව හා මෝහය ගැන පමණි. යථා තත්වාවබෝධයෙන් හා කරුණා මෛත්‍රී පූර්වක බවින් ඒවා දුරලිය හැකි වේ.

ආචාර්ය එස්. රාධක්‍රිෂ්ණන් "ගෞතම බුද්ධ" නම් ග්‍රන්ථයෙනි.

普觉禅寺

මිහිතලයෙහි පහල වූ ශ්‍රේෂ්ඨතම මිනිසා - බුදු හාමුදුරුවෝ නම් මේ මහා ග්‍රන්ථය,ගරු පණ්ඩිත ගණේගම සරණංකර නා හිමියන්ගේ "බුදුහාමුදුරුවෝ " නම් ග්‍රන්ථයට නව මුහුණුවරක් දෙමින් චිත්‍ර සහිතව වේරගොඩ සාරද හිමියන්ගේ නව සංස්කරණයකින් ද යුතුව ඉදිරිපත් කරන්නකි. මෙය බහු අංශ සහිත ග්‍රන්ථයකි. මේ ප්‍රකාශනය හා සමගම, සිංගප්පූරුවේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය විසින් ප්‍රකාශිත ග්‍රන්ථ සංඛ්‍යාව ශීඝ්‍ර වේගයෙන් දෙසීය වන අංකය වෙත ගමන් ගනිමින් සිටී. මේ ග්‍රන්ථය සඳහා පොත් කිහිපයක් එකට එකතු වන්නේය.



පූජ්‍ය වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ

ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ 1941 දී උපත ලැබ වයස අවුරුදු 12 දී යටලමත්තේ ශ්‍රී වජිරඥාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ ශිෂ්‍යවරයකු ලෙස වේරගොඩ ජයන්ති විහාරයේදී පැවිදි බව ලැබූහ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උන් වහන්සේ උපාධි ලැබුවේ 1964 දී ය. පාලි, සංස්කෘත, සිංහල සහ බුදු සමය පිළිබඳ හසළ බුද්ධියකින් හෙබි උන් වහන්සේ 1965 සිට 1967 දක්වා ඉදුරුපන් විල පිරිවෙන් විද්‍යාලයේ පරිවේනාධිපති පදවිය හෙබවූ සේක. එසේම, 1967 සිට 1969 දක්වා ඒ ස්ථවිරයන් වහන්සේ අවිස්සාවේල්ලේ සුධර්මාරාම පිරිවෙන් විශ්ව විද්‍යලයේ අධිපති පදවියද ඉසිලූ සේක.

ජාත්‍යන්තර බුදු සමය උදෙසා සාමයික සේවයට කැප වෙමින් උන් වහන්සේ සිය ජගත් ව්‍යාප්ත ධර්මදූත මෙහෙය ආරම්භ කළේ මැලේසියාවේ පිනෑං නගරයේ දී ය. ගරු වේරගොඩ සාරද ස්ථවිරයන් වහන්සේ එහි මහින්දරාම ඉරිද පාලි පාසලේ විද්‍යාලයාධිපති පදවිය ඉසිලූහ.

1979 දී ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ සිංගප්පූරුවට වැඩම කොට, සිංගප්පූර් වේ බෞද්ධ භාවනා මධ්‍යස්ථානය පිහිටුවාලූහ. දැනටත් ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ ඒ භාවනා මධ්‍යස්ථානයෙහි අධිපති ධූරය දරති.

ඇමරිකානු - ශ්‍රී ලංකා බෞද්ධ සමිතියේ සමාරම්භක සාමාජිකයෙකු වන සාරද මහා ස්ථවිරයන් වහන්සේ දැනටත් ඒ සමිතියේ අධ්‍යක්ෂ පදවිය හොබවති.

ජපන්- ශ්‍රී ලංකා බෞද්ධ සමිතියේ සමාරම්භක සාමාජිකයෙකු වන සාරද මහා ස්ථවිරයන් වහන්සේ දැනට එම සංවිධානයේ මහා ලේකම් වරයායි. එසේම ගරු වේරගොඩ සාරද මහා ස්ථවිරයන් වහන්සේ දකුණු සිරිලක අම්බලංගොඩ, වේරගොඩ ජයන්ති විහාරයේ අධිපතීන් වහන්සේයි.

ගරු සාරද හිමියන් විසින් බුදු සස්නට ඉටු කෙරෙන ඉතාම විශිෂ්ට මෙහෙය නම් බුදු සමය පිළිබඳ පත-පොත මුද්‍රණයෙන් ප්‍රකාශ කිරීමයි. උන් වහන්සේ විසින් මුද්‍රිත පොත් වලින් පිටපත් දශලක්ෂයක් පමණ මුදල් අය කිරීමකින් තොරව ලොව පුරා ප්‍රචාරය කොට ඇත්තේය. දැනට එතුමන් විසින් ප්‍රකාශිත පොත් ගණන 200 පමණ වේ. ඉන් දහයක් පමණම පලවී තිබෙන්නේ එතුමන්ගේ කතෘත්වයෙනි. ඒවා නම්, බුද්ධ වචනය, බෞද්ධ භාවනා මාර්ගය, මෛත්‍රී භාවනාව, ආධුනිකයන්ට බුදු දහම, බුදු සිරිත, මහා මංගල සූත්‍රය, ළමයින් සඳහා හොඳ සිරිත්, ඉන් සමහරකි. බුදු සිරිත සිතුවමින් කෘතිය ගරු සාරද මහා ස්ථවිරයන් වහන්සේගේ කෘති අතර දැනට ඉතාමත්ම ජනප්‍රිය ප්‍රකාශන යයි.

ගරු වේරගොඩ සාරද ස්ථවිරයන් වහන්සේ ගේ විශිෂ්ඨ ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ ධම්මපද පරිවර්තනයයි. එය සිංහල ,ඉංග්‍රීසි, හා චීන භාෂා වලින් පිටපත් හතලිස්දහසකට අධික ප්‍රමාණයක් පළකොට ඇත.

එඩ්වින් ආරියදාස